තල්පතේ පිළියම්

දෙවෙනි කාණ්ඩය

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි

2008 11872

තල්පතේ පිළියම්

දෙවෙනි කාණ්ඩය

201
2012
2018

011872
GWAIL

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි

පෙරවදන

අපේ ජනතාව ආයුර්වේදය සංරක්‍ෂණය කිරීමට ඇති බලවත් උනන්දුව නිසා, තමන් සතු පුස්කොළ පොත් රජයට බාර දීමට කැමැත්තෙන්ම ඉදිරිපත් වූ අවස්ථා බෙහෙවි. ආයුර්වේද හිතකාමීන් විසින් අප දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට පරිත්‍යාග කරන ලද පුස්කොළ පොත්වල ඇති දෑ මුද්‍රිත මාධ්‍යයෙන් ජනතාව සතු කිරීමට ආයුර්වේද දෙපාර්තමේන්තුව ගත් තැත ප්‍රසංසනීයයි.

අපේ ජාතියේ බුද්ධි ප්‍රභාව පළ කෙරෙන ජාතික හැඟීම් ප්‍රකට කෙරෙන අනගි දායාදයකි පුස්කොළ පොත් පත්. අපේ විද්වතුන් ගේ අවධානය යොමු වී ඇති මේ මහඟු උරුමයෙන් උපරිම ප්‍රයෝජන ගත යුතුව ඇත. මෙම ග්‍රන්ථ මාලාව ඒ සඳහා හොඳ අත්වැළක් වනු ඇත. වෛද්‍ය ක්‍ෂෙත්‍රයට පමණක් නොව, සංස්කෘතිය, සාහිත්‍යය, භාෂාව සමාජ දර්ශනය ගැන පර්යේෂණ කරන්නන්ට ද මෙකී ප්‍රකාශනය ස්වකීය පර්යේෂණයන්ට සාදකයක් කර ගත හැකි අගනා සම්පතකි. එවැනි මහඟු කාර්යයකට උර දී මෙම උදාර ප්‍රයත්නයේ යෙදුණු දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ හා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ටත් ඊට තම නොමඳ සහාය දුන් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ හා ලෝක සෞඛ්‍ය සංවිධානයේ හිතවතුනටත් සකල ආයුර්වේද හිතකාමීන් ගේ උපහාරය හිමි වේ.

තෙරුවන් සරණයි!

වි. ජ. මු. ලොකුබණ්ඩාර.
සංස්කෘතික කටයුතු හා ප්‍රවෘත්ති අමාත්‍ය
සහ දේශීය වෛද්‍ය අමාත්‍ය.

බු.ව. 2536 ක්වූ උදුවප් මස පුර 11වැනි දා,
සංස්කෘතික කටයුතු හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ දීය.

හැඳින්වීම

ආයුර්වේද හිතකාමීන් විසින් දේශීය වෛද්‍ය අමාත්‍යාංශයටත්, ආයුර්වේද දෙපාර්තමේන්තුවටත් තාවින්නේ බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයටත් පරිත්‍යාග කරනු ලැබ දැනට නාවින්න ආයුර්වේද පර්යේෂණායතනයේ රැස්කර තබා ඇති පුස්කොළ පොත් ආශ්‍රයෙන් මෙම ග්‍රන්ථය පිළියෙල කර ඇත. මෙය, මෙවැනි ග්‍රන්ථ මාලාවක දෙවැන්නයි.

මෙම පොත පරිශීලනය කරන ඔබ එහි භාෂාමය ඌණතා ගණනාවක් දකිනු ඇත. ඒවා හුදෙක් වැරදීමකින් හෝ නොසැලකිල්ලෙන් කළ හෝ තිබීමට ඉඩහැරිය හෝ වැරදීම් නොවේ. පුස්කොල පොත්වල ඇති භාෂාව බොහෝ විට එහි මුල් ස්වරූපයෙන්ම තිබීමට ඉඩ හැරීමට අප පෙලඹ වූ හේතු දෙකක් ඇත. ඖෂධ වට්ටෝරු වල හෝ ඖෂධ සාදන ක්‍රම සම්බන්ධයෙන් පුස්කොල පොත් වල තිබූ වචන හැකිතාක් දුරට ඒ ඒ පොත්වල තිබූ ආකාරයටම මුද්‍රණය කරන ලද්දේ දැනට ව්‍යවහාරික භාෂාවෙන් හෝ වචන වලින් එමවට්ටෝරු සැකසීමට ප්‍රයත්නයක් දරන ලද්දේ නම් පුස්කොල පොතේ සඳහන් අර්ථයට හානියක් වියහැකි වීම ඉන් පළමුවැන්නයි. විවිධ කාලසීමා වලට අයත් වූ මෙම පුස්කොල පොත්වල සඳහන් භාෂා විලාසය ඒ අන්දමින්ම මුද්‍රණය කිරීමෙන් වාග් විද්‍යාත්මක පර්යේෂකයන්ට එය පර්යේෂණකාරකයක් කර ගැනීමට කටයුතු සැලසීම දෙවැන්නයි. ඇතැම් පාඨකයෙක් මීට එකඟ නොවීමට පිළිවන. කෙසේ වෙතත් මෙම ග්‍රන්ථය පිළිබඳ ඔබේ අදහස් අප වෙත දන්වන්නේ නම් එය අගය කරමු. මේ පොත් පෙළ නැවත මුද්‍රණය කිරීමේදී අවශ්‍ය සංශෝධන කිරීම සඳහා ඔබේ අදහස් වැදගත් වනු ඇත.

තවද, මෙම පොත හා මුද්‍රණය කිරීමට බලාපොරොත්තු වන අනෙකුත් පොත්වල ද මෙම පොතේ සඳහන් රෝගවලට අදාල වට්ටෝරු තිබිය හැකි වග ද සඳහන් කරමු. එසේම එකම වට්ටෝරුව වෙනත් පොතක ද තිබෙන්නට ද පුළුවන. එසේ වීමට හේතු වූයේ ඉතා ඉක්මනින් පොත් ගණනාවක් සකසා-මුද්‍රණය කිරීමට සිදු වූ හෙයින් ස්ථාන කිහිපයකදී, වෛද්‍යවරුන් ගණනාවක් එම කාර්යයේ නිරත වූ නිසාය. එසේ නොවන්නට මෙම පොත් මෙතරම් ඉක්මණින් ඔබ අතට පත් නොවන්නට ඉඩ තිබුණි.

මෙම පොත් පෙල සකසා මුද්‍රණ කිරීම සඳහා අපට තිබුනේ ඉතා සීමිත කාල සීමාවකි. එම කාලසීමාව තුල පොත් හතක් මුද්‍රණය සඳහා සැකසීම හා ඒවා මුද්‍රණය කරවා ගැනීම පහසු කාර්‍යයක් නොවේ. එම දුෂ්කර කාර්යයේ දී අපට ආධාර කළ දෙපාර්තමේන්තු නිලධාරීන් ගණනාවක් විය.

ඔවුන්ගෙන් මෙම පොත සැකසීම හා සෝදුපත් කියවීම කල නාවින්නේ බණ්ඩාරණායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයේ වෛද්‍යනිලධාරිනි ලීලා රාමනායක මහත්මියටද යතුරු ලියන කටයුතු කරදුන් පද්මා අබේසිංහ, ඒ. සී. පර්සි. එස්. අන්ද්‍රාදි මහාතාටද එස්. එච්. කරුනාවතී මෙනවියට ද මුද්‍රණ කටයුතු සංවිධානය කළ ලිපිලරු වී. සී. ටී. සේනානායක මහතාට ද සැකසූ පොත් මුද්‍රණයට යෝග්‍යතාවයකින් ඇද්දැයි පරීක්ෂා කල ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ (ආයුර්වේද) වෛද්‍ය චන්දා කරුණාදාස මහත්මියට ද පොත සකස් කිරීමේ කටයුතු අධීක්ෂණය කළ බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ ආචාර්ය උපාලි පිලපිටිය මහතාටද, විවිධ කටයුතු මඟින් සහයෝගය දී අප ධෛර්යමත් කළ දේශීය වෛද්‍ය ලේකම් ජාලිය මැදගම මහතාටද මෙම පොත් පෙල සකසා මුද්‍රණය කරවා ගැනීමේදී දැඩි උනන්දුවකින් හා කැපවීමකින් කටයුතු කල දේශීය වෛද්‍ය ක්‍රම සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරු පී. බී. වේරගොඩ මහතාටද මුදල් සැපයූ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහනේ නේවාසික නියෝජිත රොබට් ඉන්ග්ලන්ඩ් මහතාට ද නියෝජ්‍ය නේවාසික බර්නාබේ ගාර්ෂියා මහතාට ද වැඩ කටයුතු කඩිනම් කිරීමේ කාර්යයට පූර්ණ සහයෝගය දැක්වූ ලෝක සෞඛ්‍ය සංවිධානයේ ශ්‍රී ලංකා නියෝජිත වෛද්‍ය ඖන් මිත්ට් මහතාට ද මුද්‍රණ කටයුතු කඩිනමින් කරදුන් ජාතික තරුණ සේවා මුද්‍රනාලටයද අපගේ කෘතඥතා පූර්වක ආචාරය මෙයින් පුද කරමු.

එන්. ඩබ්ලිව් වෙරළුපිටිය
ආයුර්වේද කොමසාරිස්.

1992 නොවැම්බර් මස 30 වැනි දින
කොළඹ 08, ආයුර්වේද දෙපාර්තමේන්තුවේදීය.

දත් රෝග

(පලමුවන කාණ්ඩය හා සම්බන්ධයි.)

දත කළුවී දත කැක්කුම

1. සවිඳ , සිද්ධිගුරු, සුනු කොට මීයෙ කබා මුකය ගෑ කලත් දත් පනුවො වැගිරෙත්.
2. ලා පුවක් ගිතෙලිං බැද දත් මුල තබනු.
3. කිරිදි වැල පොළු ගසා උන අළුවෙං තම්බා දතිං තෙපලන්න.
4. දිය බෙරලිය කොල අඹරා කට ඇතුලෙ තබනු. දත් වැයටයි.

දත්මුල් දියවීම.

තුග ඇසල මාදං
මෙකී පොතුත් තිපල් පලමකුත් ගෙන කසාය කකාරා කට සෝදා හරිනු..

මූ කල කුකුරුමාන් ගෙඩි විස්සක් විවර ගෙන යූස මැඩ.
කුප්පමේනියා යූස පතයි මී තෙල් තල තෙල් පත පතයි
සස්සඳ මුල් එල බටු මුල් පොතු
අඹරා තෙලට දිය කර පදමට පෙරා කල්ක වෙනම තිබා තල තෙල් ගාලා කනු. උගුරෙ වන ගුණවෙයි.

උගුරේ සියළු ලෙඩට

එත්සාල් කොල්ලං කොල රත් තෙටුල් කුරුඳු පොතු
මිරිස් යවකර එනු කැල පොතු
මේවා දවා අළු ගෙන තබා
වග පුල් සිවිය සිද්ධිගුරු සීනි
මේ හැම සම භාග ගෙන චූර්ණ කර පලමු දැවූ අළුත් එක්ක ගෙන ගුලි කර මුඛයෙහි තබා ඉඳිනු. මුඛයේ සියළු රෝග නසයි.

මස් වැඩීමට හා අර්බුද වලට

දුරු රත් නිටුල් මූරුංගා ඇට ශැබෝ ඇට
සවින්දව කටුවැල් බටු
වරා කිරෙං කලතා අඹරා ගෝ මූත්‍ර තල තෙල් එක්ව පදමට සිඳ නශ්‍ය කරනු ගානු.

දත් මුල සියළු රෝග වලට

මනෝසිල
යවකර
හිරියල්
කසා
වෙනිවැල්
ත්‍රිපල්
සවිද
ගිතෙල්

මේ හැම අඹරා මී පැනි එක්ක මුඛයෙහි දතෙහි විදුරු මසෙහි ගා තබනු. දත් මුල සියළු රෝගද දිවෙහිද අටගත් මුක රෝග ගුනවෙයි.

දන්තශූල රුජා වැඩි වූ කල්හි

හිඟු තහඩුව සේ තනා රුජා ගන්නා තැන තිබා තහඩුව ඉදි වැල් රත්කොට ඒ පිට උනු. සුං කරනු. බොහෝ වේලා තිබනු. දන්ත සුල ගුණවෙයි.

මුඛ රෝග ලේපයක්

සිද්ධිගුරු
සුදුදුරු
අගිල්
නාමල් රේනු
තිප්පිලි මුල්
කලාදුරු
රත් නිටුල්
කොල්ලං කොල
තලා කොල
කොට්ටං
මෝදගං
සිවිය වැල්
වල් ඉද්ද කොල
වලහ සාල්

මෙකී දේ චූර්ණ කර සීනි වැඩි කර මීයෙං අනා මී ඉටි මදක් එක්කර දැගිල්ලෙං. මදිච්චි කරනු. කටේ තොලේ උගුරේ විදුරුමස් වල සියළු රෝග ගුණවෙයි.

තෙලක්

1. ගිතෙල් මහුල් කරද කොල යුස නැලියක් ගෙන පොල් තෙල් පතක් ලා සිවිය හිඟු කලදක් ගෙන දමා ලනු පදමට සිද දත් මුලගානු. සවි වෙයි.

2. රුක් අත්තන
කරද
වරා
දැසමං
තිබ
දුම්මැල්ල

මෙකී මුල් යුස මිරිකා යුස නැලියයි තල තෙල් එපමණ ගෙන තිප්පිලි ඉඟුරු වැල්මී කලද කලද අඹරා එහි දමා පදමට සිද පුළුනේ රදා දත මුල තබනු. මුඛ රෝග ගුනවෙයි.

3. මුඩ මහන කොල, ත්‍රිපල්
රත් නිටුල්
ත්‍රි කටුක
සවිද

මේවා වේලා චූර්ණ කර ගෝ මුත්‍රයෙ ලා පාංකඩ රදා දිව පල්ලෙ දිව යට තබනු. මුඛ රෝග ගුණවේ.

4. රුක්අත්තන කරඳ වරා
සමග දුම්මැල්ල නිබ මේවා කොල යුස නැලියට තල තෙල්පතක් වක්කර තබා යෂ්ටි, මහවුෂද මේවා කලඳ කලඳ ගෙන සිඳ ගත් තෙල් ගංඩුස කරනු. මුඛ රුජා ගුනවෙයි.

5. කරඳ පොතු තික තලා දේවදාරු
තිප්පිලි
මේවා කසාය කර කට සෝදනු.

7. හිරියල් වම්මුතු තිකුළු හිංගු
මේවා පොඩි කොට ගිතෙලිං අනා දුම් කටට පානු. මුඛ රෝග ගුනවෙයි.

දත මුල ඉදිමුම් රුජාවට

1. හිඟු, ඇද්දෙමට පොතු, කොට්ටං පොඩි කොට රෙදි පොට්ටනියක ලා බැඳ දත්මුල අඩස්සි කරනු. මෙකී අවුසදය තෙලිං කකාරා කට සෝදනු.

2. එඬරු ඵල බටු කටුවැල් බටු බිත් තඹුරු
මෙකී දේ කකාරා කට සෝදනු.

3. අනෝදා වෙනිවැල් වම්මුතු කටුකරෝහිනි
තිප්පිලි
මෙකී දෙ කල්ක සරිවි කර කට කුමුත්දනු.

4. රිදෙන තැන් බලා හිඟු උනු දියට දිය කර කට සෝදනු ක්‍රිමිශූල නසා.

5. පසු ගඩු හිල් උනාම
තිපල්, වලඟ සාල්, පොඩි කොට පැනියෙං අනා දත මුල ගානු.

6. සිවිය දවා අළු ගෙන දත මුල උලනු. දන්ත ශූල ගුනවෙයි.

මුඛයේ වන වලට

1. දිය මෙනේරිය සහමුලින් ගෙන පොල් එක්ක කොටා මිරිකා කයිප්පු අඹරා දමා ලනු පදමට සිඳ කට සෝදනු. වන වල් ගුනවෙයි.

2. තැඹිලි දෙකක් ඇසි කපා කොටිකා දෙකයි, අරළු දෙකයි, කුරුම්බා පුංචි එකයි කපා ඇතුලේ ලා සතියක් පසුකර එදියෙං කට සෝදනු. කට වන ගුනවෙයි.

අක්කාරං යන ලෙඩට

1. දිව ඉදිමී උනත් ගැනී කතා කරන්ටත් බැරි වේ. එවිට
උක් දඬු යුෂ පතයි දොඩං ඇඹුල් පතයි
මුරුවට, වී කුඩු, පොල් හකුරු, පුස්කර
මෙකී දේ අඹරා දමා කකාරා ගානු. පොවනු. ගුනවෙයි.

2. කරල් ශැබෝ මුල් වල පොතු දියෙං අඹරා දත් අනුවල විදුරු මස් අස්සේ පත්තු කොට තබා තුන්වේලකිං අහක දමනු.

3. කළු දුරු මදක් බැද චූර්ණ කර තත කිරිං අනා දිවෙ ගා මැලියං අරිනු.

4. ඊරිය කිරිත් තල තෙළුත් එක්ක සරිවි කර ඇහිල්ලෙ ගා අරිනු.

5. ගැඩිඹ පොතු යුස ගෙන ඇහිල්ලෙං ගා අරිනු. කිරි මැලියං නසා

6. පුස්කර පොඩිකර දිවෙ ගානු.

7. දිය බෙරලිය කොල පොල් කුඩු එක්ව තබා මිරිකා ගත කුකුරුමාන් ගෙඩි අඹරා දමා පල්මානික්කං කාලක් ගෙන අඹරා දමා සිඳගත් තෙල දිවේ ගානු. අක්කාරං යන ලෙඩට ප්‍රශස්තයි.

යක්‍ෂ දිෂ්ටි කතා කරන්ට බැරිව යාම.

දෙමට පොතු අඹු පොතු, මුල් කයිල පොතු තොටිල පොතු
වැල් පෙනෙල හරං කහ වද කහ කලු හබරල අල
මෙකී යුස පත පත ගෙන රං තැඹිලි කිරි ගෙන කකාරා දෙවලල්ලක් අඩුකර මීට

තල තෙල් දුම්මල තෙල් අබ තෙල් නිඹ තෙල්
මී තෙල් එඬරු තෙල් ගිතෙල්
පත පත ගෙන වක්කර මීට
දෙදුරු ත්‍රිවග්ග තිප්පිලි දේවදාර
වැල්මී කිරි ගරුඩ ශාස්ත්‍ර වේලි

මේවා කලඳ කලඳ මීට රත්‍රං මංචාඩිතුනයි යකඩ, පිත්තල, ලෝකඩ, වානේ, යබර මේ දෙකලඳ කලදයි පලමු යුසිං අඹරා යොදා ආරක්ෂා කර දෙහි කපා කන්‍යා නූල් බැඳ උඩුවියං බැඳමල්බුලත්තටු ව තනා පේ කරනු. ලනු පදමට බා තබා සියළු යක්‍ෂ දිෂ්ටියට පාත් අවුලනු. නලල තිලක ලනු. උගුරු කංඩමාල රෝග සියල්ල ඇරේ.

උගුරේ රෝග

1. මාසක්කා කුකුරුමාන් ගෙඩි පල්මානික්කං සවින්ධව ලුණු
සීතක්කාරං තිප්පිලි ඉඟුරු මිරිස්
කළු දුරු

දොඩං ඇඹුලෙන් අඹරා කැමති රෙද්දක රඳා දෙහි ඇඹුල් ගල්වා හක්කේ තියා ඉඳිනු. කෙල ගිලිනු. සෙම් කැපී යේ .

රසදිව දික්වීම

2. තිප්පිලි කළු දුරු සාදික්කා තිපල්
කුඹුරු මුල් පුපුල තික මුල් සුදු පිටවක්කා මුල්

මේවා අඹරා දිය කර කායන් පදමට තකාරා පදමට උක්පැනි පතක් එක්තර කායන් දෙනු. ඇඹුල සීතල කැම නොදෙනු. රසදිව දික්වීමටය.

දිව පල්ලේ දිව හා දිවේ රෝග

1. වලහසාල් මුඩ මහන කොල තිපල් කටුක
සවින්දව

එක්කර රත් නෙටුල් මුල් යන මෙකී දේ වියලා සුනු කොට ගෝ මුත්‍රයෙහිලා ලේහ පදමට පිස ගෙන දිව පිට ගානු.

උගුරේ රෝග, හනු ඉදිමීම, හක්කේ ඇතුලත ගෙඩි.

කළු දුරු සුදුදුරු ඉඟුරු මිරිස්
සුදුළූණු පල්මානික්කං මී මුරුවට තිප්පිලි

මේ දේ කුඩු කර පොට්ටනි බැඳ කඩ පිම්මේ උයා හක්ක තවනු.

ශෙමට කට ශෝදන්ඩ කසායට

1. සමන් පිච්ච කොල තුන් කලඳයි අමු ඉඟුරු තුන් කලඳයි අරළු තුන් කලඳයි නෙල්ලි තුන් කලඳයි අට පත එකට සිඳුවා මී පැනි දමා කට සෝදනු.

2. අනෝදා කොල තම්බා මී පැනි දමා කට සෝදනු.

රශ දිය කා තිබුනත් දත් වලින් එලියට වැටෙයි.

දන්ත පිලිකාවට

1. සාදික්කා අරළු කයිප්පූ කෝවක්කා
ගෙන තෙලෙං අඹරා රෙද්දේ රඳා කටෙහි තබා ඉඳිනු.

දන්ත පිලිකා කුණු කැපෙන්ඩ

2. පල්මානික්කං, සීනක්කාරම්, ලුනු අළු පල්ලෙ උයා ගෙන එය සිතිඩව අඹරා රෙද්දෙ රඳා කට ඇතුලෙ තබනු. කුනු කැපේ.

ඊට
පිටට පත්තුවට බේත්

3. පෙරුංකායත් මුදු ලුනු බිං දුම්මල කිකිළි බිජු
නානුවෙන් අඹරා ගානු. දන්ත පිලිකෙටයි.

ඊට
4. අත්තන ගෙඩි සාරා අබිං බටු ගෙඩියක් පමන තිබ්බටු ඇට එල බටු ඇට මෙකී දේ අත්තන ගෙඩියලා උන අළුවෙන් උයා අඹරා දත දිගට තියා ඉඳිනු.

දත් වැයාට

1. වරා කිරෙන් දත් මදිනු.

දත ඇතුලෙ ගඩු වලට

1. මිරිස් මුල් හිඟුරු පට සවින්ඩව එනු ඉඟුරු
දොඩං ඇඹුලෙං අඹරා කටේ තියා ඉඳිනු. ගුණවෙයි.

ඊට තෙලට
2. එනු වරන අංකෙන්ද පොතු
පොල් එක්ක කොටා මිරිකා ලිප තබා කැකෑරෙන පදමට
කළුදුරු සුදුදුරු සවින්දව වෙඩි එනු
සීනක්කාරං පල්මානික්කං සාදික්කා කරාබු
වසාවාසී ඉඟුරු මිරිස්
කුඩුකර තෙලට දමා ලනු ඇඹරෙනා පදමට බා තබා තෙල් රෙද්දෙ රඳා හක්කේ තියා ඉඳිනු.

හකු පිලිකෙට

අට්ටික්කා කිරි　රුක්අත්තන කිරි　එරා කිරි　දුම්මල
කිතුල් හකුරු එක්ක අඹරා ගානු.

කුරුලෑවලට

හක් ගෙඩි, කරපිංච නැටියි දෙහි ඇඹුලෙන් ගලේ උරච්චි කර කුරුලෑ වල ගානු.

ඉස කෙයියා උගුරේ පැටලුනාට

අළු කෙහෙල් අල තුල් නැර සීන් කර ලියා කහ ලුනු ලා මලවා බත් එක්ක සහ යහමින් තිකතුත් කඩ හොඳයි.

දිව පල්ලේ දිවට

තිකුළු　තිපල්　සවින්ධව ලුණු　කසා
රත් නෙටුල්　මුඩ මහන කොල
මෙකී දේ සම භාග ගෙන චූර්ණ කර ගොමුත්‍රයෙලා පදම්ට කකාරා පාන්පියලි දිවපල්ලෙන් තබනු.

දත් සවිවීමට

1.. තිඹිරි　කුඹුරු　ගිරිතිල්ල　නල
කුඹුක්　අත්තික්කා
මෙකී පොතු හා මූල කී හතරෙන් මුල් හා සරිසෙ ගෙන තෙරපා දිය අට එකට කකාරා කට සෝදනු. දත් තරවේ.

2. සපු දඬු, සියඹලා දඬු, කුඩා කුඩා කොට කපාලා ගිල් සැලියෙකින් තෙලම් පෙරා දත් මුල ලනු. දත් මැදී ඔප වී දත් තරවේ. ගන්ධ නැති වේ. දත් මුල් මස් ලා සවි වේ.

3. කටු කරඩු　කරල් ශැබෝ　බැබිල　මිගුල් කරඳ
මෙකී මුල් තලා අඹ පොත්තේ කිරෙන්. අරළු කොටිකා කයිප්පු උරච්චි කොට තල තෙල් කපුරු ඒක්කොට මුල් සැටියේ ගල්වා දත මැද උලනු. සත් දිනෙන් දත්මුල් සවිවේ.

කනේවන සියළු රෝගයනට

1. කලාඳුරු අල, අංජන කැට අඹරා මී පැනියෙන් අනා ගා අදිනු.

2. බෝ පොතු   දිවුල් පොතු   නුග පොතු   ඇශටු පොතු
පුලිල සම භාග ගෙන කකාරා කශාය පෙරා ගෙන මේ දිය මී පැනි එක්කොට දවශ දෙතුං පැයකට වරක් ශෝදනු.

දත් හිරි වැටුනාට

1. කල තෙල් උනුකොට කටට ගෙන ඉදිනු.

2. කල තෙලින් කට සෝදනු.

කටේ ලේ සැරවා ඇතිවිට

1. සිද්ධිගුරු   මිරිස්   වග පුල්
මී පැනියෙන් අඹරා මි පැනියෙන් අනා දිවේ ගා අදිනු.

කටේ බිබිලි

2. වලහ සාල්   ශෙංකොට්ටං   දේවදුරු   වග පුල්
අසමෝදගං   අරළු   රත් නෙටුල් මුල්
මෙකී බෙත් ශතර බැගින් ගෙන තෙල් නැලියට දිය කර වක්කර කකාරා පදමට බා පෙරා කට ශෝදනු. කටේ බිබිලි සොද වේ.

3. නුග පොතු   තිඹිරි පොතු   අත්තික්කා පොතු බෝ පොතු
ඇශතු පොතු
ශරියේ ගෙන කොටා දිය ශතරක් වක්කොට කකාරා එකට හෙලා නිවා කට ශෝදනු. කට වන ගුණවේ.

දත් වැයාට කෙම්

1. ගොඩ කිරිල්ල දළු කන අස්සෙ හැර අනික් ඇස පිට පැත්තේ උරච්චි කරනු.

2. වල්ලා මුල් හක්කේ තිබා ඉදිනු. දත් වැයාටයි.

3. සිද්ධිගුරු මිරිස් වග පුල්
අඹරා මී පැනියෙන් ගා අදිනු.
තල්ලේ අට ගන්නා රෝගයටත් මෙම පිලියන් කරනු.

4. පිච්ච කොල තල තෙලෙන් බැද තෙල් කටට ගෙන ඉදිනු. මෙම ලෙස කොල ශපා ගනු.

හැම මුඛ රෝගයට

1. කශා වෙනිවැල් ගැට
අඹරා එනුදියේ ලා කකාරා කට සෝදා දමනු.

2. කුරුඳු පොතු වලහ සාල් කොල්ලං කොල සිද්ධිගුරු
මිරිස් වග පුල් දෙමට පොතු
මේ බෙහෙත් සම භාග ගෙන දවා අළු ගෙන මී පැනි එක්කොට කට සෝදා දමනු.

දිව මුලද දකෙහිද රෝගයට

වරා මුල් කකාරා දියෙං කට සෝදනු. කීප පැයක් කටේ තියා කට සෝදා දමනු.

දිව මුල තොල කසා පැලී මල නැග තිබේ නම්

1. පිච්ච කොල වියලි කශා
ගෝ මුත්‍රයෙන් අඹරා මොලොක් කොට අනා තොල් කඩට දළු අඹරා මී පැනියෙං තොල ගා තිබනු.

2. කශා තල
ශම භාග ගෙන අඹරා මදක් මී ඉටි එක්කොට එලඟි තෙලින් සිද පදමට පෙරාගන ගානු.

3. තල තෙල් උනු කොට වාත නාශක බෙහෙත් කකාරා දමා ඒ කශායෙන්ද එලඟිතෙලින්ද මෙකී දෙඉන් කවලග්‍රහ කරනු. කවලග්‍රහ නම් කටින් කශාය ගෙන කට කුමුන්ද කුමුන්ද නැතක් නැතක් වේලා කර පශුව දමනු.

විදුරු මසින් ලේ ගැලීම

1. කුළු රත   කලාඳුරු   ලොවි කොල   කශා
දිය මිත්ත   ලොත් සුඹුලු   වතු වැල්
මෙකී බෙහෙත් වියලා සුනු කොට මේ බේහෙතින් විදුරු මස් උලනු. ලේ විදීමත් විදුරුමස් රෝගත් නසයි.

2. මුඛ වියලීම් ලේ වැගිරීම් පිතින් උපදී ඊට ගිතෙල් දියෙන් කවල කරනු.

3. සියඹලා කොල   කිදි   මිදිවැල්   කශඹිලියා
වෙනිවැල්   තිපල්

4: මෙකී බෙහෙත් කකාල කශාය මී එක්කොට සිහිල් වූ කල කවල ග්‍රහ කටයුතු මුක වියලීම් පැලීම් නැතිවේ.

උඩු තල්ලේ මුල ශෙලෙස්මායෙන් ගල ගන්ඩිකා නම් රෝගයෙක් උපදී. ඒ රෝගය තිකුළු, ශවින්දව, වද කශා මෙකී බෙහෙත් මී වක්කොට අඹරා ගල්වනු.

ශෙලේස්මාවෙන් උපන් මුඛ රෝගයට

1. වියන් දුඹුළු   තිකුළු
මීපැනියෙන් අඹරා මුකයෙහි ලනු. මුඛ රෝග නසා.

උගුරේ වන

1. රත්ත   ශුවස එනු   තිකුළු   කලාඳුරු අල
යවකාර එනු
මෙකී බෙහෙත් මී පැනියෙන් දිය කොට කටට ගෙන උගුරෙ හරිනු. උගුර වන, ගල ග්‍රහ ආදි වූ හැම රෝග නසා.

2. ශවින්දව   එන්ශාල්   මනෝශිල   මුද්දරප්පලම්
වෙනිවැල්
මෙකී බෙහෙත් සුනු කොට මී පැනියෙන් දිය කොට කවල ග්‍රහ කටයුතු.

3. එන්සාල්   කොල්ලන් කොල   කුරුඳු පොතු   මිරිස්
යවකාර එනු
කැල යන මෙතෙක් බෙහෙත්
අළු කර   අරළු   වගපුල්   සිවිය
සිද්ධිගුරු   රත්නෙටුල්   සීනි
මෙකී බෙහෙත් සුනු කොට පලමු දවූ අළු හා එක්කොට අඹරා ගුලි කොට මුඛයෙහි ලනු. උගුරේ සියළු රෝග නසා.

4. සුවශ එතු යවකාර එතු තිපල් තිකුළු
වලඟ සාල් සවින්ධව එතු
මෙකී බෙහෙත් සමභාගව ගෙන රත් තෙඹුල් මුල් එක්කොට බෙහෙත්, පොඩි කොට බෙහෙත් ගොමුත්‍රයෙහිලා කෙල ගිලිනු. උගුරේ සියළු රෝග නසා.

කට පැලීම්

1. ජාති සඳුං සීනි සමව ගෙන කසපැන් ලෙලි ඉස්මෙන් දිය කොට පෙරා කට සෝදා දමනු.

2. දිය බෙරලිය දඩු ඉස්ම ගෙන පොල් කිරිවත් කොට තෙල් සිඳ පෙරා තබා කට ගානු. කට පැලීම් වියළීම් ගඩු නැගීම් වලට යහපති.

දත් මුලෙහි වන රෝගයට

1. තිකුළු සුවස එතු යවකාර එතු
මීයෙං හනා ලේහ කොට ශෙං නගනු.

2. තිපල් රස අඩුං පුවඟු කුඹුක්
කෂාය කර එහි මී හෙව එම තෙක්ම කට මුකුන්දනු.

3. දන්ත පුප්පුටයේ කුණ වී නම් ලේහ කරනු. පශ්එතු මීයෙන් හනා ලේහ කොට ඉම්ම මුව දෝනෝ. ශිරෝ විරේක නශ්නද කරනු.

දත් ශැලුමට

1. සිද්ධිගුරු කරබටු යුස ශා ඇට (සැබෝ ඇට)
කපු පුළුනේ තබා දත් මුල තබා පිට තල තෙල් ගානු.

2. දැ සමන් කොල, බැදි තල එක්ව සපනු.

හැම මුඛ රෝගයට

1. කසා වනුවැල් ශබ
එතු දියෙහිලා කවල ග්‍රහා කරනු.

2. ලවග　සුඹුළු　හෙල් බිජු　සමල් පත්
තිකුළු　පස් කොල　දෙමට　කැල
දවා අළු ගෙන මීයෙහි තබනු ලේහ කරනු.

ක්‍රිමි දන්තයට

සිද්ධිගුරු සෙන්ධව මීයෙන් හනා ලේහ කරනු.

දිව මුල දත ශෙලෙවු රෝගයට

1. වරා මුල් කසාය මීයෙන් ගන්නේ මින්ම දෝනේ

2. කසා අළු මී තෙල් හනා ගල්වනු.

තොල් පැලීම්, වනවීම්.

1. ලා කසට දළු සියුම් කොට වඩාමීයෙන් හනා තොලේ ගල්වනු.

2. බෙරු, ඉඟිනි මුල්, වටා මී හෙව තොල ගල්වනු.

3. කසා, වැල්මී, තිත්ත, වටා මීයෙ හනා තොල ගල්වනු. මෙයින් සුව නොවුවේ නම් පූඩාවන් කවනු. වන වී නම් කරඳ බිජු ඉර මුසු මුල්, කොසඹ කොල දුම්මැල්ල කොල, වෙනිවැල්, මී ඉටි සමව ගෙන වටා එක්දා ගිතෙල සිඳ තෙල් ගානු.

මුවෙහි රුජා ඇතිව පැලී වනව රිදේ නම් :

වෙනිවැල්　කසට සුඹුලු　දෑ සමන් කොල　මුව කිරි වැල්
දැමිතිරිය කොල　පොල් කොල
සුනු කොට මීයෙන් ගාන්නේ　ලා වැටකේ
දත් කුරෙයි මස් වැඩි ගියේ නම්
අරළු සුනු කොට තබනු.
මුබ තික දියෙන් සෝදනු.

ශැලෙන දතට

මුන මල් පකක් දතින් සපනු.

ගලග්‍රහයට

1. වැට කොළු මුල් එළගිතෙලින් බැද සුනු කොට වලඳනු.
2. මෙම මුල් මුවෙහි ලනු.

ගල ග්‍රහ නම් උගුරෙහි වන රෝගයට ඊට පූර්ව හාගයෙහි බත් ගෙලෙහි ගනීනම් ඊට

3. අස්වැත්ත පුස්වැත්ත හෙල බටු කටුවැල්බටු
හෙල එඬරු තොටිල පළු ඇත්දෙමට
මිදි

මෙකී සුඹුළු කකාරා සහස්සෙක සිටි කල එක්දා ගිතෙල් ලහස්සක් හෙව සිඳ තෙල සිටි කල උදය මීයෙන් සත් දවසක් වලඳනු.

දත්තර වන්ට

කීකිරිදිය තිපල් කුඹුක් පඹුරු
සම කොට කසාය සිඳ මීයෙන් ගන්නේය.

කට හඩ වැඩීමට බැරුන්ඩියට

සැබෝ යුසයෙහි තික මුල් වියලා සුනු පතක් පමන එක්ව සිතිදුව අඹරා ගිතෙලින් බැද නොහොත් ගිතෙල්ලා කකාරාපු තෙල් මඩලයක් වලඳනු. එනු ඇඹුලු හරිනු.

දන්ත රෝගයට

1. ගැටතුඹ ගැටත් උඳුපියලිත් අඹරා තිබොල් කිරිත් තෙටුල් කිරිත් අනා දත මුල තබනු.
2. සඳුන් කුරුඳු කුඩුමිරිස මුල් අමු කහ
මේ හැම තලා අඹරා මුකයෙලා ඉදිනු. දත් රුජා දත ගඩු පොලද නැතිවේ.
3. ගිතෙල් තල තෙල් මී පැනි එළ කිරි
ගෝ මුත්‍ර යන මෙකී දේ සම හාගව මදක් උනු කොට ගන්ඩුස කරනු. දත් මුල් ලේ ව්‍යාදීන් දිව දඩු ගැසින්ද ශෙලෙස්මාද යන මෙකී දේ නසා.

මුඛ රෝගයට

1. **දී කිරි රෙද්දෙ බැඳ උඩ එල්ලා තබා වියැකුණු මොරෙන් කැප්පිටියා අඟුරු අඹරා ගාන්න.**

2. **ගින්නේරියා සහ මුලයෙන් ගෙන පොල් එක්ව තෙල් සිඳ ගානු. මුඛ රෝග කඩිවේගත් ගුනවේ.**

ගල රෝග නිසා වූ වමන

1. සඳුන් බෙලි මුල් මුරුංගා මුල්
කාඩියෙන් උරච්චි කර රෙද්ද ගා බෙල්ලේ වට දවටනු. වමනේ සිටී.

2. තිප්පිලි විලඳ සුනු කොට නස්නාරං ඇඹුල් සීනි මී පැනි එක්ව අනා ලේහ කරනු. වමන සිටී.

3. සියඹලා බොර ත්‍රිකටුක සවින්ධව
මෙකී දේ අඹරා මී පැනියෙන් අනා ලේහ කරනු.

4. තිප්පිලි මිරිස් ගල්මද විලඳ
මෙකී දේ චූර්ණ කොට නස්නාරං ඇඹුල් ගිවුල් ඉස්ම මී පැනි හා ලේහ කරනු. වමනේ සිටී. සෙම් අරුචි සිටී.

දත් සවි වීමට

1. පල්මානික්කන් කලන් 6 තිප්පිලි කලන් 2
තිත්ත අබින් කලන් 2 කයිප්පු කලන් 2
සවින්ධව කලන් 2 ලේවා ලුනු කලන් 2
මේ හැම චූණී කර දත් උලනු. දත් තර වේ.

2. තික බ්‍රිංගරාජ මිරිස්
මේවා සොරස නැලිය නැලියයි තල තෙල් එපමන වක්කර
මීට
තිප්පිලි සිරිතේක්කු වද කසා මුරුංගා මුල්
සුදු අබ දෙළුං හිඟු දියමිත්ත මුල්
ඉඟුරු මිදි මුල් සවිඳ කොකුං
කලං තුන තුනයි අඹරා තෙලෙහි කලතා මද ගිනිකර කකාරා සම පාකයට පෙරා මුඛයෙං අඩියක් ගෙන ගන්ඩුස කරනු. දිවෙහි සියළු රෝගද මුඛයෙහි ශට ශයක් පමණ රෝගද නසා.

නාස රෝග

1. කුරුඳු පොතු   එන්සාල්   නාමල් රේනු   කොල්ලන් කොල
වේලා චූර්ණ කොට ඉඹිනු. ප්‍රතිශ්‍යාවටයි. නාසයෙන් දියර ගැල්මටයි.

2. වලහ සාල්   සවින්දව එනු   දේවදාර
අඹරා තල තෙලට දිය කොට මද ගිත්තේ කකාරා පෙරා නශ්‍ය කරනු. සියළු නාසා රෝග ගුණවේ.

3. සිඩිගුරු වියලි කහ දෙකින් දොලොස් කලදක් අට එකට කකාරා පෙරා වග පුල් සුනු දමා දෙනු. ප්‍රතිශ්‍යා පීනස් ලේ දොස්. මන්දාග්නි ගුනවේ.

4. සිඩිගුරු   වග පුල්   මිරිස්   සවිඳ ලනු
සමව ගෙන චූර්ණ කොට උදය සවස වඩියක් පෙරා ගනු. නාසයේ ප්‍රතිශ්‍යා පීනස ඉසරදය දිය වැහීම් ගුණවේ.

5. නාසය තුළ ඇණයක් මෙන් මස් වැඩීමට
කුඩැල්ලන් කවා ලේ හැර
අරළු   එරඬු ඇට   හාතාවාරිය අල   වැල්මී
මී අරටු   සිඩිගුරු   සෛන්ධව ලුණු   වලහ සාල්
සමසේ ගෙන කල්ක කොට තල තෙලින් කලතා මද ගිත්තේ කකාරා මුදු පානයට පෙරා නශ්‍ය කරනු. පුළුතේ රදා තබනු. මස දිය වී යයි.

ධූප-1
6. මගුල් කරද ඇට   කුඹුරු ඇට   වෙනිවැල් පොතු   වියලි කහ
වද කහ, කපුරු   කළුදුරු   පෙරුංකායන්   අසමෝදගන්
දේවදාර   අගිල්   හඳුන්   එරඬු ඇට
මේ හැම ගෙන චූර්ණ කර රෙද්දක ලා පාන්කඩ අඹරා ගිතෙලිං අවු කවා අවුළුවා තිවා දුම් උරා ගනු.

මෙසේ දුම් පත් කල නාසා රෝග දස අටම සන්සිදේ.

7. පීනසට
රත් මල්   කරද   එනු වරණ
මෙකී පොතු පොල් එක්ක කොටා මිරිකා තුං දවසක් කකාරා ඉක්බිති
තල තෙල්   ගිතෙල්   තිඹ තෙල්
මෙකීවා වක්කොට කල්ක යට
දෙදුරු   හිංගු   අරලු   නෙල්ලි
අබ   මිරිස්

සම භාග ගෙන අඹරා තෙලෙහි කලතා කල්ක ලනු පදම වෙනකොට බා පෙරා සතියක් ඉස ගානු. තුං දිනක් වතුර වක්කරනු. විසි එකක් පීනස ගුණවේ.

8. රක්තාති තෛලයට
අමු කහ යුස පතයි දෙයි ඇඹුල් පතයි,මී තෙල් හපලමයි
කසා කුඩු එක්කලං හමාරයි
සම පාකයට කකාරා නශ්‍ය කරනු. පීනස ගුණවේ.

9. සුදුකාදී තෛලය
බෙලි මුල් යකිනාරං මුල් ඉරිවේරිය මුල් හපු පොතු
එරබදු පොතු නා පොතු හරං කහ වල් ඉඟුරු
කලුවා අල
මේවා පොල් සමග කොටා මිරිකා ලිප තිබා තුං දිනක් කකාරා ඉං පසු තල තෙල් මී තෙල් එඬරු තෙල් ගිතෙල් මෙකී තෙල් ගෙන පලමු කැකැරුණු කසාය තෙල් පාට උනු විට මේ තෙල් වක්කොට මීට
අරළු තෙල්ලි සාදික්කා මෝදගං
සිඩිගුරු වලහ සාල් අති විඩයන් මනෝසීල
රිදීතුත්තං දෙදුරු සුදුළුනු වසාවාසි
උලුවා දේවදාරු
සන්තිනායං මේවා සමව අඹරා තෙලෙහි යොදා කකාරා සත් දවසක් ඉස ගල්ලනු. සන්ධිපත්වල ගානු. සුදුකාදි තෛලයයි. පීනසටයි.

ධූප-2
10. හිරියල් මංචාඩි හතරයි තිප්පිලි මංචාඩි තුනයි
අරළු මංචාඩි හයයි
බුග යුසිං අඹරා එමෙං අනා රෙද්ද ගා පවන වියලා අකුලා නිඹ තෙලිං තෙමා පත්තු කර තිවා දුං උරනු. පීනස ගුනවෙයි.

11. වලහ සාල් සවිද වැල්මී දේවදාරු.
මෙකී බේත් සමව ගෙන කල්ක කර අඹරා එම බරට තල තෙල් සතර බරක් ගෙන කලතාමද ගිත්තෙන් කකාරා මුදු පාකයට බා පෙරා නශ්‍ය කරනු. නාසා පුටය නම් රෝගයද දුර්ගන්ද නම් රෝගයද නාසා වියලීමද නාසයෙහි අර්බුද ප්‍රතිශ්‍යා වෙන් වූ නාසයෙහි හට ගන්නා දහ අටක් රෝගද නසා.

ධූප-3
12. කරද කිරි පෙවු රෙද්දේ පාන්කඩ අඹරා තල තෙල් ගලා අවුලා ධූන් උරනු. පීනස ගුණ වේ.

ධූප-4

13. ශාදිලිංගං දෙකලඳයි අක්කරපට්ටා දෙකලඳයි
කරාබු , සාදික්කා වසාවාසී එක්කලං හමාරයි

මේ දොඩං පොතු වරා පොතු පනංපෙති කැප්පිටියා පොතු ශතර වගෙන් දෙකලඳයි, දිවුල් ලාටු ටිකයි වරා කිරෙන් අඹරා පොතු වේලා අඹරා දශ හතරක් ගුලි බැද උනු කටු අඟුරෙන් ධූං උරනු. ශතියක් එනු ඇඹුල් නොකනු. පීනස ගුණවෙයි.

ධූප-5

14. සඳුන් කුඩු වරා මුල් මුරුංගා මුල් කුරුඳු මුල්
කළුදුරු තික කොල දේවදාරු වී කුඩු
විල් දුම්මල සුදුදුරු

කඩදාසි රෙද්දක ඔතා අව්වේ තුන් දවසක් වේලා කුඩු කොට කුරුඳු ලී අඟුරෙන් ධූං උරනු. දවසක් ධූං නොපා ඉඳිනු. දවසක් ඇර දවසක් සතියක් දිය වක්කරනු. පීනස ගුණවේ.

ධූප-6

15. නාසයේ මස් වැඩුනාට
පෙරුංකායන් තිප්පිලි වසාවාසී කරාබු
වැල්මී අරත්ත පත්පාඩගන්

හිවුරු රෙද්දේ හැම බැද කොහොඹ තෙලෙං තෙමා ධූම් පානු. නාසයේ මස් වැඩුනා ගුනවේ.

16. එම ශෙලේස්මාවට
සුදු ළූනු වද කහ එනු පතයි මී මුරුවට
අඹරා හිහුරු පවේ ඉස්මෙන් දෙනු.

17. මිදෙල්ල මල් අත්තික්කා ගෙඩි අඹ පොතු පොල් මල්
මෙකී යුෂ තෙල් පතට නැලියක් ගෙන බාගයක් සිඳුනු කොට තෙල් වක්කර
සුදු එනු සුදුදුරු එන්සාල් වැල්මී
වග පුල්

මෙ කීවා අරික්කාල අරික්කාල ගෙන අඹරා දමා කකාරා පෙරාගෙන තබා ගනු. වාත ශිශු ශෙලෙස්මා සිඳුවාට නශ්‍ය කරනු. කන වක්කරන්න පානය කරන්න.

18. පුහුල් දිය හතරයි, සියඹලා කොල යුෂ නැලියයි
වරා කොල යුෂ හැලියයි මුව කිරිය යුෂ නැලියයි
සීනක්කාරං නැලියයි කොල්ලන් කොල, කුරුඳු පොතු
තික පොතු ගම් දූරිය පොතු කලාඳුරු අල වද කසා
නාමල් රේණු රත් නෙටුල් මුල් සිවිය මුල් නෙල්ලි සවින්දා

එන්සාල්   සුදු ළූනු   පල්මාතික්කම්   දේවදාරු
දෙවුඩුරු   අසමෝදගන් :   වග පුල්

මෙකී බෙහෙත් තුං තුං කලදයි, එඬරු තෙල් තල තෙල්, එලගි තෙල්, තුන් වගේ නැලියයි, සම පාකයට පෙරා පීනසට ඉසතෙල් බැඳි, ලැපැත්තේ තෙල් බදින්ඩ, නශ්‍ය කරන්ඩ. යහපති.

19. ත්‍රිස්ථවාළු මුල්   තික මුල්   කුඩු මිරිස් මුල්   ගිත්තෙරිය මුල්
කපු ඇට   සියඹලා පොතු

පොල් බැවක පොල් උත්තල යන්ත්‍රයෙන් තෛලම් බස්වා පල්මාතික්කම් සාදිලිංගම් හිරියල් සුනු කොට සුළුනයි. කොලෙන් අඹරා උදැසන තෛලමුත් එක්ක වලදවනු. පීනසට තෙල් .... යහපති.

20. රසදිය   අසමෝදගන්   තියහලා අල   වේලා ලශුන
වරා මුල් පොතු, දෙහි පොතු,

වතලා කොටා යුසයෙන් බෙහෙත් අඹරා ඉයිං ධූං ගුලි බැඳ සතියක් ධූං පානු. ඇඹුල් ළූනු වලකිනු.

21. ඉරුවා රදේට
සාදිලිංගම් දෙකලදයි   මනෝශීල කලදයි තුත්ථං බාගයයි.
තුරිසි කලදයි   ලාකඩ කලදයි   වරා මුල් වල පොතු

වේලා එකට අඹරා කුඩු කර සත්ද වසක් දුං පානු. තුං දවසක් දිය වක් කරනු. ඊට පස්සේ උනු දිය වක්කරනු. ඉරුව රදේ ගුණවේ,

22. පීනසට
සිඞිගුරු   වේලා   සුදු දුරු   සුදු ළූනු
වේලා   අරළු   කසා   මිරිස්

සිතිඳු කොට අඹරා තබා දුම්පානු. මූං ඇට පමණ ගුලිකන්ටදෙනු.

23. නාසෙන් දළුව එනවාට

23-1 අබිං   පෙරුංකායත්   සුදු ළූනු ගෙඩි දෙකයි

මේවා අඹරා නාස් දළුවෙ තබනු. ගුණවෙයි.

23-2 අන්කෙන්ද   තිඹිරි කොල, පොතු

කොටා මිරිකා මීට තල තෙල් වක්කොට පොල් තෙල් වක්කර කැකෑරෙන පදමට
සිත්තක්කාරං   රිදී තුත්තං   පල්මාතික්කන්   බලල් ළූනු
සවින්ඩව   පෙරුංකායං   සුදු ළූනු
අඹරා ඊට යොදා පදමට සිඳ බා නාසේ දළු එනවාට ගානු.

23-3. කුරුඳු පොතු   එත්සාල්   තාමල් රේනු   කොල්ලන් කොල
වේලා චූර්ණ කොට පොට්ටනි බැඳ තවනු.

23-4. කළු දුරු අඹරා පොට්ටනි බැඳ ඉඹිනු.

24. වලඟ සාල්   සවින්ධව ලුනු   වැල්මී   දේවදාරු
අඹරා තල තෙල දමා දිය කොට මඳ ගින්නේ සකාරා පෙරා නස්‍ය කරනු. සියළු නාසා රෝග ගුනවේ.

25. සිඩිගුරු   වේලි කසා
දෙකිත් දොලොස් කලඳක් ගෙන දිය අට පතක් එකට හෙලා සකාරා වග පුල් සුනු එහිලා දෙනු.

26. මිරිස් පොඩි අඟුරු කබලට දමා නාසයට දුම් උරනු. ප්‍රතිශ්‍යා නැතිවේ.

27. කරල් සැබෝ ඇට සුන් කොට තල තෙලට දමා සකාරා පෙන පැහෙන විට ගෙන නස්‍ය කරන්න.

28. සිඩිගුරු   සදුන්   වග පුල්   මිරිස්
සවින්ධව ලුනු   අමු කපුරු
සමසේ චූර්ණ කොට උදෑසන සවස මංචාඩිය මංචාඩිය බැගින් උරා ගනු. නාසයෙන් දිය වැගිරීම් කිඹුහුම් ප්‍රතිශ්‍යා ඉසරද, නාසයෙන් ලේ යනවා ගුණවේ.

29. නාසයෙන් ඇතයක් මෙන් මස් වැඩේ නම් පූඩාවත් කවා ලේ හැර
එවරු ඇට   තෝර ඇට   අරත්ත   හාතාවාරිය මුල්
වැල්මී   ගොකටු   මී අරටු   සිඩිගුරු
සයින්ධව ලුනු   වලඟ සාල්
සමසේ ගෙන මෙකී දෙය කල්ක කොටා කලතා මඳ ගින්නේ සකාරා මෘදු පාකයට බා පෙරා නස්‍ය කරනු. පුළුනේ රදා දවනු. වීකායේ අත්දුටුවයි.

රටම.

30. කටුවැල් බටු   කිඳි ගැට   සිඩිගුරු
කුඩින් නව කලඳක් ගෙන සකාරා කසායට වග පුල් සුනු ලා පොවනු.

31. නාසා ගැලුනාට කහ කිරි වැල්මී එක්කොට නස්‍ය කරනු

32. කිසිසි මොණර දුව මී හා පොල් කිරි නස්‍ය කරනු.

33. කළු දුරු පිල්ලේ දුම් උරනු.

34. නාසා රත්තයට

සඳුං
සුවඳ හොට
වම්මුතු
ඉරිවේරිය
හානාවරිය,

ඇල් පැන වටා ඉස ගල්වනු.

35. නාසා ශ්‍රාවයට

අරළු හා ගැට කසා තලා කසාය ගෙන එම කල්ක හා මී තෙල් කකාරා බඩ පුරා උදය බත් කවා බත් පිට නස්‍ය කරනු.

36. කතුරු කොල යුස තල තෙලිං කල්කයට සවිඳ ලුනු ලා පදමට කකාරා නස්‍ය කරනු. පීනස ගුණවේ.

37. නාසයෙං ඇනයක් මෙන් බසිනවාට, පුඩාවත් කවා ලේ අරවා

එඩරු ඇට
වැල් මී
සවින්දව
තුවරලා
ගොදිවු
වලහ සාල්
දැත්ත
මී අරටු
සාතාවාරිය මුල්
සිඩිගුරු

මෙකී දේ කල්ක ලා සිඳ ගත නස්‍ය කරනු.

38. කරද ඇට
දෙකසා
මෝදගං
එඩරු ඇට
කුඹුරු ඇට
තිත්ත කපුරු
දේවදාර
මී ඇට
කළු දුරු
අගිල්
වෙනිවැල් පොතු
හිඟු
සඳුං

මේ සමව චූර්ණ කර රෙද්දකලා පාංකඩ අඹරා ගිතෙල් තලා අවු කවා අවුලා නිවා දුං උරනු. මෙම ලෙස දුං ගත් කල නාසා රෝග දහ අටම නසයි.

39. නාසය ඇසුරුනාට

ත්‍රිකටුක
හිඟු
වද කසා
ගුගුල්
තිප්පිලි
රත්හිරියල්

සුනුකර දුම්පානු.

40. ඊටම

ත්‍රි කටුක
සවිඳ
අමු කපුරු

සරිය ගෙන සුනු, කොට සවස උදය මංචාඩි එක තමාරක් බැගින් නස්‍ය කරනු.

42. ඊටම,

එල මීදෙල්ල ගෙඩි ඇල් දියෙං නස්‍ය කරනු.

43. හිඟු
වලහ සාල්
වැල්මී
සිඩිගුරු

කොට්ටං සමව ඇල් දියෙන් නස්‍ය කරනු.

44. **පීනසට**

ලිහං දෙකලදයි   තිප්පිලි දෙකලදයි තුං බෝ
අත්තන කොල සකලදයි

මේ චූර්ණ කර දහ හතරට බෙදා කඩදාසි කොලවල අකුලා පොල් කොලවල සුහානම තතා දහ හතර වේලක් දුන් බී දවසක් ඇර වතුර වක්කරනු.

45. පීනසට
දේවදාර   මුරුංගා   වද කසා   දෙදුරු
මෝදගං   වලහ සාල්   කුරුදු පොතු   තික දළු ඉස්ම

ගෙන අඹරා බුග යුසිං තුං වරක් වේලා තෙමාගත් රෙද්ද තෙමා බේත් රෙද්ද තෙලට දමා තිඹ තල එඬරු මෙකී තෙල් තුං තුං වර තෙමා වියලා අගුලක් කපා අහුරෙලා නාසයට දුම් පානු. පීනස ගුණවේ.

46. ඉස කරප්පනට පොල් තෙල් වෙඩි බේත් ගානු. සවස උනු දිය ඉස වක්කරනු.

47. ඇඹුල්   ඊතන   අබ   රතු ළූනු
ඉස්ම නස්‍ය කරනු. නාසෙං වැගිරෙන ලේ නවති.

48. නාසයෙන් ලේ යනවාට
අමු ඉඟුරු පතක් ගෙන අට එකට කකාරා දෙනු.

49. නාසයෙන් වැගිරෙන රක්තයට
සක් බෙලි ගුරු එක්ක අඹරා ගත් කල්කය වැල්මී කල්ක හෝ තන කිරිං නස්‍ය කරනු.

50. දෙළුං මුල් යුස හෝ ඊතන යුස හෝ අබ ඇට යුස හෝ රතුළූනු යුස හෝ මෙයිං ලැබුනු දෙයක් තන කිරිං නස්‍ය කරනු. නාසයෙං යන ලේ නවතී.

51. නාසය ඇතුලෙ හිකනල් වලිගෙ සේ වැඩෙනවාට
පාසානං   ජයපාල
එඬරු තෙලිං අනා රෙද්දක ගා නාසය ඇතුලේ තබනු.

52. සිඩිගුරු   මිරිස්   තිප්පිලි   සවිඳ
අමු කපුරු
සරිය ගෙන සුනුකර උදය මංචාඩි එකක් උරනු.

නාසයෙං ලේ යනවාද ප්‍රතිශ්‍යාද කිඹිසුම් ඉසේ රුජාද ආදී රුජාද නාසිං දිය වැහෙනවාද අසුවක් ඉසෙ ලෙඩද විගසිං සංසිදෙයි.

53. කතුරු කොල යුසයේ සවින්ධව එනු ලා කකාරා ගත් කල්කයට තල තෙල් දමා නස්‍ය කරනු. නාසෙං ලේ යනවා සරව යනවා නවතී.

54. පීනසට
කොකුං අඹරා ගිතෙලං නස්‍ය කරනු. පීනස නැතිවෙයි.

නාසයෙං ලේ යනවාට

55. දෙළුම් මල් ඉත්ත, අබ ඇට මද තල වෙන වෙන නස්‍ය කරනු.

56. ප්‍රතිස්‍යාවට සමං මල්, කොල, නස්‍ය කරනු.

57. නාස සරවට, කටුවැල්බටු මුල් දැත්ත අල මුරුඟා පොතු කුප්පමේනිය, සවිදව සම බාග ගෙන තල තෙලින් මුදු පාකයට සිද නස්‍ය කරනු

58. මීටම තිකුළු අරළු චූර්න කර ඉඃ කලදක් තල තෙලිං වලදනු.

59. මීට ඉඟුරු වියලි කසා දෙකින් තුං කලදක් කස පැං දියෙං දෙනු.

60. වැල්මී තනකිරි නස්‍ය කරනු.

61. නාසයෙන් ලේ යනවාට
සඳුන් සුවඳ හොට වම්මුතු ඉරිවේරිය
කසා අඹරා ඉසේ ගල්වනු.

62. නාසයෙං ලේ ඇනයක් සේද එයි. එම ලෙඩනං කුඩැල්ලං කවා ලේ හරිනු.

63. ඊටම
එඬරු ඇට
සාතාවාරිය
සිඩිගුරු
තෝර ඇට
වැල් මී
සවිද ලුනු
දැත්ත
ගොදිවු
කසා
මී අරටු
සිදගත් කල්කය නස්‍ය කරනු.

නාසයෙං ඇනයක් සේ එනවාට

පුඩාවන් කවා ලේ හැරි අරත්ත එඬරු ඇට තුවරලා සතාවාරිය ගොදිවු මී අරටු, සිඩිගුරු, වලගසාල්, සවිද, සමග සිදගත් තල තෙල නස්‍ය කරනු.

කිබිසුං වැඩිය ඒනම්

1. තිකුළ සුනු නාසයට පිඹිනු.
2. කළු දුරු පියලෙලං දුන් පානු කිබිසුං රෝග නසයි.

නාසයෙන් ලේ යනවාට

දෙළුම් මල් ඊතණ අබ ඇට මද තලා
වෙන වෙන නස්‍ය කරනු.

නාස සැරවයට

කටුවැල් බටු මුල්, දැත්ත අල මුරුංගා පොතු කුප්පමේනිය
සවිඳැව
සම භාග ගෙන තල තෙලින් මෘදු පාකයට සිඳ නස්‍ය කරනු.

පීනස පූතිනාශයට

කුළු ඇඹුල් මහළුවෙන් බත් කවනු. ශෙත් නසනු.

නාශා පාකයට

පිතට හිත දූ කරනු. පශකුළු තෙල් ගානු. පශකුළු දියෙන් ප්‍රශෙක කරනු.

පූයා රක්තයට

රත්පිතට හිත් දූ කරනු. ක්‍ෂව ශුස්තු දෙකට එනු ගිතෙල් අනා ධූං දෙනු. විරෙක ස්වෙද කරනු.
දහයට තෙල් පොවනු. බැලිල තෙල් ගානු.

නාශා පරවියට

විරෙක කරවනු. පැහුතිං ධූං දෙනු.

නාසා රක්තයට

සදුං, සුවදහොට, වම්මුතු, ඉරිවේරිය, හැල් පැන වටා ඉස ගල්ලනු.

නාශා ශොෂයට

කිරිතෙල් ගානු. මෙම වරනුතෙල් මුශු රස පොවනු.
සෙනහා ස්වේද කරනු.

පූති නාශයට

1. අඹ ඇට පෙලා ඉශ්ම ගෙන නශ්‍ය කරනු.
2. මීටම වග පුල්, මිරිශ්, සුවද තලා මද, උපුල් කොල කොටා, ශියුන් කර වටා ගිතෙල් බැඳ පෙරා නශ්න කරනු.

ප්‍රතිශ්‍යාවට

1. මිරිශ්ශුනු හා උක් හකුරු අනා බත් කනු.

නාශයෙන් පහන් දිය බශී නම්,

2. දෙවුදුරු, රත් තිවුල් මුල්, හෙල කිරි, කකාරා පොවනු.

3. මීටම පහං ගිතෙල, වග පුල්, මී මුශුව පොවනු.

4. පඹුරු මුල්, දෙඩං මුල් පොතු, ශුධු එනු, ශවින්දව, ගිතෙල් බැඳ කවා ශෙන් නගනු.

5. දෙක දෙක දෙකශා. අරළු, දෙවුඩුරු, තිකුළු, බැවිල, දෙමට, වලහ ශාල්, තල මුල්, දෙඹුරුද මෙ හැම ශතර ලාශක් දිය හෙව කකාරා ලාශෙක ශිටුවා මුල් පෙරා කශාය ශුරකිව වලඳ වනු. නශ්‍ය කරනු.

6. වංමුතු, ගොදිවු, දිය මිත්ත, කැකුන පත්, මිරිශ්, වද, අබ, වග පුල්, දෙළුං, ශවින්දව, රත් නෙවුල්, කරඳ ඇට කකාරා තල තෙල් ශිද නාශයෙන් ගන්න. වා:ත වැදියට හදුල පිළියම මිටත් කරනු.

7. තිකුළු, අරළු ශුනු, තල තෙලිං වලඳනු.

8. ශක්‍රා හෝ හකුරෙන් තිකුළු ශුනු වලඳනු.

9. කටුවැල් බටු, කිඳි ගැට, ශිද්ධිශුරු, තුතින් නව කලදක් ගෙන කශාය කකාරා වග පුල් ශුනු ලා පොවනු.

10. එකී බතට සුළු බුරුද, ශිංකෙන්ද, උනු හගුළු පලා, හෙල බටු, තිබ්බටු, මිරිශ් කොල, අළු කෙසෙල්, මුං රස, එලගිතෙල්, මෝරු ආදියෙන් බත් දෙනු.

නාශා ගැශුනා,

වැල්මී තත කිරි නශ්‍ය කරනු.

1. කිඹිශි බොහෝ උව, මී හා පොල්කිරි නශ්‍ය කරනු.

2. මීටම ධූරු පියල්ලෙලා ධූන් උරණු.

නාශා ශැරවයට

අරළු හා ගැට කශා කකාල කශාය ගෙන එම කල්ක හා මී තෙල් හෙව කකාරා බඩ පුරා උදය බත් කා බත් පිට නශ්‍ය කරනු.
ශවස ඉත්ත කෙන්දක් නාශයේ එ කලකිඹිශ්ම හා ශමග අරළු වංග යිශුනු තෙල් කිප වේලක් වත ශුව වන්නට, එම තෙල් නාශයේ ලනු. ප්‍රතිශ්‍යා වාත වූව හෙල එහුනු ලා බත් දෙනු.

11872

ශෙලෙස්මාජ වූවට

ශවින්දව, ගිතෙල් අනා කවනු.

පිත්තජ වූව

කටුවැල් බටු, සිද්ධිගුරු, කිදි ගැට පලමක් ගෙන කකාරා පැන් පලම ගෙන උක් හකුරු මැඩ පොවනු.

කිඹිසි බොහෝ වූව ඇනු තෙල හනා ධූං දෙනු.

පූති නාශා රෝග

1. කටුවැල් බටු, දූත්ත අල, වද, මුරුංගා අල, තලා, තිකුළු, ශවින්දව, ශමසේ ගෙන තල තෙල් මධුපාකයේ ගෙන ශිද නශ්න කරනු. පූති නසා රෝග හැරේ.

2. එත්ශාල්, කොල්ලන් කොල, කුරුඳු පොතු, නා කෙශරු, මෙකී බෙහෙත් ගෙන පොඩි කොට කළු ධුරු හා කබලකට අඟුරු උකා පොඩි කොල බෙහෙත් එහිලා නැගි ධූං නාශයෙන් උරනු.

3. ශිගුරු පියලි, නෙල්ලි, තිකුළු, මෙකී බෙහෙත් චූර්ණ කොට ශකුරු මුශු කොට එලගිතෙල් බාගයකට දිය ශතර බාගයක් එක්කොට ඇඹරු බෙහෙත් එහි ලා තෙල් ශිද වළඳනු. ලෙහි රුජා දලයෙහි රුජා හ්‍රිදයෙහි රුජා, බඩ රුජා යන මෙතෙක් රෝග නශා.

4. කටුවැල් බටු, දූත්ත අල, මුරුංගා අල, තල, තලා කොල, ශවීන්දව, මෙතෙක් බෙහෙත් අඹරා තල තෙල් බාගයකට දිය කර ශතර බාගයක් දිය එක්කොට තෙල් ශිද මධු පාකයේ දී බාගෙන නශ්‍ය කරනු.

සෑම ශිරෝ රෝගයට

1. මී හා ගිතෙල් නශ්‍ය කරනු.

2. මිරිකුළු, වලහ ශාල්, වැල්මී, කීකිරිඳිය යුශ, ගිතෙල් ලා ශිද නශ්‍ය කරනු.

3. කීකිරිඳිය දළු, මුල්, මල්, තෙලි දියෙහි වටා නලල ආලේප කරනු.

4. එඬරු, වැල් පෙනෙල, කිඹුල් වැන්න, උඩුපර, බලා, කැලි, කිදි, වැටකේ අරළු, කීකිරිඳිය, මේ හැම කොටා තිය වටා පොහොනා හුනා හිශ ආලේප කරනු.

5. උක්, මී, තෙලි දිය, හුළු කන් පොවනු.

6. වැල්මී, ශධුං, අඹල තල, එඬරු ඇට, කිදි ගැට, උක් පැති, තන කිරිත් තෙල්

කශ පැත් ලොද එක්ක තල්ක කොට මඩයකලා දියෙහි තබා ඕගිල් කොට පලමුව ඉශ පිරුවා ඉශ නොවල ගල්ව ගල්වා තබනු ඉශ රුජා හැරේ.

ඉශ රුජාවට

1. තල පතක්, ශාල් පතක්, නොගරා මී කිරින් හෝ එල කිරි බත් පිශ, හෙල, පතක දෙමුලක් කොට බැද රුජා හරිනා තැන තවා තිවුනු කල පස්පලගා කාඩින් පිත බැද ඉතා බා හුනු කොට තබා තවනු.

2. වැල්මී ශතර අතක්, කුළු කුන්දම. දනක් වද දනක් ශිද්ධිගුරු දනක් පොඩි කොට එශ උක් පුරුකක දෙන කැන පොක්කහා හෙල වෙඩරු කැටියක් හා මෙකී බෙහෙත් දෙන ලා එම පියතින් වශා අගුරේ තබා කකියා ගිය කල එතෙල් පෙරා තබා කෝමාරික, කුඹුක් කොල, දෙහි කොල යුශ, ශමසේ ගෙන වෙන වෙනම ගෙන එක්කොට ඉශ ගල්වා ඉක්බිති මේ තෙලං නශ්න කරනු. පැයක් වීවර ගිය කල දෙලොස් කලදක් පැන් තමා ඉශිං නතිං වක්කර හෙල කිලනිම බත් කවා බත් පිට එම කිලං පොවනු. යම්ම ඉශ රුජාවන් වලකී.

3. ඇබෝකරල් බිජු ශුනු කොට තල තෙල් ශිද නශ්‍ය කොට ශශං හරවනු. සියළු ශිරෝ රෝග නශා.

4. හෙල එඬරු හා කුඹුරු කොල යුශ තල තෙල් ගල්ලනු.

5. ශිරෝ රෝගයට දෙසි කැල්ලක්, ශිද්ධිගුරු, ගෙනා ඇල් පැන ලවා නශ්‍ය කරනු.

6. හරිද, ඉඟුරු කොල එකපමණ ගිතෙලින් දුංලරනු.

7. කිකුළු ශුනු ලා හෙල මෝරිං මෙකී මුං රශ හෝ කලක් රශ හෝ පොවනු.

8. ශර්කරා, නොකුං ගිතෙලිං බැද නශ්න කරනු.

9. කුළු කැන්දම්, කශා, කලාබුරු අල, අරළු, වද, මේ හැම තන කිරි වපා සියල්ලේ ගල්වා වියලා තල තෙල් ගලා මුං පත් ශතකින් තැගි මුං උරනු.

10. ඉශ රුජා ඇත්තන් හට ඉශ තෙල් නෙගානු. ඇල් පැනින් ඉශ නො ශෝදනු.

පනුවන් විසින් වන ඉශ රුජාවට

1. කිකුළු හරද ඇට මුරුංගා ඇට, අඹරා ඇල් පැනින් නශ්න කරනු.

2. ඉරමුසු, මහතෙල්, වැල්මී, උපුල් කොල, විලිකුන් නියඹරා මදෙශ් අඹරා ඉශ

ගල්වනු.

3. එල ශඩුං, තන කිරිවත් කොට හා ශිද්ධිගුරු ටිකක් හා මල කුඩුඩම් කපුරු මුශුව තන කිරෙන් නශ්‍ය කරනු. ශෙන් ගිය කල නැවතත් නශ්‍ය කරනු.

4. විලිකුන්, කුකුරු කොල අඹරා අමු කපුරු කොල මුශුව තන කිරෙං අනා නශ්‍ය කරනු. ඉශ විරෙකයි.

කෙස් කලුවීමට,

1. නෙල්ලි ඉශ්ම මනාවයි, කීකිරිඳිය ඉශ්ම මනාවයි, එලගිතෙල් නැලියයි, වැල්මී පලමයි, හිශ සෝදනු. සුධු ඉසකෙස් කළුවේ. දත් සවිවේ.

2. තැඹිලි ගෙඩි තුනයි, සැවැන්න මුල් කලන් තුනයි, සුදු සඳුන් කලන් තුනයි, කළු දුරු කලන් තුනයි, වතුර නොතිබෙන්ඩ කර නොකර ශිද ඉශ ගානු. නස්නයට එලගි තෙල් තන කිරි, තල තෙල්, අමු ඉඟුරු ඉශ්ම බින්දු තුනක් උක් පැති මේවා ශේරම එක පදමට ගෙන යන්තන් රත්කරනවා එලිගිතෙල් ටික උනුවෙන පදමට හොදයි.

ඉශ කුඩිව්වියට

ඉඟිනි ඇට, නෙල්ලි, උඳුපියලි සහ මුලින් කලන් හතර හතරයි, එලකිරෙන් ශිතිඳුව අඹරා එල කිරෙන් දිය කර ඉශෙ දමනු.

කාස ශවාස

1.

දියමිත්ත, සිරිතේක්කු, සිඩිගුරු, මුරුවා, දේවදර, ආඩතෝඩා, රසකිඳ, එලබටු යන මේවායින් කකාල කෂායෙහි වගපුල් චූණිය ප්‍රතිවාප දමා දෙනු. කාසශ්වාස, උර්ධ්ව වායු මේ හැම සුවවේ.

2.

මිරිසට දසයයි, අරළු ගෙඩි යයි, මෙ හැම උනු දියෙන් කලතා රාත්‍රියෙහි පොවනු, කාෂ ගුනවේ.

3.

පැසි ජිවුල් හයක් ගෙන ඊට අඩි භාගයක් මනෝසිල ගෙන මෝරුවෙන් අඹරා එම බෙහෙත් ලා පාන්කඩ අඹරා අවුලා තිවා දුම් පානය කැර පසු මෝරු බොනු. පංචකාශ ගුණවේ.

4.

වරාමුල් පොතු, පලමුවෙන් අඹරා එසේම දුම් බී එම විදි කරනු. කාෂ ගුණවේ.

5.

කලාඳුරු අල, අරළු, නෙල්ලි, වගපුල් යන මෙයින් ඇඹරු චූර්ණය හෝ නෙල්ලි, වගපුල්, කලාඳුරු අල, දේවදර, සිද්ධිහුරු මේ හැම මීන් ඇඹරු චූර්ණය හෝ රත්නෙටුල් තිප්පිල මුල්, ඇත්වගපුල් මෙයින් ඇඹරු චූර්ණය හෝ මේ ලේහ තුන මී පැති එක්කොට වෙන වෙන දෙනු. ශ්ලෙෂ්මා කාස ගුණ වේ.

6.

වැල්මදට, අංජන කැට, මුරුවා, රත්නෙටුල්, දියමිත්ත, තිප්පලී, කහ මේ හැමින් අඹරු චූර්ණය මී පැණි එක්කොට දෙනු. ක්‍ෂත කාශ, ක්‍ෂය කාශ ගුනවේ.

7.

මීට, මනෝසිල, සවින්දව එනු, තිකුළු, වළහසාල්, කොට්ටම්, පෙරුංකායම්, යන මේ හැම චූර්ණ කොට මී පැතියෙන් ලේහ කරනු. කාස, ශ්වාස, ඉක්කා ගුණවේ.

8.

මීටම, විළඳ, නෙල්ලි, දේවධාරු, බැලිල, අරත්ත තිපල්, තිකුළු, පියුම්අල, වලහසාල් මේ හැම චූර්ණ කොට සීනි සමකොට කනු පංච කාස ගුණවේ.

9.

විලඳ, නෙල්ලි, තිප්පිලි, සිඩිහුරු, අරළු, සීනි, මීපැති, තලතෙල්, මේ හැම අඹරා ලේහ කරනු. පංච කාස ගුනවේ.

10.

තිකුළු, තිපල්, කුකුළු සුහු කොට්ටම්, සෛදළුනු, සීනි, එලබටු මේ හැම චූර්ණ කොට මීපැතියෙන් ලේහ කරණු. පංච කාශ ගුණවේ.

11.

සිඩිහුරු, වදකශා, අරළු, යන මේ කල්ක හෝ අරළු කල්කයෙන් කලතා දෙනු. සියළු කාෂ ගුණ වේ.

12.

පෙරුංකායම්, වදකහා මේ කී දේ එල කිරෙන් කලතා දෙනු. කාස ස්වාස හික්කා මන්‍යස්තම්භ ගුණවේ.

13.

මීටම, කපුරු, ලොත්සුඹුලු කපුකිනිස්ස ඇට, සාදික්කා, තොල්ලන් කොල, මේ සම භාග ගන්ධත් නාමල් රේනු, කරාබු, සිවිය, මිරිස්, මෙකට එකක් වඩ වඩා

ගෙන චූර්ණකොට සීනි හා සමඟ දෙනු. ජ්වර, ගුල්ම අර්සස්, සෙම් රෝගත් මේ හැම් ගුණවේ.

14.

මිරිස් තුන් කලඳයි, ඊට සමාන යවකර ගෙන දෙක කොටා උනුදියෙන් බොනු. කළු ශ්වාස ගුණ වේ.

15.

අසමෝදගම, රසකිඳ, තිකුළු, රත්නෙටුල්, අරත්ත, පැපිලිය, වංමුතු, තිප්පිලි මුල්, මේ හැම පලම් බාගේ බැගින් ගෙන චූර්ණකොට සුධ වූ උක් සකුරු විසි පලමක් ගෙන ලිප තබා චූර්ණ එහි ලා ලේහ පදමට කකාරා තබාගෙන මාත්‍රා දැන ලේහ කරනු.
හුත් රෝහ දසය ද, ස්වාස ද, විෂම ජ්වරද අරිසස්, ග්‍රහනී, හික්කා, හක්තවෙෂද උදර, පාණ්ඩුජ්වර දෝස, ගුල්ම, රක්ත දෝෂ මේ හැම ගුන වේ.

16.

තික කොල කකාරා, ගෙන ගිතෙල්, තලතෙල්, එක්කොට පදමට කකාරා ගෙන බා තබා මාත්‍රා දැන ලේහ කරනු. කාස, ස්වාස ගුණවේ.

17.

අමුක්කරා, වදකහා, ආඩතෝඩා, තිප්පිලි, සිඩිගුරු, කහා, වැල්මී, කොට්ටම්, සවිඳලුනු මේ හැම කල්ක කොට අඹරා ගිතෙල්. නැලියක් එක්කොට පදමට කකාරා පෙරා තහා කන්ඨ දෙනු.
ස්වරාසත සුවවේ.

18.

කීකිරිදිය ඉස්ම දසබාගයකට තෙල් එක භාගයක් ගෙන තෙල් කකාරා ගෙන එහි අළු චූර්ණිය දමා කන්ට දෙනු. උග්‍ර වූ ස්වාසකාස ගුනවේ.

19.

රටතෝර, එලබටු, කීකිරිදිය මේ හැමින් ගත් ස්වරස සතර බාගයකට ගිතෙල් එක බාගයක් ගෙන පදමට කකාරා කන්ට දෙනු. කාස ස්වාසා දී මුහ මේ හැම ගුනවේ.

20.

වසාවාසී, කපුරු, කපුකිතිස්ස ඇට, වැල්තිබ්බටු, එන්සාල්, කලාඳුරුල, සුදූරු, තිකුළු මේ හැම චූර්ණ කොට සකුරු වෙන් හෝ සීනියෙන් ලේහ කරනු. මීපැනියෙන් හෝ පානය කරනු.

කාස, ඉක්කා, ස්වාස, අග්නිමාන්ද, ප්‍රමෙහ, පීනස, ඡර්දි අරුචි, මුඛ බන්දන, ස්වරභෙද, මෙ හැම ගුනවේ.
මීටම,

21.

දශමුල් කසාය දෙනු. ත්‍රිදෝෂයටද, වාත, පිත්ත. ශ්‍රමය ද ක්ෂයට ද සිරෝ රෝගයටද හික්කාවටද ඡර්දියට ද මෙ හැමට ද හිත වන්නේයි.

22.

රසකිඳ, ඉද්ද, කිකිරිදිය, රටතෝර, යන මෙයින් කොල ගෙන ඉස්ම මීරිකා රෙදීරද හෝ දුම්බොනු.

23.

මනෝසිල, කුකුරුමාන්, රසකිඳ යන මෙ කී දේ ලා ඇඹරු පාන්කඩින් වෙණ වෙනම දුම් හැම්බොනු. කාස, හික්බා මනා වේ.

24.

හීනටි හාල්, අත්තික්කාකොල, මෙ දෙවගේ සමසේ ගෙන මදක් අබ එහි එක්කොට අඹරා තලතෙලින් කැවුත් පිෂ කනු. අසාධ වූ කාෂ ගුන වේ.

25.

සිඩිහුරු, අතිවිඩයං, තිප්පිලි, කටුකරෝහනී, සිවිය, තිප්පිලි මුල්, සවින්දව එනු. දෙවගේ රත්නෙටුල්. මෙ හැම සමසේ ගෙන අඹරා චූණී කොට ගිතෙල් හෝ තලතෙලින් හෝ අනා ලේහ කරනු.
පානය කරනු.
මෙ නාගරාදියෝගය ඊට සුදුසු වූ යෝග දැන අග්නි බල දැන සරීර සක්ති දැන දුනොත් උෂ්ණයෙන් අටගත් ව්‍යාදි ද පිපාසාවෙන් අටගත් වැදිද කාස, ස්වාශ ප්‍රමෙහ, මන්දග්නි වාතශ්‍රේණිත්කුට්ට, ශොථ, අතිසාර, ගුල්ම සූල, අරුචි, අරුචි, තිමිර අරිසස්, සිරෝරෝග, මෙ හැම දෙයට වෛද්‍ය තන්මයා විසින් යෙදිය යුත්තේය.

26.

මීටම, පොතු, ඇට, මද, මෙ හැම ඇර දමා පුහුලෙන් තුලාවක් ගෙන උයා නැවත කනතෙලින් තඹා ගෙන මීපැනි පැස වූ තැන කන්ඩ සර්කරා, පුහුල් මට්ටම ගෙන එනසාල්, කුරුඳුපොතු, කොල්ලන් කොල, කොතඹුරු, මිරිස් මෙයින් වෙන වෙන ඇටපලම, ඇටමද ගෙන චූණී කොට එහි ලා සිහිල් වූ තැන මී පැණියෙන් ගිතෙල් දෙකෙන් නැලි යෙන් දෙක දෙක එක්කොට සොද රහට හැදිගා ගෙන තබා මතු කියන වැදිවලට දෙනු.
කාස, ශ්වාස, අරුචි, මූහ රත්පිත් ක්ෂතක්ෂය මෙ හැම ගුනවේ.

ලයෙහි සියළු වැදියටද හිතයි. නුවන වඩින වන්නෙයි.

27.

පුස්කර, මිරිස්, තිප්පිලි, යබර, තිවිද වූ කාදගල් චූර්ණ කොට දෙනු. (භ්‍රමකය චූඹකය අයශ්කාන්තය යන මෙ ත්‍රිවිධ කාන්දන නම් වෙ.)

28.

තිකුළු, පෙරුන්කායන්, ශවින්දව එනු, අසමෝදගම, දුරු, මිරිස්
ආදී කොට ඇත්තා වූ ත්‍රිවිද කාන්දගල් මෙ හැම චූර්ණකොට දෙනු. අග්නිදීප්තිද ක්ෂයද කාෂයද අරුචිද, අතිකුත් සියළු රෝග ද ගුණවන්නේයි.

29.

තිකුළු, තිපල්, කලාදුරු අල, වලගසාල්, රත්නෙමුල්, කුරුඳු පොතු, එන්සාල්, තිප්පිලි මුල්, කිකිරිදිය, දේවදරු තාමර අල, ගොන්කැකිරි, ඹදකසා බලල් එනු, සුවස එනු, යවකර එනු, සවින්දව එනු, ඇත්වගපුල්, මෙ හැම සම භාග ගෙන මෙ බරට ගුගුල් ගෙන අඹරා ඉලන්ද ගෙඩි පමණ ගුලිකොට ගිතෙල්මී එක්කොට දෙනු.
කාස ස්වාස ශෝෂ අරිසස්, භගන්දර ගුල්ම පිලිකා බඩරුජ වෑඩි වමන, ක්‍රිමි දෝස මෙ හැම සිස්‍රව ගුණ වෙ.

30.

ත්‍රිජාත එක්කලත් සමාරයි. තිප්පිලි අඩ පලමයි, සීනි මුද්දප්පලම මීපුක් රටඉඳි මෙ හැම පලම පලම ගෙන චූර්ණ කොට ගෙන මී පැනියෙන් ගුලි කොට කනු.
රක්තපිත්ත, කාස, ශ්වාස, අරුචි, ජර්දි, ශ්‍රම ක්ෂත, ක්ෂය ස්වර භේද ප්ලීහ යෝග උරුස්තම්භ, ලේ වමන, භ්‍රම, ජ්වර මෙ හැම ගුණවෙ.

31.

මීටම,
පක්වසාර,(පක්වසාර නම් කිරි නැලියයි දිය පතයි.)
දියෙන් බාගයක් ගිතෙල්, ගිතෙල් බාගයක් සීනියි, මී පැණි තුන් කලදයි, තිප්පිලි කලදයි මෙ හැම පක්වසාර හා කකාරා දෙනු. ග්‍රහ, දෝෂ, ගුල්ම ජ්වර, පාණ්ඩු රෝග, හික්කා ක්ෂය රෝග, රත්පිත්, පිපාස ශෝෂ කාස, මෙ හැම ගුණවෙ.

32.

සප්ත සාර නම් ගිතෙල්, තලතෙල්, සූරුදීපෙරලි දිය සුදුළූනු, රත්නෙමුල්, හකුරු මෙ හැම එක්කොට මෙ සප්තසාරය කනු. මින් කාස ස්වාසාදිවිය, ලේමාද, වාත-ව්‍යාදී, මන්දග්නි, කම්ප ජර්දි කාමල හික්කා, ශෝෂිතාන,
අරුචි මෙ හැම ගුනවෙ.

33.

විළද, තිප්පිලි, අරළු, සිඩ්හුරු, නෙල්ලි, සිනි, මී පැණි, තලතෙල් සමභාග ගෙන අඹරා ලේහ කරනු. පංචකාස ගුනවේ.

34.

අවරිය මුල් බාගයක් ගෙන ඊට අඩ්බාගයක් මනෝසිල ගෙන මෝරුවෙන් අඹරා එම බෙහෙත් ලා පාන්කඩ අඹරා අවුලා තිමා දුම් පානය කොට පසුව මෝරු බොනු. පංචකාස ගුණවේ.

35.

කපුඇටමද, මනෝසිල, අගිල්, වදකසා, සිඩ්හුරු, තිප්පිලි, මිරිස්
මෙකී දේ මදුරු කොල ඉස්මෙන් අඹරා වරා කිරි මීකිරි අත්තික්කා කිරි සෙවන වියලා
ඇඹරු බෙහෙත් හා පාන්කඩ අබරා වෙලා දුම සතියක් ධීකිරි බත් කටලා බොනු.
කාස, ස්වාස, උගුරෙහි සියලු රෝග, කණිරෝග, නාසා රෝග, ඇස්වලින් කඳුළු නොනවතී යනවාද සිටී.

36.

මීටම, සුදු රෙද්දක,
අත්තික්කා කිරි පොවා වේලා වරාකිරි මීගස කිරිත් එසේම වේලා ගැට තෙටොල් කිරෙන් තෙමා වේලා තබා, නස්නාරන් දළු, මා එරමිතිය දළු දෙඩම් දළු, වරාදළු, දත්තමුලේ පොතු සරියට ගෙන රෙදිත් එක්ක අඹරා රෙඩක ගා පාන්කඩ අඹරා වේලා දවශ අහල බැගින් කපා දුම බොනු. බොන තැන සීලහක් කටලා බොනු. සියළු කාශ නශා.

37.

වන්ඇපල, බෙලි, තික ශාමුලයෙන් ගෙන මල බටු මල් හැම සමභාග ගෙන අත වඩා තිකුළු ගෙඩි ලා හැම එක්ව පැන් හෙව කකාරා තුනීකොට සිටුවා ගෙන අරමනා ගසින් පොතු කොල, මුල්, මල් සාමුලයෙන් ගෙන කකාරා මෙසේම මිත් මේ, බෙත් තුන එක්ව කකාරා පැනි පිට හෙලා දෙදුරු, එලළුනු, සාදික්කා, කරාබු, අසමෝදගම් සවින්දව අබ, වසාවාසි, ක්‍රිමි ශස්ත්‍රු, උළුවා හැම සුනු කොට මදක් ලා තබා මදින් මදින් ගෙන උදය කනු. ශ්වාස, ශෙම නසා වාත නසා ලය පැසවා සැරව යන වා නසා,කැසි මූස ආදී රෝග නසා. විරේකත් වේ.

38.

ඉහුරුකොල යුෂ කබළු පොල් කිරෙන් දෙනු. කැසි පිලිකා ගුන වේ.
කැලතිය කොල යුෂයෙන් කබළු පොල් කිරෙන් දෙනු ඊට මයි.

39.

තොලබෝ කොල ලාවයින් සතරක් උන අළුයෙන් උයා තබා ඉස්ම ගෙන අරළු දෙකක් තලා ඇට ඇර දමා මීපැනී පතක් සමග දමා තිබා උදය ඉස්ම එක්කොට

දෙනු.

උනු දිය බොනු. මුහටයි.

40.

මලබටු විස්සක් තිහක් බූ හැර ඇස්ස කපා. මී පැණි පතක දමා තුන් දවසකට පසුව ගෙන වැල් තිබ්බටු මුල්, සක්සඳ මුල් වේලා චූර්ණකරපුවා මීපැනියෙන් ලේහ කරනු. කැසි මුහට බේතයි.

41.

මිරිස් කසා අරත්ත මුද්දරප්පලම් තිප්පිලි මේ හැම චූර්ණකොට හකුරු තලතෙල්, එක්කොට දෙනු. මෙම ලේහයට කාස ගුණවේ.

42.

සාරන මුල්, හුදුළුනු, සිදිහුරු, මේ හැම එළ කිරෙහි ලා කකාරා ඒ කිරි දෙනු. ක්ෂත, කාස, ජ්වර, ගුල්ම, ක්ෂය රෝගගුණවේ..

43.

මීටම,
හාතාවාරිය, කිරිබද්ද අල, අමුක්කරා, අරළු, සාරන මුල්, තුන්බැලිල, නෙරෙංචි මේ හැම චූර්ණ කොට මීපැණි ගිතෙල් එක්කොට ලේහ කරනු. ක්ෂය රෝග ගුනවේ.

44.

මීටම,
මුද්දරප්පලම්, හීනි, මේ හැම එක්කොට මේ සම කොට මී පැණි ගිතෙල් එක්කොට හෝ ලේහ කරනු.

45.

අමුක්කරා, තිප්පිලි, සීනි මේ හැම චූර්ණ මීපැනි, ගිතෙල් එක්කොට ලේහ කරනු. ඉක්කා, ක්ෂය, කාස රෝග ගුනවේ.

46.

මීටම,
වතුසුද්ධ මුලේ පොතු, කල්ක කොට අඹරා ධාරෝෂ්ණ කිරෙහි කලතා පානය කරනු. චිරා කාලයක් සිටි පීනස ගුනවේ.

47.

මීටම,
තුවර ලාවත්, රට තෝර, සිරිතේක්කු, තිප්පිලි, කටුවැල්බටු, රසකිඳ, සිඩිහුරු

යන මෙයින් කකාල කශාය දෙනු. කශා, පනුඩිය නැගීම් ක්‍ෂරෝග ගුනවේ.

48.

මිටම,
තෝර, අරළු, කලාඳුරු අල, රසකිඳ, ඩියමිත්ත, අඩාතෝඩා, සිඩිහුරු යන මෙයින් කකාල කශාය දෙනු.
කාස, පනුඩිය නැගීම ක්‍ෂය රෝග පීනශ ගුනවේ.

49.

මිටම,
තික සහමුලයෙන් ගෙන ඊ ශ්වර සය ගෙන එහි ගිතෙල් එක්කොට කකාරා පදමට සිඳ ඒ තෙල් පානය කරනු.
සියළු කැසි රූප වූ ක්‍ෂය රෝග නසා. මිත් පුෂ්ටි වර්ධන කරන්නෙයි.

මිටම,
කිරි සතරකට සුද්ද තලතෙල් නැලියක් ගෙන වැල්මී කල්ක එක්කොට සියක් වාරයක් පදමට කකැරු ගිතෙල් පාන නශාංභාදියෙන් ක්‍ෂය රෝග ඌර්ධගත රෝග උන්මාද රත්පිත මෙ හැම ගුනවේ.

50.

මිටම,
අමුක්කරා කසායට සතර ගුණයක් වඩා කිරි ගෙන ක්‍ෂීරාවසේස කොට කකාරා ගෙන සිහිල්වූ කල්හි මත් ගා තෙල් ගෙන නැවත අමුක්කරා මුල, කල්ක අඹරා, අමුක්කරා කසාය කකාරා එහි එක්කොට එල කිරිත්, තෙල් විවර එක්කොට පදමට කකාරා ගෙන උදය යුක්ති දැන පානය කරනු.

51.

මිටම,
මුකල පුහුලේ ඉස්ම ගෙන ඊට අර්ධයක් කිරි හා ගිතෙල් ගෙන මිට කිතුල්, තිප්පිලි මුල්, අසමෝදගන්, පෙරුන්කායන්, කළුදුරු, සුදුදුරු, වදකසා, රත්නෙටුල්, දේවදරු, සිවිය, සවින්දව එනු, අතිළඩයන්, කාමරඅල මෙ හැම තුන්තුන් කලඳ ගෙන කල්ක කොට අඹරා පදමට සිඳගත් මෙහි තෙල කනු, ගොළු, අග්නිමන්ද, කාස, ස්වාස, මෙ හැම ගුණවේ.

52.

මිටම,
රසකිඳ තුලාවක් ගෙන දිය දසයෙක ලා කකාරා දෙකක් කොට ගිතෙල් නැලියක් ගෙන මිකිරි දෙකකුත් එක්කොට මිට කල්කට සඳුන් ඉරමුසු මුද්දරප්පලම්, වැල්මී, මීපුප්, බැලිල, නෙරෙංචි, කිරිබඳු අල, කොකටිය, වැල් කහඹිලියා, අරත්ත, සිඩිහුරු, අගිල්, මේ හැම තුන් තුන් කලඳ ගෙන අඹරා එක්කොට ගිතෙල් සිඳ

මාත්‍රාදන පානය කොට කිරෙන් බත් කනු.
ක්‍ෂය රෝග, කසස්වාශ, ප්‍රතිශ්‍යාය, ජ්වර, ඉරු රුජා මේ හැම ගුන වේ.

53.

මිටම,
ඇත්වගපුල්, සිඩිහුරු, අගිල්, තිප්පිලි, සිරිතේක්කු රට තෝර. කටුවැල් බටු, රසකිඳ, අඩාතෝඩා, හාතාවාරිය අමුක්කරා කසායට සතර ගුණයක් වඩා කිරි ගෙන ක්ෂීරාවසේස කොට කකාරා ගෙන සිහිල්වූ කල්හි මත් ගා තෙල් ගෙන නැවත අමුක්කරා, මුරුවා, වැල්තිබ්බටු, ඉරමුසු, කහ, දියමිත්ත, මිරිස්, තිප්පිලි, කෙලින්ද යන මෙයින් කකාල කසායෙහි මී පැණි එක්කොට තිබා කනු.
අග්නිමන්ද, පිපාස, කාස, අරුචි, ක්‍ෂය රෝග, නැති වේ.

54.

මිටම,
රසකිඳ වැල්මී, මුද්දරප්පලම්, කෙලින්ද, කාමර අල, සිකුරු පියලි, තිප්පිලි, කටුවැල්බටු, නෙරෙංචි, බැලිල, මානෙල් අල, පිටවක්කා, තෙමතල, වැල්කසඹිලියා මෙ හැම කල්ක කොට අඹරා ගිතෙල් නැලියක් සුධ ජලයෙන් තබා කන්ට දෙනු.
ක්‍ෂරෝග ගුණවේ. මිටම,

55.

ආඩාතෝඩා, රසකිඳ, අමුක්කරා, තිපල්, හාතාවාරිය, එලබටු, නෙරංචි, සාරන, කීකිරිඳිය, හිරැස්ස, මහ පස්මුල්, සැවැන්දර, ඉරිවේරිය, තිපල්, කොට්ටම්, ත්‍රිජාත, තිකුළු, අරත්ත, වැල්මී, මීපුප්, උනමකුළු, පොල්කුඩුපලා, දෙකසා, පස්එනු මෙ හැම බෙහෙත් ගන්නකල ආඩාතෝඩා ආදිකොට මහ පස්මුල් අන්තකොට ඇති මෙකී බේත් තිස්පලම ගන්ටත් ශැවැන්දර බෙහෙත් පස් පස්පල ගන්ටත් ගිතෙල් එක් නැලි සමාරක් ගෙන ඊට දෙකුරුවක් වඩා කිරි ගෙන කකාරා මී පැනි තිපල් එක්කොට කනු. ක්‍ෂයරෝග ස්වාස සූල ගුල්ම අරිසස්, පාන්ඩු රෝග මුත්‍රක්ක්‍රිච්ච ප්‍රමේහ, සර්කරාඅසමරි, දෙකක් ක්‍රිවචා පිලා වාත පිත්ත ශෙලෂ්මා, ජ්වර භේද ජ්වරසාද නේත්‍ර රෝග හික්කා රක්ත පිත්ත මෙ හැම ගුනවේ.

56.

මිටම,
අමුක්කරා, බැලිල, ලාකඩ මෙ හැම එක එක නැලිය ගෙන දිය නැලි දසසයක් ලා කකාරා චතුර්භාගාවශේෂ කොට නෙල්ලි නැලියක් එක්කොට වඩාගෙන මිට කල්කට අමුක්කරා, කහා, අරත්ත, තෙමෙනල,කොට්ටම්, කලාදුරු අල, හඳුන්, ඉරමුසු, කළුදුරු, හාතාවාරිය, ලාකඩ, මුරුවාමුල්, දේවදුරු, මාජෙෂ්ටි, ශැවන්දරා,
මෙ හැම සමසේ ගෙන තෙල් නැලියක් එක්කොට කකාරා ගෙන ආභ්‍යාගපානා දී කරනු.
සියළු ජ්වරද, ක්‍ෂය රෝගද, පුෂ්ටි කිරිම කාෂ ස්වාස ක්‍ෂය මෙ හැම ගුනවේ.
සප්තධාතු වඩින වේ.

57.

මීටම,
නෙල්ලි ඉස්ම නැලියයි, ගිතෙල් නැලියයි, තලතෙල් නැලියයි, එළුකිරි නැලියයි, එලකිරි නැලියයි, හාතාවාරීය ඉස්ම නැලියයි මීපුක් ඉස්ම නැලියයි, කිරිබදු අල ඉස්ම නැලියයි, වැල්මී පලමයි.
මෙකී දේ එක්කොට පදමට මද ගින්නෙන් කකාරා ගෙන සිහිල් වූ තැන මීපැනි නැලියක් හා මුද්දරප්පලම් අට පලම හා සීනි අටපලමක් තිකුළු සුනු පලමක් හා මෙ සියල්ල එක්කොට යහපත් කොට අඹරා අට දවසකට පසු උදය තිති පානය කරනු. දතු ක්ෂිනයනට ඉතා ගුනවේ.

කැසි මුස ශ්වාස

මුහ රෝගයට විධි

58.

කෝමාරිකා ලොද දෝතක් පමන ගෙන තලතෙළුත් සමව වත්කොට උදේට දෙනු මුහ නැතිවේ.

59.

මීගසක් පෙහෝ කොට ගසට පංචෝපකාර කොට බටහිරින් පොත්තක් උපුටා තලා ඉෂ්ම ගෙන සීනාවි සාල් අඹරා කබළු පිස ඉර බලා ඉඳ වළඳ මුවෙන් නොබැන ඉඳ කනු.
මුහ ගුනවේ.

60.

අරළු දසයක් තලා දමා පැනි පදමට කකාරා
එපමන තලතෙල්, උක්හකුරු, මීපැනි, ගිතෙල්සහිතව කනු පමන දූන වලදනු.
කැසි කුෂ්ට වායු පිත්, ශෙලෂ්මා වමන උදර ගුනවේ.

61.

මීට,
තිප්පිලි, උක්සකුරු, මුද්දරප්පලම්, යොන් ඉඳි මීපැනියෙන් ගිතෙලින් අනා ලේහ කරනු. කාස ශ්වාස නසා.

62.

මීටම,
අරළු, ත්‍රිකටුක, බෙලිමුල්, කකාල, කසායෙහි මීලා , දෙනු. කාස නසා.

63.

මිටම,
දිඹුල් කොල යුස යෙන් සීනවිසාල්. මිරිස් මදකුත් එක්ක අඹරා කබළු පිස නැවත තලතෙල් ගා කනු. කැස්සටයි.
සුදුළූනු ඉස්මෙන් ත්‍රිකටුක චූර්ණ ලා පානය කරනු. කැසි මුහළමැ ද රුජාවටද යහපති.

64.

මිටම,
කුරුඳුපොතු, නාමල් රේනු කලදයි, මිරිස් හකලදයි, වගපුල් කළදයි, කංඩ සකීකරා විසිහතර කලදයි මෙ හැම පොඩිකොට මීයෙන් අනා තබා දෙහි ගෙඩියක් විතර බත් කා ඉක්බිති කනු කැසි මුස ඉලප්පු අජිර්ණ ගුනවේ.

65.

ත්‍රිකටු, තිපල්, එන්සාල්, කුරුඳු පොතු වසාවාසි කොට්ටන් කටුවැල්බටු මුල් කසාය කකාරා මීපැති එක්කොට දෙනු. මුහ නැති වේ.

66.

මිටම,
සීන් ඉඟුරු පුළුස්සා පොතු හැම හැර චූර්ණ කොට බතින් අනා උනුඩියෙන් කලතා තුන්දු පොවනු. කැසි මුස නැති වේ.

67.

මිටම,
ඉඟිති අඹරා ගත් චූර්ණය තලතෙලින් දෙනු. කැසි මුසටයි.

68.

මිට,
අරළු, බුළු, නෙල්ලි, තිප්පිලි, කළුදුරු, සුදුදුරු, අසමෝදගම, එන්සාල්, සිඩිඟුරු මෙකී දේ සමව ගෙන අඹරා මීපැතියෙන් අනා අට දවසකට දෙකලද බැගින් දෙනු. කැසි නැතිවේ. කැසි පිලිකා ලය රෝග නසා.

69.

මිටම,
ආඩතෝඩා, තිබ්බොටු, මෙ කොල දෙකින් ඉස්ම පතපතයි. ගිතෙල් තලතෙල් දෙපතයි. වලගසාල්, එන්සාල්, කසා, අරළු, නෙල්ලි මෙකී කල්කලා සිද ගෙන උදය සවස කනු සත්වගේ කැස්ස ගුනවේ.

මනෝසිල, ගෙන්දගම, සිරියල්, කලඳ කලඳයි, මිරිස්,සිද්ධිගුරු, සතර කලඳයි, අබ හකලඳයි, තිප්පිලි, සාදික්කා, කළුදුරු, හුදුළුනු, කලඳ කලඳයි.
මෙකී දෙයින් මනෝසිල පුසුල් දියේ සැට පැයක් දියෙන් සෝද ගනු. සිරියල්, කසපැතින් සෝද ගනු.

ඉක්බිති අමුඉඟුරු ඉසිනුත් කකිරිඳිය ඉසිනුත් අඹරා තුන් දවස ගිය පසු මිරිශට පමණ ගුලි කැර සෙවන වියලා තිබා කැස්සට මී පැතියෙන්ද, මුහට ඉඟුරු ඉසින්ද, උදඩියට මිරිස් පොඩි, ආඩාතෝඩා ඉසින්ද උනට ඉඟුරු ඉසින්ද දෙනු.

71.

මීටම,
රණවරා සාමුල වේලාගත් සුනු උක් සකුරෙන් කනු.

72.

සාවුන්ගේ වසුරු රත්වත් කිකිරිඳිය කොළ වටා ගුලි කොට දුම් බොනු. මුහටයි.

73.

සුධ රසදිය, සුධ ගන්දක, ලෝහ බස්ම, පුස්කර, තිපල්, රසකිඳ, දේවදුරු, අරත්ත, වලහසාල්, පියුම් කෙහුරු මෙකී දේ සමබාගයයි.
මේ බරට වච්ජනාවී ගෙන මීපැතියෙන් අඹරා ඔලිඳ ඇට තුනක බර ගුලි කොට ඉන් ගුලියක් දෙනු.
කැසි ස්වාස ගුණවේ. මේ ගුලිය නව අමෘතාණීව ගුලියයි.

74.

මීටම,
ආඩාතෝඩා සාමුලයෙන්, දසපලමක් ගෙන කුඩා කොට කපා සැලක ලා දිය දසයක් වත්කොට කුරුනිය කට, සිවුවා කකාරා පෙරා ගෙන ගිතෙල් නැලියක් එහි එක්කොට වතුරංලී තන ජාතියේ ඇටයි දෙකසා කකුළු සුහු කොට්ටම් තිකුල් වලහසාල්, වන්මුතු, නෙල්ලි, බුළු, දේවදුරු, අමුක්කරා, ගජ තිප්පිලි, සිනි, මුද්දරප්පලම්, නෙළුම් රේනු, සයින්දව, මානෙල්, සිවිය, රත්නෙටුල්, කළුදුරු, ගොකටු මුල්, මෙකී දේ අඹරා ධියකොට කකාරා පදමට පෙරා මී පැති වත්කොට තබා උදය වළඳනු.
කාස, ස්වාස, ක්‍ෂය රෝග පිත් මේ හැම ගුණවේ:

75.

මීටම,
ත්‍රිකටුක. තිපල්, නාමල් රේනු, වැල්මී, නෙළුම්, සුදුදුරු, කපුරු, නෙළුම් රේනු මේ දෙකලඳ බැගින් ගෙන සුනු කොට මීයෙන් කනු. කැසි මුස ඉලප්පු ගුණවේ.

76.

සිරුස්ස, රසකිඳ වේලා පොඩි කොට තබා බිලාල පාදයක් ගිතෙලින් අනා කනු. මුහටයි. නැතිවේ.

77.

මීටම,
පතුක් මුල් වේලා වූණිති කුළු, කහ, පොඩි කොට තබා ගිතෙලින් අනා කනු. මුහ ගුනවේ.

78.

මීටම,
ආඩාතෝඩා කොල, තිකකොල, එරබදු, කිකිරිඳිය කොළ මෙයින් ඉස්ම සතර පතක් ගෙන මීට ගිතෙල් පතක් එක්කර තිකුල් සෛන්දව මෙ කීවා අඹරාඩිය කර පදමට කකාරා දෙනු.

79.

මීටම,
සිරියල් කාලයි බටු කරවිල කොළත් මෙම කොල ඉස්මන් අඹරා රෙඩ ගා පාන්කඩ අඹරා වේලා තලතෙල ගලා තිවා බත් කා දුම් බොනු. මුහටයි.

80.

මීටම,

ආඩාතෝඩා කොළ, තෛලං තිබා ගෙන මීට මීපැතියෙන් තිප්පිලි පොඩිත් එක්ව දෙනු. මුහ ගුනවේ.

81.

මීටම,
මී ගහේ කොළ කොටා ශැලක ලා කඩවැස්ම බැඳ ඇල් සහලේ පිටියෙන් පිටවූ තල තෙලින් කනු. කැස්සට අත් දුටුවයි.

82.

හිරිහි ඇල්දියෙන් උරව්විකර මදක් මී මිශ්‍ර කොට තුන් දවසක් උදය උදය මෙ ලෙස දෙනු. කැස්සටයි.

83.

බැළිල සාමුලයෙන් කොටා පෙරා ඉස්ම සීතවි ශාලින් එනු නොලා කැද පිෂ බොනු. මුහ ගුනවේ.

84.

මිරිස්, කහ, අරත්ත, මුද්දරප්පලම, තිප්පිලි, හැම චූර්ණකර හකුරු තලතෙල් එක්කොට ලේහ කරනු. ස්වාස ගුණවේ.

85.

මීටම,

සාරණ මුල්, සුදුළුණු සිඩිහුරු මේ හැම එළකිරෙන් ලා කකාරා ඒ කිරි දෙනු. ක්ෂය, කාස, ජ්වර, ක්ෂය රෝග නසා.

86.

මීටම,

හාතාවාරිය, කිරිබඳු අල, අරළු, සාරතමුල්, තුන් බැලිල, නෙංචි මේ හැම චූර්ණකර මී හා ගිතෙලින් ලේහ කරනු. ක්ෂය රෝග ගුනවේ.

87.

මදත්‍යය,

සුවස එනු, තිකුළු මේ චුර්ණ එක්කොට මදක් ඩිය සහිත මධ්‍යය මද්‍යපානාධිරාගිය කල්හී දෙනු. වාතමුහ මදත් ගුණ වේ.

88.

මීටම,

සුවස එනු, කකුළු සුං, මිරිස්, අදුතලා, අසමෝදගම, මේ හැම එක්කොට මී සහිත වූ මද්‍යපානය කරණු. වාත මද්‍යත්තය ගුණවේ. පිත්ත මද්‍යත්තයට. මී පැණි එක්වැ මධ්‍යය අදියක් ජල එක්කොට හෝ පානය කරනු.

මධූයෂ්ඨි අවුසද කකාල කසායෙහි සීනි එක්කොට පානය කරනු. පිත්ත මදත්ත ගුණ වේ.

මීට හැම දෙයින්ම සීත ක්‍රියා කරනු.

ශෙලෂ්මයෙන් වූ මදත්තයට. වමන ද්‍රව්‍යය යුක්ත වූ මද්‍ය පාන කහෝ වමන හෝ කරවනු. සක්ති බලා ලංහන හෝ කරවනු.

මදත්‍යයට සන්නිපාතයෙන් යුතු ත්‍රිදෝෂ චිකිත්සා කරනු.

යම් උෂ්නාදියෙන් වූ රෝගයනට සුදුසු ඖෂධවලින් වැලකිය යුත්තේය.

මද්‍යපානයෙන් ක්ෂීන වූ දෝෂ ඇත්තාහට අනුවාසන ශහිත වූ නිරූහන ක්‍රියා අභ්‍යභද උදවර්තද මදතයට කටයුත්තෙන්.

89.

මීටම,
හාතාවාරිය, වැල්මී, ශාරන මෙ කල්ක කොට බැලීල, හිරිවැඩිය කකාළ කශාය ගෙන එලගිතෙල් නැලියක්, කිරි නැලියක් එක්කොට පදමට කකාරා ගෙන තිතී පානය කරනු. පානයෙන් වූ ක්‍ෂය ගුන වේ.

90.

මීටම,
සාරන මුල් කකාල කසායේ වැල්මී, කල්ක කොට ගිතෙල් නැලියක් කිරි නැලියක් එක්කොට පදමට කකාරා ගෙන මද්‍ය, පානයෙන් ක්‍ෂිත වූ ඕජස් ඇත්තාහට දෙනු. පුෂ්ටි වඩීන වේ.

91.

පිප්පල්‍යදිගනයෙන් කකාල කසාය එම පිප්පල්‍යාදිගනයෙන් ඇඹරි චූණි එක්කොට යොදනු. උනුදියෙන් හෝ දෙනු. ගෝමුත්‍රයෙහි ගුගුල් චූණි මීපැණි එක්කොට දෙනු. මදත්‍ය, ගුනවේ.

92.

මහුල් කරද ඇට අඹරා ආලේප කරනු. නොහොත් ස්වේද ස්නෙහ දේ කරනු.

මදත්‍යයට තිමි.

හික්කා, කාස ශ්වාස, අධිකාරය

1. වායු සමග මුහට කැස්සට

එරඬු මුල්, වෙලිපිරිත්ති මුල්, ගොකටු මුල්, සමව ගෙන වේලා චූර්ණ කර බිලාල පාදයක් ගෙන තල තෙලින් අනා ලේහ කරනු. වායු කැසි මුස නැතිවේ.

2.

උණ කොල, වෙල්ලිපරිත්ති කොල, හිරියල්, මෙකී දේ අඹරා රෙද්දක ගා පාන්කඩ අඹරා අවුළුවා තිවා දුම් බොනු. කැසි නැතිවේ.

3. කාස ස්වාසයට

ප්‍රතිශ්‍යාවට ශෘංගී ආදි චූර්ණය කරනු ලැබේ.
ශෘංගී, ත්‍රිකටුක, ත්‍රිඵලා, වැල් තිබ්බටු, සිරිතේක්කු, කොට්ටම, වැල්මී, සවිඳ ලුනු, මෙකී දේ සමභාග ගෙන චූර්ණ කොට මීයෙන් හෝ උණු පැනින් හෝ දෙනු. මෙයින් කාස, ශ්වාස අරුචි ගුනවේ.

4.

පුස්කර, සාදිලිංගම, වච්චනාවි ශුද්ධ කොට ගෙන මිරිස් හා තුන් දිනක් දෙහි ඇඹුලින් අඹරා මිරිසැට පමණට ගුලිකොට තබා මිරිස් පොඩියෙන් දෙනු. ලේහ කරනු. කැසි ගුනවේ.

ලේ සිදමට - සීතියෙන්ද අතීසාරයට මෝරුවෙන් ද දෙනු.

බතින්, බුලතින්, සූනුවෙන්, මාළුවෙන් යම් වෛද්‍ය උපදෙසකින් දෙනු.

5.

සිද්ධිගුරු පුළුස්සා පොතු හැර චූර්ණ කොට බතින් අනා උණු දියෙන් කලතා තුන් දිනක් දෙනු.

6.

ඉඹුල් පොතු කලඳයි, නාමල් කලඳයි, කළු දුරු කලඳයි, සිද්ධිගුරු පස් කලඳයි, මිරිස් කලඳයි, වග පුල් සත් කලඳයි, කංඩ සර්කරා විසි එක් කලඳයි. මෙ හැම මී පැණියෙන් අඹරා නෙල්ලි පමණ ගුලිකොට උදය සවස සත් දවසක් දෙනු. කැසි ඉලප්පු නැති වේ.

7.

තිප්පිලි, රටඉඳි, රට මිදි යන මෙකී දේ අඹරා ගිතෙල් හා මී පැනි සමහ අනා ලේහ කරනු.
අරළු, තිකුළු, බෙලි මුල් මෙකී දෙය කකාල කෂාය දෙනු.

හික්කා ශ්වාස

8.

නෙල්ලි, සීනි, සිද්ධිගුරු, තුඹ අල, කැල ගෙඩි, වග පුල්, ඉඳි බඩ, මෙකී, බෙත් සමභාග ගෙන අඹරා මී මුසුකොට දෙනු.

9.

වැල්මී අඹරා මී පැණි එක්කොට දෙනු.

10.

තිප්පිලි අඹරා සීනි එක්කොට දෙනු.

11.

වියලි ඉඟුරු අඹරා හකුරු එක්කොට දෙනු.

12.

සඳුන් තන කිරෙන් ගලගා නස්‍ය කරනු.

13.

හිරියල් අඹරා එළගිතෙලින් අනා දුම් බොනු.

14.

ගොදුම ලැටි හා අඟුරෙහි දමා අනා දුම් බොනු.

15.

තිප්පිලි කොලයෙන් උපන් දුම අනා දුම් බොනු.

16.

ඉත්ත කොල ලා අඟුරෙහි ලා අනා දුම් බොනු.

17.

ඊතන, සහිඳ ලුනු පලමක් සමඟ අඹරා එය එළගිතෙල් දෙපලමක් අනා කලතා පොවන්න.

18.

යවකාර ලුණු චූර්ණ කොට එළගි තෙලින් අනාදෙන්න.

19.

සීනි, සහිඳ ලුණු, සිද්ධිගුරු මෙකී බෙත් අඹරා උණු පැනින් දෙනු.

20.

කුරුඳු පොතු, එත්සාල්, ඉරිවේරිය, සිද්ධිගුරු, කිරි අඟුණ, නෙලුම් අල, එරබදු මුල්, හොර පොතු, අගිල්, කලාදුරු අල, තල, සමව අඹරා අට භාගයක් සීනි එක්කොට අනා තබා වළඳනු.

21.

මොතර පිල් හෝ තටු හෝ සියල්ලම එක්කොට හෝ දමා ගිතෙල් එහි එක්කොට ලේහ කරනු.

22.

තිකුළු, බෙලි, තොටිල, සිහින් මිදි, ඇත් දෙමට, පලොල්, දෙබටු, එරඬු, සාකාල කසායට මී දමා දෙන්න.

23.

තික සහ මුලයෙන් ගෙන කොටා ඉස්ම මැඩ සතර නැළියක් පමණ ගෙන එලගිතෙල් නැළියක් ගෙන එහි ලා කකාරා තෙල පෙරාගෙන නිති උදය වලඳනු.

24.

නෙලුම් අල, හිඟුරු පියලි, මුද්දරප්පලම්, බැබිල, මානෙල්, වග පුල්, එල එඬරු, කිරි අඟුණ, වැල්මී, කටුවැල්බටු, මහනෙල්, වැල් කහඹිලියා, කෙලින්ද ඇට, ගොකටු, මෙ හැම සමභාග ගෙන අඹරා දිය සතර නැළියකට එලගිතෙල් සිඳ පෙරාගෙන නිති උදය වලඳනු.

25.

කපු ඇට, තිකුළු, වද කස, අගිල්, මනෝසිල, මෙවා ගලෙං පිටිකර කීකිරිඳිය යුසින් රෙදි කඩක් තුං වරක් තෙමා වේලා බෙහෙත් පිටිලා අකුලා බැද ගිතෙල් හෝ තල තෙලිං දුං බොනු. මෝරිං බත් කනු. කාස රෝග, ගල රෝග, නාස රෝග, ඇසේ කනේ රෝග ගුනවේ.

26.

තික කොල, වරා කොල, මී කොල, පුපුල මල්, වියලි කසා, මිරිශ්, තිප්පිලි, මී මුරුවට, සිරියල්, මෙවා අඹරා දිය කොට රෙදි තෙමා පවතින් වේලා වැටි කොට බුලත්වල අකුලා දුං බොනු. කිරි බත් අනා හක්ක තිබා ගිලිනු.

27.

සුදු රෙද්දක දළුක්කිරි ගා පවතින් වේලා කිකිලි බිජු සාරු ගා ඊපිට හිරියල් පොඩි ලා වැල් තිඹටු මුලක් තිබා අකුලා තල තෙලින් රද අවුලා තිවා දුන් බොනු.

28.

තිකුළු, නෙළුම මල්, දෙදුරු, රත්ත, වලහ සාල්, කිඳි, තිපල් මේවා චූර්ණ කර එපමන සීනි සමග කනු.

29. මුහ කැස්සට

තික, එරබදු, පුපුල, හැල කොල, යුස මීයෙං දෙනු.

30.

කොසඹ පොතු කසාය දෙනු.

31.

මී මුරුවට, අබ, සුදුළූනු, හිඟුරු පට යුෂින් දෙනු.

32.

එල බටු කොල, යුස මීයෙන් දෙනු.

33.

ඉඟුරු යුෂ, හිඟුරු වැලේ දිය, දෙඩං ඇඹුලෙං දෙනු.

34.

මල් තුඹ අලේ නර මුත්‍රයෙං නසා කරනු.

35.

තිකුළු, කොත්තමල්ලි, සවින්ද, අරළු, බුළු, නෙල්ලි, තිප්පිලි, ඉඟුරු, සවින්දව, පල්මාතික්කං, සුදුළූනුත්, මිරිස්, පැහිරි දෙඩං, බටුකර සම ප්‍රමානගෙන බටුකර යුසයෙන් අඹරා ගුලිකර සීනි හකුරු මී පැතියෙන් දෙන්න.

36.

මී පැනි පතයි, **උක්පැනි පතයි, සුදුළූනු**, ඉඟුරු, මිරිස්, අඹරා එකට කකාරා දෙනු. කාස ඉක්කා **සිටී**.

37. මොනර පිල්, පුළුස්සා අළු ගෙන කිතුල් හකුරු මී පැණි දෙවගෙ අනා ලේහ කරනු.

38. මනෝසිල, සවින්ද ළූනු, සිද්ධිගුරු, වග පුල්, වලඟ සාල්, කොට්ටං, පෙරුංකායන්, මෙකී දේ චූර්ණ කර එළගිතෙළුත් මී පැනිත් දෙවගේ එක්කොට බොන්නට දෙනු. කැසි මුස ඉක්කා සිටී.

39. වග පුල්, කොත්තමල්ලි, සැවැන්න, සමසේ ගෙන අට එකට කකාරා සීනි මී පැනි එක්ක දෙනු. ශ්වාස ඉක්කා පිපාස සිටී.

40. සුදුළූනු සිද්ධිගුරු, තලා දමා එකට කකාරා සවින්ඩව ළූනු පෙරුංකායන් චූර්ණ කර කෂායට ලා දෙනු. ඉක්කා සිටී.

41. සඳුන් තන කිරෙන් නස්න කරනු. වැල්මී මී පැනියෙන් නස්න කරනු. ඉක්කා සිටී.

42. ගොන් අං, මනෝසිල, කොට්ටං, සල්දුම්මල, ඉත්ත මුල්, මෙකී දේ අඹරා එළගිතෙල් අනා දුන් බානු. ඉක්කා සිටී.

43. ඉත්තෑ උල් පුළුස්සා අඟුරු ගෙන මී පැනියෙන් එළගිතෙලින් මදිව් කොට ලේහ කරනු.

44. රත් මල් ඉස්ම රෙදි කැබැල්ලක පොහවා පවනේ වේලා හිරියල් මනෝසිල කුඩුකර දමා පාන්කඩ අඹරා වේලකට අහලක් උළු කටු අඟුරේ ලා දුන් බොනු.

45. ඉත්තෑ කුරු පුළුස්සා තල තෙලෙං ලේහ කරනු. ඉක්කා සිටී.

46. කරල් සැබෝ ඇට චූර්ණ කර මී පැනියෙන් බොන්නට දෙනු.

47.

තිප්පිලි, සවින්ධව ලුනු, වෙන වෙනම බැද පොඩි කර මී පැනියෙන් දෙනු. ඉක්කා ඔක්කාර සිටී.

48.

ගොකටු කිරි, නෙටොල් කිරි, අත්තික්කා කිරි, දෙල් කිරි, රෙදි කැබලි සතරක් ගෙන මෙ කිරිවලින් තෙමා හිරියල් මනෝසිල කුඩුකර දමා දෙල් කිරි රෙද්ද පිටින් දවටා පාන්කඩ අඹරා අහලක් පොල් කටු අඟුරෙං දුං බොනු.

49.

සිද්ධිගුරු, තල් හකුරු, මී පැනියෙන් අඹරා පොවනු. කාස ඉක්කා සිටී.

50.

වැල්මී, ඉගිනි ඇට, කලාදුරු අල, තිප්පිලි, විලඳ, එන්සාල්, මෙවා සමව කිරා කිරෙන් අඹරා මී පැනි ගිතෙලින් කලතා දිව ගා ඇල් දිය බොනු. වාත ශෙලෙස්මා පිත් පිපාස, ගිතියන්, ශ්වාස කාශ,. ඉක්කා නශා ගුනවේ.

51.

එන්සාල්, වැල්මී, කළු දුරු, සැවැන්නමුල්, බැබිල, බෙලි මුල්, සිහුරු එකට කකාරා දෙතුන් වරක් දෙනු.

52.

ජීවුල් ගෙඩියේ පොතු කොටා මිරිකා තිප්පිලි කලදක් එක්කොට දෙනු.

53.

මී පැණි තන කිරෙන් නස්න කරනු. ඉක්කා සිටී.

54.

වග පුල්, කොත්තමල්ලි, සැවැන්දරා, සමව අඹරා දුන් බොනු. කරල් සැබෝ මුල් චූර්ණ කර ගිතෙලින් ලේහ කරනු. ඉක්කා සිටී. මෙරහ තුං දවසක් පෙවූ කල ඉක්කා නොසිටිය නම් වායු සමනකයක් ඉහුරු ඉස්මෙන් දෙනු.

55.

වැල්මී කල්ක කොට අඹරා මී පැනියෙන් නස්න කරනු. ඉක්කා සිටී.

56.

වග පුල් අඹරා මී පැනියෙං නශ්න කරනු. ඉක්කා සිටී.

57.

සිද්ධිගුරු අඹරා කල්ක කොට උක් ශකුරෙන් අනා නශ්න කරනු.

58.

කොට්ටම් චූර්ණ කොට රෙද්දක රද පාංකඩ අඹරා අවුලා තිවා ධූං පානු.

59.

මාදන් පොතු, තුඹ මුල්, වද කශා, අඹ පොතු, සුදුළුනු අඹරා එළගිතෙලිං ගුලිකර දෙනු. ඉක්කා ගුනවේ.

60.

කුඹුරු ඇට මද ඒ මට්ටමට සුදුළුනු, පෙරුංකායන්, ශවින්දව ළුනු, සිද්ධිගුරු මෙකී දේ ශමව ගෙන අඹරා එඬරු තෙලෙන් කලතා පොවනු.

61.

ශල් දුම්මලවත් පොඩි කොට රෙද්දක රද පාංකඩ අ්අඹරා අවුලා තිවා ධූං පානු. ඉක්කා සිටී.

62.

ගජ තිප්පිලි, සිද්ධිගුරු, සිරිතේක්කු, රට තෝර මුල්, කටුවැල් බටු, රසකිඳ, වන් ඇපල මුල්, සාතාවා රිය අල, මුරුවා මුල්, වැල් තිබ්බටු මුල්, ඉරමුසු මුල්, කසා, දියමිත්ත මුල්, මිරිස්, තිප්පිලි, කෙලින්ද ඇට මෙයින් දෙලොස් කලඳක් ගෙන මනාවට කකාරා තිවා සතර වේලක් දෙවේලේ මී පැති මදක් එක්ව දෙනු.

63.

තිප්පිලි තුන් කලඳක් අඹරා දිය මනාවක්ලා කාලට කකාරා තිවා මී පැති සතලිස් අට කලඳකුත් බැගින් දෙවේලේ කඩ දෙනු.

64.

අමුක්කරා මුල්, තිප්පිලි, සීනි එකපමනට ගෙන චූර්ණ කර වේලකට තුන් කලඳ බැගින් ගිතෙල් මී පැති මෙයින් අනා දෙවේලේ කවනු. උනුකර තිවූ වතුර පානයට දෙනු. ක්ෂය රෝග නසා.

65.

නෙළුන් අල, සිකුරු පියලි, මුද්දරප්පලම්, වැල්මී, මානෙල්, වග පුල්, එළ එඬරු, කටුවැල් බටු, ගොකටු, වැල් කසඹිලියා, කෙලින්ද ඇට, මේ සැම සමභාග ගෙන අඹරා දිය සතර නැලියකට එළගිතෙල් නැලියක් එක්කොට ඇඹරූ බේත් එහි කලතා කකාරා සීනි හතලිස් අට කලඳක් මීට එක්කර හැදිගා තබා වේලකට තුන් කලඳක් බැගින් දෙවේලේ කංඩ දෙනු. ක්ෂය රෝගයෙන් කෙට්ටු අයට සීනි සතලිස් අට කලඳකුත් මීට එක්කර සැදිගා තබා වේලකට තුන් කලඳ බැගින් දෙවේලේ කඩ දෙනු. රක්ත ගැලීමද නසා. ඇල් සහල්, සැටද සාල්, ගොධූම මේ

ආදීයෙන් බත් හා පක්ෂිමාළු, මාංශ දෙනු.

66.

වග පුල්, මුද්දරප්පලම්, සීනි, මී හා තලතෙල් සහිත කොට ලෙහ කරනු.

67.

නෙළුම් මුල්, සිද්ධිගුරු, ඉඟුරුපියලි, තලා මුල් මෙකී බේත් අඹරා ගිතෙල් මීයෙන් ලෙහ කරනු.

68.

පෙරුන්කායන්, මුද්දරප්පලම්, වග පුල්, අරළු, ඉඳි මෙකී බේත් හෝ කසාඹිලියා මුල්, සීනි, නෙල්ලි, විලඳ, උක් සකුරු, වග පුල්, සිද්ධිගුරු, මෙකී බේත් අඹරා එලගිතෙල් හා මී මුසුකොට ලෙහ කරනු.කාසශ්වාසඅරුචි, උන, ඇඟ වියලීම, අග්නි මන්ද, අතිසාර, ගුල්ම, අර්සස්, වමනේ, මෙතෙක් රෝග නසා.

69.

තික සාමුලයෙන් ඉස්ම මැඩ සතර නැලියක් පමණ ගෙන ගිතෙල් නැලියක් ගෙන එහිලා කකාරා තෙල් පෙරාගෙන තිති උදය වලදනු. පුෂ්ටි වැඩෙයි. කස නැසේ

70.

සුදු නෙළුන් අල, සිකුරු පියලි, මානෙල්, එඬරු, කිරි පළු, කිඩාරං අල, කසඹිලියා, කෙලින්ද, ගොකටු සාමුලයි. සුවඳ කොට්ටම් කසාය දෙනු.

71.

කරපිංච, දම් දෙවි සුදු තිප්පිලි, වැල් තිබ්බටු මුල්, රසකිඳ යන මෙයින් කකාල කසාය මී පැති සහිතව දෙනු.

72.

සඳුන්, සැවැන්දර, පැපිලිය, කලාදුරු අල, ඉරිවේරිය, මෙයින් කකාල කසාය දෙනු.

73.

තිකුළු, සිවිය, වලඟ සාල්, චූර්ණ කර ගිතෙල් මී සමග වලදනු.

74.

ඉඳි, අරළු, තිප්පිලි, වැල් කසඹිලියා, හකුරු, නෙල්ලි, විලඳ, රත්නිටුල් මුල්, ගජ තිප්පිලි, පොකුරු මුල්, සිකුරු පියලි, සමසේ ගෙන චූර්ණ කර සීනියෙන්

දෙනු. ක්ෂය රෝග, කාස, ස්වාස ගුනවේ.

75. රත් නිටුල්. වද කසා, වන් ඇපල. තිප්පිලි, සිද්ධිගුරු, කසා, වැල්මී, කොට්ටම, සෙන්ධව එනු, චූර්ණ කර ගිතෙලින් ලේහ කරනු.

76. සිද්ධිගුරු, කසාඹිලිය, මුද්දරප්පලන්, සීනි, මෙකී දේ චූර්ණ කොට තල තෙලින් අනා ලේහ කරනු.

77. මනෝසිල, සෙන්ධව, තිකුළු, වලඟ සාල්, උපුල් කොල, පෙරුන්කායන්, මෙකී දේ සමසේ ගෙන අඹරා මී හා ගිතෙල් එක්කොට ලේහ කරනු. කාස හික්කා ස්වාස නසා.

78. වග පුල්, සීනි, මුද්දරප්පලන්, උන මකුල්, විලඳ, නෙල්ලි, මෙකී දේ හෝ

79. වැල්මී, වග පුල්, සීන් මැඩහගු, සිද්ධිගුරු, මුද්දරප්පලන්, මෙකී දේ හෝ

80. වග පුල්, ඉඳි බඩ, ගොකටු, මෙකී බේත් චූර්ණ මී හා ගිතෙලින් අනා ලේහ කරනු. පිතින් උපන් කැසි නැතිවේ.

81. කලාඳුරු අල, අරළු, නෙල්ලි, වග පුල්, එඬරු පොතු, මෙකී බෙහෙත් හෝ

82. රත් නෙටුල් මුල්, වග පුල් මුල්, ඇත් වග පුල්, මෙකී බෙහෙත් හෝ වෙන වෙන අඹරා මී පැතියෙන් අනාලේහ කරනු. සෙමින් උපන් කාස නසා.

83. වැල් මදට, රසඳුං, සීන් මැඩ හගු, රත් නිටුල්, උපුල් කොල, කසා, වග පුල් මෙකී බෙහෙත් සුනුකොට මී පැතියෙන් අනුභව කරනු.

84. දේවදරු, බැවිල, රත්ත, තිපල්, තිකුළු, නෙළුම මල් මෙකී බෙහෙත් සුනු කොට

සීනි හා සමභාග ගෙන හැම කාස නසා.

85.

සිද්ධිගුරු, සිවිය මුල්, කලාඳුරු අල, මුරුවාමුල්, දෙවදරු, තිප්පිලි, කටුවැල් බටු මුල්, ගජ තිප්පිලි, අරළු, සිරිතේක්කු, මිරිස්, හෙල රත්තිවුල් මුල්, රත් තිවුල් මෙකී බෙහෙත් කලඳ ගෙන දිය අට එකට කකාරා පෙරා දෙනු. මින් ගුණ ශ්ලේෂ්මා කාස, හික්කා, ස්වාස, ප්‍රතිශ්‍යා, අරුචි, නසා. අග්නි වැඩෙයි.

86.

තිප්පිලි මුල්, සිවිය මුල්, රත් නෙටුල්, ඉවද, රට තෝර, සිද්ධිගුරු, අරළු, සිරිතේක්කු, රසකිඳ, වං ඇපල, මිරිස්, වලහ සාල්, පිටවක්කා, බටු, කලාඳුරු, තිකුළු, පොකුරු මුල්, සිරිතේක්කු, කටුවැල් බටු, මෙකී බෙහෙත් දෙකලං බැගින් ගෙන දිය අට එකට කකාරා මී පැනි මිශ්‍ර කර රාත්‍රියෙහි පානය කරනු. මෙහි ගුණ ස්වාසයට, පීනසට,

87.

එළු මරුන්දු, පල්මාතික්කන්, රිදී තුත්තං, රංවන් අත්තන කොල යුසයෙන් අඹරා ඔලිඳ ඇට පමණ ගුලිකර ඉඟුරු යුසයෙන් දෙනු.

88.

සිවිය මුල්, කොට්ටං, මදටිය, කසා, සිද්ධිගුරු, ඉරමුසු මුල්, වැල්මී, දේවදර, කටුකරෝහිනි, සෛන්ධව ළුනු, මුදු පෙන මේවා එකිං එක්කලං මුක්කාල මුක්කාලයි දී කිරි මෝරු තල තෙල් නැලි එක්ව ලේහ කරනු.

89.

රසදිය, ගන්ධක, වච්චනාවි, අරළු, පුස්කර, තිකුළු, දෙවදරු, කවඩි, රසකිඳ පිටි, අරත්ත, වලහු සාල්, සමසේ ගෙන චූර්ණකර මීයෙන් ලේහ කරනු.

90.

රිදී තුත්තම්, රසදිය, පුෂ්කර, වච්චනාවි, පල්මාතික්කන්, හිරියල්, මෙකී දේ සමභාගයි කරවිල කොල යුසයෙන් අඹරා දුරු පොඩි එක්ක සීනි යොද දෙනු.

91.

වැල්මී, වද කසා, දෙවදරු, වෙනිවැල්, නෙළුම් රේනු, තිප්පිලි, සිද්ධිගුරු, මුරුංගා බිජු, ගල්මද, ජටා මාංශ, මිරිස්, සාදික්කා, කපු ඇට, එන්සාල්, මනෝසිල මෙකී බෙහෙත් සමසේ ගෙන චූර්ණ කර පාන්කඩ අඹරා කැස්සටපාකංඩ දුං දෙනු.

92.

සාදිලිංගන්, වච්චතාවී, පුස්කර, මිරිස්, තිප්පිලි, සමභාග ගෙන දෙසි ඇඹුලෙං අඹරනු. ඔලිඳ ඇට පමණ ගුලියි.

93.

රසදිය, ගන්ධක, ලෞහ, සින්ධූරං, ගලින් අඹරා යකඩ අප්පල්ලයක ලා ලිප තබා උනු වු කල එල ගොම බිමලා අළු කෙහෙල් පතක් එහි තබා උනු බෙහෙත් එහි ලා උඩින් පතක් වසා නැවත ගෙන ඉඟුරු යුසයෙන් අඹරා යලි; නැවත, කිකිරිඳිය, මුඩමහණ කසා, වං ඇපල, කෝමාරිකා යන මෙකී යුසයෙන් අඹරා ගුලිකර ඉඟුරු යුසයෙන් දෙනු. සියලු කැසි මුස නසා.

94. **කැස්සට පිළියං**

එලබටු, මහ ඔසු (ඉඟුරු), ආමුතා (රසකිඳ), අරළු, වං ඇපල, බෙලි මුල්, මෙ හැම කකාල කසාය උදය වලඳනු. පංච කාසම නසා.

95.

සිහුරු, අති උඩයන්, පෙරුන්කායන්, තිප්පිලි, කටුකරෝහිනි, සිවිය මුල්, තිප්පිලි මුල්, සවින්ධව ළුනු, රත්නිටුල් මුල්, එල නිටුල් මෙකී බේත් සමභාග ගෙන බැද චූර්ණ කර තුන් කලඳකින් මෙ පිට පමණ දන ගිතෙල් තල තෙල් එක්ක අනාපානය කරනු. කාස මන්දග්නි අතිකුත් වැදියට හිතයි.

96. **කුස්මාඩ රසායනය**

ලාම පුසුල් ගෙන මදක් පිට පොතු ත් හැර අඟිලි ඇඟිලි පමන කැබලි කපා සැලියේ මදක් තබාගෙන දිය මිරිකා තබා මිට සීනි විසි පලමකුත් එක්කොට මී පැනි මතාවකුත් එක්කොට, ගිතෙල් මනාවකුත් එක්කොට ලිප තබා සැදිගා උකු පදමට තිප්පිලි, සිද්ධිගුරු දුරු මෙ හැම සකලං බැගින් ගෙන එන්සාල්, කුරුඳු, පොතු, කොල්ලං කොල, කොත්තමල්ලි, මිරිස් මෙකී බෙහෙත් එක්කලං සමාර බැගින් ගෙන මදක් බැද චූර්ණ කර එහිලා සොඳ රහට සැත්දෙන් ගටා තනා තබා තුං කලඳක් දෙවේලේ අනුභව කරනු. කාස නසා.

97.

වං ඇපල මුල්, කොත්තමල්ලි, තිප්පිලි මුල්, අසමෝදගං, සිද්ධිගුරු, දියමිත්ත, මෙ හැම කකාල කසාය මී පැනි හෙය දෙනු.

98.

ත්‍රි කටුක, අරළු සමව ගෙන උනු දියෙං අඹරා එයින්ම දෙනු.

99.

ත්‍රිකටුක, හිරියල්, තිපල්, කරාබු, කළු දුරු මේවා චූර්ණ කර බ්‍රහරාජ ඉස්ම හා මකුළු වැන්න ඉස්මෙන් රෙද්දක රද පලමු චූර්ණ එහි ලා පාංකඩ අඹරා අවුලා තබා දී කිරීත් බතුත් කකා තුන් වරුවක් දුං ගනු.

100.

අග්නි මාන්ද්‍ය හා ක්‍ෂය කාස, වැල්මී, විලිකුං පුහුල් ඉස්මට අඳීධයක් කිරි හා ගිතෙල් ගෙන පදමට සිඳ බත් සමහ වලඳනු.

101.

ගජ කනා, තිප්පිලි, ඉඟුරු, සිරිතේක්කු, කිඳි (රසකිඳ), කටුවැල්බටු, රට තෝර, වං ඇපල, සාතාවාරිය, මුරුවා, වැල් තිබ්බටු චූර්ණ කර මීයෙන් දෙනු.

102.

සෙම ඔක්කාරයට - විලඳ, නුග දළු, තිප්පිලි, සවිඳ එනු, වෙන වෙන බැඳ පොඩි කොට මීයෙන් දෙනු.

103.

අරළු, නෙල්ලි, පිටවක්කා මුල්, මුස්තා එක විවරට ගෙන චූර්ණ කොට තල තෙල් මී පැනි එක්ව ලේහ කරනු.

104.

තිපල්, හිරියල්, ඉඟුරු, මිරිස්, තිප්පිලි, කොට්ටං, වං මුතු අල මේවා චූර්ණ කර තල තෙලිං අනා පොල් බෑයකිං වසා අඟුරු කබලක ලා අමු බත් කටට තබා ලීයෙ දුං උරනු.

105.

කසා, දිය මිත්ත, ඉරමුසු, මිරිස්, කෙලින්ද යන මෙයින් කකාල කසාය මී පැනි එක්ව තබා පොවනු. කාස රෝග, අග්නි මන්ද නසා.

106.

වං ඇපල, කිඳි, අස්ගොඳ, කනා, සාතාවාරිය, එල බටු, ගොකටු, බ්‍රඟ රාජ, හිරැස්ස, මහ පස් මුල, සැවැන්දර, සඳුං, ඉරිවේරිය, ත්‍රිපල්, ත්‍රිකුළු, ත්‍රිජාත, කොට්ටං, අරත්ත, වැල්මී, මී පුක්, උන මකුළු, පොල් කුඩු පලා, දෙකසා, ළුණුරල, පස්එනු මේ හැම බේත් ගන්නා කල වං ඇපල ආදී කොට පස් මුල් ආදී කොට මෙකී බේත් තිස් පලමක් කොටත් ශැවැන්දර ආදී කොට බේත් පහක් තුං තුං කලඳ ගනනටත් ඉං මෙපිට බේත් පස් පස් කලඳ ගනනටත් ගිතෙල් නැලි සමාරක් ගෙන කකාරාගන මී පැනි, ත්‍රිපල් එක්ක වලඳනු.

107.

ඉඟිනි ඇට අඹරා චූර්ණ තල තෙලින් දෙනු. කැසි මුහ ගුනවෙයි.

108.

වං ඇපල, වැල් තිබ්බටු කොල, දෙකින් ඉස්ම පත පතයි. ගිතෙල් තල තෙල් පතයි, වලහ සාල්, එනසාල්, කසා කලාඳුරු අල, හිඟුරු පියලි, මුද්දරප්පලන්, බැබිල, මාතිල් අල, තිප්පිලි, පිටවක්කා, රසකිඳ, වැල්මී, කටුවැල් බටු, තෙමනල, ඌරල, කෙලින්ද, ගොකටු, මෙවා සමසේ ගෙන කල්ක කර අඹරා ගිතෙල් නැලියක් ලා තෙල් පදමට සිඳ සත්ත බලා දෙනු. එක දසරු පක්ෂ වු රෝග නසයි.

109.

කෝමාරිකා දෝතක් පමණ ගෙන තල තෙළුත් සම වත්කොට සරිවි කර උදය දෙනු. මුහ නැතිවෙයි.

110.

අරළු දහයක් තලා දමා පැනි පදමට කකාරා එම පමණ තල තෙල් උක් හකුරු, මී පැනි, ගිතෙල් එක්ව පමන දූන වලදනු. කැසි, මුස, ස්වාස, වායු, පිත්, සෙලෙස්මා, වමන උදර ගැල්ම ගුනවෙයි.

111.

කසා, අරළු, නෙල්ලි, මෙකී දේ චූර්ණ කොට සිඳ ගත් තෙල උදය සවස දෙනු. කැසි මුස සංසිඳේ.

112. ගල ග්‍රහට

දූමිතිරිය, බ්‍රහ්ම රාජ, වං ඇපල, මකුළු වැන්න මෙකී කොල යුස ගෙන ගිතෙලිං සිඳ දෙනු.

113.

පැනි (මී පැනි), වම්බටු, එලකිරි ඉස්ම තලතෙල් එක්ක දෙනු.

114.

පල්මාතික්කන්, තිප්පිලි, සිද්ධිගුරු, සවිඳ, දෙඩම ඇඹුලෙන් අඹරා තල තෙල්, මී පැනියෙං අනා දෙනු.

118.

වැල්මී, කතා, ඉඟුරු, මේවා චූර්ණ කර සීනි මී පැති ගිතෙලිං අනා ලේහ කරනු

119. **කාසයට හා හික්කාවට**

තිපල්, සවිඳ, වලඟුසාල්, හිඟු, කොට්ටං මේවා චූර්ණ කර ගිතෙල් මී පැති සමඟ ලේහ කරනු.

120.

ඉත්තෑ කුරු, පුළුස්සා අළු තල තෙලෙං අනා දෙනු.

121.

ඒකා වේරිය මුල්, දෙසිඹුලෙං උරව්වි කර තල තෙල් එක්ක අනා පල්මාතික්කන් ටිකක් එහි ලා දෙනු.

122.

පල්මාතීක්කන්, බටුකර, මී මුරුවට, දෙසිඹුලෙං අඹරා එහි කලතා දෙනු. ගලග්‍රහ ගුනවෙයි.

123.

කනා, කොතඹුරු, සුවඳ හොට, සමව අඹරා රෙද්දක දවටා දුම බොනු.

124.

ශාබො ඇට චූර්ණ කර මීයෙං ලේහ කරනු.

125.

ඉඟුරු පයෝදරින් නශ්‍ය කරනු. ඉක්කාවටයි.

126.

මොනර පිල් දවා අළු ගෙන වග පුල් කලදක් පොඩි කොට මීයෙං අනා කවනු.

127.

මී පැති පයෝදරිං නශ්‍ය කරනු. ඉක්කා සිටී.

128.

දිවුල් ගෙඩි පොතු, කොල යුස මීරිකා වග පුල් සුනු කලදක් ලා පොවනු.

129.

මොනරාගේ,උකුස්සාගේ පිහාටු .මෙ දෙවගේ පාංකඩ අඹරා රෙද්දක තබා අඹරා ඔනෑවට අවුලා බට ලීයෙං නාසයට දුං උරනු. දුම ගන්නවාට පළමුවෙන් අත්තන රේනුවක් ගෙන නාසා පුඩු ඇතුලෙ දූ නෙත්ට කුමුන්ද දමා දුං උරනු. ඉක්කා සිටී.

130. **අරුචියට, සෙමට, ඉක්කාවට**

බෙලි මුල්, ඉඟුරු, අරළු, විලඳ මෙවා කකාල කසාය උදය දෙනු. වා, පිත්, සෙමෙන්වූ ඉක්කා සිටී.

131.

සිවිය, තිප්පිලි මුල්, මිරිස්, සිද්ධිගුරු, බෙලි මුල් මෙයින් කකාල කසාය දෙනු.

132.

තිකුළු, යවකර, මොදගං, සීනි මෙ හැම අඹරා කාඩියෙහි,කලතා දෙනු.

133.

තිප්පිලි, සිද්ධිගුරු, බෙලි මුල්, යන මෙයින් කකාල කසාය දෙනු. සවිඳ එක්කොට දෙනු.

134.

සොංකල කිරි කොට්ටම්, වැල්මී, උනු පැතිං අඹරා මීයෙං අනා ලේහ කරනු.

135.

එන්සාල්, කුරුඳු පොතු, කොල්ලං කොල, දූරු, සීනි මෙවා අඹරා කාඩි එක්කොට ගංඩූස කරනු. අරුචි, කෙල ඉතිම, කැසි ස්වාස ගුල්ම රෝග නසා.

136.

සවිඳ, මිරිස්, තිප්පිලි, සිද්ධිගුරු, නත්තාරං ඇඹුල්, මී පැති මෙවා එකට අඹරා කටේ තබනු. අරුචි නසා. කැස්ස නසා.

137.

එන්සාල්, නාමල් රේනු, කුරුඳු පොතු, මිරිස්, වග පුල්, සිද්ධිගුරු, ක්‍රමයෙන් වැඩි කොට වූර්ණ කර සීනි සමහ ලේහ කරනු.

138.

නන්නාරං ඇඹුල්, දෙළුං ඉස්ම, සියඹලා බොර, ජීවුල් ඉස්ම, සීනි, මී පැනි, මුද්දරප්පරම්, නෙළුම් රේනු, දෙදුරු, එන්සාල්, කුරුඳු පොතු, කොල්ලං කොල, තිප්පිලි, විලඳ, සාදික්කා, යොං ඉඳි මෙකී බදිනා දේ බැද වේලන දේ වේලා අඹරන කල පලමු කී ඉස්ම එක්කර පදමට අඹරා ලේහ කරනු. අරුචි, වමන, කාස නසා.

139.

සිද්ධිගුරු, අරළු, සුදුළූනු, අසමෝදගම්, සුදුදුරු, මිරිස්, තිප්පිලි, පොරුම්කායම්, සමභාගයි රත්තිටුල් මදින් ගනු. මෙකී බෙත් වූර්ණ කොට බිලාල පාදයක් වලඳනු. දිවි තිබෙන තුරු කැසි වායු නසා.

140.

තිකුළු, තිපල්, සුදුදුරු, ගල් මද, සවිඳ මේවා සමව ගෙන සියඹලා ඇඹුලෙං අඹරා මීයෙං යොදා ලේහ කරනු.

කරඳ මුල්, කසාය කකාරා කට සෝදනු. කල් ගිය කාස රෝගීන්ට කටේ කාරම බැඳුනාට.

සෙම නිසා කටේ හා උගුරේ රැල බැඳුනාම කැස්සට. ඉඟුරු පෙති, ගඩා දෙහි ඇඹුලෙං තම්බා තිබනු. කෙල ගසනු.

143.

සිද්ධිගුරු, ඉරිවේරිය, මුරුංගා ඇට, තිප්පිලි, සවින්දව ළූනු, කළු දුරු, සුදුදුරු, අසමෝදගම්, මිරිස්, සමව ගෙන අඹරා ගුලිකොට මුබය දරා ඉඳිනු.

144.

වැල් තිබ්ඹුටු හෝ එල බටු මුල්, සිද්ධිගුරු, රසකිඳ, අරළු, ආඩාතෝඩා මුල්, බෙලි මුල් යන මෙකී දේ දෙකලඳ දෙකලඳ ගෙන අට එකට සිඳුවා මී පැනියෙන් දෙනු.

145. කැස්සට

විලද, නෙල්ලි, තිප්පිලි, සිද්ධිගුරු, අරළු, මේ හැම සමභාග ගෙන චූර්ණ කොට දිය ගතීද මාලේ ගිතියටද මෙකී දෙයට යහපති.

146. සරස්වතී තෙල

කොට්ටම්, අරළු, මුරුංගා මුල්. වද කසා, තිකුළු, සෛන්ධව මෙකී බෙත් සමව අඩපලමක් ගෙන අඹරා කල්ක කොට එළු කිරි සතර නැලියක් එලඟි තෙල් දෙනැලියක් දිය දසයක් එක්කොට මද ගින්නේ තුන් දවසක් කකාරා කල්ක ලනු වැටෙන පදමට බා පෙරා ගන්න. කැසි, මුස, උන්මාද, ගොලු, විකල් නසා.

147. කලාදුරු අල, අරළු, නෙල්ලි, පිටවක්කා මුල්, සමසේ චූර්ණ කොට තල තෙල් මී පැනි දෙවගේ අනා ලේහ කරනු. කැසි ගුණවේ.

148. මනෝසිල, සයින්ධව ළුනු, මිරිස්, සිද්ධිගුරු, වලග සාල්, කොට්ටම්, පෙරුම්කායම්, මෙකී දෙය චූර්ණ කර ගිතෙලින් මී පැනි දෙවගේ එක්කොට අනා ලේහ කරනු. කැසි මුස ඉක්කා නැතිවේ.

149. කටුකරඬු මුල්, කීකිරිදිය, මේ දෙවගේ චූර්ණ කොට කටු තෙලින් අනා ලේහ කරනු.

150. කළු දුරු, මිරිස්, සිද්ධිගුරු, වග පුල්, කලාදුරු අල, චූර්ණ කොට කිතුල් හකුරෙන් ගුලිකර ගුලි කටට අඩංගු කොට කෙල ගිලිනු.

151. තික, දළුක්, සීනටි සාළුත්, සමසේ ගෙන එම ඉස්මෙන් අඹරා එම ඉස්මෙ දිය කොට මිරිස් වග පුල්, සුදුළූනුත් අඹරා එක්කොට තික කොල ඉස්ම වර දියට ගෙන කබුළු පිස ගිතෙල් තල තෙල් එක් උදය පසක් හයක් කනු උනු දිය බොනු. සියළු කැසි ගුණවේ.

152. වරා කිරි වියලි වියලිණේ තුන් වරක් රෙදි රද මනෝසිල, තිකුළු, චූර්ණ කොට බෙත් පෙවූ රෙද්දෙලා පාන්කඩ අඹරා පොල් බෑ අඟුරෙ ලා දුම් බොනු. කැසි ගුණවේ.

153. මනෝසිල, තිකුළු, කොට්ටම්, කලාදුරු අල, චූර්ණ කොට තල තෙලින් අනා

කබලෙන් බැද අහුරු ලා හිල් පොල් බෑයකින් වසා කුඩා බට දඬකින් දුම්බොනු. කැසි ගුණවේ.

154.

ඉඟුරුත්, වදකසා, අරළු, වෙන වෙන උනු දියෙන් අඹරාද උනු දියෙන් දිය කොටද දවස දෙවේලේ බොනු. කැසි ගුණවේ.

155.

ඇත් සැටිය කොල, රසකිඳ කොල, ආඩාතෝඩා, කලුකැත් මෙරිය කොල, මෙකී කොල සමයේ ගෙන යුසට තිකුළු චූර්ණ කොට එක්කලං සමාරක් හා මී පැති කලදක් මෙකී බේත් යුෂට කලතා දෙනු. කැස්සු සිට.

156.

තික කොල ඉස්ම සතර පලමක් විචර ගෙන උකු කොට කකාරා ගිතෙලුත් තල තෙල් ටිකකුත් තිකුළුසුනු එක්කොට සතියක් දෙතුන් දවසක් දෙනු. කැසිවාත ගුණවේ.

157.

වැල් කසඹිලියා මුල්, කටුකරෝහිනි, වග පුල්, අරළු, සමභාග ගෙන චූර්ණ කර ගිතෙල් මී පැති දෙවගෙන් ලේහ කරනු. මුහ ගුණවේ.

158. මුසට

කිතුල් හකුරු, මිරිස්, වෙලි කසා, අත්තන, මුද්දරප්පලම, වග පුල් සමභාග ගෙන චූර්ණ කොට තල තෙල් එක් කලත් සමාරක් ගෙන බේත් පදමට අනා ලේහ කරනු.

159.

කෙම්පලා වැල්, පිච්ච මල්, වරා මුල්, වග පුල්, සමභාග ගෙන සාල් පානුවෙන්ම තම්බා ඊටම දිය කොට බොනු. සුවාසයටයි.

160.

පුපුල කොල ඉස්ම ගොටුවක් විචර ගෙන ඊට තල තෙල් භාගයක් වක්කොට මී මුරුවට එලබටු ගෙඩියක් විචර එක්කොට උදය බොනු. ලය විරේක වේ. මුහ ගුණවේ.

161.

කෝමාරිකා මද, දෝතක් විචර ගෙන තල තෙල් සමභාග වත් කොට උදය දෙනු මුහ ගුණ වේ.

162.

නුපුන් මී ගසකින් බටහිර දිසාවෙන් පොත්තක් ගෙන උළුප්පා තලා ඉස්ම ගෙන හීනටි හාලේ පිටි යොද එම වර දියෙන් කබුළු පිය කතා නොකර ඉඳ බස්නාහිර බලා ඉඳ තුන් කෙමඹුරක් කනු. මුහ ගුණවේ.

163.

මී පැතියෙන් අරළු කුඩු ලේහ කරනු. කැසි, වමන නවතී.

164.

මුරුවා මුල් තුන් කලඳක් අඹරා හාල් පානුවෙන් දෙනු.

165.

එන්සාල්, කුරුඳු පොතු, නාමල් රේනු, මිරිස්, සිද්ධිගුරු, වග පුල් ක්‍රමයෙන් බාගයක් ගෙන චූරණ කරනු.

166.

වැල් කසඹිලියා ඉස්ම තුන් දවසක් බොනු. මුහ ගුණ වේ.

167.

මොතර පිල් දවා අළු ගෙන කිතුල් සකුරු, මී පැති දෙවගෙන් ලේහ කරනු. කැසි ගුණ වේ.

168.

තන කිරි නස්න කරනු. ඉස්මුදුන මදිච්චි කරනු. කැසි වන සිටී.

169.

සයින්ධව එනු එක්කලන් සමාරක් එලගිතෙල් කලතා පොවනු. කැසි වමන නවතී.

170.

අමු ඉඟුරු ඉස්මත් උක් පැතිත් සමව කලතා දෙනු.

171.

වග පුල්, මිරිස්, ගල් මද, සමභාග චූර්ණ කොට මේ හැම බරට විලඳ සුනු ගෙන මී පැතියෙන් ඇර පොඩි කොට කලතා දෙනු. කැසි අරුචි නසා.

172.

පිටවක්කා, කොසඹ, තික මෙකී කොල කසාය කකාරා සයින්ධව එනු. පෙරුම් කායම් වංචාඩි පසක් චූර්ණ කලතා දෙනු. ඉක්කා සිටී. ශ්වාස සිටී.

173.

කරල් සැබෝ චූර්ණ කර මී පැතියෙන් ලේහ කරනු. ඉක්කා, මුහ තවකී,

174. **ගලක්කරාවට**

කුප්පමේතිය, සුදුළූනු, එක්ක අඹරා රෙද්දෙන් පෙරා දෙනු. තද වී නම් මී මුරුවට එක්ක දෙනු.

175. **ක්‍ෂය කාසයට**

අමු ඉඟුරු, ගම්මිරිස් කසාය කකාරා මී පැතියෙන් දෙනු.

176.

ආඩතෝඩා කොල, තික කොල, එරබදු කොල, කිකිරිදිය කොල ඉස්ම එක පමණට ගෙන වග පුල්, සිද්ධිගුරු, සහිඳ ලුණු, මිරිස් ගිතෙල් මෙකී දෙය එක්කොට පදමට තෙල් කකාරා මදක් දෙනු. ශෙලසිමා කැසි ගුණ වේ.

177.

මනෝසිල හෝ සුවඳ කොට්ටම්, සල් දුම්මල, ඊ තන මුල් වෙන වෙන ගිතෙලින් දුම්පානු. ඉක්කා කැසි මුහ සිටී.

178. **සියළු කැස්සට**

මී පොතු කොටා පිටි ගෙන සීනටි පිටි සමහ අනා රොටිය තනා ගිතෙලින් බැද දෙනු.

179.

හිඟුරු පට්ටා, පොල් සමඟ කොටා මිරිකා මුස සෙල්ලුන විට දෙනවාය.

180. **කාස ජවර ගුල්ම**

සුළු බුරුද, හෙල එහුනු, සිද්ධිගුරු, මෙයින් විඩිවූ ලෙස කල එලකිරි කසාය වලදනු.

181. කැස්සට

උප්පැති කාලයි, වන් ඇපල මුල් යුස කාලයි, රසකිඳ යුෂ කාලයි, කොට්ටන්, ඉවද, කරාඹු නැටි, මෙවා සමව චූර්ණ කර ලේහ පදමට කකාරා කඩ දෙනු.

182.

අළු පුහුල් ගෙන මිදි පිට පොතු හැර අඟිලි පමණ කපා පස්විසි පලමක් ගෙන දියෙන් මදක් තම්බා දිය මිරිකා හැර ගිතෙල් නැලියක් ලිප තබා පුහුල් කැබලි එහි ලා තෙලෙන් තන්බාගෙන දිය හා පැසවු තෙල් මදක් මිරිකා හැර මිට සීනි පස් විසි පලමක් ගෙන මී පැණි මනාවයි එළගිතෙල් මනාවයි මෙවා එක්කොට නැවත ලිප තබා හැඳිගා උකු පදමට තිප්පිලි සිද්ධිගුරු හකලද හකලදයි. ත්‍රිසුගන්ධි කොත්තමල්ලි, මිරිස් මෙ හැම එක්කලන් හමාර බැගින් ගෙන මදක් බැද චූර්ණ කර එහිලා හැන්දෙන් සොද රහට ගඩා තන්බා මින් තුන් කලදක් අනුභව කරනු. මෙහි ගුණ වියලි උෂ්ණයෙන් එන කාස ගුණවේ.

183. පිත්තකාස

දෙදුරු, අසමෝදගන්, තිප්පිලි, මනෝසිල, කොට්ටන්, වැල්මී, සුදුළූනු, යබර කුඩු, යහුනු, ඉඟුරු, අරළු, නෙල්ලි, මෙවා කලඳ කලඳයි. යබර කුඩු යකඩ යහුනු තුන් කලඳයි, මෙවා අඹරා තබා මී පැති උක් පැති නාමුල් බුලත් යුෂ සාතාවාරිය යූෂ කහ මුල් යුස. මෙවා යුස පත පත ගෙන හින් දෙහි ගෙඩි 20 ක ඇඹුල්ද ගෙන මෙම ඇඹුලුත් මී පැතිත් රන් තැබිලි දියත් එක පමනට ගෙන නවුම් භාජනයකට වත් කොට සරක්කු අඹරා දමා කඩමැටි බැඳ වී යට සතියක් තබා දවස දෙවේලේ වලඳනු. එනු ඇඹුල් වලකිනු. මින් ගුණ පිත්ත ආධුවටද, කාමලටද, සෙංගමාලයටද, මල බද්දයටද, ඇහදය, ඉස කැරකැවීමටද කරකැවිල්ලටද, ලය වේලීමටද, අනපය එලීමටද හති කැක්කුමටද, කට තොල වේලීමටද, ඇස් රතු වීමටද, මුත්‍ර පැති පාට වීමටද, පිත්ත කාසයටද යහපති.

184. කැසි මුසට

සුදුළූනු යුස පතයි, තිකුළු මදක් බැද අඹරා එහි කලතා පානය කරනු.

185. සියළු කැස්සට.

තිප්පිලි චූර්ණ මංචාඩි පහලවකුත් ගම්මිරිස් සුනු එක්කලන් හමාරකුත් එකට කකාරා පැති දෙඩන් ඇඹුල් දේඩන් මෙම දෙවගේ පැගිරි සහ ඇඹුල් තේ කෝප්ප භාගයක් ගෙන උදය සවස දවස දෙවේල සතියක් වලඳනු. මෙම බෙහෙතට මී පැති බෙලිකටු දෙකක් පමණ ගන්නවාය. ලුනු ඇඹුල් මද කර ව්‍යංජන වලට ගනිමින් පත්තියමට දවසක් හැර උදය හතර වේලක් පැන් වක්කරනවාය.

186.

පිට පොතු හැරපු අළු පුහුල් තුලාවක් ගෙන උයා නැවත තල තෙලින් තංබා මී පැනි පැය ඌ තැන අරගන සකීකරා පුහුල් පමන ගෙන එකතු කර සිද්ධිගුරු, දෙකලද බැගින් ගෙන එන්සාල් කොල්ලන් කොල, කුරුඳු පොතු, මී රිස් මෙවා වෙන වෙන සකලන් බැගින් ගෙන සුනු කොට එහිලා තබා සිහිල් වූ කල මී පැනි ගිතෙල් නැලිය නැලිය ගෙන එක්කොට සොඳ රහට සැදිගා තනා තිබා දෙවේලේ වලඳනු. ක්ෂය, කාස ශවාස නසා. අරුචි රත් පිත් නසයි.

187. **ඇදුම, ක්ෂය, ගොළු.**

අළු වතු ගෙඩි පතයි. මෙවා පැනි ගන්නා ක්‍රමය නම් අළු වතු ගෙඩි ලෙලි හැර දමා දෙහි සමඟ අනා රෙද්දක පොට්ටනි බැද උඩ එල්ලා භාජනයක් යට තබා ඒ වැහෙන වතුර පැනීයීගත යුතුය. අළු පුහුල් යුස නැලියයි. කප්පර වල්ලිය කොල යුස නැලියයි. හේන් කැකිරි කොල යුස නැලියයි. වන් ඇපල කොල යුස නැලියයි. කිකිරිඳිය කොල යුස නැලියයි. උක්පැනි නැලියයි. ඔලිඳ කොල යුස නැලියයි. එල කිරි නැලියයි. මෙකි දේ එක් භාජනයකට වක්කර තුන් දවසක් ඌරු වෙන්ඩ තබා මීට සරක්කු, වැල්මී, තිප්පිලි, මාසක්කා, ඉවඳ, වාල් මොලඟු, දෙදූරු, ත්‍රි වගී, කෙලින්ද, දේවදූරු, ගල් නහර, කොතඹුරු, රතුළුනු මෙවා සම භාග ගෙන මී පැනි, ගිතෙල්, සීනි, සූකිරි, තල් හකුරු, කිතුල්, වැලි හකුරු, මෙ හැම සිනිඳු කොට අඹරා තෙලට කලතා ලිප තබා කල්ක ඉටි පදමට බා පෙරා තබා කාසි දෙකක බර උනු දියෙන් දෙනුංසත් දවසක් මෙ බෙහෙත වලඳනු. පත්තියන් උනු වතුරයි. මෙහි ගුණ ක්‍ෂය රෝගද, කට කිරිදි එන රෝගද, ඇදුමටද, උගුර කට වෙලිමටද, බැරැන්ඩියටද, පිත්ත කාසයටද පිත්ත ජවරයටද, ගුණවේ.

188-1 **ක්‍ෂය කාසයට**

ඇත් වහ පුල්, සිද්ධිගුරු, රටතෝර, කටු වැල් බටු, රස කිඳ, වන් ඇපල, මුරුවා, වැල් කසා, දිය මිත්ත, මිරිස්, තිප්පිලි මෙ කායම ප්‍රථම දෙනවාය.

188-2

සුළුබුරු, හෙල ලූනු, සිද්ධිගුරු, මෙයින් විඩි වු ලෙස සිඩකළ කිරි කසාය වලඳනු. ක්‍ෂය කාස, ක්‍ෂතකාස නසා.

189. **ඇදුමට කැසි උනට**

ලිංගන් ත්‍රිපල් පුසුකර තිප්පිලි මනෝසීල සතකුප්පයේ නා
කොට්ටං වැල් මී දේවදර ගෙන සාදික්කා හිංඟුද රැගෙ නා
සෙවුයන් ගල් මද නවසාරන් ගෙන කරාඹු වසාවාසිද රැගෙ නා
තුත්ථං පල්මානික්කං ගතිමිං සහිඳ එනුද කටුකරෝසි නා

මෙකී මෙ අවුසද සමව කිරාගෙන එල කිරි වක්කර අඹර මී නා
දෙවනුව කී හැටි උක් පැනි තන කිරි හිඟුරු පටද යුෂ අඹර මී නා
තුං වෙනුවම කන්ෂා කොල යූසයෙං අඹරා මිරිශට පමන ගෙ නා

අගස්ති නම රුසිවරුන් විසිං කී කෝල මතුර ගුලි බල ඇදි නා

කළුදුරු සුදුදුරු තිප්පිලි සාදික්කා හිඟුද රැගෙ නා
එල කිරි උප්පැති තැඹිලිද කස පැං ඉඟුරු මිරිශ් සුදුළූනු ගෙ නා
මෙකී මෙ අවුසද කසාය යොදමින් බාගය සිඳවූ කල රැගෙ නා
මෙ කී කසායට ගුලිත් යොදලා දීපන් දස අට කෝල නා

වම්මුතු ඉරිවේරිය ඉරමුසු මුල් පාවට්ටා බිං කොසඹ ගෙ නා
මෙකී මෙ අවුසද සමව කකාරා තිප්පිලි චූර්ණ කර රැගෙ නා
ලැය ඇදූමද කැසි කෝල විකාරද ගිනියං තදවි දුවොතින් නා
මෙකී කසායට ගුලිත් යොදලා දීපන් ගුණවෙයි විගසකි නා

දෙහිද දෙඩං නාරං මුල් ගනිමිං කුරුඳු මිරිශ් මුල් සමඟ ගෙ නා
මුක ඇදවි බස ගොළු කරවාලා බිම අත ගාමින් පෙරළමී නා
මෙකී ලෙඩට සැක නොව විමසා දෙං මදුකත් ත්‍රිජාති තිපල් ගෙ නා
මෙකී මෙ අවුසද සමග කකාරා ගුලිත් යොඩාගෙන දෙං සොඳි නා

ලැම දහඩිය සෙං වේල වමිංඋන ගිනියං තද කරවිමි නේ
ඉඟුරුත් කොතඹුරු වද කහා පැපිලිය වම් මුතු රසකිඳ මුල්ද ගෙ නේ
මෙකී මෙ අවුසද සමව කකාරා ගුලිත් යොද ගන දෙං සොඳි නේ
මෙකී සියලු ලෙඩ නොරද පලයෙයි රිවි දුටුවිට පිනිබිඳු ලෙසි නේ

රත් පිත් වාතෙන් ප්‍රමෙහ අධිකව උනගිනියං තද කරවා න මි
මත් වි ඇඟ සීගතු කරවා සිට ඉල ඇ දුමෙන් දනුමට ඒන මි
වම්මුතු ඉරිවේරිය රසකිඳ මුල් වං ඇපලද සපු සත්තිඳ ගතිමි මි
මෙකී අවුසද සමව කකාරා ගුලිත් යොද පානය කරව මි

190.

වහ පුල්, මිරිශ් මේ හැම එක එක බරට කිරා ගෙන කර නොකොට බැද සුනු කර තබා කලදක් හෝ බාගයක් මී පැනියෙන් වලදනු. සෙම, තදවිම, පාඩුද, බඩේ රුදද, ඉදිමුම, ඇදිරිද, කටි වායුද, රත්පිත් ආදියටද, බගන්දරයටද, මේ හැම ගුණ ගෙන දේ.

191. කාසයට

හාතාවාරිය, අරළු, ඉඟුරු, කොත්තමල්ලි, තිප්පිලි, දෙවදුර, වම්මුතු, කොට්ටන්, අශමෝදගන්, කළුදුරු, සුදුදුරු, රත්නෙටුල්, හිඟුරු පියලි, හරන් කසා, වලහසාල්, සහිද එනු, මෙකී දේ සම භාග කිරාගෙන චූර්ණ කර තබා මින් කලදක් ගෙන සීනි සකුරෙන් දෙනු.

192. ඉක්කා ස්වාස දෙකට

ඩෙබර ලොද, රත් හඳුන්, සිද්ධිගුරු, විලද, කුළු රැන, තබ, මනෝසිල, වහ පුල්, ශිනි, නෙල්ලි, සිද්ධිගුරු, තුඹඅල, කොල, ගෙඩි, මල්, ඉදිබඩ, මෙකී බෙහෙත් ශමව වෙන වෙනම අඹරා මී එක්කොට දෙනු. හික්කා නසා.

193.
වැල් මී අඹරා මී මුශුකොට හෝ මෙ තුන් ප්‍රකාර වෙන වෙනම ලේහ කරනු. හික්කා නසා.

194.
තන කිරි වත්කොට අඹරා නශ්‍ය කරන්න. ශ්වාස වේග, හික්කා නතර වේ.

195.
හිරියල් අඹරා ගිතෙල් අදුං දෙනු. හික්කා නසා.

196.
ගෝනා අං ලැවිගා අහුරලා දුන් බොනු. හික්කා නසා.

197.
ඊතන තලා අහුරෙලා දුම බොනු. හික්කා නසයි.

198.
යවකර එනු පොඩි කොට ගිතෙල් ලා පොවනු., හික්කා නසා.

199.
කහාඹිලිය, වහ පුල්, මුදුප්පලම්, පෙරුංකායන්, අරළු, මෙකී බෙහෙත් සුනුකොට මී පැතියේ හෝ ගිතෙල් එක්ව අනා ලේහ කරනු.

200.
වැල්මී අඹරා මී පැතියෙන් ලේහ කරනු ස්වාස නසයි.

201.
කෙහෙල් මල්, වරා මල්, වහ පුල්, මෙකී බෙහෙත් ශාල් දෙවුන් දියෙන් අඹරා එහිම දිය කොට පොවනු. ස්වාස නසා.

202.
ඝිනි, සූවශ එනු, සිද්ධිගුරු, මෙකී බෙහෙත් අඹරා උනු පැතින් දෙනු. ශ්වාස, හික්කා නසා.

203.
තිකුළු, බෙලි, තොටිල , සිහින් මිදි, ඇද්දෙමට, පලොල්, බටු, කටුවැල් බටු,

එඬරු, මෙතෙක් බෙහෙත් කකාල කශාය හෝ පොවනු. හික්කා ශවාස නසා.

204.

කුරුඳු පොතු, එන්ශාල්, ඉරිවෙරිය, සිද්ධිගුරු, කිරි අඟුන, නෙළුම් අල, එඬරු මුල්, සොර පොතු, අභිල්, කලාඳුරු අල, තල, මෙතෙක් බෙහෙත් ශම භාග ගෙන අඹරා ඊට අට භාගයක් සීනි එක්කොට අනා තබා වලදනු. කැසි මුස, ශ්වාස නසා.

205.

මොනර පිල්, හෝ පිල් නටු එක්කොටදවා ගිතෙල් මී පැති එක්කොට ලේහ කරනු. හික්කා ස්වාස නසා.

206.

ශ්ලෙස්මාවට, සිද්ධිගුරු, පොතු ඉශ්මත් කුකුරුමුවන් ගෙඩි ඉස්මත් තල තෙලෙන් ශමව ගෙන කවනු.

207.

දස මුල් කසාය කකාරා ඉට අමු ඉඟුරු සියක් පලමක් ගෙන ශින් කොට තලා උක් සකුරු සියක් පලමක් ගෙන එක්කොට උයන කල සැදිගා සැන්දෙ ඇලෙන පදමට කකාරා කුරුඳු පොතු, එන්ෂාල්, කොල්ලන් කොල, කොත්තමල්ලි, කලාඳුරු අල, කළු දූරු, තිකුළු, සත කුප්ප, අජමොද, මෙකී දෙයින් පලම පලම බැගින් ගෙන චූර්ණ කොට ඊට එකතු කර සැදි ගා තබා තිම් දඩිවූ කල මී පැති නැලියක් වත් කොට සැදිගා තබා වරුවට තුන් කලද බැගින් අවස්තා බලා වලදනු. ක්ෂය රෝග, කාස, ස්වාස, උන, පීනස, අරුචි, රුජා, ගුල්ම, උදවර්ත, රත්පිත් රෝග නසා.

208.

ඉංචි කුලම්බුවට

ඉඟුරු ඉස්ම නැලියයි, සීනි අට පලමයි, නස්නාරං ඇඹුල් පතයි, මෙකී දෙයට එන්ෂාල්, කුරුඳු පොතු, කොල්ලන් කොල, ත්‍රිකටුක, තිපල්, යහුනු, වලහ සාල්, සමාර බැගින් ගෙන් චූර්ණ කර පලමු කී බෙහෙත් ලා ඇලී වැටෙන පදමට කකාරා කුලඹු කොට බාගෙන උදය උනු දියෙන් පමනක් කනු. අග්නි වඩා: අරුචි, බඩ පිපුන්, ඉදිමුන්, උදරශූල, කාස, ස්වාස, වාත ආදි රෝග නසා.

209.

වැල් තිබ්බටු විලිකුන් ගෙඩි හා මුල් ගෙන සෙවන වියලා වනලා කෝටා චූර්ණ කර රෙද්දෙන් පෙරා නැවුන් භාජනයක තබා ගිලන්ට ගිතෙලින් දෙනු. කුඩා ශරීරයට මී පැතියෙන් දෙනු. පිපාසයට වෙඬුරෙන් දෙනු. කැසි, මුසට තිප්පිලි මී පැතියෙන් දෙනු.

210.

අරළු, මිරිස්, වහ පුල්, කලාඳුරු අල, චූර්ණ කර කිතුල් හකුරෙන් ගුලි කර අඩඟු කර කෙල ගිලිනු. කැස්ස ගුණවේ.

211.

තියද දළුත්, සිනටි සාළුත්, සමසේ ගෙන එම ඉස්මෙන් අඹරා මිරිස්, වහ පුල්, සුදුළුනු, අඹරා එක්කොට ගිතෙලින් කබළු පිස උදය පහක් බත් එක්ව වලඳනු. දිය බොනු. සියලු කැසි ගුණවේ.

212.

මොනර පිල් දවාලු අළු ගෙන කිතුල් හකුරු, මී පැනි දෙවගේ අනා වලඳනු. කැසි, මුස, ඉක්කා ගුණවේ.

213. **කාසයට**

අමු ඉඟුරු, කවුඩු කැකිරි කොල, කප්පර වල්ලිය කොල, මී පැනි, උක් පැනි, කිතුල් පැනි, සීනි, ඇඹුල් දෙඩම යුස, මෙවා පත බැගින් දෙදුරු අරළු වැල්මී ත්‍රිවගී රතු ලූණු කලඳ බැගින් යොදු අඹරා කුලඹු පදමට කකාරා දෙනු.

214.

පාවට්ටා මුල්, රට තෝර මුල්, රසකිඳ, වැල් තිබ්බටු මුල්, කටු වැල් බටු කෂාය කර බොන්න.

215.

සිද්ධිගුරු, කහාඹිලිය, මුද්දරප්පලම්, සීනි, මෙකී අවුසද පොඩි කොට තල තෙලින් අනා ලේහ කරනු. (වාත, කාස)

216.

රා නැලි 3, දෙහි ඇඹුල් නැලි 1, මා වී නැලි 1, ශලක දමා මිටම අසමෝදගම් දෙදුරු, ඉඟුරු, කොල්ලු, තිප්පිලි, මෙකී දේ කලඳ කලඳ ගෙන චූර්ණ කර ඊට දමා මදගින්නේ කකාරා නැලියට සිටි කල බා පෙරා වී නැලියද අව්වේ වියලා කොටා කබලෙන් බැද චූර්ණ කර හී රැස්ස තැම්බු දියෙන් රොටී තනා පලමු පෙරු කසාය නැලිය හත්වරුවක් පානය කරනු. රොටී හත හත්වරුවේ වලඳනු.

217.

අගල් ආදර පොතු යුස, දෙළුන් ඉස්ම, මී පැනි, රතුළුනු යුස, සුදුළුනු යුස, දෙඩම් ඇඹුලු, තන කිරි, කවුඩු කැකිරි යුස, කප්‍ර වල්ලි යුස, මී පැනි පත බැගින් ගෙන බඳුනක වත් කර ලිප තබා ත්‍රිජාත, වැල්මී, කොට්ටං, නෙලුං රේනු, අක්‍රපට්ට,

තිකුළු, දෙදුරු, කලාදුරු, කකුලු සුහු, සිරිතේක්කු, කලඳ කලඳ බැගින් සුකිරි කුඩු පතයි. මේවා කුඩු කර දමා මද ගින්නේ කකාරා හැන්දේ ඇලෙන පදමට බා බුලු ගෙඩියක් පමණ දවසට තුන් වරක් කන්න. ලුනු ඇඹුල් අරිනු. ස්වාස කාස නසා.

218.

සිකුරු පියලි, කලු පෙරුන්කායම්, උක් හකුරු, කලාදුරු, කහඹිලියා අඹරා තල තෙලින් අනා ලේහ කරනු.

219.

මනෝසිල, සහිඳ ලුණු, තිකුළු, වලහසාල්, පෙරුංකායන් සියල්ල අඹරා එලගිතෙල් හා මී පැනි මුසු කොට ලේහ කරනු.

220.

තිප්පිලි, ගොකටු, ඉඳි බඩ,. සියල්ල පොඩි කොට එලගි තෙලින් හා මී යෙන් ලේහ කරනු. (පිත්ත කාස)

221.

වැල්මී තිප්පිලි, ගොකටු, ඉඳිමුල්, සිහින් මැඩ හඟු, සිද්ධිගුරු, මුද්දරප්පලම් අඹරා ගිතෙල් හා මීයෙන් ලේහ කරනු.

222.

අරළු, නෙල්ලි, තිප්පිලි, එරඬු පොතු අඹරා මීයෙන් ලේහ කරනු.කෘඵජ කාස ගුණවේ.

223.

අරළු, තිප්පිලි, කලාදුරු අල, දේවදර, වියලි ඉඟුරු අඹරා මීයෙන් ලේහ කරනු. කඵජ කාස නසා.

224.

රත් නිටුල්, තිප්පිලි මුල්, ඇත් වග පුල් අඹරා මීයෙන් ලේහ කරනු. කෘඵජ කාස නසා.

225.

දේවදර, බැබිල, තුත්තං, තිපල්, තිකුළු, නෙළුම් මල් සියලු සමභාගව සීනි දමා කලවම් කර වලඳනු.

226. අගස්ති කොල (කතුරුමුරුංගා) යුස ගෙන තල තෙල් මුසු කර බිමෙත් කැසි මුස නැතිවේ.

227. **ලය බර බව**

කොහොඹ කොල, දළු, බුලු සමඟ අඹරා ජලයෙහි දිය කර බොනු.

228. ඊ තණ කොළ, අඹරා දියේ කලතා තබා වැදිය බී උනු පැන් බොන්න. ලය බර බව නැසේ.

229. **කැසි මුසට**

කොට දිඹුලා කොල, පුපුල කොල, සියඹලා කොල, සැවැන්න පොතු මේවා කොටා යුස මැඩ ඉඟුරු සමග කකාරා ඉශ්ම බොනු.

230. රත් තිටුල් මුල්, නෙල්ලි, සිද්ධිගුරු, මෙකී බෙත් ශමයේ ගෙන අඹරා සුනු කොට ශිනි, විලඳ, සුනු එක්කොට මී පැතියෙන් කවනු.

231. පෙනෙල කොල, දෙමට දළු, කැලිය පට, ඉස්මෙන් අඹරා ලැපැත්ත ගානු. වේලුමටද ඇදුමට යහපති.

232. මී පැති මතාවයි වැල්මී දෙකලදයි, රටඉඳි දෙකලදයි, උක් පැති මතාවයි. මෙකී බේත් අඹරා ලිප තබා පදමට කකාරා දෙඩං ඇඹුලෙන් කන්න දෙනු. කැසි නවති.

233. කවුඩු බෝ පොතු, කපු ඇට, මිරිස්, සිද්ධිගුරු, තිප්පිලි මේ හැම සුනු කොට මී පැතියෙන් අනා තුන් දවසක් දෙනු. කැසි ගුණවේ.

234. සිද්ධිගුරු, මිරිස්, හිරියල්, මනෝසිල, කළුදුරු, කරාබු, මේ හැම ශම්ව ගෙන ශුනු කොට තබා කීකිරිදිය, මකුළු වැන්න, කොල ඉස්ම ගෙන රෙදි රද අඹරා අවුලා තිවා දී කිරිබත් කට තිබා තුන් දවසක් ධූං බොනු.

235.

තල තෙල් අප්පල්ලයක වත් කොට ලිප තබා සුදුළූනු වදකහා පැහිච්ච තිත්ත වැට කොලු ඇට මෙකී දේ චූර්ණ කොට තෙලට දමා කකාරා ගෙන දෙවේලේ ලැමද ලේහ කරනු.

236.

තිකුළු, අසමෝදගම, වැල්මී, කලාඳුරු අල, සැවැන්නව, ඉරමුසු මුල්, මෙ හැම වියලා අඹරා කුඩු කොට රෙද්දෙං පෙරාගෙන මී පැතියෙන් අනා මොර ඇට පමණ ගුලි කොට තුන්වෙලේ ගුලියක් කටට දමා ශැල ශැල ඉදිනු. කැසි මුස නසා.

237.

සුදු දුරු, කළු දුරු, තිප්පිලි, අශමෝදගම, ශතකුප්ප, වැල්මී, අබිං, සුදුළූනු, පෙරුන්කායන් කොත්තමල්ලි, කුරුඳු පොතු, ගිරිතේක්කු, එංශාල්, මිරිශ්, අබ, ඉඟුරු, අරළු, බුළු, නෙල්ලි, ත්‍රිශ මුල්, අඟුන මුල්, මෙ බෙහෙත් කලඳ කලඳ ගෙන අඹරා පොල් දෙකක කිරි එක්ක යොද සිඳ ගෙන සතියක් කලඳ කලඳ දෙන්න. තෙල් ගා ලැපැත්තේ ගානු. එනු ඇඹුල් ශකුරු පැති වලකිනු.

238.

කීකිරිදිය ඉශ්ම පතයි, මුරුංගා ඉස්ම පතයි, ගැට තුඹ කොල ඉස්ම පතයි, වැරතිය කොල ඉස්ම පතයි, සීනක්කාරන් දෙකලඳයි, ශවිඳ එනු කලඳයි, වෙඩි එනු මංචාඩියයි. තිරස්සවාළු කලඳයි, කුරුඳු කලඳයි, සුදුළූනු කලඳයි, ඉඟුරු කලඳයි, එන්ශාල් කලඳයි, මෙකී බේත් අඹරා නාඹුල් කුකුලකු මරා බඩ පලා බඩවැල් ඇර දමා බඩ ඇතුලේ මෙකී බෙහෙත් දමා දෙවනුව මහා ශැලක දමා ඉශ්ම වත්කර මැශ්ශ අතුට ඊපිට කුකුලා තබා ඉශ්ම හිදෙන තුරු තඹා වේලා කොටා රෙද්දෙං පෙරා ඇඟිලි දෙකෙන් අල්ලන පමන උනු දියෙන් දෙනු.

1. **මුත්‍රා කිච්ඡාවට**

ඉඟිනි ඇට, හීන් එන්සාල්, මෙ හැම අඹරා තැඹිලි කහ පැන් දියෙන් දිය කොට බොනු.

2.

එන්සාල්, පොල් කුඩු පලා මුල්, තිප්පිලි, ගල් මද, නෙරෙංචි, මෙ හැම චූර්ණ කොට හාල් පානුවෙන් දිය කොට හෝ දෙනු.

3.

නෙරෙංචි එල කිරෙන් කකාරා සීනි එක්කොට දෙනු.

4. එන්සාල්. සීනි. මානෙල් අල අඹරා දියෙන් හෝ දෙනු.

5. එන්සාල් අඹරා චූර්ණ කොට අලු කෙහෙල් අලේ දියෙන් හෝ කහ පැන් දියෙන් හෝ දී පෙරලිය දියෙන් හෝ කිරෙන් හෝ මෝරුවෙන් හෝ වෙන වෙන දෙනු.

6. වෘහත්‍යාදී ගනය කොටසක් හෝ නෙරිංචි වඩාගෙන කකාරා ගත් කශාය කිරි එක්කොට හෝ ගිතෙල් එක්කොට හෝ දෙනු.
වෘහත්‍යාදිඝනය නම කටු වැල් බටු මුල්, එල බටු මුල්, දියමිත්ත, වැල්මී, හාතාවාරිය අල, වැඑක්, ඊතන, නෙරින්චි, කිරිබදු අල, මී පැනි, සකීරා මෙ හැම එක්කොට දෙනු.

7. එන්සාල්, ගල්මද, තිප්පිලි, වැල්මී, පොල්කුඩු පලා මුල්, මෙ හැම චූර්ණ කොට ගෙන කහ පැන් දියෙන් කකාරා බොනු.

8. අස්වැන්න අඹරා දී පෙරලිදියට දියකර දෙනු.

9. කැකිරි, බුලු, එන්සාල්, සහීඳ ලුනු, තිප්පිලි, වැල්මී, අරළු, මෙ හැම අඹරා කාඩි දියෙන් දිය කොට දෙනු.

10. **මල බද්දයට හා මුත්‍ර බද්ධයට**
අරළු, සීනි, මෙ· දෙවගේ අඹරා කහ පැන් දියෙන් දිය කොට ඌරු වන්ඩ තබා බොනු.

11. එන්සාල්, තිප්පිලි, වැල්මී, පොල්කුඩු පලා, නෙමෙනල, නෙරිංචි, ආඩාතෝඩා, එඩරු මුල් යන මෙයින් කකාල කශායෙහි සීනි එක්කොට දෙනු

12. ඉද්ද මුල්, නෙරිංචි, මුරුවා, එනුවරන, කලාදුරු අල, වැඑක්, කරල් ශබෝ, කොබොවක්කා, ගල් කුර කොලයි, ඇටයි කොල්ළු,පාල, තිප්පිලි, ගල්මද, මෙ හැම කස පැන් දියෙන් කසාය කකාරා දෙනු.

13.

නෙළුම, තන්නාරං මුල්, රත් නෙටුල් මුල්, මුරුංගා යන මෙයින් කකාල කශායෙන් තිකුළු චූර්ණ දමා දෙනු.

14.

ඉද්දමුල්, කොබොවක්කා, රත් තිබුල් මුරුංගා යන මෙයින් කකාල කශාය හෝ කැද හෝ නශ්‍ය හෝ ආලේප හෝ කරනු.

15.

අරළු, නෙරිංචි, ඇසල, පොල් කුඩු පලා, ඇත් කසඹිලියා, යන මෙයින් කකාල කශාය මී පැති එක්කොට දෙනු.

16.

ගල් කුර, එනුවරණ, මුරුංගා මුල්, සාරන, සහිති සාරන (සුදු සාරන), රත් තිබුල් මුල්, කටු වැල් බටු, මෙ හැම කිරි එක්කොට කශාය කකාරා කිරි ශේෂ කොට ගල් මද තිප්පිලි පොඩි ලා දෙනු.

17.

අන්දර, ගල්කුර, ආඩාතෝඩා, පොල් කුඩු පලා, නෙරංචි, කුරුඳු පොතු, රංවං කරඬු, වැලුක්, රසකිඳ, සමදරා මුල්, ඉළුක්තණ, කළාඳුරු අල, තොටිල්ල, මුරුවා, වෙල්ලිප්පරින්ති, කෙහෙල්, කුඹුක්, යන මෙයින් කකාල කසාය හෝ කල්ක හෝ දෙනු.

18. මුරුංගා මුල් කසාය හෝ දෙනු.

19.

කොබොවක්කා, මුල් අඹරා සුරාවෙන් හෝ දෙනු. මෙ මුල් කිරෙන් කකාරා හෝ දෙනු.

20.

එන්සාල්, තිප්පිලි, සීනි, මෙ හැම කල්ක කොට අඹරා උනු දියෙන් කලතා දෙනු.

21.

එන්සාල්, පොල්කුඩු පලා මුල්, තිප්පිලි, ගල්මද, මෙ හැම අඹරා චූර්ණ කොට හාල් පානුවෙන් දිය කොට හිස්බඩට දෙනු. මෙ චූර්ණය හිති එක්කොට ලේහ කරනු. මුත්‍ර කෘච්ඡ්‍ර ගුණවේ.

22.

කැකිරි ඇට, වෙනිවැල්, වැල්මී, මෙ හැම අඹරා හාල් පානුවෙන් හෝ දිය කොට දෙනු.

23.

එන්සාල් අඹරා, හෝ මුත්‍රයෙන් හෝ සුරාවෙන් හෝ කෙහෙල් අල ස්වරසයෙන් වෙන වෙන දෙනු. මුත්‍ර කෘච්ඡ්‍ර ගුණවේ.

24.

ගල් මද වුණී, මී පැනි එක්කොට ලේහ කරනු. සුල දෝෂයෙන් වු මුත්‍රබද්ධ මගහැරේ.

25.

හාතාවාරිය මුලේ ඉස්ම, නැලියක් ගෙන එළකිරි ඒ ගනනට ගෙන ගිතෙල් නැලියක් එක්කොට පදමට සිඳ කකාරා ගෙන වැල්මී සීනි මෙ දෙවගේ එක එක සතර සතර පලම බැගින් ගෙන එහි එක්කොට මාත්‍රා දැන තිති උදය දෙනු.
ප්‍රමේහ, මුත්‍රකෘච්ඡු, අශමරී

26.

පුසුල් ඉස්ම නැලියෙන් සතරක් ගෙන කල්කයට පුහුල් ඇට, වැල්මී, සීනි, මෙ වෙන වෙන දෙපලම දෙපලම ගෙන එළහි තෙල් නැලියකුත් මෙ කල්කත් එක්කොට පදමට කකාරා පෙරා ගෙන උදය තිති කනු. මුත්‍ර බද්ද නසා.

27.

පුසුල් ඇට, කැකිරි ඇට, වැල් මී, මීපුප්, එන්සාල්, හාතාවාරිය, බන්ඩ ශර් කරා සීනි, එන්සාල්, අස්වැන්න, බින්තල්, පිටවක්කා, මෙ හැම ගිතෙල් නැලියක් එක්කොට තෙල සිඳ තිත්‍ය සේවනය කරනු. ඉතා උග්‍රවු මුත්‍ර කෘවජ්‍රා ද ක්‍ෂයද, වායුද, සකීකරා, අශමරීද ගුණවේ.

28.

මිටම නෙරිංචි සාමුලෙන් ගෙන සියක් පලමක් කොට කශාය කකාරා පෙරා ගෙන මෙ කශායද සයකට තල තෙල් සතරක් ගෙන දී කිරි එළකිරි කාඩි නැලියෙන් අට අට ගෙන එහි එක්කොට මිට කල්ක දෙවදුරු, හාතාවාරිය, පෙරුංකායන්, තිකුළු වදකසා, කහා, කලාඳුරු අල, තගර, කොට්ටං, මෙ හැම කල්ක කොට කකාරා පදමට ආ තැන ශොඳ රහට හැදිගා පෙරාගෙන නශ්‍ය, පාන අස්මරී, ශකීරා, මුත්‍රකෘච්ඡ්‍ර ගුණවේ. අනුවාසන, අබ්‍යංගාවංගාදි, කරනු.

29. මූත්‍රා දහයට

මීමුරුඅඹරා දෙසි ඇඹුලේ ඩිය කොට පොවනු.

30.

පිටවක්කා කොල, අඹරා එල කිරෙන්වත් එලගි තෙලින්වත් මෝරුවෙන් වත් දෙනු. මූත්‍ර දහ මූත්‍ර කෘවජ්‍ර ගුණවේ.

31.

කෙසරු බැබිල, කොටා ඉස්ම ගෙන සීනටි සාල් ලා අඹරා කබළු පිස පොල් කිරි ලා කනු. සතියක් මූත්‍රදහ ගුණවේ.

32.

බිං පොල් ගෙන කොටා ඉස්ම තැඹිලි කස පැන් වත් කොට රැයක් ඇස්ස වශා තිබා උදය බොනු. තුන් දිනෙන් මූත්‍ර දහ, සැරව ගුණවේ.

33.

සීනි දඩු කකාල කිරි බොනු, උළු කැන් බොනු.

34.

සියඹලා ඇට පිට පොතු කොටා ගෙන ඒ පොඩි ටිකයි ගොකටු වේලා කොටා ගත් පොඩි මිටයි මෙකී දෙය හෙද රහට වේලා ගෙන තබා දවසකට බිලාල පාදයක් දෙසි ගෙඩියක් විවර කස පැන් දියෙන් දෙනු. ගල් වෙරෙප්පු ගුණවේ.

35. මූත්‍ර කිච්චාවට.

පිච්ච මුල්, පොල් කුඩු පලා මුල්, එන්සාල්, බැලිල මුල්, බෙලි මුල්, මේ හැම කකාරා කසාය මී පැනි එක්ක දෙනු.

36.

මුඩ මහත සාමුලයෙන් ගෙන කොටා ඉස්ම ගෙන එහි සීනටි හාල්ලා පොහවා අඹරා කබළු පිස එලගිතෙල් හා කබළු කනු.

37.

එන්සාල්, ඉගිනි ඇට, මුගුනු වැ න්න මුල්, වැල්මී, ගල් මද, මෙ එලකිරෙන් අඹරා එහිම කලතා දෙනු.

38.

කැකිරි ඇට, වැල්මී, ඊතණ, මේ හාල් පානු වෙන් අඹරා දෙනු.

39. මුද්දරප්පලම්, සීනි, මානෙල් අල මේ හැම දී කිරි දියෙන් අඹරා එහි කලතා දෙනු.

40.

ගල් මද සුනු, එල කිරි සීනි හා දෙනු.

41.

ගල් මද, අඹරා උනු දියෙන් දෙනු.

42.

ගල් වෙරෙප්පුවට

රත් හැඹිලි ගෙඩියක් ඇස්ස සිඳ පෙනල ශා මුලයෙන් ගෙන කොටා ඉස්ම ඊට මිරිකා වත් කොට දවසක් රෑ දෙකක් තිබා පසුව ගෙන සඳුන් හා කොමාරිකා ඉස්ම සමඟ බොනු. තුන් දවසින් ගල් වෙරෙප්පු, දය, ලේ, ගුන වේ.

43.

දිය කිරිල්ල දළු කොල සුහක් ගෙන කොටා ඉස්ම ගෙන එලකිරෙන් ලිප තබා එයට එම ඉස්ම වත් කොට සීනටි සාලේ පිටි එක්ව කැඳ දෙනු. ගල්වෙරෙප්පු, මුත්‍රදය ගුන වේ.

44.

මීටම සීන් කවඩි ගෙන ඉනුත් මදක් කශාවන් කවඩි විස්සක් පමන දෙසි ඇඹුල් මනාවක් විවර පිහානකට වක්කර කවඩි ඊට දමා රෑයක් දෙරෑයක් එක තැනක තබා දෙවනද ගෙන දෙසි අඹුල් පෙරා හැර හුන මකුල්සේ තිබුනු කවඩි සුනු ගෙන ඊට ඉඟිනි ඇට එන්සාල් හැඹිලි කස පැන් උක් පැනි මෙකී දේ මුලකී බෙහෙතට ඇඹරූ බෙහෙත් දිය කොට උදය පානය කරනු. දය, උෟෂණ, වෙව්ලුම් ලේ නවති. ශැරව මුත්‍ර කිච්චා ගුණවේ.

45.

මීටම උක් සකුරු, කොත්තමල්ලි, කල්කත් එක්කොට හැඹිලි කස පැන් දියට දිය කැර බොනු. මුත්‍ර කෘච්ඡ්‍ර ගුණවේ. සබර කොල මුත්‍ර කිච්ඡාවට බොනු.

46. සුක්‍ර ප්‍රමේහ, ගල්වෙරෙප්පු මුත්‍රදාහයට

අඹ ගසේ පිලිල කොල ගෙන කොටා ඉස්ම ගෙන ඊට සමව එලකිරි එක්ව දෙනු.

47.1 ගල් වෙරෙප්පුවට

කොට දිඹුලා පොතු ඉෂ්ම උදය උදය සත් දවසක් දෙනු.

48.2

කපු ගෙඩි කොටා ඉස්ම ගෙන එළකිරි එක්කොට දෙනු.

49.3

කෙහෙල් අල කොටා යූෂ ගෙන එල මෝරු උළක්කුවක ලා පොවනු.

50. **මුත්‍ර දහයට**

සකුරු පිල්ල කොල ගෙන යූෂ මැඩ ඉස් මුදුන දැඩි කොට මදිච්චි කරනු.

51. **මුත්‍ර කිච්චාවට**

පුපුල කොල යුස ගෙන කබළු පිස කනු.

52.

අස්වැන්න අඹරා එළකිරෙන් දෙනු.

53. **ගල් වෙරෙප්පුවට**

ඉරමුසු මුල් අඹරා එළකිරි තුන් කලදෙන් දෙනු.

මුත්‍ර කිච්චාවට

54.

පුසුල්වැල් ඉස්මත් රසකිඳ ඉස්මත් දෙක ශරියේ ගෙන එන්සාල් එකතු කර අඹරා බොනු.

සියළු ප්‍රමේහයට

1.

උන මකුල්, තිප්පිලි, කදලි කිහිරි යන මෙයින් කකාල කශාය මී පැති එක්කොට රාත්‍රියෙහි දෙනු. සීයලු ප්‍රමේහ ගුණවේ.

2.

දෙකසා, තිපල්, කලාදුරු අල, කුඹුක් පොතු, ඉඟිනි ඇට, රනවරා පස යන මෙයින් කකාල කසාය මී පැනි එක්කොට රාත්‍රියෙහි දෙනු. සියලු ප්‍රමේහ, දහ ගුණ වේ.

3.

ඉඟිනි ඇට, කිහිරි, නෙල්ලි, දුම්මැල්ල, වෙනිවැල්, දඩ ඉඳින් නරු, ගොකටු, හා

ඩිය මිත්ත, අඹ ඇට, අරළු, කලාදුරු අල, යන මෙයින් කසාය කකාරා මී පැති එක්කොට දෙනු. සියලු ප්‍රමේහ ගුනවේ.

4.

පශකුරු, දම, කුඹුක්, මෙ හැමින් පොතු ගෙන කහද ගෙන මෙයින් කකාල කසායෙහි මී පැති එක්කොට දෙනු.

5.

පැහිච්ච කොස් කොල වේලා චූර්ණ කොට තල තෙලින් දෙනු.

6.

තිප්පිලි, පිටවක්කා, බිං කොහොඹ, රනවරා, පංචාංගය කකාල කසාය මී පැති එක්කොට දෙනු.

7.

කෝවක්කා, ඉලන්ද, රනවරා මෙකී කොල ගෙන කපු ඇටද යන මෙයින් කලද කලද ගෙන මෝරුවෙන් දෙනු.

8.

ලොප් සුඹුළු, ඉරිවේරිය, අරළු, කළු දුරු, ඇද්දෙමට, යන මෙයින් කකාල කශායෙහි මී පැති එක්කොට දෙනු. ශෙලෂ්මා ප්‍රමේහයට විශේෂයි.

9.

කරාඹු, ලොප් සුඹුළු, ඉරිවේරිය, අතිවිඩයම්, වසාවාසි, අඹඇට, තිපල්, බෙලි පිංචි, දිවුල් ලාටු, දුරු, මයිල මල්, වලහ සාල්, අශමෝදගං, මෙ එක එක දෙකලද බැගින් ගෙන අව්වේලා චූර්ණ කොට අබින් කලදකුත් එක්කොට පොල් කිරෙන් අඹරා ගුලි විස්සක් කොට මී පැතියෙන් හෝ එලකිරෙන් හෝ අළුවතු ගෙඩියෙන් හෝ දවස ගුලියක් බැගින් කනු. සියළු ප්‍රමෙහ ගුනවෙ.

10.

කරපිංච කොල පංචාංගෙම ගෙන තිපල්, තිකුළු, කාහදගල්, තල, බෝධි ඇට, කළු දුරු මෙ හැම කරපිංච චූර්ණයට සමව ගෙන අඹරා චූර්ණ කොට තිබා දවස තුංකලදක් බැගින් කනු. සියළු ප්‍රමෙහ ගුනවෙ.

11.

රනවරා, කලාදුරු අල, තිපල්, දෙකසාද, පසකුඹුක් පොතු, මෙ හැම පොතු ගෙන දියමිත්ත, ඉගිනි ඇට, රත්න, හීන් මිදි, කිහිරි, ඇඹිල, පියා ගස්, කෙලින්ද, තොටිල්ල, එරබදු යන මෙයින් කකාල කශාය සිහිල් වූ කල මදක් තුත්තං චූර්ණය එහි එක්කොට මී පැති එහි සහිත කොට දෙනු. සියළු ප්‍රමෙහ ගුන වෙ.

12.

රනවරා පංචාංග ගෙන සෙවන වියලා චූර්ණ කොට ඉන් බාගයක් නෙල්ලි ගෙන මෙම නැලියෙන් බාගයක් දෙකසා ගෙන මේ හැම එක්කොට අඹරා මී පැති මෝරු එක්කොට දෙනු. ප්‍රමේහ මුත්‍ර බදධ ගුන වේ.

13.

වතු සුද්ධ කොල මදක් කැකුළු සාල් එක්කොට අඹරා ගෙන තෙලෙන් කැවුන් පිස කනු.

14.

සියඹලා ඇටේ පොතු, කරාඹු එල ඔලිඳ ඇට, අත්තික්කා, කිරෙන් මේ හැම අඹරා කලඳ කලඳ ගුලි කොට මී පැතියෙන් මෝරුවෙන් දෙනු.

15.

බිංතල්, සීනි, බු මැ ඇට, මේ හැම එක එක පලම ගෙන අබිං කලඳකුත් ගෙන චූර්ණ කොට දෙනු. සියලු ප්‍රමේහ ගුනවේ.

16.

රස කිඳ, නෙල්ලි, මෙයින් කකාල කසායෙහි මී පැති එක්කොට දෙනු.

වැදියට පත්‍යාහාර

සත් අට දවසක් හැර, කඩල, හොඩල, ගොදඹු, මුං, මෙනේරිය, මෙකී දෙය අනුභව කරනු.

17.

ඉක්බිති මිට බෙහෙත්, ලා පොල් මල් විසි පලමයි, අළු කෙසෙල් මල් විසි පලමයි, දිවුල්ලාටු ද සපලමයි, දිවුල් ගසේ පොතු දස පලමයි, කිරි වෙල්ලාටු දසපලමයි. මෙම පොතු දස පලමයි, අඹ ගස, මාදම් ගස, ලාවුළු ගස, නුග ගශ, කුඹුක් ගස, දිඹුල් ගස, රනවරා ගශ, ඇශල ගශ, ඉහිති ගශ, බුළු ගශ, නෙල්ලි ගශ, යන මේ ගස් වලින් පොතු එකක් හෝ කිපයක් එක්කොට කසාය කර මීයෙන් දෙනු.

18. මුත්‍ර බොහෝමයක් යන ප්‍රමේහයට

රනවරා ගහේ පොතු, මාදම් පොතු, බෙලි පොතු, කුඹුක් පොතු, මෙකී බේත් පොතු සමසේ ගෙන වේලා චූර්ණ කොට තනා තියාගෙන වෙලකට බිලාල පාදයක් ඇර දෙනු.

19. ප්‍රමේහ ඇතිව, අළුත් වැදූ අයට උන රස්නේ අධිකව උන ඔක්කාර දෙමින් බඩ ගසා යනවට. ලා පොල් මල්, කලිප්පාක්කු, අසමෝදගම, සුදුදුරු, සිද්ධිගුරු, රතුළූනු, මෙකී බේත් එක එක පංගුවෙන් කලං දෙක බැගින් දෙලොස් කලදක් කිරාගෙන මෙකියන බේත් මදක් තලා පොඩි කොට දියවර අටක් පත් මැත එදියරට බේත් දමා පතකට සිටින තුරු කකාරා බාගෙන දෙවේලේ තුන් දවසක් බොන්නට දෙනු ගුනවේ.

20. කඩුත්තුවට යන ප්‍රමේහයට

කයිප්පු දෙකලදයි, තිප්පිලි දෙකලදයි, ගොලු පුවක් (තඹාපු වෙලාපු) කයිප්පාක්කු දෙකලදයි, මෙකියන තුන් වගේ අත්තික්කා කිරි මිටක් විතර ගෙන ඒ කිරට සුවස කලං සතර ගෙන සීනි තිස් කලදයි, උඳු පිටි කලදයි, කුකුළු බිජු දස සතරක සාරුවක්කොට දිය කර ඊට දමා අඹරා බුළු ගෙඩියක් පමන ගුලිකර තබා සතියක් වැලඳුව පුෂ්ටිමත් වෙයි.

21.

අළුත වැදූ අයට බඩ සීතල ගතිද, බඩ යනවාද වායු ගතිද, ඉදිමුමද, උන ගන්නවාද, ප්‍රමේහ යන ලෙඩට නියම වු අවුසදේ වග නම මිරිස්, තිප්පිලි, වසාවාසි, අසමෝදගම, කළු දුරු, කුරුඳු පොතු, කරාබු නැටි, සාදික්කා, පුවක්, සිද්ධිගුරු, මිරිස්, අරළු, බුළු, නෙල්ලි, මේ හැම චූර්ණ කොට දෙනු.

22. දියවැඩියාවට

පෙර ඉසිවරම පැවසූ බසෙකි දනයුතු

දියවැඩියාවට ගෙන සොඳ රණවරා ඇ ට
අඹරා කිල නෙත් බු කල ශක නොක ට
මෙම කොල මලවා මින් කැවොත් මනා කො ට
පසුව පෙනේ ශක නොකරමි මෙම බෙහෙත ට

23. ප්‍රමේහයෙන් බහු මුත්‍ර යනවාට

මෙල මල්, කරාබු, වසාවාසි, කපු ඇට මද, එන්ෂාල්, නෙල්ලි, අතිඋඩයන්, දියමිත්ත, දෙළුං, කෙප්පු, මාදන් පොතු, එනු, අඹ ඇට මද, පිටවක්කා මුල්, මේ හැම සමභාග ගෙන බැද චූර්ණ කොට තබා මුත්‍ර බොහො යනවාට දෙකුරුවයි අබින් ඊට කුට්ටුකර එල මෝරුවෙන් දෙනු. දවසට නැලි දෙකක් එන මුත් සිටී.

24.

ඊට විරේචනයට:-
තිපල්, තිරස්තවාළු මුල්, ගල්මද, මේ චූර්ණයම උදය උදය දෙනු.

25. දේවදුරු, වදකසා, කලාදුරු අල, සතකුප්ප, සිද්ධිගුරු, කසා, වෙනිවැල්, සෙන්කලතිරිකොට්ටන්, අබ, තුවරලා, කුරුඳු පොතු, නාමල් රේණු, සඳුන්, හොර අරටු, නෙළුන් අල, මෙකී දේ චූර්ණ කොට වෙන වෙන එක බරට කිරා ගෙන ගිතෙල් හා එක මුට්ටියක ලා කඩ බැඳ වසා දෙවෙලේ තුන් කලඳක් වලඳනු.

26. දියවැඩියාවට

එල ඔලිඳ ඇට එක බාගයයි, කසා දෙබාගයයි, ගල්මද තුන් බාගයයි, රණවරා ඇට හතර බාගයයි, මේ හැම චූර්ණකොට ලේහ කරනු.

27. මුත්‍රාතිසාරය

ඌරල, ඉඳිබඩ, වතුගෙඩි මේ හැම මී පැතියෙන් අඹරා දෙනු.

28.

උඳුචූර්ණ, ඉඳිබඩ, වැල්මී, වතු ගෙඩි, මේ හැම අඹරා එල කිරෙන් පොවනු. මුත්‍රාතිසාර ගුණවේ.

ප්‍රමේහයට පත්‍ය

එල මෝරු, තිපල්, දියෙහි හටගත් නෙළුන් ආදී සැම අල ජාති, මුන් තංබාගත් පැන්, එම කැඳ තිම්ති, මුරුංගා කොල, දිය බත්, සීතල සෙවන, ප්‍රමේහයට හිත වන්නේය.

29. දිය වැඩියාවට

බෙලිගහේ පොතු, එල ඔලිඳ මුල්, කශා, වෙනිවැල් පොතු, සම සේ අඹරා තල තෙල් පතක් දිය නැලියක් එලකිරි පතක් එක්ක සිඳ පමන දන වලඳනු. වැඩි බසිනා දියවැඩියාව නැතිවේ.

30.

ඉඟිනි ඇට, රණවරා ඇට, ශමසේ ගෙන ශූනු කොට වලඳනු.

ඉඟිනිපොතු, රණවරා පොතු දෙකින් ශතර කලඳක් ගෙන දිය දෙකක් වක්කර කකාරා පතක් සිටින කල් පෙරා තිවා මී පැති එක්ක වලඳනු. මංඩි, දහ ඇති දියවැඩියාව නසයි.

32.

එල නෙළුම් මල් රේණු, ශත කුප්ප ශමසේ ගෙන ශූනු කොට ඇඹුල් මෝරුවෙන් වලඳනු. සියළු ග්‍රහ ප්‍රමේහ නැතිවේ.

33.

තිපල්, කසාය, දැත්ත, කකාල කශාය, කොතලා කෙමිය වැල් කකාල කශායද මීපැති හා එක්කොට පොවනු. සියලු දියවැඩියා ඇති අයට දෙනු.

34. **ප්‍රමේහයට**

කසා පොඩි කොට දිය දස නැලියක් වත් කොට කකාරා, දිය නැලියට හුණු කල පෙරාගෙන මී දෙනැලියක්, වත් කොට කකාරා දෙනැලියක හුනු කල ගෙන එලගිතෙල් කවා සුරකිව තබා පසලොස් දවසින් ගෙන දවසට දෙපලමක් බැගින් වලදනු.

35. **ප්‍රමේහයට**

අසමෝදගම්, සෛන්දව, රසකිඳ, අරළු, කෂාය, මී පැණි දමා දෙනු.

36.

දියමිත්ත, වෙනිවැල්, වලහසාල්, කුඹුක්, කෙලිඳ ඇට, කෂායට මී පැති දමා දෙනු.

37.

සල්, කුඹුක්, අත්දෙමට, කලාඳුරු අල, දියමිත්ත, ලොප්සුඹුල්, අරලු, කිහිරි, ඇවරිය, හීන් මිදි, තිපල්, කෂාය මී පැති දමා දෙනු.

38.

දුම් මැල්ල, කොහොඹ, රසකිඳ, නෙල්ලි, කලාඳුරු අල, කෂාය දෙනු.

39.

අරලු, මානෙල් අල, නෙල්ලි, කලාඳුරු අල, වැල් මදට කෂාය දෙනු.

40.

අරලු, වැල් මදට, නෙලුම් මල්, ඉරිවේරිය, කෙලින්ද ඇට, කෂාය කර දෙනු.

41.

තිල් මහනෙල්, වැල්මදට ලොත් සුඹුල් කුඹුක් කෂාය කර දෙනු.

42.

තිපල්, දේවදුරු, කලාඳුරු අල, කෂාය දෙනු.

43.

කෙලින්ද ඇට, පියා සුඹුල්, වියත් සුඹුල්, වෙනිවැල්, තිපල්, රත් තිවුල්, මෙකී දෙය අඹරා කකාරා කෂාය කර පොවනු.

44.

සල්, තෙලඹු, කුඩු වෙලහ, මෙකි මල් තුන් තුන් කලඳ ගෙන අඹරා තෙල්ලි යුසින් මී මුසුකොට දෙනු.

45.

තිපල් චූර්ණය, ගල් සෙවෙල් චූර්ණය, යසුනු චූර්ණය, අරලු චූර්ණය, වෙන වෙන හෝ තනිව මී පැනි යෙන් දෙනු.

46.

ලොත් සුඹුල්, එන්සාල්, රත්නිටුල්, හිඟුරු පියලි, දියමිත්ත, කොල්ලම කොල, කුරුඳු පොතු, නාමල් රේනු, නෙලුම් අල, මිරිස්, බිත් කොහොඹ, දේවදරු, කෙලිඳ ඇට, මහ ගොන් කැකිරි මුල්, උපුල් කොල, හිත් මැඩ හඟු, වලහසාල්, තිපල්, තිකුලු, තිප්පිලි මුල්, සිවිය, අසමෝදගම්, කලන් 3 බැගින් ගෙන පෙති තෝර කොල ඉස්ම මනාවක් ගෙන ලිප මැද රතු පස් කලදයි. ලුණු කලදයි. දමා හැන්ද වෙ ලිපතබා පතට මඳ ගින්නේ සිඳුවා මී පැණි පත 1, ගිතෙල් පත 1, සීනි පත 1, එලකිරි පත 1 සියල්ල එකට වත් කොට අරලු කලං 3, බුළු කලං 6, තෙල්ලි කලං 12, සියල්ල කුඩු කර දමා කලඹු පදමට උයා ගන්න. මාත්‍රාව වරකට කලං 3 බැගින් දෙන්න.

47.

කොට්ටම, වැල්මී, මානෙල් අල, වමමුතු, අමුක්කරා, එන්සාල්, කුරුඳු පොතු, කොල්ලං කොල, කපු කිතිස්ස ඇට, ගොකටු මුල්, නෙලුං අල, රණවරා ඇට, සාදික්කා, වෙල්ලිපරිත්ති, සැවැන්න, මුද්දරප්පලම, දෙසදුන්, කොකුම, අමු කපුරු, මුං ඇට, බිත්තල්, දෙදුරු, ඉලඳ ගෙඩි පොතු, අබිං, මෙ හැම සමභාග ගෙන චූර්ණකර ඊට දෙබරක් රසකිඳ, පිටි ගෙන මී පැතියෙන් සීනියෙන් එල වෙඩරුවෙන් වලඳනු.

48. ප්‍රමේහ හා ස්‍රෝතික වාදමට

නෙල්ලි, අරළු කලං 6, ත්‍රස්තවාලු කලං 9, එලමුත්‍ර නැලි 1, තැඹිලි දිය නැලි 1, වතුර නැලි 7ක්, නැලි 1ට සිඳුවා දෙවේලෙට දෙනු. ලුණු ඇඹුල් වලකිනු.

49. සියළු ප්‍රමේහයට

අල බෙත් පලමයි, දුරු දෙක, අසමෝදගං, තිප්පිලි, ත්‍රිජාත, සහිඳ එනු, ඉඟුරු, මිරිස්, අබ, සුදුළූනු, තිපල්, තිකමුල්, කරඳ මුල්, එනු අරණ මුල්, මෙ බෙත් දෙකලඳ දෙකලඳ බැගින් ගෙන චූර්ණ කර තබා පොල් රා නැලියක් එහි වක්කර පෙරකි සරක්කු එහි කලතා උඩිං වසා මැටි බැඳ දෝලා යන්තරයෙහි තබා රෙදි මැටි බැඳ උඩින් වසා තුන එකට කකාරා පෙරා ගෙන දස දවසක් හෝ පසලොස් දවසක් හෝ වැදිය බලා දන දෙනු. එනු ඇඹුල් වලකනු.

50. බැබිල, තික, කරල් ශබෝ, දිවි පහුරු, හාතාවාරීය, මදුරු තලා, තුඹ, බෙලි හොඩ පර, මුගුණුවැන්න, කිකිරිඳිය, සැවැන්දරා, කලා දුරු අල, ඕළු අල, මෙකී දෙ තුං තුං කලද ගෙන තලා දමා වැටකේ, අරළු, දිය නුමුසුව මිරිකා ඉස්ම පතයි, නැඹිලි දිය දෙපතයි, උප්පැති නැලියයි, දෙසි ඇඹුල් නැලියයි, මෙ දේශැලකලා පලමු කි බේත් ලා කිතුල් හකුරු දමා සීනි තුං කලදක් දමා කළු දුරු, සුදුදුරු, අසමෝදගං, තිප්පිලි, කරාඹු, වසාවාසි, සාදික්කා, දෙවදුරු, අසමෝදගං, තිප්පිලි, කරාඹු, කොට්ටං, සිරිතෙක්කු, වැල්මී, අංජණකැට, කටුකරෝසන, කොත්තමල්ලි, වලහසාල්, පෙරුංකායන්, සහිඳ එනු, මෙකී දේ කලද කලද ගෙන මෙ හැම බරට කොත්තමල්ලි ගෙන හැලපුහුලක් ගෙන ඇස්ස ගසා හිරමනෙන් ගා අව්වෙලා පිටිකොටා මෙ දෙවගෙ පලමු සරක්කු බරට කිරා තලා දමා ඊට අරළු, නෙල්ලි තුං තුං කලද ගෙන තලා දමා උඩිං වසා මැටි බැඳ හුම දන කර වසා උඩින් ගිනි කර සතර වෙතිදු ඇරගෙන පෙරා සීනි මී පැනි, ගිතෙල්, වක්කර දෙනු. සතියක් දෙනු. එනු ඇඹුල් වලකිනු. දිය වක්කරනු. මින් ගුන සේලෙස්මාවෙන් එන ප්‍රමෙහ විස්සද කොරවාදමට හිරි වැටිමටද, පිත් සේලෙස්මාවටද යහපති.

51. සාදික්කා, වසාවාසි, කරාබු, අරළු, බුළු, නෙල්ලි, ඉඟුරු, මිරිස්, තිප්පිලි, දෙදුරු, සහිඳ එනු, මෙකී කලද කලද ගෙන මේ හැම බරට කොත්තමල්ලි ගෙන හැල පුහුලක් ගෙන ඇස්ස ගසා හිරමනෙන් ගා අව්වේ ලා පිටි කොටා දෙවගේ පලමු සරක්කු බරට කිරා ගෙන සීනි තුන් කලදක් ගෙන මී පැනි එලගිතෙල් හැන්දේ ඇලෙන පදමට තබා දෙවේලෙ සතියක් තුං තුං කලද බැගින් දෙනු. උනු දිය බොනු. කැම තෘෂ්ණා නැතිව කතොත් පහලොස් දවසක් දෙනු. මින් ගුන රත්පිත් දහ ඉසේ කරකැවිල්ලද ඇඟ පතදය රුදවටද අතපය වලංගු නැතුවාට අග්නි මන්දයටද

ප්‍රමෙහයටද රත්පිත් ඔල්මාදයටද යහපති.

52. **පිත් සේලෙස්මාවට**

දුරු දෙක, අසමෝදගම්, තිප්පිලි, ත්‍රිවග්ග, තිපල්, ඉඟුරු, මිරිස්, අබ, සුදුළුනු, අල බේත්, විලඳ, මෙකී දේ කලද කලද ගෙන චූර්ණ කොට මී පැනි පතයි, ඔලිඳ කොල ඉස්ම පතයි, දෙඩං ඇඹුල් කලදයි, තන කිරි දෙකලදයි, ගිතෙල් පතයි, පාවට්ටා සහ මුලිං ඉස්ම පතයි, මේ දේ ලිප තබා ඇඹරු බෙහෙත් දමා සීනි දෙකලදක් එහි දමා හැඳි ගා ලෙප පදමට බා බුළු ගෙඩියක් පමනට දෙනු. තුං සතියක් හෝ මඩලයක් හෝ දෙනු.මින් ගුන සිරෝ රෝග අත්පා වෙවුළුං, ලෑය, උගුර, අඩිස්සි, මුක වේලීම, පංච කාස ස්වාස ගලග්‍රහ, මුත්‍ර කෘච්ජ්‍ර, පංචගුල්ම, ජ්වර අග්නි සුල, අපස්මාර, නොයෙක් ලෙඩ ගුණවේ.

53. අරළු පස් කලදයි, නෙල්ලි හතර කලදයි, බුළු දෙකලදයි, ත්‍රස්තවාළු හකලදයි, ඉඟුරු හතර කලදයි, කොසඹනැටි හතර කලදයි, සියඹලා නැටි හතර කලදයි, රතුළුනු, කොට්ටන්, වැල්මී, කයිප්පු, කළු දුරු, වලහසාල්, තිප්පිලි, ත්‍රිවගී, මෙකීවා කලද කලදයි, අල බේත් පස්කලදයි, මෙකීවා වතුර නැලි දෙලහකට

වත්කර කකාරා එකහමාරට සිඳුවා බා තබා මී පැනියෙන් සවරුවක් සීනි සමඟ දහ හතර වරුවක් වලඳනු. එනු ඇඹුල් වලකිනු. ප්‍රමෙහයෙන් උපන් වාදන් ඉදිමුන් හන්දි පත් කෙවුන් හති කැක්කුන් බඩ බැන නැඟුන් ඇග බරවීම කැශි පාණ්ඩු මෙකී ලෙඩ ගුනවෙයි.

54.

රසකිඳ පිටි දෙකලඳයි, කලාඳුරු අල පිටි කලඳයි, ඉරිවේරිය, ඉරමුසු මෙකී දේ සතර කලඳයි, වැල්මී දෙකලඳයි, කොට්ටන් දෙකලඳයි, සුදුළුනු කලඳයි, නෙළුන් මල් කලඳයි, මානෙල් මල් කලඳයි, සපු මල් කලඳයි, දෙමට මල් කලඳයි, රණවරා මල් දෙකලඳයි, මුල් කලඳයි, නෙළුම් මුල් දෙකලඳයි, වැල් තිබ්බටු මුල් දෙකලඳයි, අරළු දෙකලඳයි, නෙල්ලි දෙකලඳයි, බුළු දෙකලඳයි, කරඳ කිරි පතයි, මදුවැල් ඉෂ්ම පතයි, එලකිරි නැලියයි, උප්පැති පතයි, එලගිතෙල් පතයි, මෙකීවා වත්කර පලමු සරක්කු දමා කකාරා කල්ක පදමට තබා දින තුන්දවශක් වලඳනු. ප්‍රමෙහයෙන් උපන්බඩේ වනවල් මුත්‍ර මාගී වනවල් පිට වනවල් ගිනියම් ලේ යන ප්‍රමෙහ ආදී සියලු ලෙඩට අත්දුටුවයි. එනු ඇඹුල් වලකිනු.

55. මුහ ප්‍රමෙහයට

අමුකහා ඉෂ්ම පතයි, එඩරු තෙල් පතයි, කලාඳුරු අල ඉෂ්ම මනාවයි, තිපල්, ඉඟුරු, මිරිස්, තිප්පිලි, ජයපාල, මේවා කල්ද කලඳ කිරා චූර්ණ කොට දමා කකාරා හෝ දෙනු.

56.

කහ ඉස්ම, දෙශි ඇඹුල්, රා මේවා පත පත සස්සඳ මුල් මේවා කකාරා තිප්පිලි කුඩු දමාදෙනු.

57.

අසමෝදගන්, ශැවැන්දන, රසකිඳ, අරළු, මේ දෙය හෝ

58.

දියමිත්ත, වෙනිවැල්, වලහසාල්, කුඹුක් කෙලින්ද, ඇට මෙකී දෙය හෝ ශඩුං අගිල් අරළු. උපුල් කොල, දේවදරු, මෙකී දෙය හෝ

59.

ඇද්දෙමට, වංමුතු, දියමිත්ත, ලොත් සුඹුල්, සිහින් මිදි, තිපල්, මෙකී දිය හෝ වෙන වෙනම කකාරා කෂාය ගෙන මී මුශු කොට පොවනු.

60.

දුම්මැල්ල, කොශඹ කොල හෝ රසකිඳ, නෙල්ලි, වම්මුතු, හෝ අරලු, සුවඳ

හොට, නෙළුම මල්, ඉරිවේරිය, වල්ඉද්ද මුල්, ලොප් සුඹුළු, කුඹුක්, මෙකී දෙය හෝ මෙකී පස් වගය වෙන වෙන කකාරා කෂාය මී මුසු කොට පිත්ත ප්‍රමේහයට දෙනු. තල තෙල් මුසු කොට වාත ප්‍ර මේහයට දෙනු.

61.

තිපල්, දේවදුරු, වමමුතු, මෙකී බෙහෙත් කකාල කෂායේ සීනි මුසු කොට දෙනු.

62.

අශමෝදගන්, සැවැන්දව, රසකිඳ, අරළු මේ දෙය හෝ දියමිත්ත, මනුවැල්, වලහසාල්, කුඹුක්, කෙලින්ද ඇට, මෙකී දෙය හෝ සඳුන් අගිල් අරළු, උපුල් කොල, දේවදුරු මෙකී දෙය හෝ ඇද්දේමට, වංමුතු, දියමිත්ත, ලොප් සුඹුලු, ඇඹටිය, සිහිං මිදි, තිපල් මෙකී දෙය හෝ වෙන වෙනම කකාරා කශාය ගෙන මී මුසුකොට දෙනු. මේ සත් වගින් ශ්ලේෂ්මා ප්‍රමේහ නසා.

63. ශ්ලේෂ්මා ප්‍රමේහයට

ඇද්දෙමට මුල්, කලා දුරු අල, දියමිත්ත මුල්, ලොප් සුඹුලු, අරළු, ශමයේ දෙලොස් කලදක් ගෙන කකාරාමී පැති මුශු කොට පොවනු.

64. ශතකුප්ප

ශැවැන්ද, රශකිද වැල්, අරළු, ශමසේ දෙලොස් කලදක් ගෙන තලා දිය දෙකක් වත් කොට කකාරා කුශාය පතක් ගෙන මී පැති මුශුකොට පොවනු. ශ්ලේෂ්මාවෙන් උපන් ප්‍රමේහ සංසිදේ.

65.

දියමිත්ත මුල්, වෙතිවැල්, දැව ගහේ මුල්, පොතු, වලහසාල්, කුඹුක් පොතු, සමසේ දෙලොස් කලදක් ගෙන කශාය කකාරා පෙරා ගෙන මී පැති මුශු කොට උදය පොවනු.

66.

ගල් සෙවෙල්, පොඩි කොට තුං කලදක් ගෙන සීනි එක්කොට ලේහ කරනු.

67.

තිපල් ශුනු හෝ ගල් ශෙවෙල් ශුනු හෝ යහුනු හෝ මී පැතියෙන් පොවනු.

68. මුත්‍ර කඩිත්තුවට

තල මතාවක් කොටා වැල්මී, සුදු, උක් පැති මෙකී බෙහෙත් එක්කර එළඟිතෙල්

වක්කර අනා පිඩක් කනු.

69. ශ්ලේෂ්මා ගිනියමට

එලකිරි මනාව ගෙන කරාබු, වසාවාසි, සාදික්කා, අශමෝදගම්, කුරුදු පොතු, ඉඟුරු, මිරිස්, මෙකී වා එක් පමණ ගෙන පොට්ටනි බැද එම කිරි මුට්ටියක දමා කකාරා බොන්නට දෙනු. බත් එක්ක කන්න දෙනු.

70. දියවැඩියාවට

එලතුත්තිරි, සියඹලා කොල, පුහුල් මුල්, බෝ මුල්, අඹරා රොටි පුලුස්සා තල තෙලිං දෙනු.

71-1 ප්‍රමේහ රොගයට

අසමෝදගම්, සවින්දව, රසකිඳ, අරළු, මෙකී දෙය හෝ

72-2

වෙනිවැල්, දියමිත්ත, වලහසාල්, කුඹුක්, කෙලින්ද ඇට හෝ

73-3

අරළු, මගුල් කරඳ, අබ, බෝධි ඇට, ශවින්දව එනු, මෙකී දේ හෝ

74-4

අරළු, වෙනිවැල්, සිද්ධිගුරු, වලහසහල්, කසා මෙකී දෙය හෝ

75-5

අශමෝදගම් කුඩුත්, වෙනිවැල් මෙකී දෙය හෝ

76-6

සඳුන් අගිල්, අරළු, උපුල් කොල, දේවදරු, මෙකී දෙය හෝ

77-7

කලාඳුරු, දියමිත්ත, ඇද්දෙමට, ලොප් සුඹුලු, අරළු, කිහිරි, ඇඹිටිය, සිහින් මිදි, තිපල්, මෙකී දෙය හෝ වෙන වෙන කකාරා කශාය ගෙන මී මුසු කොට පොවනු. මේ සත් වගෙන් ශ්ලේෂ්මා මෙහ නසයි.

78. දුම්මැල්ල, කොසොඹ, මෙකී දේ කොලඳ, රසකිඳ, නෙල්ලි, වංමුතු, මෙකී දේ හෝ

79. අරලු, නෙල්ලි, සවින්දව, තිල් මානෙල්, වංමුතු, මෙකී දේ හෝ

80. වැල් මදට, නෙළුම් මුල්, ඉරිවේරිය, අරළු, කෙලින්ද ඇට, මෙකී දෙය හෝ

81. ඉරිවේරිය, මලිත්ත මල්, ලොප් සුඹුල්, කුඹුක්, මෙකී පස් වගය වෙන වෙනම කකාරා කශාය ගෙන මී මුසුකොට පිත්ත ප්‍රමේහයට දෙනු.

මෙකී දේ කකාල කශායේ තල තෙල් මුශුකොට වාත ප්‍රමේහයට ශ්ලේෂ්මා ප්‍රමේහයට දෙනු.

වාත ප්‍රමේහ, පිත්ත ප්‍රමේහ ඇත්තනට මෙකී බෙහෙත් තෙල් සිඳ පොවනු. පිත්ත මේහීන්ට ගිතෙල් මුසු කොට දිය යුතුය.

82. ජල මල අඩිස්සියට. (මුත්‍ර කෘවජු)

එනු පස් වගේ පොඩි කොට කැකිරි ගෙඩියට අඩස්සි කර උන අළුවෙන් උයා මිරිකා පොවනු. මල ඇරෙයි.

83. මහා කඩුත්තු අඩිස්සියට

දුරු දෙවගේ, සුදුළුනු, වස හැරි ජයපාල පියලි 3, එඩරු ඇට 3, ඉඟුරු, මිරිස්, කුරුදු පොතු, එල කටරොඩු මුල් මෙකී දේ එක පමණට දළුක් පල්ලේ අඩස්සිකර උන අළුවෙන් තඹා ගෙන ඒ දළුක් පල්ලේ ඉස්මෙන් අඹරා එම බේත් පොල් කිරෙන් දෙනු. උගුලවයි. දළුක් ඉස්ම බඩේ ගානු. උගුලවයි. යහපති. ශිටුවන්ඩ බැරිව යා නන් හඳුන් පොවනු. කුර කොල ඉස්ම පොවනු. සිටි. අඹ පොතු, පුෂ්ප හඳුන් කුර කොල ඉස්ම පොවනු. හිටි.

84. අඩස්සියට

කැප්පෙටියා පොතු, පොල් සමහ කොටා මිරිකා පෙරුංකායන්, තිබ්බටු ගෙඩියක් පමණ දමා දෙන්න.

85. ජල මල අඩස්සියට

ලොකු අරලු ගෙඩියක මස් සමඟ ගොකටු කිරි මදට දෙකක බර පුස්කර මදට 1ක බර අඹරා සියබලා කොල තම්බාපු යුසින් දෙන්න.

86\.

වෙනිවැල්, මී පැති එක්කොට නෙල්ලි යුසින් දෙන්න.

87\.

කැකිරි ඇට, වැල්මී, වෙනිවැල් අඹරා, සහල් දෙවුන් දියෙන් දෙනු.

ගෝමුත්‍රයෙන් හෝ කෙහෙල් කොල ඉස්මෙන් හෝ එන්සාල් සිනිඳු කොට අඹරා එහිම කලතාහෝ පොවන්න.

88\.

ගල් සෙවෙල්, මී පැති එක්කොට අඹරා ලේහ කරනු.

89\.

මුද්දරප්පලම, සීනි, මානෙල්, මෙකී බෙහෙත අඹරා දී පෙරලි දියෙන් පොවනු.

90\.

හකුරු, මිරිස් අඹරා එළකිරෙන් පොවනු.

91\.

ගල් සෙවෙල් වගපුල් එන්සාල් චූර්ණ කොට මී පැතියෙන් කලතා පොවනු.

92\.

සීනි, යවකාර ලුණු, පොඩිකොට දියෙහිලා පොවන්න.

93. ප්‍රමෙහ විරේකයට

තිපල්, තිරස්තවාළු, ගල්මද, චූර්ණය මී හා උදය උදය දෙනු.

94\.

වන් ඇපල ස්‍රතයට, වන් ඇපල කොල, අසුරු දෙකක් කොටා එළකිරි මනාවක් සමඟ අනා වන්ඩුවේ කැන්ද කොල එලා බෙහෙත් එහි තිබා තම්බා මිරිකා ගෙන

මීට සීනි තුන් කලදයි. තිප්පිලි තුන් කලදයි. පලමු මිරිකා ගත් ස්වරසයට යොද දඩී කර තබා බිලිඳු ලමයින්ගේ උනට, ගිනියමට, කැස්සට, සෙම ඇදුමට, මී පැනි තාරන් ඇඹුල් කනවෙයිය පැනි රතුළුනු. මෙකී යුසයෙන් දෙනු.

95. **පාන්ඩු ඉදිමුමට**

ඉඟුරු යුස පතයි, කීකිරිදිය යුස පතයි, කපු කොල යුස පතයි, පොල් රා යුස පතයි, කල් ගිය යබර කුඩු අතලොස්සයි. මෙවා ශලකලා මදක් කකාරා වෙලකට පියලාව බැගින් දෙවේලේ සතියක් බොන්නේය. අදිනු වමනේ සිටි.

96. **උෂ්ණ රෝගයට මුත්‍රදූහයට**

තිකුළු, ත්‍රිසුගන්ධි, වලහසාල්, නෙල්ලි, වන් මුතු එක එක වගේ මංචාඩි හතහමාර බැගින් ගෙන තිරස්ත වාළු තුන් කලදයි. දූත්ත අල එක කලං මංචාඩි දෙක හමාරයි, සීනි දෙකලන් මංචාඩි පහයි. උනුකර තිවු වතුරෙන් දෙනු. උෂ්ණ ලෙඩින් හොඳ නොවන කොර ඉදිමුම ඇල්ළු අයටයි.

97.

රණවරා කොල ලියා වතුර වක්කොට තම්බා දනා හාල් පොඩි කොට ලා කිවුලෙන් කැද පිස කිතුල් හකුරු කට ගා බොනවාය. අර්ශශ් කඩුත්තු මුත්‍ර රෝග ගුනවේ.

98. **අණ්ඩවායි රුජාවට**

දූරු දෙවගේ සුදුළුනු, කුඹුරු ඇට මද, පුස් ඇට මද මේ දෙවගේ යන්තං පුළුස්සා පෙරුංකායන් වැඩිව ගෙන එනු දියෙන් අඹරා එනු දියෙන් මුඩ මහන යුසයෙන් දෙනු.

ඊට වීරෙචන බේතට

හිරස්ස පොතු වේලා චූර්ණ තුන් කලදයි, සිද්ධිගුරු චූර්ණ එක කලං භාගයයි, මෙකී දේ එක්කොට උනු දියෙන් දෙනු. හත් සරයක් විරේකවේ.

99. **සැම ප්‍රමේහයට**

නෙල්ලි, රසකිඳ, කකාල කසාය තිවා මී පැනි එක්කර උදය දෙනු. දහ පිපාස එන අරුචි නසා.
මීටම ඇසල මුලේ පොතු, නෙල්ලි, රසකිඳ වැල් කකාල කසාය තිවා මී පැනි එක්කර දෙනු. ප්‍රමේහ නසා.

100.

මීටම සැවැන්න මුල්, කුඹුක් පොතු, වැල්මී, අමු කසා, තිපල්, රණවරා මුල්

දත් පොතු, කිරිබදු අල, සතකුප්ප මෙයින් කකාල කසායෙහි තිකුළු, සුනු කලදක් ලා උදය කිප දිනක් පොවනු සන්තිපාත ප්‍රමේහ මුත්‍රඝාත සක්කරා සෝප රෝග නසා.

101.

මුත්‍ර කිච්චාවට

එන්සාල්, ගල්මද, තිප්පිලි, වැල්මී, පොල්කුඩු පලා මුල්, බැම්තිරිය කොල, ගොකටු මුල්, වන් ඇපල කොල, එරඩු මුල්, මෙයින් කකාල කසායෙහි සීනි එක්කර දෙනු. මුත්‍ර කිච්චා මල බඩ දහ හැරේ.

102.

මීටම කුප්පමේනිය කොල අමුවෙන් අඹරා අමු දෙඩම් ගෙඩියක් පමණ ගුලිකර දිය අට කාල කාලට කකාරා එක විටම පොවනු. මුත්‍ර කඩුත්තුවද, මල බඩ එම විගස ඉගිලේ.

103.

මීටම එන්ෂාල්, ගල්මද, තිප්පිලි, වැල්මී, පොල්පලා මුල්, මේ දේ එක බරට ගෙන චූර්ණ කරමින් කලදක් රත්තැඹිලි කසපැන් කපා එම දියට කලතා ඉස්ම වසා ගිති අඟුරු පිට තබා මදක් කකාරා ඒ දිය පොවනු. බොහෝ කලක් ගිය මුත්‍ර කිච්චාද වැලි ගල්ද ඉගිලී යන්නේය.

104.

සියළු ප්‍රමේහයට

ඉඟිනි ඇට, කිහිරි, නෙල්លි, දුම්මැල්ල, වෙනිවැල්, ඉදින්නරු, වියලි කසා, දිය මිත්ත, අඹ ඇට, අරළු, කලාඳුරු මෙයින් කකාල කසාය මීයෙන් දෙනු. සියළුම ප්‍රමේහ නසා.

105.

මීටම පසකුරු, දම්, කුඹුක්, මෙයින් පොතු ගෙන කකාල කසාය මී පැනියෙන් දෙනු. සියළු ප්‍රමේහ නසා.

106.

මීටම දෙකසා, තිපල්, කලාඳුරු අල, කුඹුක් පොතු, රණවරා, පංචාංගයෙන් මේ හැම සමව ගෙන කකාල කසාය මී පැනි එක්කොට රාත්‍රී දෙනු. සියළු ප්‍රමේහ දහ ගුනවේ.

107.

මීටම ඉඟිනි ඇට, තිපල්, කලාඳුරු, රණවරා, දේවදරු, කිහිරි, කුඹුක් දත් මෙකී පොතුද උන මකුළු, තිප්පිලි, කළු කිහිරි, මේ හැමින් කල කසාය රාත්‍රියෙහි දෙනු.

සියළු ප්‍රමේහ නසා.

108

තිපල්, පිටවක්කා, බින් කොහොඹ, රණවරා, පංචාංගයෙන් ගෙන එක්කොට කකාල ක්සාය මී පැතියෙන් දෙනු. සියළු ප්‍රමේහ නසා.

109.

මීටම සූරිය පොතු, චූර්ණ කොට තලමුරුවට චූර්ණයත් සරියේ ගෙන මී සමව දෙනු. ප්‍රමේහ නසා.

110.

අරළු, එරබදු කොල, අඹරා මෝරුවේ කලතා දෙනු. ප්‍රමේහ නසා.

111.

පැහිච්ච කොස් වේලා චූර්ණ කොට තල තෙලින් අනා ලේහ කරනු. සියළු ප්‍රමේහ නසා.

112.

කෝවක්කා, රණවරා, මෙහි කී කොල ගෙන කපු ඇට මදක් එක්ව මෝරුවෙන් අඹරා දෙනු. සියළු ප්‍රමේහ ගුණවේ.

113.

කපු මුල්, බෝ පොතු, චූර්ණ කර මීයෙන් අනා ලේහ කරනු.

114.

කරාබු, සියඹලා.ඇට, පොතු, එල ඔලිඳ ඇට, අත්තික්කා කිරි, මෙ හැම අඹරා මී පැතියෙන් මෝරුවෙන් දෙනු. සියළු ප්‍රමේහ ගුනවේ.

115.

වතුසුද්ධ කොල මදක් කැකුළු සාල් එක්කොට අඹරා මී පැතියෙන් මෝරුවෙන් දෙනු. සියළු ප්‍රමේහ ගුනවේ.

116.

කරපිංච පංචාංගයෙන් ගෙන තිපල්, තිකුළු හා තල තෙලින් කැවුන් පිස මේ හැම කරපිංච චූර්ණ සමව අඹරා තබා දවස තුන් කලදක් දෙනු. සියළු ප්‍රමේහ, කුෂ්ඨ, කාස ස්වාස නසා. අග්නි වඩා.

117.

රණවරා, කලාදුරු, තිපල්, දෙකසා, දම්පොතු, කුඹුක්, පසකුරු, මේ හැම පොතු ගෙන දියමිත්ත ඉඟිනි ඇට, රත්නෙටොල්, තිප්පිලි, කිහිරි, ඇඹිලිය, පියාගස්, කෙලින්ද, තොටිල, එරබදු, යන මෙයින් කකාල කසාය මදක් සිහිල්වූ කල මදක් තුත්තං චූර්ණය එහි එක්කොට මී පැති සමව දෙනු.

118.

මීටම රණවරා පංචාංගයෙන් සුනු කොට ඉන් භාගයක් නෙල්ලි සුනු කොට ගෙන ඉන් භාගයක් දෙකසා සුනු කොට ගෙන මෙ හැම එක්කොට මී පැති මෝරු සමව දෙනු.

119.

තිපල්, වෙලි කසා, රණවරා ඇට, එල ඔලිද මුල්, කළු තල මෙ චූර්ණය මී පැතියෙන් දෙනු. සියළු ප්‍රමේහ ගුනවෙ.

120.

රණවරා දළු, මෝරුවෙන් තන්බා දෙනු.

121.

ඉඟිනි ඇට, දෙකලදක් ගෙන අඹරා මෝරුවෙන් මීයෙන් හෝ දෙනු. සියළු ප්‍රමේහ නසා.

122.

අලු පුහුල් තන්බා මී පැති සහිත කොට දෙනු.

123.

රසකිඳ චූර්ණය එසේම මීයෙන් දෙනු.

124.

අළු කෙහෙල් මල් පුළුස්සා එසේම මීයෙන් දෙනු.

125.

තිපල්, දේවදුරු, කලාදුරු අල මෙයින් කල කසායෙහි මෙම බෙහෙත් කල්ක අඹරා දිය කර දෙනු.

126.

ඉඟිනි ඇට අඹරා හාල් පානුවෙන් දියකර දෙනු. සියළු ප්‍රමේහ නසා.

127.

වියලි කසා කසාය කකාරා එම කසා කල්ක ලා පොවනු.

128.

මීට රණවරා ඇට චූර්ණය මී පැනියෙන් නිත්‍යයෝගයෙන් දෙනු.

129.

ඌර ල බුමු, ඇට, සකීකරා, මෙ හැම පලම ගෙන චූර්ණකොට ගෙන අබිනුත් ඉන් බාගයක් එක්කොට පොවනු. සියළු ප්‍රමේහ නසා.

130. සෑම ප්‍රමේහයට

අළුත් සිනටි වී ලාසයක් ගෙන ශලකලා මුඩ මහන කොල වැත්තක් වී වැත්තක් අතුට මෙම ලෙස නැවත දෙතුන් වැත්තක් අතුට දියවත්කොට දිය නොසිටුවා උයා ඇරගෙන වේලා සාල් පැහැර ගෙන බැද අත්සුනු කොට ගෙන එළතිලනෙන් නැටියක් ගෙන මෙයින් අත්සුනු පතක් එහිලා පැහිච්ච වතුගෙඩි පහක් හයක් එහිලා අනා සත් දවසක් කනු. දියවැඩියා ගුනවේ. දිව්‍ය ඖෂධයයි.

131. දියවැඩියාවට

ඉඟිනි ඇට දෙළොස් කලඳක් ගෙන කසාය කකාරා පෙරා මී කලඳක් එක්කොට පොවනු.

132.

ඊටම,
රණවරා මුල්, නෙරෙංචි මුල්, වේලා චූර්ණ කොට තල මුරුවට හා එක්කොට මෙ චූර්ණය සමකොට මීයෙන් හෝ ගිතෙලින් හෝ පොවනු.

133. ප්‍රමේහ දහයට

සඳුන්, වම්මුතු, කපුරු, සිද්ධිගුරු, සීනි, මෙ හැම සඳුන් දන්ඩෙන් අඹරා ලේහ කරනු. දහ ගුනවේ.

134.

මීටම ත්‍රිවගී, සිද්ධිගුරු, තිප්පිලි, අසමෝදගම්, කළු දුරු, දිවුල්ලාටු, දෙළුන්පොතු

අතිවිඩයන්, ඉඹුල් මැලියම මෙ හැම චූර්ණ කොට අබින් කලඳක් මිශ්‍ර කොට සීනියෙන් දෙනු. සියලු ප්‍රමේහ නසා.

135.

සාතාවාරිය කොල සතරයි එපමණ එලකිරියි එලගිතෙල් නැලියයි, මෙ හැම කකාරා පදමට පෙරාගෙන එහි වැල්මී සකීකරා චූර්ණය සතර පලන් ලා ලේහ කරනු. උන්මාද, මුත්‍රකිච්චා, අස්මරි, ස්වර හෙද ක්‍ෂය රෝග, කාමලා මෙ හැම නසා.

136. ප්‍රමේහයට

තිපල්, තිකුළු, තිජාත, කොතඹුරු, දළුව මුල් සමඟ, රණවරා පංචාංගය ගෙන කිරි නැලියයි, වතුර හතර නැලියයි, නැලියට සිඳුවා හතර වේලක් දෙනු.

137.

එන්ෂාල්, ගල්මද, නෙල්ලි, තිප්පිලි, පොල් පලා මුල්, වැල්මී, ව්ලගසාල්, ත්‍රිවගී, සෙංකල නෙරි කොට්ටම්, රනවරා ඇට, මුඩමහන, අතිවිඩයන්, කලාඳුරු අල, වඳුරු මෑ ඇට,. කෙලිඳ, ඉඟිනි ඇට, තල් මල්, ලොත් සුඹුලු, වෙල්ලොත්තිරං, මයිල මල්, එල ඔලිඳ ඇට, පොතු, දූරු දෙවගේ, දේවදරු, ඉඹුල්ලාටු මේවා චූර්ණ කර එක්කලං හමාර බැගින් ගෙන එපමන සීනි සමඟ දෙනු. විස්සක් ප්‍රමේහ නසී.

138.

මිටම කරපුංචා කොල, මල් ගෙඩි, මුල්, කොල, පොතු, යන් මේ පස සෙවන වියලා, තිපල්, තිකුලු, කාන්ථ ගල්, තල ඇට, බෝදි ඇට, කළු දූරු, යන මේවා චූර්ණ කර දවස තුං තුං කලද දලදනු.

139.

මිටම කරපිංච පංචාංගයට, තිකුළු, තිපල්, වසාවාසි, ගල්මද, එලසතකුප්ප, බිංතල් අල, බෙලි පිංචි, මෛල මල්, අට්ටික්කා පිංචි, ඉඹුල් මැලියං, මේවා දෙකලං බැගින් ගෙන චූර්ණකොට මීයෙන් වලදනු. මින් ගුන චූර්ණ කට්වුද මුත්‍ර කිරිබැරිද මුත්‍ර මාර්ගයෙන් සාරේ යාමද, අස්මරියද, සියළු අතිසාරයටද, වාත රුජා ගුල්මද මේ හැම ගුනවේ.

140. මුත්‍ර කිච්චාවට

ඉඟිනි ඇට, එන්ෂාල් අඹරා, නැඹිලි පැනිං දෙනු.

141.

අළු කෙසෙල් අලයක් වල සාරා බේරුනු දියත් කස පැන් දියත් දිය පෙරු දියත් මෝරුත් එලකිරිත් සමඟ කලතා මදක් අඹරා දමා පානය කරනු.

142.

එන්ඝාල්, ගල්මද, තිප්පිලි, වැල්මී, පොල් පලා මුල්, අඹරා කස පැන් [illegible] දෙනු.

143.

එන්ඝාල්, පොල් පලා මුල්, ගල් මද, තිප්පිලි, සාල්පානුවෙං දෙනු.

144.

හාතාවාරිය මුල් කැද දෙනු.

145.

ගල්මද, වව්වනාවි, මුද්දරප්පලම්, දත්ත මුල්, පොල් පලා මුල්, වියලි කසා, රත් නෙටුල්, අරළු, වැල්මී, සමව අඹරා උලන්දු පමණ ගුලිකර සීතියෙන් දෙනු.

146. මුත්‍ර ගල්

1. පලොල් ගස් පුළුස්සාපු අළුත් දෙකලදක් එලකිරෙන් කකාරා පතකට ගුලීයක් දිය කර දෙනු. මුත්‍ර කිච්චා, ගල් වෙරෙප්පු, අකුරු කෙවුන් ගුනවේ.

147.

2. මීටම සුදුළුනු දෙතක් විවර තන කිරෙන් කකාරා තුං උදයක් දෙනු. ගල වැටෙයි.

148.

3. මීටම පෙනෙර කොල යුස, කිකිලි බිජු සාරු ගානු. ගල වැටෙයි.

149.

4. මීටම කුඹුක් කොල යුස පතකට තලතෙල් බාගයක් එක්කර ඉනවට කර ගානු. ගල වැටෙයි.

150.

5. මීටම සකුරු, සවින්දව දෙකිංදෙකලදක් බෝ පොතු යුසින් පොවනු. ගල වැටෙයි.

151.

6. පෙරුංකායන්, ඉඟුරු, කරාබු, කොත්තමල්ලි, තිප්පිලි, සුදුළුනු, මෝදගං, කුඹුරු ඇට, මෙවා දෙකලං බැගින් ගෙන අඹරා බෙලි මුල්, මුරුංගා මුල් කොටා දිය සත්‍ර එකට කකාරා ගෙන තුං උදයක් දෙනු. ගල වැටෙයි.

152.

7. කරාබු, තිප්පිලි, උළුවා, සුදුදුරු, කළු දුරු, කොත්තමල්ලි, බුලු මෙවා දෙසි ඇඹුලෙං අඹරා තුං උදයක් දෙනු.

153.

8. පඹ කොල යුස දෙනු.
ඊට. ලය විරේකට රට වැටකුළු ඇට පොතු හැර මද තලතෙලෙං ලැපැත්ත ගානු.
විරේක වේ.

154.

මදට්ය කොල එළ කිරෙන් පොවනු.

155.

මා නුගු වැල් මුල් යුස එළ කිරෙන්ද කෂ පැන් දියෙන්ද කොසඹ සාමුලින් එළ කිරෙං ද දෙනු. මාත්තු - සඳුං

156.

පාවට්ටා ඉස්ම පතක් ගෙන කකාරා දෙකට බෙදු පුළුහුවක් දෙනු. ගල් වෙරෙප්පු වැටේ.

157.

කිකිරිඳිය ඉස්ම එළ කිරෙන් දෙනු. ගල් වැටේ.

158.

මී මුරුවට මී පැනියෙන් දෙනු. ගල් වැටේ:

159.

ඔලිඳ කොල ඉස්ම පොල් කිරෙන් දෙනු. ගල් වැටේ.

160.

තිපල්, සඳුං, ඉඟිනි ඇට, වැල්මී, ගල්සෙවෙල්, චූර්ණකර අඹරා පොල්පලා මුල් තැඹිලි දියෙහි කකාරා එයට දියකර බොන්න.

161. **ප්‍රමේහයට**

රසකිඳ ගැට, සැබෝ, වලහ සාල්, සක්නැබ, වද කසා, අරළු, සිද්ධිගුරු, රස කිඳ පොතු හැර කපා වතින් කොටා දිය වත්කර අනා මිරිකා පෙරා ශලක වක්කර පැදෙන්ට අවුවේ තබා යටට මිදුන මන්ඩිගෙන වේලා තබා සැවැන්දර සුදුදුරු, කළු දුරු, කොල්ලන් කොල, කොට්ටම්, නෙල්ලි, බිත්තල් මුල්, එන්සාල්, හරේණුක, මුද්දරප්පලම්, කොකුම්, නාමල් රේනු, නෙළුම් මල් රේනු, එම අල, අමු කපුරු, රත් හඳුන්, මිරිස්, සිද්ධිගුරු, විලඳ, අමුක්කරා මුල්, හාතාවාරිය මුල්, නෙරෙංචි මුල්, වඳුරු මෑ ඇට, තකුල් මෙකී දේ සමභාගව ගෙන චූර්ණ පංගුවට රසකිඳ පිටි දෙබාගයක් එක්කර සීනි මී පැනි එළගිතෙල් මෙකී දෙයින් අනා බිලාල පාදයක් කනු. මෙහි ගුණ නම් විස්සක් ප්‍රමේහ ගතිද මූත්‍ර අඩිස්සියද ශොප රෝග රත්පිත්

අතුල් පතුල් දහ කැමති ආහාර ගන්නවා විරුද්ධ නැති.

162.

රණවරා කොල මිටක් ගෙන කොටා තල් පතෙක මුලක් බැද උනු අළුවෙන් උයා උනුසුමෙන් බා ගෙන අඹරා තුනක් ගුලි සුදු රෙදි වලින් බැද ගිල්ලෝ තබමින් එකිනෙක තුන් දිනක් මීයෙන් කැවෝත් මෙහ තිබෙනු කොතනද

163.

මුත්‍ර දහයට

සුදු එනු. වද කසා, මුරුංගා මුල් ඉස්මෙන්, වරා කොල ඉස්මෙන්, පතුක් කොල ඉස්මෙන්, හීරැස්ස ඉස්ම, සියත් දුඹුළු, බිම්පොල්, දෙමට මුල්, කොටා යුෂ කුරු පොල් එක්ව කැද දෙනු.

164.

සීනි, යවකාර එනු පොඩි කොට දියේ ලා පොවනු. හැම මුත්‍ර කිච්චා නසා

165.

මුරුවා මුල් කකාල කශාය ගෙන උතින් පොවනු. ගල් වැටේ.

166.

වැල්මී, ඉඟිනි ඇට, තිප්පිලි, පොල් පලා මුල්, හඳුන්, එලකිරි වත්කර අඹරා එම කිරට කලතා උදයක් දෙනු. මුත්‍ර දය උෂ්ණ ගුණවෙයි.

167.

ගල් මද යන අටද එල කිරි, උප්පැති, තැඹිලි, සවිඳ එනු ද, වසාවාසි, ද තැඹිලිද, කශා, කෝමාරිකා, පුෂ්කර, ගල් නහර, ගල්මද, ඉඟිනි ඇට, ත්‍රස්තවාළු,සැබෝ අළුද සිදුවා යොදමින් දෙනු. මුත්‍ර අඩස්සි පිපුමද මෙම අවුෂද දුන්නොත් තද දහ උෂ්ණ රස්නෙද මේ බෙහෙතින් අඩුවෙයි. අත් දුටුවෙයි.

169.

නෙළුම් අල, කටු ඉඹුල් පොතු, කුර මුල්, කිතුල් බඩ, රෂකිඳ, සැවැන්දන, අළු කෙහෙල් මුල්, රණවරා මුල්, හාතාවාරිය මුල්, කහ මුල්, මෙකීවා පලම පලම

ගෙන තැඹිලි කශ පැන් වතුර නැලි හතරයි සිළු පැන් වතුර නැලි හතරයි එකට වක්කර ඊට පළමු වල් බේත් කොටා කශායට දමා ගිනිකර දෙකට ශිඳුවා බා තබා රොඩු දමා පෙරා ගෙන මීට එල කිරි පතයි උප්පැති පතයි, දෙහි ඇඹුල් පත බාගයයි ශීනි පත බාගයයි මීට කඩ සරක්කු, වැල්මී, කොට්ටන්, කරාඹු, සුදුරු, මෙකී බේත් මංචාඩි දෙලහයි සඳුන් ඉඟිනි ඇට මෙකී දේ කලඳ කලඳයි අඹරා දමා කකාරා බා තබා මීට අරළු දෙකලන් හමාරයි. බුළු එක්කලං සමාරයි. නෙල්ලි දෙකලඳයි, මෙකීවා වතුර නැලි හතර කට දමා නැලියට ශිඳුවා පලමු කශායට වක්කර නැලියට ශිඳුවා බා තබා දහ හතර වරුවක් වලඳනු: පලමු මී පැනියෙන් දෙනු. එනු ඇඹුල් වලකිනු. මීන් ගුණ රක්තාදියෙන් එන ප්‍රමේහ යටද, එයින් එන ඉදිමුමටද, කාසයටද ලැය අඩස්සියටද, ඇශිරිමටද, ගිනියමටද, ලැය පැසවනවාටද, බඩේ වනද උගුර කට වනවිමටද මුත්‍රා මග වනවිමටද පිට ගෙඩි ගැශි වනවිමටද මුත්‍රා සමඟ ශාර යනවාටද රත්පිත් පාඩුවටද බඩින් ලේ යනවාටද මෙකී දේට යහපති.

170. **ප්‍රමේහයට**

ඉරමුසු, ඉරිවේරිය, කලාදුරු අල, බැබිල මුල්, පෙනෙල මුල්, මෙකී මුල් තුං තුං කලඳ ගෙන වී කුඩු නැලියක් පමණ ගෙන වතුර නැලි හතරකට දිය කර තුන් දවශක් ඌරුවෙන්ඩ තබා අරගෙන පෙරා ලිප තබා නැලියට සින්දවා ඊට උප්පැති පතයි.
දෙහි හතරක ඇඹුල් වක්කර හඳුන් තුන්, කලඳක් ගෙන අඹරා දියකර මඳ ගින්නෙන් කකාරා තුන් පතට සිඳුවා බා තබා ශීතියෙන් සත් දවශක් දෙනු. එනු ඇඹුල් වලකිනු.

මීට ගුණ රක්තාදියෙන් එන ප්‍රමේහ මුත්‍රා පැති පැයට සැරව යෙයි. මුත්‍රා අඩස්සියටද බඩේ පපුවේ ගිනියමද දැවිල්ලටද ඇස් රතු වෙනවාටද, ඇස් කබ බැදෙනවාටද පුරුෂ ලිඟුව වන වෙනවාටද ගෙඩි බිබිලි ගැශි වන වෙනවාටද, කුඩා කඩුත්තු මග වන වෙනවාටද මෙකී ලෙඩ ගුණ වෙයි. කශාය දී පසුව දිය වක්කරනු.

171.

සියළු දියවැඩියාවට
දේවදර, වෙනිවැල් මුල්, කලාදුරු, තිපල්, මෙකී දෙය ශමස් පලමක් ගෙන කකාරා මී පැනි මුශුව පොවනු.

172.

නෙල්ලි කකාරා ගත් දිය පතක් මී පැනි එක්ව පොවනු.

173.

තිපල් ශුනු මී පැනියෙන් අනා කවනු. සියළු දියවැඩියා නසා.

174.

ගල් ශෙවෙල් පොඩි කොට තුං කලඳක් ගෙන මී පැනි මුශු කොට ලේහ කරනු. සියළු දියවැඩියා නසා.

175.

වෙනි වැල් මුල්, නෙල්ලි, මෙ දෙකින් පලමක් ගෙන දිය දෙනැලියක් වත් කොට කකාරා පතක් පමණ ශිටි කල පෙරා තිවා මී පැනි එක්කොට පොවනු. පිත් ලේ දෙකිං වු මුත්‍ර බාධ සංසිඳේ

176.

වෙනිවැල්, වැල්මී, කැකිරි, ශමයේ ගෙන හුනු කොට හාල් පානු දියෙන් පොවනු.

177.

වෙනිවැල් පොතු අඹරා උනු දියෙන් පොවනු. පිත් ලේ දෙකින් වු මුත්‍ර බාධක හැරේ.

178.

එන්සාල් පොඩි කොට තුං කලඳක් ගෙන පාද ගත් ගෝ මුත්‍ර සහ පොවනු. ශෙලෙස්මාවෙන් මූ මුත්‍ර බාධා හැරේ.

179.

අරළු, ගොකටු මුල්, ඇශල මුල්, පුස්වැන්න, වැල් කහඹිලියා මුල්, මෙකී බෙත් ශමයේ පලමක් ගෙන දිය දෙනැලියක් වත්කොට කකාරා පතක් පමණ ශිටි කල පෙරා පොවනු. රුදු සහිත මලමුත්‍ර බද්ධ ඇරේ.

180.

කොවක්කා මුල්, කපා පලමක් විවර ගෙන දිය දෙකක් වක්කොට කකාරා පෙරා පොවනු. ගල් වෙරෙප්පුවටයි.

181.

පුහුල් වැල්, කපා ලා කකාල කශාය නොහොත් එම මුල් පුහුල් වැල් තලා මිරිකා ගත් ඉස්ම පතක් විතර ගෙන ඊට ගල් ශෙවෙල් පොඩි කලඳක් විවර එක්කර උදෑසන පොවනු. මුත්‍ර බද්ධ ගුණ වේ.

182.

මුත්‍ර කිච්චාවට

එල බටු මුල්, කටුවැල් බටු මුල්, දිය මිත්ත මුල්, ඊට දිවුනක් කොට ගොකටු මුල්, වැල්මී මෙකී බෙහෙත් සමසේ ගෙන එල කිරි මනාවක් එක්කොට කකාරා කිරි පමණ ශිටි කල පෙරාගෙන පොවනු.

183.

එන්ෂාල් පොඩි කොට තුන් ක්ලඳක් පමණ ගෙන අළු කෙසෙල් ඉශ්මින් කලතා පොවනු.

184.

තල ගශාගත් රොඩු දවා අළු ගෙන සවස දියේ ගිලා කකාරා පෙරාගෙන මී පැනි එල කිරි එක්කොට තුන් රාත්‍රියක් බොනු. නැතිනම සවිද එනු එක්කොට පොවනු. මුත්‍ර කටච්ජා, ගල් වෙරෙප්පු සංසිඳ වේ.

185.

දිය වැඩියාවට

එන්සාල් කලඳයි, ඉඟිනි ඇට කලඳයි,. මෙ දෙවගේ අඹරා නැඹිලි කසපැන් දියෙන් දිය කොට ශිනි තුං කලඳකුත් දමා තුන් දවසක් දෙනු.

186.

මුඩ මහන කොල ගෙන ශැලියක පල්ලේ අතුට ශිනටි නැලියක් ගෙන කොල පිට එම විලා වී වැත්තක් කොල වැත්තක් ලා උයා ගෙන වී වේලා හාල් කොටා ඉන් පිටි පතයි, පිල කොල, ඔළු අල, කෙකටිය අල, ඇටෝරා අල ජති අලුකෙහෙල් අල, ගල් කුර කොල මෙකී දෙය වෙන වෙන ගෙන පොඩි පත පත බැගින් මෙ හත් වගේ පැහිච්ච අළු කෙහෙල් ගෙඩි පොතු හැ ර දමා අඹරා ඉක්බිති. දෙශි ගෙඩිය පමණ එලඟිතෙලුත් එවිතර ශිනිත් අබිං කලඳකුත් එක්කොට වේලක් අඹරා නැවත අළුත් මී පැනි පතක් වක්කොට අනා අඹරා තනා තිබා උදය ශවස දෙවේලේ වලඳනු. දිය වැඩියා ගුණ වේ.

187.

තික කොලයි, පෙනෙල කොලයි, වශ තැල්ල කොලයි, ඔලිඳ කොලයි, [illegible] දේ කොටා දිය නොවක්කර මීරිකා තැඹිලි පොල් ගෙඩියක් කිරි මීරිකා ගෙන දෙවගේ එක්කොට උදය බොනු. සතියක් බොනු. දියවැඩියා ගුණවේ.

188.

අරළු සුනු කොට මී පැනි එක්කොට වලඳනු.

189.

දිය මිත්ත මුල්, වෙනිවැල්, කොසඹ කොල, කලාදුරු අල, නෙල්ලි, ශමයේ පලමක් ගෙන දිය දෙකක් වක්කොට කකාරා පතක හෙලා පෙරා පොවනු.

190.

රශකිඳ වැලේ ඉශ්ම මීරිකා ගෙන මී එක්ව දෙනු. සියළු දිය වැඩියා නසයි.

191.

උයාපු හාලේ කැඳ පෙරා තබා උදෑසන කැඳ තැටියකුත් ශුඩු එනු මීටකුත් කොටිකාවක් විතර ශිතිත් එක්ව පොවනු. දිය වැඩියා සුවවේ.

192.

ශුඩු ඉත්ත
අඹරා අඹරා ශත් දවසක් එල කිරෙන් දෙනු. දිය වැඩියා ගුණ වේ.

193.

බෝ ඇටයි, රනවරා ඇටයි, හිබුටු පොතුයි, වෙන වෙනම වේලා පොඩි කොට තුන් කලඳක් මී මෝරුවෙන් දෙනු. මේ රහට අට දවසක් දෙනු.
වික්කලට බෙත්
කොබ්බෑ මුලේ පොතු, අඹරා තල තෙල් දමා තෙල් කැකැරීගෙන එන පදමට බා තිබා නිරන්තරයෙන් ලේහ කරනු.

194. **මුත්‍ර විරේකයට**

ශක් සඳ මුල් දෙඩම ඇඹුලෙන් අඹරා දෙඩම බිකේ ලා ගිලිනු. මුත්‍ර විරේක වේ.

195.

රස බස්ම, අරළු, නෙල්ලි, බුළු, ශාදිලිංගන් සුනු කර හිරියල්, වචවකාවී, ජයපාල ගන්ධක, මෙ හැම ශමභාග ගෙන කිකිරිදිය ඉශ්මිං අඹරා ඔලිද ඇට පමණ ගුලිකර නොඅව්වේ වියලා තබා මින් ගුලියක් ඉහුරු ඉස්මෙන් දිය කොට පානය කරනු මුත්‍ර විරේක වේ.

රත, මාඳම හා බාලරෝග

රත් පිතට

1. ඇල් හාලේ බත් දී, සුදු හඳුන්, ශැවැන්දරා මුල්, ඉරිවේරිය මුල්, කලාඳුරු අල, පපීටක, මෙකී බෙහෙත් සමව දෙලොස් කලඳක් ගෙන ගලේ ලා තෙරපා දිය දෙනැලියක් වක්කොට කකාරා පතක් පමණ සිටි කළ පෙරා මද උනුවේ උදෑසන පොවනු.

2. රත් පිතෙන් ඇති වන වමනයට

   මුද්දරප්පලම, කළු දුරු, උගුරැස්ස මුල්, මෙකී දෙය සමභාග ගෙන දෙලොස් කලඳක් ගෙන දිය දෙනැලියක් වත් කොට කකාරා පතක් පමණ සිටි කළ පෙරා තිවා ගෙන උදෑසන විලඳසුනු, මී පැති, එලගිතෙල්, සීනි එහි ලා දිය කොට පොවනු. රත් පිත් වමනය වේ නම් විරේක කරනු. රත් පිත් බඩින් යේනම් වමනය වන්ට බෙත් දෙනු. ඊට සමානවේ නම් දිය කැඳ දෙනු.
   රත් පිතට විරේක කළ යුතුය. ඊට

විරේකයට බෙත්

1. තිරස්තවාළු මුල්, දෙලොස් කලඳක් ගෙන දිය දෙනැලියක් වක්කොට කකාරා පතක් පමණ සිටි කළ බා පෙරා තිවා මී පැති උක් සකුරු සුගක් එක්කොට උදෑසන පොවනු. විරේක වේ.

2. අරළු. දෙලොස් කලඳක් ගෙන දෙනැලියක් වත් කොට කකාරා බා පෙරා තිවා මී පැති උක් සකුරු එක්කොට උදෑසන පොවනු.

3. නෙල්ලි දෙලොස් කලඳක් ගෙන දිය දෙනැලියක් වක්කොට කකාරා පතක් පමණ සිටි කළ බා පෙරා තිවා මී පැති උක් සකුරු එක්කොට උදෑසන පොවනු. රත් පිත් විරේක වේ.

4. කලාඳුරු අල, කෙලින්ද පොතු, වැල්මී, නොමු කළ කුකුරුමාන් ගෙඩි, සාරු පස් මසක් වියලා තබා ඉන් ගෙඩි දෙකක මද ගෙන මෙකී බේත් - සව් ඇත්නම් දෙලොස් කලඳක් හෝ සකලඳක් හෝ ගෙන එගකිරි මනාවක් විවර එක්කොට කකාරා පෙරා තිවා මී පැති පලමක් විවර එක්කොට උදෑසන විටක් දෙවිටක් දී වමන කරවනු.
   බාල අයටද වයස් ගිය අයටද විරේකයට බේත් නොදෙනු. සව් නැති අයටද ඇඟ මැරී තිබෙන අයටද ක්ෂය රෝග ඇත්තන්ටද මෙකී අයටද බෙහෙත් නොදෙනු.

9. දුම්මැල්ල මුල්, පිවච වැල්, මුල්, කොසඹ මුල්, පොතු, රත් සඳුන්, සුදු සඳුන්, හෙල නෙළුම් අල, මෙකී බෙහෙත් සමසේ දෙලොස් කලඳක් ගෙන තෙරපා දිය දෙනැලියක් වක්කොට කකාරා පතක පමණ සිටි කළ පෙරා තිවා මී පැති

උක්සකුරු එක්කොට පොවනු. රත් පිත් නසා.

10. කුර මුල්, වන් ඇපල මුල්, ලොත් සුඹුල, වගපුල්, කිතුල් ගසේ පොතු, මෙකී බෙහෙත් සමසේ දෙලොස් කලඳක් ගෙන තෙරපා දිය දෙනැලියක් වක්කොට කකාරා පතක් හෙලා සිඳී තැන බා පෙරා නිවා මී පැනි උක් සකුරු මුසු කොට පොවනු. රත් පිත් නසා.

11. කලාඳුරු, නෙල්ලි, මයිල මල්, කෙලිඳ පොතු, පළීපට හෙවත් පැපිලිය මෙකී බෙහෙත් සම සේ දෙලොස් කලඳක් ගෙන තෙරපා දිය දෙනැලියක් වක්කොට කකාරා පතක් පමණ සිටි කල බා පෙරා නිවා මී පැනි උක් සකුරු මුසුකොට පොවනු.

12. වන් ඇපල මුල්, දෙලොස් කලඳක් ගෙන තෙරපා දිය දෙනැලියක් වක්කොට කකාරා පතෙක හෙලා තබා පෙරා නිවා මී පැනි උක් සකුරු මුසු කොට පොවනු.

13. රත්වන් කැල, සුදු නෙළුම මල්, රුක් මල් ගස පොතු, ලොත් සුඹුළු, ඳුරු කැට මෙකී දෙය සමව ගෙන හෝ වෙන වෙනම ලත් එකකින් තුන් කලඳක් ගෙන පානු දියෙන් දිය කොට උක්සකුරු තුන් කලඳක් එක්කොට පොවනු. රත් පිත් නසා.

14. කොබෝලීල මල්, කුඹුක් මල්, කිහිරි මල්, මෙකී බෙහෙත් සම සේ ගෙන වියලා සුනු කොට තුන් කලඳක් ගෙන මී පැනියෙන් උදෑසන අනා කවනු.

15. ඇද්දෙමට ගෙඩි, අරළු, යොන් ඉඳි, මුද්දරප්පලම මෙකී බෙහෙත් වෙන වෙනම ගෙන සුනුකොට තුන් තුන් කලඳ ගෙන මී පැනියෙන් අනා උදෑසන කවනු. රත් පිත් නසා.

16. පුසුල් ගෙඩියක් ගෙන පිටපොතු හැර ඇතුලේ ඇටත් හැර කැබලි කොට කපා ගෙන අමු නොකොට මෙරි නොකොට උයාගෙන පලමින් සියක් පලමක් කිරාගෙන එළගිතෙල් නැලියකින් මෙකීයන පුසුල් බැද ගෙන සීනි සියක් පලමකින් මෙපුසුල් අනාගෙන යහපත් ශැටියේ තබාගෙන දවසකට පුළුවන් විචර කවනු.

රත්පිත් මාලෙට

1. එන්සාල්, කොතඹුරු, කොල්ලන් කොල, කුරුඳු පොතු, මිරිස්, මෙකී දෙය එක එක කලඳ ගෙන වග පුල්, සිහුරු, මෙකී දෙපලම දෙපලම ගෙන වියලා සුනුකොට මී පැනි මනාවක් එළගිතෙල් නැලියක් එක්ව අනා යහපත් කොට තනා තබා උදෑසන තුන් කලඳක් බොනු. රත් පිත් උණ කැසි මුස ඇඟ වැරුම් වමනේ ලෙහි රෝග නසා තර කෙරේ. කට හඩ ඇති කෙරේ.

2. මුද්දරප්පලම, අස්වැන්න, පුස්වැන්න, මෙකී දෙය මුල් දෙලොස් කලඳක් ගෙන තෙරපා එළකිරි මනා වක්කොට කකාරා කිරි පමණ සිටි කළ පෙරා ගෙන උදෑසන බොනු.

3. බැබිල මුල්, සිද්ධිගුරු, රත් ගොකටු, සාතාවාරිය මුල්, කොසවිල පලම පලම ගෙන එළ කිරි මනාවක් වක්කොට කකාරා දිය සිඳී කිරි සිටි කල පෙරානිවා

උදෑසන පොවනු. රත් පිත් මාලේ නසා.

4. සින් මැඩ හඟු මුල්. රත් සඳුන්. කලාදුරු අල. මානෙල් මල් රේනු. වැල් මදට. ශැවැන්දව මුල්. මෙකී බෙහෙත් සමව සතර පලමක් ගෙන එලඟිතෙල් මනාවක් එලකිරි සතර නැලියක් ශාල් පානු දිය සතරනැලියක් එක්කොට මුල කී බෙහෙත් සිනිඳු කොට අඹරා මෙකියන තෙල් කිරි දියට එක්කොට තුන් දවසක් මද ගින්නේන් කකාරා සිඳ තෙල් කා ලනු වැටෙන පදමට තෙල් පෙරා ගෙන තිවා බොන්නට ඇඟ ගාන්නට. බතට කන්නට. නශ්‍ය කරන්නට වස්තියෙන් බඩට තෙල් විදින්නට යහපති.

5. කිරිබඳු අල. වැල් මී. සීන් තිඳි කුමබා මුල්. මහා තිඳි කුමබා මුල්. පැසිගිය සියඹලා. බොර. දෙළුම් මුල්. කවෙලු. නන්නාරං මුල්. මෙකී බෙහෙත් සතර නැලියක් ගෙන දිය දහසය නැලියක් වත්කොට තුන් දවසක් මද ගින්නේ කකාරා තෙල් කා ලනු වැටෙන වේලාවට බා පෙරා ගෙන තබා සුහ සුහ උදෑසන බොනු. රත් පිත්. උණ. බඩ රුජා. මල බද්ද වීම. බඩ පිපුම. කැසි. බඩගිති නැති වීම යන මෙකී දෙය සංසිදේ හෙවත් නැතිවේ.

16. සක්සුනු සිවන් ගුරු. මෙ දෙක සමසේ අඹරා ගත් කල්ක වත් වැල් මී කල්ක වත් නන කිරෙන් දිය කොට නශ්‍ය කරනු. නාසයෙන් වැගිරෙන්නාවූ ලේ නැතිවේ.

යෝති මාර්ගයෙන් ලේ යන රත් පිතට පිතින් වු තියාවට කී බෙත් කරනු.

1. කරල් සැබෝ කොළ. සාරන කොළ. මුඩ මහන කොළ. මෙකී කොළ ඉස්ම වෙන වෙනම ඇරගෙන පුළුනේ රද මාලේ යන උන්ට කුඩා කොට යෝති මාර්ගයෙහි තිබා ඉන්ට දෙනු. මාලේ නවති.

2. මුන්වැන්න මුල් උදුරා තලා. යුස මැඩ ගෙන නැලියක් විතර ගෙන තල තෙල් පතක් එම මුල් කල්ක පලමක් අඹරා එහිලා එලකිරි පතක් වත්කොට කලතාසිඳ තෙල් කා ලනුඇඹරි වැටෙන පදමට තෙල් පෙරා ගෙන පුළුනේ රදගෙන යෝති මාර්ගයේ තබනු. මාලේ නවති.

3. කුඹුක් පොතු මැඩ මී පැනි සීනි එල කිරි මනාවක් ලා කකාල කිරි පොවනු. මාලේ නවති.

4. රන්වන් ගුරු. මාදම කොළ ඉස්ම. මනෙල් අල. මෙකී බෙහෙත් වෙන වෙනම අඹරා කල්ක කොට පානු දියෙන් කලතා මී පැනි එක්කොට පොවනු. මාලේ නැතිවේ.

5. රුක්මල් ගසේ පොතු. සුදු හඳුන්. නාමල් රේණු. වෙන වෙනම අඹරා කල්ක කොට රායෙන් කලතා පොවනු.

6. වැල් මී. රස අඳුන් කැට. කුර මුල් සමව තුන් කලඳක් ගෙන අඹරා කල්ක හාල් පානු දියෙන් දිය කොට දෙනු. සියළු මාලේ නසා.

සිහිල් දියේ ගැලීමද ඇල්පැන් කොතලා දෙකක් තුනක් තෙමා වත් කිරීමද ඇල් සාලේ බත්, මුල්, ආදියද ජාංගල වර්ගයේ මුග, පක්ෂීන්ගේ, මාංශද දෙනු.

රත්පිතින් වැරුනාට

1. වග පුල්, මුද්දරප්පලම්, තුන් තුන් කලඳ ගෙන සුනු කොට අඹරා මී පැනි තල තෙල් සීනි එක්කොට අනා ලේහ කරනු. ඇඟ වැරීම නැති වේ.

2. අමුක්කරා මුල්, වග පුල්, තුන් තුන් කළං ගෙන සුනු කොට අඹරා සීනියෙන් අනා කවනු.

3. මී පැනි එළගිතෙල් දෙකින් අකක් අඩු කොට ගෙන කවනු. ඇඟ වැරීම නැතිවේ.

4. රත් තිවුල් මුල්, නෙල්ලි, සිද්ධිගුරු, මෙකී බෙහෙත් සුනු කොට ගෙන සීනි වීලඳ සුනු මී පැනි එක්කොට අනා දවස තුන් තුන් කලඳ කවනු. රත් පිතින් වැරුනාට හා ක්‍ෂය රෝග නසා.

5. පුලිල, අත්තික්කා, ඇද්දෙමට, අරළු, මුද්දරප්පලම්, ඉඳි මෙ හැම අඹරා මී මිශ්‍ර කොට වෙන වෙන ලේහ කරනු. රත් පිත් ගුණ වේ.

6. කලාඳුරු අල, වැල් මී, කුකුරුමාං, මෙ හැම අඹරා දිය කොට සඳුනුත් එක්කොට බොන්නට දී වමනය කරවනු. රත් පිත ගුණ වේ.

7. දුම්මැල්ල, දෑසමන්, කොසඹ, රත් තිවුල්, සඳුන් සුදු යන මෙයින් කකාල කසාය දෙනු.

8. කුර මුල්, ආඩතෝඩා, ලොත්සුඹුල, තිප්පිලි, මෙයින් කකාල කෂාය හෝ මදු මිශ්‍ර කොට දෙනු. රත් පිත් ගුණ වේ.

9. ආඩතෝඩා, වද මල්, රසකිඳ යන මෙයින් කකාල කසායට මුරුවා මී පුක් මෙ කල්ක ලා ඝෘතය දෙනු. මින් රත් පිත්, සෝස කාස, ස්වාසද, මෙ හැම ගුණවේ.

10. ආඩතෝඩා සහමුලින් ගෙන ඊට කොටසක් වඩා දිය ගෙන අෂ්ට භාගාව ශේෂ කොට ගෙන කසාය සතරට ගිතෙල් නැලියක් ගෙන එම ගස මල් කල්ක මොට ගෙන එක්කොට පදමට කකාරා ගෙන තිබා මී මිශ්‍ර කර කන්ට දෙනු. රත් පිත් ගුල්ම ජ්වර ගුණවේ.

11. සඳුන් කුරු, කසාය කකාරා ගෙන එහි ඉරමුසු වැල් මී කල්ක අඹරා එක්කොට පදමට කකාරා ගත් ඝෘතය සකීකරා මී පැනි එක්කොට කන්ට දෙනු. ශ්‍රොත පිත්ත ගුණවේ.

12. මුරුවා, මානෙල් අල, නාමල් රේණු, වැල් මදට, එල්වළු, සුදු ඉද්ද, ශැවැන්දරා මුල්, කලාඳුරු අල, හඳුන්, මුද්දරප්පලම්, මී පුක්, වැල්මී, කොකුන්, රත් සඳුන්, මෙයින් තුන් කලන් ගෙන අඹරා කල්ක කොට ගීතෙල් නැලියකට ඊතන ඉස්ම

සතරකුත් එළු කිරි සතරකුත් ගෙන ඝෘතය පදමට කකාරා සුරැකිව තබා රත් පිත් ආදියට වමනයට පානය කරනු. නාසයෙන් වැහෙන රක්තයට නශ්‍ය කරනු.

රත් පිතට

13. ගම්මිරිස් පොතු ගෙන, දද කිරිය, අත්තන, මුරුවා, කොමාරිකා, පතුක් කොළ, ඔලිඳ කොළ, කිරි අගුන කොළ, මුහුනුවැන්නකොළ මුල්, කීකිරි දිය යුස තල තෙලට දමා කකාරා දූරු දෙක පල්මානික්කම්, ඉඟුරු, මිරිස්, අරළු, බුළු, නෙල්ලි, හරංකහ, පාට කහ, කුඩු කර දමා කල්ක ඉටිපදමට බා හිස ගල්වනු. රත් තම්පලා, වද මල්, රතු එනු, පැහි වම්බටු, ගොරක, සියල්ල එලකිරෙන් තම්බා අඹරා ගෙන බුළු පමන ගුලි කර එල කිරට දිය කර බොන්නට දෙනු. සත්වරුවක් දෙන්න. ලුණු ඇඹුල් වලකින්න. නාන්න.

15. සඳුන් සැවැන්දරා මුල්, පැපිලිය, කලාඳුරු අල, ඉරිවේරිය කෂාය කර දෙනු.

16. මුද්දරප්පලම්, රටඉඳි, බොරළු දමනු, කෂායට මී පැනි එලගි තෙල් එක්කොට විලඳ සුණු ලා පොවනු.

අධොගත රත් පිත.

17. කලාඳුරු අල, කෙලිඳ ඇට, වැල්මී, කුකුරුමුවන් ගෙඩි, මෙතක් දෙය ලා කකාල එලකිරි තිවා මී පැනි සීනි මුසු කොට පොවා වමනය කරන්න.

18. දුම්මැල්ල, පිච්ච, කොහොඹ, සුදු හඳුන්, රත් හඳුන්, නෙලුම් මල් කෂාය මී මුසුකොට පොවනු.

19. ඉරමුශු මුල්, මහ ඉරමුශු මුල්, වැල් මී, හාතාවාරිය මුල්, කකාල කෂාය.

20. පුලිල, දිඹුල්, ඇද්දෙමට, අරළු, මුද්දරප්පලම් වෙන වෙනම අඹරා මීයෙන් අනා ලේහ කරනු.

21. බැලිල එලකිරෙන් කකාරා පොවනු.

22. බැලිල, සිද්ධිගුරු, හාතාවාරිය එල කිරෙන් කකාරා පොවන්න.

23. දෙහි ඇඹුල්, දෙඩං ඇඹුල් නැලිය, නැලිය බැගින් සියඹලා ඇඹුල්, ගොරකා ඇඹුල්, පුහුල් ඇඹුල්, මින් මනාව බැගින් ගෙන නික මුල්, කොහොඹ මුල්, වරා මුල්, හාතාවාරිය මුල්, කුඩු මිරිස් මුල්, ඔලිඳ මුල්, මුකුණුවැන්න මුල්, කුඹුරු මුල්, ඉරමුසු මුල් හා කොළ, සැබෝ මුල් හා කොළ. ඊට සරක්කු, දෙදුරු, අසමෝදගං,

තිප්පිලි, ත්‍රිවඟ, කටු වැල් බටු, කුරුඳු පොතු, සුදුලූණු, මිරිස්, වදකහ, පුෂ්ප සඳුන්, තිපල්, පලමු කි මල් බෙත් සොරසකට ඇඹුල් වක්කර තබා කසායේ කකාරා ඊට සරක්කු යොද කකාරා බොර පදමට තබා කොටසකට ජයපාල දමා උදය විරේචනයට සවස පත්තියමට විරේචනය තුන් දිනයි. පත්තියමට සත් වරුවක් වලදනු. ඇල් දිය වක්කරනු. උනු දිය බොනු.

රත්පිතින්වූ වමනයට

24. අරළු සුනු මීයෙන් ලේහ කරනු. වමනය විරේක වෙයි. දුර්වල නම් නොකරනු.

සෙම්ං උපං වමනයට

25. වලඟ සාල්, කළු දුරු, මීයෙං දෙනු.

තුං දෙස් වමනයට

26. ඉරිවේරිය කසාය මීයෙං දෙනු.

27. මීට වග පුල්, මීයෙං කවනු.

28. බෙලි මුල් කසාසට දුරු පොඩිත් බැදි සාල් පිටිත් සීනියෙං දෙනු.

29. බෙලි, බැබිල, ඉඟුරු, කොත්තමල්ලි, විලඳ, අට එකට සිඳ සීනියෙන් දෙනු.

ලේ වමනයට

30. පර පොතු කසාය දෙනු.

31. උඳුපියලි, පෙනර කොල, සඳුං ලැපැත්තෙ පෙකනියේ ගානු.

32. පොරි පොඩි කස පැං දියෙං දෙනු.

33. සඳුං, අගිල්, දුම්මල, එන්සාල්, මේවා පොඩි කොට පොල් කටු අඟුරේ ලා හිල් පොල් කටුවක් වසා බට නලේ දුං බොනු. සියළු වමනේ සිටී.

33. නුග මුල් එළකිරෙන් පොවනු.

34. මී දල්ල පට යුෂ තල තෙලෙං පොවනු.

35. තික, දළුක්, මුරුවට, කසාය දෙනු.

36. විලඳ එළු කිරෙන් දෙනු.

37. තිටෝල් කොල, පොතු, අරළු, ඉඟුරු, එනු, මෙවා යුස පොවනු.

38. දෙලුම්, ගොඩපර, ලොප් සුඹුලු, නස්නාරම පොතු, අඹරා හිස ගල්වනු.

මුකයෙන් නාසයෙන් ලේ යනවාට.

39. ඉරමුසු, ඉරිවේරිය, සාතාවාරිය, කලාඳුරු, වැල්මී, මුද්දරප්පලම, වැල්මී සමව කසාය සීනි මීයෙං දෙනු.

40. උක් දඬු, මානෙල් අල, නෙළුම් මල් රේණු, අළුකෙසෙල් මුල්, වැල්මී, දෙළුම් පොතු, නුග අරළු, කෙසෙල් මුල්, වැල්මී, දෙළුම් පොතු, මුද්දරප්පලම්, ඇද්දෙමට මුල්, මෙ කසාය සීනි මීයෙං දෙනු.

41. ආඩාතෝඩා කොල යුස සීනියෙන් දෙනු.

නාසයෙන් ලේ යනවාට

42. දෙළුන් මල් යුස නස්‍ය කරනු.

43. තන කිරෙන් සීනි දිය කොට පොවනු.

44. පිතළ විලඳ, විලිකුං කෙසෙල්, එලගිතෙල්, උප්පැති, පොල් කිරෙං සතියක් දෙනු. යහපති.

රත් පිත් වමනය

45. නත්නාරම ඇඹුලුත් දිවුල් මදත් එක්කොට අනා ලේහ කරනු. වමනේ සිටී.

46. විලඳ, සිද්ධිගුරු, බෙලි මුල්, සමසේ දෙලොස් කලඳක් ගෙන දිය අට පත එකට කකාරා දෙනු. සියළු වමනේ සිටී.

47. තිකුළු; සයින්ධව ළුනු, සුදුදුරු, ගල් මද, තිප්පිලි සම භාග ගෙන චූර්ණ කොට සියබරා බොර, නත්නාරම රේණු, මී පැනි, එක්කොට අනා ලේහ කරනු.

48. නත්නාරම රේනු, කිතුල් හකුරු, මී පැනි, විලඳ සුනු, වගපුල් එක්කොට දෙනු.

49. සිද්ධිගුරු, වගපුල්, බෙලිමුල්, සමසේ දෙලොස් කලඳක් ගෙන දිය අටපත එකට සිදුවා පෙරා සයින්ධව ළුනු මංචාඩි පසක් ගෙන මෙ හැම බරට මෙ සකුරු ගෙන එක්කොට අනා දෙනු. රත්පිත්, අරුචි කැසි මුහ ගුණවේ.

රත්පිතින් වූ නාසයෙන් ලේ යාමට

50. මුද්දරප්පලම, එලකිරි, මී පැනි, කොට්ටම, වැල්මී, මින් ලැබුනු පමණක් ගෙන නශ්‍ය කරනු.

51. නැවුන් මුට්ටියක මිදි කිරි කිලන් වත්කොට මී පැනි වත් කොට දිය නොවදනා ලෙසට බැඳ දියවර ඇතුලේ දෙතිස් පැයක් තබා උදය බොනු. රත් පිතින්වූ පිපාස ගුණවේ.

52. වගපුල්, කොත්තමල්ලි, සැවැන්දන මුල්, සමසේ සකලඳක් අට මිට එකට කකාරා සීනි මීපැනි එක්කොට දෙනු. ඉක්කා පිපාස ගුණවේ.

53. කීකිරිදිය කොල, තික කොල අඹරා අත්තන ගෙඩියක ඇස්සගසා ඇතුලත මද හැර ඇඹරූ බෙහෙත් මදක් එහිලා සයින්ධව ළුනු අඹරා ඊට දමා තිබූ බේත් මතු පිට ලා පියන වසා රෙදි මැටි බැඳ උතුකටු අඟුරේ පුළුස්සා අඟුරු වූනාම ගෙන අඹරා ටිකක් කන්ඩ දෙනු.

54. වලහසාල්, තිකුළු, තිපල්, සයින්ධව ළුනු, කසා, රත් නිටුල් මුල්, මුඩ මහන කොල, මෙකී වගේ ගෙන චූර්ණ කොට ගෝ මුත්‍රයෙහි ලා ලේහ පදමට කකාරා පාන් පියලි රඳ දිව පල්ලේ තබනු.

55. සුදු ළුනු, සිද්දිගුරු තලා දියට දමා වත් ගෙඩි දෙසි ඇඹුලෙන් උරච්චි කොට දෙනු.

56. මී මුරුවට පල්මානික්කන් අක්කරත් කර දෙහි ඇඹුල්, එලබටු ඉස්ම, තල තෙල් එක්කොට දෙනු.

57. ඒකා වේරිය මුල්, දෙහි ඇඹුලෙන් උරච්චි කොට දෙනු.

නාසා රත්පිත

58. දෙළුම් මල් ඉස්ම හෝ ඊතන ඉස්ම අබ ඇට රතු එණු ඉස්ම හෝ වෙන වෙන නශ්‍ය කරනු.

59. ඉරිවේරිය, සඳුන්, සුවඳ හොට පැපිලිය කලාඳුරු මෙයින් කකාල කසාය දෙනු. රත්පිත් ගුණ වේ.

60. කෙහෙල් මුව, වැල් මී, නෙළුම් දඬු, නුග අරළු, මුද්දරප්පලම්, ඇද්දෙමට මුල්, මෙයින් කකාල කසාය දෙනු.

61. ආඩාතෝඩා ඉස්ම මී පැනි එක්කොට දෙනු. රත්පිත් නසා.

62. ඉරමුසු, කලාඳුරු, හාතාවාරිය, මුද්දරප්පලම්, වැල්මී කසාය මී පැනි සකීකරා එක්කොට දෙනු. රත්පිත් නසා.

63. සුවඳ හොට, මී පුක්, ඉරිවේරිය, කලාඳුරු, සිකුරු පියළි, එන්සාල්, රසකිඳ, බෙලිමුල්, මෙයින් එකකට පස් පස් පලම් ගෙන දී ජලය දෙලසක් වත්කොට භාගාවසේස කොට කකාරා ගෙන තෙල් නැලියක් එක්කොට කල්ක වලට කුරුඳු පොතු ඇට, කෙහෙල් අල, ඉරිවේරිය, රසදකිඳ, කොමාරිකා යූෂ මෙයින් ඉස්ම ගෙන පාදයක් එක්කොට සඳුන්, ඉරිවේරිය, කපුරු, කලාඳුරු, කොකුම්, අරත්ත, කොට්ටම්, වගපුල්, ඇත් වගපුල්, පොකුරු මුල්, නෙළුම් කෙසරු, වම්මුතු, වැල් මී, මීපුක්, බැලිල, මශපජෂ්ටි, රත් සඳුන්, කිතුල්, සාදික්කා, සල් දුම්මල, දුම්මල, කුරුඳු පොතු, කොල්ලංකොළ, අඹඇට, මෙවං, මහමෙවං, අගිල් මෝච, දඹ, දේවදර, කෙකටිය, මානෙල් අල, මෙකී දේ එක එක කලඳ අඹරා කල්ක දිය හැර කකාරා පදමට බා පෙරා ගෙන සඳුන් කොකුන් එනසාල්, කපුරු, කොට්ටං මෙයින් දෙදෙකලං චූර්ණ කොට දමා ප්‍රතිවාප දමා ගනු. මේ තෙල් අභ්‍යංග කිරීමෙන් රත්ත පිත්ත, දය, පාද දහ, ඉස රෝග, දහ, ජ්වර, පිපාසා, පතුල දහ, ඉස සිසාරුං, ඇස දෝස, මුච්චා, දහය, පිත්ත විකාර, නසා.

64. ඉරමුසු, පියුම්, සුවඳහොට, වැල්මී, සඳුන්, ඇද්දෙමට මේ සාරිවාදී ගණය කකාරා දෙනු. රත්පිත් ජ්වර උන්මාද හැරේ.

65. මානෙල්, කුමුදු, පියුම, වැල්මී, මෙ උත්පලාදී ඝණය නම වේ. කකාරා දෙනු. රත්පිත් හැරේ.

66. හාතාවාරිය ඉස්ම පතයි, උක්පැති පතයි, පුසුල් ඉස්ම පතයි, තෙල් පතයි, උක්පැති පතයි, කල්කයට, සඳුන්, ඉරමුසු මුල්, කැකිරි ඇට, එන්සාල්, වැල්මී, වලහසාල්, දෙවුදුරු, සිද්ධිගුරු, කොල්ලංකොල, කලං බාගෙ බාගෙ ගෙන අඹරා දිය හැර පදමට කකාරා තිබා බුළු ගෙඩියේ සා වලදනු. රත් පිත් හා සියළු පිත් ගුණවේ.

67. කටු ඉඹුල් පොත්තෙන් තලප පිස පිත්තේ තබා කනු. රත්පිත් නසා.

68. මැට කේ අරලු, තෙඹු දඩු, උක් දඩු, කළුවාඅරිසි, කකාරා දෙනු. රත්පිතටයි.

69. රත් පලා යුෂ මීතෙලින් පොවනු.

70. ඇට කෙහෙල් පැන් පොවනු.

71. එළකිරි, කකාරා රසකිඳ පොතු දමා රැයක් ඌරුවෙන්ඩ තිබා පසුවද එකියන කිරීත් ඇතුළු සැමදේම ගෙන කුකුළු බිජුවල සුදුමද නානු වෙන්කර අඹරා තනා තියාගෙන වේලකට පුවක් ගෙඩියක් පමණ ගෙන කුකුළු බිජුවල සුදුමද නානුවෙන් දියකර බොනු. මෙ ශටියේ දෙවෙලේ දෙවෙලේ ගනු. අත් දුටුවයි. රත්පිතට.

විළිඹුරාවට දුම

72. කළුදුරු, සුදුදුරු, පල්මාතික්කන්, සුදුළූනු, හිරියල්, මනෝශිල, දළුක් පොතු, මේවා චූර්ණ කර පොට්ටනි දහහතරක් බැඳ සියඹලා පොතු හා දළුක් දරින් දුම්පානු.

කබර තෙලට

73. රත් තිටුල්, කීකිරිදිය, මල බුලත්, එරබදු කොළ, පුහුල් මද, මේවා යුෂ ගෙන දෙහි ඇඹුල් එක්ක රෙදි රද කීප දවසක් සෙවණ වේලා ගෙන්දගං, ඉඟුරු, මිරිස්, දූරු දෙවගේ අරළු අඹරා, කොසඹ තෙල් දෙඹ තෙල්, එඩරු තෙල්, මේ හැම දේ එක පමණ ගෙන සීනක්කාරං දළුක් කිරි එක්ක අඹරා තෙලට දමා කකාරා පලමු බේත් රද තිබු පාංකඩ තෙල් දමා අඹරා අව්වේ තියා තෙලං බස්සවාගෙන එම තෙලමට රසදිය තුන් කලඳක් තෙලං එක්ක අඹරා කබර ඇති තැන් ඉසොද නා සුද ඇති ඇති තැන් වල ගානු.
මීට පත්තියන් රොටී, පිට්ටු, තිත්ත රස, පිළිහුඩු, කිරි, දීකිරි, එනු ඇඹුල්, පැති රස, නොකනු. ඉවුසාලේ බත් කනු. සෙසු දේ නොකනු. සතියක් දිය වත් කරනු.

ඇඟේ රශ්නෙට ගිතියමට

74. කළු දුරු, තිප්පිලි, අසමොදගම්, සුදුළූනු, සුදුදුරු, කොත්තමල්ලි, පෙරුම්කායං, වදකහා, ඉඟුරු මෙකී බෙහෙත් කලඳ කලඳ ගෙන අඹරා එළකිරි එක්ක දෙනු. මිරිස්, හොදින්, බතුත්, දෙනු. උනු දිය බොනු. ඇඟ දය ගිතියම ගුණවේ.

කකුල් පැලුනාට

75-1 කොටි කා, අමු කහා, දෙහි ඇට, වරා කොල, කෂ පැන් ලෙලි ඉස්ම, අරළු කළුදුරු, මල බුලත්, මදුරු කොල, එලගොම, අඹරා පොට්ටනි බැඳ පතුල හොදට සෝද තවනු. විලිද, කකුල් පැලුනාද ගුණවේ.

75-2 නුග දළු, බදුල්ල දළු, මී ඉටි, අඹ ගහේ මැලියම, ශවින්ද එනු, වරාකිරි එක විවරට ගෙන අඹරා කන තෙලට දිය කොට මද ගින්නේන් කකාරා පමනට පෙරා ගෙන කල්ක ගා තවනු. කකුල් පැලුන් තැන ගානු. ගුණවේ.

76. අබ අඹරා පතුලේ ගා තිරිවානා ගලක් රත් කොට මද උණුසුමින් තවනු සත් අට දවශක් තවනු බේත් ගානු. විලිඹුරා ගුණ වේ.

77. වද මල්, බෝ කොළ, රත් මල් කැකුළු, ටිකක් ගා ඔලිද ඇට ටිකක් බැද තල තෙලෙන් අඹරා ගානු. බාලයින්ගේ රත් පිත ගුණ වේ.

78. ඊටම කවුඩු කැකිරි, මේ කොළ අඹරා තල තෙලින් ගානු.
මදටිය කොළ, පොතු, යුෂ ගෙන දෙඩන් ඇඹුලෙන් අඹරා මේ කකාරා ගානු.

79. ඊටම රත් තම්පලා කොළ යුෂ මැඩ ගන්දක පොඩි ලා කකාරා තිවා රෙද්දෙ මදිවි කර බේත් ගා රෙද්ද උඩින් එලනු.

රත් පිත් නිසාවෙන් වූ නිය බිරිත්තාවට

80. කැප්පෙටියා දළු, මී පැනි, නියහලා අල, අබිං මංචාඩි 3ක් විතර ගෙන මෙ කිවා අඹරා නිය පිරිත්තා කන වනයෙ ගානු. තිස් පැයට ගුණවේ.

81. කළුදුරු, සුදුදුරු, අසමොදගම්, කොත්තමල්ලි, වැල්මී, කයිප්පු, හිරියල් තිප්පිලි, වදකහ, මෙකී දේ අඹරා තබා රදලිය පොතු තබල පොතු, දිබුල් පොතු, මහල් කරද, එක්කොට කකාරා සරක්කු දමා කල්ක ලනු වැටෙන පදමට බාගෙන බන්දන පිලිකා ඔඩුවට තෙල් ගසනු. නොයෙක් ඔඩු වලට යහපති.

82. දෙම පොතු, ඉඟුරු, අරළු, වදකහ, සුදුළූනු මෙවා අඹරාගෙන එඬරු තලෙට

යොද දිය නැති පදමට සිද ගානු. ඔළිඳ කොල උඩින් දමනු. බාලයින්ගේ රතගෙඩි ගුණවේ. රත් පිත් තුවාල ගුණවේ.

පුසුල් පත්මෙට

83. පුසුල් කැබලි ඇට, පොතු, ඇර දමා වේලා පුසුල් සියක් පලමක් හා ගිතෙල් නැලියක් එක්කොට සැදි ගා කකාරා මී පැනි පාට තිබෙන වේලාවට සීනි සියක් පලමක්ද තිප්පිලි , සිද්ධිගුරු, සුදුදුරු, මේවා එකිනෙක දෙපලම බැගින් ගෙන එන්සාල්, කොල්ලන් කොළ, කුරුඳු පොතු, කොත්තමල්ලි, මිරිස් මේවා එකිනෙක සකලද බැගින් අඹරා දමා පදමට කකාරා ලිපෙන් බා ඇල් කොට ගන්නා ලද කල්ක එහිලා මී පැනි මනාවක් වත්කොට සැදි ගා තනා තිබා පමණ දැන අනුභව කරනු. මෙහි ගුණ කාස ස්වාස අරුචි රත් පිත් ගුණවෙයි.

84. උක් දඩු, මුද්දරප්ලම්, සැවැන්දන මුල්, විලඳ, නෙල්ලි, රසකිඳ, ඉරිවේරිය, වැල්මී, මීපුක්, මූකුනුවැන්න, මෙ හැම එක්කලං මංචාඩිය බැගින් දිය අට එකට කකාරා සීනි මී පැනි එක්ක දෙනු. පිත් දය, ඇඟ කරකැවිලි, ගුනවෙයි.

85. රසකිඳ පොතු, හැර කපා වනේ දමා කොටා ඉස්ම මිරිකා සැලක වත්කර පැදෙන්නට තබා අව්වේ තබා පැදුනු කළ පිටි ගෙන වියලා ඊට සැවැන්දන මුල්, කළුදුරු, සුදුදුරු, රත් නෙටුල්, කොට්ටං, නෙල්ලි, බිංතල් මුල්, එන්සාල්, මුද්දරප්පලම්, කොකුන්, නාමල් රේණු, නෙළුම් මල් රේනු, අල, අමු කපුරු, රත් හඳුන්, සුදු හඳුන්, මිරිස්, තිප්පිලි, වැල්මී, විලඳ, අමුකහ මුල්, හාතාවාරිය, නෙරෙංචි මුල්, වදුරු මෑ ඇට මෙකී බෙහෙත් සම භාග ගෙන චූර්ණ කර මෙම චූර්ණය එක පංගුවක රසකිඳ පිටි දෙභාගයක් ගිතී, මී පැනි, ගිතෙල් මෙ දෙයින් අනා බිලා පාදයක් වලදනු. මෙහි ගුණ සියළු ප්‍රමේහද දහ මුත්‍රා ඝාත, ක්‍රිච්ජා ශෝෂ, ශෝත රෝග, රත් පිත්, පාද දහ, මාලේ රෝග, ගුණවේ.

86. පුෂ්ප හඳුං, කිතුල් හකුරු, සුදු බූත්සරණ, දෙහි ගෙඩි මෙකී දේ මල බුලත් තටුවේ ලා ලෙඩාගේ ඉස ඉද්දර සවස ජේකර තබා පාන්දර බූත්සරන දළු තලා දෙහි ඇඹුලට මිරිකා හඳුන්, හකුරු යොද දෙනු. උදය දෙකක් දී එවේලෙම දිය වත් කරනු. එනු ඇඹුල් දෙදවසක් ඇරිනු. තුන් දවස නොදෙනු. රත් පිත් එතෙක් වේ. අත් දුටුවයි.

87. රත් නැඹිලි දිය ලෝද දෙනැලියකුත් මොනර කුඩුම්බිය ඉස සිවි නඩු බා
උප්පවනි එක නැලි මී කිරි එපමණ එළකිරි කුමරිය දෙම නා පසු බා
ගිතෙලුත් තලතෙල් දෙනැලිය ගතිමින් බද නෙක ඔසු ලා කල බා
තුන් දින නිශලව තබමින් තයිලෙය සරක්කු මකියන ගත් එසු බා

දේවදර සතකුප්පද සුදුරු කොට්ටන් වැල්මී ඉරමුසු සුවඳ හො වා
අරත්ත වගපුල් සඳුන් ද තිප්පිලි නාගර සදික්කා මල වා
හිඟුරු පියලි අල හපු මල් සස්සද වම්මුතු හෙල් බිජු වා
පච්ච කොලොන් දත් අගිල් කුරුඳු පොතු හරන් කශා කොල්ලන් කොළ වා

සුබා මෙ අවුසද ගන්නේ තුන් තුන් කලඳය එක නෙක නොවලක්කා මෙ සේ
යොද කල්ක සත් දින පාවන කොටලම්ගිති තුන් කලඳ මෙ සේ
විබාග කල්කය ලනු වැටෙනා කොට බුබුලු එය රන් පැයලෙ සේ
තබා ඒ තෙලෙහි අත සීලම පදමට නොබා දියට බා ගෙන සතො සේ

නස්න පානයද කන වක්කර ඉස බැන් දෙත් බත් සහ උදය තො සේ
සත් දින තිශලව දියවත්කර කල හොත් මින් ගුණ අශන් මෙ සේ
ඇස් ඇදිරිය ශෙ කැක්කුන් වෙවුළුන් කනේ රෝගදත් වලට ය සේ
දිය ගෙඩි මු කල හිස රද දිය වැඩි පීනශ රත් පිත් වායු නැ සේ

එනු ඇඹුල් වලකිනු. එළවළු වැජන වලදනු. දවශක් පසුකර සතියක් ඇල් දිය වත්කරනු. මින් ගුණ ඉසට එන කපාලද ඇඟට එන ලෙඩද. කර්න සූල අඩස්සිද ගතට පැමිණි ගිති දයද ලේ රුජාවද, දත් රුජාද, පිටි අල්ලේ ගිති විමද, ඔක්කාරයද ලේ වමනේද, අතීශාරේද, බඩ පිපුන්ද දෙපා හන්දි හිරි වැටුමද, කැවෙනවාද, වලහු නැතුවාද, ශෙමින් පිතෙන් එන ප්‍රමෙහ වාතද, දය, මුත්‍ර දයද, උෂ්ණයද, පිත් ඔල්මාද ද, පිපාශද, ස්වර අටද, මුල ව්‍යාදී, රත්පිත්, වෙවුළුන්ද, මෙකී සියළු ලෙඩ ගුණ වේ.

88. වම් මුතු, ඉරිවේරිය, නාමල් රේණු, අක්‍රා බින් කොහොඹ, බින්තල්, ඉඳි බඩ, සීනි, සැවැන්දන, මානෙල්, එන්ෂාල්, තිප්පිලි, දූරුදෙක, දේවදුරු, අශමොදගං, සුදුළුනු, කිඩාරං අල, කොට්ටං, කුඹුරු බිජු, දේවදර, වැල්මී, ඉඟිනි ඇට, වලහසාල්, ඔලිඳ මුල්, ඉඟුරු මෙ හැම දේ කලඳ කලඳ ගෙන කබලක ලා රත් කර චූර්ණ කර ශීල වැඩිකර තබා ශීනි, එලකිරි, උප්පැති, තැඹිලි වතුර මෙ සතර වගේ කශාය කර බිලාල පාදයක් කශායට දමා බොනු.

පුසුල් ෂුතේට

89. ත්‍රිකටුක, ත්‍රිපලා, ත්‍රිවගීග, දෙදුරු, සහිඳළුනු, මෙ හැම කලඳ කලඳ ගෙන මෙ හැම බරට කොත්තමල්ලි ගෙන පුහුල් කපා හිරමනෙන් ගා අවුවෙන් වේලා පිටි කොට හිනටි සාල් පිටි එපමණ ගෙන පලමු සරක්කු බරට මෙ දෙවගේ කිරා ශීනි මී පැනි ලා කකාරා සැන්දේ ඇලෙන පදමට බා තබාමෙ බේත් සතියක් දෙවේලේ තුන් තුන් කලඳ වලදනු. මිං ගුණ වෙන ලෙඩ රත්තයාමද, ඉශේ කරකැවිල්ලද, ඇඟ පත දයටද රුදු වලටද, අග්නිමාන්දයට, ප්‍රමෙහයට, වායයටද රත්පිත් මල්මාදයටද, මුලඅග්නියටද, පිත්ශෙලෙස්මාව කැපෙයි. පුෂුල් ශ්‍රිතයයි.

90. විලඳ, උක් සකුරු, ගිතෙල්, විලිකුන්, අලවකුකැන් හෝ සුවඳැල් මෙයින් ලද දෙයක් පොල් කිරෙන් වලදනු. කැශි මුස ගුණවෙයි.

91. පුහුල් කලන් ශියයයි, ශීනි පලම් ශියයයි, තිප්පිලි දෙපලමයි, එන්ෂාල්, කුරුඳු පොතු, කොල්ලන් කොළ, මේවා හකලඳ ශකලඳයි. කලාදුරු මනාවයි. පුහුල්

වේලා ගනු. මෙයින් පුහුල් සමහ චූර්ණ කර ගිතෙල්, මී පැනි, සීනි සමහ අනා තිබා වියල් බැඳ වැලි නොපාගා මශක් හෝ දෙමශක් තුන්මශක් හෝ වලදනු. කිලි කුනු අසු නොව ඉඳුල් නොකනු. මෙහි ගුණ නුවණ වැඩීමද මල වැඩිවීමද ධාතු වැඩීමද, කට හඬ වැඩීමද, රත් පිත් ගියල්ලද ගුණවෙයි

92. උප්පැනි, මී පැනි, කිතුල් පැණි, ඉඟුරු, කිතුල් බොඩ, මේ හැම පත පතයි. අරළු, සුදු එනු, වැල්මී, මේවා අඹරා දමා පස්පතට හිඳුවා උදය බොනු. රත් පිත් වායු ගුණ වේ.

93. උප්පැනි, මී පැනි, කිතුල් පැනි, ඉඟුරු, කීකිරිදිය, දෙසී, මෙ හැම පත පත බැගින් මිට මිරිශ්, තිප්පිලි, කලුදුරු, සුදුදුරු, සුදුඑනු, අශමොදගම් මෙකී සරක්කු අඹරා කශායට යොද කකාරා උදය බොනු. එනු අඹුල් නොකනු. පසුව දිය වත් කරනු. පිත් ශ්ලේෂ්මා රත් පිත් වායු ගුණවෙයි.

94. කළුදුරු, සුදුදුරු, සුදුඑනු, තිප්පිලි, කරාබු, වසාවාසි, සාදික්කා, අසමොදගම්, පෙරුංකායන්, අබ, මිරිස්, ජයපාල, දෙහි, දෙඩං, යකිනාරං, බෙලි, පාවට්ටා, මෙකී ඉෂ්ම පත පතයි. ඉඟුරු, අමු කහා, හරංකහා, වල්ඉඟුරු, සිරස්ස, මෙ හැම ඉෂ්ම පත පතයි, දෙහි ඇඹුල් දෙපතයි. මේ හැම කකාරා දෙනු. රත් පිත් දහ ගුණවේ.

පිතට

95. වැල් පෙනෙල මුල් යුෂ මිරිකා ශුධු හකුරු මුසුව දෙනු.

ඉදිමුන් රත් පිතට

ගොපාසානන් රත්කර ගොම මුත්‍රයෙන් සත් විටක් ශලා චූර්ණ කර තිකුලු, තිපල්, කරාබු, වසාවාසි, දෙදුරු, අසමොදගන් මෙකී බෙහෙත් මදක් බැද සිද්ධිගුරු එක්කර බිලාල පාදයක් මී දිකිරි ලා, කිතුල් හකුරෙන් වලදනු.

මල් රතයට

97. මල් අනෝද කොළ, යුෂ හා පොල් කිරි එක සරියට කකාරා කල්ක ලනු වැටෙන පදමට ආලේප කරනු.

කනේ අල්ලන රතයට

98. ගොන් කැකිරි කොළ, අවරිය කොළ, තුන් වගේ එක සරියට ගෙන යුෂ මැඩ තලතෙල් පතක් වක්කර ලිප තිබා මිට ඉඟුරු, අබ, පල්මාතික්කං, සමව අඹරා තෙලට දමා කකාරා සීඳ පෙරා තබා ආලේප කරනු.

ගල් රතේට.

99. අලේ තලා, කහ, ලුනු ලා උන අළුවෙන් උයා දවටනු. ගල් රත ගුණ වෙයි.

බාලයන්ගේ ස්වරයට

1. විලඳ, අසමොද, චූර්ණ කොට මී හා ලේහ කරනු.

2. වං ඇපල යුෂ මී පැතියෙන් පොවනු.

3. ඉවද මී පැතියෙන් ලේහ කරනු.

4. නෙල්ලි ඉස්ම තනකිරි හා පොවනු.

5. සකුරු, මී පැති, තල තෙලිං දෙනු.

6. තිප්පිලි චූර්ණ ගිතෙල් වලින් අනා කවනු.

බාලයන්ගේ අක්ෂි රෝගයට

1. වෙනිවැල්, සිවංගුරු, වමමුතු, මී පැතියෙන් අඹරා ඇසපිට ගානු.

බාලයන්ගේ මුඛ රෝගයට

1. වෙනිවැල්, වැල්මී, අරළු, ද සමංකොල මේ අඹරා අනා මුඛයේ ගානු.

2. අරළු, කෝමාරිකා, ලා පුවක්, මෙ හැම ගලගා එක්කොට දිවද මුඛයෙහිද ගා උලනු.

3.බාලයන්ගේ ග්‍රහදෝස

1. පිදු මල්, ලාකඩ, කොසඹ කොල, එනු පොතු, අබ, නයිශැව, උන ලැලි, ඉසකෙස්, මේ හැම පන්දමින් හෝ චූර්ණ යෙන් හෝ දුමපානු. කුමාරයන්ගේ සියළු ග්‍රහ විකාර හැරේ.

2. රුක්අත්තන පොතු, මුරුවා, කුළුරැන, මේ එක්කොට අඹරා ඇඟ උලනු. සියළු බාලග්‍රහ විකාර ගුනවේ.

3. හෙල එහුනු, සවින්ධව, තල, අඹරා, මීයෙන් අනා නලල ගානු.

4. සඳුං, කොට්ටං, සිද්ධිගුරු මේ හැම තන කිරෙන් අඹරා නලල ගානු.

5. සීනි, කොකුං, ගිතෙල් මේ හැම සමව සටා ගන්වා නශ්‍ය කරනු.

බාලයන්ගේ ඉසරුජාවට

1 සඳුං, මානෙල් අල, කොට්ටං, තිප්පිලි, ඉරිවේරිය මේ හැම අඹරා නලල ඉස ආලේප කරනු.

බාලයන්ගේ හිසරද හා හිසේ රෝග.

1. කොට්ටම්, සිද්ධිගුරු, වද කහා, දේවදරු, ශතකුප්ප, පෙරුම්කායන්, සයින්ධව එනු මෙකී දේ සමසේ ගෙන අඹරා එළු මුත්‍රයෙන් තල තෙල් සමසේ ගෙන කලතා පදමට තෙල් සිඳ ගානු. හිසරද ඇරේ.

2. රත්මල් අඹරා වේලා චූර්ණ කොට දිය සිඳුනු පොල් ගෙඩියක පුරා කිකිරිදිය ඉස්ම වත්කොට පෙදගසා ලිප තිබා මඩා වලසාරා තිස තිබු ඉක්බිති ගෙන ගසායන දියේ සිට ඉස සෝදනු. ඉස කෙස් දික්වේ. සිටි දියේ සිට ඉස සෝදනු. ඉස කෙස් මුදුවේ.

3. දුටු සතුටු කල්කය, කටුකරෝහිති කල්කය, අඹරා දුටු සතුටු පත් ස්වරසයෙහි ගිතෙල් සමහ කකාරා පුළුනෙහි රඳ හිසෙහි අලවනු. බාලයන්ගේ හිස රුජා නසාලන්නේය.

4. සිද්ධිගුරු, කොට්ටම්, සුදු හඳුන් ගලගා නලලේ ආලේප කරනු. ඉසරදේටයි.

5. වියන් දුඹුලු, සියන් දුඹුළු, එල බටු කර, හීරැස්ස මද එක්කොට උදු ගොවුවන් කෑ තැන පාද ගල්වනු. ගුනවේ.

6. තල තෙල් විසි කලඳක් එව්වරට එලකිරිත් එක්කොට කකාරා පෙරා එමතෙලට දම්, යසුනු එක්කොට ඉශ ගානු. ඉසකේ මෘදුව තිල්ව දික්වේ. මුරෙන් මුරේට ඉස සෝදනු.

7. කුඹුරු මුල් ගොමුත්‍රයෙන් අඹරා ඉස ගානු. ඉස් හොරි ගුනවේ. නොසංසිඳේ නම් ඉස රෝගයට පූඩාවන් ලවා ලේ හරිනු. ගුනවේ.

බාලයන්ගෙ උණ

1. නිඹ මුල් කසාය කකාරා මී පැනි වත්කොට පොවනු.

2. ඉරිවේරිය, ඉඟුරු, සුදුළූනු, වද, සුවද හොට, වම්මුතු කසාය.

3. රත්සඳුං, වද කහ, බැමිතිරිය, අරළු, වගපුල් මෙවා සුනුකර ගිතෙල් හා මී පැනියෙන් යොදු ලේහ හෝ රන්වන් බැමිතිරිය යුසින් හෝ ලේහ කරනු.

4. පැපිලිය, සඳුන් මෙ හැම සමසේ ගෙන දෙළොස් කලඳට කිරා පත අට එකට සිඳුවා ළමයාට කිරි මවුන්ට පොවනු. ගුනවෙයි. උන ශිටී.

5. තිදි කුමහ මිටක් පමන හීන් කර ලියා තලා දමා දිය නැලිය පතට සිඳුවා තේ කෝප්ප බාගයක් පමණ කෂාය ගෙන එපමන තන කිරි මී පැනි මංචාඩි පහක් දමා කලතා පස්වරුවක් පමන දෙනු. බාලයින්ගේ ඉක්කා ස්වාස උන වමන ශෙලෙස්මා ගුනවෙ.

බාලයින්ගේ ග්‍රහනි අතීසාරයට

1. කලාඳුරු අල, සිද්ධිගුරු, මගුල් කරඳ මුල්, මෙයින් කකාල කසාය දෙනු. ග්‍රහනි අතීසාර අජිර්ණ ගුනවේ.

2. දියමිත්ත, කරඳ, සිරිල, 'පංචකෝල, පිල මුල්, කරපිංච යන මෙයින් කකාල කසා යෙහි තිප්පිලි පොඩිලා දෙනු. ගුල්ම, මන්දග්නි ග්‍රහනි මෙ හැම ගුනවේ.

3. සිද්ධිගුරු, තිප්පිලි මුල්, රත්නෙටුල්, දේවදුරු, අරළු, තිප්පිලි යන මෙයින් කකාල කසා යෙහි පෙරුන්කායන් සෛන්ධව ලුණු ලා දෙනු. ග්‍රහනි මාන්දන් නසා.

4. මගුල් කරඳ, බෙලි, සිද්ධිගුරු, රත්නෙටුල්, යන මෙයින් කකාල කසාය දෙනු. ග්‍රහනි ගුල්ම ප්ලීහ මෙ හැම නසා ගුනවේ.

5. දේවදුරු, සුදුළූනු, තිප්පිලි, ඉඟුරු, අසමෝදගන්, මෙ චූර්ණය උකු දියෙන් දෙනු. සියළු ග්‍රහනි ගුනවේ.

6. වලහ සාල්, පෙරුන්කායන්, අතිවිඩයන්, ත්‍රිවගී, තිප්පිලි, සුදුදුරු, සුදුළූනු, තිපල්, මිරිස්, සිද්ධිගුරු, අසමෝදගන්, දූත්ත, තිරස්තවාළු, බට කිරිල්ල දළු, ඇහැල දළු, මෙකී චූර්ණය මී පැතියෙන් දෙනු. පනුවන් වැටී අණ්ට ග්‍රහනි ගුනවේ.

7. සිද්ධිගුරු, අසමෝදගන්, කෙලින්ද ඇට, ඉවද, වම්මුතු, දියමිත්ත, සුළු බැබිල, වේලි කසා, සෛන්දව ලුනු, මයිල මල්, අළු කෙසෙල් අල, කිඳි, වැල්මී, දෙළු ලෙලි, වඳුරු මෑ ඇට, අඹ ඇට, සුදුදුරු, මග පුල්, අංජන කැට, පුස්කර, සාදික්කා, කරාබු, අබින්, කරඳ මුල්, දිවුල් මද, කොල්ලන් කොල, සිවිය, සාතාවාරිය මුල් මෙකී බෙහෙත් සමභාග චූර්ණ කර සීනි මී පැතියෙන් දෙනු. සියළු ග්‍රහනි අතිසාර ආමරුජා ගුනවේ.

ග්‍රහනි මාන්දම ගුලියට

1. දුරු දෙක, අසමෝදගං, තිප්පිලි, කරාබු, වසාවාසි, සාදික්කා, අබින්, දිවුල්ලාටු, බිම් දුම්මල, වරකා පොතු, අට්ටික්කා පොතු, දිය කිරිල්ල පොතු, මයිල පොතු මෙ හැම සමව ගෙන අබිං වැඩිව ගෙන ජිවුල් ගෙඩියට අඩස්සි කර උන අළුවෙන් තම්ඹා දිවුල්මද ටිකක් එක්ක අඹරා තිබ්බටු පමණ ගුලිකර තබා ලේ සීදමට අතිසාරයට බඩින් යනවාට ළමයින්ගේ බඩින් යනවාට තන කිරෙන්ද මෝරුවෙන්ද කශපැන් දියෙන්ද අට්ටික්කා යුෂින්ද දෙනු අත්දුටුවයි.

ඊටම
කෙලවලු බඩ මාලු බෙහෙත

2. උලු හාල්, දෙවිදුරු, කුරුඳු පොතු, රතුලුනු, අමු ඉඟුරු, අබ, කොත්තමල්ලි, වලහ සාල්, දෙදුරු, අසමෝදගං, වියලි කහ, ත්‍රිවර්ග, කරපිංච කොල, සුදුලුනු සමව ගෙන ඒ හැම බරට සහිඳ ලුණු ගෙන එම ලුනු බරට පරණ ගොරක ගෙන සරක්කු පමණක් කබලේ බැද අඹරා කෙලවලු බඩ මාලු හීන් කර ලියා ඇඹරූ බෙත් සමග අනා කරපිංච කොල ඉස්ම නැලියක් වක්කර කායං පදමට උයා උදය සවස බුළු ගෙඩියක් පමණ වලදනු. බත් සමහ කන්ට දෙනු. මාන්දම නසා.
උදය තල තෙල් අල්ලා හවස නාවනු. දවසට වතුර කලගෙඩි 5 බැගින් වැඩි කර නාවන්න.

3. ඊටම

නිකා, වරා, දෙසි, නාරන්, ඔලිඳ, මහගොන් කැකිරි මෙකීවා මුල් පොතු අහුර බැගින් ගෙන කොටා නැලියක ලා වතුර හතරක් වක්කර කකාරා නැලියට හෙලා පෙරාගෙන මීට තල තෙල්, එඬරු තෙල්, තන කිරි පත බැගින් ගෙන එකී වත්කර වලල්ලක් සිදෙන තුරු උණු කර තබා පසුවද ලිප තබා මීට කල්ක, තිප්පිලි, මුදු පෙන, පෙරුන්කායන්, ක්‍රිමි ශස්ත්‍රු, කුඹුරු ඇට මද, සුදු හඳුං මෙකී දේ අඹරා තෙලට යොදා කැකෑරෙන වෙලාවට කිකිරිදිය සහ මූලයෙන් කොටා යුෂ පතක් වක්කර වලල්ලත් කැකෑරුණාම බා තබා පසුවද කකාරා පදමට බා පෙරා තබා සියලු ග්‍රහණි මාන්දමට ඇහ ඉස ගානු. පානය කරනු.

4. ඊටම

දෙදුරු, අරළු, තිප්පිලි කලං 2 බැගින් ගෙන කුඩු කර සීනි, ගිතෙල්, මී පැති, විලඳ කුඩු පත බැගින් ගෙන එල කිරි මනාවක් වක්කර ලිප තබා හැන්දෙ ඇලෙන පදමට බා තබා වේලකට බුලු ගෙඩියක් පමණ දෙවේලට දෙන්න.

5. ඊටම

වලහ සාල්, පෙරුන්කායන්, සාදික්කා, කරාබු, වසාවාසි, තිප්පිලි, නෙල්ලි, සුදුලූණු, සුදුදුරු, අරලු, මිරිස්, සිද්ධිගුරු, අසමෝදගන්, දැත්ත, ත්‍රස්තවාලු, බට කිරිල්ල මෙකී දේ සමව අඹරා චූරණ කර බිලාල පාදයක් මීයෙන් දෙනු. උනු දිය පානය කරනු.

6. ඊටම

සිද්ධිගුරු, මිරිස්, වග පුල්, කලං 6 ක් ගෙන පොඩි කොට මී පැතියෙන් කවා විරේක කරන්න.

7. ඊටම

ඉඟුරු, මිරිස්, තිප්පිලි, අසමෝදගන්, වද කහ, සුදුදුරු, සුදුලූනු, සීනක්කාරං, අරලු, කලාදුරු අල, කරාබු, සාදික්කා, කිරි ඉබි කබල්, වේලිච්ච කොහොඹ, මේවා සමව කොටා බැද දිය එකක් පමණක් වක්කර පමණට උනු කර තුන් වරුවක් දෙනු.

8. ඊටම

ජයපාල ඇට හතරක්, එඬරු ඇට අටක්, සුදුළූනු බික් අට සතරක්, මීරිසට අටක්, තිබ්බටු ගෙඩි හා ඉඟුරු සහ මේ හැම සකුරු අඹරා ඇල්පැනින් තිබ්බටු සා ගුලිකර සකුරු, දෙඩං ඇඹුල්, ඇල්දියෙන් දෙනු. ග්‍රහනි මාන්දං නසා.

9. ඊටම

දෙදුරු, අශමෝදගම, තිප්පිලි, තිවර්ග, අරළු, පෙරුන්කායන්, ඉවද, මකෝඹිලා, සිවංගුරු, කොතඹුරු උළුවා, වලහ සාල්, කොට්ටන්, අරිට්ට, ශෙවුවෙල්ලි, දේවදර, සුදුළූනු, සන්තිනායන් මෙකී දේ එක පමණ කිරා අඹරා තබා දෙහි, දෙඩන් නාරන්, කුඩු මිරිස්, බෙලි, පඹුරු, කැප්පිටියා, කුඹුරු, තීක, යකිනාරන්, වරා මුඩ මහන, එල තිටොල්, වන් ඇපල, කරඳ, සුවඳහොට, වැටකේ අරළු, වම්බුටු මෙකී මුල් පොතු පෙරන්ගා ශමව ගෙන සැලියක ලා දිය අටක් වක්කොට කබ මැටි බැඳ මා වී යට තුන් දවසක් තිබා පෙරා ඊට පේ කරනු.

10. ඊටම

වන් ඇපල මුල්, රසකිඳ, කටුවැල් බටු මුල්, කලං දෙක දෙක බැගින් කිරා අට පත එකට සිඳුවා ගිතෙල් මිශ්‍රව දෙනු. ග්‍රහනි මාන්දම ඇරෙයි.

11. තල තෙල්. එඬරුතෙල්. ගිතෙල්. මී තෙල්. කොසඹ තෙල්. එක්කොට රත්වත් පාට බුබුළු එනවිට දියට බා තබා සියළු ග්‍රහනියට මාන්දමට පාඩු රෝගයට උදය තෙල් අල්ලා සවස මිමුරුවට කෝන් කොල කොටා ඉස ගල්වා උනු දිය වක්කරනු. මෙ තෙලට ජාපාල තුස්තවාළු දමා දෙකට බෙදු සිඳ මදට සල්ලියක් පදම දෙනු. මෙ රහට සතියක් කරනු. සියළු මාන්දන් ග්‍රහනියටයි.

මාන්දම ගුලී

කිරි මාන්දමට උනු දියෙන් හකුරු ඇල් දිය සමව දෙන්න. උඳු මාන්දමට දෙහි ඇඹුල් උලුවා අඹරා උණු දියෙන් දෙන්න. ගල් මාන්දමට හකුරු සමව ඇල්දිය හකුරු දෙඩම ඇඹුල් උනු දිය සීතල සන්ති ඉඟුරු යුෂින්. ශෙලෙස්මා සන්ති මී පැනි සීනියෙන්. පනු සන්තියට සියඹලා ඇඹුලින්. අජිර්ණ සන්ති මිරිස් පොඩි උනු දියෙන්. උන සන්ති මාන්දමට කසපැන් දිය ලැමද අඩස්සි වෙලාකොල, කෝල් සන්ති මාන්දමට කුප්පමෙතියා යුසින් දෙන්න.

1. මාන්දම ගුලිය i

රසදිය. ගන්ධක. හිරියල්. පුස්කර. සස්සඳ ඇට. අත්තන ඇට. වරා ඇට. කලුදුරු, සුදුදුරු, අසමෝදගන්. තිප්පිලි. අරළු. තිපල්. තිකුළු. සමව ගෙන එම බෙහෙත් බරට සුද්ධ ජයපාල ගෙන ඇල් දියෙන් දෙඩම ඇඹුලින් අඹරා ඔලිඳ ඇට පමණ ගුලිකර සෙවන වියලා තබා ලොකු කුඩා සැමට බලා දෙනු.

2. මාන්දම ගුලිය ii

පෝරු මාන්දම. කලිමාන්දම. වල්ලි මාන්දමට. කලුදුරු, සුදුදුරු, අසමෝදගම්, තිප්පිලි. සුදුලුණු, සිද්ධිගුරු, අඹරා උණු දියෙන් දෙනු.

3. මාන්දම ගුලිය iii

තඹ මාන්දම. අහර මාන්දමට. තිකුළු. තිපල්. අරත්ත. එන්සාල්. වග පුල්. තිප්පිලි. සියඹලා ඇඹුලින් අඹරා ගුලිකොට දෙහි ඇඹුලින් දෙනු.

4. මාන්දම ගුලිය iV

කෝල මාදම. සන්ති මාන්දම. උඳු මාන්දම. කලුදුරු, සුදුදුරු, සුදුලූනු, අරලු පොතු. වදකහ. සිද්ධිගුරු, පල්මාතික්කන් සමව කිරාගෙන යුෂින් අඹරා ගුලිකොට තලතෙල් හෝ ඉඟුරු යුසින් දෙනු.

5. මාන්දම ගුලී V

වෙලා කොල, මුරුංගා පොතු, සස්සඳ, නුග කොල, ලුණුවරණ පොතු, අරලු බුලු. නෙල්ලි. අබ කොල. බිත් කොහොඹ. කොහොඹ පොතු. ගම්මිරිස්. අබ,

සියල්ල එක්කොට දිය අට තුනට කකාරා දෙන්න.

6. මාන්දම ගුලි vi

සාදික්කා, කරාබු නැටි, තිප්පිලි, කලුදුරු, සුදුදුරු, අසමෝදගන්, සිද්ධිගුරු, ගම්මිරිස්, සමභාග ගෙන උණු දියෙන් අඹරා ගුලිකොට ලුනු අඹරා ගුලිය තවරා කබලෙන් රත් කොට උනු දියෙන් දෙනු.

1. මාන්දම් තෙල්, අන්ධ මාන්දම, කිරි මාන්දම, සන්නි .

විසදුලිය කොල, කලාදුරු අල, සියඹලා ඇට මද, උදුපියලි කොල, තික කොල, කුඹුරු කොල, වල් කපුරු කොල, කොටා මිරිකා, කලුදුරු, සුදුදුරු, අසමෝදගං, තිප්පිලි, සතකුප්ප පොල්, කිරට වල් බෙත් වක්කර කකාරා පදමට කඩ සරක්කු පොඩි කර දමා කකාරා බානු. දිව ගානු. සන්ධි ගානු. බොනු.

2. හැම මාන්දමට

කයිප්පු, ඉඟුරු, තිප්පිලි, පස් අවුරුදු ලුණු, කුඹුක් ඇට මද, බුලත් පලා, මිරිස් කොල, වේලා ගත් අතිකුත් දේ බැද චූර්ණ කොට උණු දියෙන් දෙන්න.

3. කිකිරිදිය කොල, කිරිවැල් කොල, දුම්මැල්ල කොල, කෝමාරිකා, තිපල්, සමභාග ගෙන දියවර පහක් දමා කකාරා දෙන්න.

4. මාන්දම් කටින් බඩින් යනවාට

අඹ ඇට උරවච් කර තල කොල පුලුස්සා දෙහි ඇඹුලින් යොදා බඩින් යනවාට ඉහළට ගානු. වමනේට පහලට ගානු.

5. කිරි වමන මාන්දමට

ගවුරිපාසානම් උරවච්කර තල කොල පුළුස්සා මී පැනියෙන් වත් දෙහි ඇඹුලින්වත් පොවනු.

6. අඩ මාන්දමට

කුඹුරු දළු, පිටවක්කා කොල, කලු දුරු, සුදුදුරු, සුදුලුණු, අසමෝදගං, උනු දියෙන් අඹරා දෙනු.

7. මාන්දම් තෙල

සාරණ මුල්, වැල් තිබ්බටු මුල්, එල බටු මුල්, වත් ඇපල මුල්, එලබටු මුල්, මෙකී මුල් යුෂ ගෙන තල තෙල් කොහොඹ තෙල් එලඟි තෙල් සරියට ගෙන සන්තිනායම්, අසමෝදගම්, තිප්පිලි, කොත්තමල්ලි, පෙරුංකායන්, කලඳ බැගින් ගෙන තෙල් සිඳෙන පදමට සරක්කු දමා තෙල් දිය ගැසුණු පදමට බානු.

8. සියඹලා ඇට බැද පිට පොතු ගෙන කුප්පමේතියා කොල, දද කිරිය වැල්, සුදු පිටවක්කා මෙකී දේ පොල් ගෙඩියක් කුඩු එක්ක කොටා තුතී තැටියක අව්වේ තබා තෙල් පාට වූ කල මිරිකා පොවනු.

9. කිරිමාන්දන්

දෙහි, දෙඩන්, පාවට්ටා, කලු අත්තන, කුප්පමේතියා මදුරු, අනෝද, රත්නෙටුල්, සුවඳ හොට, මෙකී මුල් අරලු කොත්තමල්ලි, නෙල්ලි, අසමෝදගන්, තිප්පිලි, සුදුලූණු මෙකී දේ අඹරා තල තෙල් පොල් තෙලට දමා ඇඹරූ බෙහෙත් දමා කකාරා පාන් ඇවිලෙන පදමට බා තබා සන්ති මාන්දමට පොවනු. ඇඟ ගානු.

10. පනු මාන්දමට

ගුලියඃ රසදිය, ගෙන්දගම්, සුදුලූණු, හිරියල්, පුස්කර, සුදුදුරු, අසමෝදගන්, තිප්පිලි, ඉඟුරු, මිරිස්, සරක්කු එක බරයි, සුද්ධ ජයපාල තුන් කුරුවයි දමා ඇල්දියෙන් අඹරා මිරිසැට පමණ ගුලි පවන වියලා ගන්න.

2. සකුරු, ඇල්දිය, දෙඩම් ඇඹුල්, මී පැනි, දෙහි ඇඹුල්, මුරුංගා පොතු යුෂ, ඉඟුරු යුෂ හොඳ කොහොඹ කුරු දහයයි හොඳ අරළු දෙකලඳයි හිරඃස්ස, දළු වරා දළුයුශයෙං එ දෙවගෙ අඹරා එඩරු තෙල් පතකට යොදු ලිප තබා තුං ඉඩක් උඩ ඇවිත් ගළුනාම බානු. පොවනු. ඇග ඉශ ගානු. මිට මාන්දං පනු දෙස් විකාර ඉශරදෙ දෙඩ්විලි ඇහ ගිහියං ඔක්කාර මෙ ලෙඩ ගුනවෙයි.

11. ශෙලෙස්මා මාන්දමට

දුරු දෙකයි, අශමෝදගන්, තිප්පිලි, ඉඟුරු, සුදුළුනු, පල්මාතික්කම, කරල් සැබෝ මුල්, එම දළු, කුප්පමේතියා දළු, හැම මෙකීවා තික කොල යුෂයෙං අඹරා උනු දියෙන් දෙනු. ශෙලෙස්මා මාන්දං ලෙඩ ශන්ති මාන්දං ලෙඩද මාන්දන් කැස්සට යහපති.

12. සියලු මාන්දමට

වැල්මී, වද කහ, ඉඟුරු, මීරිස්, සුදුළූනු, අරළු, බුළු, නෙල්ලි, මේවා ශමවගෙන සැබෝ මුල් කටු රොඩු මුල් දෙවගෙ යූෂ දෙකයි. ජාපාල ළමයාගේ පමන බලාගෙන යොද ගත යුතුය. පෙරකි සරක්කු එකට අඹරා ඒ යූෂය දීය කොට කකාරා කායම පදමට උකු වෙලාවට එවෙලේටවත් කන දෙඩන් ඇඹුලෙන් පොවනු. තිප්ප මාන්දමට ජාපාල නැතුව දෙනු.

13. පතුක් මුල්, කුඩු මිරිස්ස මුල්, කැප්පිටියා මුල්, මෙකීවා එක පමණ ගෙන කොටා මිරිකා පැහිච්ජ පොල් ලැබුනු පමනක් ගෙන මිරිකා එකට යොද ලිප තබා දළුක්කිරි පමනකට ගෙන මීට කල්කයට ඉඟුරු මිරිස්, සුදුළූනු, වද කහ, අරළු, බුළු, නෙල්ලි, ජාපාල, සුදුදුරු, කලුදුරු, අශමෝදගන්, තිප්පිලි, පෙරුංකායන් සහිද එනු, මෙකී දේ චූර්ණ කොට ඊට එඩරු තෙල් වක්කර පදමට කකාරා පොවනු. ඇහ ඉශ ගානු. මීට ගිරහන මාන්දම, පනු දෝශ, සන්නිපාත උන ගුනවෙයි.

14. දෙහි මදුරු, මුරුංගා මෙකී දළු, ජාපාල කැබැල්ලයි, මිරිස්, බිත්තරයයි අඹරා ඇග ගානු. මාන්දං ඇවිශ්ශි අඩනවාද ඇස් උඩඉන්දවා අඩාද ඊට යහපති.

15. තුඹ, මුගුනුවැන්න, මෙකී කොල යූෂ ගෙන කළු දුරු, සුදුදුරු, අශමෝදගන්, තිප්පිලි, ළූනු, ශාදික්කා ඉඟුරු, මිරිස්, අබ, වද කහ, සමව ගෙන තල තෙල් පොල් තෙල් එක විවරට ගෙන ශම කුට්ටු කර කකාරා ඉටි පදමට බානු. උස්මෘතාවට, උන ගන්නාවට ඇගේ ඉශේ ගානු. එපමණක් පොවනු.

16. මාන්දමට

කුඹුරු ඇට මද, කුඹුරුදළු, ගොන් කැකිරි මුල්, සහිද එනු මෙකීවා සමව ගෙන අඹ පොතු, දඹ පොතු කොල අඹරා තල තෙලිං පොවනු. මාන්දමට සහපති.

17. අඹ පොතු කොල, කුඩු මිරිස් මුල් කොල, දෙඩං මුල් කොල, තිපල්, ඉඟුරු, මිරිස්, අබ, එනු. මෙකී දේ එක්කර කබලට දමා ගිනි කර කබලු පාටට දුං ගියාම දිය වක්කර එදිය බොන්නට දෙනු. බඩිං යනවාට, උස්මුරුත්තාවට, උනට, වමනේට, මෙය ගුනවෙයි.

18. බුලත් තික, කුඹුරු බඩගා මෙකීවා දළු, දෙදුරු, උළුවා, කොත්තමල්ලි, අරළු, වද කහ, සුදුළුනු, මෙකීවා අඹරා පොවනු. මාන්දන් සිටියි.

19. බඩ පිපෙනවාට ,

තික කොල ඉස්ම, ඉඟුරු ඉස්ම, කළු දුරු, තිප්පිලි, වැල්මී, කොහොඹ කොලිං අඹරා කොහොඹ තෙලින් දෙනු. මාන්දමට. ගුනවේ.

20. කිකිරිඳිය මුල් මිටයි, වරා මුල් මිටයි, කුප්පමෙතියා කොල මිටයි, තල තෙල් කොහොඹ තෙල් ගෙන දෙකට බෙද ජයපාල ඇට පහක් දමා ජයපාල ඇතිතෙල උදය දෙනු. ජයපාල නැති තෙල් සවස දෙනු. මාන්දන් තෙලය.

21. සිංඑඬරු, දළුක් දෙදුරු, අසමෝදගන්, තිප්පිලි, ශාදික්කා, උළුවා, අරළු, බුළු, නෙල්ලි, වදකහ, ඉඟුරු, මිරිස්, ජාපාල, කබලෙන් බැද සරක්කු එක ශරියට ගෙන අඹරා උනු දියෙන් දෙනු.

22. කළු දුරු, සුදුදුරු, වද කහ, අශමෝදගන්, කුඩු මිරිස දළු, යකා බැදි වැලේ දළු, විෂ්නුක්‍රාන්ති, කිරි කොල, වෙලා කොල, මෙකීවා කොටා යුෂ ගෙන තල තෙලට. දමා තැටියේ වක්කර අව්වේ තියා තෙල කහ පාට පදමට බානු. මාන්දමටයි.

23. සහිඳ එනු කලදයි, ජාපාල, සුදුළුනු, සම හාග ගෙන දළුක් කිරි පතයි මෙ සතර වගෙ ගෙන පොල් කිරට දමා ලිප තබා තෙල් පදමට සිද තබා මාන්දමට පනු දෑහලුමට බඩ රුජාවට යහපති.

24. කිරි මාන්දමට

කළු දුරු, සුදුදුරු, තිප්පිලි, අශමෝදගන්, සුදුළූනු, සිද්ධිගුරු, අරළු, මිරිස්, වද කහ මෙ හැම සම බාග ගෙන විශ හැරි ජයපාල තුංබරින් සිවංගුරු, ඕලු ඇට, මදුරු ඇට, කුප්පමෙතියා මුල්, දද කිරි මුල් මෙකීවා ගෙන කුප්පමෙතියා කොල ඉස්මෙන් අඹරා ඔලින්ද ඇට පමන ගුලිකොට ගෙන වියලා මිංගුලියක් කිරි මාන්දමට තන කිරෙන්ද, ඊටම ලොකු අයට කුප්පමෙතියා යුෂයෙන්ද, පනු මාන්දමට දෙඩම් ඇඹුලෙන්ද, ශන්තිවායමට ඉඟුරු මිරිස් පොඩිකොට උනු පැතින්ද, උන මාන්දමට දෙහි ඇඹුලෙන්ද, අටක් මාන්දමට ගුනයි.

25. ඉරමුසු, වරා, ඉඟුරු, කොහොඹ, දෙඩන් පතා, මුරුංගා, රත්හිටුල්, එලනිතුල්, පාවට්ටා, කුප්පමෙතියා මෙකී මුල් පොතු අහුර අහුර ගෙන හරං කහ, කලාදුරු අල, මෙකීවා කොටා යුෂ ගෙන ඊට තල කොසඹ, එඬරු, අබ, එලහි තෙල්, මී තෙල් ඊට වක්කර ඊට ත්‍රිපල්, ඉඟුරු, මිරිශ්, එනුද, කහ, කොල්ලං, කහ පළු, දෙදුරු, වැල්මී, කොට්ටං, ශවින්දව, පල්මාතික්කන් මෙකීවා ඊට දමා කකාරා ඉටි පදමට බානු. තශ්නයටද පානයටද ඉශ ගානු. කුඹුරු මුල්, එම ඇට, එඬරු මුල්, කරඳ මුල්, හිග්ගහේ පොතු, මිරිස් මුල්, කරවිල මුල්, මළ බුලත් නැටි, කුඩු මිරිස මුල්, පාත්පාඩගං කලඳ බැගින් ගෙන පොඩි කොට මිරිස්, සිද්ධිගුරු,

වග පුල්, දෙවදුරු, අශමෝදගං, ගජ තිප්පිලි, සස්සඳ, සත කුප්ප මේවා කලං බාගිං ගෙන නැලියකට දමා කශාය කකාරා මී තෙල් එඬරු තෙල් පොල් තෙල් තුං තුං මනාව ගෙන කශායට වක්කර ලිප තබා නෙළුම් මලක් පමන ගිතිකර කකාරා තෙල් ලනු වැටෙන පදමට බා පෙරාගෙන තබා වාදං කොරවද අතුල් පතුල් විහිදි දය දස වායුවටද ගානු. මෙතෙල් ගාන විට මෝරා කරවල මිරිෂ් අනා බත් දෙනු. අට දවශකට ඉඩක් තෙල් ගා ඉශ සෝදනු. පිලිහුඹු නොකනු.

26. අබ, කොසඹ කුරු, ජාති හඳුං, හිඟුරු පියලි, සමදරා මුල්, ගෙන තෙලට දමනු. පෙර කී බෙහෙත් එකපමණ ගෙන ඇල්දියෙන් අඹරා එළඟිතෙල්, කොහොඹ තෙල් සමව සමදරා කොල, කුඹුරු කොල, වේලා මුල් මේවා සමව යුෂ ගෙන මුලින් කී ශරක්කු තෙලට යොදු ශමපාකයට බා පෙරා පොවනු: මාන්දමටයි.

28. දෙදුරු, අශමෝදගන්, තිප්පිලි, කරාබු, කිරිමිශකුරු, අරළු, බුළු, නෙල්ලි, ඉඟුරු, මිරිස්, අබ, ජයපාල මේවා අඹරා එහි ලා තුං දවසක් මද ගින්නෙන් කකාරා බලා පදමට බා පෙරා කලඳක් පමණ පොවනු. මීට ගුණ දහ අට මාන්දං ළමයින්ගේ සියළු බඩ ලෙඩ නසයි.

29. දෙදුරු, අශමෝදගං, සුදුළූනු, තිප්පිලි, ශාදික්කා, පල්මානික්කන්, සීනි, කකාරා මේවා සමව ගෙන ඉඟුරු දශවගයක් ගෙන තිප්පිලි, කරාබු, පෙරුංකායන්, වශාවාසි, සුදුළූනු, වදකහ, වැල්මී. මිරිශ්, අරළු, බුළු, නෙල්ලි මේවා අඹරා තෙලට දමා කකාරා පදමට බාගෙන දෙකට බෙදු ජයපාල ඇට දහයක් දමා කකාරා එතෙල් පොවනු. ගශා ගිය, තල තෙල් පොවනු. පත්තියමටයි. සියළු මාන්දමට උස් මුරුත්තාවට යක්‍ෂ බැල්මට ශන්තියට යහපති.

30. කරාබු, වශාවාසි, සාදික්කා, අති උඩයන්, සුදුදුරු, කළු දුරු, තිප්පිලි, අශමෝදගන්, දිවුල්ලාටු, දුම්මල, අබිං මෙකී දෙ ශමව ගෙන ලොළු පොතු යුෂයෙන් අඹරා මදට පමන ගුලි කොට බඩිං යනවාට කිලං මෝරුවෙන් උනු දියෙන් ද දෙනු. මල මාන්දන් ගුනවේ.

31. පෝරු මාන්දමට

අඹ පොතු, ලුනුවරණ, කුප්පමෙතියා මුල්, වරා මුල්, ඉඟුරු, ළූනු, මෙසේ එනු අඹරා මෙකීවා කොලෙ අකුලා උන අළු වෙන් උයා උනු දියෙන් අඹරා අඹ පොතු, අට්ටික්කා පොතු, මෙමල පොතු මේ පොතු ඉස්මෙන් පොවනු. පෝරු මාන්දං ගුනවෙයි.

32. අඩහැර වේලා, කුප්පමෙතියා. කීකිරිඳිය, පාවට්ටා, පතුක්, වරා, බෝ, මදුරු, කුඩු මිරිස මෙකී මුල් කොට දිය පත අට එකට පෙරා. තල තෙල් එඬරු තෙල්, කොශඹ තෙල් ශම භාග ගෙන ඊට කළු දුරු, සුදුදුරු, දෙළුම් මුල්, නෙළුම් අල, වං මුතු, ඉඟුරු මේ තුං තුං කලඳ ගෙන අට එකට සිඳුවා තිප්පිලි පොඩි දමා දෙනු. කළු අක්කාර, සන්නිවාදං. රතළුණ

33. කළු දුරු, සුදුදුරු, අෂමෝදගන්, තිප්පිලි, ඉඟුරු පිට කුඩු ගා කුඩුකර අඹරා ගුලිකර ළූනු අඹරා ගුලිය ළූනුමැද තබා එලගි තෙල් වෙලා කෝවෙක ලා කෝව බිඳ දමා අඟුරු අඹරා තන කිරෙං පොවනු. උඟුරු තැංබී බඩිං යනවා ගුනවෙයි.

34. යබර පතක් ගෙන උනුකොට අරලු ගල්මද, වලහසාල්, කටුකා, විලඳ තල, කලඳ බැගින් ගෙන අඹරා දමා අත ඇලෙන පදමට කකාරා තබා බිලාල පාදයක් වරකට ගන්න. යක්‍ෂග්‍රහ ශාන්තියට, ගිරහෙතියට, ගිරහේති මාන්දමට, මැටි කෑ පාණ්ඩුවට, පිත් පාන්ඩුවට ගුල්මයට, යහපති.

35. සුදුදුරු මං වාඩි දෙකයි, කළු දුරු මංවාඩි දෙකයි, අශමෝදගම, කරාබු, වශාවාසි, ඉවද, අත්තන ඇට, මෙ කලඳ කලඳ ගෙන අබිං එක බරට කිරා උනු දියෙං අඹරා මීයෙං අඹරා ඉඹුල්ලාටු පමන ගුලිකොට වියලා තබා ගිරහෙ තියට උනු දියෙන්ද, මී පැනියෙන්ද එකක් බැගින් දෙනු. පිළිහුඹු මාළු නොකනු.

36. ශාදික්කා, කරාබු, වශාවාසි, තිප්පිලි, මෙ කලඳ කලඳයි, මිරිස් මංවාඩි පහයි, වච්චනාවි මංවාඩි දෙකයි. (වචනාවි විශ හැර ගනු) හිඟු මංවාඩි දෙකයි, මෙ බරට අබිං කිරා ගනු. තල තෙලෙං දවසක් අඹරා බටු පමණ ගුලිකොට තබා මීයෙං වේලකට දෙනු. ළමයින්ගේ බඩයාම ගුණ වෙයි.

35. දෙදුරු, අශමෝදගන්, තිප්පිලි, සුදුළුනු, ඉඟුරු, මිරිස්, වද කහ, අරළු, මෙකීවා සැම සමසේ ගෙන කටුකැලිය, කුඩු මිරිස, යකිනාරන්, හිං තඹල, තික, දෙහි, දෙඩං, මෙකීවා අළු ගෙන තන කිරෙං අඹරා තිබ්බටු පමණ ගුලිකර තන කිරෙං දෙනු. ළමයින්ගේ බඩින් යනවාට යහපති.

36. වද කශා, වන් මුතු, කරාබු, සිද්ධිගුරු, අති උඩයං, අරළු, වෙලිකහ, වැල්මී, කෙලින්ද මෙවා සමව ගෙන ඇල්දියෙන් අඹරා අරත්ත, කහ, තැම්බුදියෙන් දෙනු. මාන්දමෙන් ආ අතීසාරයට යහපති. මාන්දමෙන් අට ගත් බඩ රුජාවට ඇවිලිල්ලට කුඹුරු කොල යුසින්, විරේකයට පොල් කිරෙං, දෙසි ඇඹුලෙං, පොල් කිරි එක්කර දෙනු. විරේක වන තුරු උනු දියයි, ඇල් දිය මාත්තුයි මෝරු කුර කොල, උනු දිය සවසට වක්කරනු. එදා හැමට පසුද තෙල් උකුණු වලේ කම්මුලෙ මදිංචි කරනු. කුං දෙහිං හිස ශෝදනු. ඇඹුල් දිය නොදෙනු.

37. පෙනෙල කොල, හීන් එබරු, කබලෙං වේලා පස් කුළු බඩු රත්කර එකට සිහිදු කර මාන්දං අතීසාරයට දෙනු.

38. කලු දුරු, සුදුදුරු, අශමෝදගන්, තිප්පිලි, සුදුළූනු, ශාදික්කා, වද කහ, ඉඟුරු, මිරිස්, ශරක්කු, සුදු රෙද්දක බැඳ දෙමුඹ කොල අඹුරත් ගෙන තවුන් වලදකලා දිය තුං පොල් බෑවික් වක්කර එක පිට වැටිච්චාම ගෙන කට සරක්කු එහි ලා කහ, වද කහ, ඉඟුරු, මිරිස් අරත්ත සුදුරු. තම්බා එම සරක්කු එම ගුළමෙන්

අඹරා ඒ ඉස්මෙන් දෙනු. මාන්දං අතිසාර සිටී.

39. වේලා, ළූනු, කුඩු මිරිස, යකා බැදි වැල් කලද බැගින් එකී හා මුල් ගෙන කොටා දියවක්කර කකාරා පෙරා තල තෙල් කොහොඹ තෙල් වක්කර කකාරා කුළු බඩු පහවර්ගෙ චූර්ණය තිප්පිලි, අරළු, බුළු, නෙල්ලි, අමු වරා, දමා ගනු ලනු වැටෙන පදමයි. ඇහ ඉශ ගානු. පොවනු.

40. අරළු, මාශක්කා, සීනක්කාරන්, කරාබු, මෙකීවා අඹරා එලඟි තෙල් පෙනෙල ගෙඩි සම ප්‍රමාණයට සමව ශැමදෙය තුං දවශක් ටික ටික උනු ගන්ව පසුවද කකාරා ඉටිපදමට බානු. පොවනු. ඇහ ගානු. මැලි මන්දං කිරී, වමනේ යන මේ රෝග නසයි. වද උලත්පු, ශන්ති, මාන්දන් වූ දඩිය, උන තදවීමද ඔළුව පිටටයේද විටක දියතත්තද බඩගිනි වේද බොහො සේවායියේද අතුල් මුට්ටුවේද මෙවෙති ගානු.

41. කෝල සන්ති මාන්දමට

කලුදුරු, සුදුදුරු, අරළු, කුරුඳු, ශැවැන්දන, සිද්ධිගුරු, සහිද ළුනු, පල්මාතික්කන්, කුප්පමේතිය යුසයෙන් අඹරා එම යුශින් හෝ තල තෙලින් හෝ ඉඟුරු යුෂින් පොවනු.

42. ඊටම දෙහි, දෙඩම්, පාවට්ටා, අරත්ත, කුප්පමේතිය, මදුරු, කුරුඳු, රත්තිවුල්, සැවැන්දන, මෙකී මුල් අරළු, කොත්තමල්ලි, තිප්පිලි, අශමෝදගන්, සුදුළූනු, මෙකී බේත් අඹරා තල තෙලට පොල්කිරි වක්කර ඇඹරු බේත් ඊට පිට දමා කකාරා ඇවිලෙන පදමට බානු. මාන්දමට ඇහ ඉශ ගානු.

43. උලුකුත්තු ශන්ති මාන්දම

බිත්තර, බිම්පනුවා, මුද්දරප්පලම්, රට ඉදි, මිරිස්, සුදුළූනු සියල්ල මේවා ශමයේ ගෙන කිරෙන් අඹරා ගුලි කොට වියලා උනු දියෙන් දෙනු. උලුතුක්කු මාන්දං ශන්ති මාන්දං ගුනවේ.

44. කලුදුරු, සුදුදුරු, තිප්පිලි, අශමෝදගන්, සුදුළූනු, සිද්ධිගුරු, අරළු, වද කහ, මේවා හැමසම බාග ගෙන විශ හැරි ජයපාල තුං බර ගෙන මගුරු ඔළු, දූරු මුල්, කුප්පමේතිය මුල්, දදකිරි මුල්, මෙකිවා ගෙන කුප්පමේතිය කොල ඉස්මෙන් අඹරා ඔලිද ඇට පමණ ගුලිකර ශෙවන වියලා මිං ගුලියක් කිරි මාන්දමට තන කිරෙන්ද ලොකු ළමයින්ට කුප්පමේතිය යුශයෙන්ද පානු මාන්දමට හකුරෙන්ද උනු පැන් පුරුදුයි. ගල්මාන්දමට දෙඩම් ඇඹුලෙන්ද ශන්ති මාන්දම ට ඉඟුරු මිරිස් පොඩි කොට උනු පැතින්ද උන මාන්දමට ඉඟුරු යුශයෙන්ද මාන්දමට දෙහි ඇඹුලෙන්ද අටක් මාන්දමද ගුනවේ.

45. කෝල සන්ති මාන්දමට

කලුදුරු, සුදුළූනු, අරළු, කුරුඳු, වද කහ, සිද්ධිගුරු, සහිඳ එනු, පල්මාතික්කන්, කුප්පමේනිය යුශයෙන් අඹරා එම යුෂින් හෝ තල තෙලින් හෝ ඉඟුරු යුශින් පොවනු.

46. ඊටම පොල් මිටිකිරි මිරිකා ලිප තබා කළුවාල බටු මුල්, අමු කහ දමා කොටා මිරිකා ඊටම වක්කර තෙල් පාට වූ කල සුදුළූනු, දෙදුරු, සහිඳ එනු, සීනක්කාරං මේවා අඹරා පොට්ටනි බැඳ දමන්න. තෙලටද යහපති.

47. ශන්ති මාන්දමට

ඉරමුසු, වරා, පඹුරු, කොහොඹ, දෙඩන් පතා, මුරුංගා, එල තිතුල්, පාවට්ටා, කුප්පමේනිය, මෙකී මුල් පොතු අහුර අහුර ගෙන හරං කහ කලාදුරු අල, මෙකීවා කොටා යුශ ගෙන ඊට තල තෙල්, කොහොඹ තෙල්, එඩරු තෙල්, අබ තෙල්, එලඟි තෙල්, මී තෙල් මෙකී තෙල් ඊට වක්කර ඊට තිපල්, ඉඟුරු, මීරිශ්, එනු, වද කහ, කොල්ලං කොල, කහ, පළු, දෙදුරු, දෙ ගුනයයි, කුරුඳු, වැල්මී, කොට්ටං, ශවින්දව, පල්මාතික්කන් මෙකීවා අඹරා ඊට දමා කකාරා ඉටි පදමට බානු. නශ්නයටද පානයටද ඉශගාන් ට යහපති.

48. ශෝති මාන්දමට

සුදුදුරු, වැල්මී, අරලු, අරත්ත, අසමෝදගං, ගුරුන්ද, සෙංකලතිරි. කොට්ටං, මිරිස්, ඉඟුරු, සුදුළූනු, තිප්පිලි, කලාදුරු අල, මේවා කලඳ කලඳ ගෙන එලඟි තෙල් නැළියට මේ ලිප තබා තල තෙලට දමා තැම්බූ පදමට බානු. පුංචි කායි දෙකක් බර දෙනු. ඉල ඇදුන්, කැසි, මාන්දං ශෝදි මාංදං යන මේ ලෙඩ නසයි.

49. වලි මාන්දං

රසකිඳ, ශැවැන්දරා, වැල්මී, තිප්පිලි, එන්සාල්, වසාවාසි, ගල් කැන්ද, කහට මල් සමව ගෙන කොටා යුෂ ගෙන එලඟි තෙල් එසම පමණ ගෙන සරක්කු කලඳ කලඳ ගෙන චූර්ණ කර තෙලට දමා කකාරා සුගඳීය පමණට බානු. ඉසේම සිද්ධි කරනු. බොන්නට දෙනු.

සුදුළූනු, වැඩියෙන් ගෙන කොහොඹ කොල එක්ව අඹරා මෙකී බේත්

එළගි තෙලින් අනා දුම පානු. ගිරහයින්ගෙන් හටගත් දෝෂ නැතිවේ.

රතයට

1.මල් රතයට

මල් අනෝද කොල කොටා යුෂ හා පොල් කිරි එක සරියට ගෙන කකාරා කල්ක ලනු වැටෙන පදමට ආලේප කරනු.

2.කනේ අල්ලන රතේට

ගොන් කැකිරි, අවරිය කොල එක සරියට ගෙන යුෂ මැඩ තල තෙල් පතක්වක්කර ලිප තබා මීට ඉඟුරු, අමු කහ, පල්මාතික්කං සමව අඹරා තෙලට දමා කකාරා සිද පෙරා තබා ආලේප කරනු.

3.ගල් රතේට

1. අමු කහ, ඉඟුරු අලේතලා දිය ලුනු ලා උන අලුවෙන් උයා දවමනු.

2. තිරුවානා ගල් පුළුස්සා කොටා පොඩිගෙන පොඩි කොට අසමෝදගන්, කළු දුරු, සුදුදුරු, උළුවා, අරළු, බුළු, ගෙද පොතු, කුකුළු පොතු, රත් සඳුං කකියවාගත් දෙඩං ඇඹුලෙන් මෙ හැම සොදට අඹරා ගා අදිනු. ගල් රත ගුනවේ.

3. කල්ගිය යබර, රත් කොට පොඩි කොට දෙඩන් ඇඹුලෙන් අඹරා ගා අදිනු. ගල් රත ගුනවේ.

4. තිරුවානාගල් පුළුස්සා පොඩි කොට සීනටි සාල් පිටිත් එපමන එක්කොට අන්කෙන්ද පොතු ඉස්මෙං අඹරා කබළ පිස නැවත එම ඉස්මෙන් අඹරා ගා අදිනු. ගල් රත ගුනවෙයි.

5. තිරුවානා ගල් පුළුස්සා පොඩි කොට අන් කෙන්ද පොතු ඉස්මෙන් අඹරා ගානු.

6. අත්තන කොල, පිච්ච පොහොට්ටු, තක්කාලි කොල, පිංචි, දෙහි ශාල් පානුවෙන්

තැඹා ගෙන්ද ගත් සිරියල් විකා විකා එක්කොට ගල් පානුවෙන් අඹරා තුනී කොට ගා අඳිනු. ගල් රත ගුනවේ.

7. තොලබෝ අලය එනු ලා උයා දෙඩං ඇඹුලෙං අඹරා ගානු. රත ගුනවේ.

8. පැහිච්ච බටු. දෙමට. කුකුරුමාන්. දෙසි ඇඹුලෙන් තැංඹා ගානු. පිට අල්ලන රතේටයි.

9. ගල් රතේට

තොල බෝ අල. ඉඟුරු අල. තලා කහ ලුනු ලා උන අලුවෙන් උයා දවටනු. ගල් රතේ ගුනවෙයි.

10. තිරුවානා ගල් පුළුස්සා කොටා පොඩිගෙන අසමෝදගත්. කළු දුරු. සුදුදුරු. උළුවා. අරළු. බුළු. ගෙද පොතු. රත් මල් පොතු. රත් සඳුං කකියවාගත් දෙඩං ඇඹුලත් මෙ හැම සොදට අඹරා ගා අඳිනු. ගල් රත ගුනවේ.

4. කනේ අල්ලන රතේට

ගොන් කැකිරි කොල. අවරිය කොල. කරද කොල. තුන් වගේ එක සරියට ගෙන යුස මැඩ තල තෙල් පතක් වක්කර ලිප තිබා මීට ඉඟුරු. අබ. පල්මාතික්කං. සමව අඹරා තෙලට දමා කකාරා සිඳ පෙරා තබා ආලේප කරනු.

5. කරද කිරිත් තල තෙල් ගෙන එක සේ
පමන කකාරා කරගනිමින් එම සේ
බාලයන්ගෙ රත පිට ගා එම සේ
ලීල කෙරෙයි තුන් දවසින් සැප සේ

6. තිපල්. තිකුළු. එනු. සුදුදුරු. කොට්ටන්. වද කහ. හොද කසා. වියන් දුඹුළු. දේවදර. වත් ඇපල මුල්. රත් නෙටොල් මුල් මෙ හැම කස පැත් දියෙන් අඹරා එම දියෙන් දිය කොට පත්තු පදමට තනා ගානු. සියළු රතවලට ප්‍රත්‍යක්‍ෂයි.

7. අඩු, අත්තන කොල, කැකිරි කොල, විල දවැන්ත කොල මෙකී යුෂ ගෙන තල තෙල් සුනු එක්ව අනා ගානු. එම කොල මලවා බඳිනු.

රතේට අල්ලන වමන

1. මුද්දරප්පලම්, ඉඳි, බොරලුද, මුණු මෙකී දෙයින් කකාල කසාය මී පැනි අත වැඩිය ලා පොවනු.

2. කලාදුරු අල, කෙලින්ද ඇට, වැල්මී, කුකුරුමුවන්, මෙතෙක් දේලා, මී හා සීනි මුසුකොට පොවා වමනය කරවනු. සියලු රත්පිත් නසා. රත නසා

රත කසාය

1. දුමමැල්ල, පිවච, කොසඹ, සඳුං, නෙළුන් අල, මෙකී දෙය කකාරා ගත් කසාය

2. ඉරමුසු මුල් සාතාවාරිය මෙකී මුල් කකාල කසාය සිහිල් කොට තිවා සීනි මුසුකොට පොවනු.

3. පුලිල, දිඹුල්, ඇද්දෙමට, අරළු, ඉඳි, මුද්දරප්පලම්, මෙකී දෙය පලම පලම වෙන වෙන අඹරා මීයෙන් අනා ලේහ කරනු.

4. බැබිල හෝ සිද්ධිගුරු, සාතාවාරිය අල හෝ මෙකී දේ වෙන වෙනම එල කිරෙන් කකාරා පොවනු.

5. නෙළුන් මල් ඉස්ම හෝ ඊතන ඉස්ම අඹ ඇට ඉස්ම හෝ රතු එනු අඹරා ගත් ඉස්ම හෝ තන කිරින් නස්‍ය කරනු. නාසයෙන් වැගිරෙන ලේ නවති.

6. රුක් පොතු කල්කය හෝ සඳුං කල්කය හෝ රා මුසුව පොවනු.

7. සාතාවාරිය අල, ඉරමුසු මුල්, සඳුං, සැවැන්දර මුල්, ඉරිවේරිය, සුළු කුර මුල්, මුද්දරප්පලම්, මත්පේස්ට් මුල්, මාතිල් අල, වැල්මී මෙකී බේත් එක්කලං මංචාඩි සතර බැගින් ගෙන දිය අට එකට කකාරා පෙරා සීනි මී හා එක්ව පානය කරනු.

8. උක් දඬු, මුද්දරප්පලම්, දෙසඳුං, විළඳ, නෙල්ලි, රසකිඳ, ඉරිවේරිය, වැල්මී. මී පුක්, මුගුනුවැන්න මෙකී බේත් එක්කලං මංචාඩි සය බැගින් ගෙන කසාය සීනි මී හා එක්ව දෙනු.

9. ඉරමුසු, කලාඳුරු අල, සාතාවාරිය, නෙල්ලි, මුද්දරප්පලම්, වැල්මී, මානෙල් අල, මෙකී බෙහෙත් දෙලොස් කලං ගෙන තෙරපා දිය අට එකට කකාරා සීනි මී හා දෙනු.

10. අජන කැට, වැල්මී, ඉරිවේරිය, සඳුං කුරු, ගෛරික ලොත් සුඹුළු මේ හැම සමව ගෙන චූර්ණ කර සීනි හා කස පැන් දියෙහි කලතා පානය කරනු. පිත්ත නසා.

11. සක්සිවන් ගුරු, මෙලමල්, වැල්මී තන කිරෙන් අඹරා ගාන්න.

12. පුවඟු, වෙල්ලොත්තිරම, දුමමල, වැල්මී, කලාඳුරු අල, අරළු, ඉරමුසු, ඉරිවේරිය කසාය කකාරා සීනි සහිතව දෙනු.

13. පෙරුංකායන්, මුද්දරප්පලම්, වග පුල්, අරලු, ඉඳි, මෙකී බෙහෙත් අඹරා එලගිතෙල් හා මී මුසුකොට ලේහ කරනු.

14. වග පුල්, නෙළුම් මුල්, සිකුරු පියලි, සීනි, තලා මුල්, මෙකී බෙහෙත් අඹරා එලගිතෙල් මියෙන් ලේහ කරනු.

15. වග පුල්, මුද්‍රප්පලම්, සීනි මී හා තල තෙල් සහිත කොට ලේහ කරනු.

16. සිද්ධිගුරු, වග පුල්, මිරිස්, කෙලිඳ ඇට, එකින් එක වඩ වඩා ගෙන මදක් බැද පොඩි කොට තබා සීනි මුසුකොට දෙනු.

මල් රතේට

1. අනෝද කොල කොටා මිරිකා තල තෙල් පොල් කිරි සමඟ පදමට බා පෙරා ගානු.

කණේ අල්ලන රතේට

1. ගොන් කැකිරි කොල, අවරිය කොල, මේ හැම කොටා මිරිකා තල තෙල්වත් කොට කකාරා තෙල් පාට බලා පල්මාතික්කන්, ඉහුරු අඹරා දමා පදමට බා තබා තෙල් ගානු. ගුනවේ.

2. මදටිය, අන්කෙන්ද, හාතාවාරිය, ඔලිඳ, කොල්ලං කොල, මදුරු, යක්බෙරිය, යක වනස්ස තෙලට ලා පදමට බා ගානු. රත කුෂ්ඨ ගුණවේ. සියලු පතු කැවිලි සහ දදවලටත් යහපති.

3. මීටම උරුලෑ සට්ටන්, රත් හඳුන්, දියෙන් අඹරා ගානු.

4. රත්මල් උයා අ[illegible] වානාගල් පුළුස්සා එකුඩුත් දෙඩන් ඇඹුලෙන් අඹරා ගානු. රත ගුනවේ.

5. එඬරු දළුයි,එරබදු දළුයි දී කිරෙන් අඹරා ගානු.

දුවන පතින රතේට

1. ඉඹුල් මල්, රත් මල් කැකුලු, ඔලිද කොල කොටා උයා උ[illegible]රුමන්ට තබා අඹරා ගානු. ගුනවේ.

2. පඹුරු කොල කොටා යූෂ ගෙන හුනු කර ඉස වක්කරනු. ගුනවෙයි.

3. ඔලිද කොල, වද මල්, අළු කෙහෙල් පිත්තයි මෙකී දේ ගෙන මිරිකා ගානු. ගුනවේ.

4. කැබෙල්ල දළු උන අළුවෙන් තබා කස පැන් ඉස්මෙන් අඹරා ගානු. ගුනවේ.

5. මාරා කොල තැඹිලි පොල් කිරෙන් තෙල් සිද ගානු.

රත, විසාදී.

6. ගොන් කැකිරි කොල, පිල කොල, අවරි කොල, මේ හැම කොටා මිරිකා තෙල් වක් කොට කකාරා තෙල් පාට බලා මීට අබ, ඉහුරු ඉස්ම අඹරා ගානු. රත සෑම විසාදිවලටයි.

7. වරා කිරි, තිකුළු, රුක් අත්තන, එරබදු, ගම්මිරිස් මෙකිවා පොල් කිරි දමා තම්බා අඹරා බඳින්න. සියලු විසාදිවලට.

8. අත්තනමුල්, කෝමාරිකා , පතුක් කොල, පොතු, යකිනාරන් පොතු කොල, අත්කෙන්ද කොල පොතු, පිල කොල පොතු, අඟු කොල පොතු, වැල් කැප්පිටියා කොල පොතු, මැඩිය කොල පොතු, කහ එනු ලා අඹරා ඉඟුරු, මිරිස් මෙකි බෙත් හා කොටා මලවා බඳිනු. විසාදිවලටයි.

9. මුරුවා කොල, රදලිය කොල, පුපුල කොල මෙකි යුස එනු කැටි තිබුනු වලඳකින් කැබැල්ලක් ගෙන අඹරා කකාරා අඳිනු. දුවන පතින ගඩු ගුනවේ.

10. මුරුවා කොල ඉස්මෙන් සීනටි හාලේ දියලා එ පිටි රොටි උයා දවටනු. ගුනවේ.

11. මුරුවාකොල එම ඉස්මෙන් රස දිය මත්වාඩියක් පමන ගෙන පොඩිකර කබලු ගා දවටනු.

12. පාවට්ටා දළු, මුරුවා දළු, බුලත් දළු, කිකිලි බිජු සුදු සාරුවෙන් අඹරා ගා අඳිනු. දුවන පතින රතේටයි.

13. එරබදු පොතු, මුරුංගා පොතු, කුඩු මිරිස්ස පොතු, අන් කෙන්ද පොතු, මෙකි මුල් පොතු ගෙන සැම දෙඩන් ඇඹුලෙන් අඹරා ඇත් ඇට, කැප්පිටියා පොතු, හාල් මැසි ඉහටි මේ හැම දෙඩන් ඇඹුලෙන් අඹරා සුනු ටිකක් එක්ක අඹරා ගානු. ඇකන්ෂා ගුනවේ.

14. දළුක් පළු, කහ එනු ලා මලවා බඳිනු.

15. උන අළුවෙන් ගැට කහඹිලියා කොල ඉස්මෙන් හීනටි සාලේ කබළු පිස සීන් රෙද්දක ගා පිට දමා එලනු.

16. සුදුදුරු, සුදුළුනු අඹරා දවටනු. රතේටයි.

17. කළු දුරු, අසමෝදගන්, තිප්පිලි, එක්ක අඹරා ගානු. රතේටයි.

18. මිරිස් කොල, පුඩල් කොල කොටා උණු අළු පල්ලේ තම්බා ඒ පිට දවටනු.

19. තිල් කටරොළු මල්, බටු මල්, මුරුංගා මුල්, රත් නෙටුල්, කුඹුක් පොතු, දෙඩත් ඇඹුලෙං ගලගා ගානු.

20. වද කොල, ගදපාතා කොල, බටුකර දෙඩං ඇඹුලෙන් අඹරා ගානු.

21.දුවන රතේට

මකුළු වැන්න සහ මුලයෙන් ගෙන වැටකේ කොල යුසයෙන් ගානු.

22. ඔළිඳ මද, කැල, ලිප මැද පස්, වීයන් දුඹුළු,කුඹල බැදපු පස්, පොල් හකුරු, මැටි දිකිරින් තම්බා දෙඩං ඇඹුලින් ගානු. රතයටයි.

23. ඇඹිල්ල දළු, උනු අළුවෙන් උයා කසපැන් ලෙලි ඉස්මෙන් අඹරා ගානු. ගුනවේ.

24. තරණ දළු, මුල් එම ඉස්මෙන් අඹරා ගානු. ලගනයට

ළදරු තගනයට

පුස් ඇට මද ගලගා ගානු.

වරා කොල හතයි, සවින්දව එහි ඉස අමු වරා පත් වසා බැඳ උනු අළුවෙන් උයා දුනු හැර ඉස්ම ගෙන කණ වක්කරනු. එක අතකුත් පයකුත් වලඟු නැතුවාට ඇස් රතුවෙනවාටද, ගිනියන් කෙරෙහි හිරි වැටීම තිමිර ශයාන්ති ගුනවෙයි.

තැවිල්ලට

පුෂ්ප සඳුං, කුරුඳු පොතු, මුරුංගා, කදුරු, මෙ පොතු පොල් මල්, කපු ඇට, කහ, මෙවා කොටා පොට්ටනී බැඳ කාඩියෙන් මහිශ, ගජ, ගො, මුත්‍රයෙන් එක එක දවශ දමා වඩුවෙන් උයා තවනු. ළදරු තිමිර වාදන් ගුනවේ.

රත් පලුවට බේත්

සුදු සඳුං, සැවැන්දර මුල්, පිපිලිය, වං මුතු, ඉරිවේරිය මෙකී දෙය කකාල කශාය පොවනු.

ආදෝ බාගයට යන රතට,

ඇසල පොතු, කකාරා ගත් පැන් හෝ නෙල්ලි කකාරා ගත් කශාය හෝ තිරස්සවාලු වෙන් හෝ නොහොත් අරළුයෙන් හෝ ශිති හා මී පැති අතවඩා පොවනු. ඇඟ ඇල් පැන් වක්කරනු. ශිටී.

වමනයට

වමමුතු, කිරින්ද ඇට, වැල්මී කුකුරුමුවන් මෙකී දෙය කකාල කශාය එල කිරි මී හා ශිති මුශු කොට පොවා වමනය කරවනු.

රත අල්ලා සිටි අයට කොසඹ, හෙල ශඳුං, රත්ශඳුන්, නෙළුම් මල් මෙකී දෙය කකාල කශාය දෙනු.

ඊටම හීන් ඉරමුසු, මහ ඉරමුශු, වැල්මී, හාතාවාරිය, මෙකී මුල් කකාල කශාය ශිති හා මුශු කොට දෙනු.

ඊටම බැබිල හෝ සිද්ධිගුරු හෝ හාතාවාරිය අල හෝ මෙකී දෙය හෝ වෙන වෙනම හෝ එලකිරි කකාරා පොවනු.

නාසයෙන් වැගිරෙන රතයට

1. ශක් හා ගුරු කැට එක්ව අඹරා ගත් කල්ක හෝ

2. වැල්මී අඹරා ගත් කල්ක හෝ තන කිරෙං නශ්‍ය කරනු.

3. නෙළුම් මල් ඉෂ්ම ඊතන ඉශ්ම හෝ අඹ ඇට ඉශ්ම

4. රතුළූනු ඉශ්ම හෝ නශ්‍ය කරනු. නාසයෙන් වැගිරෙන ලෙය නවතී.

5. ශීනි හා මී මුශු කොට කකාල එල කිරි පොවනු.

6. ශිවං ගුරු හෝ දම කොල හෝ මානෙල් අල හෝ මෙකී බෙහෙත් සහල් දෙවුං දියෙන් මී මිශ්‍ර කොට පොවනු.

ගල් රතයට

1. ඉඟුරු, කහ, ලුණු ලා උණු අලුවෙන් උයා දවටනු.

2. රත් තිවුල් මුල්, ගෙන්දගං, කොටවං, ඉරමුසු, බදුල්ල ඇට, අරලු, ආඩතෝඩ මුල්, දලුක් පොතු, බෝ පොතු, පුස් ඇට මද, දේවදර, වියන් දුඹුලු, වරා මුල් ගෝ මුත්‍රයෙන් අඹරා ගාන්න රත ගඩුවලට හොඳයි.

3. වවුලැටිය කොල, පොතු, අන්දර, හිරැස්ස, තරණකොල, බිත්තඹුරු කොල, වැටකෙයිය කොල මෙකී බෙහෙත් කොටා උදුල්ල ලිප තබා බේත් ඉස්මත් දෙහි ඇඹුලුත් පැසවා ගාන්න. ගල් රත ඉසිරේ.

4. යබොර කොටා සිනිඳු කොට දෙඩන් ඇඹුලින් අඹරා අඳිනු.

5. හිරැස්සපලු, තඹල කොල පොතු, ගොංකැකිරි කොල, එල කිරි එක්ක හිස ගල්වා දිය හැටක් වක්කරන්න.

1. දෙමට මල්, රත්වේලා කොල, දෙහි ඇඹුලින් අඹරා ගාන්න.

ඉසේ එන රත ගෙඩි

1. රණවරා, තිතුල්, රුක්අත්තන, එරබදු, හාල් පානු දියෙන් අඹරාගාන්න.

රත තැවිල්ලට

එල තල, හරං කහ, වල් ඉඟුරු, බෙලි පොතු, ශිරැස්ස පළු, එල බිත්තඹුරු මේ හැම කොටා පොල් කිරි වක්කර යොදු මත්ඩයක දමා ශවස තබා ගානු.

උදය උදුල්ලක් දර ගිනිලා රත් කොට මෙකී බෙහෙත් එහි දමා ආතුරයාට

එලඟිතෙල් ගා තවනු. රත් ලේ පළු වියල් පොඩිවේ.

දහ

ආලේප : නෙල්ලි කුඩු, එලඟිතෙලින් බැද ගල්වන්න. සිසිල් සෙවෙල් කාඩියෙන් අඹරා ගල්වන්න.

නුග පොතු, ඇඹුල් පොතු, කැල, පුලිල පොතු, මී පොතු, බෝ පොතු, තිඹිරි පොතු, ඩෙබර පොතු, ලොත් සුඹුළු, බලු දං දිය දමා මහ දඹ මහනෙල් ඇඹුල මල් හෙල පියුම රත්පියුම, උපුල් කොල, හෙල් මැලි, රත්ඹුල, වැල්මී අඹරා ගල්වන්න. එම බෙහෙත් චූර්ණ කර ජලයෙහි ලා කකාරා සිසිල් කොට තිවා ඔරුවක වක්කොට එහි බැසීම.

තෙල් අභ්‍යංග

1. නෙලුම් මල්, අල, දඬු, මුල්, අඹරාගාන්න.

2. සැවැන්දරා මුල්, නෙලුම් මල්, ගුරුකැට ඇත්දෙමට දමා සිඳ ගත් තෙල

3. මහ ඉරමුසු, කලු ඉරමුසු, ලොප් සුඹුලු, කලාදුරු අල, මුද්දරප්පලම්, ඉඟි, සඳුන්, දමා සිඳ ගත් තෙල

4. නෙල්ලි, හාතාවාරිය අල, එකට අඹරා දිය එල කිරි ඇඹුල් කාඩි දිය සහිත කොට සිඳ ගත් තෙල

රතේට

1. ගස්කදුරු කොල, සස්සඳ කොල, කහ එනු ලා කොටා මලවා බඳිනු.

2. හිඟුරු දළු, දෙඩං ඇඹුලෙන් ගා අඳිනු.

3. බිත්තඹුරු කොල, පොල් කුඩු එක්ක අඹරා ගා අඳිනු.

4. අංකෙන්ද දළු, ගස් කදුරු දළු, සස්සඳ කොල, සුදුළුනු දෙඩං ඇඹුලෙන් අඹරා

ගා අඳිනු.

5. ගෙන්දගං, පුපුල දළු, කුඹුරු දළු, තොලබෝ කොල, රබ්බඩ පැතියෙන් අඹරා ගානු.

6. මදු කොල, දිය හබරල කොල, කොටා ඉස්ම මිරිකා ගා අඳිනු.

7. මඩිතිය පොතු, ඉඟුරු අඹරා ගා අඳිනු.

8. මී ඉටි, බින්දුම්මල, කැප්පිටියා පොතු කොල, කුඩුමිරිස් පොතු, කොල, කටුපිල කොල, පොතු, ගොකටු කොල, මුරුවා කොල, මෙකී දේ පොල් එක්ක කොටා මිරිකා ලිප තියා වලල්ලක් හිඳි එන විට දුරු දෙවගෙ සුදුළුනු අඹරා තෙලට දමා බාගෙන තෙල් ගසනු. සියළු ගඩු ගුනවේ.

9. කැට කැල, පොතු, තිතුල් පොතු, මූන මල් පොතු, මී පොතු, මඩිතිය පොතු, ගැරඬිදුල් පොතු, රුක්අත්තන පොතු, බෝ පොතු මේවා කොටා මිරිකා පොල් කිරෙන් යොද තෙල් ගසා ගානු.

10. කෝවක්කා කොල, රත්තම්පලා කොල, කිකිලි බිජු මද, ඉස්මෙන් අඹරා ගා අඳිනු.

11. සියඹලා බොර, කොල, පොතු, රත්මල් කොල, පොතු, පොල් කුඩු පලා, මුරුවා කොල, තික කොල, පොතු, මහතඹල කොල, පොතු, දළුප්පළු, මුරුංගා පොතු, මෙකීවා කහ ලුණු ලා කොටා මලවා බඳිනු.

රතට :-

1. ගින්නේරිය කොල මල් හා පොල් කිරි අනා ඇඟ ගල්ලනු. ගුණවේ.

2. සහස්‍රවේදි දෙහි ඇඹුලෙන් උරව්වි කර ගානු. රත ගුනවේ.

3. පුස්කර, ගින්නේරිය කොළ, මල්, පොල් කිරි හා ඇඟ ගල්ලනු. ගුනවේ.

දුවන පතින රතයට

1. පතැඟි පොත්ත ගොමුත්‍රයෙන් අඹරා ගානු. දුවන පතින රතයට ගුනවේ.

ලේ රතේට

1. ඉඟුරු අලයක් කපා උණු අළුවෙන් උයා දවටනු. අත්දුටුවයි.

2. රත් තිපුල් මුල්, කෙලිඳ ඇට, සොංකලතිරි කොට්ටම්, ඉරමුසු මුල්, බඳුල්ල ඇට, අරළු, තිකුළු, ආඩාතෝඩ මුල්, දළුක් ගහේ පොතු, වරා පොතු, ඇහැළ පොතු, ලුණුවරණ පොතු, කසා, ලූණු, සිද්ධිගුරු, දෙඩම ඇට, කොසඹ ඇට, දේවදුරු, වියන් දුඹුලු, මාරා පොතු, මගුල් කරඳ පොතු, වලඟ සාල්, කරල් සැබෝ මුල්, වදකහ, මුරුංගා මුල් මේ හැම ගෝමුත්‍රයෙන් ගා අදිනු. සියලු රත ගඩුද අර්බුදද ගුනවේ.

ගල් රතයට

1. තිරිවාණගලක් පුළුස්සා, අසමෝද, කළුදුරු, සුදුදුරු, උළුවා, අරළු, බුළු, අබ, ගෙන්දගන්, ඇ පොතු, තිකුළු පොතු, රත් හඳුන්, කකියවා දෙඩම් ඇඹුලින් ගා අදිනු. ගල් රත ගුනවේ.

2. කල්ගිය යබොර පුළුස්සා පොඩිකර දෙඩම ඇඹුලෙන් අඹරා ගානු. ගල් රත ගුනවේ.

තිප්පාඩු ගුළිය

අරලු, දෙදුරු, ඉඟුරු, බුලු, තිප්පිලි, නෙල්ලි, තිවඟ, රසාංජන, දේවදර, පෙරුංකායම, ගම්මිරිස්, බෙලි ගැටමද, හල්දුම්මල, ලා පුවක්, මදට හය හය ගෙන අබිත් කලඳක් දමා මදුරු යුසින්ද, මීයෙන්ද දෙදිනක් අඹරා මිරිසැට පමන ගුළිකර පවනේ වියලා ගන්න.

තිප්පාඩු ගුලීය අනුපාන

1. බාලයන්ගේ වමනේට

උනු දියෙන්ද, එන්ශාල් යුසින්ද, තන කිරෙන්ද දෙනු.

2. බඩ ගසාගෙන යනවාට

තඹල පොතු කොටා යුෂ මැඩ ගෙන කකාරා ගත් දිය තන කිරි සමග දෙනු. උඳුපියලි යුස, කකාරා, සඳුන් තන කිරි සමහ දෙනු.

3. උනට

යකිනාරන් කොල යුසින්ද, බෙලි කොල යුසින්ද, විෂ්නු ක්‍රාන්ති කොල යුසින්ද

4. බාලයන්ගේ උනට

සීනියෙන්ද

5. සන්නියට

මුරුංගා මුල්, කුරුඳු මුල්, අබ, මිරිස්, මෙයින් කකාල කසායෙන්ද

6. බඩ රුජාවට

වදකසා, පරණ එනු, මෙයින් කලඳ කලඳක් සමග ගුලියක් පොඩි කොට දෙසි ඇඹුලෙන් දෙනු.

7. බාලයන්ගේ බඩ රුජාවට

වද කහ, කුඹුරු ඇට මද, කකාරා එඬරු තෙල් මුසුව දෙනු.

8. බාලයන්ගේ වමනයට

විලඳ, මී පැනි, දෙඩන් ඇඹුලෙන්ද

9. බාලයන්ගේ පිට ගැස්මට, ඇනුමට

තෙල් පස් වගේම ගුලි යොද පොවනු. කන වක්කරනු. නස්න කරනු (බාලයින්ගේ විපරීත සන්නි, වෙවුළුන් සන්නි, ගොලු සන්නි, බිහිරි සන්නි, නිදිමත සන්නිද) වදකහ, ලසුනු, කොහොඹ පොතු, කංසා, සැවැන්දරා, ඉරිවේරිය, ඉරමුසු මෙකී දේ අට එකට කකාරා දෙනු. ගුණවෙයි.

10. බාලයින්ගේ කෝල සන්නියට

ආඩා මුල්, කොල, කඩ පිම්මෙන් තම්බා, මිරිකා මී පැනි තිප්පිලි කුඩු, තන කිරෙන් දෙනු.

11. බාලයින්ගේ උනට

සිනි, මී පැනි, එලගි තෙල්, තන කිරෙන්ද මීටම බැබිල කසායෙන්ද රතුලූනු දමා තන කිරි ගිතෙලින්ද දෙනු.

බිලිඳු රාජ ගුලිය

කළු දුරු සුදුදුරු තිප්පිලි ගත් නේ
වැල්මී කොට්ටන් ඉඟුරුද ගත් නේ
අරළු බුළු ද නෙල්ලිද අර ගත් නේ
එනු මීරිශ් වද කහ අර ගත් නේ

කලඳ කලඳ මින් අවුසද ගත් නේ
මෙකී බරට එන්ෂාල් අර ගත් නේ
තන කිරි වත්කර අඹරා ගත් නේ
මුන් ඇට පමනට ගුලිකර ගත් නේ

පවනේ වියලා සූරකිව තබමි න්
සිනි විලඳ තන කිරි ශහ ගනිමි න්
උන ගිනියන් කැශි මුශ ගුණ කරමි න්
බිලිඳුට දෙන ගුලියකි පෙර පවශ න්

කරඳ කුඹුරු තික මුල් අර ගත් නේ
තෙරපා කඩ පිම්මෙන් තඹන් නේ
ගුලිත් යොද පෙම කර දීපන් නේ
මෝරණ පනු හතළං නොතිබෙන් නේ

එනු කොසඹ කොල වද කහ ගත් නේ
ගුලියක් කුඩු කර දුන් අල්ලන් නේ
දමා කිරිත් නොදමයි දූන ගත් නේ
ගිරහ දෙලහ කල ලෙඩ ගුනවෙන් නේ

ඉඟුරු මිරිස් සුදුළූනුද ගත් නේ
පනක් වතුර මැන කකාර වත් නේ
ගුලිත් යොදා සමකර දීපන් නේ
බිලිඳු අයගේ සන්නිය නොතිබෙන් නේ

පොල් කුඩු සහ පොල් එක්ව කොටන් නේ
මදුරු යුෂත් සහ මිරිකා ගත් නේ
කකාර මින් ගුලි දෙක දෙක දෙන් නේ
බිලිඳු අයගේ කෝලේ නොතිබෙන් නේ

ඇශ රවමින් ඉස කෙස් උදුරන් නේ
නැතක් වෙලා ඉද ඉපිල පතින් නේ
මියුරු කිරෙන් ගුලියක් යොදමින් නේ
අංජන ලනු කෝලේ නොතිබෙන් නේ

සීන් තඹල සැබෝ මුල් ගත් නේ
කොටමින් මිරිකා පැශවා ගත් නේ
තන කිරි සහ ගුලි දියකර දෙන් නේ
කඩුත්තු බඩ කැක්කුං නොතිබෙන් නේ

බැබිල කොලද සහ මුලයෙන් ගත් නේ
මිරිස්ද කුඩුකර සමග තොසීන් නේ
මී පැනි සහ යුෂ යොදමින් දෙන් නේ
බිලිඳු අයගේ වමනේ නවතින් නේ

දෙඩන් පැහිරි හිඟුරුද යුෂ ගත් නේ
තල තෙල් සහිතව ගුලින් යොදන් නේ
උදය උදය තුන් වරුවක් දෙන් නේ
බිලිඳු අයගේ කැශි මුශ ගුණවෙන් නේ

උගුරෙ ලෙඩට

පල්මානික්කන්. අරළු. සිද්ධිගුරු. වැල්මී. තිප්පිලි. සෛන්ධව එනු මෙති අඹරා මුවග දරා කෙළ ගිලිනු.

රත් පිතෙන් එන හිස රදයට

තෙලා ඉඹුල් කොල කොටමින් ඉස්ම ගෙ න
හිනටි හාල් එම දිය සෝදලමි න
කිතුල් හකුරු එල කිරි පුවොත් රැගෙ න
පිස කැව කල පිත් දුරුවෙයි තිමව ද න

ලදරු පිත් රෝග

සිවයස් පිරුනු උළු සුනු කැර සිනිදු කො ද
මී වෙනුරෙත් ගටමින් මන්වඩියක් පි ද
තබමින් කරඩුවෙකලා එහි සුරකි කො ද
එුවොත් නෙතෙහි අතිකුත් ඔසු කුමකට ද

එලකිරි ඔලු පැන් එක්කොට සොදින් ගෙ න
බැද පිතිපිටිත් ලා පුසුලුත් උයා ගෙ න
පින්නේ තබා රැ මිරිකා තබා ගෙ න
බොන උතුරවා යහපත් පින් දිගු නුව න

ඉස්මෙ සියඹල කොල ලා
හිනටි පිටිකර සා ලා
පිස පිතිකිරි කබළු ලා
කැව පිත්යෙයි ඔදිස්ව ලා

රත්පිත

මී ගොමයෙක බැදි දර අහුරු පි ට
තබා කකියවා මඩව ගත් ඉස්මය ට
මී පැතිලා පෙරා දීපන් රත් පිත ට
රත්තම්පලා ගෙද කොල මලවා බත ට

ඇස්රුජා

තන කිරි අඹරා එල කටුරොලු මු ල්
ගුලිකර වියලා තබමින් සෙවැනැ ල්
එම කිරි ගාමින් ඒවහොත් දුර ක ල්
නෙක දුක් දුරු වෙයි දූත ගත් හැම ක ල්

හිසරුජා

වැල් මිරිසද අත් දූතක් කඩා ගෙ න
මල් දදත් සිද්ධිගුරුත් අකක් ගෙ න
පොඩි කොට සහාලත් කපුරෙන් අකක් ගෙ න
කොවක්කා එල වෙනුරෙන් අතාගෙ න

ඉස ගල්වා එම තයිලා කරමින් තේ
අයත් ඉකුත් කොට එම දිය සලත් තේ
බත් එලගිතෙලෙන් පුතු කොට තවත් තේ
මෙයින් ඉසරුද දුක් දුරු කරත් තේ

බාලයින්ගේ අතපය වලඟු නැතිවාට වෙදුවක්

දළුක් සියඹලා කොල බෙලි ගිවුපත් තලා කොල ය
කරද මුරුංගා මුව කිරිවැල් වෙලා සහ සිහින් මදු ය
අමුක්කුා වලාවැත්ත මුරුවා වැල් පට ඇපිල ය

මෙකියන කොල සමව රැගෙන ගලක දියෙලා මිරි බැ ද
නොහැර කකාරමින් වෙදු පැ කල උසු පුටුවෙක ඉ ද
මුව ඇත දවන වායු පිලා සිරුරු තුලෙහි ඇතිවායු ද
අතපය වායු සමග හැම වායුන් ගුනවෙ සො ද

වියලා බෙලි මුල් කටු කරඩු හුනු කො ට
කකාරමින් මද උනුවෙන් පෙවු වී ට
සියලහ හැම වායු ගුනවෙයි එම වී ට
නැබ තලේ තෙල් පැති තොල් පැලීම ට

බාලයින්ගේ අඩස්සියට

රත් හඳුන් කලදයි, පුෂ්ප හඳුන් කලදයි, මෙ බරට සහිද එනු කිරාගත දෙකී ඇඹුලෙන් අඹරා එමෙන්ම දෙනු.

කුඩා ළමයින්ට උපන්ද පටන් අල්ලන ශෙමට

ආඩතෝඩ මුලේ පොතු ගලවා යෝරගත් අමු ඉඟුරු ඉස්ම වලට සීනි දමා සැරයකට තේ හැන්දකින් එකක් පමන පොවනු. සෙම ඉතා උග්‍රවනත් වජ්‍රකාන්ති ලැපැත්තෙන් ඉෂ්මුදුනේ ගානු. සීනි සමග කවනු.

ළමයින්ට ලැය තුල හිරවී තිබෙන ශෙමට

මී තෙල්, ගිතෙල්, එනුවිල, තිප්පිලි මෙ සැම එකතු කර තෙල් සිඳ පොවනු.

ළමයින්ට තුන්දෙසින් ආ උනට

අබ, විලද, රත් හඳුන්, අත්තුා, දං දෙවු සුදු, වැල්මී මෙකී බෙත් සමසේ ගෙන ශුනු කොට මීයෙන් ලේහ කරනු. තුන්දෙසින් ආ උන වලකී.

ළදරුවන්ගේ සෙම නැගුම

වගපුල්. ඉවද. කකුළු සුඟ සුනු කොට මීයෙන් අනා ලේහ කරනු.

බාලයන්ට ආ උනට කිරි නැගුමට

ඉවද මීයෙන් ලේහ කරනු.

විලඳ, ශවින්දව, අබ ඇට, මීයෙන් ලේහ කරනු.

බිලිඳු කුමරුන්ට ආ හික්කාවට

විලඳ. සවින්දව. ලජ්නාරං ඇඹුලෙං ලේහ කරනු.

බාලයන්ට වූ පීනස, හික්කා, රුජාවට

විලඳ. ශක්කා. ගිතෙල්. මී, ශවින්දව, ලේහ කරනු.

වසූරියට

1. කොසඹ පොතු, වැල්මී, රසකිඳ, කශාය කර සීනි දමා දෙනු.

2. මසන් කොල, රතුළුනු කශාය කර තල් සුකිරි දමා දෙනු.

ළමයින්ගේ බඩ වේලෙනවාට

සියඹලා බොර ශීනි දමා පොන්ස තනා බඩ වේලෙනවාට දෙනු.

ළදරුවන්ට වූ මුඛ රෝගයට

කොශඹ කොල, වැල්මී කශා සුනු තුං අහුරක් තල තෙල්ලා කකියවා තෙල විධුරුවශ ගල්වනු.

බාලයන්ගේ වමනයට

1. වගපුල්. පස්පුනු. වලහපොල්. එරබදු දළු මේවා අඹරා මී පැතියෙන් ලේහ කරන්න.

2. සඳුන්. හකුරු. අගිල්. කුරුඳු. විලඳ මෙකී දේ අඹරා පාන්කඩ අඹරා එලගිතෙලින් අවුලා දුන් පානු.

බාලයන්ට වූ අතීසාරයට

1. බෙලි. මෙමල මල්. ඉරිවේරිය. ලොත් සුඹුළු. ඇත් වගපුල්. මෙයින් කකාල කසාය හෝ මේවා සුනුකර මීයෙන් ලේහ කරන්න. බාලයන්ට වූ අතීසාරයෙහි යෙදිය යුතුය.

2. කෙලින්ද ඇට, දියමිත්ත. ඉදිත්තරු. අසමෝදගන්. මෙ චූර්ණය දෙනු.

3. කෙලින්ද ඇට. ඉවද මෙ සුනුකර එසේම තන කිරි එක්කොට විදි ලෙසින් බාලයන්ට දෙනු.

සර්ව අතීසාරයට ජ්වරයට

කසා. කෙලින්ද ඇට, වනුවැල්, එලබටු, වැල්මී මෙහැම පමණට කකාල කසාය බාලයන්ට තන කිරින්වූ දෙස් නැසීමට යෙදිය යුතුය.

බාලයන්ට අඩස්සියට

වැල්මී.රත් හඳුන් කලඳයි, පුෂ්ප හඳුන් කලඳයි. මෙ බරට සහිඳ ලුනු කිරාගෙන දෙහි ඇඹුලෙන් අඹරා එමෙන්ම දෙනු.

බඩ ඇතුලේ අල්ලන රත

පොල් කුඩු පලා සහමුලින්ම ගෙන පොල් එක්ක කොටා මිරිකා ලිප තබා කළුදුරු, සුදුදුරු, අශමෝදගන්, පෙරුන්කායන්, පල්මාතික්කන්, සුදුළුනු, රත්මල් කැකුලු, රත් මල් පොතු, ජයපාල මෙ හැම අඹරා දමා පදමට බා තබා පොවනු. බඩ ඇතුලේ අල්ලන රත ගුනවෙයි.

ළමයින්ගේ ඉදිමුමට කසාය

1. දේවදර, අරළු, වේලා මුල් , සුදුළූනු, සාරන මුල්, රත් නෙටුල් මුල්, මේවා සමව කිරා අට එකට කකාරා තල තෙල් මිශ්‍රව දෙනු.

2. සඳුන්, වැල්මී, ඉඟිනි ඇට, අඹරා මුට්ටියේ ගා මීට ඉරිවේරිය, කලාඳුරු අල, පත්පාඩගත්, ඇහැල මුල්, පාවට්ටා මුල්, කොත්තමල්ලි, ඉඟුරු මේවා සමව කිරා තල ගොබයක් ලියා දමා තැඹිලි වතුරෙන් අට එකට කකාරා දෙනු. ළමයින්ගේ උන ඉදිමුත් මාන්දත් ගුනවේ.

3. අරළු පස් කලඳයි, ත්‍රස්ථවාළු තුන් කලඳයි, අට එකට කකාරා උදය එඬරු තෙල්, ක්‍රිමි සැත්‍රු කුඩු දමා දෙනු. සවස එරඬු තෙල් සහිද ලුනු දමා දෙනු. ඉදිමුම , මාන්දත්, උන, ගිනියන් ගුනවේ.

පුංචි ළමයින්ගේ ලේ හිඳං යනවාට

1. බෙලි මුල් කලං හයක් අරන් වතුර පත හතක් වක්කර එකට සින්දවා මී පැති වලහසාල් තනකිරි දමා තුන් වරුවක් දෙනු. දෙහි ඇඹුල් අගුණයි.

2. ගොටු කොල මිටක් සහ මුලින් ගෙන රතුලූනු එක්ක වතේ දමා කොටා හාල් මිටක් දමා කැද උයා ගිතෙල් එක්ක තුන් වරුවක් දෙනු.

3. ළමයින්ඩ මාන්දමට ලේ හිදත් පාචන වෙනවාට බිත් කරල් හැබ සහමුලින් ගෙන හිනටි හාල් එක්ක කැද උයා තුන් වරුවක් දෙනු.

4. අරළු, ඉඟුරු, කොත්තමල්ලි, බැදලා කුඩුකර උතුරණ වතුර දමා තම්බා තිවා පොවනු.

උල්ලෝගත් විරේකයට

1. අක්‍රපට්ටා, වැල්මී, රතුළූනු, මාසක්ක, කලිප්පාක්කු, අරළු, අතිවිඩයන්, සූකිරි, මේවා ඉතා ටික ටික අරන් තේ කොප්පයක් පමන වක්ර දෙපැයක් දමා තේ හැන්දකින් එකක් පමන එක සැරේට දෙතුන් විඩක් පොවනු. අත්දුටුවයි.

මාසක්කා ගෙඩියකින් බෑයක් පමන ඉතිරි බේතුත් එපමනට ගන්නවා කලිප්පාක්කු පෙති හතරක් පමන බඩ නොයනවාට කුඩා අයට කඩුත්තු නොයනවාටත් සාද පොවන්ඩ හොදයි.

ළමයින්ගේ අඩස්සියට

1. වැල්මී, හාල් පානු දියෙන් අඹරා එමෙන්ම දිය කර දෙනු. රත් කර දෙනොත් ඉතාම හොදයි.

ජ්වර පිපාසයට

1. බෙලි මුල්, සුදුළුනු, ගොටු කොළ මුල්, ටික ටික අරන් පෙති ගසා වතුර දමා තම්බා දෙනු.

2. ඉරිවේරිය ගහක් සහමුලින් ගෙන හීනටි හාල් සමග කැද උයා දෙනු.

පුංචි ළමයින්ගේ ලේ හිදත් සමග බඩ යනවාට, බඩ වැල් මතුවෙනවාට

දියමිත්ත, රසකිඳ, අතිවිඩයන්, කලාඳුරු අල, එක්කලන් බාග බැගින් කිරා අට පත එක පතට උනුකර දවසට දවස් තුන් සැරේ බැගින් දවස් දෙකට බොන්නට දෙනු.

අනුපාන:-
මී පැනි ටික ටික දමා දෙනු.

බාලයින්ගේ කට්ටු මුට්ටුවට

1. ඉරමුසු සා මුලින්, ගෙන්දගං තන කිරෙං අඹරා තන පුඩුවට ගා කිරි පොවනු.

බාලයින්ගේ සියළු ලෙඩට

2. මෝදගං, තිප්පිලි, ඉඟුරු, මිරිස්, සුදුළුනු, සුදුදුරු, අරළු, මෙ හැම බරට ජයපාලයි බැද චූර්ණ කර සැමදේට මීයෙං සකුරෙං ඉඟුරෙන්, සීතියෙන්, උක් හකුරෙන් ටිකක් දෙනු.

කුස පිලිකාවට.

1. වැට හිර කොල කඩ පිඹමෙන් උයා යුස ගෙන තැඹිලි දිය, මී පැනි, සඳුං යොද දෙනු.

2. කරද මුල් කාඩියෙන් කකාරා පස්කුළු බඩුලා කායම දෙනු.

3. හිරැස්ස, හිඟු, තිප්පිලි මුල්, සිවිය, රත් නිටුල්, කුරුඳු, මුරුංගා, වලගසාල්, උළුවා, සාදික්කා, කරාබු, වසාවාසි, ඉඟුරු, මිරිස්, කහ, අබ, ගොරක, එනුමෙයින් කායං පිස දෙනු.

4. හිඟු වේලා කොල එක්ක අඹරා දෙනු. ගුලිකර දෙනු.

බඩ උත්තිලට

පොල් කුඩු පලා, මිරිස් කොල, පොට්ටනි බැඳ තවනු.

පිපාසයට

1. උක් දඩු, ළුනු දියෙං කවනු.

2. තික දළු, දෙදුරු, උළුවා කොත්තමල්ලි අඹරා දිවේ ගානු.

3. බාලයින්ගේ කොඩිවින ඉදිමුන් වලට

තිපල්, ඇහැල මුල්, බෙලි මුල්, බටු මුල්, ත්‍රිස්තවාලු මුල් කලන් දෙකයි. මෙවායින් සේරම කලං හයක් කිරා ඉහත කී අතින් ඔසු කලං එක එක ගෙන මෙයින් පලමක් කිරාගෙන තැඹිලි වතුර නැලි හතර මනාවට කකාරා උදය උදය හතර වේලට දෙනවාය.

මෙම කසායට තැඹිලි පැන් ගස් කුරුම්බා ඉඳුල් වෙඩ හොඳ නැත.

විරේක බෙහෙත් කෑ කල නොයිගිලේ නම්

1. ඇහැල කොල කොටා යුස මැඩ තැඹිලි මුසුකර එහිම කලතා පුස්කර සීනක්කාරං මංචාඩි දෙක දෙක පුළුස්සා සුනුකර එහිම කලතා පතක් විවර පොවනු.

2. වැල්මී, බැබිල, සඳුන්, උක් පැතියෙන් අඹරා යටි පතුලේ ගානු.

3. සීරුස්ස පළු කකාරා මිරිකා රොඩු පෙරා හැර කැඳ පිස එඬරු තෙල් සුදුළූනු ගම්මිරිස් පෙරුංකායන් සමව අඹරා දමා පොවනු.

රාක්ෂග්‍රහදීන්ගෙන් වන රෝග නැසීමට

කපු ඇට, මොනර පිහාටු, හෙල බටු, පුදහල මල්, කුකුරුමුවන් පොතු, ජටා මාංශ, බලල් වසුරු, දහයියා, වදකහ, හිස කෙස්, නයි සැව, ඇත්දත් කුඩු, ගම්මිරිස්

මෙ හැම සමව ගෙන කොටා ලද ධූපය දෙනු.

උගුරේ ලෙඩට

පල්මාතික්කන්, අරළු, සිද්ධිගුරු, වැල්මී, තිප්පිලි, ඉද්දමුල්, සෛන්ධව එනු මෙකී බෙත් ගෙන අඹරා මුවග දරා කෙල ගිලිනු. උගුරේ ලෙඩටයි.

රත

1. ගොඩ කුඩළු කොල මෙකී කොල ඉස්මත් එනු තිබූ සැලියෙ කුඩුත් එක්කර උනු ගන්වා ගානු.

2. තිත්ත වැටකොළු, දෙඩං ඇඹුලෙන් අඹරා ගානු.

3. එම ඇඹුලෙන් රෙද්ද රදු රත්පිට එලනු.

4. ජයපාල කොල පොල් තෙලින් මලවා බදිනු. රත ගුනවේ.

5. බාලයන්ගේ දුවන පතින රත ඇතිවිට

1. ඉඹුල් මැලියන් ඉස්මත්, වදුරු වසුරුත් එක්කර අඹරා ගානු ගුනවේ.

2. යබර පුළුස්සා දෙඩං ඇඹුලෙන් අඹරා ගානු. දුවන පතින රත ගුනවේ.

3. කැකිරි කොල, ඉහුරු කොල, පොල් කිරි තැටියෙ වත්කර අව්වේ තිබා ගෑ කල අතට රත එයි.

4. ඉහුරු, වරා මල්, කබලක ලා උඩින් වසා අහුරු සේ දවා ගෙන දෙඩං ඇඹුලෙං අඹරා ගානු. දුවන පතින රත ගුනවේ.

5. ගැට තිපුල් පොතු, කහ, එනු තවරා උන අළුවෙන් තඹා ඔතනු.

6. එලගිතෙල් කලදයි, තල තෙල් කලදයි, එකට කලතා ගානු.

7. ඇ පොතු, උදුපියලි කොල, මුකුනුවැන්න කොල, හරංකසා කොල, තික කොල, රුක් අත්තන පොතු එම යුසින් ගටා රෙද්ද පිටරදු ගානු. රත ගුනවෙයි.

තිපල්, තිකුළු, දෙදුරු, ලසුනු, කොට්ටන්, වැල්මී, වදකහ, මෙහැම සමව කිරා ගෙන තනකිරි ලා අඹරා මුං ඇට පමන ගුලිතනා පවන වියලා තබා ගන්න.

8. කැට කැල පොතු, කැලිය පොතු, දමුන පොතු, මෙකීවා කහලුනු ලා කොටා මලවා බදිනු.

බිලිඳු රාජ ගුලිය

බිලිඳු රාජ ගුලිය අනුපාන.

1.
කිරිත් නොබි ඇඟ ශිතල කරව ත
බඩත් පිපී ඉසරුජාව කරව ත
ඉඟුරු මිරිස් එනුද යුෂ ගුලිදෙ ත
සීතල සන්තිය බිලිඳුගේ ගුණවෙ ත

2.
මොනර පිල්ද දවමින් අළු ගන් තේ
මී පැනි ගිතෙලින් සහ අනමින් තේ
ගුලිත් යොදු ලා සමකර දෙන් තේ
බිලිඳු අයගේ ඉක්කා නවතින් තේ

3.
නෙරළු කිරිද දෙහි ඇඹුල්ද ගන් තේ
කිරි ගරුඩය ගලගා අරගන් තේ
ගුලිත් යොදු සමකර දීපන් තේ
බඩරුජාව බිලිඳුගේ ගුණමෙන් තේ

4.
කොමා කොට්ට පොල් තෙල් අරගන් තේ
බමුකර සහ හකුරුද අරගන් තේ
යොදු ගුලිත් සමකර දීපන් තේ
මාන්දන්ද තුන් දෙස් නොතිබන් තේ

ගජ තෙක් රඹ උයනක් මැද යන් තේ
දියේ වැටුනු ලුනු කැටයක් වැන් තේ
ගිනි දුටු ඉටි උනු වෙනව ලෙශින් තේ
බිලිඳු රාජ ගුලියයි දැන ගන් තේ

5.
බාලය නෙත් උඩ ඇල්මට ආන ත්
උනත් සමග ලෙඩ තදකර ආන ත්
ඊට පනත් පෙති බිං පොල් ගතිමි ත්
පාවට්ටා දළු කුප්පමේනිය ත්

බටු දළු දිඹි බිජු සමග කොටා ග ත්
කඩ පිම්මෙන් තම්බා මිරිකා ග ත්
ඊටම තල තෙල් තන කිරි යොද මි ත්
මී පැති සහිතව ගුලිය යොමා දෙ ත්

6.
බැබිල ඉත්ත තිදීකුම්බා සමගි ත්
තලා දමා ඊට එක්කර කකාර මි ත්
බාලයන්ගේ උන වමනේට ආන ත්
මෙකි යුසට ගුලි යොදවා දීප ත්

7.
ඉඟුරු මිරිස් අබ වදකහ ගතිමි න
බින් මුල් සන්තිද නායන් ඇට ගෙ න
දිඹි බිජු මිරිකුළු වේලා මුල් ගෙ න
තික දළු කොසඹද දළු සහ අරගෙ න

කරාබු කුප්පමෙතිය දළු සමගි ත්
මෙ හැම එකතුව චූර්ණ කරමි ත්
තලද කොසඹ තෙල් දෙපතක් ගතිමි ත්
පලමුව චූර්ණ පොට්ටති බැද ග ත්

තල තෙල් පලමක් බේකුත් රැගෙ නා
පොට්ටතියද රත් කරමින් රැගෙ නා
දෙවනුව අවුසද මිරිකා රැගෙ නා
ගුලිත් යොද දෙයිනන් විගසකි නා

ඇහ ඉසගා බොන්නට දී පන් තේ
....
රිවිදුටු පිති බින්දුව සේ වැන් තේ
බාලයන්ගෙ හැම ලෙඩට බොලන් තේ

දසට සන්ති තිදීමත දුරු වෙන් නෝ
අතපය වෙව්ලා සීතල වෙන් නෝ
සන්ති මුරුත්තා සිහ නැති වෙන් නෝ
මෙකී ලෙඩට ශැක නොම දීපන් නෝ

සියළු වලිප්පු ඉලිප්පු ආන ත්
රතු සුදුළූනුද වැල්මී ගතිමි ත්
කොතබුරු කපුරුද සමකර ගතිමි ත්
පයොදරින් අඹරා ගුලි දීප ත්

තන කිරි ඉඟුරුද කංසා ලෙ ග ත්
දෙඩං පැඟිරි සුදුළූනුද සමගි ත්
හරන් කසා මිරි කුළු පොතු ගතිම් ත්
සියලු සන්නියට දීපන් මෙලෙසි ත්

මිල්ල පොතුද ගෙන කසාය කරමි ත්
පනුවන් වැටෙන්ට මෙ ලෙසට දීප ත්
පනු වමනය යනවා දුටු වොති ත්
බටුකරවිල කොල යුස මී පැතියෙ ත්

බඩිනුත් යනවා දුටුවොත් සොඳි නා
තිත්ත වෙරළු තිබ්බටු ගොටු කොලි නා
උඳුපියලිද ඉරමුසු කොල මුලි නා
දෙහි ඇඹුල්ද සහිතව ගුලි දෙමි නා

මෙකී බෙහෙත් සමභාග කිරා ග ත්
කන්සා කීකිරිදිය කොල යුසයෙ ත්
දිනක් අඹරමින් දෙකට බෙදු ග ත්
පංගුවකට නෙරුවාල දබර කි ත්

විරේක පන්ගුව ගිතෙලින් අඹ රා
ඕළු ඇට පමනට ගුලිකර නොහැ රා
පත්තියමට සිද්ධිගුරෙන් අබ රා
ඔලිද ඇට පමනට ගුලිකර නොහැ රා

බාලයන්ගේ සන්නිද පනු දෝස ත්
සන්නි මාන්දන් වලිප්පු දුටුවො ත්
අතපය වලංගු සිහි නැති වීම ත්
මෙකී ලෙඩට දෙනමාත්තු යහප ත්

දෙහිද දෙඩං නාරන් යකිනාර ත්
ඉයද පබුරු තික තුඹ බෙලි ගතිමි ත්
කොසඹ කුඹුරු කුඩු මිරිසද දළු ග ත්
කඩ පිම්මෙන් තම්බා ගුලි දීප ත්

නාබි තුඩෙ පනුවෝ තුඩු දෙන් නේ
බඩේ රුදුවෙන් බිම පෙරලෙන් නේ
ඇඟ දහලවමින් කෑ ගා මින් නේ
මීට දෙන්න අනුපාන අසන් නේ

කුඹුරට මද රතු සුදුළූනු ද ගන්නේ
දෙහි ඇට හින්ගුද දිමි බිජු ගන්නේ
වැල් තිබ්බටු සහ කසායත් ගන්නේ
ගුලියත් සම කර කසාය දන්නේ

මීටම රත්මල් කැකුළු ද පොතු ගෙ ණි
හීන් තැබල පොතු සහ ගතිමි ණි
අළු කෙසෙල්ද අල විලදද ගතිමි ණි
මෙම යුෂයෙන් ගුලියක් මෙහි දම මි ණි

සියළු මාන්දන් සහ ගිතියමට ද
ඇඟ පත සුදුමැලි කිරිමැලි විම ද
ග්‍රහ දෙතිස් දෙක බඩින් යනව ද
ඊට කියන් දෙන කසාය තිවර ද

බෙලි බැබිලද බටු මුල් වන් ඇපලි ණි
අබ හැර පොඩිදල් රතුළුනුත් ගෙ ණි
දුරු දෙක තිපලු තල අදුරුද ගෙ ණි
තිප්පිලි ලසුනුත් හින්ගුද ගතිමි ණි

එල කිරි වත්කර කසාය කරමි න
අට එක සිදුවා ගුලි යොදමින් දෙ න
සිළු පැන් එක්කරවාපන් සතියෙ න
අද්දුටු කසාය යහපත් වෙයිදූ න

ලුනු පස්වගයද එක්කර ගෙන වි ණි.
ඇඹුලුත් පස්වගයද එම ලෙස ගෙ ණි
කසාය කරමින් ගුලි යොදමින් දෙ ණි
පනු දෙස් මුල් සිදුවා සෙත කරමි ණි

පනුවන් නසන්ඩ දෙන සැටි අසප න්.
අබින් කිරි මිශ්‍ර සතු අඹරා ග න්
පොල් කිරිසහිතව කසාය කර දෙ න්
වැටෙයි කිච්ච තුන් පාටට පනුව න්

මාරාසහ මුලයෙන් අරගන් නේ
පට බෙලි මුල් සහ කසාය දෙන් නේ
මෙකී කසායෙන් ගුලියක් දෙන් නේ
සියලුම පනු දෙස් නසයි කියන් නේ

සින් තල්සේ බින් මුල් ගන් නේ
පොට්ටනි බැඳ තනකිරෙන් ගලන් නේ
එම යුසයෙන් ගුලියක් දීපන් නේ
බිලිදුන්නේ හැම සන්නි නසන් නේ

නාබි තුලේ පනු රුදුව දුන් වි ට
ලේන් සමග බඩ පාවන පැල ට
බඩ අල්ලා සිට කෙදිරි ගාන වි ට
මවු දෙතනේ කිරි නොබි ඇඩිම ට

ඉහල බලා පතුවත් යන ගමන ට
කැවුතු වහල්ලේ මීදියලුම වී ට
පතු දිය වමනය කරවයි එතකො ට
වමනෙට සිහියත් නැතිවෙයි බිලිඳු ට

උල්ලෝගත් පතු සන්තිද දහ අ ට
වලිප්පු සහ ඇස් කැරකී යනව ට
අනපය වෙවුලුන් පිටට හැරෙන වී ට
ඊට කියන දෙන කසාය අත්පි ට

තිකුලු තිපල් අබ කොල්ලුද ගන් නේ
අමු ඉඟුරුද ලුනු ද දෙවගින් නේ
දෙහිද දෙඩං නාරන් ඇට ගන් නේ
කුඹුරුද පුස් එරබදු ඇට ගන් නේ

කොත්තමල්ලි කහමුත් කන්සා ඇ ට
අබින්ද වදකහ හින්ගුත් තබා ඇ ට
කිරි විස්සති රත් කළු අත්තන ඇ ට
අඹරා මෙ දෙස පොල් කිරි වක්කො ට

තික දළු කන්සා කුඹුරු දළුත් ගෙ න
සත් සඳ තිබ කරවිල කොල අරගෙ න
දෙහි දෙඩං නාරන් දළු ගතිමි න
මෙකී මේ දලු එකම වරට ගෙ න

කොටමින් බාජනයකට ලවා ලා
අරක්කු කස පැන් දිය වක්කර ලා
ඇඹරු සරක්කු ඊට යොද ලා
කකාරමින් පතකට හිඳුවා ලා

පෙරමින් කසාය ගුලින් යොද ලා
තිබද ගිතෙල් සීනිත් සමකර ලා
බාලයන්ගේ සන්තිද දුරු කර ලා
සෙත දෙයි අත්පිට රුසියෝ වද ලා

රුදුව පෙරලිලි සිහි නැති වේත න්
කොත්තමල්ලි කුඹුරුද බිජු සමගි න්
වද කහ සහ ලුනු වතුරෙන් අඹර න්
තිම්ව්ව වතුරට ගුලිය දමා ප න්

උන සිටියත් බිලිඳුට වැඩි වී න න්
යකිනාරං පත් යුශ මී පැතියෙ න්
නොබසී නම උන බිලිඳුට අවෝති න්
වායි මොල රසකිඳ අමු ඉඟුරෙ න්

කසාය කර ගති මෙ දේ සමගි න්
බඩ කිච්ච ගිනි දුං විලයි න්
ඊටත් නොබැසී උන ආවෝති න්
කොත්තමල්ලි වැල්මිද කසායෙ න්

පිත් ගිනියන් වී උන ආවෝති න්
ඊට දෙන්න මතු අවුසද අහප න්
ඔලිද කොලත් මිරිකා යුස ගතිම් න්
සීනක්කාරන් රතු සුදුලුති න්

ගිතෙල් සමග ගුලි යොදවා දීප න්
ගිනියම් නොතියේ දිවි දුටු මුවමෙ න්
පනු සන්තිය බිලිඳුං ආවෝති න්
කරද මුලක් උපුටාගන විගසි න්

තන කිරෙන්ද ගල ගාලා ගතිම් න්
එම කිරෙන්ද යොදවා ගෙන දීප න්
බිලිඳු බඩේ අමු රුදුව ආන න්
සක්සඳ මුල් එනු වතුරෙන් දීප න්

මින්ද නොසිට හද කර ගත ආන න්
වද කහ ලුනු දිය දෙසී ඇඹුලෙන් දෙ න්
බඩ අල්ලා සිට කෙදිරිද ගාන න්
ලේත් මුසුව බඩ පාවන වේ න න්

කරද මුල්ද දෙසී ඇඹුලෙන් අඹර න්
එම ඇඹුලට ගුලි යෙදවා දීප න්
ගුල්ම සන්නි බිලිඳුට ආවෝති න්
කරද මුලක් උපුටා ගෙන විගසී න්

එන් නොසිට වැඩිකරගන ආන න්
වැල්මී පෙනෙලද කොල යුසයෙන් දෙ න්
පෙරලී බිලිඳුට සිහි නැතිවේ න න්
රුදුව සහ ගිනියන් වැඩිවී න න්

කොත්තමල්ලි හින්ගුද අමු ඉඟුරෙ න්
කුඹුරුද පුස් ඇට කන්සා කොල ග න්
කසාය අට එක සිඳුවා ගතිම් න්
දෙඩම් ඇඹුල් සීනිත් සම්කර ග න්

ගිතෙල් සමග ගුලි යෙදවා දීප න්
ඇරගෙන උන ගිනි දුටු වෙඩුරක් මෙ න්
බඩිනුත් යනවා දුටුවොත් නියති න්
වදකහ අල අලුකරමින් අරග න්

උනු වතුරට අළු යොදවා සොදී තා
මී පැති දෙහි ඇඹුලුත් ගෙන දෙමී තා
ඊටම යකිනාරං කොල පොතු සොදී තා
කබලකලා අලුකරමින් රැගෙ තා

ලුනුත් පොල් කුඩු සමග කොටා ගෙ ණ්
කඩ පිම්මෙන් තම්බා ගුලි දීප ණ්
මීටම තිබ දළු වදකහ සමගි ණ්
මිරිකුළු මුල් සහ කොටමින් උදුනෙ ණ්

මිරිකා ගෙන ගුලි යොදවා දීප ණ්
ගුල්ම සන්නියෙයි දිවි දුටු මුවමෙ ණ්
අමු රුදුව තදකරගන ආත ණ්
ඇශල මුල්ද ගෙන කසාය දීප ණ

ඒත් නොසිට තද කරගෙන ආත න්
උපුල කොලත් දෙසී ඇඹුලෙන් දීප න්
උල්ලෝගන් පනු රුදුව ආත න්
අමු වදකහ පිල මුල් සහ ගතිමි න්

අමු කන්සා කොල ගිත් ගතිමි න්
කසාය සිඳුවා ගුලි සමගම දෙ න්
ගිතියන් උන බිලිඳුට වැඩිවී න න්
පයෝදරින් වැල්මී ගෙන දීප න්

මී පැති සමගින් ගුලි යොදවා දෙ න්
බාලයන්ගෙ ජල වාතය බිඳිමි න්
රබ වනයට වන් ගජයකු විලසි න්
බිඳුවයි රුසිවරු කී බස මෙලෙසි න්

බාලයන්ගේ බඩ ගසාන යේ න න්
ඉඟුරු මිරිස් අබ වදකහ ගතිමි න්
අරළු බුළුත් වදකහ මුත් සමගි න්
කුඹුරුද තිබ කන්සා කොලග න්

දෙදුරුමෝද ගත් හිත් ගුද ගතිමි න්
කොත්තමල්ලි තිප්පිලි අබිනුත් ග න්
දෙහිද දෙඩං නාරන් දළු ගතිමි න්
තික කුඹුරුද තිබ කන්සා කොල සමඟි න්

හීන් තැබල කොල පොතු අරගන් නේ
රත්මල් කොල පොතු මල් අර ගන් නේ
කසපැත් ලෙලි මයිලය පළු ගන් නේ
දිවුල් ලාටුවෙන් දුන් මල ගන් නේ

දෙහි දෙඩං නාරන් අත්තන ඇ ට
හියබලාද ඇට තිබ කන්සා ඇ ට
ලාකඩ කොල්ලෑ ගලිසි සූං සමකො ට
කසපත් කටු දෙළුමුත් අරගෙන ග ට

මෙකී දේ සමභාග කිරා ගෙ ත
කබලකලා අළු කරමින් අරගෙ ත
බාලයනෙන් බඩිනුත් යනවා ද ත
දීපන් මේ අළු රුසිකිවු මෙලෙසි ත

බඩත් පිපී බඩ ගසාන යේ න න්
ගෙනැත් වරා කොල ලීපට දමාප න්
ඒ යුෂට අළු ලා ගුලිලා දීප න්
ඒත් නොසිට මේ ලෙසට තියේන න්

ඉඟුරු පතක් ගෙන කසාය කර දෙ න්
අළුත් සමග ගුලි සහිතව දීප න්
ඒත් නොසිට එම ලෙසට තියේන න්
මී පැනියට අළු ගුලි සහ දීප න්

ඒත් නොසිට තද කරගෙන ආන න්
බටු කරවිල කොල පොල් සහ කොටට න්
අළුත් සමග ගුලි යොදවා දීප න්
අද්දුවු බේතකි ශැකනොව දීප න්

ඒත් නොසිට තද කර ගෙන ආන න්
අළුත් සමග කරවිල කොල සමගි න්
නඩත්තු රුදුව වැඩිකර ආන න්
උදුපියලිද පොල් එක්ක කොටා ප න්

ඒ යුශයට අළු ගුලි යොදවා දෙ න්
ඒත් නොසිට තදකරගෙන ආන න්
පොල් මල් එරමිනි තුබ දළු ගනිම් න්
ලෝළු පොතුත් උදුපියලිද ගනිම් න්

අළු කෙසෙල් අල පොල් සහ කොටම් න්
මිරිකාගෙන අළු ගුලි සහ දීප න්
දිවුල් පිටොස් දෙළු මේ මද සමගි න්
කහ කුඩු කපුමල් බොකලද සමගි

මාන්දමට බඩ ගසානයේ න න්
කුඹුරු කොලත් යුෂ මිරිකා ගනිම් න්
අළුත් සමග ගුලි යොදවා දීප න්
ඒත් නොසිට මේ ලෙසම තිබේ න න්

දෙහිද කොසඹ දළු තෙරපා ගන මී ත්
ඒ යුෂයට අළු ගුලි සහ දීප ත්
ලෝළු පොතුද තික දළු යුස මැඩග ත්
ඒ යුසයට අළු ගුලි සහ දීප ත්

කඩුත්තු රුදුව වැඩිවි ආන ත්
බඩ වැල බිඳු සේ එලියට ආන ත්
රුදුව ආ විට කෑ ගෑ වේ න ත්
උල්ලෝගම සන්තිය ඔද එගෙන ත්

අළු කෙසෙල්ද අල කොටමින් උදුති ත්
ඒ යුෂයට අළු ගුලි සහිතව දීප ත්
සස්සඳ මුල් දෙසි ඇඹුල් ද සමගි ත්
අළුත් සමග ගුලි යොදවා දී ප ත්

උන අළුවෙන් තම්බා මිරිකාග ත්
අළුත් සමග ගුලි සාදව දී ප ත්
සිදන් රුදුව බිළිඳුට ඇත් න ත්
අලුත් සමග ගුලි කිලන් මෝරුවෙ ත්

කටින් බඩින් යනවා දුටුවෝති ත්
පානු දියත් අළු ගුලි සහ දී ප ත්
බිළිඳුට වමනේ බඩිනුත් යේ න ත්.
කොතඹුරු වද කහ කරුන්කාද ග ත්

කසාය කර අළු ගුලි සහිතව දීප ත්
ඒත් නොසිට තද කර ආවොති ත්
මීටම මතු දෙන කසාය දීප ත්
ඉසඟු තික කුඩුමිරිසද ගතිමි ත්

කටු කැලිය කපු කන්ද ගතිමි ත්
මෙමුල් සම කර සරියට ගතිමි ත්
කොත්තමල්ලි දුරු දෙති සමගි ත්
තිකටු කන් සමකරලා අරග ත්

පුවක් කරුංගඳ කහ අරග න්
අඹරා කසාය කරගත විගසි න්
කිරී වමනේ සහ ගසාත යේ න න්
රඹ උයනට වත් ගජතකු විලසි න්

බිපු විටම කිරි වමනේ නසම් න්
තිප්පිලි මුලක් සමකර ගනිම් න්
එල කටරොඩු මුල් සමකර අරග න්
මෙ දේ චූරණ කරලා අරග න්

මී පැති තන කිරි ගිතෙල්ද ගන් නේ
චූර්ණ සහ ගුලි යොදු පොවන් නේ
බඩින් සමග වමනය නවතන් නේ
අත් දුටු බේතකි සැකනොව දෙන් නේ

කිරි වමනේ බිලිඳුට වැඩිවෙන ග න්
ඊට තවත් මතු අවුසද පවස න්
සිවස බලල් ලුනු තිප්පිලි සමගි න්
සහිඳ ලුනුත් කැට සමකර ග න්

මෙලෙසට අවුසද සමකර ගනිමින් යොදු එගිති පිට තබමින් නේ
අලෙසට වියතුති ගන්නා සරක්කු ඇසුවෝතින් මෙහි දැන ගන් නේ
නොලෙසට ලසුනු දෙදුරුත් මෝදක තිප්පිලි වම්මුතු අල ගන් නේ
මෙලෙසට සාරන වැල්මී සමගින් කොට්ටන් උග්ගඳ අරගන් නේ

තිපල්ද සමගින් තිජාතිත් ගෙන වලහ සාල් මෙහි ගන් තිබ දේ
සතකුප්පද සහ අති උඩයං ගෙන සීනක්කාරං ගන්න සො දේ
හිඟුරු පියලි සහ හරන්කහඳ ගෙන පැපිලිය මහ ඔසු මෙ අවුස දේ
ඇඹුලෙන් අඹරා ගත හැම අවුසද පවනේ වියලා ගන් තිබ දේ

දත් ඉගිලු සන්නිය දැන ගන් නේ
දෙඩම් පැහිරී මෙ සළුවත එලන් නේ

පෙර ඉසිවරු පැවසූකල නිති තේ
සත් සිද්ධ පත් කතුන් කී නිති ලෙසි තේ
ගිරද ගැසූ රේඛා මෙන් ඇදී තේ
රිවි දුටු පිනි බිඳු ලෙස ගිය නදී තේ

යසක් සන්නි දුරු කරවන ලෙස ට
බයක් වේය දිවි දුටු මුව ලෙස ට
තොසක් වේය දුන්නොත් දූන එවි ට
සොක්කනාද ගුලි හිම වෙයි කි වි ට

සැවැන්දනද ඉරිවේරිය සමගින් කුඩු මිරිසද තික මුල් ගන් නේ
දෙහිද දෙඩම මුල් සමකොට ගතිමින් කුරුඳුද පිල මුල් අරගන් නේ
සහිතව මෙ හැම කොටමිං අවුසද භාජනයකි එහි තබමින් නේ
මෙකී දූන වියතුනි කිව තෙල් සමගින් තිලා තෙලේ බලදූන ගන් නේ

කුරුඳු මුල් පොතු එම ඇටත් සහ එඩරු මුල ගතිමින් තො ශා
කරද හික් මුල් මිරිස් මුල් ගෙන කරවිලද මුල් ගෙන තො ශා
කුඩු මිරිස මුල් මල බුලත් නැටි තිපල් ගතිමින් නොවල සා
මෙකී ඔසු එක එක් පලම ගෙන සැලක දමමින් ශැද ග සා

සොලොස් පැන් කලකුත් දිය සිඳවමින් ගෙන සතිර ටා
එඩරු මී තෙල් පොල් තෙලුත් ගෙන නැලි දෙකක් එහි වත්කො ටා
දේවදරු අසමෝදගං දේවදුරු සතිකුප්ප සතු ටා
හිඟුරු ගජ තිප්පිලි වග පුල් පත්පාඩගම ගෙන තු ටා

කකාරා පමණ දවස තුන්යම පදමට තෙල් බා ගන් නේ
සද සොදට තෙල් තනා තියාගෙන පිං වී සතරද කර නොලසින් නේ
රුදසි සහිත එන වාත සන්නියට ඇගේ ඉසේ තෙල් බැදපන් නේ
සද සොදට එන සන්නිද දහ අට පිට ගැස්මට තෙල් ගා පන් නේ

වියතුනි මෙතෙලින් නස්නද කර එන කපාල සන්නිය දුරු වෙන් නේ
පැවසූ විලසට නෙතටද ගසමින් සවනත වක්කර විගසින් නේ
සතහට පැමිණෙන අනු මුටමු සහ වැදූ අයගෙ ලෙඩ වනසන් නේ
පැවසූව වියතුනි පෙර සිටි රුසිවරු සන්නිරාජ තෙලය දන් නේ

ඉඟුරු පියලිද සමග ගතිමින් කලං තුන තුන තොලැයි තේ
ඇඹරුවේ ඔසු තෙලෙහි කලතා ලිපෙහි මද ගිනි තොලයි ණේ
පිරිත් පුරවා නූල් වට ඇදවයිදු ලහ ඉඳ තොලයි ණේ
මල් බුලත් රන් පඩුරු සදමින් උතුරු දිග පුද කරමි ණේ

කල්ක ලනුසේ පදන් ආ විට දියට බා පෙරමින් ය ශේ
යුතුව බජනෙක සේ වත් කොට කොට්ටන් දුන් දී තො ශේ
තෙලුත් ඇඟ ඉශ පාන කරවා නස්න කෙස්වල ගෙල බ සේ
සියලු රෝදුක් නොරදවා ශේන පලෙයි රිව්දුටු පිණි ලෙ සේ

වාතයෙන් ගත සන්දි කොටුවද කොන්ද කැක්කුන් ඉසර දේ
සීත සගතු උනද කුසතුල නොයෙක් රෝදුක් දුටු ලෙ දේ
දසට සන්හිද වැදුගෙයි ලෙඩ අගන කුස වදවු දෙ දේ
ලුනු ඇඹුල් ඇර පාන් කිලහොත් නොයෙක් කුස ලෙඩ සංසි දේ

ජේන ලෙඩ සහ හුනියන්සම පිල්ලි අත්ගත් සර්ප විෂට ද
නලලතෙහි ගා නාස් ඇරිකල සේය රිවි දුටු පිනිබිඳක් ලෙ ද
කයත් දිරවන බූත ලෙඩ සහ පිස්සුවෙන් වන අපස්මාර ද
ලූනුත් පිලිහුඩු නොකා ඉසතෙල් ලමින් දිය නාපුවොත් යෙයි බි ද

කතුන් බඩ සහ යෝනි හිරි දෙමින් ලේ පිත් සංවාස බැරුව ද
ඉතින් තුන් දින කුස තුලේ ගා කොට්ටං දුං ගෙන ඇරිම ද
නිතින් ලැමදෙහි තෙලුත් ගාගෙන සැතපුනෝතින් වේය ගනත ද
බසින් බොරු නෑ ඉසිවරෝවක් මනාවෙති මෙ සපිරිසින් වැ ද

පසුව ලිඟු ගත අකුලුවාගත උකුල යටිබඩ හිරි වැටිම ද
විසුව ලද වෙන බැරුව නතරව නහර පත නැති පීතට අපිරි ද
ගගස කොඳු තුල ගෑවොත් මෙතෙල් කිපිව අරන් ලෙසට සිතුන ද
කෙනට ශිදි නොව වෙනට තුන්යම වේය සංවාසයද පිරි මැ ද

කොට්ටං දුන් ලවමින් රිවිදින වදයේ අසුනොවී තිලකුනට වැලකි ය
සතර සිව් ශැට ප්‍රේත් මියෙති නිතර ගැවොත් තමා කලල ය
දැති කර තෙල් ගැවෙන්නද දුනු අදිති අත් යදම වෙනි පී ය
ඊශ්වරයෝ මනාවෙන් මෙ දිවැශ අන්ගත බලැති තෙල ය

පුසකර පුලුස්සං දෙහි ඇඹුලෙන් ද
ජලමල අඩස්සි ඉන්නො තිබෙන් ද
වෙවුලුන් සන්නියා මදුරු කොලින් ද
සීතල සන්නිය බුලත් යුසින් ද

කුඩු මිරිස්ස කොල යුසයෙන් දුන්න ත්
මාන්දමින් ආ සන්නිය ගුනවෙ ත්
අංගගිරිය සන්නිය මල පැවො ත්
වෙද කසාය යුසයෙන් දෙනු ගෙන දෙ ත්

සෙලෙස්ම සන්නිය ආවොත් ලෙස ටා
එරමුදු පොතු යුසයෙන් දෙනු මෙ වී ටා
දෙඩනා සන්නිය ආවොත් මෙලෙස ටා
දෙඩං ඇටද පොඩිකර දෙනු එම වී ටා

කඩුත්තු සන්නිය ආවොත් දන් නේ
කොසොඹ තෙලෙන් සැක නැති වම දෙන් නේ
කටිං බඩිං යන ලෙඩ අට ගන් නේ
දිය මිත්තය යුසයෙන් ගුණ වෙන් නේ

යකිවනස්ස කොල යුසයෙන් දෙන් නේ
යක්ෂ පිශස් ලෙඩ ඉන් දුරු වන් නේ
ඉස ගිනි මුල් සහ කසා යොදන් නේ
ශැග උන නාඩිය ඉන් ගෙන්නන් නේ

වාත කිපුනොත් තික කොල යුසි නා
උක් පැණියෙන් දෙනු නැති පිත් කිපු නා
කරිවිල කොල යුසයෙන් උන බසි නා
සෙං යව්සව් තැන දෙඩං පැගිරි යෙ නා

හිහුරු මහන් ගෙඩි ඉස්මෙන් දෙන් නේ
ගලක් කරා ලෙඩ ඉන් දුරු වන් නේ
තුං දෙස වැඩි උන බව දැන ගන් නේ
තිපල් කසායෙන් ගෙන බෙදමින් නේ

දංපනා කොල යුසයෙං දෙන් නේ
ගොලු සන්නිය ලෙඩ ඉන් දුරු වන් නේ
ඔල්මාදය පිත් ගිනියම වන් නේ
තන කිරි ඉගිනිද ගලගා දෙන් නේ

සෝප සන්නි බඩ රුජාම සත් ණි
සෝප නැතුව ඇසලද පොතු යුසි ණි
දීප නොවන තිදිමත එන සැති ණි
කෝල නැතුව ඇසලව කට කෙලි ණි

ඊටට තැඹිලි සන්නිය දන ගත් තේ
කුකුලු තැඹිලි යුසයෙන්ම දෙවන් තේ
දත් ඉඳුලුනු සන්නිය දන ගත් තේ
දෙයි ඇඹුලෙන් දනිමුල ගා ගත් තේ

උස් මුරුතාවී එන සන්නිය ට
දද පලෙයි වද යුසයෙන් එවී ට
ඕනල සන්නිය බඩින් යනවා ට
ම්හනාරන් යුසයෙන් දෙනු එම වී ට

දසටන් සන්නිය ආවෝතින් තේ
පස්තෙල් ගුලි පස් පැසවා ගත් තේ
තස්නද වස්නිය ගල්ලති සත් තේ
සියක් සන්නි දුරු වෙයිතල සත් තේ

ඊටම පාවට්ටා කොල යුසයෙ ත්
ඊටම ගොන් කැකිරිය කොල දැස්මෙ ත්
ඊටම තෝරුද කොල එම දැස්මෙ ත්
ලුනුද වැල්මී සමකොට මෙලෙසි ත්

පලමල අඩස්සි නොතිබෙයි එගෙන ණ
කැසි මුස උඩා මින් වැඩී ඊන ණ
ඉඟුරුද මී පැනියෙන් දෙනු මෙලෙසි ණ
තලා කොලෙන් දෙනු වලිතය ඒත ණ

ඊටම ගැඩවිලි තැඹු දියෙන් ගෙ ණ
වමනය වී නන් දෙඩං ඇඹුලෙ ගෙ ණ
බෙලි දළු කන්නිරි කූ බටු මුල් ගෙ ණ
සිඳිමින් සන්නිද උන ජල නොතිබෙ ණ

ඊටම දෙන්නේ මුලප්පාල ඔය ණ
ඊටම තුඹ කොල යුසයෙන් මෙලෙසි ණ
ඊටම මෝරින් යොද පොවනි ද ණ
සෙත් වැඩී ඒනත් එරමුදු පොතු ගෙ ණ

වච්චනාවී සාදලින්ගම් ඔන්කාර පුස්කරද ග ත්
මීට සිනක්කාර රසදිය රත් සඳුන් සහිදිය ලුනු ත්
ඊට තිප්පිලි කරාබුත් වසාවාසි කළුදුරු සුදුදුරු ත්
මීට සාදික්කාද මෙ සමබරට ජයපාලය කිරා ග ත්

ගෙනත් කංසා කොලද යුසයෙං ගටා කිරගේ සිනිදු යේ
ගෙනත් පසු දෙසිඹුලෙන් අඹරා ගුලිත් මුං ඇට පමණ යේ
ගුනත් අනුපානය බලා දෙන් තිගැස්සුම් හතියට ල යේ
ගෙනත් දිමි බින්තරද බිං මුල් ලුනු තන කිරි මුසුව යේ

උල්ලොගමට කැප්පිටියා කොල, පොතු, පොල් උලේ ලා ගෙඩියක
ගුරුල්ලා පොතු, පනං පෙති, කැප්පිටියා කොල, පොතු, පොල් උලේ ලා ගෙඩියක

වැදු ගෙයි සන්ති දෙඩවිලි තිකන් සතිහට පැමුනො ත්
යෙදු ලෙස යක්වනස්සද කොල රඹුක්මද සුදුලූනුග ත්
සැදු අවුසද කොටා කඩ පිට උයා මිරිකා හෙයුස ත්
යෙදු යූසයට කොසඹ තෙල් සමකර දූනොත් ගුන කර දෙව ත්

සන්ති දහ අට පිට ගැස්ම යන අනු පුටවුද කර තදි න් නේ
ගන්නා අවුසද මුරුංගා මුල් ඉඟුරු දිමි බිත්තරින් නේ
කුප්පමෙනිය යක්වනසු පත් ලසුනු ඊටම සමකරන් නේ
හතක බින් මල් ලසුනුව ශලිෂ්ට දෙඹ වදකහ පැහිරි සම කරන් නේ

මෙකී අවුසද කොටා කඩපිට උයා මිරිකා ගෙන තොසි නේ
ඊට ගුලි සමකරම දූන්නොත් කීව ලෙඩ ගුන කරන් නේ
මෙකී අවුසද කිව්ව රුසිවරු ලෙඩට අන්දුටුවයි ලසින් නේ
කුත්තුරා කෝල ඉලප්පුව වං ඇපල මුල් ඊට ගන් නේ

ගන්නා දිමි බිජු සමව කඩ පිට උයා මිරිකා තබා තෙලි ණේ
බඩ රුජාවෙන් ගසා යානන් කුඹුරුමද වද තිහද ග ණේ
මිරිස් සුදුළූනුත් කසායෙන් කොසඹ තෙල් සමකර දෙව ණේ
උනත් කෝලේ ඉලප්පුව ආකලට තදවී පිපාශෙ ණේ

සන්තිද ඉදි මුත් ඇවිලිලි ඉලප්පුව ආකල තදි න්
ගන්ඩ පාවට්ටාද මුල් සුදුලූනු දිමි බිත්තර ශොදි න්
දෙන්ඩ කඩ පිට උයා මිරිකා ඊට මුසුකර තන කිරෙ න්
දෙන්ඩ පෙර ඉසිවරුන් කීවේ සිළු කෝලේ යයි දුරි න්

ඊට තන කිර ඉලප්පුව ආකලට බැලුවොත් ශොදි නේ
මීට සඳුනුත් ශැවැන්දන තන කිරෙන් දූන්නොත් ශොදි නේ
ඊට ලුනුත් උයා යූෂ ගෙන කොහොඹ තෙල් සහ පොවන් නේ
ගිගය මුන් සහ උනට ආකල කලාදුරු ඉරිවේරි ගන් නේ

මීට කෝලේ ඉලප්පුව ගිනියමුත් ආවා උනදුටො ත්
ඊට එනුත් උයා යූශගෙන කොශඹ තෙලයෙන් සමහර ත්
ගිනියමුත් සහ උනට ආකල කලාදුරු ඉරිවේරිය ත්
සීනි සහ තිපළුත් කසායෙන් ඊට දිපන් ගුන කරෙ ත්

ඉලප්පුව හෝ තිබේ සමදර සදෙඩබුළුත් සමකර දෙව න්
බැන නැගී සෙං අදිකවීනත් කුප්පමේතිය තල තෙ ලෙ න්
දෙන්ඩ කෝලෙට උනට දෙසී පොතු දෙඩං පැගිරීත් සමකර න්
ගෙන තිබද බටු මුල් තලා යුස කකාරා දෙන් තන කිරෙ න්

.... ඇවිලිලි ආතන් කුඹුරු එරබදු පොතුද ගන් නේ
සේම එනු දී රන්ද කොලත් සුදුළුනු කඩ පිට ගෙන පොවන් නේ
යුදට පැලබත් වාත පිත්තය ශෙලෙශ්මාලාලි එක්ව එන් නේ
ගනට පැලඩෙශ කුත්තු කොලේ වලිප්පුව ඇරයෙයි ශොදි නේ

දසට සන්තිද කෝල දහ අට නෙක වැදුනු ලෙස ගිය ඉති න්
දෙසට පත්වන වැදුගෙයි ලෙඩ ගියාමේ උනු උනාවෙ න්
බිත කර එන වාත සන්තිද යං ඔයෙයි ආපසු බයි න්
දසට සන්තිය බිඳින සමයෙක මෙවෙති කිරි බත් තලිගෙ ගුනයෙ න්

දෙදුරුත් තිප්පිලිත් අසමෝදගම් ගෙ න
තිවගය කොට්ටං කොත්ඹුරු ගතිමි න
ඝනක්කාරං සිගු අබිං ගෙ. න
කිරමිශ සතිරං සහිද ලූනුද ගෙ න

වලහසාල් කටුකරොහනද ගෙ ණ
සිද්ධිගුරුත් යහමින්ද ගතිමි ණ
අරළු නෙල්ලි බුළු තුන එක්ව ගෙ ණ
මෙකී මේ දේ සම භාග කිරා ගෙ ණ

එරබදු කොල පොතු ඉඟුරුද යුෂගෙ න
මෙකී යුසයෙන් සතියක් අඹරා ගෙ න
මුං ඇට පමනට ගුලිකර තබමි න
........නය නොවරදවා දෙවටි න

බාලයන්ගෙ සන්තිය දුටුවෝති ණ
තන කිරිද ඉඟුරුද යුසගෙන දෙවටි ණ
තවත් ඊට ගුණ නැතුවම ආ නැ ණ
තිකද කුඹුරු පාවට්ටා දළු ගෙ ණ

තෙරපා කඹ පිම්මෙන් තම්බන් නේ
මිරිකාලා යුස සමකර ගන් නේ
තන කිරි මීපැනි සමකර දෙන් නේ
බාලයන්ගේ උන නසා තිබෙන් නේ

සන්නිපාත නොබහින උන දුටුවො ත්
තිඹ පොතු ලසුනුද සම කර ලා ග ත්
තෙරපා කඩ පිම්මෙන් තම්බා ග ත්
මිරිකා යුස තන සමකර දෙ ත්

ඊටම තිප්පිලි වදකහ අරග න
කොත්තමල්ලි සුදුළුනුද ගතිමී න
තලා ශැලක ලා කසාය කර ගෙ න
ගිතෙල් සමව දෙනු ගුනවෙයි සැනකි න

ඊටම තන කිරි ඉඟුරුද යුස ගෙ න
සීනිද මීපැනි ගිතෙල් සමගි න
එහි ගුලි යෙදවා ලා ගෙන දුන් තැ න
බසීය නොබසින බාලයාගේ ද න

වෙවුලුම් ඇග උණ නොබසිතියේ න ත්
පාවට්ටා කොල මුල් පොතු අර ග ත්
සුදුළුනුත් සමකර තම්බා ග ත්
ගිතෙලුත් ඊටම සමකර දීප ත්

බාලයන්ගේ බඩ ගහගෙන යනව ම
මේ අවුසදයේ ගුනවෙයි අත්පි ට
බඩත් රුජායි වමනෙ ආ වි ට
වද කහ කුඹුරු දළු ගෙන එම වී ට

යුශ මීරිකා ගෙන කිරියෙන් දීප ත්
තවත් බඩින් බිලිදුහට යේ න ත්
රුදු සහිත ලේ බිංදු යේ න ත්
බින්තඹුරුද කොලා දෙහි ඇඹුලෙන් දෙ ත්

තුඹු යකිනාරං පත් සිද්ධිගුරෙ ණ
යුෂ මීරිකා ගුලි යොදවා දෙන් දු ණ
හෝ තලාද තුඹ කොල යුසයෙන් දු ණ
.... වෙව්ලුම් උන ගුණ වෙ ණ

බාලයන්ගේ බඩ ගහගෙන යන වි ට
කපු කොල මල් බො කොලත් ගෙන එම වි ට
යුෂ මීරිකා දෙහි ඇඹුල්ද ඔසු කො ට
ශැක නොව දීපන් ගුණවෙයි අත් පි ට

මීට දිවුල්මද එම කොල මීට ගෙ න
හීන් තඹල කොල පොතු සමකරගෙ න
නෙරපාලන දළුවෙන් තම්බා ගෙ න
මීරිකා යුසයට ගුලිලා පොව ගෙ න

ඊට දෙළුන් ගෙඩියෙන් මද සමගි න
ඊට දිවුල් ගෙඩි කොල පොතු සමගි න
එම් ගෙඩියේ මද එම මුල් අරගෙ න
කසාය කර මීපැනි මුසුකර ගෙ න

වම්මුතු කංසා කොල තන කිරි ග ත්
වමනෙට කංසා මීපැනි විලදී ත්
දකිනවාට වද කහ අල යුසමය ත්
ඌටම එම කොල යුස මීරිකා දෙ ත්

බාලයන්ගේ උන නොබැසියේ න ත්
ගිනියං කර සෙම ඉලප්පු වේ න ත්
බින්තල් අල අමු ඉඟුරුද ලසු වෙ ත්
තෙරපා කඩ පිම්මෙන් මිරිකා ග ත්

මිරිකාලා යුස සමකර අර ග න
දෙඩං ඇඹුල් එම පැහිරිත් අරග න
කුප්පමේනි තල තෙල්ද සොඳ ගෙ න
බිලිදුගේ වලිප්පු ගුණවෙයි මෙලෙසි න

කොත්තමල්ලි වැල්මී සමකර ග ත්
රතුළූනුත් සම කසාය කර ග ත්
තනකිරි ගිතෙලුත් සමකර දී ප ත්

රුද වැඩිය ලේ සිදන් යා න ත්
කංසා කොල එල කිරෙන් දීප ත්
ඇඟ දහලවමින් අඩත් ගසාප ත්
ඉඟුරු කුඹුරු සුදුළූනු කසාය ත්

කොසබ කොල දළු එම තෙල් සමකර ග ත්
ඉඟුරු සුදුළූනුත් සමකර ග ත්
බිම්මුල් දිමි බිත්තර සමකර ග ත්
තුන එක්කරලා කසාය දීප ත්

දිව කටු නැත්තමිං ඔක්කාරය වි
තිදිමත නං සිහිනෙන් සිහි වෙ වි
ලවුනු කිරි ඇඟ සුදු මැලිවේ වි
දෙඩවිලි උස් මුරුත්ත වේ වි

පාවට්ටා වැල් තිබ්බටු ගන් නේ
කොත්තමල්ලි වැල්මී සමගින් නේ
බිම්මුල් සුදුළූනුත් සමගින් නේ
තිප්පිලි තුන් ලා කසාය දෙන් නේ

ගිනියං ඇඟ උනනං බසියි සෝ නේ
රුද වැඩිව ලේ සිදං යන් නේ
ඔක්කාරය වී විකාර වෙන් නේ
උල්ලොගන් සන්තිය දූන ගන් නේ

නාබි තුලේ පනුරුදව එන් තේ
කුඹුරු ඇටද දෙසී ඇට අරගන් තේ
කංසා කොල පිල මුල් අරගන් තේ
කකාරමින් ගුලි දෙක දෙක දෙන් තේ

ගිනියම ඇඟ උන නොබැසි ගියේන ත්
කොසඹ තෙල් දළු පොතු ගෙන දීප ත්
ඔක්කාරය වී විකාරවී න ත්
මී පැති විලදන් සමකර දීප ත්

විරේක දී බඩ ගසාගෙන යේ න ත්
ඉඟුරු තන කිරි යුස ගෙන දී ප ත්
අමුද දිවුල් තම්බා උන අළුවෙ ත්
කංසා විලදක් මී පැති ගෙන දෙ ත්

සාදික්කා සුදුදරු මදටිං දෙක කරාබුවෙන් ගතෙත් තුන ලු
කුඹුරුට කන්සා බිජු සය පරකිං වත්කං බිජු මදටිං අට ලු
සුදු පාසානම මීමුරුවට ගෙන සිවු සිවු මදටිය බර කිරි ලු
මෙ ඔසු තිවං දවාගෙන සිරියට මෙ හැම බරට ලිංගං බර ලු

මෙම සල්ගිරබින් මැද සුනු කරමින් පළමුව ආ දුක යුස අබ රා
පෙමකර අඹරා දෙවෙනි දිනට ගං සුටිකායෙන් වෙයි මිතු රා
තිමකර සිදුහත් බිජුමෙන් ගුලිකර පමන ගිමන් කරඩුව අසු රා
.........ලෙඩ තිවරද දූනගන දුන්නොත් ගුනවෙයි අනුපානං සොඳු රා

කෝල ඉලප්පුව ආ අවි අරහන් හිඟුරු පටද දෙඹ මෙ පැහිරි ත්
කුප්පමේතිය සහ තුඹ පිට මිරිකා මයුර ගල්ද බිනකර අරග ත්
තල තෙල් මීපැණි නෙලුං මුසුකොට ගුලිත් යොදලා දුන් කලට ත්
ලීලිය කර දෙයි තුං විට දුන්නොත් කෝලය ඇවිලිලි ඉලප්පුව ත්

ඒත් නොසිට වැඩිකර ආවේ නම වැටහිරි මුල් හිඟුරු පට ග ත්
සිත් තොස වදකහ සමග කොටා තෙරපා කඩ පිමමෙන් මිරිකාලා ත්
ගාමෙ
බිත්තර බිංමුල් එංශාල් සරියට පයෝදරෙන් අඹරාසොඳ වෙමි ත්
අත්පිට ගුණවෙයි ගුලියට කරදෙන් ගුනවෙන ලෙඩ මෙකී පමණ ත්

......වලද මාන්දම දුටුවිට දීපං එරබදු වැටහිරි තෙලෙ ත්
මැලිනොව දීපං ඊටම දූනගන තිබ තෙලං සහ උනු වතුරෙ ත්
යලිනොව වදකහ බටුකරවිල පත් යුෂ ගෙන සති ඊටම දීප ත්
කලිවැද පලයෙයි ඉක්කාවට දෙනු කොසඹ තෙළුත් ගෙන උනු වතුරෙන්

පහයන මුත්සති කපුමල් සිදිලා ඉක්කාවට දීපං අඳුර ණ
දූනගං රනවරා නෙරළු කංසා සහ මන්තං රේණුත් ගං මිතු ණ
ගෙන දෙන යෂ්ටිං වීපොරි එක්කර මීපැනි සහ තිරගේ ඇඹ ණ
දෙනවිට මීපැති සමකර ගුලි දෙනු ගුණකාරවයි ඉක්කා නපු ණ

මීටත් කිව වැඩිකර ආවේ නං කපු මුල් එනසාල් ඇට මී
මීට සුවද කොට අඩුද වගපුල් ගිරග තුලේ සිග ඔසු වැඩ මී
පාට බලා අංනෂී ඇඹුලුත් ගෙන හඳුං ගිතෙල් සමකර දෙව මී
........වන මුත් බඩිං යතොතින් මීරිශතඩුද ගෙන උනු දීයෙ මී

පොතු ගෙන මීරිකුළු යුසයෙං දී බෙලි මුල් පොතු ග න්
මතුදෙං රත්මල් තැඹිලි පොතුද ගෙන හඳුදෙ අබ මුසු කිරගන් නේ
අතුගෙන කංසා උග්‍ර කශායට දෙඹ මුල් සමකරලා දෙන් නේ
අතුවෙති වියතුනි! බිඩිං යතෝතිං මෙ අවුසද දූන දීපන් නේ

මාලේ යන විට පොල් මල් යුසද නෙළුන් රනවරා මල් ඉස්මෙ න්
ආලේ කර දිවවද කොල පොතු ගෙන කසාය කරමින් මුසුකර දෙ න්
ලීලේ හඳුනුත් ඉඟිනි ඇබද ගෙන අඹරා දෙසි මුල් ගෙන දීප න්
කෝලේ නොව මහ ඔසුගෙන මිරිකා කලු උක් රසයට සමකර දීප න්

මාලේ නවතියි උදුපියලිය ගෙන නෙරළු කිරෙං මිරිකා දෙන් නේ
කෝලේ නොවි වේලා කොල යුසයෙං ගුලිත් යොද සමන තලන් නේ
කී ලෙස තිවං ද හවෙ තෙල් ගුල සහ පැසවා ඇහ බැදපන් නේ

අත්කාරම දෙඩවිලි උන සහ හැති කකියා එන ලෙඩ දුටුවො ත්
වැදුගෙවත් යහපති දූන දීපං වැඩිකර එන දූන බලව ත්
ලැයද අඩස්සි වදන විට දූන බවුක මී මුසු කරම දෙව ත්
ඊට තවත් වැඩිකර ආවේ නං වැල්මී යුසයෙහි තෙලටම දෙව ත්

තියං මුවං මද මී පැහියෙන් ඡදං ඊට පෙනෙල සියඹලා බොරෙ න්
දෙවං මිට බවු කර තීල තෛලනේ උනට දෙවං කොල යකිනාර න්
අරං බැබිල බෙලි බවු මුල් අරළු දිය කර උනටම දීප න්
දෙවං වැදුගෙයි උනට කසායෙං වේල මුල් තිප්පිලි අර න්

ඊටම තව දෙන් අනතී පත්‍ර යුස ශ්‍රින්ගිත් ලා සිඳුවා පැහියෙ න්
මීටම තිබ තික පත් මිරිකුලු පොතු කඩ පිම්මෙ මිරිකාලා දීප න්
තුට කර වැටහිර තිකපත් උදුනෙහි ලා මිරිකා මදු සමකර දෙ න්
දුට දං ඇදුරනි සියලු උනට දෙන් වෙරකලා සිදගත් තුනයෙ න්

ලැයද අඩස්සිය දුටුවිට තිරද තිබ්බවු තම්බාතීල තෙලෙ න්
කියම උනට වේලා කොල යුසයෙන් නාගවල්ලි නම තල තෙලෙ න්
වියතුනි බිලිදුගේ උන දුටුවොතින් පිටවක්කා රතුළුනු යුසෙ න්
තියතිං උග්‍ර පයොදර යුසයෙන් යොදවාලා ඊටම දීප න්

බෝව ආතුර බ උයන වං ලෙයත් දෙෂට බිදි යමයකු ලෙසි න්
සේම අල පොතු නෙළු පොතු ජලයේම නොරදර ගිය ලෙශි න්
කව කිලියුග වරුසාවට දං රුසිවරුං පවතින ලෙසි න්
ජීවකය රත්නාදි මෙ ගුලි ශෑදුව මතු පවතින ලෙසි න්

වම්මනා වලින් ගත් රසදිය ළු
මනෝශිල හිරියල් මිරිගැට ළු
එ පැමරි තෑ ගන්දක පුස්කර ළු
ඉඟුරු ගම්මිරිස් හරං කහ ළු

සුද්ධ ලෙසට ගෙන අරළු දෙබාගෙ ය
වීස හැර තෙරුවල ගෙන තුං භාග ය
ගෙන සොඳ කිකිරිඳිය කොල ඉස්ම ය
දෙවනුව ජටාරාමය කොල ඉස්ම ය

තුන්වෙනුව මුරුංගා කොල ඉස්ම ගෙ ත්
අඹරා මුං ඇට පමනට ගුලි ගෙ ත
දසටත් සන්තිය ආවොත් තිති ත
කොසඹ තෙලෙන් දෙනු ගුලි මේ තිසැකි ත

බඩත් රුජා වැඩිකර ආවේනන් දෙසු මුල් සහ ගුලි ගත් නේ
ඉඩ නොහැරම කුඹුරුද පත් තම්බා යුස මිරිකා ඒටම දෙන් නේ
තඹ කොට වදකහ මිරිකාලා තවන දියත් මුසුකොට දෙන් නේ
වැඩ දෙනු පුපුලක් තවදෙං ඒටම රජරුති සුඹුලුත් සිඳ දෙන් නේ

අඩස්සියට නෙරළුද මුල් සිඳ දෙන් එඩරු ඇමද ගෙන දෙහි ඇඹුලෙ න්
පොඩි කර යෙයි තිංතිති පත් තංබා ගෙන මුසුව ගුලියෙං දීප න්
පොඩිකර යෙයි ඔලිඳ සලබු පත් ......පතනකුත් ඒටම අරග න්
වැඩිකරගං ඉඟිතිඇට හඳුනුත් නෙරළු පිලද ගෙන පයොදරී න්

සත්තට ගංනේකවුඩු පුවක් කා කොල ගෙන මිරිකාලා දෙන් නේ
පත් බිද මල් ඉද්දය කොල මිරිකා ගුලිත් යොදලා දීපන් නේ
සිත් ලෙස බැබිල පත් ගෙන සිඳුවා ගුලිත් යොදලා දීපන් නේ
යුත් වැල්පෙනෙලද හඳුනුත් ගලගා පයිම්පාල් සමකර දෙන් නේ

කඳුරු නුගට තිප්පිලි යුෂ දෙ ....
ශැදුවෙ අවුසද තිවරද දනගෙන දෙසිබුල් ළූනු වතුරෙන් දීප න්
යෙදුවේ දරු බිහිවන්නට බැරිනම් වූ කැන්ද කොල යුසින් දෙව න්
බිදුවයි වදමල්ද වරා කොලත් ගෙන බැරිවිට බිහිවන්නට දීප න්

එක්කොට ඔලිදය මුල් හිද දීපන් වැටෙයි වැදූ හ මහ අත්පිට ළු
බක්මී පොතු ගෙන තවත් දෙවං සති එලකිරි සීනිත් ඒටම ළු
එක්කිර වී පොරි කංස මහ ඔසු මධු ජම්බිර යුස වමනෙ ළු
උක්පැති ඉඟුරුත් යුස මිරිකාලා දුන්තල වමනේ ගුණවේ ළු

වැදූ අයට දෙනු රුජාව කැක්කුම් උන ගිතියං දනගෙන සොදු රු
යෙදුවේ එරබොදු පොතු කොල්ලුද ගෙන කොත්තමල්ලි සිඳ ගත් මිතු රු
සිදුවේ වදකහ සුංට් ලසුනු ගෙන දේව කෙදිරි ගෙනසිදිවා......
සැදුවේ රුසිපිට ගැස්මද සන්තිය දන දුන්නොත් ගුණවෙයි ඇදූ රු

මිරිකුලු කොල යුෂ ඉඟුරුද එ යු
.......සතියක් මේ යුසින් අඹරා මෙලෙ සා
මිරිසට සේ ගුලි පවනේ නොල සා
අනු පානය දුන දීපන් නොලෙ සා
සා

ගිතියම් ඇඟ උනු නොබැසී යේ න
කොසඹ පොතු එම තෙල් ගෙන උප න්
ඔක්කාරයවී විකාර වී න න්
මී පැති විලඳිත් සමකර දීප න්
න්

රුදුවැඩිව ලේ සිදං යාන
කංසාකොල එලකිරියෙන් දීප න්
ඇඟද ගලවමින් අඩත් ගසාන න්
ඉඟුරු කුඹුරු සුදු ඵැනෙන් දීප න්
න්

කොසඹ කොලද එම තෙල් සම කරප
ඉඟුරුත් සුදුළුනුත් සමකර ප න්
බිත්මුල් දිමිබිජු සමකර අරග න්
මෙ හැම එක්කර කසාය දීප න්
න්

ගුළු වෙන ලෙඩ සන්ති වලිප්පු
බාලයන්ගෙ මුරුත්තාද තිදිමත සන්තිද දුරු වෙ ද
මෙ හැම ලෙඩම ගුණ කරවා සෙත දෙයි අත්පිට දුන ගෙ ත
සිසිපත්ත තිබිම පෙර මින් අත පය සීතල ගුනවෙ න
න

බැබිල ඉත්ත තිදිකුම්බා මුල් රැගෙ
තලා දමා අට වක්කර කකාර නා
බාලයන්ගේ උන වමනය ගුන කර නා
බිලිදුගේ ලෙඩට දුන්නොතින් ගුන වෙන් නා
නා

ඉඟුරු යුසින් දුන්නොත් සෙම් තදවී ගුන වෙ
බාලයින්ගේ සැම සන්තිද වලිප්පු දහ අට ගුන වෙ නා
තුන්දෙස් කිපුනු සියලු අයට බාලයින්ඩ මෙ හැටි දෙ නා
මෙකී සියලු ලෙඩ ගුනවෙයි සන්ති කුමාරද ගුලියෙ නා
නා

පස්කුළු බඩු පෙරුංකායන් සමගි
තිපල් කටුක කොත්තමල්ලි ගෙ න
වශාවසි සාදික්කා සහිද ලුනුගෙ න
අබිං මෙකී දේ සමව කිරා ගෙ න
න

කුමරුට පනු රුදුව එන් නේ
කුඹුරු ඇටද දෙසි ඇට මද ගන් නේ
කංසා කොල වද කහ අරගන් නේ
ගුලිකර මින් ගුලි දෙක දෙක දෙන් නේ

ගිතියම් ඇඟ උන නොබැසියෙ න් තේ
රුදව වැඩිව ලේ සිදන් යන් තේ
ඔක්කාරයටි විකාර වෙන් තේ
...... ඔය සන්තිය දන ගත් තේ

බිලිඳුගේ හැම ලෙඩ ගුන වෙන් තේ
ගජුං මැදට වත් කෙසරිඳු වැන් තේ
මෙකී ලෙඩට අත්දුටුවයි දන් තේ
ජීවානන්ද ගුලියයි පවසන් තේ

ගත සීතල කර උන ඒ න ත්
කොත්තමල්ලි වැල්මී සමකර ප ත්
රතුළූනුත් සමකර තංබා ග ත්
තනකිරි ගිතෙලුත් සමකර දීප ත්

මෙයිනුත් උන නොබැස තියේ න ත්
පාවට්ටා කොල මුල සම කරප ත්
සුදුලූනුත් මසකර තම්බා ග ත්
ගිතෙලුත් ඊටම සමකර දීප ත්

ඊටත් අඩු නොව කුමරු සිටි ච්
තිදිමතසේ සිහිපත් නැතිවං ච්
ලත කිපි ඇඟ සුදුමැලි වේ ච්
දෙඩවිල්ලස්මුරුතා කරවා ච්

පාවට්ටා වැල් තිබ්බටු ගත් තේ
කොත්තමල්ලි වැල්මී සමගින් තේ
බින්මුල් සුදුලූනුද සමගින් තේ
තිප්පිලි කුඩු එක්කර දීපන් තේ

බඩින් යතොත් නැඹිලිද කොල පොතුයෙ ණ්
ඊටම එරමිණියා පොතු යුෂයෙ ණ්
ඊට දිවුල් එලකිරි උක්පැනි යෙ ණ්
දීපන් ශැක නොව සිටිය මෙම ලෙසි ණ්

ඊටම අබ නැටි ලූනු මිරිශ් ගෙන ණ
ලත පතුරුත් කබලෙන් දව මි ණ
එම බස්නය දියකරමින් තබමි ණ
පැදි දියෙන් දෙනු සත්තයි තියමි ණ

ඊටම ගිතියම පිපාස ආන ණ්
දීපන් ශැක නොව මදද කසායෙ ණ්
ඒත් නොසිට තද කර ආයේ න ණ්
විලදත් පාඩිලා නැඹිලි කසායෙ ණ්

උස් මුරුතට දෙනු අතී පත්‍රයෙ ත්
නශ්න කරන්මයිකුන්ටික යූශයෙ ත්
රස්නය කර දෙනු ඉඟුරු කසායෙ ත්
බස්නය කර බදු තෙල් පස්වගයෙ ත්

පෙරලී කෙන්ඩා ඇහ ගෙඩි ආවො ත්
සිරකර මල නසමින් ඇහ රිදුනො ත්
සූරකි අවුසද ගෙන වං ඇපල ත්
අරගෙන කොල පොතු තෙරපා ගෙන වී ත්

තෙරපා ගෙන යූශ තබාගෙ නේයා
මිරිකා සොරස පෙරා ගෙ නේයා
තුරිසිද දුරු දෙක සමග ගෙ නේයා
කරාබු තිප්පිලි වශවශි නේයා

අසමෝදගම් සුදුලූනු මිරිශ් ගෙප ණ
මෙ හැම දෙයින් අඹරා එයොදගෙ ණ
කි ලෙස කසාය කකාරමින් ගෙ ණ
අලෙස නොවී දීපන් ගුලි යොදම් ණ

ඉක්බිති වේදුව අල්ලන විගස ය
අර්ක යමයි රන්ගය මහ තිඹ ය
එක්කර ගතිමින් මේ හැම පත්‍ර ය
ශලක දමා කඩ බදිමින් විගශ ය

ලිග්ගන් තිප්පිලි අබින්ද ගතිම් ණ
කවෙළුන් අළු කිරි ගරුඩය අරගෙ ණ
දූනත් වසි වසි ජාති පලන් ගෙ ණ
කොට්ටම් සහිදව කරාබු අරගෙ ණ

ජීරයකි සතක අශමෝදගම් ගෙ ණ
සුදුපාසානම් ලුණුමිරිශ් ගෙ ණ
මිජය ඇඹුල් සිද්ධාථි බුළු ගෙ ණ
මත්තං කංසා කුබුරු ඇටද ගෙ ණ

මෙකී මේ දේ සමබාගේ කිරා ගෙ ණ
ජඹිර එල ඇඹුලෙන් අඹරා ගෙ ණ
පසුව සුවද හොට කසාය කර ගෙ ණ
අඹරා ගුලි ඔලු ඇට පමනට ගෙණ

පවනේ වේලා තබමින් සොදි ණ
වමනෙට සන්නිය ආවා ඇදි ණ
දෙමින් මහා ඔසුවෙන් විගසකි ණ
දෙසි ඇඹුලෙන් වමනෙට දෙන් ඇදී ණ

ඊටම කිංකිණි ඇඹුලෙන් දීප ත්
බඩදගලා සිටවම වේ තබ ත්
බටු කරවිල පත් යුසු මී පැතියෙ ත්
සිවිය ශුක නොව දීපත් මෙලෙසි ත්

පොල්කිරි දෙසි ඇඹුලුත් අර ගත් තේ
කිරි ගරුඩය ගලගා අරගත් තේ
සිරියට ගෙන ගුලි සමර දෙන් තේ
සිරිතකි තිප්පාඩුවට ඔබින් තේ

රජරුක සුඹුළුත් බැ මීකිරි පොඩි දවල් යුශගෙන පත පත එඩරු තෙලුත්
විජය තවද මුත් දුරුදෙක කිරිමිත් කලඳ කලඳ වැඩි රතුලුනු ත්
සිඳ යොද පදමුත් යොදමින් බෙහෙතුත් තබමින් යහපත් භාජනය ත්
දූනගත බිලිඳුන් කුසතුල පනු දෙස් නසමින් ගත බබලයි යහන ත්

පෙර සිටි රුසිවරු කී බසය කීම ය
ඇර ගජ රැල රඹ විමන වැදීම ය
තිරසර ඇත මෙකී අනුපාන ය
සුර ජීවක ජලයන්ති කපාල ය

උණ ලීයේ කැඩූ පොල්, උකු කටුරම කැඩූ කැලිය පොත්ත, කහ ලුනුලා කොටා මලවා බදිනු. හන්දි බෙති.

ඇවැට්ටි උනාට

කැලිය පොත්ත තලා කහ ලුනු ලා උණු අළුවෙන් තම්බා බදිනු. මදක් බිඳුනාටත් හොගයි.

ඔලිද කොල පොල් කිරෙන් මලවා බදිනු. දිය වක්කරනු ඇඹුල් නොකනු.

අතපය බිඳුනාට බෙත්

1. ගොනු කෑ කොළ, කොට දිඹුලා කොළ, දිය කිරිල්ල කොළ, දවට කොළ, බේදුරු අල, කහ ලුනුලා කොටා මලවා බදිනු. හංදි වදී.

2. තලා කොල, මදරා කොළ, පින්න කොල, කහ එනු ලා මලවා බදිනු. බිඳුනාටයි.

භූතරාම කල්කය

දුව්මෝදක කටුක දෙදුරු තිවිස රුහැති ගෙන තිප එ
දෙමදු පැපිලි කුෂට තුරිසි ජාති වගී පුස්කර එ
කාර සින්දු මෝව රසය මෙග දුත කී පෙනෙ එ
නාග කෙරු කොල්ලන් මල් හපුමල් තල කන්සා එ

පැසකර ගිතිපිට තබමින් බාගෙ ණ
උස් පුටුවක හිඳුවා දුන් අල්ල ණ
රුස්කර ඇවිත් සීතල බිඳුව ණ
අස්කර දස අට සන්තිය දුරල ණ

උනට තියම අනුපාන දන ගෙ ණ
මහ ඔසු තික කොල යූෂ තම්බා ගෙ ණ
ඊටම මීපැති සීති යොදා ගෙ ණ
මෙලෙසින් දුන්නොත් සිටිය සම උ ණ

බඩත් රුජා ඔක්කාර කෙරෙන් නේ
ඉඩක් නොහැර ගිතියමද කෙරෙන් නේ
හැමත් එකන්සා කොල වද අලයෙ නේ
තිකඳ කුඹුරු කොසඹ කොල යුසයෙ නේ

කසාය කර තිවරද මෙලෙ සේයා
කසාය පෙරමින් යුස රුගෙ නේයා
මෙලෙසින් ගුලි පහක් යො දයා
ගුල්මය දුරු වෙයි දෙනු මෙලෙ සේයා

ඇම්ම දෙඇල ආගේ රිදුම් හැති කතියා කට වෙලු න්
ඉම්ම නොවන උන ගිතියන් මෙලකතද දෙඩවිලින න්
ඉම්ම කිතුල් ඉදි මෙ බොඩ සහ කේතරබුත් බොඩ ගතිමි න්
ගැම්ම තැඹිලි පැණෙති යොදා මී හා සීතියෙන් දෙව න්

විඩාව තද උන ගැන්මද වමන බඩින් දෙකයා න න්
අලු රඹ අල යුෂ පතකට මී පවති සමකර දිප න්
තවත් තදින් උනත් ගැති වමන බඩින් යනවා න න්
කොලි කුටටු අල යුෂ සහ උක් රස මී තැඹිලි පැති න්

සේම රුගත් ඖෂධයට ගුඩු පොල් අළු හරි බර ඒ
ඉන්ම දෙකට බෙදූ අළුත් කිතුල් හකුරු එහි බර ඒ
දෙවැති සීති එලෙස කිරා මී පැතියෙන් අඹරා ඒ
නාම එරිසිවරු කී භූතරාම කල්කය ඒ

තනා තිබා කරඩු තුලෙක ජඹිර ගෙන නාගර ඒ
මනා කිතුල් හකුරෙන් දුන සියළු උනම බැසයා ඒ
තැම්බූ මිරිස් යුශට ඉඟුරු යකිනාරං පොල් කිරි ඒ
යොදා පොවන් ගිතියම් වුන වාත උනට හතික ට

ඔලුව පිටට යමින් බෙල්ල අත කට ඇදව ය න
දෙළර දෙකිං තිගැස්සීවී දත් නිතර කැටිකර න
දෙපා තිගැස්සියන් ඇතුව දෙනෙත් දෙකන් කරකව න
උනත් තදව වියරු දෙඩා ආවේසෙන් බැන නැගෙ න

හිඟුරල වැලේ වතුර දෙඩං නත්නාරං ගෙන ඇඹුලෙ න්
අක්‍රා වැල්මී පෙනෙලත් ගල ගාලා එහි යොදමි න්
සහිඳ එනුත් තිප්පිලි ගෙන සීනක්කාරන් සුණු වෙ න්
ගිතෙල් සීනි මී පැතියෙන් කැ පුමට සෙත් උතුම් බොල න්

වමන බඩින් යතොත් උදුපියලිද ඉඟුරු යුෂෙ න්
නැර තදින් තවත් යතොත් හදුන් සමඟ තැඹිලි පැනෙ න්
නොහොත් ඉඟුරු කසොකොල විලදත් මී පැති සමගි න්
වමනත් නැත තොවිල්ල පොතු ඉඟුරුත් කංසා යුසයෙ න්

ඉවදත් බෙලි මුල් තිප්පිලි වංවුව ඉරිවේරිය මෙයි න
සින්ගත් ලැසිදි පවනයෙන් කඩුත්තු බඩ රුජා නස න
වන් විලදත් කන්සා තිප්පිලි සුනු කර මී පැතියෙ න
කුඹුරුත් තිකදලු ඉඟුරෙන් කඩුත්තුවට දෙනු ඉඟුරෙ න

තික කුඹුරුද කුඩු මිරිස මුලින් නේ
කටුකරඩුද මුල් සමගින් ගන් නේ
සිවිය මිරිස් මුල් සමකොට ගන් නේ
මෙ හැම මුල් එක එක කලඳින් ගන් නේ

ත්‍රිසවළු එක් කලඳක් සමගින් නේ
බුලත් මුල්ද කලඳක් සමගින් නේ
කිරා මෙ ඔසු අව්වෙන් වේලගෙ නේ
අශමෝදගමම් තිප්පිලි කලඳි නේ

කරාබු සාදික්කා සමගින් නේ
වශාවාසි ද සින්ගුද අරගන් නේ
වැල්මී කොට්ටන් තුරිසිද ගන් නේ
මෙකී දේ එක එක කලඳින් නේ

සීන මුල්තුම් පලම් රැගෙන කොත්තමල්ලි පලම් 1, හීනටි හාල් පිටි තුන් කලඳයි, සීනි දෙවිසි කලඳයි, දෙදුරු, ඉඟුරු, වදකහ, ලසුනුද, තිපාලද, තිප්පිලි, තිවග, ත්‍රිකටුක සම සමව රැගෙන

කටුද කරෝසන දෙක දෙක කලද ගෙ ණ
මෙකී මෙ ඔසු සත් දින වේලා රැගෙ ණ
කුඩුකර පොල්වාකර පස් කලඳක් ගෙ ණ
තවසී වතුර අට නැලි කලං බාග ගෙ ණ

ආක්කු සත් කලදක් කිරාගෙ ණ
මදනෙ තලාගෙන බෙහෙත් යොදුගෙ ණ
මද ගිත්තෙන් ලා කල්ක යොද ගෙ ණ
මුළු පමනට සත් දවසක් වලද ණ

කෙප්ප සූල කෙප්ප අග්නි කෙප්ප වායු සය රෝග ද
යෝනි මාර්ග මතු වීමෙන් ලේ කුනු සාරේ යාම ද
පියයුරු දෙකකි රි එරෙමින් දරු ගැබ ලෙස පෙරලීම ද
අඟනන්හට රක්ත ගුල්ම උදර අටෙ පාණ්ඩුව ද

පතුල් කෙන්ඩ ඇඟ හැම තැන ඉදිමුම නෙත් දෙක කහනට වීම ද
නිතරම ඇඟ ලළණ වාද දෙඅත් කකුල් හිරි වැටේ ද
කොන්දෙන් පිට වුන වායුව අන්ස උදර ගෙඩි සිඳ බි ද
නිතර කසින පංච කැසිද දිය වැඩියා උදර අට ද

සීතෙන් දෙත කැස නසයි කිලි කුණු අම්යා රෝග ද
දරුවත් උපදින්ඩ නැතිව තිතියෙන් ගබ්සා වීම ද
වද අහනට තිති වැලඳුව දරු ගැබ කරවයි තිවර ද
ඇඟ හැම තැන දය යෝනි මාර්ගයද වන වීම ද

ගුද මග අරිසස් වැඩි වී කහලය මල ලේ යාම ද
බඩ වැල් අටගත් අජීර්ණ මුත්‍ර ගුල්ම. අම්යාව ද
සීද යෙයි මෙකී යන ලෙඩ අඩමාස වැලඳු මුදිවර ද
කුස බඩ වැල පෙරලීමෙන් වැලඳු අහර නොදීරීම ද

සීතෙන් දෙත කැම නසයි කිලි කුනු කහලය මල.ලේ යාම ද
දරුවත් වදන්ඩ තිතියෙන් ගබ්සා වීම ද
වද අහනන්ට තිති වැලඳුව දරු ගැබ කරවයි තිවර ද
ඇඟ හැම තැන ගිති දයාද යෝනි මග කුනු වන වීම ද

ඉසකකියන කෙප්ප වායු දෙකතින් සාරේ යාම ද
ඇස් කබ වැගිරීම සමග අසූ අට පීනස වායු ද
රස පහසට සිත නොනැමි වමනය බඩ දැහලීම ද
බස පෙර පැවසුව තිවරද කෙප්පරාජ කායෙම සො ද

ත්‍රිවගී දෙදරුත් වැල්මී ගතිමි ත්
තිපලත් දෙවදුරු එහි සමගි ත්
ලාගත් හිරියල් මනෝසිල ග ත්
අක්‍රා සීනක්කාරන් සමගි ත්

අලා අරිසි වෙප්පල් සහ ගලි සේ
ශාස්ත්‍රවෙලිය සුහු පොරි කාර ත්
තික දෙහි කුඹුරුද තිඹ දළු ගතිමි ත්
කංසා අත්තන තිබ බිජු ගතිමි ත්

සිවංගුරුත් සහිද ලුනු සමගි ත්
ක්‍රිමි ශාස්තු වද කහ සොද මිරිසෙ ත්
මාසක්කා කුරුදු පොතු ලිසිති ත්
පල්මාතික්කම් අබිංද ගතිමි ත්

වලහයාල් බෙලි පින් විද සමගි ත්
මේ හැම බැද කුඩුකර අරග ත්
මී පැතියට ගුලි කුඩු සහ ගතිමි ත්
ඇදුරති දීපත් ගුනවෙයි සතොයි ත්

ඉඟුරු යුසින් ගුලි දුන්නොති ත් තේ
සියලු සන්නි ගුන වෙයි දූන ගත් තේ
තිදෙස් කිපි එන සන්නි නසන් තේ
බාලයන්ට මෙ මෙ ලෙස දීපන් තේ

බාලයන්ගේ සැම සන්නි නශන් තේ
වලිප්පු දහ අට ගුනවී යන් තේ
මෙකී සියලු සැම ලෙඩ ගුනවෙන් තේ
සන්නි කුමාරද ගුලි තිමවත් තේ

බාල බිලිඳුනට උන සහ පැමිණෙ ත
වලිප්පු සන්නි දුටුවෝතින් එ ත
ආල නොකර ගත් දුරු දෙක කර අබු හින්ගුද සාදික්කා සමගි ත
ඌල නොකර ගං කොට්ටං මදුකය වශාවාසි රැගෙ ත
කෝල නොකර ගං සුංඨිං ගලිස්ස මිරිශට මී අත්තඩු අසමෝදගම ත
සහ රැගෙ

බසපෙර කී ලෙස ගිරග තුලට ගෙ ත
සිඹතෙල මුසුකර මැද දින සු ත්
තොස කර මුං ඇට පමනට ගුලිකර පවනේ වේලා ගෙන මෙලෙසි ත්
රොසනොව ගුලිකර කරඩුවක තබා ගෙන බිලිඳුට දෙන අනුපානතිය ත්

ඉන්ඩ බැරිව බිලිඳුගේ අතපය බාන සෙද ගල තිදිමත සේ ඒන ත්
දත් ඔවාල ලෙස බෙල්ලා පිටට යෙයි උන සහ ඇහයට වෙවුලුවන ත්
උන්ඩ දෙවන අනුපානය මෙලෙසින් තිබද ගිතෙල් තන කිරි ගෙන දෙ ත්
යන්ඩ දුවෙයි නද වලිප්පු සන්නිය කෙසරිඳු දුටු ගජරැල විලසි ත්

කුඹුරු ඇට වදකහ කුඩුකර ගිතෙල්ද මුසුකර ගුලි දීප ත්
බින්දු ලෙසට යෙයි වලිප්පු සන්නිය කීවා දූන මෙලෙසි ත්
කාබිර ජමබිර දෙසි ඇඹුලුත් සහ සමකරලා දූන ගුලි දීප ත්
මිත් ගුනවෙයි රැසි බස බොරු නැන දූන මෙලෙසි ත්

රැගෙන එම දූ සීතිද මුසුකරලා මේ ගුලි යොදවා දෙවි නොල ශේ
එදින බිලිඳුහට පැමිණී වලිපපුව ගුන කරවයි අත්දුටු විල ශේ
තදින් රුජා කුස නැර තිබෙනම සා දෙහිඹුල් දෙති සැප ශේ
එද නත මෙරුසිවරු හැමනුං සතහට ....මෙ ශේ

ගර්භිනී රෝග හා සූතිකා රෝග

1. බඩ දරු අයට අඩස්සියට

යක් වනස්ස. යක්බෙරිය. යකිනාරන්. මෙකී දළු මිට මිටයි. ජයපාල. තිප්පිලි. මෙකී දෙය දෙහි ඇඹුලෙන් අඹරා ගුලි සයක් කොට ඉන් තුනයි. ගින්දරින් පුළුස්සා විශ හැර දෙහි ඇඹුලෙන් අඹරා ගුලි සයක් කොට ඉන් දෙකක් තුනක් දෙන්න. විරේක වෙයි. බඩ දරු අයගේ අඩස්සි. සන්නිපාත. ඇවිලිලි. බඩ පිපුන් අඩස්සි ගුනවෙයි.

2. අලුත වැදූ අයට

තික දළු. මදුරු දළු. අමු ඉඟුරු. අබ. මුරුංගා. දෙහි ඇඹුලෙන් පොවනු. අලුත වැදූ අයගේ වෙව්ළුන්. සිගතු උන. ඇවිලෙනවාද සිටී.

3. සුදුදුරු. පෙරුංකායන්. සිනක්කාරන්. ඉඟුරු. මිරිස්. මෙවා සම භාග කිරා මෙම බරට ජයපාල කිරා දෙඩන් ඇඹුල්. කැකිරි ඇඹුල්. මෙම දෙවගේ අවුවෙන් රත්කර මෙම ඇඹුලෙන් සිහිදුව අඹරා ඉඹුල් ඇට පමණ ගුලි කර තබා දෙඩන් ඇඹුලෙන් දෙනු. කිලි මාල අඩස්සි ඇරෙයි.

4. වැදූගෙයි ලෙඩට

කසායට

බෙලි මුල්. කොහොඹ මුල්. නැටි. කරපින්ච නැටි. තික මුල්. ඉරිවේරිය මුල්. පාවට්ටා මුල්. කලාදුරු අල. ඉරමුසු මුල්. සස්සඳ මුල්. කරල් සැබෝ මුල්. බැබිල මුල්. වැල් කසඹිලියා මුල්. මෙකී මුල් කොටා දිය හතර නැලියක් වක්කර එකට සිඳුවා මිට සරක්කු. අරළු. බුළු. නෙල්ලි. ඉඟුරු. මිරිස්. සුදුළූනු. කළුදුරු. අසමෝදගන්. තිප්පිලි. මෙකී දෙය අඹරා ඊට යොද කකාරා කසාය පදමට බා තබා බොන්නට දෙනු. වැදූගෙයි උන ගිනියන් වෙවුළුන් සියළු ලෙඩ ගුණවෙයි.

5. වැදූගෙයි බඩින් යනවාට, කඩුත්තුවට, මාලේට

කලාදුරු අල. නෙළුන් අල. අමු වද කහ. පත්පාඩගන්. මෙකී දේ තුන් තුන් කලඳ ගෙන කොත්තමල්ලි. අබින්. කටුකරෝසන. වැල්මී. මෙකී දෙය මන්චාඩි පහ පහ ගෙන අරළු. බුළු. නෙල්ලි. කලඳ කලඳ ගෙන අට එකට කකාරා දෙනු.

6. කොහොඹ කොල. කුඩු මිරිස කොල. තික කොල. කුඹුරු කොල. ශැබෝ කොල. මෙකී දෙය මිට මිට ගෙන සින් කර ලියාගන. ඊටම කුඹුරු ඇට මද. වද කහ. ඉඟුරු. මිරිස්. අබ. සුදුළූනු. පෙරුන්කායන් මෙකී දේ එක පමන ගෙන කුඩුකර කළු දුරු. සුදුදුරු. අසමෝදගන්. කරාබු. වසාවසි. සාදික්කා. තිප්පිලි. තිපල්. සමව ගෙන කුඩුකර කොට්ට පොල් පලමු සරක්කු එකට කොටා තිරින්ගෙන් මිරිකා තෙල් රාවතාවක් පමණ බොනු. මින් ගුණ වැදූගෙයි සන්ති බඩෙ ලෙඩ කැක්කුන් රුද. ගිනියන්. කඩුත්තු ගුණවෙයි.

7. රත්හිටුල්, බුලත් මුල්, වද කහ, අමු කහ, සුදුළූනු, කලාදුරු, අසමෝදගන්, මිරිස්, හොද මිරිස්, ඉඟුරු, තික දළු, කුඹුරු දළු, මෙකී දෙය දෙඩන් ඇඹුලෙන්ද දෙනු. නොසිටියොත් අරක්කුවෙන්ද දෙනු. අද්දුටුවයි. මාලේ, බඩින් යනවාට.

8. වැදූගෙයි කෝලෙට

ආඩා සහමුලින් කකාල කශාය වැදූ අයගේ සියලු කෝලෙට යහපති.

9.වැදූගෙයි කෝල ඉලප්පුවට

වැල්මී, කොත්තමල්ලි, කොට්ටන්, ලසුනු, සිනක්කාරන්, සඳුන් අඹරා තන කිරෙන් දෙනු.

10.වැදූගෙයි සන්ති උනට

කොසඹ, තුඹකූරු, හිරුස්ස, වවුල්ලැටිය, වැල් තිබ්බටු, අමුක්කරා, ඉරමුසු, තික, යකවනස්ස, මෙකී මුල් ඉඟුරු, ලසුනු, දිමි බිජු, සහිඳ ලුනු, අට එකට කකාරා කොසඹ තෙල්, මී තෙල්, ගිතෙල්, සමව දෙනු.

11.වැදූගෙයි අයගේ සියලු සන්තියට

සිනක්කාරන්, කොත්තමල්ලි, සතකුප්ප, සහිඳ ලුනු, යවකාර ලුනු, පොල් හකුරු, සපුමල්, රනවරා මල්, නා මල්, මී මල්, මුන මල්, රට බුලත්, ඉඟුරු, මිරිස්, අට එකට කකාරා සීනි මී පැනි තන කිරි සමව දෙනු.

මින් ගුණ :-
බඩින් යනවාටද, දහඅට සන්නියටද, තුන්දෙස් විකාරයටද, උන ගිතියමටද, කලු අක්කාරමටද, සෙම නැගිමටද, ඉක්කාවටද, කෝල විපරිතයටද, කෝල වලිප්පුවටද, කන් කැසීමටද, මෙකී දේට ගුනදෙයි.

12.වැදූගෙයි ලෙඩට

දෙමට ගෙඩි, කුකුරුමහන් ගෙඩි, හිඟුරු පට, විලිකුන් බටු, මිරිකුළු යුෂ, මෙකී යුෂ පත පත ගෙන පොල්කිරි මනාවයි, තල තෙල් සමව ගෙන ලිප තබා මිට සරක්කු, කළුදුරු, සුදුදුරු, අසමෝදගන්, තිප්පිලි, කටු කරඬු, වසාවාසි, ශාදික්කා, වලහ ශාල්, පල්මාතික්කන්, ශිනක්කාරන්, සවින්දව ළුනු, පුශ්කර, ඉඟුරු, මිරිස් අරළු, සුදුළූනු මෙකී දේ සමභාග ගෙන අඹරා ඊට දමා කකාරා පදමට බා තබා බොන්නට දෙනු.

මීත් ගුණ :-
වැදූ අයට එන වෙව්ළුන් උන, ඇම්ම, ඇවිලිලි, අක්කාරන් කැශි, හති, කැක්කුන්, ගිතියම, දිය පිපාස, බඩින් යනවාද, මෙ සැම එකතුනත් අශාද්ධයි. මදක් අඩු නම් මෙකී කශායෙන් ගුන වන්නේය.

වැදූ අයට සන්ති ලකුනු
(ඇඟ පත රිදෙනවාද, තන කිහ ඇවිලෙනවාද, උගුර කට කළු වෙනවාද, පිපාසද, කැම්ද, හති කැක්කුමද, ගිතියමද, පිත් දයද, විකාර, අතපය මූන තඩිස්සි වීමද, උනද, වෙවුළුන්ද, මෙවා සමහරක් අඩු නම් සාද්ධයි. වෙදකන් කරනු.)

දෙඩන් ඇඹුල් පතයි, උක් පැනි පතයි, මී පැනි පතයි, එලකිරි පතයි, ඔලිදකොල ඉස්ම පතයි, බටු මුල්, තොටිල්ල පොතු, වන් ඇපල මුල්, අමුඉඟුරු, සැවැන්දන මුල්, කලාඳුරු අල, මෙකී දේ කොටා තබා යුස නැලියයි, මිට සරක්කු, වැල්මී, පෙරුන්කායන්, වදකහ, මිරිස්, සුදුළූනු, පැහිච්ච බටු යුස පතයි, තැඹිලි දිය නැලියයි, කරල් සැබ ඇට පතයි, මෙකී සරක්කු තැඹිලි දියෙන් අඹරා කශායට යොද කකාරා කොසඹ තෙල් මුසුව දෙනු. පලමු කී ලෙඩට අත්දුටුවයි.

වැදූ අයගේ සියළු ලෙඩට.

මුත්‍ර අඩස්සිද මුල වායුව ද
ගුල්ම රුදුවද ගත හිරි වායු ද
කල් දූන ආ සිය ගත කොරවීම ද
බැම්ම ලෙසින් එන ලැමද අඩස්සි ද

දැඩිකර බගන්තරාවද අටගත් තේ
වැඩි කර ගත මහසිලන්දු ඇත් තේ
පොඩි කරවයි සියොගත ලෙඩකිත් තේ
වෙඩි ශර මෙන් අවුසද බල් ඇත් තේ

වැදූ අයගේ සියළුම ලෙඩ අටග ති
වැදී තියෙන සියො ගත ලෙඩ හරි ති
දී අශපන් ආශිරි බලවඩ ති
නොදී සියළු රෝ දුක් දුර හරි ති

කෙඩ පතුල් දෙක දන ඉස ඉදිමි බැම්ම ලෙසින් හැති කැක්කුම ඒන න්
කඩ බැරුව ශෙම වේලි සැම ද වාත වැඩිම සෙං ගුගුරා ඒන න්
යඩ බැරුව මග තැන තැන වැටෙමින් පිත්ත පාඩු වද වැඩි විතින න්
දෙඩමෙ අවුසද පැවසූ රුසිවරු සියෝගත ලෙඩදුරු කරණා ලෙසි න්

කපුරු, එන්ශාල්, ශැවැන්දන, ඉරිවේරිය, වගපුල්, අන්නාසි ඇඹුල්, ගිතෙලින්ද

බඩිං යනවාට මිරිස් කඩෙන්ද, ඒට මුරුංගා මුල් යුසින්ද, කන්ෂ, වද කහ දෙඩං ඇඹුලෙන්ද, අටිටික්කා පොතු යුසින්ද, මාලෙට පොල් මල් යුසින්ද, රත්මල්, රනවරා මුල් යුසින්ද

දඹුල් පොතු යුස, මීයෙන්ද, සඳුං, ඉඟිනි ඇට, දෙසි ඇඹුලෙන්ද, ඉඟුරු උප්පැතියෙන්ද, උදුපියලීය පොල් කිරෙන්ද, කෙල පෙරෙනවාට ගිතෙලින්ද කොසඹ තෙලින්ද පැසවා සන්දිවල ගානු. කන වත්කරනු.

තිගැස්සියට පොල් කිරෙන්ද, එනු දියෙන්ද, මහ අඩස්සියට රණවරා කොල යුසින්ද, ගොරවන සන්නි, බිහිරි සන්නියට කුකුරුමාං මුරුවට දෙබටු, බටු, ඉඟුරු පට, කුප්පමෙනිය, මී පැතියෙන්ද, තල තෙලෙන්ද, ගිතෙලින්ද, ඊට ආඩි මුල්, කලාදුරු අල තඹා තල තෙල් කිරෙන්ද සියළු දෙට මිරිස් කුඩෙන්ද යහපති.

රුජාවට.

දෙහි ඇඹුලෙන්ද, කුඹුක් කොලයෙන්ද, අඩස්සියට පොල් කසායෙන්ද, කාන්දං චූර්ණයෙන්ද, එඩරු ඇට අඹරා දෙහි ඇඹුලෙන්ද, සියළු අඩස්සියට සියඹලා කොල යුස සීනියෙන්ද, ගිනියමට ඉඟිනි ඇට, හඳුන්, ඔලිද දළු, ලබු දළු, කසපැන් දිය, තන කිරෙන්ද, ඊටම ගිතෙලින්ද, කුඹුක් කොලෙන්ද, දෙහි ඇඹුලෙන්ද, වදඩ බැරුවාට කරද කොලෙන්ද, වල් වරකා කොලෙන්ද, බෝ පොතු යුසින්ද, වැදූ මහ වැටෙන්ට ඔලිද මුල් කසායෙන්ද ඊට බක් මී පොතු යුසින්ද. ඊට එල කිරෙන්ද සීනියෙන්ද දෙනු.

කිලි මාලේට බෙත්.

27. කෙටෙන පදමට තැඹිලි පොල් මල් කීපයක් ගෙන කොටා යුස මිරිකා සීනටි හාලෙන් රොටිය උයා දෙනු.

28. තිපල්, ඉඟිනි ඇට, වැල්මී, ඉරමුසු, මෙයින් කකාල කසායට එල කිරි සීනි එක්ව දෙනු.

29. බෙලි මුල්, කලාදුරු අල, ඉරිවේරිය මුල්, කොට දිඹුලා පොතු, තැඹිලි පොල්මල්, මෙයින් කකාල කසාය දෙනු.

30. රක්ත ගුල්මයට.

නෙල්ලි යුස, උක්පැනි දෙවගෙ දෙනැලියයි, ගිතෙල් නැලියයි, අරළු කල්ක දෙපලමයි, පදමට සිඳ බානබා දෙවේලේ වලඳනු.

31. කුස ගුලියට ගර්භයේ රුජාවට.

එන්සාල්, මුන් ඇට, ඉඟිනි ඇට, අළු වතුකැන් අල, බෙලි, තිපල්, බෙලි මැලසි, කැකිරි ඇට, තුඹ මල්, හෙල සඳුන්, දේවදරු, කොරාසානි, අසමෝදගන්, අළු කෙසෙල් මැලසි, සීනි, මී පැනි, මෙයින් කලඳ කලඳ ගෙන අත්තික්කා පොතු

යුසින් දවසක් අඹරා සියඹලා පොතු යුසින් දවසක් අඹරා කිකිරිදිය යුසින් දවසක් අඹරා තිබ්බටු පමණ ගුලිකර තබා දෙවේලේ ගුලි තුන තුන බැගින් අමු එලකිරි හා දෙන්න.

32. අළු කෙසෙල් මොටෙයියා ගෙන කොටා මිරිකා පුස්ප සඳුන් ඊට එකතුකර පොවා පැයක් විවර පසුකර උයා සුත්සාලේ බත් මදක් ගෙන ඇල් දියෙන් දෙතුන් වරක් සෝද පොඩි කොට ඇල් දියෙන් දිය කර පොවනු.

33. කොහිල අල තලා යුස මිරිකා පොවනු.

34. කුර කොල යුස පොවා නැවත එම කොල කොටා යුස මිරිකා කිවුලෙන් කැද පිස දෙනවාය.

35. ලේ සිඳමට.

පුල් මද, සුදුළූනු, අඹරා මී පැණි තල තෙල් එක්ක දෙනු.

36. වැදූ අයට ප්‍රමේහයට.

කරාබු, ලොප් සුඹුලු, ඉරිවේරිය, අති උඩයන්, වසාවසි, අබ ඇට, තිපල්, බෙලි පිංචි, ජිවුල් ලාටු දෙකලඳයි දෙකලඳයි ගෙන චූර්ණ කොට අබින් කලඳකුත් එක්කොට පොල්කිරෙන් අඹරා ගුලි විස්සක් කොට මී පැනියෙන් හෝ එල කිරෙන් හෝ අළු වතු ගෙඩියෙන් දවසකට ගුලිය බැගින් දෙනු.

37. ප්‍රසූතයට.

දුම්මැල්ල වැලක්, බක් මී සුඹුලු, කටින් සපා කා කෙල ගිලිනු.

38. කපු කොල කොටා පොට්ටනි බැද තවනු. ඔලිඳ කොල යුස පොවනු.

39. කසා, තිප්පිලි, පංචකෝල කසාය කකාරා දෙවේලෙ දෙනවාය.

40.වැදූ අයගේ ලේ කුනු සුඩ වීමට.

කලුදුරු, කපු කොල, දෙවගේ අඹරා ඇල් දියෙන් අඹරා ගින්නෙන් පැසවා යටි බඩේද තුනටියේද ගානු.

41. බඩ මල දරුවෝ වැටෙන්ඩ.

බැමිතිරිය සහ මුලයෙන් අඹරා ගිතෙලෙන් ගානු.

42. කැපුනාට.

රතුළූනු, අමුඉඟුරු, එරබදු පොතු, මල බුලත්, කඩුපහර, සියල්ල කොටා තල තෙලෙන් මලවා බඳිනු.

43. බඩ මල දරුවන් වැටීමට.

වැටකෙයියා අරළු, මී පොතු කොටා මිරිකා පෙරා යුස පොවනු.

44. අනෝද කොල යුස දෙනු.

45. පුස්වැල් දිය, සඳුන්, සීනි කලතා පොවනු.

46. රසකිඳ වැල් කොටා යුස ගෙන එයින් කැද දෙනු.

47. වැදූ අයගේ ලේ කුණු සුද්ධ වීමට.

සිද්ධිගුරු, සුදුළූනු, සතකුප්ප, මෙයින් පලමක් ගෙන අට එකට කකාරා දෙනු.

48. වැදූ ගෙයි ලෙඩට.

ගලිස්, තිකුලු, තිපල්, අබ, සුදුළූනු, අසමෝදගන්, සාදික්කා, කොට්ටන්, උළුවහාල්, කළු දුරු. මෙ හැම සම භාග ගෙන අඹරා කොසඹ කොලයුසට බේත් දිය කර කකාරා කායන් පිස දෙනු.

49. වැදූ ගෙයි සීතලට:

කුප්පමෙතිය, අත්තන කොල, ගොන් කැකිරි, මුරුංගා පොතු, ඉඟුරු, මිරිස් අඹරා කකාරා කායන් පදමට බා තබා ඇඟ ගානු. සීතල නවති.

50. අක්කාරමට.

කුඩු මිරිස් මුල්, කරඹ මුල්, කරල් සැබෝ ඇට, එම මුල්, මී මුරුවට බටු කර කලුදුරු, පල්මාතික්කන් මෙ හැම පුළුස්සා අඹරා හීන් දෙහි ඇඹුලෙන් දිව ගානු.

51. වැදූ අයගේ සන්ති ගිතියමට.

බුලත් මුල් යුස පතයි, ගැට තුඹ කොල යුස පතයි, දෙහි ඇඹුල් පතයි, කාමරංගා ඇඹුල් පතයි, දෙදුරු, අසමෝදගන්, තිප්පිලි, පෙරුන්කායන් මෙවා සමභාග කිරාගෙන අඹරා කායන් පිස දෙවේලේ වලදනු.

52. වැදූ අයගේ වෙවළුන් සන්තියට.

වදකහ, සුදුළුනු, ඉඟුරු, අබ, කොට්ටන්, පොල් සමග කොටා පොට්ටනි බැද තවනු.

53. වැදි වලට.

පුස් ඇට මද දෝතක් විවර කොටා දිය වක්කර පැදුනු විට දිය පෙරාගෙන තුන් දවසක් තබා කාමරංගා කොල යුසයෙන් අඹරා සීනටි සාලේ පිටි එක්ක තලප පිස සතියක් දෙනු.

54. ගර්භනීන්ගේ වාතයට.

වත් ඇපල, තික, කටුකරඬු, තිපල්, දෙකසා, දේවදුරු, මේ හැම සමව ගෙන කකාල කසාය කාඩි හා දෙනු.

55. ගර්භනීන්ගේ සර්ව වාතයට.

හිඟුරු, පලොල්, තිරස්තවාළු, තිපල්, බුරුද මේ හැම සමව ගෙන තලා කසාය දෙනු.

56. වාලුකා කෂාය.

දෙදුරු අසමෝද තිකුළු තිපළුත් ලසුනු වම්මුතු ගතිම් නා
සුදු හඳුං ඉර්වේරි මදුරුද තලා රත් නෙමුලුත් ගෙ නා
කටුකරෝසන දෙව්දුරුද හිරමුසුද කුරුදුත් ගතිම් නා
කරල් ශබෝ තිකා සැමැන්දත සස්සඳද කුරුදුත් ගතිම් නා

මෙ ඔසු හෙදී බැද ගලක බහමින් දෝරවැලි තැලියක් ද බැද ලා
එහිමලා පැන් අට එකට සිද දුනෝතින් ලෙඩ ශවිබලා ලා
මෙ හැම උන තුන්දෙස් විකාරද සන්ති ගිතියන් දුටුක ලා
බැහැර කර යයි වැදුගෙයි ලෙඩ ශක නැතුව දුන්නොත් බ ලා

බැන්ද ජල මල ගතද හිරවී සන්දි කකියා මෝලිගැසෙමි ණා
සන්දි කකියන උනද ගිතියන් අඩස්සිද වෙවුළුන්ද දුටු තැ ණා
දුන් මෙකී මෙ ලෙඩද ගුණවෙයි වාළුකා නම ලත් කසායෙ ණා
දෙන්ඩ ඇදුරති මෙලොව ශකනොව පැවසුවයි රුසිවරුන් දූනග ණා

57. සාතාවාරිය, ඉරිවෙරිය, ඉදින්නරු, බුරුද, බැබිල, දියමිත්ත, බැබිල මුල්, දළුව මුල්, වැල්මී, පැපිලිය, එඩරු මුල් මෙ හැම සමව ගෙන කළ කසාය යවකර එනු ලා දෙනු.

58. පියුම, බැබිල, ගොකටු, අස්වැන්න

59. සාතාවාරිය, ඉරමුසු, ඉරිවෙරිය මෙ හැම සමව ගෙන කකාල කසාය ගිතෙල් කකාරා පොවනු.

61. සියළු බඩ රුජාවට.

බෙලි මද, හිහුරු, පලොල් සුඹුළු මෙ හැම යුස ගෙන කිරි හුළු කැද පොවනු.

62. ගර්භනීන්ගේ කලවේ උකුලේ රුජාවට.

වගපුල්, ශෛයින්ධව එනු, අත්සුනු, මෙ චූර්ණය තලතෙලින් දෙනු

63. ගර්භනීන්ගේ කාසයට.

රත්නෙටුල්, බැමිතිරිය, විලද, පස්කෝල මෙ හැම කසාය හෝ කැද හෝ කිර හෝ දෙනු.

64. රත්තිටුල්, බැමිතිරිය, විලද, කිරි අගුන, දිය මිත්ත, මෙ කසායට දෙනු.

65. ඇඹුල, බටු මුල්, තිකුළු, එල්බිජු, ලවංග, ලොත්සුඹුළු, සවින්ධව, මිදි, කිරි අගුන, දියමිත්ත, මෙ කසාය වගපුල් සුනුලා දෙනු.

66. සිවන්ගුරු, වගපුල්, මානෙල්, ඉඟුරු, මෙ හැම මෝරුවෙන් අඹරා මී පැණියෙන් දෙනු.

67. ගර්භනීන්ගේ හික්කාවට.

බැබිල මුල්, බෙලි මුල්, මේවා කිරා එක්කොට කසාය කකාරා පිට හෙලා දෙනු.

68. ගර්භනීන්ගේ ප්‍රවාහිකාවට.

ඇත් වග පුල්, ලොත් සුඹුළු, මෙලෙ මල්, බෙලි මුල්, ඉවද මේවා සුනු කොට මී හා ලේහ කරනු.

69. ගර්භනීන්ගේ ඡර්දියට.

විළද, බෙලි මුල්, කොතඹුරු මුල්, සිද්ධිගුරු, මුන් මේ කසාය සීනි හා දෙනු.

70. වමනෙට.

දුරු, අඹ ඇට, විළද, කොතඹුරු, වග පුල්, කරාබු, සිවිය, නස්නාරන් රේනු, මේ හැම සමසේ ගෙන චූර්ණ කොට දෙනු. මීටම මී පැණි එක්කොට දෙනු. වමන නසා.

71. යහවපු බැබිල, කරාබු, සිද්ධිගුරු, බුරුද, කෙලින්ද, මේ කසායෙහි ගිතෙල් මී හෙව දෙනු.

72. ගර්භස්‍රාවයට.

ඌරල මුල්, අඹරා අතුල් පතුල් වල ආලේප කරනු.

73. මහ බෝ මුල් අපත්‍යමාර්ගයෙහි තබනු.

74. වැල්මී, සදුං අඹරා දිය කොට වෙඩුරුවෙන් හෝ දියෙන් හෝ පොවනු.

75. සූරිය පොත්ත උක් පැණියෙන් ගලගා පොවනු.

76. කස පැන් දිය, රඹුක් බඩ යුස පත පත එකතු කර දෙනු.

77. බොරළු දමනු. මනුවැල් මුල්, හෝ වන් ඇපල හෝ තැඹිලි මුල් හෝ පැන් හෙව

වටා (අඹරා) යෝනියෙහි ගල්වනු.

78. මළ දරුවන් වැටෙන්ට.

ඕ ගස මුල් මුවෙන් නොබැන උගුලා ගෙන අඹරා බොටුවේ සිට පතුලට දක්වා ආලේප කොට මදක් පොවනු.

79. කපු කොළ යුස කොසඹ තෙල් සමව දෙනු.

80. මල් තුඹ අල මී තෙලින් මලවා දෙනු.

81. වැද මහ වැටෙන්නට.

තිත්තලබු ඇට, තයිසැව, අබ මෙකී දේ අඹරා තල තෙලින් අනා දුන් දෙනු

82. මුස්සැන්ත මුල්, ගලගා පැත් එක්ක පොවනු

83. වැදූ ස්ත්‍රියගේ ලෙඩට.

කප්පර වල්ලිය කොළ, කොසඹ කොළ, කොල්ලන් කොළ, කරපිංච කොළ, බුලත් මෙකී කොළ යුස ඇඹුල් දෙඩන් ඇඹුල්, ඉඟුරු යුස මේවා එක පමණට ගෙන දෙදුරු, සුදුළූනු, තිකුළු, තල ඇට, එඩරු ඇට, මේවා එක පමණට ගෙන අඹරා පිස දෙනු.

84. වැදූ ගෙයි ලෙඩට.

සිද්ධිගුරු, සුදුළූනු, සතකුප්ප මේ කසාය අට එකට කකාරා උදය සවස දෙනු.

85. සන්නිපාතයට.

තිප්පිලි, තිප්පිලි මුල්, සිවිය, රත්නෙටුල්, සිද්ධිගුරු, මෙයින් කසාය දෙනු.

86. සූතිකා ජ්වරයට.

කලාදුරු අල, පැපිලිය, රසකිද, ඉඟුරු, වදකහ, පලං 2 ට කිරා අට එකට සිද සීනි මිශ්‍ර කර දෙන්න.

87. සූතිකා රත්තය හොඳින් පිටවීමට.

කහ කුඩු, කලුදුරු කුඩු, කලඳක් ගෙන පොට්ටනි බැඳ කෝපි කුඩු ටිකක් සමග බඳුනක ලා උණු දිය වත්කර වසා තබා කෝප්පයක් පමණ වේතාලෙට දෙන්න. (කහ කුඩු වෙනුවට කුංකුමප්පු වඩා හොඳයි.)

88. සූතිකාවන්ට.

වීන මුල්, කරඳ, මා එරමිනිය, කැප්පිටියා, බුලත් මුල්, මිරිස් මුල්, ඉසඟු, හිත්තලා, ඇද්දෙමට. තොටිල, කොසඹ, යකිනාරන්, දෙහි, දෙඩන්, නාරං, පඹුරු, ශවැත්ත, එඬරු, බැබිල, හාතාවාරිය, කුඹුරු, මුරුංගා, දෙඩම් පතා, හැම මුල් පලම් එක බැගින් ඉඟුරු, මිරිස්, ත්‍රිජාත, අසමෝදගං, දේදුරු, සතකුප්ප, කෙලින්ද, අරත්ත, දේවදර, කලාදුරු අල, අගිල්, වද කහ, තිපල්, වලහ සාල්, මාසක්කා, කටුකරෝසන, උලුවා, ඉවද, වැල්මී, අබ පලම ගෙන චූර්ණකර තුන් කලඳක් වරකට දෙන්න.

89. වැදුගෙයි අනුපූට්ටු.

දුරු දෙක, අසමෝදගං, තිප්පිලි, කරාබු, වසාවාසි, සාදික්කා, ඉඟුරු, මිරිස්, පෙරුන්කායන්, පල්මාතික්කන්, සීනක්කාරන්, සහිඳ ලුනු, කුඹුරු ඇට, දෙහි ඇට, පුෂ් ඇට, දෙසී, දෙඩං, කුඹුරු, තුඹ, තික, වේලා, කොසඹ, බුලත් දළු, කුරුඳු, මුරුංගා මුල්, ජයපාල, මෙකී දේ සමභාග ගෙන අරක්කුවෙන් දෙඩං ඇඹුලෙං අඹරා මිරිසට පමණ ගෙන ගුලිකර තබා අනුපාන බලා දෙනු.

90. බඩින් යනවාට.

ඉඟුරු, මිරිස් බැද දෙඩං ඇඹුලෙන් දෙනු.

දහ අටක් සන්නියට.

සුදුළූනු, හිඟුරු පට, කසායෙන්ද අරක්කුවෙන්ද සියළු කැක්කුමට රුදවට ඉලප්පුවට සුදුළූනු අරක්කුවෙන්ද දෙනු

91. මුරුවා කොල ඉස්ම, මිරිස් මුල්, වේලා මුල් මෙකී මුල් ඉස්ම පත පත ගෙන නර මුත්‍රා පතයි, පොල් තෙල් පතයි, එහි වක්කර ලිප තියා වැල්මී, පල්මාතික්කන්, සීනක්කාරං, දුරු දෙක, අසමෝදගං, තිප්පිලි, සුදුළූනු, මෙකී දේ මුත්‍රාවෙන් අඹරා තෙලට යොද කකාරා දීය මෙනේරිය මලේ පාටට බිමට බා අනුපූට්ටුවට නස්න කරනු. කනෙ වක්කරනු. කම්මුල් දෙකෙ ගානු.

92. අනුපූට්ටුවට.

අත්තන කොල ඉස්මත්, එල ගොමත් කබලෙන් පැසවා පිටි කර දීග්ගා අදිනු.

93. පිටගැස්මට.

අත්තන, කුඹුරු දළු, තික දළු, වරා, කරඳ, රත්තිටුල්, කුප්පමේතිය, තුඹ, මදටිය, බෙලි, ඔලිඳ, මෙකී මුල් එක එක පමතු ගෙන කොටා ඉස්ම ගෙන තල තෙල්, එඬරු තෙල්, එක පමණට ගෙන මීට සරක්කු, පෙරුන්කායන්, කටුකරෝසන, වදකසා, උළුවාසල්, සන්තිනායන්, සොංකලරි කොට්ටන්, වගපුල්, සීනක්කාරන්, දුරු දෙක, සුදුළූනු, අසමෝදගං, සිවිය මුල්, තිප්පිලි, අතිඋඩයං, කරාබු, වසාවාසී, සාදික්කා මෙකී දේ එක පමන ගෙන මුරුංගා පොතු යුසිං අඹරා තෙලට යොද මිල්ල දරින් කකාරා තෙල්කා ලනු ඇබරෙන පදමට බානවා, බඩ අල්ලනු. සන්දිවල ගානු. පිට ගැස්මට තෙලට.

94. කොසඹ පොතු, තොටිල්ල පොතු, තුවර ලා මුල්, මුරුංගා මුල්, මීමුරුවට, දළුක් දළු, යක්බෙරිය, යක්වනස්ස, පාවට්ටා, දෙසී, දෙඩං, නාරං, මෙකී දළු කෝවක්කා කොල මෙකී බෙත් එක එක පමන ගෙන කොටා මිරිකා ශලක වත්කර තල තෙල් එඬරු තෙල් එක පමන එහි වත්කර ලිප තියා කකාරා මීට සරක්කු පාවට්ටා, වදකහ, තුං අවුරුදු එනු මෙ තුං වගේ පලම පලම ගෙන සුදුළූනු, පෙරුංකායන්, තිප්පිලි, දිමි බිජු, බිම්මල් මෙකී කලඳ කලඳ ගෙන දෙපහුව අඹරා තෙලට යොද කකාරා තල්ක ලනු ඇඹරෙන පදමට බා තබා තෙල් රාවනාවක් පොවනු. සන්දි වල හෝ කොන්ද දිග ගානු. ඒ රොඩු පොට්ටනි බැද තවනු. පිට ගැස්මට අත්දුටුවයි. මෙම පොල් තෙල් පාං වැටිය අඹරා තෙලෙ ගාලා පත්තු කර දෙඩං ගෙඩියට අල්ලා දැලි වස්සා අන්ජනත් ගානු.

95. වැදූගෙයි පලමු කොට දෙන කසායට.

දුරු දෙක, අසමෝදගං, තිප්පිලි, ත්‍රිජාත, කොට්ටං, මේවා අඹරා තබා, දිවුල් පාවට්ටා මුරුංගා, ඇවරිය, වෙල්ලංගිරිය, කොසඹ, කුඩු මිරිස්, මෙකී මුල් පෙරංගා ශලියක දමා පානු දිය වක්කර කඩ වසා බැද ලිප තබා කකාරා ගෙන මිරිකා ඉස්මෙන් දියකර දෙනු.

96. වැදූගෙයි බඩේ කැක්කුමට.

අහුන මුල් ඉස්ම මනාවයි. සහිද එනු. පෙරුංකායන්. සුදුළූනු. මේවා අඹරා කසායට කකාරා බාන්ට කිට්ටුව මනා දෙකක් පමන එඬරු තෙල් වක්කර බොන්නට දෙනු.

97. වැදූගෙයි ලෙඩට.

කළු දුරු කලදයි, සුදුදුරු කලදයි, පෙරුංකායන් කලදයි, සිද්ධිඟුරු පතයි, සුදුළුනු බික් හයයි, එඬරු මුල් මිටයි, කරපිංච නැටි මිටයි, සිවිය මුල් මිටයි, තික නැටි මිටයි මෙවා තෙරපා අට එකට කකාරා දෙනු.

98. මා විණ්නු තෛලයට - සූතිකාවත්ට -

දළුක් සිනුක් සිරුස්ස පතුක් කොල යුස නැලියෙ තා
අමුක්‍රා තික සස්සඳ ඉරමුසු යක්බෙරිය යකු වනසුගෙ තා
කුඹුරුට මදුරු ඉරිවෙරිය මීරිකුළු වැටකෙයියා කුඩු මීරිස ගෙ තා
වැල් තිබ්බටු මුල් නැලිය බැගින් ගෙන ගො මුත්‍රා දෙනැලියක් ගෙ තා

තිකුළු තිපල් සුදුළුනුත් කුළුදුලක් පමන සමව ගෙ තා
ජාති පලං වසවාසි කරාබු ද සෙවුවෙල්ලි කොට්ටම් සමග ගෙ තා
සුවද හොටත් ගල් මද ගල් නහරත් සිනක්කාරං වද කහ රුගෙ තා
ඉඟුරු මිරිස් සහ සවිද එනුත් ගෙන හිඟු කලද කලදිමමගෙ තා

කොසඹද තල තෙල් එඬරුදම්තෙල් නැලිය කකාර වී ට
සමව ඇඹරු සරක්කුත් ලා සමව කල්කය ලනු වැටෙන කො ට
දියට බා තෙල් තබා රිසි ලෙස කරං යං ලෙඩත් වූ වී ට
පොවා ගත මැඩ නණ්න වස්තිය කරං අවගති සන්ති ලෙඩක ට

සිරස අංසෙක දෙගිතියන් කටත් තාසෙති ඇද උනාට ද
කනත් නැයි බෙල්ල කොරවම ඇතුල්වී ඉදී මුනාට ද
අන්සයක් කොර වෙලා උකුලක් හිරි වැටි ගෙන එන වෙලාව ද
තවත් ඉදිමුන් දය වෙවුළුන් සන්දි ඉදිමුං යේය මුල්සි ද

99. වැදූගෙයි ලෙඩට.

කුරුඳු, තික, සිරි වැඩිය, බැබිල මුල්, මිරිස් මුල් මෙකී මුල් දෙපලමක් කොටා ශලියක දමා රා දෙලොසක් වක්කර දවසක් ඌරුවෙංඩ තියා පසුද ලීප තියා, දුරු දෙක, තිප්පිලි, කරාබු, වසාවාසි, සාදික්කා, වලහසාල්, අසමෝදගන්, මෙකී දේ පොඩි කොට දමා අරක්කු වැටී බණ්න උනවිට බා තබා සුදුළුනු ගෙඩි පතයි, මිරිස් පතයි මෙකී දේ කුඩුකර දමා තිව්වවාම බොන්නට දෙනු. වැදූ සන්තියට, දූලවර දෙකෙන් එන කැක්කුමටද අතපය එලනෙවාටද පපුව සිරවිමටද තිස් දෙකක් වැදූගෙයි ලෙඩද අසුවක් වාතෙටද සන්ති කොරේටද හන්දිපත් කොර උනාටද වැදූ ගෙයි ශම ලෙඩට අද්දුටුවයි.

100. වද මල දරුවැටෙන්ඩ බැරුවාටංඩ.

ඉය කොල, කොසඹ පොතු, ගස් කැප්පිටියා පොතු, මෙකී දේ කොටා ඉස්ම මීරිකා සාදිලිංගන් අඹරා දිය කර තෙල් ටිකක් දිය කර බොන්නට දෙනු. මල දරුවො වැටෙත්.

101. කඹිලි රෙදී තල තෙලිං පුළුස්සා තල තෙලෙං පොවනු. බඩ මල දරුවෝ වැටෙත්

102. මී අරටු, රතුළූනු, හඳුං, කෝමාරිකා, උප්පැතියෙන් පොවනු.

103. උප්පැති, එලකිරි, තැඹිලි, කස පැං වතුර මෙකී දේ එකිච්චරට ගෙන පොවනු.

104. බඩ මල දරුවන්ඩ උයාපු හාල් නැලියක් විතර ලිප තියා කැඳ පෙරා එලඟි තෙල් දෙපතක් එක්කර බොන්නට දෙනු.

105. අන්නාසි ඇඹුල්, රඹුක් බොඩ ඉස්මත් බිං පොල් ඉස්මත් එකතුව දෙනු.

106. ගර්භනීන්ගේ බඩින් යනවාට.

බෙලි මුල්, කලාඳුරු අල, ඉරමුසු මුල්, කොට කිඹුලා පොතු, තැඹිලි පොල් මල්, මෙවා ඉස්ම එක එක පමන ගෙන කසාය කකාරා සත් වරුවක් බොන්නට දෙනු.

107. ගුරුළුරාජ තෛලය.

මුරුංගා මුල් ඉස්ම නැලියයි, එනු අරන ඉස්ම නැලියයි, කරද මුල් ඉස්ම නැලියයි, නික මුල් ඉස්ම නැලියයි, මුඩ මහන මුල් ඉස්ම නැලියයි, පොල් කිරි නැලියයි, කටුකරෝසන, කොට්ටං, කරාබු, වසාවාසි, සාදික්කා, දුරු දෙක, අතිළුඩයං, අසමෝදගං, මෙකී දේ එක්කලං සමාර බැගින් ගෙන කසායට යොද දුම්මල තෙල් තුං කලඳයි, තල තෙල් නැලියයි, එලඟි තෙල් නැලියයි, ජයපාල තුන් කලඳයි, සතියක් ගිනිකර තෙල් කාලනුවැටෙන පදමට බා පෙරා තබා නොයෙක් ලෙඩට රුදවට වැදුගෙයි සන්නියට, අසූවක් වායුවට, දහ අටක් ජ්වරයට, ඇගේ ඉසේ සන්දිවල ගානු. බොන්නට දෙනු: ඇසට ගසනු.

110. ඇට නහර වල රුජාවට.

සිනමුල් විසිපස් කලඳයි, කුරුඳු මුල් පශ් කලඳයි, අශමෝදගන් කලඳයි, වැල් මිරිස් කලඳයි, සුදුළූනු කලඳයි, අගිල් කලං බාගයයි, කරාබු කලඳයි, ශාරන මුල් කලඳයි, කොහොඹ කුරු දෙකලඳයි, ශිවිය මුල් කලඳයි, අරළු කලඳයි, නෙල්ලි දෙකලඳයි, ඉඟුරු කලඳයි, මෙකී බේත් දිය දෙකක් වත් කොට අරක්කු නැලියකුත් වක්කර එකට හෙලා ශම පාකයට බා පෙරා බී කල්හි මෙය ගුනවේ.

111-1 දරුවෝ සිටීමට.

රංවං බැබිල මුල්, මල්, උක් හකුරු, වැල්මී, කිරි උතින් වක්කර පොවනු.

112-2 කුඹුරු ඇට, මුල්, කොල, මෙතුන වටා කිරි මැඩ නිරන්තරයෙන් පොවනු.

113. වැදුගෙයි සියළු ලෙඩට

අරළු, ඉඟුරු, බැබිල, සුදුළූනු නිශි විධියට කිරා කශාය කර දෙනු.

114. වැදු ගෙට කොහොඹ කායමට බේත්.

කළු දුරු, සුදුදුරු, අසමෝදගන්, තිප්පිලි, කරාබු, වසාවාසි, සාදික්කා, අතිවිඩයන්, කොත්තමල්ලි, උළුවා, වදකහා, පෙරුන්කායන්, සුදුළූනු, මෙවා කලං එක එකයි ඉඟුරු කලං 3, ගම්මිරිස් කලං 3, අබ කලං 3 මෙවා සේරම එකට වේලා අඹරා ගෙන දෙඩන් ඇඹුල් පත බාගයයි, කොහොඹ කොල ඉස්ම පත බාගයයි, කොහොඹ පොතු ඉස්ම පතයි; මෙ ඉස්ම වක්කර කායන් පිස වේලට බුළු ගෙඩියක් පමන කායම් දෙවේලේ දෙනු.

එනු ඇඹුල්, අලුත් මාළු නොකනු, දහතර වේලක් දෙවේලේ මෙලෙශ කා ඉතිරි බේත් තිබා වතුර නාපු දවස් වල ගුලි සතර කනු. බඩේ පිපුන්,සුඩ වීම නැතුවාට සහ වැදු අයගේ බඩේ සියළු රෝග වලට අද්දුටුවයි.

115. ගර්භනීන්ගේ ඉදිමුවට

ඉකිරි මුල්, ඉය මුල්, කරල් ශබෝ මුල්, කහඹිලියා මුල්, මෙකී දේ සමව ගෙන කබලෙන් පුළුස්සා අළු ගෙන ඊට අරළු, බුළු, නෙල්ලි, යහුනු, අමබර, මෙකී දේ අට එකට කකාරා දෙනු. එනු ඇඹුල් වලකිනු.

116. කැශි පිත්තන්, වැල් කශඹිලියා, හාතාවාරිය, බෙලි, බැබිල, වමමුතු, මෙ හැම සමව ගෙන සුදුදුරු අශමෝදගන් කොත්තමල්ලි, වලහසාල්, කොට්ටන්, වැල්මී, දේවදුරු, මෙ හැම අඹරා මංචාඩි දහයයි අරළු ඉඟුරු තුන් තුන් කලදයි ගෙන චූර්ණ කර අට එකට කකාරා දෙනු.

117. බෙලි, වත් ඇපල, බැබිල, බටු, හාතාවාරිය, ඉරිවේරිය, වමමුතු, ඉඟුරු, තිත, බටු, කරවිල, මෙකී මුල් මිට මිට ගෙන සතර එකට කකාරා විලඳ කුඩු දමා දෙනු.

118. ඉඟුරු, දෙහි ඇඹුල්, ගොරක කොල, කපු කොල, මෙ හැම පත පත ගෙන කළු දුරු, සුදුදුරු, අශමෝදගන්, තිප්පිලි, වලහසාල්, අතිඋඩයන්, කොත්තමල්ලි, මෙ හැම මංචාඩි පහ පහ ගෙන ඉඟුරු මිරිස්, අබ තුන් තුන් කලදයි, අරළු පස් කලදයි, යහුනු තුන් කලදයි, සියඹලා සුඹුළු තුන් කලදයි, වෙලි කශා කලදයි මෙ හැම අඹරා කායන් පිස බුළු ගෙඩියක් පමන අවස්තා බලා දෙනු. උනු දිය බොනු මින් ගුණ උන ඉදිමුන් නැතිවෙ.

119. වැදූ ගෙයි සත්තියට

දසමුල්, පංචකෝල, බැබිල, දේවදුරු, අරළු, කසාය දෙනු.

120. එලකිරි, තැඹිලි දිය, උප්පැති, මී පැති, දෙඩන් ඇඹුල්, මෙවා පත පතයි කළු දුරු, අසමෝදගන්, තිප්පිලි, ත්‍රිවර්ග, වැල්මී, පත්පාඩගන් අල බේත් මෙ හැම අඹරා යොදු කකාරා දෙනු. ගර්භනීන්ගේ උන ගිනියන් හති කැක්කුන් ගුණවෙයි.

පාවට්ටා මුල්, රසකිඳ, සාරන අල, තිරස්තවාළු මුල්, කලාදුරු අල, මේවා පත පත කහට පුවක් ගෙඩි අටක් ගෙන අරළු බුළු, නෙල්ලි, ඉඟුරු, මිරිස්, කරාබු, වශාවාසි, සාදික්කා, තිප්පිලි, සහිඳ ලුනු, වලහසාල්, මෙකී සරක්කු කලඳ කලඳ ගෙන වතුර දහසය එකට කකාරා බොනු. උදේට එඬරු තෙල් දමා බොනු. වැදූගෙයි හැම ඉදිමුනටද තනි ඉදිමුනටද යහපති. අත්දුටුව කසායයි.

කුෂ්ට රෝග

සියලු කුෂ්ටයටය්

1. දුම්මැල්ල, තිපල්, රසකිද, කටුවැල්බටු, වන් ඇපල, මහුල් කරද යන මෙයින් වෙන වෙන සකලන් මංචාඩි දහ හතර බැගින් ගෙන කල්කද අඹරා දිය සතර නැලියක් හි තෙල් නැලියක් වත්කොට කලතා පස් දවශක් මද ගින්නෙන් කකාරා සමපාකයට බා පෙරා ගත් වජ්‍රනම් මේ ස්‍රුතය පමන දූන තුන් කලද බැගින් වලදනු. ඇඟ ගානු. සියළු කුෂ්ට නසා.

2. ලොප් ශුඹුළු, එංසාල්, රත් නෙටුල්, ගිගුරු පියලි, දියමිත්ත, කොල්ලං කොල, කුරුඳු පොතු, නාමල් රේනු, නෙළුම් අල, මිරිශ්, කොශඹ, දේවදර, කෙලින්ද ඇට, මහ ගොන් කැකිරි මුල්, උපුල් කොල, හීන් මැඩ හඟු, වලහ ශාල්, තිපල්, තිකුළු, කුරුඳු, වගපුල් මුල්, ශිවිය, අශමෝදගන්, යන මෙකී බෙහෙත් තුං තුං කලද ගෙන කපා පොඩි කොට දිය දශ නැලියක් වත්කර කකාරා දෙනැලියකට හුනුකර ගෙන ගිතෙල් කැවූ වල දෙකලා ශුරකිව තබා පශලොශ් දවශකින් ගෙන දවශ දෙපළමක් කසායයෙන් වලදනු. මේ හැම පාඩු රෝගද අරිශශ්ද කුෂ්ට අරුචි මෙතෙක් රෝග නශා.

3. ඡ්ටම දුම්මැල්ල, තිපල්, කොශඹ, එලබටු, වං ඇපල, කරද මෙතෙක් බෙහෙත් අඹරා දිය ශතර නැලියක් ගිතෙල් නැලියක් එක්කර කකාරා ශිදගත් මේ ශ්‍රිතය වජ්‍රක නම්වේ. මේ තෙල් වැලදීමෙන් සියළු කුෂ්ටනසා.

4. ඡ්ටම බිං කොශඹ, තිපල්, ශැවැන්දව, උපුල් කොල, කොශඹ, වංමුතු, කශඹිලිය, වැල්මී, ඉරමුසු, කුළු රැන, තෙමෙන්ල, සඳුං, වගපුල්, නෙළුම් මල්, වද කශා, කහ, ගොන් කැකිරි, කෙලින්ද ඇට, හීන් මැඩහඟු, දුම්මැල්ල, ඇශල, පැපිලිය, කශා, වෙනිවැල් ගැට, රුක්අත්තන, ශානාවාරිය මෙකී බෙහෙත් අඹරා කල්ක පතකට ගිතෙල් ශතර පතක් හා දිය අට නැලියක් වත්කොට කකාරා හිදගත් මේ තෙල නමින් මහාතිත්ථ නම්වේ. මේවා වැලදීමෙන් රත්පිත් නිසා උපන් කුෂ්ඨ, පාඩු රෝග, උන, නශා.

5. කදලි දවාගත් අළු හෝ කරල් ශැබෝ අළු හෝ තල තෙලින් අනා ඇඟ ආලේප කරනු. ශියළු කුෂ්ඨ නසා.

6. ඡ්ටම මොනර පිල් එක්ව අඹරා ගත් මනෝශිල හෝ ඉරිවේරිය අළු හෝ ආලේප කරනු.

7. ඡ්ටම දළුක් කිරි, වරා මුල් ශුඹුළු, ශවින්දව, රත්නෙටුල් මෙකී බෙහෙත් අඹරා ගොමූත්‍රයෙහිලා කලතා තල තෙල් එක්ක පෙරා ගෙන ගැල්වීමෙන් සියළු කුෂ්ඨ නශා.

8. ඡ්ටම රශකිද, තිපල්, වෙනිවැල් මෙකී බෙහෙත් කකාල කශාය ගෝමූත්‍රයෙන් බොනු. මසක් මෙලෙස කල, සියලු කුෂ්ඨ නසා.

9. ඊටම ගල් ශෙවෙල් කශාය හෝ අඹරා මී පැති හෝ ගෝමූත්‍ර එක්කොට පොවනු. කුෂ්ඨ හා පාන්ඩු රෝග නශා.

10. ඊටම වලහශාල්, රත්නෙවුල්, ශිති, තලතෙල්, නෙල්ලි, යදැල් ශූනු, වගපුල් යන මෙතෙක් බෙහෙත් ශම බාග ගෙන එක්කොට අඹරා ලේහ කරනු. සියළු කුෂ්ඨ නශා.

11. දුම්මැල්ල ශමූලයෙන් ගෙන කකාරා ශිදගත් තෙල හෝ කොශඹයෙන් ශිදගත් ගිතෙල හෝ කිහිරි හරින් ශිදගත් ගිතෙල හෝ වෙතිවැලින් හිදගත් ගිතෙල හෝ පෙවීමෙන් පිතිං උපන් කුෂ්ඨ නැති වේ. මේ තෙල ශිදින්ට තල ශැට සතර පලං බැගිං ගෙන දිය දශයක් වත්කොට ඒ ඒ බෙහෙතකින්ම කල්ක පත පත අඹරා කකාරාලනු. නැලියට ශිවුවා බා පෙරා ගෙන එලගිතෙල් නැලියක් එක්කොට ගන්නේය. ලනු වැටෙන පදමට බා පෙරාගෙන සුරකිව තබා පෙවිය යුතුය.

12. අමු ඇට, පින්න කොල, ලාකඩ, තිකුළු මෙකී බෙහෙත් අඹරා ඇඟ උලනු. ශියළු කුෂ්ඨ නශා.

13. මනෝශිල, මිරිශ්, තලතෙල්, වරාකිරි, මෙතෙක් දෑ ගෙන අඹරා ඇඟ උලනු. සියළු කුෂ්ඨ නශා.

14. අරළු, මගුල් කරඳ ඇට, අබ, බෝදි ඇට, ශවින්දව එනු, වලහශාල් මෙකී බෙහෙත් ගෝමූත්‍රයෙන් අඹරා ඇඟ ගෑමෙන් සියළු කුෂ්ඨ නශා.

15. ලොත් ශුඹුළු, රශ අඳුන්, ශවින්දව, තුවර ඇට, කෙලින්ද ඇට මෙකී බෙහෙත් අඹරා ඇඟ ගානු. ශියළු කුෂ්ඨ නශා.

16. ගන්දක, එනශාල්, මනෝශිල, උපුල් කොල, රංවං කැල, සුවඳ හොට, කොල්ලං කොල, කුරුඹු පොතු, තුවර අල මෙකී බෙහෙත් ශමව ගෙන බුළු හර මුශුකොට ගෙන කාඩියේ කකාරා ගඩු පිහ. නුග කොල මලවා එහි ලා පොවනු. කුෂ්ට නශා.

පනු කැවිල්ලට:

පැහිච්ච දෙඩන් ඇට පොතු ඇර එනුදියෙන් අඹරා ගානු.

1. අත් ශුධුවූනාට, සුවේත කුෂ්ටයටඃ

දිවිකදුරු ඇට අල්ලුවක් පමන ගෙන කැප්පිටියා මුල් තුං කලදක් ගෙන අඹරා ජැහිප්ජ පොල් ගෙඩිය දිය හුනු හා දමා පොල්කුඩු ගා ගෙන මෙකී බේතුත් එක්කොට මීරිකා තෙල්ලිප තබා තෙල්පාට වැටුන තැන පෙරුංකායන්, කයිප්පු, වෙඩි එනු, වැල්මී මේවා මංචාඩි තුන තුන බැගින් පොඩි කර තෙලට දමා, තික මුල් තුං කලදයි, අළු හුනු, මුරුංගා මුල් පොතු, මෙකී බෙහෙත් නැලියක ලා පොලවේ තිබා තුං දවශකට පශුව ගෙන තුන් දවශක් තිරුවානා ගලක් රත්කොට වේධු පානු. තෙල් ගානු. ඊට පශුවත් තෙල් ගානු.

2. අළු හුනු, මුනු පැං, වරා කිරි, මල බටු ඉශ්ම, අමුකපුරු මෙකී දේ මඬා පිටෑ නැටියෙං ගවා අත ගානු. කබර ගුනවේ. අද්දුමුවයි.

3. පඹුරු ඇට නැලියක් එම ශුඹුළු නැලියක් හා පැනි ශිද ගෝමුත්‍රයෙන් අනා ගානු. කිටිභ කුෂ්ටයටයි. කොසඹ, මහුල් කරඳ, ගිවුළුය, රත්කැලිය, කුකුරුමාන්, ඇහැලය මෙකී බේත් වියලා චූර්ණ කොට රැතිදෙන් ගොමුදිය වත්කොට අනා අව්වේ දී යහපත් කොට වියලා චලදෙක තබා දෙහි ඇඹුල් වත්කොට කශා මුශු කොට අතපං ශ දවහක් ඇඟ ගානු. සියළු කුෂ්ට නශා.

4. ශිරිල ශමුලයෙං ගෙන වල්රංධු ශාමුලයෙන් කාඩියෙ කකාරා එනු මිරිශ් තෙරපා ශතිහක් දෙනු. ශවශ එක්වතට එනු නොලා හෙලකිරි නැලියක් මහ රැක්මල් සුනුලා මෙශේ තලප පිශ කවනු.

5. පිව්ව මල්, බුළු ඇට, ලාකඩ, සිද්ධිගුරු, මිරිශ්, වගපුල් ශමසේ ගෙන අඹරා ඇඟ උලා ගල්වා තබනු. සියළු කුෂ්ට නශා.

6. කොට්ටං, මගුල් කරඳ ඇට ශමසේ ගෙන අඹරා ඇඟ උලා ගල්ලනු. සියළු කුෂ්ට නශා.

7. රශධූන්, ලොත් සුඹුළු, ශවින්දව එනු ශමසේ ගෙන ඇඟ ගල්ලනු. සියළු කුෂ්ට නශා.

8. කෙශෙල් පතුරු දවාගත් අළුවත්, කරල් ශැබෝ ස මූලයෙන් ගෙන දවාගත් අළුවත්, තලතෙල් වත් කොට මුත්‍රත් එක්ව ඇඟ උලනු. සියළු කුෂ්ට නශා.

කුෂ්ටයට සොරිකඩුවේගප්ඃ

එවලෙම සිදගත් පොල් තෙල් පතක් ගෙන මීටම කෙමහිද කොල ඉෂ්ම සතර පතකුත් තෙලට එක්කොට මීට කල්ක, වරා මුලේ පොතු එම මල්, ඒකාවෙරිය, අතිත්ත ගහේ මල්, අත්කෙන්ද මුලේ පොතු, කැප්පිටියා මුලේ පොතු, කෙමහිද මුලේ පොතු, මෙකී කලඳ කලඳ ගෙන පල්මාතික්කම කලදයි කිරබ් කලදයි, ගන්දගත් කලන් බාගයයි. මේ හැම දිය වත්කොට අඹරා තෙලට යොද තිස් පැයින් කකාරා පදමට එන ප්‍රස්ථාවට මී ඉටි මංචාඩි පසකුත් එක්කොට පදමට සිදබා පෙරා ගෙන තබා ගානු. සියළු කඩුවේගත් සොරි ගුනවේ.

කුෂ්ට:

වරා කිරෙං, වලහසාල්, මිරිස්, මනෝසිල, අඹරා ලෙපයෙන් ගානු. සියළු කුෂ්ට නශා.

අරළු පොඩි දෙකලඳට නවසාරං, සූස්කර, පල්මාතික්කන් මංචාඩි දෙක දෙක ගෙන මඩෙක කඩ පින්නේ උයා ගත් සියඹලා කොල ඉෂ්ම සත්විටක් අව්වේ තිබා අඹරා කුෂ්ටයෙහි ගානු. තාක්කු නොවෙ නම් රස මංචාඩියකුත් වච්චනාවි මංචාඩියකුත් එක්කොට අඹරා ගානු. ගුණවේ.

කඩිවේගමට තෙල්:

දෙළුත් මුල්, මදුරු, තිකා, කරල් සබෝ, රට තෝර, බැබිල මෙකී මුල්වල පොතු අරළු, කළුදුරු, සෛන්දව ළුනු මේ හැම කලඳ කලඳ ගෙන පුස්කර, සිද්ධිගුරු කාල කාලයි, පල්මාතික්කන් මංචාඩියයි මේ හැම අඹරා තල තෙල් පතකට එක්කොට කකාරා පදමට පෙරා ගෙන අමු කපුරු, සොද කපුරු කොකුන් මෙයින් මුක්කලන් ගෙන අඹරා තෙලට එක් කොට කඩිවෙගමට සොරියට ගානු.

තීලිකාදියට:

තොලොබො අල, ගරිද පොතු, අංකෙන්ද පොතු, කඩොල් පොතු, ඒකාවෙරිය මුල්, කැප්පිටියා පොතු මෙකී බේත් සමබාග ගෙන තැඹිලි පොල් තුනක පොල් කුඩු ගා මෙකී පොලුත් එක්ක කොටා තම්බා මිරිකා ගෙන මීට කල්ක, පල්මාතික්කන්, ගෙන්දගං, වරාමුලේ පොතු, රහදිය, සිද්ධිගුරු, තිප්පිලි මෙකී බෙහෙත් කලං භාගය කලං භාගය ගෙන රසදිය අත්තන කොල බුලත් කොල ඉස්මේ අඹරා බේතුත් එක්ව සොදින් අඹරා තෙල් කකාරා පදමට එන්න මදක් වේලසන බා කල්ක එක්කොට සැදීගා පදමට ආ තැන රෙද්දෙන් පෙරා මතුපිටින් පෙරාගෙන තිබා තෙල් කා වියාදිය උලා තෙල් ගාපන් තීලිකා කඩිවේගම, කුෂ්ට, පඬ නාමර, මෙකී දෙ ගුණවේ.

ඉසෙ හැම තැනම සොරියට:

කල්ගිය ගරිද වැලක පොතු පස් පලමක් පිට කුඩු ගා දමා දියසතර නැලියකට

කකාරා පොල් දෙකක පොල් කුඩු කොටා එදිය නැලිය වත්කොට පොල් කුඩු තම්බා කිරි මීරිකා කරපාකයට තෙල් සිද ගෙන සොරියට ගානු.

තාම්‍ර කුෂ්ටයටඃ

1. රුකගුන පොතු සියක් පලමයි රත් කිහිරි අරටු, කළුවර අරටු දහ දහ පලමයි, ඇසල අරටු පස් පලමයි, කොසඹ පොතු දෙපලමයි, එරබදු පොතු තුං පලමයි, ගරිද මුල් සතර පලමයි, වරා මුල් සතර පලමයි මෙකී බේත් වන ලා කොටා දිය තිස් දෙකක් වත්කොට මද ගින්නේ හත් දවසක් කකාරා අට නැලියකට පෙරාගෙන මීට තලතෙල්, කොසඹ තෙල්, එරඩු තෙල්, මකුළු තෙල් මෙකී තෙල් මනාව මනාව ගෙන කසායට එක්කොට, මීට අඹරා එක්කරන බේත් චූර්ණය, කිහිරි අරටු, පත්කැල, කුඩුමිරිස, තිමුල්, කහඹිලියා, තිත්ත වැටකොළු, තිත්ත ලබු මේ හැම මුල් ගෙන, කොවක්කා අල, තියද අල, වල් කිඩාරං අල, තොර ඇට, බදුල්ල ඇට, බෝදි ඇට, අඳු ඇට, ගස් කදුරු ඇට, මකුල් ඇට, එරඩු ඇට, මහල් කරද ඇට, කොහොඹ ඇට මේ හැම සකලං බැගින් ගෙන වේලා චූර්ණ කොට තෙලට දමනු. වෙලඩ බැරි දෙය අඹරා එක්කරනු. තවද, මුඩමහනු, කඳුලැස්ස, වෙලිප්පරිත්ති, රම්මතිස්ස, වේලා, තලා අඳු මෙකී බේත් සාමූලයෙන් තුං තුං කලද ගෙන තෙතින් අඹරා මුල කී තෙලට එක්කරනු. මෙම තෙලට කල්ක, අරළු, බුළු, නෙල්ලි, මිරිස්, සිද්දිගුරු, වගපුල්, වෙනිවැල්, හරන්කසා, සුදුරු, කළුදුරු, වලහසාල්, එන්ශාල්, හිරියල්, සිනක්කාරං, නවසාරං, සුස්කර, එලිමරින්ද්‍ර, තුත්ථම්, තුරිසි, ගෞරිපාසානන්, සාදිලිංගම්, ගන්දක, රසදිය, වච්චනාවි, සාදික්කා මේ හැම කලද කලද ගෙන අඹරා තෙලට එක් කොට පස් රෑයක් මද ගින්නේ කකාරා සම පාකයට තෙල කඩකින් පෙරා තනා තිබා ලවනාම්ලය වර්ජිත කොට බ්‍රහ්මචාරිව අව් සුලං නොගස්වා මාත්‍රා දන අනුබව කරනු. ඇගෙත් ගානු. සතලිස් පස් දවසකින් තාම්‍ර කුෂ්ට ගුනවේ.

2. තෙල්ලික්කා ගන්දක, ගන්දක, සුස්කර, රසදිය, මනෝසිල, කළුදුරු, සුදුදුරු, දෙකසා, සිරියල්, මිරිස්, කළු තඹ බස්ම, තෝර ඇට, බෝදි ඇට කලද කලද ගෙන හොත් එලගිතෙල් සතර පලමක් ගෙන දෙකලා දඩෙන් උදය පටන් රාවන තුරු අඹරා ගත් තයිලය මහෙස්වර ග්‍රිත නමවේ. මේ බේත නම ඇඹුරු තුන් දවසකට පසුව ගෙන ශරීරයෙහි ආලේප කරනු. සොරි කුෂ්ට කැඩුම් විසාදද සමනය වේ. මෙම ක්‍රමයෙන් තුන් දවසක් කරනු. තඹ බස්ම සාදන කල කොමාරිකා පියලි කළු තඹ උනු කොට කොමාරිකා පොඩි එහිලා සත් අට පැයක් ගිනිකරනු බස්මයි.

3. තෝර ඇට, සිද්ධිගුරු, අරළු, කොසඹ කොළ, අබ, තිප්පිලි මේ හැම මෝරු වත්කොට අඹරා ඇඟ උලා නහනු. දද, කිටිබ, වාඩ, කාමර මේ හැම නසා.

4. කරද පොතු, ඇසල පොතු, දියමිත්ත පොතු, අරළු, සිද්ධිගුරු, තිප්පිලි මේ හැම

ගෙන දළුක් පළු උන අළුවෙන් උයා ඒ යුෂයෙන් අඹරා දද, පඩ කාමර ඇති තැන් උලා දමා තබනු.

අළු ගොම්රට:

1. ඇසල කොළ පොතු, මගුල් කරද මුල් පොතු, ගන්දක, මනෝසිල, කසා, තල, සෙන්ධව සම බාගව ගෙන සීනුක් පළුයුසයෙන් අඹරා දිය නොව ඇඟලා සවස උනු දිය නානු.

2. දැත්ත බිජු, බඳුළු ඇට, තියගලා, රත් තිවුල්, වියං දුඹුළු ඉඟුරු ඉෂමෙන් වටා ආලේප කරනු.

3. තෝර ඇට, බෝදි ඇට, පසකුරුසුඹුළු, කොසඹ කොළ, කසා, ඇහැල, කුකුරුමුවන්, ගෝමුත්‍රවටා ආලේප කොට උලා දමනු.

4. රංමොට අල, තුවර ඇට මෙවා දළුක් පල්ල යුෂට සත්දිනක් තිබා දෙසි ඇඹුලෙන් වටා ආලේප කරනු.

මුල වෑදියට:
ගැට ඇත්නම

තිත්ත වැටකොළු ගෙඩිය ගින්නට පැ උයා පිට පොතු හැර දමනු. මුල විසාදියට ගැට කැපිමයි. ඉක්බිති ගෙඩි කැපනු වනේ ගුනවේ. කටුපිල කොලමුල්. කටුකරඩු මුල් කොල, අරළු, වගපුල්, සිද්ධිගුරු මෙකී දේ අඹරා ගිතෙල්, තලතෙල්, එක්කොට සිද තෙල්කඩ ලනු. මූල වැදිය ගුනවේ.

මුලං කිසෙ ලේ යනවාට:

සැබෝ මුල්, පොතු සාල් පානුවෙන් අඹරා සඳුං එක්ව පොවනු. ගුනවේ.

ගැට අඹල වැදියට:

1. අබ අඹරා ලා ගැට දෙහි, වදකසා, ලුණු, දෙසි ඇඹුලෙන් උරව්වි කර පොවනු.

2. අත් කහ අඹරා දිය කොට පොවනු.

3. පල්මාතික්කම උනු කර මුරුවට හා දෙසිගෙඩිය ඇතුලෙ රෑයක් තබා

පියන වසා උණු ගන්වා දෙනු

4. දුම්මැල්ල, තිපල්, කොහොඹ, එල බටු, රසකිඳ, පාවට්ටා, කරඳ සියල්ල සමව එක්කොට ලීප තබා කකාරා ගත් අඹරා දිය හතර නැලියක් එළගිතෙල් නැලියක් ස්‍රුතය දෙන්න.

5. බිං කොහොඹ, තිපල්, සැවැන්දරා, උපුල් කොල, කොහොඹ, කලාදුරු අල, කහඹිලියා, වැල්මී, ඉරමුසු, තිකුලු, තෙමෙතල, සඳුන්, වගපුල්, නෙලුම් මල්, වදකහ, මහ ගොන් කැකිරි, කෙලිඳ ඇට, සිහින් මැඩ හඟු, දුම්මැල්ල, ඇසල, පැපිලිය, කසා, වෙනිවැල්, රුක් අත්තන, හාතාවාරිය බෙහෙත් අඹරා කල්ක පතකට ගිතෙල් පත 4 ක් මුසුකොට ගත් ස්‍රුතය. සියලු කුෂ්ටයට දෙන්න.

6. දුම්මැල්ල සහමුලයෙන් ගෙන කකාරා සිඳගත් ගිතෙලින් හෝ වෙනිවැල් සිඳගත් ගිතෙලින් කිහිරි අරටුවෙන් සිඳගත් ගිතෙලින් හෝ කොහොඹයෙන් සිඳගත් ගිතෙල් ද්‍රව්‍ය පලම 64 දිය නැලි 16 හතර නැලියට සිඳ බා පෙරාගෙන එළගිතෙල් නැලියක් එක්කොට ඒ බෙහෙත කල්ක පත පත අඹරාලා කකාරා කල්ක ලනුවැටෙන පදමට බා පෙරා ගෙන පොවන්න. සියලු කුෂ්ටයට පොවනු.

1. අභ්‍යංග

දුහුදු ඇට, පිච්ච කොල, ලාකඩ, තිකුලු මෙතෙක් දෙය අඹරා ඇඟ උලනු.

2. මනෝසිල, මිරිස්, තලතෙල්, වරා කිරි, බෙහෙත් අඹරා ඇඟ උලනු.

3. අරලු, මහුල් කරඳ, අබ, බෝදි ඇට, සවින්දව, වලහසාල් මෙකී බෙහෙත් ගොමුත්‍රයෙන් අඹරා ඇඟ ගල්වනු.

4. මහුල් කරඳ ඇට, තෝර ඇට, උපුල් කොල අඹරා ඇඟ ගල්වන්න.

5. ලොත් සුඹුලු, රස අඳුන්, සෛන්ධව, තෝර ඇට, කෙලින්ද ඇට මෙකී බේත් අඹරා ඇඟ ගාන්න.

කුෂ්ට (ලාදුරු කුෂ්ටයට):

මහාසින මුල් අරක්කුව

රාජ වණී චූර්ණය (ලාදුරු කුෂ්ටයට) අල බේත් පලම 1, ත්‍රිවගී, පෙරුම්කායං, අබිං, දෙදුරු, අසමෝදගං, හිරියල්, සාදිලිංගන්, තිප්පිලි, කොත්තමල්ලි, අති

උඩයං, වලංගසාල්, කටුකරෝසන, සීනක්කාරන්, පුස්කර, අබ කලඳ බැගින් අමුක්කරා, සාරණ, සිවිය මුල්, ඉඟුරු, මිරිස්, තිපල්, එන්සාල්, ඉලවං පාවට්ටා, හීන් අරත්ත, ඉඟුරුපියලි කලඳ බැගින් කිකිරිඳිය, මදුරුතලා, අත්තන, කපු, එරබදු කරල්සැබෝ මෙම කකාල ඉස්මෙන් තුන් දිනක් කොටා තබා ඇඟිලි තුනට ඇල්ලූ පමණ මී පැණියෙන් වලඳනු. අපමණ - ලූණු ඇඹුල්, පමණ - එළ මෝරු, මුකුණු වැන්න, පෙති තෝර

කඩුවේගත්:

ඇමබරැල්ල දලු, ලොවි දලු, හීන් බෝවිටියා දලු, ගුරුල්ලා දලු මෙවා එකතුකර දෙඩන් ඇඹුලෙන් දඩි කර ගා නාන්න.

අරළු, මහල්කරද, අබ, බෝදි ඇට, සවින්දව එනු, වලංගසාල්, මෙකී දේ ගොමුත්‍රයෙන් අඹරා ඇහ උලනු. සියළු කුෂ්ට නසා.

මගුල්කරද ඇට, තුවර ඇට, උපුල් කොල, මෙකී දේ අඹරා ඇහ උලනු. සියළු කුෂ්ට නසා.

තිසඳුන්, ලොත් සුඹුළු, ශවින්දව, තුවර ඇට, කෙලින්ද ඇට, මෙකී දේ අඹරා ඇහගෑමෙන් සියළු කුෂ්ට නසයි.

ගංදක, එංශාල්, මනෝසිල, උපුල්කොල, රංවංකැල, ශවින්දව, කොල්ලංකොල, කදුරු පොතුතුවරලාමෙකී දේ අඹරා ඇහ ගල්වනු. සියළු කුෂ්ට නශා.

කදලි දවාගත් අළු හෝ කරල්ශැබෝ දවාගත් අළු හෝ තලතෙලින් ආලේප කරනු. කුෂ්ඨ නසා.

මොනරපිල් හා එකට අඹරා ගත් මනෝසිල හෝ ඉරිවේරිය දවාගත් අළු ආලේප කරනු. පවිත්‍රව කුෂ්ඨ නසා.

දළුක්කිරි, වරාමුල් සුඹුළු, ශවින්දව එනු, සැවැන්දව රත්නෙටුල් මෙකී දේ අඹරා ගොමුත්‍රයෙන් අනා තලතෙල් එක්ව කකාරා තෙල් සිද පෙරා ගැල්වීමෙන් සියළු කුෂ්ඨ නසා.

රසකිඳ, අරළු, බුළු, නෙල්ලි, වෙනිවැල්, මෙකී දේ කකාල කසාය හෝ ගොමුත්‍රයෙන් බොනු. උණුදියෙන් ගුගුල් අඹරා එම උනුදියෙන් බොනු. මසක් මෙ

ලෙස කල ජව් ගත වූ කුෂ්ඨයෙන්මු කලවණද, ඉදිමුන්ද මෙතෙක් රෝගනසා.

වලහසාල්, රත්හිටුල්, සිහි, තලතෙල් තෙල්ලි, යැල්සුණු වගපුල් මෙකී දේ සමබාගගෙන අඹරා ලේහ කරණු. සියළු කුෂ්ට නසා.

කිහිරි අරටු කකාල කශායෙහි මී පැති, සඳුන්, උපුල්කොල, මෙකී දේ අඹරා ලෙහ කරනු. සියළු කුෂ්ට නසා.

දළුක්කිරි මනාවයි, පොල්කිරි නැලියයි, ගන්දක තුන් කලඳයි, රසදිය කලඳයි මෙකී දේ ලොහ හාජනයකට වත්කොට සූර්ය පුටයෙන් පැසවා තෙල් ගෙන නොයෙක් කුෂ්ටයට ගානු. ගුනවේ.

මීටම, දෙශිමුල්, නාරංමුල්, දෙඩමුල්, තලමුල්, කුරුඳුමුල්, සක්සඳ මුල්, එඩරුමුල්, ඒකාවේරියමුල්, කලාඳුරු අල, මීපොතු, පඹුරුමුල්, වසිවාසි, ශාදික්කා, තිප්පිලි, කළුදුරු, සුදුළූනු, කරාබු මෙකී බෙහෙත් කලඳ කලඳ ගෙන මී පැතියෙන් අඹරා පමනට ගුලි කොට ශතරක් කංඩ දෙනු. කැශිමුෂ ශෙලෙෂ්මා ශ පාඩු රෝග ඉදිමුං පිලිකා වායු මෙකී සියළු ලෙඩට අද්දුටුවයි.

මූලවිශාදියටඃ

විල්ධුමමල කෝමාරිකා ශුධුදුරු, කළුදුරු, වලහසාල්, කොත්තමල්ලි මෙකී බෙහෙත් දෙකලඳ දෙකලඳ ගෙන අඹරා හබරල අලයක් පෙතිගසා අඹරාපු බේත් දමා ශැදිගා දෙවේල ටික ටික කනු. එනු ඇඹුල් වලකිනු.

ශෙංගමාරියට

මුං, කයිලකොල, කොල්ලු, මුගුනුවැන්න කොල, හොදශංධුං, කඩොල් උළු අරිශි තැඹිලිදියර තුනක් අරගෙන මනාවකට කකාරා දෙවේලක් දෙනු. හකුරු පැති වලකිනු.

දයරග්ති ඇතිවනවලට

කොට්ටම්, තල, විලඳ, බැද අඹරා එලහිතෙලින් අනා ආලේප කරනු. දයරග්න ඇතිවන ගුනවේ.

වන මස් වැඩීමට

1. මීටම, කොහොඹකොල, දෙකොට්ටාශක් කශා තුන් කොට්ටාශක් ගෙන අඹරා මීපැතියෙන් අනා තිබනු. මස් කැජේ. මේ හැම කකාරා එලහිතෙලිං තිබුකල මස්වඩා ගුනවේ.

2. මීටම, සියඹලාකුරු, එමකොල ඉස්ම වත්කොට මැඩාපිටදී ගටා කළු පැයවූ කල

වණේ ලනු. මස්වඩා පුරා ගතී.

3. රත්කතුරුකොල කොටා එම කොල ස්වරසයෙන් ශිත්දු තෙල් දමනු. වනමය් පුරාගතී.

වජ්‍රක සෘතුය

දුම්මැල්ල, තිපල්, කොහොඹ, එලබටු, කිඳි, වං ඇපල, කරද මෙකී බෙහෙත් ශගින කොට අඹරා දිය හතර නැලියක එළගිතෙල් නැලියක් එක්කොට කකාරා ශිදගත් මෙග්‍රිථය වජ්‍රක නමවේ. මෙ තෙල් වැලඳීමෙන් සැම කුෂ්ට වන නශා.

මහාතික්ත ශ්‍රිතය

බිංකොහොඹ, තිපල්, සැවැන්දව, උපුල් කොල, කොශඹ, කලාදුරු අල, කශාඹිලියා, වැල්මී, ඉරමුසු, කුළුරත, තෙමෙතල ශධුං, වගපුල් නෙළුම්මල්, වදකහ මහාගොං කැකිරි, කෙලින්ද ඇට, ශිහින් මැඩ හඟු, දුම්මැල්ල, ඇශල, පැපිලිය කශා, වෙනිවැල් රුක් අත්තන ශාතාවාරිය වන මෙකී දේ අඹරා කල්ක පතකට එලගිතෙල් ශතර පතක් හා දිය නැලියක් වත්කොට කකාරා ශිදගත් මෙ ගිතෙල් නමින් මහාතික්ත නමවෙයි. මෙයින් රත්පිතින් උපන් කුෂ්ඨ පාඩුරෝග උන උන්මාද ගඩමාලා මෙතෙක් රෝග නසති.

දුම්මැල්ල සහමුලින්ම ගෙන කකාරා ශිදගත් ගිතෙල් හෝ කොහොඹයෙන් (?) සිදගත් ගිතෙල් හෝ පෙවීමෙන් පිතිං උපන් කුෂ්ඨ නශා.

මෙ තෙල් සිදිනා කල ශැටශත පලම බැගින් ගෙන දිය දහශයක් වත්කොට කකාරා ශතර නැලියට ශිටුවා බාපෙරා ගෙන එල ගිතෙල් නැලියක් එක්කොට ඒ ඒ බෙහෙතිම්ම කල්ක පතපත අඹරා කකාරා කල්ක ලනුවටන පදමට බාපෙරාගෙන සුරැකිව තබා පෙවිය යුතු.

ලීතියපළු සියක් පලමක් ගෙන දිය දහශයක් වත්කොට දිය ශතරට සිටුවා කකාරා පෙරාගෙන එම බේතින් බේත් පතක් අඹරා එලගිතෙල් නැලියක් හා කාඩිදිය නැලියක් එක්කොට කකාරා තෙල් ශිද බා පෙරා දවශකට තෙල් කුළුදුල්ලක් සමන පොවා, බෙහෙත් දිරා ගියකල අමුශාලේ බත්කවා මෙම ක්‍රමයෙන් දවසක් ඇර දවසක් ශතියක් දෙනු. හිතවත් වූ ආහාරයෙන් දවස් යවා මෙසේ කලකට කුෂ්ට ගුල්ම උදර බගන්ත්‍රා මෙතෙක් රෝග නශා.

දූඩු ඇට, පිච්ච කොල, ලාකඩ, තිකුළු මෙකී දෙය අඹරා ඇඟ ලනු. කුෂ්ඨ නසා.

මනෝශිල, මිරිස්, තලතෙල්, වරාකිරි මෙකී දේ අඹරා ඇඟ උලනු. සියළු කුෂ්ට නශා.

100. තිරුවානා ගල් පුළුස්සා කොටා පොඩි ගෙන පොඩි කොට කඩ. අසමොදගං, කළුදුරු, සුදුදුරු, උළුවා, අරළු, බුළු, ගරිඳ පොතු, කකුළු පොතු, රත්සඳුං, දමා දෙඩං ඇඹුලෙන් කකියවා. මෙ හැම හොඳට අඹරා ගා අදිනු. ගල් රත ගුණවේ.

101. කල් ගිය යබර රත් කොට පොඩි කොට දෙඩං ඇඹුලෙන් අඹරා ගා අදිනු. ගල් රත ගුණවේ.

102. තිරුවානාගල්, පුළුස්සා පොඩි කොට සීනටි සාල් පිටිත් එපමණ එක්කොට අන්කෙන්ද පොතු ඉස්මෙං අඹරා කබලු පිස නැවත එම ඉස්මෙන් අඹරා ගා අදිනු. ගල් රත ගුණවේ.

103. තිරුවානා ගල් පුළුස්සා පොඩි කොට අන්කෙන්ද පොතු ඉස්මෙන් අඹරා ගානු.

104. අත්තන කොල, පිච්ච පොහොට්ටු, තක්කාලි කොල, පිංචිදෙහි, ශාල් පානුවෙන් තම්බා ගෙන්දගම් සිරියල් ටික ටික එක්කොට ශාල් පානුවෙන් අඹරා තුනී කොට ගා අදිනු. ගල් රත ගුණවේ.

රතයට

105. තොල බෝ අලය පුනු ලා උයා දෙඩං ඇඹුලෙන් අඹරා ගානු. රතයටයි.

106. පැහිච්ච බටු, දෙමට්, කුකුරුමාන්, දෙහි ඇඹුලෙන් තංබා අඹරා ගානු. පිට අල්ලන රතයටයි.

ගල්රත

107. වවුලැටිය කොළ පොතු, අනෝද, හිරස්ස, කර කොල නැටි, බෙබිය, බිං තඹුරු කොල, මෙකී බේත් යුශ ගෙන උඳැල්ල ලිප තබා බේත් ඉස්මත් දෙසි ඇඹුලත් පැසවා ගානු. ගල් රතය ඉසිරේ.

108. කරඳ කිරිත් තල තෙල් ගෙන එක සේ
පමන කකාරා ගතිමින් එම සේ
බාලයන්ගේ රත පිට ගා එම සේ
ලීල කෙරෙයි තුන් දවසින් සැප සේ

109. තිප්පිලි, තිකුළු, එනු, සුදුදුරු, කොට්ටං, වදකසා, හොද කසා, වීයක් දුඹුළු, දේවදර, ඇපල මුල්, රත්නෙටොල් මුල්, මෙ හැම කස සැන් දියෙන් අඹරා එම දියෙන් දිය කොට පත්තු පදමට කකාරා ගානු. සියළු රතවලට ප්‍රත්‍යක්ෂයි.

110. සුදු අත්තන කොලත්, කැකිරි කොලත්, විලඳවැත්ත කොලත්, මෙකී යුෂ ගෙන තල තෙල් සුනු එක්ව අනා ගානු. එම කොල මලවා බඳිනු. දුවන [illegible] රතේටයි.

මල් රතේට

111. අනෝද කොල කොටා මිරිකා තල තෙල්, පොල් කිරි සමඟ පදමට බා පෙරා ගානු.

කණේ අල්ලන රතේට

112. ගොන් කැකිරි කොල, අවරි කොල, මෙ හැම කොටා මිරිකා තල තෙල්වත්කොට කකාරා තෙල් පාට බලා පල්මාතික්කන්, ඉඟුරු අඹරා දමා පදමට බා තබා තෙල් ගානු. ගුණවෙයි.

113. මදටිය, අත්කෙන්ද, හාතාවාරිය, ඔලිද, කොල්ලං කොළ, මදුරු, යක්බෙරිය, යකවනස්ස සියළු පනු කැවිලි සහ දද වලටත් යහපති. කොටා මිරිකා තල තෙල් වත්කොට කකාරා තෙල් පාට බලා පදමට බාන්න.

114. උරුලෑ සටටන්, රත් හඳුන්, දියෙන් අඹරා ගානු.

115. රත් මල් උයා අඹරා තිරුවානාගල පුළුස්සා එකුඩුත් එක්ක දෙඩං ඇඹුලෙන් ගානු. රත ගුනවේ.

116. එඬරු දළුයි, එරබදු දළුයි, දි කිරෙන් අඹරා ගානු.

දූවන පතින රතයට

117. ඉඹුල් මල්, රත්මල් කැකුලු, ඔලිඳ කොල, කොටා උයා උරුලෑසටටන් එක්ව අඹරා ගානු. ගුණවේ.

118. පඹුරු කොල කොටා යූෂ ගෙන උනු කර ඉස වත් කරනු. රත් පිත් ගුනවේ.

119. ඔලිඳ කොල, වද මල්, අළු කෙහෙල් පිත්තයි, මෙකී දේ ගෙන මිරිකා ගානු ගුණවේ.

120. කැබෙල්ල දළු උන අළුවෙන් තම්බා කස පැන් ඉස්මෙන් අඹරා ගානු. ගුණවේ.

121. මාරා කොල, නැඹිලි පොල් කිරෙන් තෙල් සිඳ ගානු. රත්වලටයි.

122. ගොන් කැකිරි කොල, පිල කෝල, අඹරි කොල, මෙ හැම කොටා මිරිකා තෙල් වත්කොට කකාරා තෙල් පාට බලා මිට අබ ඉඟුරු ඇඹුලෙන් අඹරා දමා ගානු. සෑම විසාදිවලටයි.

123. වරා කිරි, කිතුල්, රුක් අන්තන, එරබදු, ගම්මිරිස්, මෙකීවා පොල් කිරි, අන්තන මුල්, කෝමාරිකා, පතුක් කොල, යකිනාරන් පොතු කොල, අත්කෙන්ද කොල පොතු, පිල කොල පොතු, අඟු කොල පොතු, වැල් කැප්පිටියා කොල පොතු, කහළුනුලා අඹරා මෙකී බේත් කොටා මලවා බඳිනු. විසාදිවලටයි.

124. මුරුවා කොල, රදලිය කොල, පුඩල් කොල මෙකී යුස ගෙන එනු කැට තිබුනුවලදකින් කැබැල්ලක් ගෙන අඹරා කකාරා අදිනු. දුවන පතින ගඩු ගුනවේ.

125. මුරුවා කොල ඉස්මෙන් සීනටි හාලේ දියලා පිටි රොටි උයා දවටනු. ගුනවේ.

126. එම ඉස්මෙන් රසදිය මත්වාඩියක් පමන ගෙන පොඩිකර කබලු ගා දවටනු.

127. පාවට්ටා දළු, මුරුවා දළු, බුලත් දළු, කිකිලි බිජු සාරුවෙන් අඹරා ගා අදිනු. දුවන පතින රතයටයි.

128. එරබදු පොතු, මුරුංගා පොතු, කුඩුම්රිස්ස පොතු, අත්කෙන්ද පොතු, මෙකී මුල් පොතු ගෙන ගැට දෙඩං ඇඹුලෙන් අඹරා සුනු ටිකක් පොතු ඇත් ඇට කැප්පිටියා පොතු, හාල් මැසි ඉහටි මේ හැම දෙඩන් ඇඹුලෙන් අඹරා සුනු ටිකක් එක්ක අඹරා ගානු. ඇකන්ෂා ගුනවේ.

129. දළුක් පළු කහ එනු ලා මලවා බදිනු.

130. උන අළුවෙන්. ගැට කහඹිලියා කොල ඉස්මෙන් හීනටි සාලෙන් කබළු පිස සීත් රෙද්දක ගා ගඩෙ පිට දමා එලනු.

131. සුදුදුරු, සුදුළුනු අඹරා දවටනු. රතේටයි.

132. කළුදුරු, අසමෝදගන්, තිප්පිලි, එක්ක අඹරා ගානු. රතේටයි.

133. මිරිස් කොල, පුඩල් කොල, කොටා අමුවෙන් තිබා කොත්තමල්ලි ගින්නෙන් තිවා ඒ පිට දවටනු.

134. තිල් කටරොළු මුල්, බටු මුල්, මුරුංගා මුල්, රත්නෙටුල්, කුඹුක් පොතු, දෙඩං ඇඹුලෙන් ගලගා ගානු.

135. වදකොල, ගඳපානා කොල, බටුකර, දෙඩං ඇඹුලෙන් අඹරා ගානු.

දුවන රතේට

136. මකුළුවැන්න සහමුලයෙන් ගෙන වැටකේ කොල යුසයෙන් ගානු.

137. ඇඹිල්ල දළුළනු අළුවෙන් උයා කසපැත් ලෙලි ඉස්මෙන් අඹරා ගානු. ගුනවේ.

138. හරන්ක හා දළුමල් එම ඉස්මෙන් අඹරා ගාන. ලග්ගනයට.

139. පුස් ඇට මද ගලගා ගානු.

රත්පිතට බෙත්

140. සුදු ශැවැන්දව මුල්, පිපිලිය, වං මුතු, ඉරිවේරිය මෙකී දෙය කකාල කශාය පොවනු.

ආදෝ බාගයෙන් යන රතට

විරේකයට

141. ඇශල පොතු කකාරා ගත් පැන් හෝ නෙල්ලි කකාරා ගත් කශාය හෝ ත්‍රිශ්න වාළුවෙන් හෝ නොහොත් අරළුයෙන් හෝ ගිතී හා මී පැණි දමා පොවනු. ඇහ ඇල් පැන් වක්කරනු. ශිවී.

වමනයට

142. වම්මුතු, කිරින්ද ඇට, වැල්මී, කුකුරුමුවන්, මෙකී දෙය කකාල කශාය එලකිරි මී හා ගිතී මුශු කොට වමනය කරවනු. සියළු රත්පිත් නසා.

වැරසිටි අයට

143. දුම්මැල්ල, පිපිලිය, කොශඹ, හෙලශධුං, රත්ශදුං, නෙළුම් මල්, මෙකී දෙය කකාල කශාය.

144. හීන් ඉරමුශු, මහ ඉරමුශු, වැල්මී, හාතාවාරිය, මෙකී මුල් කකාල කශාය ගිතී හා මී මුසුකොට දෙනු.

145. බැලිල හෝ සිද්ධිගුරු හෝ හාතාවාරිය අල හෝ මෙකී දෙය වෙන වෙනම හෝ එලකිරි කකාරා පොවනු.

නාසයෙන් වැහැරෙන රතය්ටඃ

146 1. ශක් හා ගුරු කැට එක්ව අඹරා ගත් කල්ක
2. හෝ වැල් මී අඹරා ගත් කල්ක තන කිරෙන් නශ්‍ය කරනු.
3. දෙළුම් මල් ඉශ්ම හෝ
4. ඊතන ඉශ්ම හෝ
5. අඹ ඇට ඉශ්ම හෝ
6. රතුළූනු ඉශ්ම හෝ නශ්‍ය කරනු. නාශයෙන් වැගිරෙන ලෙය නවතී.

මල මාර්ගයෙන් වැගිරෙන ලෙයට

ප්‍රමෙහයට කී පිලියං කරනු ලැබේ.

යොනියෙන් වැහෙන ලෙයට

147. අශාධ්‍යයි කියනු. මීටම ශීනි හා මී මුශුකොට කකාල එලකිරි පොවනු.

148. ශිවංගුරු හෝ දම් කොල හෝ මානෙල් අල හෝ මෙකී බෙහෙත් සහල් දෙවූ දියෙන් මී මුසු කොට පොවනු.

149. රත්නිටුල් මුල්, ගෙන්දගං, කොට්ටං, ඉරමුසු, බදුල්ල ඇට, අරලු, ආඩතෝඩා මුල්, දළුක් පොතු, බෝ පොතු, පුස් ඇටමද, දේවදර, වියන් දුඹුලු, වරා මුල් ගෝමූත්‍රයෙන් අඹරා ගාන්න. (ගඩුවලටද හොදයි)

150. වවුලැටිය කොල පොතු, අන්දර, හීරැස්ස, කර කොල, බිත්තඹුරු කොල, වැටිවෙඩිය කොල, මෙකී බෙහෙත් කොටා උදුල්ල ලිප තබා බේත් ඉස්මත් දෙහි ඇඹුලුත් පැසවා ගාන්න. ගල්රත ඉසිරේ.

151. හීරැස්සපලු, තඹල කොල පොතු, ගොංකැකිරි කොල, එලකිරි එක්ක හිස ගල්වා දිය හැටක් වක්කරන්න.

152. දෙමට මල්, රත්මල්, වේලා කොල දෙහි ඇඹුලින් අඹරා ගාන්න.

153. රණවරා, කිතුල්, රුක්අත්තන, එරබදු, ගම්මිරිස් පොතු ගෙන දද කිරි යූෂ, අත්තන යූෂ, මුරුව යූෂ, කෝමාරිකා යූෂ, පතුක් කොල යූෂ, ඔලිද කොල යූෂ, කිරි අගුන කොල යූෂ, මුගුණුවැන්න කොල මුල් යූෂ, කිකිරිදිය යූෂ, තලතෙලට දමා කකාරා, දුරු දෙක පල්මාතික්කන්, ඉඟුරු, මිරිස්, අරලු, බුළු, නෙල්ලි, හරංකහ, පාට කහ කුඩු කර දමා කල්ක ඉටිපදමට බා හිස ගල්වනු.

154. වැල්මී, මුදප්පලම, සඳුන්, සැවැන්දරා මුල්, පැපිලිය, කලාඳුරු අල, ඉරිවෙරිය, කෂාය.

155. මුද්දරප්පලම, රට ඉඳි, බොරලු දමනු කකාල කෂායට මී පැනි එක්කොට විලඳ සුණු ලා පොවනු.

156. කලාඳුරු අල, කෙලිඳ ඇට, වැල්මී, කුකුරු මුවන් ගෙඩි මෙතෙක් දෙය ලා කකාල එලකිරි තිවා මී හා සීනි මුසු කොට පොවා වමනය කරවන්න. (අධොගත රත්පිත්)

157. දුම්මැල්ල, පිච්ච, කොහොඹ, සුදුහඳුන්, රත්හඳුන්, නෙලුම්මල් කෂාය.

158. ඉරමුසු මුල්, මහා ඉරමුසු මුල්, වැල්මී, හාතාවාරියමුල්, කකාල කෂාය.

159. පුලිල, දිඹුල්, ඇත්දෙමට, අරලු, ඉඳි, මුද්දරප්පලම, වෙන වෙනම අඹරා මීයෙන් අනා ලේහ කරනු.

160. සිද්ධිගුරු, හාතාවාරිය, එලකිරෙන් කකාරා පොවන්න.

161. වැල්මී, බැලිල, සිද්ධිගුරු, හාතාවාරිය එලකිරෙන් කකාරා පොවන්න.

162. දෙහි ඇඹුල්, දෙඩං ඇඹුල්, නැලිය නැලිය බැගින් සියඹලා ඇඹුල්, ගොරක ඇඹුල්, අන්නාසි ඇඹුල්, පුහුල් ඇඹුල් මින් මනාව බැගින් ගෙන තික මුල්, කොහොඹ මුල්, වරා මුල්, හාතාවාරියමුල්, කුඩුමිරිස් මුල්, ඕලිඳ මුල්, මුකුණුවැන්න මුල්, කුඹුරුමුල්, ඉරමුසු මුල් හා කොල.

ඊට සරක්කු:

දෙදුරු, අසමෝදගං, තිප්පිලි, ත්‍රිවගී, හිංගු, කුරුඳුපොතු, සුදුලූණු, නාගර, මිරිස්, වදකහ, පුෂ්ප හඳුන්, තිපල්, පලමු කී මුල් බේත් සොරසයට ඇඹුල් වත්කර තබා කසාය කකාරා ඊට සරක්කුද යොදා කකාරා බොර පදමට තබා කොටසකට ජයපාල දමා උදය විරේවනයට සවස පත්තියමට තුන් දිනක් වලදනු.
පත්තියමට සත් වරුවක් වලදනු. ඇල්දිය වත්කරනු. උණු දිය බොනු.

පතක් පමණ ගොරක ඇඹුල්, සුදුහඳුන්, සුවඳ හොට, ඉවද, ඉරිවේරිය, වැල්මී, වතුර නැලි 6 - 3 ට සිඳුවා හීනටි හාල් පතක් ගෙන බැද මුත් පියලි පතක්ද සමඟ කසායේ ලා පැසවා පොවන්න.

වමනයට:

163. අරළු සුනු මීයෙං ලේහ කරනු. වමනය විරේක වෙයි. දුර්වල නම් නොකරනු.

පිතින් උපන් වමනයට

164. තිකුළු පොඩි ගිතෙලිං දෙනු.

165. මී, සිද්ධිගුරු, ඉරිවේරිය, හාල් දෙවු දියෙං දෙනු.

වාත වමනයට:

166. සවින්දව පොඩි ගිතෙලින් දෙනු.

167. මීට, සවින්දව, සුවස, බලල් එනු ගිතෙලින් දෙනු.

තුංදෙස් වමනයට

168. ඉරිවේරිය කසාය මීයෙං දෙනු.

169. මීට වගපුල් මීයෙං කවනු.

170. බෙලි, බැබිල, ඉඟුරු, කොත්තමල්ලි, විලඳ, කලඳ බැගින් අට එකට සිඳ සීතියෙ දෙනු.

171. උදුපියලිය, පෙනරකොල, සඳුං, ලැපැත්තේ පෙකනියේ ගානු. පොරි පොඩි කසපෑ දියෙ දෙනු.

172. සඳුං, අගිල්, දුමමල, එත්ෂාල්, මෙවා පොඩි කොට පොල්කටු අඟුරේලා හිල් පොල්කටුවක් වසා බට නලේ දුං බොනු. සියළු රත්පිත් වමනේ සිටී.

173. තික, දළුක්, මුරුවට,ත් දෙනු.

174. විලඳ එළුකිරෙන් දෙනු.

175. නෙටුල් කොල, පොතු, අරළු, ඉඟුරු, එනු, මෙවා යූෂ පොවනු.

රත තැවිල්ලට:

176. එලල, හරංකහ, වල් ඉඟුරු,අලේ පොතු, හිරුස්ස පළු, එල බින්තඹුරු, මෙ හැම කොටා පොල්කිරි වත්කර යොදු මලාවක දමා ශවස තබාගනු. උදය උඳුල්ලක් දර ගිතිලා රත්කොට මෙකී බෙහෙත් දමා කකාරවා ආතුරයාට එලගිතෙල් ගා තවනු. රත ලේ පළු, වියල් පොඩි වේ.

රත්පිත් දහ:

ආලේප:

1. තෙල්ලි කුඩු එලගිතෙලින් බැද ගල්වන්න.

2. ගල් සෙවෙල් කාඩියෙන් අඹරා ගල්වන්න.

3. නුග පොතු, ඇඹුල් පොතු, කැල, පුලිල පොතු, මී පොතු, බෝ පොතු, ඩෙබර පොතු, තිඹිරි පොතු, ලොත් සුඹුළු, බලු දං, දිය දමා දමා, මහ දඹ, මහනෙල්, ඇඹුල මල්, හෙල පියුම, රත්පියුම, උපුල් කොල, ෂෙවල් මැලි, රත්ඹුල, වැල්මී, අඹරා ගල්වන්න.

4. එම බෙහෙත් චූර්ණ කර ජලයෙහි ලා කකාරා සිසිල් කොට තිවා ඔරුවක වත්කොට එහි බැසීම.

5. නෙලුම් මල්, නෙලුම් අල, නෙලුම් දඬු, නෙලුම් මුල්, අඹරා ගාන්න.

6. මානෙල් මල්, මානෙල් අල, තල තෙල් 1ට දිය 4ක් වත්කොට ඊට ඇඹරු දෙය දමා සිඳ ගාන්න.

7. සැවැන්දරා මුල්, නෙලුම මල්, ගුරු කැට, ඇත්දෙමට, දමා සිදගත් තෙල ගාන්න.

9. නෙල්ලි, හාතාවාරිය අල, එකට අඹරා දිය, එලකිරි, ඇඹුල් කාඩි දිය, සහිත කොට සිඳ ගත් තෙල ගාන්න.

10. දෙලුම්, ගොඩපර, ලොප්සුඹුලු, නස්නාරම පොතු, අඹරා හිස ගල්වනු.

මුඛයෙන් නාසයෙන් ලේ යනවාට.

1. ආඩාතෝඩා, ඉරමුසු, ඉරිවේරිය, සාතාවාරිය, කලාදුරු, වැල්මී, මුද්දරප්පලම්, වැල්මී, සමව කසාය සීනි මීයෙන් දෙනු.

2. උක් දඬු, මානෙල් අල, නෙළුම් මල් රේනු, අළු කෙසෙල් අල, වැල්මී, දෙළුම පොතු, නුග අරලු, සමව ගෙන කසාය කකාරා දෙනු. කෙසෙල් මුල්, වැල්මී, දෙළුම් පොතු, මුද්දරප්පලම්, ඇද්දෙමට මුල්, මෙ කෂාය සීනි මීයෙං දෙනු.

3. ආඩාතෝඩා කොල යුස සීනියෙං දෙනු..

කොර දද කුෂ්ට ගඩු ආදියට

1. සීන මුල් රාත්තල් එකයි, සාදික්කා, කරාඹු, වසාවාසි, තිප්පිලි, තිප්පිලි මුල්, පෙරිය අරත්ත, සිනටි අරත්ත, අරළු, සිද්ධිගුරු, මිරිස්, අබ, එන්සාල්, එලවංගං, රත්නිටුල්, කටුපිල මුල්, තුවර මුල්, මෙකී දේ වියලා චූර්ණ කර සීල වැඩිකර තබා බිලාල පාදයක් කා උනුපැන් බොනු. පැටි කුකුලං කිකිලි බිජු ගනු. තෙල්, මාංශ, කිරි, දී කිරි, ඇර අනිකුත් දේ කනු. බේත් කකා දවසින් දවස උනු දිය නානු. හතර දවසකට වරක් තල තෙල් වත් එඩරු තෙල් වත් ගා ඉස සෝදනු. වැඩලයක් කනු. බේත් කකා දවසින් දවස උනු දිය නානු. බේත් කැවහම හත් දිනක් විරේක නොකනු.
ප්‍රමේහ, වායු, පරංගි, වන, සුල කුෂ්ට, කෙප්ප වායු, සුදු කුෂ්ට, කළු කුෂ්ට, සියළු දේ ගුනවේ.

2. පාරදම් හතර කලඳයි, මනෝසීල දෙකලඳයි, නෙල්ලික්කා ගන්ධක අට කලඳයි, උශසිකාන්දං, සර්ව ලෝකම් කුඩු, තිස් දෙකලඳයි, මේ සමව කෝමාරිකා යුෂින් වටා මඩා පිට ගා නැටියකින් වසා මද අව්වේ දෙතුන් වරක් වියලා පිට වැසු නැටිය ගත් කල දුම් දැමී නම් වියළුනු පදමයි. ඉක්බිති ගෙන චූර්ණ කර තබා බිලාල පාදයක් කා උනු පැන් බොනු. එනු ඇඹුල් වලකිනු. පැණි රස නොකනු. දවසක් ඇඟ තිඩා සතියක් දෙවේලේ ඇල් දිය වත් කරනු. ගුල්ම උදර රස්නේ අධික අයටද කාමල පාන්ඩුවටද බත් නොදිරා රාමතෙල් යන අජීර්ණයටද ශෝපයටද ශක නොව දෙනු.

3. සීන මුල් පලං 60, තිප්පිලි පලං 2, අසමෝදගම් පලං 1, කොරසාති කලං 5 චූර්ණ කර තබා බිලාල පාදයක් මීයෙන් අට දවසක් දෙනු. කිකිලි බිජු කුර තම්පලා කනු. සීරෝ රෝග, පීනස, ශ්ලේෂ්මා කාස රෝග උගුර වන, ශම කුෂ්ට, රෝග, බගන්දර, පරංගි, තඹ කුෂට මෙකී දේ ගුණවේ.

4. ඊටම එඬරු තෙලින් ඉසසෝදනු. කිකිළි මස් ලියා අවුවෙන් වේලා චූර්ණ බරට, කොසොඹ පොතු චූර්ණ කලං2 යවකාර කලං 2.
මෙ සමව එක්කොට රත්කරපු තවුන් වලදක ලා තනා තිබා බිලාල පාදයක් උණු දියෙන් අට දවසක් කනු. දෙවේලේ මුරුංගා කොළ, කරල්, හාල් මැස්සන් කනු. පසු තල තෙලින් ඉස සෝදනු. මතු කී ගුනයි.

5. වෙල් අරුගු, රත් කොසොඹ මුල් පලං තුන තුනයි, ගල්කුරු මුල් පලං එකයි, පිටවක්කා මුල් කාලයි, කුඩු මිරිස් මුල් පලං දෙකයි, සිද්ධිගුරු කලං පහයි, කළුදුරු, තිප්පිලි, අසමෝදගම කලං පහ පහයි, සාදික්කා, කරාබු, වසාවාසි, කටුකරෝහිති, කුඩා කළුවා, මෙකී දේ එක් කලං සමාර සමාරයි. මෙ සමව චූර්ණ කර දෙවනු සමගියාකර ඇඟිලි තුනට අසුවුනු පමණ කා උණු පැන් බොනු. හන්දි රුජා, වාදම්, අතපය එලෙනවාට, වන වල්, ඔඩු, කුෂ්ට මේ සියළු දේට යහපති. දෙවේලේ පහලොස් දිනක් කනු.

6. තුන් අවුරුදු කළු මස් කිකිළියක සම ගසා පිටකුලෙන් පලා බඩවැල් හැර සීන මුල් කලං 5, කුප්පමෙතිය, වැල්තිබ්බටු දෙවගේ වෙන වෙනම අඹරා දේශදෙසි ගෙඩි තුනක් හා පමණ මතු කී මුල් චූර්ණ කර තුන් වගේ එකට අනා කිකිළිගේ බඩට අඩස්සි කර බැති ගසා වතුර දෙකක් ශලියක වත්කොට කිකිළි එහිලා වසා බැඳ ගිතිකර තැම්බුනු කල ගෙන ඇට හැර මස් හා බේත් චූර්ණ කර පමණ දැන දෙවේලේ වලදනු. සියළු පරංගි, කුෂ්ට, වන ගුණවේ.

7. සීන මුල් කලං 25, සාරන මුල් කලං 25, සාදික්කා, කරාබු, වසාවාසි, දේවදරු, සඳුං, විලඳ, මෙකී දේ කලං පහ පහයි, ගස් බැබිල මුල් කලදයි, කුරුඳ මුල් කලදයි, ශැවැන්දර මුල් නව කලදයි, කොෂඹ පොතු හත් කලදයි, මෙකී දේ කපා කොටා ශලකලා දියවර තුන් නැලියක් තලවඩි අරක්කු එකාහමාරක් කසාය බී කල මහා සන්තිපාතයෙන් හා සර්වාංගෙ ගන්නා රුජාවද බඩේ අට ගන්නා වායු ගෙඩි කුස පිලිකා ද සන්තිද නොයෙක් කොර ව්‍යාදි වන වල්ද අසු ප්‍රකාර වායුද ශතලිහක් පිත්ද විස්සක් ශ්ලේෂ්මාවද තුන් දෙසින් වන්නා වූ කුෂ්ටාදි සියළු ව්‍යාදීම නසා. සත් දිනක් දිය වක්කරනු.

8. සීන මුල් කලං 32, තිප්පිලි කලං 4, කරාබු කලං 6, වසාවාසි කලං හාගයයි, සාදික්කා ගෙඩියයි, මිරිස් කලදයි, කොරාසානි මංචාඩි15, අසමෝදගම්, කළුදුරු, පෙරුන්කායන්, සුදුළූනු, අබ, ඉඟුරු, උළුව මෙකී දේ කලං බාගේ බාගෙයි අරළු ගෙඩි එක හමාරයි. අබිං මංචාඩියයි වගේ ඇති අයට නම සාදිලින්ගන් කලදක් එක්කරගනු. මෙ හැම වේලා චූර්ණ කර බිලාල පාදයක් දස දවසක් දෙවේලේ වලදනු. බේත් එතෙක් වුනු දවසක් ඇර උණු දිය වක්කරනු. වාදන්, හැති, සන්නි දහ අටද, ගුනවේ. ළූනු ඇඹුල් වලකිනු.

ආග්‍රිකාදි කසායට

9. සීන මුල් රාත්තලක් ගෙන පෙති ගසා, එලමුත්‍රා, කවුඩු කැකිරි කොල ඉස්ම, මොණර කුඩුම්බිය, සමව තුන් වගයේ දෙදවස දෙදවස පෙති ගැසූ මුල් උරුවෙන්ඩ තිබා වේලා තවුන් වලදක ලා උඩින් දලක් වසා කට්ට කුමංජල් රාත්තලක් හිරියල් දෙකලදක් දෙවගේ මදක් පොඩි කොට යට වලදට දමා දන් වැසූ වලද මුහින් නමා මැටි බැඳ පළු ගස්වල අඟුරු ලා ගිතිකර දුම නොයන සේ බේත් වලට දුන් බදවනු. උදය පටන් ඉර මුදුනට එනතුරු පවන් ගසනු. ඉක්බිති තිවුනු කල මැටි බිඳ බැලු විට බේත් උඩින් මිතිරන් පැයට තිබේ නම් එම බේත් දෙකට බිඳ බැලු විට එම මුල් පැයට තිබේද පදමයි, බේත් දෙන විට චූර්ණ කර ඇඟිලි තනට අසවන පමණ වලදවා ඇල් පැන් බොන. මීට පත්‍යා මරුංගා කොළ-

කුකුළු පැටියන් කනු. උග්‍ර වූ ලෙඩට දශ දවසක්ද මදක් ලෙඩට සත් දිනක්ද වේ. මුත් ගුණ ප්‍රමේහ, වාදම්, වායු, වනවල්, පරංගි, ගල් අඩස්සි, දියවැඩියා, පීනස, අරමණු, බගන්දු, ඔඩු, ලේ මුලම, සියළුම දේට පසු මාදම් පොතු කසාය සතියක් බී ඉන්පසු විරේක දේ. මින් ඇඟ සුද්ධ වී ඉන්පසු ලේඩේ පමනට සුව වේ. අද්දුටුවයි. මුල් පත්මයයි. සීන මුල් කලං විසිපහයි, සාරන මුල් කලං විසි පහයි, සාදික්කා, කරාබු, වසාවාසි, දේවදුරු, සඳුන්, විලඳ, මෙකී දේ කලං පහ පහයි. ගස් බැබිල 15 කලඳයි, කුරුඳු මුල් කලඳයි, ශැවැන්දර මුල් නව කලඳයි, මෙකී දේ කපා කොටා ශලකලා දියවර තුන් නැලියක් තල වඩි අරක්කු එකාහමාරක් මෙකී දේ සමහ කිරුම බැඳ ලිප තබා කකාරා නැලියක හෙලා පෙරා තබා දවස දෙවේලේ පස් කලඳ බැගින් පහලොස් දිනක් මේ අග්‍රි කා දී කසාය බී කල මහ සන්නිපාතයෙන් ආ සර්වාංගෙ ගන්නා රුජාවද බඩේ අට ගන්නා වායු - ගෙඩි කුස පිලිකා ද පීනසද නොයෙක් කොර ව්‍යාදි හැම වනවල්ද අසූ පශ්කාර වායුද හතලිහක් පිත්ද විස්සක් ශ්ලේස්මාවද තුන් දෙසින් වන්නාවූ සියළු ව්‍යාදිම නසා. සත් දිනක් දිය වක්කරනු.

දුර්මාංශ

කායීම භෂ්මයට:

10. ඊයම් පස් කලඳක් උණුකර එහි කහ මනාවක් කුඩු කර ටික ටික දමා යකඩ සැන්දෙන් බදී. මේ රහට තුන් දවසක් බදිනා කල බස්ම වේවි. මින් මංචාඩි පහක් සීනියෙන්ද දෙනු. ප්‍රමේහ සන්ධි කුඩුත්තු, වාදම්, මූත්‍ර ක්‍රිච්චා, දය, උෂ්ණ, දූර්මාශ, සියළු ප්‍රමේහ ගුණවේ.

කාන්දන් බස්මයට

11. කාන්දන් සකලඳට යහුනු පස් කලඳක් එක්කොට කෝමාරිකා යූෂ පුරා දවසක් තිබා පසුවද සෝද රහට අඹරා එක තැටියකට කර රෙදි සත් පටකින් මැටි බැඳ භාජනයක ලා යමකින් වසා තුන් දවසක් පුරහා පුට දෙනු. සතර වේනිද අඹරමින් භෂ්ම අරික්කාලයක් මීයෙං දෙනු. එනු ඇඹුල් වලකිනු. කාමල, හති කැක්කුන්, කුම්භකාමිලා, පිත්ත පාන්ඩු, ශෝප, මහෝදර, ගුල්ම, ග්‍රහනි, අරිසස්, මුල රෝග, මෙහැම ගුනවේ.

රාපාන ගුලියට බේත්

12. රසදිය, වච්චනාවිහිරිමියුල්කටුකරෝහිනි, සාදික්කා, කරාබු, සුදු සඳුන්, අරත්ත, වැල්මී, වලහසාල්, නෙළුං, වදකසා, තිත්ත කපුරු, තිරස්තවාළු, තිපල්, සිද්ධිගුරු, මිරිස්, කලාදුරු අල, මුව කිරිය, වැල් ඉරමුසු, දේවදුරු මෙකී බේත් මංචාඩි දෙක දෙක බැගින් ගෙන ශුද්ධ ජයපාල එක්කලං සමාරක් ගෙන වැටකේ අරළු යුෂින් අඹරා දෙවනු ඉඟුරු යුෂින් අඹරා ඉඹුල් ඇට පමණ ගුලි සෙවන වියලා තබා වාත ජ්වරයට ගිතෙලින්ද සීත ජ්වරයට සීනියෙන්ද ශ්ලේෂ්මා ජ්වරයට ඉඟුරු මිරිස් පොඩියෙන්ද, තාප ජ්වරයට එළ මෝරුවෙන්දමුර උනට තන කිරෙන්ද, දය උෂ්නට කස පැන් දියෙන්ද, උදර වායුවට එඩරු තෙලින්ද, නොයෙක් කදුරට පුසුල් දියෙන්ද, වායුවට ඉඟුරු යුෂින්ද දියවැඩියාවට රණවරා යුෂින්ද, කැසි මුස උඩාසයට කොසඹ කොල යුසෙන්ද, නොහොත් මීයෙං ද, ඉදිමුමට ඉඟුරු යුෂත් සියඹලා ඇඹුලුත් එක්කද මාලේට පොල්මල් ඉස්ම අත්තන කොටා ඉස්ම එක්වද, පිත් වැඩීමට මී පැණිත් කහට පොතු ඉස්මත් එක්වද වාත ගුල්මයට කොසඹ තෙලින්ද, ඉක්කාවට දෙහි ඇඹුලින්ද, ලේ සීදමට අබින් මංචාඩියක් හා සාදික්කාත් එක්ව දෙනු. බඩ උත්තිලට කදුරු ගෙඩි යුෂින්ද, ගලක්කරාවට කුකුරුමුවන් ගෙඩි ඉස්මෙන්ද, පිත්ත පාන්ඩුවට පතුක් මුල් ඉස්මෙන්ද, යක්ෂ විකාරයට දෙහි ඇඹුලෙන් අංජනලනු. මුත්‍රා කට්ටුවට වරා කොල යුසින්ද ශ්ලේෂ්මා අධිකයට තෝවිල පොතු යුෂින්ද සර්ප විෂට මදුරු කොල ඉස්මෙන්ද. නශ්‍ය කරන. ඉහරු යුෂින් අංජන ලා බඩටත් දෙනු.

13. රසදිය, වච්චනාවි, නෙල්ලික්කා ගන්දක, හිරියල්, පුස්කර, ත්‍රිකටුක, මෙකී ලේ කලද කලද ගෙන ශුද්ධ ජයපාල කලං පහලොහක් ගෙන කිකිරිදිය යුෂින් වජ් ඉඹුල් ඇට පමණ ගුලි සෙවන වියලා තබා වායුවට ඉඟුරු යුෂින්ද කටවු මුවටුවට ගිතෙලින්ද, පනුදෙස් ඉදිමුත් පිපුත් පනුගෙඩි බැදිමට ගිතෙලින්ද, මන්දග්නියට නෙල්ලි කසායෙන්ද, විරේචනයට එඩරු තෙලින්ද, වාදමට තිප්පිලි සිනි මියෙන්ද, දියවැඩියාවට කයිප්පුවෙන්ද, සන්ධි කඩුත්තුවට අත්තික්කා පොතු යුෂින්ද, මන්දග්නියට වරා කොල යුෂින්ද, පිතට ගිතෙලින්ද, රත්වායා විෂට ඉඟුරු කොල යුෂයෙන්ද උණ්නට දුරු නෙල්ලි එක්ක කසාරා ඇල්දියෙන්ද, රත්පිතට මීපැණි සඳුන් එක්වද දෙනු.

නයි විෂට තික කොල යුෂින්ද ඉස සිටි විෂට දෙහි ඇඹුලෙන් අංජනද ලනු.

ශම විෂට සතකුප්ප මුත්‍රායෙන් වත් එල මුත්‍රායෙන් වත් වටා ගුලි එක්ක ඉස මදිච්චි කරනු.

ගැරඩි විෂට ගිතෙලින් ගානු. අළු හෝ ගෝමරට මුත්‍රයෙන් පොවනු. ඇඟ ගානු. කුමාර ගුලිය නිමි.

තිය පිරිත්තාවට:

14-1. කොහිල බඩත්, අමුකහ, ලේවා එනු එකට තලා ජාති කොලවල දවටා ලිප් අළුවෙං උයා බදිනු. ගුනවේ.

2. මී මුරුවට හාල් පානුවෙන් පිට්ටු උයා පතුල පිට තිබා වරා කොල උඩිං වසා බැද තුං දවසක් මෙම ලෙස කරනු.

3. රසදිය, පල්මාතික්කන්, රීදී තුත්තං මෙවා කිකිරිදිය එරබදු, බුලත්, පාලා කොලයින් අඹරා වේලෙන වේලෙන සේ ගානු.

4. වච්චනාවි, රසදිය, පල්මාතික්කන්, අබිං, තුත්තං, අඹරා පිටි කර කබලෙන් පුළුස්සා තල තෙලෙං අඹරා ගානු.

5. රටල කොල, වල්ලා කොල, මකුළුවැන්න සම යුෂ ගෙන පල්මාතික්කං එට දිගෙන් ඇහිල්ල ගා කොලයක් වසා බදිනු.

6. රම්බඩ පැති බටු කරවිල කොල යුෂට පොල් හකුරු අතා ඇලවනු පනුවා මියෙයි.

7. හිරියල්, පල්මාතික්කන්, අත්තන කොල, යුෂින් ගානු. කොලයක් උඩින් වසා බදිනු. පනුවා මියෙයි.

8. රසදිය, වච්චනාවි, අමුක්කරා, අත්තන ඇට, තිබටුඇට, මෙවා සිවි කර තල තෙළේ මදක් අතා වලදක් රත් කර ඊපිට බෙහෙත් ලා හිල්කල වළඳකින් උඩින් වසා ඇහිල්ල හිලෙන් එලා දුන් පානු. පනුවෝ වැගිරෙත්.

9. මෙම ලෙස එරමිනියා ඇට දුම පානු. පනුවෝ වැගිරෙත්.

10. බැබිල, කරල් ශබෝ, බටු කරවිල මෙකී මුල් මිට මිට ගෙන සැලක ලා කොල පතක් බැඳ හිලෙං ඇගිල්ල පානු. වේදුවටත් පනුවෝ වැගිරෙත්.

11. ලබු දළු, උදුපියලි අඹරා ගානු. ගුනවේ.

කටු ඇදෙන්ට, නහර වැල් කැපුනාට

15- 1. කැප්පෙටියා දළුවේ පැතිත් තියහලා අලත් අබිං මංචාඩියකුත් සමඟ අඹරා වනේ ගානු.

2. කිකිලි බිජු සාරුවට තන කිරි, පොල් තෙල් කලන්දු කර ගානු. ඉන්පසු මැල්ලුම් බේත් බැඳ තෙල් කඩගසනු.

කැපුනාට:

16. උදුපියලිය, ඉඟුරු, සුදුළූනු, සුදුදුරු, තල තෙලෙං බැඳ දවටනු.

17. තරණ පොතු පොල් කිරෙං පශ්කුළු බඩුලා තෙල් සිඳ ගානු.

පය කටු ඇනුනාට

18- 1. වසතැල්ල සහමුලින් ගෙන කළු දුරු, කෙප්පු, කහළුනු ලාමලවා බඳිනු. කටු ඇදෙයි.

2. වල්මීයන කොල කහළුනු ලා මලවා බඳිනු.

3. කොසඹ, එරබදු කොල, දෙසි ඇඹුලෙන් අඹරා ගානු. උල් ඇදේය.

4. තෝර කොල මෙම ලෙස බඳිනු. කෝමාරිකා පළු උන අළුවෙන් තඹා බඳිනු.

19. අරළු කබලෙං දවා පල්මාතික්කන් දෙසි ඇඹුලෙන් අඹරා ගානු. පතුල් වන ගුනවෙයි.

දදයට

20- 1. තෝර ඇට එල මෝරුවෙන් ගානු.

2. දළුක් කිරි නැවුන් කබලක දවා අළු ගෙන දදකීරිය කිරෙං අනා ගානු.

3. මැඩිය දළු දෙසි ඇඹුලෙන් ගානු.

කුෂ්ට

21. තෝර ඇට. කරද ඇට. කොට්ටං. උනු දියෙන් අඹරා ගානු. සියළු කුෂ්ට නසා.

අරමනයාට:

22. කුඹුරු දළු, හින් දෙහි ඇට, උන අළුවෙන් තම්බා මී පැතියෙන් අඹරා ගානු. අරමන ගුනවෙයි.

වන වලට අරමනයාට

23. අරළු. බුළු. නෙල්ලි. කබලෙං අළු පුළුස්සා ගිතෙලිං අනාගානු. ගුනවේ.

දද කුෂ්ටයට:

24. කොසඹ කොල. නික කොල. හල්දුම්මල. ගිතෙල් තල තෙලීන් ගානු.

පනුවන් ඇති වනේට:

25. කල් ගිය කැප්පෙටියා පොතු. දෙහි ඇට. දෙසි ඇඹුලෙන් අඹරා ගානු. පනුවන් කඩා වැටෙයි.

අරමන වනයට:

26. හීනටිහාල්. අන්නන කොල ඉස්මෙන් අඹරා රොටිය තනා දෙදුරු පල්මානික්කන් පිටිකර රොටියේ පැත්තක ගා ලිප්ගල පිට තිබා තබා නැවතත් බෙත් පිටි රොටි ගා වනේ පිට තබා බඳින්න. මෙම ලෙස තුං වලියක් බැඳ නැවත කුඹුරු දළු හීන් දෙහි ගැට ලිප් අළුවෙන් තම්බා මී පැනියෙන් අඹරා ගානු. අරමන වන ගුනවේ.

වමනේ වන රත්පිතට විරේකට බෙත්

27. තිරත්ථවාළු මුල් පලමක් ගෙන කකාරා මීපැනි උක් හකුරු එක්කොට පොවනු. විරේක වේ.

රත්පිත් මාලේට

28. බැබිල මුල්. සානාවාරිය වෙන වෙන පලමක්.ගෙන එලකිරි මනාවක්, දිය මනාවක්, කකාරා දිය සිඳී කිරි පමණ සිටි කල පෙරා දෙනු. රත්පිත් මාලේ සිටී.

නාසෙන් ලේ යනවාට

29. සිවන්ගුරු සමසේ අඹරාගත් කල්ක වත් වැල් මීවත් තන කිරෙන් නශ්න කරනු. නාෂේ ලේ නවති.

රත් පිත් විරේකය:

30. හිඟුරු ශත් කලඳක්, වගපුල් ශත් කලඳක්, තාමල් රේනු ශතර කලඳක්, කුඹුරු මුලේ පොතු තුං කලඳක්, වෙප්පල් අරිසි දෙකලඳක් මෙකී දෙය වියලා ශුනු කොට අඹරා මේ ශැටියෙන් තෙල්ලි කකාරා දෙනු. රත්පිත් විරේක වේ. බාල අයට, වයස් ගිය අයට සවි නැති අයට ඇඟ වැරි තිබෙන අයට ක්‍ෂය රෝග ඇති අයටද යන මෙකී අයටද වමනේ විරේකට බේත් නොදෙනු.

රත් පිත් මාලෙට

31. පුහුල් ගෙඩියක් ගෙන පිටර පොතුත් ඇටත් දමා කැබලි කපාගෙන අමු නොවී බෙරිවී උයාගෙන සියක් පලමක් ගෙන එලගිතෙල් නැලියකින් මෙ පුශුල් බැදගෙන සීනි සියක් පලමක් අනා යහපත් ශැටියේ තබා දවශම පුශුලුවක් විතර කනු. රත්පිත් මාලේ නශා.

32. එන්ශාල්, කොතඹුරු කොල, තිකා කොල, කුරුඳු පොතු, මෙකී දේ ශත කලඳ බැගින් ගෙන වගපුල්, සීත් ඉඟුරු මෙකී දේ දෙපලම බැගින් වේලා සුනු කොට මී පැනි මතාවක්, එලහිතෙල් නැලියක්, වක්කර අනා තබා තුන් කලඳක් කනු. රත්පිත්, උන, කැසිමුස, ඇඟ වැරිං, වමනේ, ලෙහි රෝග, නැතිවේ, තුං කලඳක් වලඳනු.

ඉඳිමුමට:

33-1. ජයපාල පලමයි, සියඹලා බොර පලමයි, දුන්තෙල් පලමයි, දළුක්කිරි කලඳයි මෙවා ඉඟුරු යුෂින් අඹරා දවසක් අව්වෙ තිබා ගෙන කලඳ බැගින් කනු. මාත්තු මෝරුවෙං බත් දෙනු.

2. අරළු, කළුදුරු අඹරා ගෝ මුත්‍රයෙන් දෙනු.

3. අරළු, නෙල්ලි, ඉඟුරු, මිරිශ්, දැත්ත, රත් නෙටුල්, කසාය කර දෙනු.

4. වමමුතු, තිප්පිලි, ඉඟුරු, රත්නෙටුල්, සාරන, අරළු, සුදුදුරු, දේවදර, තිප්පිලි මුල්, මේවා චූර්ණ කර උනුදියෙන් දෙනු.

5. අරළු, කයිප්පු සීනියෙන් දෙනු.

6. සියඹලා ඇටයි, පොතුයි, මී අරටුවයි, ගමමිරිශ් ගින්නෙං දවා අළු ගෙන දිය කර ඉඳිමුමෙ ගානු.

7. කොසඹ, කරද කොල, සාරන කොල, තම්බා දිය නාවනු.

8. ඉඟුරු, බැබිල, සවින්දව, තල ඇට, අමුක්කරා, මුරුංගා, වරා, දළුක් මුල්, දේවදර, අබ, සුදුළුන. මෙවා ගෝ මුත්‍රයෙන් අඹරා ගානු. වායු සෝප ගුනවේ.

වදකහ බූගා තැඹිලි ලෙලි යුසිං අඹරා ගානු.

සෝපරාජ කසාය.

9. කිකිරිදිය, මුගුනුවැන්න, සියඹලා, ගොරක, බෙලි, වරා, මුඩ මහන, දෙහි, දෙඩං, නාරං, දෙඩං පනා, ගදපාන, කඩුපහර, මදුරුතලා, යක්ඹෙරිය, යකුවනස්ස, කොත්තමල්ලි, කොසඹ මුල්, තික, එල බින්තඹුරු, මේවා කොල, දළුක්, පතුක් සීනුක්, මුවකිරිය, මේවා කොටා යුස මනාව බැගින් ගෙන ශලක ලා තික, කොෂඹ, කුඹුරු, බෙලි, කුඩු මිරිශ්, දෙඩං පනා, නාරං,. යකිනාරං, වරා, බැබිල, තොටිල, ඉරමුසු, ශැවැන්න, කලුදුරු, බුලත්, මිරිශ්, එල බින්තඹුරු, තලා, කුප්පමෙතියා, සස්සඳ, ගොඩ මානෙල් අල මෙකී මුල් මිට මිට ගෙන එකට කකාරා පෙරා රොඩු හැර දමා ත්‍රිතිගනනට බෙද ගෙන දුරු දෙක මෝදක, පෙරුංකායං, කරාඹු, වසාවාසි, අතිඋඩයං, මනෝසීල, මාසක්කා, උළුවා, වලහවාල්, සුදුළුනු, තිපල්, ත්‍රිකටුක, සාරන, පැපිලිය, අබින්, සීනක්කාරං, බිංතල් මේවා කලඳ කලඳ ගෙන අල බේත් දෙපලමක් ගෙන තඹ, පිත්තල, රිදී, රත්තරං, යකඩ, යබර, ඊයං, තුත්තනාගම්, මේවාද යහුනු දෙසි ඇඹුලෙං අඹරාද විෂ හැර ගෙන සරක්කුත් සමග අඹරා තුනට බෙද පහුවකුත්, කසාය පහුවකුත්, ගෙන තරන, ත්‍රස්තවාළු, දූත්ත, ත්‍රිකටුක, ත්‍රිපලත්, සරක්කු බරට ගෙන කසායට කලතා තබා කබලෙන් බැදගත්, එඩරු ඇට, ජයපාල, දෙකිං දෙවෙනි සරක්කු පහුව බරට ගෙන දෙඩං ඇඹුලෙන් අඹරා කසාය පහුවට යොද කකාරා තිබා තුංවෙනි සරක්කු පහුවත් ඉතිරි කසාය පහුවට යොද උනු ගන්වා තිබා පලමු කසා බොන්නට දෙනු. උහුළුව දෙවෙනි කසා බොන්නට දෙනු. උහුළුව අන්තිම කසා පත්තියමට දෙනු. ඵනු ඇඹුල් වලකිනු. අහුන, මුකුනුවැන්න, කරවිල, තිබ්බටු, මුරුංගා, සියඹලා, දෙසි ඇඹුල්, කුකුලු මාළු, උගුරු මාලු, මෝර මාළු, හාල්මැස්සං, අළු පුහුල්, උයාපු හාලේ බත් වලදනු. සත් දවසක් බේහෙත් කා සත් දවසක් දිය වක්කරනු. පසුව දිය අඩුකර වක්කරනු. මින් ගුන ප්‍රමෙහයෙං අටගත් සෝපද කෝල වලිප්පු වලින් අටගත් සෝපද, සූල කට්වු බගන්තර වලින් අටගත් සෝපද, පිත් හතලිහෙන්, වායු අසූවෙං, සෙන් ස්තයං, අටගත් සෝපදටද, පතුල මෙන් දන ඉහට ඉදිම් එන සෝපයටද පිත් මතුවී හති කැක්කුං වී ගමං යන්ඩ බැරි, ඇඟ පත මුන පිපිහළු වී, කළු පිත නැගෙයි, පාඩු පශ් වගේ ලකුනු වෙයි. ඉම පැමිනි සෝපයට අද්දුටුවයි.

හැම පාඩු ඉදිමුමට

10. වෙතිවැල් යුස, අමුඉඟුරු යුස, දෙසි ඇඹුල්, දෙඩං ඇඹුල් යුස, අමු කහ, උප්පැති, හාතාවාරිය, කළු උන කොල දෙවගේ තැඹිලි දියෙන් මිරිකා පත පත ගෙන මදක් කකාරා දෙවේලේ වලදනු. පාඩු ඉදිමුං, හති කැක්කුං, කරකැවිලි, අත පය වේලනවාට, යහපති.

කසායට:

11. ඉඟුරු, තිප්පිලි, බැබිල, කටුකරඩු, එඩරු මුල්, අරළු, මේවා කලං 2 අට එකට සිඳුවා පෙරුංකායං මිශ්‍ර කර දෙනු. සියළු සෝපවායු නසයි.

කුෂ්ටයට

1. ද සමන් මුල්, පුදු ඇට, ලාකඩ, තිකුළු, අඹරා ගානු. කුෂ්ට නසා.

2. තලාතලෙන් වරා කිරි ඉඟුරු මිරිස් අඹරා ගානු. කුෂ්ට නසා.

3. අරළු, බුළු, නෙල්ලි, වලහසාල්, රත්නිතුල් මුල්, සෙන් කොට්ටම, බෝදි ඇට, යතුනු, කිකිරිදිය පත්, මෙකී දේ වේලා චූර්ණ කර ගන්නා ක්‍රමයෙන් වඩ වඩා කිරා ගෙන තුන් කලදක් දවස තලතෙල්වලින් අනා වලදනු. සියළු කුෂ්ටාදිය පහව බාලා දිවාකරයා මෙන් ප්‍රභාවත් ශරීර හා මොනර පිල් කලප් බදුවූ ඉස කෙස්ද වේ.

ඉසේ කුෂ්ටයට:

4. දෙමට පොතු, සුඹුළු කොට මී තෙලින් බැද ඉස ගානු. පසුව ඉස සෝදනු.

ඉස කසනවාට

5. පොල් කිරි, වරා කිරි, කහ අවුවේ තබා ඉසේ ගා සෝධනු. ගුනවේ.

උදුගොවුවාට

6. කුඩු මිරිස් ඇට කරබටු ඉස්මෙන් අඹරා ගානු.
බටුකර මී පැතියෙන් අනා ගානු. බාලයන්ගේ මුහට වගපුල් චූර්ණ කොට ගිතෙලින් අනා කවනු. ගුනවේ.

7. සියළු කුෂ්ට ගුනකොට හිසකෙස් නිල්වාක රවා දතු වඩවා ජරා ශක්ති වඩවා ජරාවිලිපිලි සන්සිඳුවා ශිෂ්ට සෘශි වීසින් කියන ලදි. ඇශල මුල් වේලා චූර්ණ කොට කලදක් විවර කොසඹ තෙලින් අනා තිස් දවසක් කනු. සියළු කුෂ්ටයටයි.

8. වලහසාල්, අරළු, බුළු, නෙල්ලි, කොට්ටම, සම භාග චූර්ණ කොට මී පැතියෙන් ලේහ කරනු. සියළු කුෂ්ට, ප්‍රමේහ, බගන්දර පනුවන් නසා.

9 දළුක් කිරි දෙපලමයි, දිය නොවක්කර මිරිකා ගත් පොල් කිරි මනාවයි, කසා මුක්කාලයි, ගෙන්දගම මුක්කාලයි, රසදිය කලං භාගයයි. මෙකී දෙය චූර්ණ කොට එයට අමු කසා මදක් කොට එල කිරි දී කිරි මෝරුවෙන් අඹරා ඇහ උලනු. සියළු කුෂ්ට නසා.

කඩිවේගමට

9. සබරල අල පිට කුඩු හැර දමා තුනී කොට කපා දෙඩම් ඇඹුලෙන් අඹරා තුන් දවසක් කඩිවේ ගමේ ගානු. ඉක්බිති බතුත් රෙද්දක බැඳ දියරේ පෙරා හැර දී කිර එක්කොට අඹරා ගානු. කඩිවේගම ගුනවේ. මධ්‍යයක් අවුවේ තබා උනුසුම් ලූ විට එල වෙඩරු කැවියක් දමා මුදු සුනුත් එක්කොට තඹින් සටා කඹපැන් දිය උනු කොට සෝද දමා ඊපිට ගානු. කඩිවේගම ගුනවේ.

තෙල්ලි කලදයි, බුළු එක්කලං සමාරයි, අරළු දෙකලදයි, වලහසාල් දෙකලන් සමාරයි. රත්තිටුල් තුන් කලං සමාරයි, ශෘං කල තිරිකොට්ටම්, තුන් කලං සමාරයි, අරළු දෙකලදයි, මෙකී දේ බෝඩි ඇට සතර කලදයි, යහුනු සතර කලං හමාරයි, කිකිරිදිය සතර කලදයි, යහුනු සතර කලං සමාරයි, කිකිරිදිය මුලයෙන් වෙලා කොටරසදියවිෂ්ණුමරාමුලකී බෙත් ඊට වත්කර කලතා අව්වේ තබා තෙල් පැම වූ කල ගානු.
සියළු කුෂ්ට, පඩතාඹර, සිලන්දු ආදියට ප්‍රත්‍යක්ෂයි.

කොසඹ, දිවුල්, රත්කැල, ඇසල මෙකී බෙත් කොල පොතු කුකුරු මුවන් ගෙඩිවල පොතුත් සම්භාග ගෙන ගෝ මුත්‍රයෙන් එක්ක වතින් කොටා වේලා ගෝමුත්‍රයේ දමා මෙසේම දවසක් කොට ඉක්බිති දෙසි ඇඹුල් වත්කොට කසා ගැටයක් එක්කද ගසා සිහිඳු කොට අඹරා ඇඟ උලනු. දෙවේලේ ඇල් දියෙන් නා බුදුගුන සිහිකරනු. ගැට්ටයක් ලනු. දශ අට කුශ්ට ගුනවේ සුවදවත් ශරීරවේ.

සම කැපුනාට

1. කරල් සැබෝ ඉස්ම කැපුනු තැන ගානු.

2. රතුළුනු තලා බඳිනු.

3. තද කෙවුමට එරබදු කොල මලවා බඳිනු.

4. සකුරු විල්ල කොල පොතු කොටා මලවා බඳිනු.

5. සියඹලා පොතු කාඩියෙන් උරුලායාත් එකට කුරුලායා ඉඳිමුම තද වුනා ගානු.

1. කටු ඇනුනාම ඇද දමා සයින්ධව එනු මුනත තබා පානේ තෙල් පොත් එහිලා තවනු. ගුනවේ.

2. කෝමාරිකා පළු උන අළුවෙන් තඹා මුනත තබා බඳිනු. ගුනවේ.

3. කටු ඇනුනාම ඇද දමන්න බැරිනම්, ඇද දමු නමුත් වරා කිරි මුනත පුරවනු. කටු එලියට පනිනවාය. වන ගුනවේ.

පතුල විළිඹුවට

1. කොටිකා, අමුකහා, ගැට දෙහි, වරා කොල, කස පැත්ලෙලි ඉස්ම, අරළු, කළුදුරු, මල බුලත්, මිදුරු කොල, එල ගොම පය පැලෙනවාට පොට්ටනි බැඳ තවනු. සෝද දමා තවනු. විළිඹු පතුල් ගුනවේ.

2. නුග දළු, බදුල්ල දළු, මී ඉටි, අඹරා මැලියම්, සයින්ධව ළුනු, වරාකිරි එක විවරට ගෙන අඹරා තල තෙලට දියකොට මද ගින්නේ කකාරා පදමට ගෙන කල්කයෙන් තවනු. පතුල් පැළුනු තැන ගානු.

3. අබ අඹරා පතුලේ ගා ගලක් රත්කොට විතර උනුසුමෙන් පතුල තවනු. මෙසේ හත් අට දවසක් කරනු. පතුල් විලුම පැලුම ගුණවේ.

ශරීරයේ සෝ ගදට

1. අරළු අඹරා දවල් ඇගේ ගා තබා සවස නානු. මෙසේම හත් අට දවසක් කරනු. නැකල තිකම් යන දද්ධිය ගුනවේ.

2. සියඹලා කොල ඉස්ම ඇගේ ගානු.

3. කෙසෙල් පතුර ඉස්ම වත්කර ගානු. සෝ ගදටයි.

4. එවෙලේම දපු මී ගොම ගෙන ගෝ මූත්‍රයෙන් දියකොට දෙකිසිල්ලේ ගානු. සෝගද ගුණවේ.

5. අමු සියඹලා පළු පොතු හැර අළුත් එක්ක අඹරා දෙකිසිල්ලේ ගානු. සෝගද ගුණවේ.

අත් පනුවන් කනවාට:

පිහිඹිය පොතු, කොසඹ කොල පොතු, ඇසල කොල පොතු, රත්තිවුල් මුල් කොලත්, මෙකී දේ වේදු පා, තවනු.

ගිනි විෂට

1. අත්තන කොල ඉස්මට හුනු මදක් එක්කොට ගානු. බිබිලි නොනැගේ.

2. එලිකිරි, කෝමාරිකා, ඔලිද මුල්, රසකිඳ කොල, අක්මැල්ල, පුසුල් දළු, අඹරා ගානු. ගිනි විෂයටයි.

3. තමෝ අමපල්ලේ දෙමපල්ලේ ඇමදෘම පල්ලේ ගිති විෂ දහම් පහම් අක්මැල්ල කෝමාරිකෙන් දවිම එයින් ගිතිවිෂ නැතියඃ

4. සා බෙටි, මී කොල, දමමල්, කුඩුමිරිස්, උදුපියලිය කොල, රත්මල් වෙන වෙන වත් එක්වත් කබලින් පුළුස්සා අළු පොල් තෙලින් අනා දජ්ජ වනයේ දමනු.

5. හික් පොත්ත ඉස්මත් පොල් කිරිත් මැඩ වත්කොට අවුවේ තිබා තෙල් පාට වු කල ගානු. දවිවටයි.

6. අළු කෙහෙල් මුවයක් කොටා එල දිකිරි මෝරුවෙන් අනා එම මුනාත් ඉස්ම මිරිකා වත්කරනු. වෙඩි උන්ඩ වත් ගිති විෂ දය නැතිවේ.

7. කිත ගසක් කපා මුල් අල්ලට කැර අල්ලා ඉන් වෑ හුනු දිය වෙඩි උන්ඩය වත් වනයේ වත් කරනු. විෂ දයේ.

8. උදුපියලි අක්කහ මදක් එක්කොට අඹරා තෙලට දිය කොට පදමට කකාරා, පෙරා ගන්ඩ පලමුවෙන්, වැල්මී, සැවැන්දරා මුල්, කොට්ටම, සිද්ධිගුරු, මිරිස්, කළුදුරු, අසමෝදගම ඊට චූර්ණ කොට දමා ඉක්බිති තිබා පෙරා ගෙන මී දළු, දිය කිරිල්ල දළු පොතු පුළුස්සා තෙලට එක්කොට ඔඩුව ඇතත් නැතත් තෙල් දමනු. වෙඩි වන ගුනවේ.

ඊට වායුවට:
කටුකරඩු මුල් ශකලදයි, බැබිල මුල් සකලදයි, කපාකොටා දිය අට පත් එකට කකාරා දෙනු. බඩේ වායු ගුනවේ.

දුවන පතින රතයට

1. ගරුඬ, පාසාන, සහශ්‍රවේදි, සක් කැබලි, රත් සඳුන්, තන කිරෙන් ගා අඳිනු. දුවන පතින රතයටයි.

රතයට

2. කුඹුරු කොල, සුදුළුනු, පෙරුංකායම, මෙකී දෙය අඹරා ගානු. රතයටයි.

3. ඇල් කෂඹිලිය කොල සාමුලයෙන් කොටා ඉස්ම ගෙන හිනටි හාලේ තලප පිස ගානු. රත ගුනවේ.

4. කුරුප්පු කොල, රත් මල් කැකුළු, තෙල්ලීක්කා ගෙන්දගම්, ඔලිද කොල, වද මල්, අඹරා උරුලියා තෙලින් ගානු. දූවන පතින රත ගුනවේ.

වගපුල්, සයින්දව එනු, මුනමල් ඇට, වරා ඇට, තියගලා අල, අඹරා පෙකනිය වටා ගානු. අරිශස් ගඩු ගුණවේ.

කුෂ්ටයට:

තිපල්, දුම්මැල්ල වැල්, කොසඹ පොතු, කිහිරි අරටු, ඇහැල පොතු, මෙවා එක බරට දෙලොස් කලදක් ගෙන කොටා වතුර අට මනාව මනාවට කකාරා සතර වෙලට දෙවේලේ දෙනු. සැම කුෂ්ට නසා.

ගජ චර්මයට

තෝර ඇට මී කිරෙන් තම්බා දළුක් පළු ඉස්මත්, රසකිඳ, වැලේ ඉස්මත් වත්කර අඹරා ඇහ උලනු.
කංශා අඹරා ගෙන කුරුලෑවේ ගානු. නැතිවේ. කුඹුරු ඇට මද එලකිරෙං අඹරා ගානු. කුරුලෑ නැතිවේ.

කුෂ්ටයට

1. රසකිඳ වැල් යුස පතක් ගෙන මී පැනි තුන් කලදක් ලා උදය කිප දිනක් පොවනු.

තීලිකා

1. පොල් තෙල්, දිය පෙනෙලත් ගෙන ගිරියල් එක්කොට අඹරාගානු. ඇහ තීලිකා නැතිවේ.

2. දිවි පහුරු ඇට ගෙන පුශුල් කොල ඉශ්මිං අඹරා උලා ගා තබනු.

3. වෙනිවැල්, වියලි කශා, තිඹිරි ගෙඩියේ මද, මෙකී බේත් සමසේ ගෙන මී පැතියෙන් අනා සුලු පැනිං සමසේ ගෙන එක්ක උලා හැර මේ බේත් ගානු. ඇහ තීලිකා නැතිවේ.

4. බෙලි සුනු, ඔලිද ඇට, කෝමාරිකා මද, එක්ව අඹරා එනු දියෙන් ඇහ ගා තබනු.

5. කවුඩු කැකිරි, වරා කොල, ගෙන යුශ මැඩ මොනර පිල් අඹරා ගා අදිනු. ඇහ තීලිකා නැතිවේ.

6. උරුලෑ සටටං අළු කොට මී පැතියෙං එලගිතෙල් එක්කොට ශා අඳිනු. මෙකී රෝග නැතිවේ.

කබර වලට

ඉරිවේරිය සහමුලයෙන් ගෙන දවා ගත් අළු ගෙන ඇල්දියෙන් ගානු. කබර නැතිවේ.

දද අළු ගෝමරවලට:

කොට්ටං, ශවින්ද එනු, වලගසාල් යන මෙකී දෙය දියවරිං පොහවා කාඩිදියෙං අඹරා ආලේප කරනු. දද අළු ගොමර නැතිවේ.

පුශ්කර, ගෙන්දගම්, ශිරියල්, කශා, ශිනක්කාරං, තුං තුං කලඳ ගෙන ගො මුත්‍ර නැලියක ලා අඹරා පතක් විවර වනතුරු කකාරාබා ගෙන ඇහ ගානු. ගෝමර පනු කැවිලි නැතිවේ.

3. ඇශල කොල පොතු, කරද මුල් පොතු, ගෙන්දගම්, මනෝශිල, ශවින්ද එනු මෙකී බේත් සීනුක් පලෝල් ඉස්මින් අඹරා ඇහ තබා ශවශ ඇහ උලා උනු දිය නානු. දද ගෝමර පනු කැවිලි නැතිවේ.

කුෂ්ටයෙන් හට ගත් තුන්දෙස් ජ්වරයට:

කලාඳුරු අල, සඳුං, ඉරිවේරිය, රශ කිඳ, සිද්ධිගුරු, ඉරමුශු, වැල්මී, මෙකී බෙහෙත් දිය අට නැලියක් වක්කොට කශාය කකාරා එක්වු කල අරගන තිබා මදක් පොවනු.

පනු කැවිලි

1. හරංකහා, සුනු අළු, වල් ඉඟුරු, අත්කශා, දෙසි ඇට, අඹ පොතු, මීදැල්ල පොතු, බාං ගැට, මෙකී දෙය එක මට්ටමකට කොටා ගෙන දෙශි ඇඹුල් තැවියයි, අත්කශා ඉස්ම නැලියයි එල ගොම ඉස්ම නැලියයි, ගොමුත්‍ර නැලියයි, මෙකීදේ සැලියක වත්කොට ලිප තබා අතපය පනු කැවිල්ලට දෙවේලේ තබනු. ගුනවේ.

2. ගිතිහිරිය, තිල්ගිතිහිරිය, අබ පොඩි, ශුනු, කොරොශ්ශවැල්, එලගොම, හුනු අළු මෙකී දේ ශැලියක ලා ලිප තිබා උනු කොට දෙවේලේ අතපය තවනු. පනු කැවිලි ගුනවේ.

සොරිවලට:

සොරි වියල්ට

1. කැකුන මල්, බිං දුම්මල, උනු ගන්වා පාන් කඩ ගා ගෙඩිය පිට තල තෙල් ගා

ඉපිට තබා බඳිනු.

2. පුස් ඇට, අන්කෙන්ද අල, පැහිච්ච වෙරළු කොල, හබරල අල, සීනටි හාල් පිටි සමහ දෙඩමින් අඹරා ගානු.

3. ගෝන අං පුළුස්සා අළු දෙඩං ඇඹුලෙන් අඹරා ගානු.

ඉකිලියේ අල්ලන තල පෝරුවට:

කැකුන, හොරම් ඉටි, පල්මාතික්කං, රිදීතුත්තන්, මේවා එඬරු තෙලින් අඹරා කඩ මාළු වල ගා ඇලවනු.

හොරි

වරාමුල්, නෙටුල් මුල්, අඹරා මී තෙලට යොදා උනු වෙන පදමට සුදුළුනු. වදකහා, ගෙන්දගං, අඹරා තෙල් සිඳ ගානු. ශම හොරි ගුනවේ.

කඩු වේගමට හා ගජ චර්මයට

බදුල්ල ඇට, දන්ත මුල්, වරා මුල්, දළුක් මුල්, ඔලිද ඇට, තිපල්, ත්‍රිකටුක, සක් පොඩි, තුත්තං, රත් නෙටුල්, තියහලා අල, හිරිටි, හිරියල්, අඹරා යකඩ වලදක් ලා දළුක් කිරි, වරා කිරි සමහ උනු කර ගානු. කඩිවේගමුත් හොදවේ.

කල්ගිය සොරිවලට:

1. අං කෙන්ද පොතු කොටා දිය වත්කර අනා තිබා පල්ලට බේරුනු මංඩි ගෙන දෙසී ඇඹුල් පොල් කිරි වත්කර ඊට අබ, තල, කසා, අඹරා එහි යොදා මඤ්ඤෙක වත්කර වරාකිරි එහිලා සුසිපුට ලා සිඳ කල්ක ඇඟ ගා තෙල් ගානු. සොරි කිලාස නසයි.

2. සඳුං, සැවැන්දන මුල්, බෝදි ඇට, දුහුදු ඇට, අමුකහ, සවින්ද, මනෝසිල, වලහසාල්, වදකහ, අබ, රත්කැල පොතු, ඇහැල පොතු, මේවා කොටා මෝරුවෙං අඹරා ලෝ බද නෙක ලා තිබා පසුවදා එපමන කල අඹරා ඇහැටිලනු. සොරි කශ් කිලාස, තිය ගැවිලි, ගුනවේ.

කුෂට

අකුපට්ට පල්මාතික් පුස්කර සාදිලින්ගන් ද
එක්කර ගෙන මෙරට මිරිස් තිප්පිලි දුරු පමණකින් ද
එක්කර ගෙන සුදුළුනුත් කලඳ බැගින් සමනයෙන් ද
රොක් කරගෙන සියළු ඔසුත් අඹරා ලාගෙන පබන් ද

එරබදු යුස මුගුනු වැන්න කීකිරිඳිය යුසා මෙ සේ
පරසිඳු රට තෝර කොලත් කුප්පමේනි මදුරු ය සේ
වැර සිදු කර ඇඹරූ ඔසුත් දෙවනුව අඹරන්න මෙ සේ
හැර සිදුවෙයි සියළු රෝග අත්දුටු අවුසදත් මෙ සේ

සතක් කොට වියලි අවුසද තනාග ණ
පතක් පමන ගිතෙළුත් සමහ කරග ණ
එතෙක් වෙන තුරා බැලුවොත් මෙ පා ණ
පතක් ගසල වැකි සදසේ වෙයි මුහු ණ

නාසයෙන් මස් දළු වැඩී නාසා උඩ විකාරවේ නම්

සුදුදුරු, රත්නෙටොල් මුල්, මුරුංගා, අබ, කරල් ශබෝ ඇට, සවින්දව, කටුවැල් බටු මුල් මේවා කලන් බාගේ බැගින් ගෙන වරා කිරෙන් අඹරා එල මුත්‍ර තේ කෝප්ප සතරකුත්තල තෙල් කෝප්ප සතරකුත් එක්ක කලතා දියෙන් සිඳුවා දන්නට තැර බා පෙරා තබා නාසායෙන් ඇතුලට පල්ලයේ එන මස් දළුවේ කුකුළු ගානු.

දද කුෂ්ටයට:

1. රත්නෙටුල් පුළුස්සා අහුරු අළු ගෙන වරකා ගහේ පැහිච්ච කොලත්, කයිප්පුත් මෙ තුන දෙඩං ඇඹුලෙන් අඹරා ගා අදිනු. කුෂ්ට ගුනවේ.

2. දළුක් යුෂයෙන්, තෝර ඇට තුන් දවසක් ඌරුවෙන්ඩ තිබා කහ, ඇසල කොල එක්කොට අඹරා ඇහලනු.

3. මීදෙල්ල දළු උන අළුවෙන් තම්බා මහ බෝවිටියාමුල් මල් ඉස්මෙන් පල්මාතික්කන් කයිප්පු එක්ව අඹරා දද කුෂ්ඨ ඇතිතැන ගානු. උනු දියෙන් සෝදනු.

කඩි වේගමට තෙල්

1. දෙළුන් මුල්, මදුරු, තිකා, කරල් ශැබෝ, රට තෝර, බැබිල මෙකී මුල්වල පොතුත්, අරළු, කළුදුරු, සවින්දව මංචාඩියයි මෙ හැම අඹරා තල තෙල් පතට එක්කට කකාරා අමුකපුරු සොඳ කපුරු කොකුන් මෙකී තුතින් මුක්කාල බැගින් අඹරා තෙලට දමා එක්කොට කඩිවේගන් සොරිවලට ගානු.

ඊට ලේප- ගන්දක, එන්සාල්, මනෝසිල, උපුල් කොල, රන්වන් කැල, ශවන්ද කොල්ලන් කොල, කුරුඳු පොතු, වරා කොල, මෙකී බෙහෙත් අඹරා ඇ ගල්වන්න.

ඊටම යවකාර ලුණු සමහ ඇඹරූ ගන්ධක පාසානයෙන් ආලේප කරන්න.

ඊටම කැල දවාගත් අළු හෝ කරල් සැබෝ දවාගත් අලු හෝ තල තෙලින් අනා ආලේප කරන්න.

ඊටම මොනර පිත එක්ව අඹරා ගත්මනෝසිල හෝ ඉරිවේරිය දවාගත් අලු හෝ ඇන්ට්ගුයෙන් යුක්ත වු පිච්චවැල් දවාගත් අලු හෝ ආලේප කරනු.

ඊටම දලුක් කිරි, වරා මුල් සුඹුලු, සවින්දව, සමන්දට, රත්නිටුල් මෙකී බෙහෙත් අඹරා ගොමුත්‍රයෙහි ලා තලතෙල් එක්ව කකාරා තෙල් සිඳ පෙරා ගල්වන්න.

ඊටම රසකිඳ, අරලු, නෙල්ලි, වෙනිවැල්, මෙ බෙත් කකාල කෂාය ගෝ මුත්‍රයෙන් බොන්න.

ඊටම උණු දියෙන් ගුගුල් අඹරා ගෝ මුත්‍රයෙන් මසක් බොනු.

ඊටම ගල් සෙවෙල් හෝ කසා හෝ අඹරා මී පැනි හා ගෝ මුත්‍ර එක්කොට මසක් පොවනු.

ඊටම වලහසාල්, රත්නිටුල්, සීනි, තලතෙල්, නෙල්ලි, වගපුල් සියල්ල සමභාග ගෙන එක්කර අඹරා ලේහ කරන්න.

ඊටම කිහිරි අරටු කකාල කෂායෙහි මී පැණි, රස අඳුන්, උපුල් කොල, මෙකී දෙය අඹරා ලේහ කරන්න.

ශොථ

ඉදිමුමට

1. අරළු   සාරණ මුල්   සිද්ධිගුරු   කලාදුරු අල
දේවදාරු
මෙයින් කකාල කශාය දෙනු. ඉදිමුන්, අපිෂ්ට පාඩුරෝග, බගන්දරා ගුණවේ.

2. සුදුරූනු   දේවදාරු   ශාරණ මුල්   සිද්ධිගුරු
මෙයින් කකාල කෂාය දෙනු. ඉදිමුම් ගුල්ම රුජා ගුණවේ.

3. ශාරන මුල්   කොහොඹ කුරු   දුම්මැල්ල   සිද්ධිගුරු
කටුකරෝහිති   අරළු   මුරුවා   රසකිඳ
මින් කකාල කෂාය දෙනු. ඉදිමුන් කැශි, බඩ රුජා, උදර වැදි ගුණවේ.

4. තිකුළු   කටුකරෝශන   ත්‍රස්ථවාළු   යුහුනු
චූර්ණ කර තිපල් කශායේ ලා දෙනු. සියළු ශොථයට ප්‍රත්‍යක්ෂයි.

ඉදිමුමට මුත්‍රා විරේකය

2. එරබදු කොල,   කටු කරඬු කොල ලබු කොල
මෙකී කොල අහුර අහුර ගෙන පිල මුල් පලමක් ගෙන අරළු ගෙඩි දහයක් ගෙන දිය ශතර නැලියක කකාරා ඊට
කළු දුරු   ඉඟුරු   සුදුළුනු   මිරිස්
මේවා ටික ටික විතරට ගෙන අඹරා කශායට දියකර පොවනු. තුන් දවසිං ඉදිමුන් බසී.

3. ත්‍රස්ථවාළු   සාරණ   තීරමුල්ලි   හීන්නෙරෙංචි
මේවා දොලොස් කලදක් අට එකට කකාරා දෙනු. සියළුම ඉදිමුන් නශා දවසින් දෙදවසින් බසී.

4. පල්මාතික්කන් දෙහි ඇඹුලෙන් අඹරා ගානු. සියළු ඉදිමුන් බසී.

ඉදිමුමට චූර්ණය

5. මිරිස් කලදයි   වේලා, කශා, කලදයි

නත හාල් කුඩු කලඳයි
ඉඟුරු කලඳයි ජයපාල ඇට පශයි

මේහැම චූර්ණ කර ගන දෙකට බෙදා පංගුවකට ජයපාල දමා පාවන පතුව උදේ උදේ වලඳනු. අනික් පතුව සවස සවසට මී පැනියෙන් වලඳනු. මීට ගුණ මුත්‍රා විරේක වෙයි. සෑම ඉදිමුමට දෙනු. එනු ඇඹුල් වලකිනු. උනු දිය පාවිච්චි කරනු.

6. බුලත් ග්‍රිදා ඉශ්ම පතයි පෝටා කොල ඉස්ම පතයි ඔලිඳ කොල ඉස්ම පතයි
නැඹිලි පොල් තුනක කිරි
මීට කල්කෙට
කළු දුරු සුදුදුරු කරාබු වසාවාසී සාදික්කා
තිප්පිලි
මෙකී දේ අඹරා තෙලට දිය කර කකාරා තෙල් පදමට හිඳ ඇඟ අල්ලනු. තෙල් කා අනුබව කරනු. ගර්භනීන්ටද තිකත් අයටද දෙනු. ඉදිමුත් බසී.

7. කපු කොල ඉෂ්ම නැලියයි ගොරක කොල ඉශ්ම නැලියයි
දෙහි ඇඹුල් මනාවයි අමු ඉඟුරු ඉස්ම මනාවයි
ගොරක පතයි යබර පතයි සුදුදුරු කළුදුරු
අසමෝදගන් කරාබු සුදුළූනු තිපල්
කටුකරෝසන තිපල් වසාවාසී
මේවා තුන් තුන් කලඳ බැගින් අඹරා ස්වරසයෙහි දිය කර තනා තිබා මින් පත පත මදක් උනු ගත්වා උදය සවස බොනු.

මෙකී ගුණ : ශ්‍රොතිත ඉදිමුන් ගුණවෙයි. එනු ඇඹුල් අරිනු.

8. දේවදාරු අරළු සුලුබුරුද සිද්ධිගුරු
මෙකී බෙහෙත් සුනු කොට ඒ ශුනු තුන් කලඳක් උනු දියෙහිලා පොවනු.

9. වලහශාල් ඉවද කෙලින්ද ඇට සිද්ධිගුරු
දේවදාරු මිරිස්
යන මෙකී දේ චූර්ණ කොට ඒ පොඩි තුන් කලඳක් උනු දියෙන් කලතා පොවනු. ඉදිමුන් නැතිවේ.

10. තිකුළු යහුනු යවකර එනු තිපල්
ත්‍රිස්ථවාළු
මෙකී බෙහෙත් පොඩි කොට තිපල් කකාල කශායෙහි ලා පොවනු. ශෝථ නසා.

11. ගුගුල් පොඩි කොට ගොමුත්‍රයෙහි ලා පොවනු.

12. වග පුල් ශුනු කොට එළ කිරෙහි ලා පොවනු.

13. සීනි හා අරළු සම බාග ගෙන අඹරා වැලදිය යුතු. නොහොත් සිද්ධිගුරු ශකුරු එක්ක වලදනු. ශෝථ නැතිවේ.

14. එල කිරි මුං
උඩු උයා ඉශ්ම ගෙන එහි එක්කොට වලදනු. ශෝප නසා. අතිකුත් රෝගද නසා.

15. දේවදාරු සුළු බුරුද සිද්ධිගුරු
මෙකී බෙහෙත් අඹරා එල කිරෙං පොවනු. ශොප නසා.

16. කශා වෙනිවැල් වං මුතු මුරුංගා අල
වග පුල් ඇත් වග පුල් මූල් ශිවිය මුල්
උනදඩෙමකුල් සිද්ධිගුරු
උපුල කොල මෙකී බෙහෙත් අඹරා උනුදියෙහි ලා පොවනු. ඉදිමුන් නසා.

17. අරළු සාරණ සිද්ධිගුරු දේවදාරු
එක එකින් තුන් තුන් කලන් ගෙන තෙරපා දිය අට පත එක පතට සිඳුවා තුන් උදයක් දෙනු. සියළු ඉදිමුන් ගුණවෙයි.

18. වේලි කශා කළුදුරු මුරුංගා මුල් තිප්පිලි
වග පුල් රත්තිටොල් සිද්ධිගුරු අසමෝදගන්
දියමිත්ත මුල්
මෙකී බෙහෙත් සමසේ කලද කලද ගෙන අඹරා උනු දියෙන් දෙනු. සියළු ඉදිමුන්ද මශින් හෝ සතියෙන් හොද වෙයි.

19. අරළු තුන් කලදක් විවර ගෙන කළු දුරු කලදක් විවරක් එක්කොට ගෝ මුත්‍රාවත් කොට අඹරා ගෝ මුත්‍රාවට දිය කොට පොවනු. තුන් වරින් ඉදිමුන් ගුනවෙයි.

20. සාරණ කොල කැද දෙනු. ඉදිමුමටයි.

21. හීරැස්ස දමා දිය කකාරා මිරිකා පෙරා හැර කැද පිස එඩරු තෙල්
සුදුළූනු මිරිස් පෙරුන්කායන්
දමා සිඳවා පොවනු. සියළු ඉදිමුන් ගුණවෙයි.

22. පතුක් කොල ඉඡ්මෙන් සීනටි ශාල් තලප පිෂ ගානු. ඉදිමුන් බසී ගුණවෙයි.

23. දේවදාර අරළු සිද්ධිගුරු සාරණ මුල්
එකීං එක ගෙන මුක්කාල මුක්කාල ගෙන උනු දියෙන් අඹරා උනු දියෙන් දෙනු. ඉදිමුන් ගුනවෙයි.

පිත් ඉදිමුමට

24. අරළු විශ්ශක් තිහක් ගනිමින් තලා සුනු කර පොතු ගු රා
යාළු ගොමුපුෂ සතර පතකින් තබා ඌ දිනක්කා රා
පසුවදා උදයෙහි එ දිය පිතට බිවොත් ගෙන පෙ රා
ඇතුළුවාගත යාළු ඉදිමුත් යඩමග බැස විස්වරා රා

ඉදිමුනාට

25. උන රෝගෙන් ඉදිමුනාට
සියඹලා කොල ඉස්ම තැලියක් ගෙන ඊට අමු ත්‍රස්ථවාළු කලන් දොලහක් ශිතිදූව එම ඉස්මෙන් අඹරා ඊට කලතා ලිප තබා තැලියට ශිදූවා දෙකට බෙදා එක පඟුවට ත්‍රස්තවාළු කුඩු කලන් හයක් දමා කායත් පදමට පිශගත උදේ උදේ පාවතේට පස්වරුවට දෙනු. මින් ගුණ උන අතීශාරෙන් ඉදිමුනාටද ස්ත්‍රීන්ටද සියළුම ඉදිමුත් වලටද අද්දුටුවයි.

ශෝපයට

26. සාදික්කා ඉඹුල් ලාටු කරාබු වද මල්
ගම්මිරිස් තිප්පිලි අසමෝදගන් දුරු
දෙවුදුරු රසකිඳ
ඉඟුරු කොල යුෂයෙන් අඹරා මොර දෙමිනේ
ලෙසිදුන් රුජා සිටුවයි මෙලෙස නොවරදිනේ

27. වම්මුතු සාරණ දෙවුදුරු කසඹිලියා
සිද්ධිගුරු
මේ කෂාය ශොප ගුණවේ.

28\.
අරළු සාරණ මුල් සිද්ධිගුරු දේවදාරු
මෙකී දෑ තුන් තුන් කලන් ගෙන තෙරපා දිය අට පතක් ගෙන එකට සිඩවා පෙරා තුන් දවසක් දෙනු. ඉදිමුත් ගුණවෙයි.

29. අරළු තුන් කලදක් ගෙන චූර්න කොට කිතුල් හකුරෙන් අනා දෙනු. උනු දිය බොනු. ඉදිමුත් ගුණවෙයි.

30. උළුවා මුං ඇට
උයාපු හාල් බැද අඹරා කැඳ පිස සිද්ධිගුරු තලා පොට්ටනි බැද කැඳට දමා උනු කර දෙනු. තුන් දොසින් ආ ඉදිමුත් ගුණවෙයි.

31. තියං වැටකොළ පෙති ගසා පුළුස්සා අළුයි. දළුක් අතු පුළුස්සා අළුයි තල තෙලෙන් අළුදිය කර ගානු ඉදිමුන් ගුණවෙයි.

සෝපා කල්කයට

32. විස හැරි ජයපාල ශකලදයි කන තෙල් සකලදයි සියඹලා බොර සකලදයි දළුක් කිරි අව්වේ තිබා මිදුනු යොදේ ඇර කිරි කල බාගයයි
මෙකීවා අමු ඉඟුරු යුසින් අඹරා කුලඹුවේ තිබාගෙන ඉදිමුම් ලෙඩට පමන බලා එල බටු බැයක් පමන වත් පුවක්, ගෙඩියක් පමණ වත් පොල් හකුරු ඇතුලෙවත් පැහිච්ච කෙසෙල් ගෙඩි ඇතුලෙ වත් තිබා උනු දිය උගුරක් දෙවුගුරක් බොනු. උනු දියෙන් විරේක වෙයි. ඇල් දියෙන් ගුණවෙයි.

වායු පොට්ටනියට බේත්

33. කුඹුරු ඇට   එඬරු ඇට   මී ඇට   කපු ඇට
නා   කොසඹ   පුෂ්මේ ඇටයි   දොඹ ගෙඩි
කුඹුරු පොතු   තුඹ පොතු   කුඩු මිරිස් වැලේ පොතු
පඤ් පැහිරි පොතු මෙම කොලවරා කොල එඬරු මුල් කොල දොඩම් පොතු, කොල කොසඹ පොතු කොල
තල   අබ   උළුවා   සුදුදුරු
සිද්ධිගුරු   වග පුල්   නරි වැල්   වලහශාල්
වදකශා
මෙයින් බේත් ලැබුණු පමනක් ගෙන කොටා පශ් තෙල් වක්කර අනා පොතු මුක්කාල ගෙන උනු දියෙන් දිය කර දෙනු.

34. මනෝසීල   සියල් තිකුළු   කොට්ටම්   කලාඳුරු අල
දේවදුරු   සිද්ධිගුරු   ගසකි මුල්
එතෙක් මුස්තාල ගෙන උනු දියෙන් දෙනු. ඉදිමුන් ගුණවෙයි.

35. සිද්ධිගුරු   අරළු   සාරන   දේවදාරු
එක එකින් තුන්තිද ගෙන තෙරපා දිය අට එකට කකාරා දෙනු. සියළු ඉදිමුන් ගුනවෙයි.

36. වේලා   කලාඳුරු අල   මුරුංගා මුල්   තිප්පිලි
වග පුල් මුල්   රත්නිටුල් මුල්   සිද්ධිගුරු   අසමෝදගන්
දිය මිත්ත මුල්   කශා
මෙකීවා සමසේ සකලදක් ගෙන අඹරා උනු දියෙන් දිය කර දෙනු. සියළු ඉදිමුන් ගුණවේ.

37. අරළු තුන් කලදයි කලාඳුරු එක්කලන් හමාරක් අඹරා ගෝ මූත්‍රයෙන් දිය කර දෙනු. තුන් ඇවරින් ඉදිමුම් ගුණවේ.

38. තන හාල් කොල කැද පිස දෙනු. ඉදිමුන් ගුණවේ.

39. තිරස්ස වාලු වැල් ඉස්ම, සීනටි ශාල් පිටියෙං කැද උයා තුන් දවසක් ඇඟ ගානු. ඉදිමුන් බසී.

40. සිද්ධිගුරු අමු ඉඟුරු හීරැසිස යුසිං අඹරා එම යුසින් සීනටි ශාල් අඹරා තලප පිස ඇඟ මුළුල්ලේ ගා මදක් කනු. ඉදිමුං බසී.

41. පෝටා කොල යුස,
උදුළු තැටිල්ල රත්කොට තබා පතුල බෙනෙලා ආතුරයා ඇඟ ගානු. රුජා ඉදිමුං කොර ඇරෙයි.

කැවුන විෂ නසන්ඩ, ඉන් වුන ඉදිමුන්

42. රොටි බේත්
සියඹලා දළු
කලාඳුරු අල
පෙරුංකායන්
දෙශි දළු
මධු දළු
කරල් ශැබෝ
අසමෝදගන්
දොඩං දළු
තිකදළු
සාල්
තිප්පිලි
නාරං දළු
කුඩුමිරිස් මුල්
දෙදුරු
කොට්ට පොල්

නෙරි විෂ හැර මේ ශරක්කු වල් අවුශද යුශිං අඹරා සීනටි ශාල් එම ඉශිදියටලා අඹරා එම ඉශි යොදා දෙනු. ලැපැත්ත අඩිස්සිද මේ හැම ගුනවේ.

42. අරළු
දේවදාරු
සාරණ මුල්
සිද්ධිගුරු
කලාඳුරු අල

මෙයින් කකාල කශාය දෙනු. ඉදිමුන් අපිෂ්ට පාඩුරෝග බගන්දරා ගුණවේ.

43. සුදුළූනු
දේවදාරු
ශාරණ මුල්
සිද්ධිගුරු

මෙයින් කකාල කෂාය දෙනු. ඉදිමුම් ගුල්ම රුජා ගුණවේ.

44. ශාරණ මුල්
කටුකරෝහිනි
කොහොඹ කුරු
අරළු
ධූම්මැල්ල
මුරුවා
සිද්ධිගුරු
රසකිඳ

මින් කකාල කෂාය දෙනු. ඉදිමුන් කැශී, බඩරුජා, උදර වැදි ගුණවේ.

දහ අට සන්නියට හා කටින් බඩින් යනවාට

1. කරාබු
දෙදුරු
සුදුළූනු
වසාවාසි
අසමෝදගන්
අති උඩයං
සාදික්කා
සිද්ධිගුරු
නික දළු
තිප්පිලි
මිරිස්
මල බුලත් නැටි

මෙකී සම භාග ගෙන අමු ඉඟුරු යුසින් අඹරා කරාබු නැටි පමණ ගුලි කර පවන වියලා තබා ඉඟුරු යුසින් දෙනු.

ඔඩු ගෙඩි වන තෙල්

1. මකුළු වැත්ත සහ මුලින්, තික කොල, සාතාවාරිය, වැල් කසඹිලියා, සතුරු සම්මැට්ටි, ඔලිද කොල, වෙන වෙන ඉස්ම මිරිකා එක පමනට ගෙන පොල් දෙකක කිරි මිරිකා කකාරා තෙල් සිද මී ඉටි දමා උනු කර තබා සියළු ගෙඩි අට ගත්තා විට තෙල් ගානු. ගුණවෙයි. අද්දුටුවයි.

2. මගුල් කරද දළු, එනුවරණ, ඉරමුසු දෙමට
උසීර
මෙකී දේ මුල් සමව පොල් එක්ව කොටා මිරිකා තෙල් උනාම
දේවුදුරු සුදුළූනු මෝදක තිප්පිලි
ඉඟුරු මිරිස් තිපල් පල්මාතික්කං
මංචාඩියකුත් එක්ව අඹරා තෙලට දමා කලතා බා තිවා සියළු තෙල් වලින් බැරි උනු ඔඩුවලට වන වලට ගානු. ඔඩු තෙලයි.

3. වෙල්ලංගිරිය දළු දද කිහිරි දළු මස් බැද්ද දළු ගිරිතිල්ල දළු
මෙකී දේ තල තෙලින් පදමට සිද ඔඩුවට පිඹිනු.

බගන්දරා ඔඩුද ගුණවෙයි.

මුර උණ

සියඹලා දළු සුදුළුනු මී පැනියෙන් අඹරා දෙනු. මුර උනටයි.

අතීසාරයට

වේලා කොල ඉස්ම කන වක්කරනු. එක වගයක් සිටි අතික් කන වක්කරනු. දෙවගේම සිටි.

උන්මාදයට

තැඹිලි ගෙඩියේ ඇස්ස කපා වතුර බොන්ඩ දී තව තැඹිලි ගෙඩියකට සුදු හඳුන් බටු ගෙඩියක් පමණ ඩීනි, තිප්පිලි කුඩු, මේ තුන් පහුව තැඹිලි ගෙඩියටද දමා දෙනු.

කෂායට

ආඩතෝඩා සුදුහඳුන් රසකිඳ තිප්පිලි
තුන තුන කිරා මනා අට එක මනාවට උනු කර තුන් වේලට තල තෙල් දමා දෙනු.

වාතොන්මාදයට

තල තෙල් හෝ එලගි තෙල් හෝ පෙවිය යුතුය.

පිත්තොන්මාදයට

පලමු කොට විරේක කර විය යුතුය.

ශෙලෙස්මා උන්මාදයට

පලමු කොට වමනය කරවිය යුතුය.

උන්මාද අපස්මාර

1. කශා
වද කහ
වැල් මදට
සිරිල
වෙනිවැල්
පෙරුංකායන්
තිකුළු
පුවඟු
මාරා මුල්
දේවදාරු
තිපල්
කට රොළු
මගුල් කරඳ

මෙකී දේ ශමසේ ගෙන අඹරා ගිතෙල් නැලියකට දිය ශතර නැලියක් එක්කොට ඇඹරු බේත් එහිලා කකාරා වර දැන සිදගත් තෙල වැලඳීමෙන් උන්මාද අපස්මාර නශා.

2. එළු මුත්‍රයෙන් හා එලගිතෙල් හා එක්කොට ශිදගත් ගිතෙල උන්මාද අපස්මාර නශා.

3. උපුල් කොල
තිකුළු
අරළු
සවින්ධව එනු
මුරුංගා අල
වද කසා

මෙකී දෙ පලම පලම ගෙන අඹරා එළු කිරි ශතර නැලියයි එහි එලගි තෙල් නැලියක් එක්කොට කකාරා වර දැන සිද ගත් මේ ගිතෙල නමින් සරශ්වතී නම්වෙයි. නුවන වඩයි. ගිගිරුම් හෙලා කථා කෙරෙයි ගොළු බවද වහාම නශා. අපස්මාර ඇරේ.

4. වැල්මී
වරා
පෙරුංකායන්
ශුධු එනු
වද කශා
උපුල් කොල
තුවරලා

මෙකී දේ එළු මුත්‍රයෙන් අඹරා උන්මාද අපස්මාර දෙකට නස්‍යකරන්න.

5. පිල මුල්
වද කශා
උපුල් කොල

මෙකී දේ අඹරා දැමිත්‍රිය ඉශ්මෙහිලා පරණ එලගිතෙල් එක්කොට තෙල් සිද වලදනු. උන්මාද අපස්මාර නශා.

6. පුශුල් රස භාගයක් ගෙන කකාරා ශතර බාගයට සිඳුවා වැල්මී අඹරා එහිලා ඒ කශාය ශතර බාගයට එලහිතෙල් බාගයක් එක්කොට සිඳ ගත් තෙල් වලදවනු. අපස්මාර නශා.

7. මුරුහා අල
ශුඩු ළූනු
උපුල් කොල
මනෝසීල
කළු දුරු

මෙකී දේ අඹරා එළු මුත්‍ර ශතර භාගයකට තල තෙල් බාගයක් එක්කොට ඇඹරූ බෙහෙත් එහිලා තෙල් සිඳ ඒ තෙල් වලදවනු. අපස්මාර නසා.

ඔල්මාදයට තෙල්

8. කොකටිය අල
සුදු ළූනු
කුරුඹා ඇට
ශවින්ධ ළුනු
අරළු
වැල්මී
මිදෙල්ල මුල්
බුළු
පත්පාඩගම්
කොහොඹ
නෙල්ලි

මෙකී බෙහෙත් කලඳ කලඳ ගෙන අඹරා තෙල් මනාවක් එක්ක කකාරා තබා බඩට කනු. ඔල්මාද පිස්සු විකාර අතිකුක් වැදි ගුණවේ.

9. උන්මාදයට පලමු කොට විරේක කරවිය යුතුය. ශෙලෙස්මා උන්මාදයට පලමු කොට වමනය කරවිය යුතුය.

ඉන් පසු
කශා
සාදික්කා කලං 8
කොරාසානි 3
කොට්ටන් 3
වෙනිවැල්
මිරිස් කලං 1
රසකිඳ පිටි 1
ඉඟුරු 5
චීන අල රාත්තල් 1 යි
කරාබු, වසාවාසී කලං 4
කුරිඤ්ඤම් මුල් 3 ගල් කුරු මුල් 3
සපු මුල් 5
මෙසේ කපා අව්වේලා වනේ කොටා කඩින් පෙරා පිහන් බරණයක ලා බිලාල පාදයක් උණු දියෙන් දෙනු.

දින 20, 30, 15 පමණ බේත් කා පසු දින බෙහෙත් නොකා තල තෙල් ගල්වා උනු දිය නාන්න. දෙහි ඇඹුල් මුසු කෑම නොකන්න. කුෂ්ට, ප්‍රමේහ, අංශබාග, පරංගි ගඩු වන පිලිකා උගුර වනද ගුණවේ.

කාමලයට

සෙඟ මාලේට

1. බැබිල හත් කලඳයි
වැටහිර හත් කලඳයි
අමු ඉඟුරු පතයි
සුදුළූනු දහයක්
කපා දමා අට එකට සිඳුවා මිරිශ්, තිප්පිලි චූර්න කර අරක්කු මූඩියකුත් සමග එහි ලා දෙවේලේ දෙනු. සෝප, හීගතු, වෙවුළුන් සහ සෙංගමාල ගුණවේ.

2. හාතාවාරිය කොල පිටවක්කා කොල මුං
එක පමණ ගෙන අඹරා එල කිරෙන් දිය කොට පෙරා උදය සවස පොවනු. එම රොඩු එම කිරෙන් ඉස ගල්ලනු. තුන් දිත ගිය තැන දිය වක්කරනු.

3. හකුරු කොලඹුවයි තැඹිලි කශ පැන් තුනක දිය ගෙන මීට අමු ඉඟුරු දෙකලදයි, මුන් ඇට පතයි, හකුරු මුලයි, ඔලිඳ කොල තුන් අහුරයි, උප්පැති පතයි, මේ හැම බාජනයක දමා දවසක් ඌරුවෙන්ඩ තිබා පසුවදා ගෙන මිරිකා පෙරා ගෙන එකට කකාරා තුන් දවසක් මෙම කශාය බොනු.

මින් ගුණ : වාත රක්තද, රත්පිත් වායු, ඇවිලිලි, අඩස්සි, පිත්ත ප්‍රමේහ, අත පය රුජාව, ඉශ කර කැවීම්, ශෙන්ගමාල, මෙකී ලෙඩ ගුණවෙයි.

4. දෙසි ඇඹුල් දොඩන් ඇඹුල් උප්පැති මී පැති
ඉඟුරු ඉශ්ම මුගුණුවැන්න ඉෂ්ම කීකිරිදිය ඉෂ්ම
මේවා එක පදමටයි
හකුරු පෙරුන්කායං අරළු ත්‍රස්ථවාළු
සහිඳ ළුනු
මේ හැම එක්කොට මුට්ටියක දමා කඩ මැටි බැඳ නොතමෙන ඉඩමක වලලා පසුවදා උදය ගෙන සතියක් ළුනු ඇඹුල් ඇර වලදනු. පසුව සතියක් දිය වක්කරනු. පිතට සෙංගමාලේට අත්දුටුවයි.

5. පුහුල් මද යුෂ පතයි කොල්ලං කොල යුෂ පතයි
ගිතෙල් ටිකයි මී පැති එච්චරයි
යහුනු යබර සුදුදුරු කළු දුරු
සුදු ළූනු
මෙකී දේ අඹරා එහි යොදා සැලෙක ලා මදක් කකාරා සත් වේලක් දෙනු. ඉක්බිති දිය වක්කරනු.

6. ශාදික්කා කරාබු වසාවාසී වැල්මී
වද කශා වලහ සාල් පත්පාඩගං පෙරුන්කායන්
අරළු නෙල්ලි බුළු සුදුළුනු
මෙකී බෙහෙත් කලඳ කලඳ ගෙන අඹරා දෙහි ශියයක ඇඹුල්
යහුණු අට කලදයි බැබිල මුල් කෝටා ඉශ්ම කලදයි
මෙකී බෙහෙත් නැවුං වලදක දමා උඩිං වශා රෙදි මැටි බැඳ ශඩවසක් හුම්දාන කොට ගෙන වේලකට කොශ් ගොඩුවක් දෙනු, ළුනු ඇඹුල් අත අරිනු.

පිට ගැස්මට

පිට ගැස්මට, අනු පූට්ටුවට

1. කොසඹ තල එඬරු මී තෙල්
මෙකී සම ගෙන

සුදු එනු
වම්මුතු
වද කහා
වලඟ සාල්
හිඟුරු පියලි
දෙදුරු
සාරණ
ත්‍රිපල
සත කුප්ප
පත්පාඩගත්
අසමෝදගත්
වැල්මී
ත්‍රිවගී
අති උඩයත්
ඉඟුරු
තිප්පිලි
කොට්ටත්
උළුවා හාල්
සීනක්කාරත්
උරුලැ සට්ටත්
මේ හැම සමව ගෙන
ඉරිවේරිය
දෙහි
සැවැන්දත
දොඩත්
කුඩු මිරිස්
කුරුඳු
තික
පිල
මෙකී මුල් වේලා චූර්ණ කර තෙල් ලිප තබා මේ දෙවගෙ දමා කකාරා පදමට පෙරා තබා ඇඟ ඉෂ ගානු. කත වක්කරනු. නස්ත කරනු. පිට ගැස්ම, අනු පුට්ටුව හොදවේ.

2. වේලා
කුප්පමේනිය
මුරුංගා
එනු අරණ
මෙකී මුල් ඉෂ්ම හතර තැලියයි,
ඉඟුරු
කළු දුරු
මිරිස්
සුදුදුරු
අබ
අසමෝදගත්
සුදුළූනු
තිප්පිලි
මෙකීවා අඹරා යොදා කශාය කකාරා පොවනු. පිට යන සන්නිය ගුණවෙයි.

3. මීටම තැව්ලි,
එඬරු
දොඩත්
මී පුප්
දොඹ
කුඹුරු
මූනමල්
මෙකී ඇට දොබ, මී පොතු, කුඹුරු මුල් මෙ හැම එකට කොටා පොට්ටනී බැඳ තැව්ලි ලනු. පිට ගැස්ම අනු පූට්ටුව ගුණවෙයි.

4. තල
ජයපාල
හරත්කහ
වල් ඉඟුරු
අබ
මේ හැම සමව තලා සුදුළූනු අඹරා දමා හතර දෙකට කකාරා සවරුවක් බොන්නට දෙනු. පිට ගැස්ම වායු අනු පූට්ටු ගුණවෙයි.

5. බෙලි, මිල්ල
ඇවරි
අන්දර
මිරිස්
ඔලිඳ
මෙකී කොල තන්බා කන්බුල් දෙක තවනු. අනු පූට්ටු ඇරෙයි.

6. තල, හරත්කහ
වල් ඉඟුරු
අබ
ජයපාල
මේ හැම සමව තලා සුදුළූනු අඹරා දමා හතර දෙකට කකාරා සවරුවක් බොන්නට දෙනු. පිට ගැස්ම, වායු අනු පූට්ටු ගුනවෙයි

වාත රෝග

1. අසූවක් වායුවට තෛලය

මුරුංගා
ගඩා දෙහි
දොඩම්
නස්නාරං
නාරං
යකිනාරං
දෙහි
වෙල්ලන්ගිරිය

කුඩු මිරිස
පිල
කටුවැල් බටු
ඉවිල්ල
කුර තම්පලා
රඹුක් මද
පූඩළු
කුප්පමේනිය
පාවට්ටා
මාළුරම්තිය
මා තුග
කොබ්‍යා
බෝ
මල ලබු
අඟුනු
උක්
කෙම්හින්ද
එඬරු

යක් එරබදු
බෙලි
වැටකොළු
කොට කිඹුලා
ඔලිද
කොසඹ
කයිල
ඉඹුල්
තෙළුම්
කප්පර වෙල්ලිය
හික්
උගුරැස්ස
කසා
වලගම්රිස්
තොට්ල
බැල තණ
රතඹලා
හීන් කතුරු මුරුංගා

නික
සිහින් මැඩ හඟු
කරඳ
කීකිරිඳිය
දුනුකේ අරළු
කළු අත්තන
දොඹ
ගිවුළු
යක්බේරිය
නිවිති
වග පුල්
තඹල
පුසුල්
පැහිරිමාං
පතු අල
රටල
වන් ඇපල

එරබදු
බැබිල
හකුරු
මුගුණුවැන්න
පෙතන්
ගැට තුඹ
සාතාවාරිය
තුවර
ඉය
ළුනු අරත
තැල්
අවර කොල
නව හන්දි
දිඹුල්
හීන් තොලබෝ
කුඹුක්
පබළු
සූරිය

මෙකී කොල ඉස්ම මන මනාවයි බුලත් ඉස්ම පතයි

දේවදාරු
සාදික්කා
කටු කරෝහිනි
රැත්ත
ගල් නහර
පැපිලිය
වලහ මිරිස්
වම්මුතු
රිදී තුත්තන්
සැවැන්දරා
මහ වන්මුතු

වදකසා
වසාවාසී
දෙදුරු
පල්මානික්කන්
කොඩොල්
සත කුප්ප
කොකුම්
කොල්ලං
එළ බිජු
සපුමල් කැකුළු
සඳුන්

තිපල්
කරාබු
අසමෝදගන්
සෛන්ධව
සීනක්කාරං
මහ කළුවා
පුස්කර
වෙඩි ළුනු
ඉලවන්ගන්
නාමල්

ඉඟුරු
තිප්පිලි එම මුල්
කොතඹුරු
වලහ සාල්
හින්ගු
අක්ක්‍රා
වැල්මී
උපුල් කොල
ඉරිවේරිය
හිඟුරු පියලි

මෙකී දේ කලඳ කලඳ ගෙන වටා කලතා

කොසඹ තෙල් තල තෙල් කෝන් තෙල්

එඬරු තෙල් මන මනාව ගෙන සමව කලතා මද ගින්නේ තුන් දවසක් කකාරා ලනු නැගෙන පදමට ඊට වඩා කර පාකයට බා පෙරා තබා වායු අසූ අටට ඉස සොදනු. පිතෙන් ගන්නා ලෙඩ හතලිහට පනමක බර බඩට දෙනු. ශ්ලේෂ්මාවෙන් පැමිණෙන ලෙඩ විස්සටම ලැපැත්තේ ගා කොසඹ තෙලෙන් තවනු.

2. වාතයට කසාය.

2-1 රත් නෙටොල් එඬරු මුල් නික මුල් කටු කරඬු මුල්
දේවදාර

මෙකී දේ දොලොස් කලඳට කිරා අට එකට කකාරා එරඬු තෙල් සමඟ දෙනු. සියළු වාත ගුණවේ.

2-2 දේවදාරු   බැබිල මුල්   සිද්ධිගුරු   කටුකරඬු මුල්
මෙයින් තුකාල කශායට ගිතෙල් හා පස්කුළු බඩු එක්කොට වලඳනු. මූල වායු ගුණවේ.

2-3 අබ   වරා මුල්   වද කශා
මෙ හැම අඹරා ගොමුත්‍රා උනු ගන්වා ගා අදිනු. ඇඟ හැම වායු නසා

ගුල්මයට

කුඹුරු කොල උන අළුවෙන් දියකර රෙද්දක රඳා ඇස පිට දමනු. උනු දියෙං මූන සෝදනු.

රුක් අත්තන පොතු   ඉඟුරු   අරළු මිරිස්
මේවා සියඹලා යුසිං අඹරා උනු ගන්වා දුවන පතින රතවලට ගානු.

බාඳුරා ගෙඩි දළු කබලොස්ස දළු දෙසි ඇඹුලෙං අඹරා ගානු. වාදමටයි.

නාසා රක්තයට

සක්කැබිලි ගුරු කැට එක්ව අඹරා ගත් කල්ක වැල්මී කල්ක, තන කිරිං නශ්‍ය කරනු.

දෙළුං මල් යුස ඉත්ත යුස අබ ඇට යුස රතු එනු යුස මෙයිං ලද දෙයක් තන කිරිං නශ්‍ය කරනු. ලේ යනවා නවතී.

ගුල්මයාට අරිසසට

1. වලහ සාල්   තිපල්   තිකුළු   සිවිය
කොතඹුරු   රත් නෙටුල්
මෙකී දේ අඹරා ගිතෙල් බාගයක් එක්කොට තෙල් විතරට එම කිරි ගෙන සිඳගත් තෙල් ගැල්වීමෙන් වාත ගුල්ම නසා.

2. සුවස   යවකර   වද කසා   කුළුරැත
අරළු   රත්තිටුල්   වලහ සාල්
මෙයිං තිකුළු තුං තුං කලඳ ගෙන ගිතෙල් නැලියක් එම කිරි නැලියක් යොදා කකාරා මේ සතර ට සිඳුවා වැලඳීමෙන් වාත ගුල්ම නසා.

3. අරළු දොලොස් කලඳ අට එකට කකාරා සවිඳ එනු ලා වලඳනු. මල බද්ධ ගුල්ම රුජා, ප්ලීහ රෝග අර්සස් නසා.

4. ඇඹුල් මොරුවෙහි අරළු චූර්ණ තුං කලඳක් දමා රැයක් තබා සතතයෙං හුක්තයෙං වලඳනු. අරිශශට ප්‍රශස්තයි.

5. සවිඳ දෙදුරු කතා හිංගු මෝදගං
මේවා සමව චූර්ණ කර ගිතෙලිං අනා පලමු පලමු කන බත් පිට ලා වලඳනු. අග්නි බල වඩා අර්ශස් නසා.

6. රත් නිවුල් මුල් අරළු දැත්ත අල
මෙයිං සතර සතර කලං ගෙන දිය දෙනැලියක් ගෙන කකාරා පතකට සිටුවා බා පෙරා සවිඳ එනු චූර්ණ මදක් එක්කර වලඳනු. විරේක වෙමිං අරිශස් ගුණවේ.

7. හබරල අල මිරිස් ඉඟුරුකතා අරළු
රත් නිවුල් මුල් වල් කිඩාරම් අල
මේවා චූර්ණ කර කලං තුනක් පමණ මොරුවෙන් කලතා වලඳනු. සියළු ගුද කීල සමූහයෝ සෙනක් ගැසූ කලක් මෙං එකිනෙහි නසා.

8. ජයපාල කලදයි පල්මානික්කම් හිඟු සයින්ධව
දෙදුරු හෙළ ලූනු කරාබු වසාවාසී
තිකුළු අරළු
මේ හැම මදට එක එක බර ගෙන මදක් බැද තික වෙල්ලප්පරිත්ති කීකිරිදිය පත් යුෂිං අඹරා යාමය යාමය ක්‍රමයෙන් අඹරා මිරිසට සා ගුලිකර පවන වියලා තිබා බාලයංගෙ විරේකට තන කිරෙන් ගුලියක් දෙනු. මාත්තු සුදු සඳුං පොවනු. ආලේප කරනු.

විරේකට පොල් පැනියෙන් දෙනු. මීට මාත්තු දී කිරි මෝරු බත් දෙනු. මීයෙන් දෙනු. ඊට මාත්තු ගුරුල්ල මද පොල් කිරෙන් දෙනු.

ගුල්මයාට
දළුක් දළු යුසින් පොල් දියෙන් සතියක් දෙනු.

ඇලියාවට
කුඹුරු පත් යුසිං තුන් දිනක්ද සජීවිසට කරවිලපත් යුසිං ඇසඳගානු.
උනට කත්ෂා පත් යුසින්ද
අතීසාර වමනයට ගිතෙලින්ද මීටම දිඹුල් පොතු යුසින්ද
අඩා වායුවට දොඩං ඇඹුලින්ද
ඉලප්පුවට ඉඟුරු යුසින්ද,
වාදමට එඬරු තෙලින්ද,
මුනු කට්ටුවට ඇල් පැනින්ද ඉගිනි ඇටයක් ගලගා ඉන් ගුලියක්ද

බරවා උනට කන්ෂා පත් යුසින්ද,
දත් වැයාට අබින් මුසුව දත මුල තිබීමද
ආමරුජාවට කීකිරිදිය යුසින්ද මැඩිය පොතු යුසින්ද,
හික්කාවට නවුත් කැපිලිත්තක උනු පැන ගහා පොතු යුසින්ද
වමනයට හෙල සඳුන් පොල් කිරි ගහා එයින්ද
බාලයන්ගේ බඩ ලෙඩට හාතාවාරිය මුල දොඩං ඇඹුල සහද එයින් ද බඩ පිට යැමද තද නම් සෝදා හරිනු. ගැනු න්නේ මුත්‍ර කිච්චාවට එල කිර කලතා මද උනුසුං කරද දෙනු.

9. වාත ගුල්මයට
වලඟ සාල් තිපල් තිකුළ සිවිය
කොතඹුරු රත්තිවුල්
යන බෙහෙත් අඹරා එලඟිතෙල් භාගයක් එක්කොට තෙල විචරට කිරි එක්කොට සිඳ ගන්න.

රුජා සහිත වාත ගුල්මයට

10. සුවස ලුණු යවකාර ලුණු වද කහ කුලු රෑන
අරළු රත් නෙවුල් වලඟ සාල් තිකුළ
මෙකී දේ සමග සිඳගත් කසාය දෙනු.

11. අබ එන්සාල් තිකුළ රත්තිවුල්
අසමෝදගම් සවින්දව ලුණු කලු දුරු
මෙකී බෙහෙත් අඹරා ඩෙබර කකාල කෂාය නෙල්ලි කකාල කෂාය කෂායෙහිලා ඇඹරූ බෙහෙත් එහි මෙකී දෙයින් කකාල එලඟිතෙලින් දී කිරි එල කිරි එක්කොට කකාරා සිඳ ගත් ඝෘතය
(අර්සස්, ශ්වාස, ශෝනිත, දෝෂවලටද, හොඳය).

පිත්ත ගුල්ම

12. තිරස්තවාලු වියලා පොඩි කොට සිනි එක්කොට තිපල් කකාල කෂායෙන් දෙන්න.

13. දිඹුල් පොතු නුග පිලිල මී පොතු බෝ පොතු
තිඹිරි පොතු ඩෙබර පොතු මගුල් මාරා කැල
වෙල්ලං කොල ගසේ පොතු අඹ රුක් පොතු
බලු දඹ හැලිදඹ දිය දඹ
යන මෙයින් පොතු ගෙන කකාල කෂාය හතර නැලියකට එලඟිතෙල් නැලියක් එක්ක කකාරා තෙල් පෙරා ගෙන තබා නිති උදය වලඳන්න:

කඵජ ගුල්ම

14. වියලි ඉඟුරු තිප්පිලි මුල් සිවිය රත් නිටුල්
යවකාර ලුණු
පලම බැගින් ගෙන එලගිතෙල් නැලි 1 එල කිරි මනා 1, එක්කොට කකාරා තෙල් සිඳ වලඳනු.

15. සුවස ලුණු රත් නිටුල් පෙරුන්කායන්
චූර්න කර මෝරෙහි කලතා පොවනු.

16. බලල් ලුණු අසමෝදගම් දෙක සම භාග කොට චූර්ණ කර මෝරෙහි කලතා පොවන්න.

රක්ත ගුල්ම

17. සිරිල මගුල් කරඳ බෙලි සුඹුල දේවදාරු
වග පුල්
සියල්ල අඹරා කල්ක ගෙන දමා අලුකොට දිය වත්කොට තබා පසුවදා ගෙන ඇඹරූ බෙහෙත් එහි දිය කොට කලතා පොවනු.

18. උක් හකුරු තිකුලු අඹරා එලගිතෙල් හා පලමු කී දියෙන් පොවනු.

19. කැල දවා අලු ගෙන එහි දිය වත්කොට තබා එදිය පෙරාගෙන එදියෙහි නෙල්ලි තුකාල කෂාය ගෙන වක්කොට පොවනු.

20. යවකාර ලුණු, තිකුලු අඹරා පෙරකී ලෙස පොවනු.

21. බැම්තිරිය සා මුලයෙන් ගෙන සෝදා වනලා කොටා යුෂ මැඩ සතර නැලියක් ගෙන ගිතෙල් නැලියක් එක්කොට මීට කල්කයට කසා
නෙල්ලි තිරස්තවාළු අරළු
මෙකී දෙය සකලද සකලද ගෙන අඹරා තෙලට කලතා මද ගින්නේ කකාරා පදමට බා පෙරා තබා වලඳන කල වචන සුද්ධ වීමද සතියක් වැළඳුව කට හඬ මිහිරිද වේ.
පසලොස් දිනක් වැලඳුව ධාරනවේ. මසක් වැලඳුව පන්ඩිතවේ. ඉන් වැඩිය වැලඳුව දස අට කුෂ්ටයද, ගුදාන්කුර, පන්ච ගුල්ම, ප්‍රමේහ, පන්ච කාස, යන මේ රෝග නසා.

ගැනු අයගේ බඩින් ලේ යනවාට සැරව යනවාටද ගුල්මයටද

22 ගජ තිප්පිලි අති උඩයන් සහිඳ ලුණු පෙරුන්කායන්
උළුවා හාල් වලහ සාල් කොත්තමල්ලි අබ

මිරිස්
එත්සාල්

මේ හැම කලඳ කලඳ ගෙන පස් පැහිරි,

පඹුරු
සිවිය
කුරුදු
මොනර කුඩුම්බිය
හරත් කහ
යක්බේරිය
මිරිස්
තික
හාතාවාරිය
වල්ඉඟුරු
සස්සඳ
එත්සාල්
එලබටු
ඉරමුසු
යකවනස්ස
වරා
ඉරිවේරිය
මුරුංගා

මෙකී දෙ එක් පමණ ගෙන තලා සැලක දමා අට එකට කකාරා ලිප තබා මීට

තස්තාරත්
දොඩත්
සියඹලා
ගොරක

මෙකී ඇඹුල්, උප්පැති, කිතුල් හකුරු, කහවෙයියා, පැති, පොල් හකුරු, සරක්කු යොදා තලප පදමට පිස බානු. මිත් මල බටු ගෙඩියක් පමණ වලඳවා උනු දිය බොනු.

හත් වරුවක් මෙම කායම කනු. එනු ඇඹුල් වලකිනු. පසුව දිය වක්කරනු. මිත් ගුණ ස්ත්‍රීන්ගේ බඩෙ උපදින බඩේ ගෙඩියක් වාගේ පෙරලීමද, සියළු වායුද බඩිත් හැරව යාමද ලේ බින්දුවාටද යහපති.

ගුල්ම පනුවාට

23. දෙල් කිරි පතක් ගෙන සීනටි සාලෙන් කිරිබත පිස කනු. එලගිතෙලින් කීකිරිදිය කොල වත්ගෙඩිය පිට ඉඳ මෝලට පය බා බස්නා ඉර බලා වලදනු. ගුල්ම පනුවෝ තුන් පාටකට වැටෙයි අත් දුටුවයි

හීරැස්ස කායම

හීරැස්ස පළු කායමට බෙත්

24. තාරත් ඇඹුල් පතයි
මුරුත්ගා ඉශ්ම පතයි
සියඹලා පොතු දවා අළු දිය පතයි
මුරුත්ගා මුල් ඉශ්ම පතයි
හීරැස්ස පළු ඉශ්ම පතයි

මේ හැම අප් පල්ලයක දමා

උළු හාල්
සහිඳ එනු
බුළු
ශාරත
අබ
එත්ෂාල්
කරාබු
වද කහ
මිරිස්
තිප්පිලි
පුලිල
පුදුළුනු
ඉඟුරු
අරළු
පෙරුත්කායත්

මේවා මංචාඩි පහ පහ බැගින් කිරා චූර්ණ කර ඉහල කිවු ශොරශ වලට කලවත් කර කායත් පදමට පිශ ගෙන දෙකට බෙදා පගුවකට ජයපාල දමා පාවන පගුව උදේ උදේ හතර වරුවටද පත්තියන් පගුව සවස සවසට තුන් වරුවටද ශේරෝම හත් වරුවට දෙනු. ස්ත්‍රීන්ට අට ගත්තා ගුල්ම අටවද කිළි මාලේටද මල්වර රුජාවටද, අමියා රෝග වලටද යක්ෂ අමියාවටද උදර මහෝදර වලටද දරු අට නොගත්තාවාටද ප්‍රත්‍යක්ෂයි.

පනු කැවිලි වලට

එරබදු කොල අඹරා මීයෙන් පොවනු. හැම පනු කැවිලි ගුණවේ.

හරං කහ මකුළු වැත්ත කැප්පිටියා කොල උඳුපියලිය කොල අඹරා ගානු. කටු පිලිකෙටයි. පොල් හකුරු ඉඟුරු අඹරා තබනු.

සවින්ධව පහයි කරාබු දෙවගේ බරට එක්ෂිය අට ඉඩයක් සෝදාපු වෙඩරු මඩාපිට දමා තුන්දිනක් අඹරා ගටා ඇසලනු. කැසුත් ඇති පනු කැවිලි ගුණවේ. මෙකී දේ සෙප්පුවක තිබා ගානු.

ස්ත්‍රීන්ගේ ගුල්ම රුජාවට

25. කශා කොල තුඹ මුල් අඟුණ මුල් පෙරුන්කායන්
සුදු එනු
මේවා සිනිදුව අඹරා මිරිස් යුශට දිය කර සීනටි ශාලේ කැඳ උයා බොන්නට දෙනු. ස්ත්‍රීන්ගේ බඩේ කැක්කුත් ගුණවේ.

නොයෙක් ගුල්ම වැදියට

26. බෙලි පොතු කුරුඳු පොතු කරල් ශැබෝ
මෙකී දෙය
තල්මල් වරා දරයි දළුක් දරයි පිලිලි දරයි දමා
කුඹුක් පොතු සියඹලා පොතු
මෙකී දෙය පුළුස්සා ගෙන අළුකොට
ත්‍රිකටුක සුදුළූනු දෙවදුරු අසමෝදගන්
බැද පොඩි කොට පලමු කී අළු බාගයක් එක්කොට සවින්දව එනු මිනාවක් විචර දිය කොට අනා අරළු පමණ ගුලි කොට බොන්නට දෙනු.

වාත රුජා ගුල්ම වලට

27. කොතඹුරු අරළු පෙරුන්කායන් නෙළුම්මුල්
සවින්දව එනු යවකර එනු බලල් එනු
මෙකී දේ අඹරා උනු දියෙන් පොවනු. වාත රුජා ගුල්ම ගුනවේ.

28. පෙරුන්කායන් වද කහ යවකර එනු සවින්දඑනු
බලල් එනු
යන මෙකී දේ ගෙන පෙරුන්කායන් දෙබාගයක් වද කශා ශතර බාගයක් උපුල් කොල ශතර බාගයක් මෙම ක්‍රමයෙන් ගෙන මෙකී දේ සුනු කොට උනු පැනින් බොනු.

29. වීයත් දුඹුළු තුන් පතකුත් මිරිශ් පතකුත් චූර්න කර තල් හකුරෙන් අනා අනුභව කරනු.

කෝල වලිප්පු වැදියට

ලුණු පශ්වගේ සිද්ධිගුරු තිප්පිලි මිරිශ්
රත් තෙටුල් තිප්පිලි මුල් සිවිය මුල් දුරු
ශවින්ධව තල් මල් අළු තිත්ත ලබු දළු කශා
රත් තෙටුල් අළු සියඹලා අලු දියකර දිය පෙරා දුරු අඹරා කකාරා දෙනු.

ශද්වශකට ද මරක් ඉශ් ශෝදනු. එනු ඇඹුල් වලකිනු

දිව යටින් දිවක් එනවාට

තික කොලත් එනුත් එක්ක තලා දිව යටිං තිබනු.

31. වැදි ගුල්ම
පිරිමි තල් ගහේ මල් කුරුඳු පොතු තැඹිලි කොලපුවයි
වරා මුල් සියඹලා මුල් කුඹුරු කළු දුරු
අසමෝදගත්
මෙකී දේ වෙන වෙන අළු ගශා අළු ගෙන සවින්ද එනු ශමයේ ගෙන දවසක් එලගිතෙලිං අඹරා බිලාල පාදයක් කනු. දිය බොනු ඉක්බිති කොහොඹ තෙල් එඩරු තෙල් තල තෙල් මේවා එක්කොට තුන් වේලේ දහ අට දවසක් අල්ලනු. නොයෙකුක් වැදි ගුල්ම නසා.

32. දෙළුම් පොතු පහලට උළුප්පා ගෙන අරළු ගෙඩියක් එ මට්ටමට ගෙන දෙළුං පොතු දෙකොටසක් ගෙන අඹරා තුන් පහුවම එක්ක ගුලි කොට තුන් උදයක උනු දියෙන් දෙනු.

33. කරිවිල අලේ ගෙන මී තෙලං බැද වලදනු. ගුල්ම රුජා ශිටී.

34. ආදා මාළු උක් කිරිත් උයා පශ්කුළු බඩු ලා ශීනටි හාලේ බතින් දෙනු.

35. බෙලි මුල් එඩරු මුල් තිප්පිලි මුල් සිවිය
රත් තිටුල් මුල් සිද්ධිගුරු
මේ හැම කකාල කශාය දෙනු. අෂ්ට ගුල්ම රුජා නැතිවේ.

36. කොල්ලු රත් තෙටුල් මුල් තිප්පිලි
මිං කකාල කශායට තල තෙල් වත්කොට වලදනු. අෂ්ට ගුල්ම රුජා නැතිවේ.

37. අරළු සිද්ධිගුරු , කරපිංච කුරු සවිද එනු
මිං කකාල කශාය දෙනු. අෂ්ට ගුල්ම රුජා නශා.

38. තිප්පිලි මුල් සිවිය රත්නෙටුල් මුල් සිද්ධිගුරු
මුරුංගා මුල් කරද මුල්.
මේහැම කකාල කශාය දෙනු. ගුල්ම රුජා ගුණවේ.

39. පැහිච්ච පොල් ගෙඩියක් දිය හැර ඉපුරා වරා කිරි වක්කර සවින්ද එනු දමා මූඩිය වසා ගිත්තේ දමා පිට උතු කටුව ශොදට දහන කල් පුළුශ්ශා තිබා දවසකට දොඩං ගෙඩියක් පමණ වලදනු. ගුල්ම රුජා ගුණවේ.

සියළුම ගුල්ම රුජාවට

40. පෙරුංකායන් සවින්දව එනු ඕංකාරං ජයපාල පතක්
හකුරු කැට දහයක්
මෙකී බෙහෙත් පොල් කුඩු එක්ක අනා පිටටුව උයා ඉශ්ම මිරිකා ටිකක් දෙනු.
ගුල්ම සූල, ගුල්ම රුජා , වායු ,පිත් ,ගුල්ම ,ශෙලෙස්මා ගුල්ම නශා.

41. බත් කා ඉක්බිති අරළු ශූණු දෙකලදයි සිද්ධිගුරු කලදයි සවින්ද එනු කලං බාගයයි අඹරා මෝරුවෙං කලතා පොවනු. කශට දේවල් කනු.

ගුල්මයට

42. වශී වාශී මංචාඩි දෙකයි සාදික්කා මංචාඩි දෙකයි
ගොරක පළු හයයි
පොල් කිරි නැලියක ලා පදමට සිඳ ගෙන බොන්නට දෙනු. ගුල්ම නසා.

පනු ගුල්මයට

43. තිත්ත ලබු වැලයි පොඩි කොට උයා ගටා ගොන්මංකල ගුලිකොට තබා උදය වලදනු. පනු ගුල්ම කහල්ලෙං වැගිරෙත්.

44. සස්සඳ මුල වටා පොල් කිරි ලා තෙල සිඳ තෙල්කා හා තෙල පොවනු. ගුල්ම නශා.

ගුල්ම අරිශශට

45. තිකුළු කෙලින්ද ඇට එකිං එක වඩ වඩා ගෙන මදක් බැද පොඩි කොට තබා ශීනි මුසු කොට දෙනු. ගුල්ම අරිශස් නසා.

46. නික ශා මුලින් ගෙන කොටා පුශ හතර නැලියක් ගෙන එළගිතෙල් නැලියක් එක් කොට කකාරා තෙල පෙරා තබා නිති උදය වළඳනු. සියළු ක්ෂය රෝග නසා.

47. වලහ සාල් තිපල් තිකුළු ශිවිය
කොතඹුරු රත් තෙවුල්
යනු මේ බෙහෙත් අඹරා එළගිතෙල් බාගයකට දිය කර ශතර බාගයක්ම එක්කොට තෙල් විවරට කිරි එක්කොට ශිදගත් මේතෙල් අනුබව කරනු. වාත ගුල්ම නසා.

48. සුවශ එනු යවකරඑනු වද කශා කුළු රැන
අරළු රත් තෙවුල් වලහසාල් තිකුළු
මෙකී බෙහෙත් තුං තුං කලං ගෙන එළගිතෙල් නැලියක් එල කිරි නැලියක් එක්ව ශිදගත් මේ ග්‍රතය වේදනා සහිත වූ වාත ගුල්ම නසයි.

හික්කා, ස්වාශ, පනු පිලිකා, කාශ මෙතෙක් රෝගද නශා.

49. අබ එන්ශාල් තිකුළු රත් තෙවුල්
අශමෝදගත් ශවින්දව එනු කළු දුරු
මෙකී බෙහෙත් අඹරා ඩෙබර කකාල කශාය නෙල්ලි කකාල් කශායෙන් අඹරු බෙහෙත් ලා ගිතෙල් දී කිරි එල කිරි එක්කොට කකාරා ශිද ගත් මේ තෙල් වැලදිමෙන් ගුල්ම රුජාද මලබන්ධනාශයද නොදිරවීමද අරිශස්ශ්වාශ ලෙහි රුජා යන මෙතෙක් රෝග නශා.

මෙකී බෙහෙත් බැඳ ශුනු කොටද උනු දියෙං හෝ දී පෙරලි දියෙං හෝ ඇඹුලෙං හෝ ද බොනු. මෙකී රෝග නශා.

පිත්ත ගුල්මයට

50. ත්‍රස්තවාළු තලා පොඩි කොට ශීනි මුශුව එක්කොට තිපල් කකාල කශායෙං පොවනු.

ශෙලෙස්මා ගුල්මයට

51. සිද්ධිගුරු වග පුල් ශිවිය රත් තෙවුල් මුල්
යව කර එනු
මෙකී බෙහෙත් පලම පලම ගෙන එළගිතෙල් නැලියක් එල කිරි මනාවක් එක්ව කකාරා මේ තෙල ශිද වළඳනු. ග්‍රහනි පාඩු රෝග පලිහෝදර, ස්වාශ, කාශ, උන, උදාවර්ත නශා.

52. සුවඟ එනු, රත් තිවුල්, පෙරුංකායන්, පොඩිකර මෝරෙහි කලතා පොවනු. බඩ ගිනිවේ.

53. රත්න ගුල්ම ඇති ස්ත්‍රීන්ට දශ එකකොළාස් මසක් ඉකුත කොට ඇඟ තෙලිං තෙමා කෙලින්ම විරේක කරවනු.

54. මගුල් කරඳ බෙලි මෙකී සුඹුළු දේවදාරු, වග පුල් මෙකී දෙය අඹරා කල්ක ගෙන තල දවා අළු ගෙන දිය වක්කර තබා පසුවදා පෙරා අඹරා ඇඹරු බෙහෙත් ඒ දියෙහි කලතා පොවනු.

55. ශකුරු ලා තිකුළු අඹරා එළගිතෙල් හාපලමු කී තෙලි දියෙන් පොවනු.

56. කැල දවා අළු ගෙන එහි දිය වක්කොට තබා ඒ දිය පෙරා ඒ දියෙහි නෙල්ලි කකාල කශාය වක්කොට තබා ඒ දිය පොවනු.

මෙයට ගුල්ම ශිල්ව ශැරව වැහේ නම් රත් පිතට බෙහෙත් පොවනු. වාත අදික රුජා පහරී නම් වාත වැදියට පිලියං කරනු

57. තන කිරිනැලියයි විලඳ කුඩු සතර පලමයි මී පැනි එක්කලං ශමාරයි
ශීනි එක්කලං ශමාරයි වලඟ ශාල් තුන්කාලයි එළගිතෙල් ශකලඳයි
එත්ශාල් කලඳයි ශවින්ද එනු කලඳයි
මෙකී දේ එක්කොට බාජනේ ලා බත ගා තබාගෙන පමන දැන උදය අනුබව කරනු.

58. ශුඩුළුනු උක් ශකුරු එක්කොට උදය හවස වලඳනු. ගුල්ම මල බද්ධ බඩ වායු, කැශි මුශ පිත්ත වායු සියළු රෝග ගුණවේ.

59. පෙරුංකායන් ශවිඳ එනු වොංගාරං ජයපාල
පතක් හකුරු කැට දහයක් මෙකී බෙහෙත් පොල් කුඩු එක්ක අනා පිටීටු උයා මිරිකා ගෙන ටිකක් දෙනු. ගුල්ම නසා.

පිත්ත හා රක්ත ගුල්ම

60. විලඳ අමු මුං ඇට බෙලි මුල් සුදුරු
එත්සාල් නෙල්ලි බටු මුල්
ගෙන කුරුම්බා වතුරින් අට එකට කකාරා මී පැනි සමග දෙන්න.

61. පොල් කිරි සීනි ඉඟුරු යුෂ
ලිප තබා කලුපාට වූ පසු ගෙන එම පමණ තිප්පිලි දමා අඹරා ගුලි කර දෙන්න.

මාත්‍රාව - ඇගිලි තුනකට ගත් ප්‍රමාණය.

62. සිරිතේක්කු   අති උඩයං   ගන්ධක   රසදිය
අරළු   තෙල්ලි   සුහු   බුලු
චූර්ණ කර වල්ලාරියා යුසයෙන් (වෙල්ලංගිරිය) ගොටුකොල සුදුළූනු අඹර ගුලිකර අමු ඉඟුරු යුසයෙන් දෙනු.

පිත්ත ගුල්මයට

63. මී පොතු සීනි එක්කොට තිපල්කෂායෙන් දෙනු.

64. මීටම මා තුග පොතු   මී පොතු   බෝ පොතු
තිඹිරි   ඩෙබර   මගුල් මාරා   කැබැල්ල පොතු
තල ගශ පොතු   අඹ පොතු   රත්ත පලොල්
බුළු   බළුදත්   බදිරද
නසින් පොතු ගෙන කොල හා කෂාය හෝ එල නෙළුම්, රත් නෙළුම් ඇඹුල උපුල් මානෙල්,
මෙකී දෙයින් කකාල කසාය හෝ 'ගෙන නසායසතර නැලියකට එළගිතෙල් නැලියක් එක්ක කකාරා පෙ. රාගෙන තබා නිති උදය පොවනු. පිත්ත ගුල්ම නසා.

සෙලෙස්මා ගුල්මයට

65. සිද්ධිගුරු   වගපුල්   සිවිය   රත්නිටුල්
යවකාර එනු
මෙකී බෙහෙත් පලම පලම ගෙන එළගිතෙල් නැලියක් එල කිරි මනාවක් එක්කොට කකාරා තෙල් සිඳ වලදනු.

66. වලග සාල්   තිපල   තිකුළු   සිවිය
කොතඹුරු   රත් නිටුල්
මෙ බෙහෙත් අඹරා එළගිතෙල් බාගයක් තෙල විතරට කිරිත් එක්කොට සිදගත් මෙ තෙල්වතගුල්ම නසා.

67. සුවස එනු   යවකාර එනු   වද කසා   කුළුරැන
අරළු   රත්නිටුල්   වලහසාල්   තිකුළු
මෙකී බේත් තුන් තුන් කලද ගෙන එළගිතෙල් නැලියක් එක් කොට සිඳ ගත් මෙ සෘතය ගුල්ම නසා.

වාත රෝග

වාත කෂාය කියනු ලැබේ.

1. රත් නෙටොල් එඬරු මුල් නික මුල් කටු කරඬු මුල්
දේවදාර
මෙකී දේ දොලොස් කලඳට කිරා අට එකට සකාරා එරඬු තෙල් සමග දෙනු. සියළු වාත ගුණවේ.

2. දේවදාර අරළු වේලා මුල් සුදුළූනු
ශාරණ මුල් රත්තෙටුල් මුල්
මේවා සමව කිරා අට එකට සකාරා තල තෙල් මිශ්‍රව දෙනු.

3. දේවදාරු බැබිල මුල් සිද්ධිගුරු කටුකරඬු මුල්
මෙයින් සකාල කශායට ගිතෙල් හා පශ්කුළු බඩු එක්කොට වලදනු. සූලයට, වණ මූලවායු ගුණවේ.

4. අබ වරා මුල් වද කශා
මේ හැම අඹරා ගොමූත්‍ර උනු ගන්තා ගා අදිනු.

5. අශමෝදගන් පෙරුංකායන් යව කර එනු ශවින්දව එනු
අරළු
යන මෙකී දේ අඹරා රායෙන් පොවනු.

6. අරළු ශාරණ මුල් සිද්ධිගුරු කලාඳුරු අල
දේවදාරු
මෙයින් සකාල කශාය දෙනු. ඉදිමුන්, පාඩු රෝග, බගන්දරා ගුණවේ. සන්දි ඉදිමුන්, ශූල ගුණ වේ.

7. සුදුළූනු. දේවදාරු ශාරන මුල් සිද්ධිගුරු
මෙයින් සකාල කෂාය දෙනු.

8. ශාරණ මුල් කොහොඹ කුරු දුම්මැල්ල සිද්ධිගුරු
කටුකරෝහනි අරළු මුරුවා රසකිඳ
මින් සකාල කෂාය දෙනු. ඉදිමුන්, කැශි, බඩ රුජා, උදර වෑදි ගුණවේ.

9. කොල්ළු සුදුළූනු සිද්ධිගුරු අරළු
අමුක්කරා
සමසේ දොලොස් කලඳක් ගෙන දිය අටපත එකට සකාරා සිඳුවා පෙරා
මිරිස් තිප්පිලි යවකාර එනු
චූර්න එහි කලතා පොවනු. වායුවටයි.

10 එල එඬුරු ඇට දළුක් පොතු පොල් කුඩු වෙත වෙතම කොටා පලමු කුඩු අතුට අතික් බෙත් ඊ පිටට දළුක් පොතු මතුපිට අතුට පොට්ටනි බැඳ කඩ පිත්තේ කම්බා තවනු. වායුවටයි.

11. දොඩම්ඇටයි දොඹ එඬරු කොසඹ
මුතමල් කුඹුරු පොල් සුනු මඟුල් කරඳ
කපු මුරුඟා කතුරු මී
මෙකී ඇට ගෙන තැවත පොතු ගෙන කොටා පොට්ටනි බැඳ ඇඟේ ගා කඩපිත්තේ උයා තවනු. වායු ගුණවේ.

12. තල මදක් බැද අමුක්කරා මුල් එක්කොට එලකිරෙන් අඹරා ගා අදිනු. ශෝනිත වායු ගුණවේ.

13. පූඩළුවන් කවා ලේ හැර සියඹරා කොල හාල් පානුවෙන් තඹා බඳිනු.

සන්දි ඉදිමුන්වලට

1. අරළු රත්නිටුල් මුල් කොට්ටම් පිල මුල්
සිද්ධිගුරු
සමසේ දොලොස් කලඳක් ගෙන අට එකට කකාරා දෙනු.

අරිසස්

1. අබ කරල් සැබෝ මුල් තිරත්තවාළු
සමභාගින් මේ හැම බරට රත්කරල් ඇටයි අඹරා අරිසස් ගඩුවේ ගානු. ගුණවේ.

2. මුදු පෙත සුදුළුනු දළුක් කිරිත් අඹරා ගානු.

3. දැත්ත තිප්පිලි මී තුග තියහලා අල
වේලා චූර්ණ කොට දුම්පානු

වාත රෝග

14. බැබිලි මුල් එඬරු මුල් කටු කරඬු මුල් බෙලි මුල්
සිද්ධිගුරු දේවදාර සවින්ද ළුනු
මේ හැම කකාල කෂාය දෙනු. වායු ගුණවේ.

15. ඊටම
කුඹුරු මුල් තිකුළු මුල් රත්නෙටුල් මුල් එනුවරණ මුල්
කොල්ලු සිද්ධිගුරු කකාල කෂාය දෙනු.

16. කටු කරඬු
වං ඇපල
බැබිල
සාරණ
කොතඹුරු
අරළු
වැල් කසඹිලියා
ඉවද
ගිරිතිල්ල
වගපුල්
වද කහ
ඇහැල
වම්මුතු
සිවිය
රසකිඳ
දෙබටු
සතකුප්ප
අමුක්කරා
එඬරු
හාතාවාරිය
හිඟුරු පියලි
දේවදාර
සිද්ධිගුරු
ගොකටු

සමව ගෙන ඊට තුන් ගුණයක් අරත්ත ගෙන 8/1 ට කකාරා ප්‍රතිවාප පිණිස අරත්ත සුනු හෝ මුඩ මහත චූර්ණ හෝ අසමෝදගම් චූර්ණ හෝ වියලි ඉඟුරු චූර්ණ සමග දෙනු.

17. අරත්ත අල
හීන් ගොකටු
ඉඟුරු පියලි
ගුගුල්

සමව චූර්ණ කර බෙහෙත් බරට දෙබරක් ගිතෙල් සමග වට තනා උදය සවස වලඳනු. බෙහෙත් වැලඳු පසු කොල්ලු කෂාය බොන්න.

18. බැබිල මුල් 64 පලමක් ගෙන කපා පොඩිකොට දිය දස නැලියක් වත්කොට සත් දවසක් ගිනිදී සතර නැලියක් වූ කල බා පෙරා තල තෙල් නැලියක් වත්කොට බැබිල මුලේ පොතු පලමක් අඹරා එහි ලා දෙදවසක් කකාරා 3 වන දින බහාකල කල්ක බොර එසේ නැවත පදමට බා පෙරා ඇඟ ගල්වන්න. රුජා ගුණවෙයි.

19. වා කිපීමෙන් වූ
ඉක්කාවට
කකුළු සුන්
අරළු
සිරිතේක්කු
කටුවැල්බටු
තිප්පිලි
සවින්දව ලුණු
සිද්ධිගුරු

මේ හැම සුනු කොට උනු දියෙන් දෙනු. ඉක්කා නසා.

පිටට වැටුනු මූලයට
හීරැස්ස අල කැකුළු සාල් මේ දෙවගේ එක පමණ ගෙන සොද රහට අඹරා දෙහි ගෙඩි පමණ ගුලිකොට රොටිය තනා තල තෙලින් බැඳ දෙවේලේ වලඳවනු. පිටට වැටුනු මූලය බඩට වේ.

20. ඉක්කා වමන අරුචියට
විලඳ
සුදුදුරු
සකීරා
තිකුළු
උක් සකුරු
මී පැනි

මෙකී දේ චූර්ණ කොට නස්නාරං ඇඹුලෙන් අනා ලේහ පදමට රැගෙන දෙනු. සියළු වමනේ අරුචි නසා.

21. ඉක්කාවට
කීකිරිඳිය කළු දුරු අඹරා පොට්ටනිය බැඳ හක්කේ තබා කෙල ගිලිනු.

22. සුදු සඳුන් අඹරා තන කිරෙන් නශ්‍ය කරනු.

23. බුලත් මුල් සඳුන් දෙවගේ ඇල් දියෙන් අඹරා පොවනු. ඉක්කා සිටී.

24. ජල සන්තියට ඇඟ ගැහෙනවාට
යකිනාරත් පොතු
එනු වරන පොතු මී පොතු
කොටා පොට්ටනි බැඳ තවනු

25. තිත්ත ලබු වැලක් කපා පෙති ගසා ශැලියක ලා දිය වත්කොට කඩ පිත්ම බැඳ අලුත් එල ගොම පොට්ටනි දෙකක් කඩපිත්ම පිට තබා ඉඳුනුකල තවනු.

26. සීල් බත් තිවෙන්ඩ තබා දෙසි ඇඹුල් වක්කොට කැටි දී කිරි හා උයා දිය පෙරා මැල්ල කොල දලූ, ඉස්මයි කහ ඉස්මයි.

මෙකී ඉස්මෙන් බත් අඹරා තබා පතක් පිටගැටවිලි කැට ගෙන දොඩම් ඇඹුලෙන් අඹරා පලමු කොට බඩ ගා ඊ පිට ඇඹරු බේත් ගානු. ඉදිමුත් බසී.

27. බූටා කොලයි   වෙල් මදුරු කොලයි
බුත් සරණ කොලයි පොතුයි ද
දෙඩම ගස කොල, පොතු, සීන් දෙසි කොලයි, පොතුයි, නත්නාරම් කොලයි, පොතුයි,
මෙකී බේත් කොටා මලවා බදිනු.

28. සැවැන්දර මුල් එම අල කෙම්හිඳ කොලයි, පොතුයි, කුඩු මිරිස පොතුයි, රේරු කොලයි, පොතුයි, මේ බේත් පියා ගස පොතු ඉස්මෙන් එනු කසා ලා කොටා මලවා බදිනු.

ඇලියාවට

1. දළුක් කිරි ශීනුක් කිරි පතුක් කිරි මේ කිරි ශමව ගෙන පොල් ගෙඩියක් දිය හැර කිරි පුරවා තිකුළු සුනු එහි ලා මූඩිය ගශා මැටි බැඳ මැවේ පුටයෙන් ගිනිකර පොල් උතු කළු වූ තැන කිරි සිඳුනාම ගෙන පොල් තිපල් සුනු ශතර බාගයකට ශුඩු එැනු තුන් බාගයක් පෙරුංකායත්, ශව්න්ද එනු, දෙබාගයක් විස හැරී ජයපාල ශතර බාග යක් තිකුළු සුනු තුං බාගයක් මෙකී බෙහෙත් හා පලමු කී පොල් එක්ව අඹරා ශුරකිව තබා මින් මංචාඩියක බර එලහිතෙලන් හෝ ශකුරෙන් හෝ දී ශොදින් පානය කරනු.

2. කෙන්හිඳ   එඩරු   පතුක්   තික
දිය පරඩලා   ඔම්රිස්   මල මිරිස්
මෙකී කොල ලුනු කශා සුදුඑැනු කොටා මලවා එඩරු තෙල් මී තෙල් ගා බඩේ බදිනු. සියලු ඇලියාවට යහපති.

3. අබ සුදුළූනු දුම්මල
මෙකී දේ මී අකුරෙං ආකුරයා ඇඟට ගශනු.

4. අබ තෙල් තිකුළ ශූනු එඬරු තෙල්
එක්ව ඇතුලත දෙනු. ඕනමෝ මෙං ග්‍රස්ව මේ මන්ත්‍රය එඬරු තෙලෙට දමා මතුරනු. බඩ ගානු.

5. පෙරුංකායන් දුම්මල තෙල් උතු අඟුරෙං බඩට ධූං පානු. ධූමරිං ඇලියා වැටේ.

6. කරල් සැබෝ අශුරක් එනු මිටක් එක්ව බැඳ චූර්න කර අළුත් එඬරු තෙල් කුලුඩුල්ලක් චූර්න බිලාල පාදයක් ලා ලේහ කරනු.

7. ඕන්නමෝ ගංශැට දේවතාවා තායති ගබ්ගම හති එස්වාහ
මෙම මතුරෙන් එඬරු තෙල් කොහොඹ තෙල් මතුට බඩ ගල්වා මිරිශ් කොහොඹ කොල යක වනස්ස මෙකීදෙ මිල්ල අඟුරෙන් බඩට ධූං ගස්සනු. ඇලියා වැටේ.

8. ශොඩල අන්දර කවෙලු රුවල් තෝර
ගැට තුඹ
මෙයින් කොල හා තිකුළ, කශා අබ, එනු ලා කොටා මලවා බඩ තෙල් ගා උඳය ගිතෙල් කුල්ඩුල්ලකට, තිකුළ සුනු බිලාල පාදයක් ලා අත් ලිප තබා පැශෙන පදමට ඇඟිලි තුන ඇත තුන් බින්දුවක් එලා බා නිවා ලේහ කරනු. තද ඇලියා වැටේ.

9. අශ් බෙටි ඇත් බෙටි කළු දැයා බෙටි අබ
කශා එනු ලා කොටා මලවා බඩ, මී තෙල් හෝ එඬරු තෙල් හෝ ගා බේත් බැඳ උයා තැඹිලි කශ පැන් දිය, අළුත් එඬරු තෙල් කුළුඩුල්ලක්, තිකුළ ශූනු බාගයක් අඹරා එහි තලතා පොවනු. උස්නධූමපානය කරනු. සියළු ඇලියා වැටේ.

10. කුරුඬ දවුල තීක කුඹුරු පොතු
වද කශා මුල හා පෙර කී පොතුද හා වල් වඩුරා කුඩු මිරිස මෙකී කොල, පොතු හා මෙකී දේ ගෙන
මී මුරුවට එඬරු ඇට තල අප
කශා එනු සුදු ළූනු වියං ධුඹුළ
දුම්මල මුරුංගා පොතු
මෙකී දේ ගෙන කොටා මලවා පශ්තෙල් ගා බෙහෙත් තුං රැයක් බදිනු. සියළු ඇලියා වැටේ.

කටුකරඬු මුල් 64 පලමක් ගෙන කපා පොඩි කොට සැලකලා දිය වක්කොට 11.මද ගිනි ලා කකාරා සත් දවසින් හතර නැලියක් සුනු කල පෙරාගෙන තල තෙල් නැලියක් එම මුල් පොතු පලමක් අඹරා දමා දෙදවසක් මදක් මැශිනිකොට කකාරා කල්ක ඉටි පදමට බා පෙරා එහි හකුරු අට පලමක් ලා කඩ වසා බැඳ වීයට සතියක් තබාගෙන වලදනු. ඇඟ ගානු.

12. කටු කරඩු සහ මුල හැට හතර පලමක් ගෙන කපා පොඩි කොට කාල් කෝත්තුවෙන් දිය දසයක් වක්කොට මද මද ගිනි කොට පස් දවසක් හෝ සත් දවසක් ගිය කල දිය හතරනැලියක් වූ කල පෙරා එපමනට එලු කිරි ගෙන (හෝ එල කිරි) තල තෙල් නැලියක් එහි වත්කොට

කල්කයට
වැල්මී
එන්සාල්
අසමෝදගම්
වග පුල් මුල්
අමුක්කරා
කලාදුරු අල
දේවදාර
කුරුඳු පොතු
වග පුල්
හෙල සඳුන්
නෙලුම් කොල
තිකුලු
සතකුප්ප
දිවෝ සබිය
ඉරමුසු මුල්
සිද්ධිගුරු
පෙරුත්කායත්
සෛනධව
ජටාමාංස
අගිල්
මෙකී බෙහෙත් එක් කලන් හාගයක් බැගින් ගෙන අඹරා කෂායෙහි එක්කොට මදින් මදින් ගිනි කොට කල්ක බඳුන් නොඇලෙන පදමට හැඳි ගා කකාරා දෙදවසක් ගිය කල බාගන්න. පිට ගැමට.

13. කේසර බැබිල සහ මුල පලම් 100 ජලය නැලි 24 දින 3 දී 4 නැලියට සිඳ බා පෙරා ඊට තල තෙල් නැලි 1
කල්ක -
දිවෝසබිය
දේවදාර
උපුල් කොල
වැල් මදට
සුදුසඳුන්
සත කුප්ප
අඹරා දමා දින 3 දී කරපාකයට තෙල් බා පෙරා ගන්න. පාන, අභ්‍යංග, ශිරෝධාරා

14. මූන මල් ඇට
අබ
පොල් කුඩු
මගුල් කරඳ ඇට
එඩරු ඇට
යවකාර ලුණු
කුඹුරු ඇට මද
දොඹ ඇට
බලල් ලුණු
තලා
මී ඇට
සහිඳ ලුණු
මෙකී බෙහෙත් කොටා ලද තෙලකින් අනා පොට්ටනි 2 ක් බැඳ තබා ශලක කාඩි දිය වක්කොට තොට්ල කොල බේත් එරඩු කොල තික කොල තිත්ත ලබු කොල මෙකී බෙහෙත් ශලක ලා කඩ බැඳ පොට්ටනි එහි තබා කකියවා පලමු ඇඟ තෙල් ගල්වා දෙතුන් පැයක් තබා ඉක්බිති කකාල බෙහෙත් දියෙන් නාවනු. තවනු.

15. එඩරු මුල්
බැබිල මුල්
කටු කරඩු මුල්
තල, පරෙයි මුල්
මෙකී මුලින් ලද දෙයක් ගෙන කකාරා දිය පෙරා ගෙන උලුවා, සුදුලූනු, කුරුඳු එල කිරි සීනටි හාල් එක්ව කැඳ පිස තබා නාවා ඉක්බිති ඇඟ දිය නොසිදෙන තෙක් බඩ පුරා කැඳ පොවා මේ ලෙස සතියක්, තුන් සතියක් කරනු.

16. සුදුලූනු
තිපල්
රත් තිටුල්
කොල්ලු
සාරණ මුල්
මුරුංගා අල
දැත්ත අල
මෙකී දැ පලම පලම ගෙන දිය අට නැලියක් වක් කොට දෙනැලියකට සිඳුවා කකාරා පෙරා ගෙන එරඩු තෙල් මනාවක් වක්කොට

කල්කයට :-

සුදුළූනු සහිඳ ලුණු
දේවදාර සිද්ධිගුරු රත්තිටුල් මුල් තිරස්සවාලු
පෙරුංකායන් වද කහ වග පුල් මිරිස්
කලං 1 බැගින් ගෙන අඹරා දිය කොට කකාරා ඉටිපදමට බා පෙරා ගන්න
මාත්‍රාව කලං 1

ශෙලෙස්මා වාත දෙකිංවන විකාරෙට

බ්‍රහවාදී චූණීය

පෙරුංකායන් පලමයි දිය මිත්ත තෙලිඹු දැලි
ශිඟුරු පියලි වද කශා සිද්ධිගුරු වග පුල්
මිරිස් අබ කොත්තමල්ලි
මේ හැම තුං තුං කලං ගෙන
යවකර එනු අමුක්‍රා ශුවස එනු බලල් එනු
ශවින්දව එනු රෝම එනු
මෙකී දෙය පලම පලමය ඇඹුල් වේ මුල් සුදුඑනු දෙපලම දෙපලමය සියඹරා
මඩ ශතර පලමයි නත්නාරං ඇඹුල් පලමයි
මෙකී දෙය පොඩි කරන්නට සුදුසු බෙහෙත් මදක් බැද පොඩි කොට කඩකින් පෙරා තබා ගෙන සියඹරා මඩ ගා නත්නාරං ඇඹුලෙන් අනා ගෙන මෙයින් තුං තුං කලං ගෙන පලමු බත් පිඩි දෙකක් තනා අනුබව කරනු. උනු පැන් බොනු. පසුව නොයෙක් මාළුවෙන් බත් අනුබව කරනු. බොනකල නිරන්තරයේ මෙයිං තුං තුං කලද ගෙන උනු පැනට කලතා බොනු.
ශතියක් දෙශතියක් මංඩලයක් වාදි සංශිදෙන තෙක් කරනු.

ශෙලෙශ්මා වාත දෙකිං වණ විකාරද දැලයෙහි හෘදයෙහි වස්තියෙහි රුජා අරුචි පාඩු රෝගද කාශ ස්වාශ, ගුල්ම, මූත්‍රා, ක්‍රිමි, ග්‍රහනි දෝශ මල මාගී රුජා හික්කා ක්‍රිමි මෙකී රෝග නසා.

වග පුල් සිද්ධිගුරු යවකාර එනු අරළු
මෙකී බෙහෙත් ශමසේ ගෙන චූර්ණ කොට ගිතෙලිං අනා ලේහ කරනු. වාතයෙං වූ කැසි ශ්වාස නසා.

සාහචූර්ණය

ශවින්දව යවකාර මෙකී එනු
අසමෝදගං වග පුල් රත් නෙටුල් ශිද්ධිගුරු
පෙරුංකායන් වලහ සාල්
ශම බාග ගෙන චූර්න කොට ගිතෙලින් අනා බත් වැළදුව අජීර්න වාත, ගුද රෝග, ගුල්ම, විශුචිකා, පාංඩු රෝග, පිත් ශෙලෙස්මා මෙකී දෙය යුහුව නැතිවේ.

කොත්තමල්ලි　දෙළුං ගෙඩිවල පොතු　රසදිය, කශා
අරළු　සුදුදුරු　ශවින්ධව එනු　යවකාර
මිරිස්　තිප්පිලි
ශමබාග ගෙන නක්නාරං ඇඹුලෙන් අඹරා කුඩුකර දී කිරි මෝරුවෙන් උනු දියෙන් දෙනු. ශෙලෙස්මා ගුණවේ.

පුපුල පොතු　හික් පොතු　කහට පොතු
මේවා කොටා තිබා "ඕං ශ්‍රිකං කාල් කාළුම් එළු හරි කාලි අට්ටා මාමා පෙරිය වානේ දේව ඕඩිවා දිෂ්ටි වා" මේ දැහැනෙන් හත්වරක් මතුරා කත්ඩ දෙනු. තිත්තරස නම් බතට තල විනයි. පැති රස නම් රස ජාතියකට විත කර දුන්නාය.

කහට රස නම් බුලතටයි පිටි රස නම් පලා ජාතියකි මල් රසනම් එක් බුලත්, තෙල් රස නම් බැදුමට කල විනයයි. කිරි රස නම් බලා කියනු.

"ඕං උරි ක්කුට්ටි තිලධි පෙරිය වානේ ගිති ගිති පුල පුල ගිති බුඩි යකෂනී උම්මා වර වර විනයෙල දූම් එසවාහ." මෙයින් සාත්තු කරනු.

වාදමට

තික කොල　දළුක්　හීරැස්ස පළු
කහ එනු ලා මලවා බදිනු.

මීට
ගැට තිවුල් කොල මෙම ලෙස මැල්ලුම් බදිනු.

මීට
දළුක් පළු හීරැස්ස පළු පොල් එනු ලා කොටා මලවා කාඩි දිය දන ඉස ගා මැල්ලුම බදිනු. වාදත් නසයි.

මීට තෙලට
දළුක්, මුව කීරිය, වරා කොල යුස්ට එල මුත්‍රා එළු මුත්‍රා රැගෙන ලිප තිබා තල තෙල් ලා මිරිස්, මෝදක, ඉඟුරු, රත් නෙවුල්, කල්ක ලා පදමට සිද තබා ගානු. වාදත් කෝෂ්ටුකශීෂීත්, වායුත් නසයි.

මීටම,
ඇසල මුල්　කරපිංච　හීරැස්ස මුල්　සාරත
තිපල් සමග කසාය දෙනු. සියළු සෝප ගුණවෙයි.

මීටම,
මිරිස් මුල්　බෙලි　හීරැස්ස　සාරණ

දැත්ත අරළු
මේවා පලමක් සිද සවිඳ පොඩි ලා බොනු. ඉදිමුත් කෙවුත් ගුණවෙයි.

මීටම,
තිපල් සාරණ මුරුවා ඉඟුරු
සවිඳ කළු දුරු රත් නෙටුල් තිප්පිලි
වියලි කසා සිද
මීපැනිත්, බොනු. වාත කෝප පාඩු බරවා ගුණවේ.

සියළු වාත

අරළු බුළු ඉඟුරු සවින්දව
චූර්ණ කර උක් හකුරු දෙනු. සම්‍යක් විරේකයි. සියලු වාත නාසී.

ඇසල කසඹිලියා බැබිල කැසි පිය්සං මුල්
ඉඟුරු කලාදුරු කොත්තමල්ලි
කසාය කර දෙනු. බඩ දරුවන් අයගේ උන ඉදිමුන් කැසි කාස බඩ යනවා හිටී.

වැල් කෂඹිලියා බැබිල දිය මිත්ත අරළු
නෙල්ලි ඉඟුරු කලාදුරු
මින් කකාල කසායට ගර්භනියින්ගේ අතීසාර සිටී.

සාරණ ඉඟුරු කසාය එල කිරෙන් දෙනු. ඉදිමුන් ගුණවේ.

ඔලිඳ ශැවැන්දත විලඳ මේ කසායට වමන හිටී.

බෙලි බැබිල කසාය එල කිරෙං දෙනු. ඉක්කා නසයි.

සාරණ මුල් කසාය ගිතෙල් සීනි සමග දෙනු. සෝප ගුණවේ.

අමු ඉඟුරු කසාය තිප්පිලි පොඩි ලා එල කිරෙං දෙනු. සෝප නසයි.

වග පුල්, සුදු එනු, අත් සුනු, චූර්ණය උෟරු තෙලෙන් දෙනු. ගර්භනීන්ගේ උකු
කලවය ලෙහි රුජා නසයි.

මීට
අතීසාරයට
අති විඩයක් උනු කල පැන් දෙනු.

බැබිල ශැවැන්දත් ඉරමුසු ඉරිවේරිය
මාතෙල් අල
කසායෙන් එල කිරෙං දෙනු. ගර්භනීන්ගේ මාලේ සිටි.

තල මල් තිත්ත ලබුවැල් වේලි කසා රත් නෙවුල් මුල්
සියඹලා සුඹුළු රත්තම්පලා මුල් රත් කැල පොතු
මේවා කබලෙං පුළුස්සා අළු පලමක් ගෙන කඩ පොට්ටනි බැඳ දිය අට පතක් ලා එකට සිඳුවා සෙන්කලනෙරිකොට්ටන් පොඩි ලා පොවනු.

මිත් ගුණ –රත්ත ගුල්ම, කිලි නෙවෙන වාතද ජල කුම්භ වාත උදර ගුල්ම අෂ්ටිල වාත ගුණවේ.

මාලේට

1. කීකිරිදිය යුස තල තෙලෙන් දෙනු. දෙහි ඇඹුලෙන් දෙනු.

2. දඩ කෙහෙල් ගහේ උඩ තිබෙන පෙති බාගෙ කොල සමග හීනෙටි පිටි කොටා පිට්වු උයා දෙනු.

ඇවිලිල්ලට

1. වැල්මී කසඹිලියා ශැවැන්දන ඉරිවේරිය
   වත් ඇපල වම්මුතු
   මෙකී මුල් පුෂ්ප හදුන් ඉඟුරු මේ හැම අට එකට කකාරා දෙනු. කෝල උන ගිතියක් ඇවිලිල්ලට අත් අත්දුටුවයි.

2. මුරුගා ඉඟුරු මිරිස් අබ
   වේලා කොල
   මේහැම සමබාග ගෙන දොඩන් ඇඹුලෙන් පැශවා ඇවිලිල්ල ඇති තැන ගානු. ගුණවෙයි.

3. ඉඟුරු මුරුංගා මුල් පොතු ලුණුවරණ මුල්
   මිරිස් මුල් සුදුළූනු උලුවා පෙරුංකායම්
   කුඹුරු ඇට මද
   මේවා කලං3 බැගින් 8/1 ට කකාරා දෙනු.

අර්ධිතයට

1 කිහිරි තිප්පිලි මුල් සිහින් ගොකටු වැල්මී
මේ හැම සමභාගගෙන කෂාය කකාරා

සිව්ය වලහ සාල් ඇත්දෙමට කරාබු
යන මෙයින් කල්ක යොදා තල තෙල් යුතුකොට අර්ධිත රුජාවෙහි නාශ්‍ය කරන්නේය

2. දසමුල් කසායට අඩ බාගයක් ස්වරස එල කිරි සහිත කොට කකාරා පතට සිටි කල දෙනු. හෘද් රෝග ව්‍යාධි එසේම අර්ධිත නසන්නේය.

3. උඳු බැබිල දළු කපු ඇට
වෙන වෙන දස පලං බැගින් ගෙන දිය නැළි දහසයක ලා කකාරා සතර නැලියට සිඳුවා විදිලෙස කල්කයට සිටුවා ගන්නා ලද
තිකුළු හෙල ලුහුනු රත්නෙටුල් සාරණ
කටුකරෝසන පස් ලුණු
මේහැම සිනිඳුව සුනුකර අඹරා පොල්කිරි සමග මද ගින්නේ කකාරා ගත් මේ තෙල මනා වයඃ ඇතිවේ. පක්ෂඝාත වායු නසා සියළු වාත තරණයට උතුම් වේ. අවබාහුක වාතය නසන්නේය.

4. කපු ඇට බැබිල උඳු කොල්ලු
එසේම දසමුල් වෙන වෙනම නැලි හෙවත් දස පලන්ද සපලන්ද බැගින් ගෙන කපා කොටා දිය දෝන සතරක ලා එක දෝනයකට සිටුවා කකාරා ඇඹුල් කාඩි නැලි සතරක් සුදුළුනු, උක් සකුරු, එක්කොට උදය සවස කනු ගුල්ම, මල බද්ධ, වායු, කැසි මුස, ගුණවේ.

5. එල බටු මුල් තිබ්බටු මුල් එරඬු මුල් පොල් පලා මුල්
මිරිස් ඉඟුරු වගපුල් සමසේ දොලොස් කලදක්
ගෙන අට එකට කකාරා පෙරා සිඳ
ලුණු පෙරුංකායන් යවකාර ලුණු
පොඩි කොට එලගිතෙල් තුන් කලදක් සමග එහි කලතා දෙනු. උදර වායු, අණ්ඩ වායු, පාශ්ව වායු ගුණවේ. ප්‍රත්‍යක්ෂයි.

6. තෙල්ලි ඉඟුරු සුදුළුනු එරඬු මුල්
අමුක්කරා මුල්
මෙකී දේ කලද බැගින් ගෙන අට එකට කකාරා
තිප්පිලි, යවකාර ලුණු, පොඩි කොට දමා දෙනු. සියළු වායුවටයි

7. අරළු සුදුළුනු එරඬු මුල් කොල්ලු
තිකුළු වැල්මී සිද්ධිගුරු හිරැස්ස පලු
මෙකී දේ සමව කලදක් ගෙන අට එකට කසාය කර දෙනු. සියළු වායුවටයි.

8. මේ සියල්ල චූර්න කොට චූර්ණ මාත්‍රාවෙන් ගෙන උණු දියෙන් දෙනු. විරේක වේ. උදර වායු ගුණවේ.

9. වීයලි කහ	සිද්ධිගුරු	පෙරුංකායන්	තිප්පිලි
මුරුංගා පොතු	කුඹුරු ඇට	එරඬු මුල්	දැත්ත මුල්
තිරස්තවාළු			

මෙකී දේ සමභාගව ගෙන එරඬු තෙල් තල තෙල් සමව ගෙන කෂාය ලිප තබා තෙල් වක්කොට කකාරා පදමට බා පෙරාගෙන උදය සවස කොස්කොල ගොටුවට දමා දෙනු. සතියකින් බඩේ වායු සියළු රෝග ගුණවේ.

10. බැබිල මුල් සියක් පලමයි අරත්ත දස පලමයි රසකිඳ විසි පලමයි මේ හැම කොටා දිය දෝන සතරකලා චතුර්ථාරාවශේෂ කොට කකාරා ගෙන ඒ කසාය දසසයකට දී කිරි පෙරු දිය දෙහි ඇඹුල් මාත්ශ රස මෝරුමෙ හැමින් වෙන වෙන එක එක නැලියෙන් සතර සතර ගෙන එක්කොට මීට කල්කයට

සතකුප්ප	රුක්මුල්	කලාඳුරු අල	සිඟුරු පියලි
තාමර අල	කිරි අඟුණ	තලා මුල්	කොල්ලත් කොල
සුවඳ හොට	රත්වත් කැල	බැබිල	සාතාවාරිය
කිරිබඳු අල	කවෙළු	හරෙනුක	එන්සාල් ඇට මද
මහ වන්මුතු, කහා, හොරඅරටු		දේවදාර	වැල්මී
පියුම් අල	කටුවැල් බටු	නාමල් රේනු	අස්වැන්න
පුස්වැන්න	මෙවන්, මහ මෙවන්, ජීවක		
ඉරිවේරිය	කොට්ටන්	තිප්පිලි මුල්	දිය පරඬලා
වැල් මදට	රත් සඳුන්	සුදු සඳුන්	ජටාමාංශ

මෙයින් දස පලමක් ගෙන අඹරා කසායට එක්කොට සුද්ධ තල තෙලුත් සතරක් වත්කොට පදමට කකාරා ගෙන සුවඳ කැවූ උතුම් භාජනයක වක්කර තබා කොකුන් අගිල් කස්තුරිය මේ සුනුකොට දමා සුරකිව තබා අභ්‍යාභාදි වස්ති කර්ම පානශ්‍ය උත්තර වස්ති ආදියහි යොදනු. වාත ප්‍රධාන සියළු වැදි ගුණවේ.

කටු කරඬු මුල් සාතාවාරිය ආපසු මදු රසකිඳ මෙයින්ද මේවිධි රහට වෙන වෙන සිද්ධි කට යුතු වෙයි.

සර්වාංග ලෙඩට

(බලා) බැබිල (කොරන්ඩ) කටුකරඬු (යොම්මුලා) මෙකී මුල්ද (පුනනීවා) සාරනය මෙකී දෙයින් පස්විසි පස් විසි පලම ගෙන ජල ද්‍රෝනේ දහ නැලියක් වත්කොට කකාරා සතර නැලියකට සිටුවා තෙල් නැලියක් වක්කොට කකාරා

ත්‍රිකටු	තිකුළු	කටුක රෝහිනි	අරත්ත
කොට්ටන්	වැල්මී	අසමෝදගම්	සතකුප්ප
ලාකඩය	බිම සෙනගරත්	කහ	කලාඳුරු අල
ඉරමුසු	විලා	මහාවන් මුතුය	සාදික්කාය
දෙදුරු	රත්තිවුල්	පතහි	රත් සඳුන්

මෙකී බේත් එක් කලං සමාර බැගින් ගෙන කිරි සතරක් ගෙන කකාරා බා

පෙරා මේ තෙල අභ්‍යංග කිරීමටද ඉසේ සියළු සෝපයටද සර්වාංගයෙහි සියළු වායුවටද කර්ණයෙහි සිටිනා අතුරෙ සිටිනා වායුවටද සර්වාංග සියළු වායුවටද යහපති.

විදුම් (අසුරවිදිය)

1. ශක්ති ඇති අයටද වමන ඇති අයටද මුස ලෙඩටද කැස්සටද උදර ඇති අයටද රත් පිත් ඇති අයටද අරිසස් ඇති අයටද පාණ්ඩු රෝගයටද ඇස මුළුක්ක ඉදිමුනු අයටද මේ කියන අයට නහර ගසා පමණ දැන ලේ හරිනු.

2. ඉසේ ලෙඩටද, ඇසේ ලෙඩටද නලල හා බැම කෙලවර නහර ගසා ලේ හරිනු.

3. කනේ ලෙඩට උඩු කන පිට නහර ගසා ලේ හරිනු.

4. නාසේ රෝගයට නාසේ අග නහර ගසා ලේ හරිනු.

5. ප්‍රතිශ්‍යාවට නාසා අගවත් නලල මැදවත් නහර ගසා ලේ හරිනු.

6. කටේ ලෙඩට දිව උඩු තල්ලේ ගසා යට පිට නහර ගසා ලේ හරිනු. තොලෙහිද උඩු තල්ලෙහිද බෙල්ලෙහිද කනෙහිද සක්කෙහිද ඉස මුදුනෙහිද මෙයින් පුළුවං තැනක නහර ගසා ලේ හරිනු.

7. මී මැස් මොරටද අනු සන්ධිවල ලෙඩටද විදාවුඩනම් පිලිකාවටද ඇක පිට රුජාවටද දටව ඇලපිට කිහිල්ලටත් මැද නහර ගසා ලේ හරිනු.

8. පබාහිකා නම් විටක ලේ යනවිටක මල ලේ යන අතීසාරයට කුලල් සන්ධියට දැඟුලකදී නහර ගසා ලේ හරිනු.

9. ගල ගන්ථ නම් බොටු වේ ගැටකී කලවා මැද මුල නහර ගසා ලේ හරිනු.

10. දනින් පහල විළුඹ පටන් ඇඟිලි අග දක්වා දුවන වායුවට, දන සන්ධියට උඩින් දැඟුලක දී නහර ගසා ලේ හරිනු.

11. උපති නම් තුන්ඩටියෙක කන්ඨෙ මැද දැඟුලකදී නහර ගසා ලේ හරිනු.

12. දන ඉදිමීම සිටී. රුජාවට පය හිරිහුමට වලළු කර සන්ධියට උඩ සතර ගුලකදී නහර ගසා ලේ හරිනු.

13. විසප්පුවට පයේ ලෙඩ කිපුනු වායුවටද මෙකී වායුවට පය මහ පට ඇඟිලි සිදුරෙන් උඩ දැඟුලකදී නහර ගසා ලේ හරිනු.

14. ප්ලීහෝදරට වමත වැලමිට සන්ධියේ මැද දැඟුලකදී වම දිහා නහර ගසා ලේ හරිනු

15. යකිරිප්ප ල නම් උදරයටද දකුනත වැලමිට සන්ධියේ ඇතුල නහර විදනු. ඇසුර විදියයි

දහ තුනක් වාදන් වලට

1. මැඩ වාදම් කියන ලෙඩට ඉස මට්වේ වෙයි. ගිනියන් රුජා වෙයි. දෙහි ඇඹුල් එක්ක තල තෙල් කලත්දු කොට කන් දෙකේ වක්කරනු. නශ්‍ය කරනු. හඳුන් ඉසේ ගල්වනු.

2. පුත්ඩලි වාදන් බෙල්ලෙන් එන රුජාවට ඔලිද කොල කොටා පැණි සිඳ ගානු. එම රොඩු පොට්ටනි බැඳ කොත්ද දිග තවනු. ලේ හරිනු. ගුණවෙයි.

3. සත්දු වාදම් උරිගෙ ලෙඩට තලල මැද දෙකොන පුළුස්සනු. නොහොත් පිටි අල්ල විද ලේ හරිනු. ගුණවේ.

4. එරි වාදම් වැලමිට්වේ ලෙඩට කසා තුන් වගෙං මී මුරුවට එඩරු තෙලින් කොටා මලවා තවනු.

5. මනි වාදන් වලළුකර රුජාවට ඉදිමුනාට සුලගිල්ල මැද ඇගිල්ල මාපට ඇගිල්ල ගිය ලෙසෙ වලළුකර පුළුස්සනු.

මතුපිට නහර බිදිනු.

6. මුබ වාදං කටේ ලෙඩට දිවයට නහර විදිනු.

7. කලලා වාදං කුනට්ටියෙ රුජාවට කට්ටියෙ මැද්දේ කොන අඟුලක් වවර ගසා පුළුස්සනු.

කුදියෙ නහර විදිනු. බේත් තෙල් ගා තවනු.

8. මුලක්කාල් වාදං දන ඉස රුජාවට ඉදිමුනාට එම ඇස් දෙක ලකුනු වන තිලබලා ගසා පුළුස්සනු. වායි තෙල් ගා තවනු.

9. කුදි වාදං වලළු කර ලෙඩට මාපට ඇගිලි සිදුරෙන් ඇඟුලකදී වත් පතුල මැදවත් ගසා ලේ හරිනු සුලගිලි සිදුරෙන් ගිය ඇස්වට පුළුස්සනු. ගුණවේ.

10. නඩත්තු වාදං අනපය ශරීරය වේවිඑමටද හිරිවැටුමටද දවු වීමටද ඊට බෙහෙත්
නික කොල සිවිය කොල එඩරු කොල කුඹුක් කොල

මදුරු කොල   වැල් රුත් අත්තන කොල
මෙකී එනු කසාලා කොටා මලවා තවනු. පාත ඉස් හතරෙයි.
තිබ්බටු පෙන   වරා කිරි දේදක තෙමා ඊ පිට මිරිස් ලා තවනු. තුනටියෙයි.

11. මල බටු කොල කොටා මලවා තවනු. කුදියෙහි රුජා ඇරේ.

12. දෙහි ඇඹුල් ඔලිද කොල කොටා මිරිකා ඉසේ ගල්වනු. ඇල් දිය වත්කරනු. මැඩ වාදම් ගුණවේ.

13. මදුරු කොල අසුවනු බේත් ඉස්ම උදැල්ලෙන් පැසවා තුනටියේ ගානු. දහ තුනක් වාදං අසූ අටක් වායුවට අවගන්නා මුලයි දැන් කරනු.

සල්ල විධි

1. ඉසේ සියළු රෝගයට පිටි කරින් එන රුජාවට උකුනු වලේ උඩ නහර දෙක පුළුස්සනු.

2. නලල වට රුජාවට කම්මුලේ බුබුලෙ පුළුස්සනු.

3. ඇස පිට එන රුජාවට දෙබැම සා වුනු තැන අඟුලක් මැදට ඇරලා දෙකොන පුළුස්සනු.

4. ඉස් හැම වෙවුළුමට ආතුරයා අතින් වියතක් නාසේ සිට මැනලා පුළුස්සනු.

5. ඇස් සුදු පටල නම් කවර හයක් සුදු ඉහිරියාව මල සේ ම තිබෙයි කළු ඉංගිරියාව සුදට උකුනුවල අග නහර ඉදි කටුවෙන් ගසා පුළුස්සනු. නූලක් ඇද ඔීජස ගිය කල නූල ඇද දමනු.

6. වාත සන්නියට වලලු කර දෙක පුළුස්සනු.

7. මුතිතු සන්නියට පතුල දළු දෙක පුළුස්සනු.

8. ආකාස සන්නියට පිටි අල්ලේ දඹර ඇඟිල්ලට වැටී තිබෙන නහර පුළුස්සනු.

9. වෙඩි සන්නියට තුන් කොන්ද සා වුනු තැන ගසා පුළුස්සනු.

10. දෙව සන්නියට මාපට ඇඟිලි සන්ධිවලට උඩින් පුළුස්සනු.

11. මුතිතු සන්නියට පෙකනිය වට පුළුස්සනු.

12. කාල සන්නියට උර ඉස් දෙපිට පුළුස්සනු.

13. කෝල සන්නියට ඉස මුදුනේ පුළුස්සනු.

14. වෙඩි සන්නියට යටි පතුල් දෙක මැද පුළුස්සනු.

15. පිත් සන්නියට කෙන්ඩෙ කුදියට වැටී තිබෙන නහර පුළුස්සනු.

16. ශෙම් සන්නියට දකුණු පය බොල මෙ පුළුස්සනු.

17. මුඩුක්කු සන්නියට බොලමෙමඅහලක් පාතින් පුළුස්සනු.

18. ඔඩ්ඩි සන්නියට දැගුලක් පාතින්ද

19. ඔල්මාද සන්නියට තුන ගුලක් පාතින් පුළුස්සනු.

කම් පෙත්තෙ යටි පිටින් හකු පාඩාවේ පුළුස්සනු

20. කුදල සන්නියට දත ඉසට පාතින්ද

21. මූල වායු දත ඉස නහර පුළුස්සනු. කුදියෙ නහරද විදිනු.

22. ලේ නොසිටී නම් දැගුලක් උඩින් වදිනු. සිටී.

23. කකුලෙ නොයෙක් රුජාවට බොලටෙ දැගුලක් උඩින් විදිනු.

24. ඇස් පිට පෙරළුනි නම් යටි පල්ලේ හරි මැද මැනලා පුළුස්සනු.

25. පතුලේ නොයෙක් රෝගයට සුලහිල්ලට වැටී තිබේන නහරෙ විදිනු. නොසිටි නම් පතුලෙට ගිය නහර පුළුස්සනු.

26. දනට රුජාවට දත ඉසට දැගුලක් උඩින් විදිනු. නොසිටිය නම් හතරගුලක් උඩින් විදිනු.

27. මැතික් කටුවේ නොයෙක් රෝගයට මැද ඇහිල්ලෙට වැටී තිබෙන නහර විදිනු.

28. ලේ නොසිටි නම් මැතික් කට්ටුවේ නමන තැන විදිනු.

29. බොලටෙ රුජාවට වැල මිටි දෙකෙ නහර විදිනු. ලේ නොසිටී. නම් උර ඉහට තුන ගුලක් පාතින් විදිනු.

30. කටේ නොයෙක් ලෙඩට දිව පෙරලා මුල නහර විදිනු. ලේ නොසිටි නම් ඉස මුදුනේ පුළුස්සනු.

31. ඉස බර නම් නලල විදිනු.

32. ඇස එන රුජාවට පිටි අල්ල විදිනු. ඇස කළරුවාවෙ සිට සුදු රුවාවට ගිය නහර විදිනු.

33. ඇස කඳුළු එනවාට ඇහැ ඇරලා ඉසිර තිබෙන නහර විදිනු.

මේ ආකාරයෙන් වෛද්‍යය කරනු. හරි හිටී..

අරුවියට

1. උළුවා කොත්තමල්ලි, දුරු, සුදුලුහුණු කඩ පොට්ටනි බැඳ හීනටි හාල් ලිප තිබා පොට්ටනි එහිලා වී විලඳක් සමග කැඳ උයා පෙනර කොළ කපා එහි ලා තැම්බිම්ව බෙහෙත පොට්ටනි හැර දමා රෙද්දෙං පෙරා ගෙන ගිතෙලින් දෙනු. ආහාර පිරිය වේ.

2. හාතාවාරිය මුල්, කරල් සැබෝ, පොල් හුනු කැඳ දෙනු.
ඉක්කා ලැය විළුන් නසයි.
ගෙඩි වියළුන්, අරුවි නසයි.

බාලයාගේ බඩිං යනවාට

1. නිදි කුඹ මුල් මයිල මල් හිරමුසු මුල් එණුවරණ පොතු
කසාය සීනි මී පැනි සමග දෙනු.

2. ඉඟුරු පෙරුංකායන් සුදුළූනු සවින්දව
කුඹුරු ඇට
කසාය අටිනෙක සිඳ දෙනු.

3. කොල්ලු සුදුළූනු බෙලි එඬරු
සිවිය තිකුළු තිප්පිලි මුල් යවකර
සවිඳ
අට එකට සිඳුවා එඬරු තෙලෙං දෙනු. වාත නසයි.

වාදමට

1. එඬරු ඇට කලදයි අබ දෙකලදයි තල තුං කලදයි ගිතෙලිං අඹරා ගානු. වාද නසයි.

2. තලද මී ඉටිද ඒල කිරෙං අඹරා ගානු.

3. වියලි කසා අබ මෙම ලෙස ගිතෙලිං අඹරා ගානු.

4. අබ තල කසා සුදුළූනු
කුඹුරු ඇට
පොල් සමව කොටා පොට්ටනි බැඳ තෙල් ගා තවනු. වාදමටයි.

5. හීරැස්ස දළු අබ සුදුළූනු පොල් සමව කොටා මලවා බදිනු.

6. පඹුරු තික වරා සියඹලා
කරඳ ඇසල එනුවරණ
මේවා කොල පොතු වැටකේ කටු කරඬු, එඩරු අත්තන මේවා කොල කහ ලූනු පොල් සමව කොටා දොඩං ඇඹුල් තල තෙලිං මලවා බදිනු.

7. සුදුළූනු කළු දුරු පෙරුංකායන් කුඹුරු ඇට
ඉඟුරු සවින්දව මුරුංගා කොල
යුසින් අඹරා මදට පමණ ගුලි තුනක් එඩරු තෙලෙන් දෙනු.

හික්කාවට

1. ඩෙබර ලොද රසඳුං විලද කුළු රැත
මනෝසීල වග පුල් තෙල්ලි සීනි
සිද්ධිගුරු තුබ අල කැල ගෙඩි මල් වග පුල්
ඉදි බඩ
යන මේ බෙහෙත් සම භාග ගෙන වෙන වෙනම් අඹරා මී මුසුව දෙනු.

2. සඳුන් තන කිරි වක්කොට අඹරා නස්‍ය කරනු. හික්කා නවති.

3. හිරියල් අඹරා ගිතෙලින් අනා දුන් දෙනු. හික්කා නවති.

4. වැල්මී අඹරා මී පැනි එක්කොට හො වෙන ලෙහ කරනු. හික්කා නසා.

5. ගොත් අන වැලිගා අඟුරලා දුං බොනු. හික්කා වලකී.

6. ඊ තණ සවින්දව එනු පලමක් ගෙන ගිතෙල් පලමක් ගෙන මෙකී බේත් අඹරා තෙලෙහි කලතා දෙනු.

7. කකීටකශ්‍රිගි තිපල තිකුළු කටුවැල් බටු මුල්
සිරිතේක්කු නෙළුන් අල සෛන්ධව එනු
සමභාග ගෙන චූර්ණ කොට උදය ඇල් දියෙන් දෙනු.

8-9 මිරිස් සිද්ධිගුරු තිප්පිලි මනෝසීල
සුදුදුරු වසාවාසී
යන මෙකීවා චූර්ණ කර කීකිරිදිය මී කං පලා ඉස්ම දෙකිං රෙදි පොහවා පාත්කඩ අඹරා දුං දෙනු. නොහොත් මොනර පිල් එසේම දුං දෙනු. හික්කා නැතිවේ.

10. මිනිරන් භස්ම   රසදිය   තිකුළු   කුරුඳු පොතු
එන්සාල්   අමු කපුරු   සෛන්ධව ලුණු   මොනරපිල් අළු
සමසේ චූර්ණ කර ඉඟුරු යුසයෙන් අඹරා උඳු ඇට පමණ ගුලි කර සීනි මී පැනි එක්ව ගුලියක් දෙනු. හික්කා නසා.

11. උක් සකුරු   මිරිස්   වෙලි කසා   අරත්ත
මුද්දරප්පලම්   තිප්පිලි
මේ සමව ගෙන චූර්ණ කොට තල තෙලෙන් ලේහ කරනු. හික්කා සමනවේ.

12. කුඹුරු ඇට   තික මුලේ පොතු   මොනර පිල්   හිරියල්
මෙකී දෙය සමභාග ගෙන හිරියල් ඉස්සර අඹරා අතික් බේත් පසුව එක්කොට මදක් අඹරා දුං ගත්ටත් පසුව තල තෙල් ටිකක් බොන්ටත් හික්කා ශීඝ්‍රව ගුණවේ.

13. කසඹිලියා   වග පුල්   මුද්දරප්පලම්
පෙරුංකායන්   අරළු
මෙතෙක් බෙහෙත් සුනුකොට මී හා ගිතෙලින් අනා ලෙහ කරනු. දැඩි වූ ස්වාස නසා.

14. වැල්මී අඹරා මීයෙන් ලේහ කරනු. ස්වාස නසා.

15. අරළු   කුළුරත   කසඹිලියා
මෙකී බෙහෙත් අඹරා එහිම දිය කොට පොවා ස්වාස හික්කා නසා.

16. කෙසෙල් මුල්   වරා මුල්   වග පුල්
මෙකී බෙහෙත් අඹරා එහිම දිය කොට පොවනු. ස්වාස නසා. හික්කා නසා.

17. ඉක්කා ස්වාස ඇත   සිද්ධිගුරු   දුං දෙනු
හෝ සහිත කොට අඹරා උනු පැනින් පොවනු. සුවය ලණු.

18. සීනි සුවසලුණු සිද්ධිගුරු මෙකී බෙහෙත් උනු පැනින් දෙනු. හික්කා ස්වාස නසා

19. කුරුඳු පොතු   එන්සාල්   ඉරිවේරිය   සිද්ධිගුරු
කිරි අඟුන   නෙළුන් අල   එඩරු මුල්   සොර පොතු
අගිල්   කලාඳුරු අල
තලා බෙහෙත් සම භාග ගෙන අඹරා ඊට බාගයක් සීනි එක්කොට අනා තබා උදය වලදනු. ඉක්කා ස්වාස උන හදෙහි රුජාද මෙතෙක් රෝග නසා.

20. මොනර පිල් පිල් කටු හෝ සියල්ලම එක්කොට දවා ගිතෙල් එහි එක්කොට ලෙහ කරනු. හික්කා ස්වාස නසා.

ඉදිමුම් උදර

1. එල කිරි ගොමුත්‍ර එලගි තෙල් දී කිරි
එල ගොම ඉස්ම එක පමණ ගෙන තිරුස්සවාලු අරළු
දැත්ත අල කහ පුෂ දලුක් කිරි
මෙකී බෙහෙත් එක්කොට දෙදවසකින් කල්ක ඉටිපදමට තෙල් බා පෙරා මසක් වලදනු. (විරේකවේ) ඉදිමුම් උදර නසා.

2. සිරිල පොතු වග පුල් සිවිය මුල් රත් නිටුල් මුල්
සිද්ධිගුරු කිදි කොල
මෙකී බෙහෙත් තලා කාඩි දියෙහි ලා කකාරා පෙරාගෙන ඒ දියෙන් හීනටි හාලේ කැඳ පිස ගෙන පොවනු. පිට ගානු.

3. වල්ලා කොල සකුරු ඉල්ල කොල අත් කසා
උළුවා ලා සකුරු පොල් කිරි
වත්කර කැඳ පිස පොවනු.

වාත

1. අබ වද කශා කොට්ටං දෙවදුරු
ශාරණ
මේ හැම අඹරා ගානු. තගන වායු ගුණවේ.

2. දොඹ ඇට එඬරු ඇට කොහොඹ ඇට මුන මල් ඇට
නා ඇට අබ අගුණ කොල කොල්ලු
ඉඩු එැනු දෙකශා දෙවදුරු මුරුවා
මේ හැම කොටා පොටටනි බැද එඬරු තෙල් මී තෙල් ගා පොට්ටනියෙං තවනු. අඩවායුව අණඩයට ඇතුළු වූ වායු ගුණවේ.

3. ගිතෙල් මී තෙල් තල තෙල් එඬරු තෙල්
කුරුඳු තෙල් කොහොඹ තෙල්
මේවා ගෙන
මිරිශ් සිද්ධිගුරු වගපුල් අබ, උදු
අසමෝදගම්
මෙකී දෙ පලම පලම ගෙන වද කශා දෙකලදක් ශවින්දව එනු දෙකලදක් හීනටි ශාල් දෙකලදක් හතර පශ් පතුවක් ගෙණ බැද පිටි කොටා මෙකී බේත් චූර්ණය කිතුල් හකුරෙන් අනා උදය වලදනු.

පිත්ත පාඩුවට බෙත්

1. ඇසල කොල කුඩු මීරිස කොල පැහිච්ච කැප්පිටියා කොල
පැහිච්ච ඉඩ කොල යබර
මෙකී දේ වේලාගෙන හීනටි හාල් පිටි බැඳ චූර්න කොට
අරළු බුළු සිද්ධිගුරු මිරිස්
ශවින්දව එනු යහුනු
මෙකී කුඩු හා පිටි චූර්ණ යට එක් කොට කිලාත්තයේ වලදනු. පිත්ත පාඩු ගුනවේ.

2. වද කශා තුන් කලදයි බලල් ලුනු තුන් කලදයි
අරළු පොතු පස් කලදයි සිද්ධිගුරු ශතර කලදයි
නෙළුත් කොල අට කලදයි රත් තෙටුල් කොල අට කලදයි
වාතේ නැති යහුනු පශ් කලදයි
මෙකී බෙත් වියලා චූර්න කොට අඹරා දෙකලදක් දෙවේලේ පානුවෙන් හෝ පාණු දියෙන් හෝ දිය කොට පොවනු. පිත්ත පාඩුවටයි.

3. කරබබිය තුත්තිරි මුල් ගත් තේ
මහ ඔසු අරළුත් අවකට ගත් තේ
අස් ඒ සහ පානය කරපත් තේ
උත්තිල නොදිරුං මද ගිනි මැත් තේ

4. වච්චනාවි එකයි සුස්කර තුනයි
ත්‍රිකටුක හතයි
මෙකී බරට ජයපාල උනුදිය, ඉඟුරු ඉස්මෙන් අඹරා ඉඹුල් ඇට සා ගුලිකර ඉඟුරු යුසෙන් දෙනු. සියළු වායු ගුණවේ.

වාත රත්තයට

අරළු බුළු නෙල්ලි කලන් එක එකයි රස කිඳ බැබිල ආඩතෝඩා කලං තුන තුන ශැලියක දමා වතුරමනා අට එක මතාවට උනු කර එඩරු තෙල් දමා තුන් වේලට බොනු.

වායුවට

1. කුඹුරු ඇටයක මද සුදුළුනු තික කොල යුෂයෙන්ද පිතට ඉඟුරු යුෂයෙන්ද කාසයට යකිනාරන් කොල යුසයෙන්ද සුදුළුනු එක්ව දෙනු.

කුරුමේන්තු රුදාවට අසූවක් වායුවට

2. එනු ඇඹුල් වලකිනු.
මුකුණුවැන්න මුරුංගා පළ තෝර කොල
මිරිස්
අනමින් උයාපු සාලේ බත් කනු.

3. සුදු එනු සියක් පලමක් ගෙන පස් මුල්
රත් තෙටුල් තික
ත්‍රිකටුක තිරස්තවාළු
එඬරු දළු එනුවරණ දැත්ත දෙදුරු
මිදෙල්ල තිපල්
මෙකී බේත් තුලා දෙකක් ගෙන කොටා දිය දහයක් වක්කොට හතර නැලියකට කකාරා එඬරු තෙල් නැලියක් එලකිරි දෙනැලියක් එක්කොට කල්කයට
සිද්ධිගුරු පෙරුන්කායන් වද කසා අසමෝදගම්
යවකර අබ එල මිදෙල්ල තිරස්ථවාළු
තිප්පිලි සුදුදුරු වලහ සාල් මගුල් කරඳ ඇට
රත් තෙටුල් මිරිස් සුවඳ එනු
මෙකී බෙහෙත් කලඳ කලඳ ගෙන අඹරා කල්ක කසායට දමා පස් දවසක් මද ගිනි කර කකාරා පෙරා තබා මේ තෙල් සියළු වායුවට දෙනු.

4. දිය තුමුසු පොල් කිරි නැලියයි මගුල් කරඳ කිරි නැලියයි
එඬරු තෙල් මනාවයි
එක්ව ලිප තබා මීට
සුදුඑනු දෙකලඳයි එනුවරණ පොතු දෙකලඳයි
පෙරුන්කායන් කලඳයි ජයපාල කලඳයි
එහිලා කකාරා කල්ක ලනුවැටෙන පදමට බා පෙරාගෙන වලඳනු. ගානු. ශරීරය පිට දුවන වායු ඇතුළු වායුවලට ඇදුරු තෙලයි.

5. කුඹුරු ඇට අඹරා පොල් කිරෙන් දෙනු. සතියක් දුන්නොත් වායු ගුණවේ.

6. එඬරු මුල් වැල් තිබ්බටු මුල් නත්නාරං මුල් බෙලි මුල්
පොල් කුඩු පලා මුල් තිකුළු
ශමසේ දොලොස් කලඳක් ගෙන අට පත එක පතට කකාරා පෙරා
ශවින්ද එනු පෙරුන්කායම් යවකර එනු
පොඩි කොට එඬරු තෙල් තුන් කලඳක් එක්කොට එහි කලත පොවනු. බඩ වායු, ඉතේ වායු, අඩ වායු ගුණවේ.

7. කොල්ලු සුදුඑනු සිද්ධගුරු එඬරු මුල්
අරළු අමුක්කරා මුල්
මෙකි බේත් දෙකලං ගෙන තෙරපා දිය අට පත එක පතට කකාරා තිප්පිලි යවකර එනු පොඩිකොට කලතා දෙනු. සියළු වායු ගුණවේ.

අසූවක් ප්‍රකාර වායුවට

8. රස ගන්ධක අසමෝදගම් තිප්පිලි සුවඟ එනු
වලහ සාල් පුස්කර ත්‍රිකටුක ගශ් කදුරු ඇට
මෙකී බේත් කලඳ කලඳ ගෙන අඹරන කල දෙහි ඇඹුල් වක්කර අඹරනු.

මේ බේත් අෂ්ටද චූර්ණය තුං කලදක් තාඹර බශ්මද හා ගෙන දෙනු. පිත්ත කාශ, ස්වාශ, රෝග ඉදිමුං, අර්ශස්, මූල වැදි පාඩු රෝග, ප්‍රමේහ, ගුල්ම, අසූවක් ප්‍රකාර වායු ගුණවේ. පත්තියං අඹරල තෙල්ලි, කිරි මෝරු, ශීනි, පුශුල් වලදනු. ඇඹුල් බටු වලකිනු.

කාශයට
ඉක්කා රෝගයටද, එලහිතෙල්, එල කිරි, කැද, කරිවිල, ශාරණ, මුරුංගා, පළු, කනු. ඇඹුල් වලකිනු.

වායු පස් වගේට තෙල්

9. කරඳ පොතු ඉෂ්ම නැලියයි පොල් කිරි නැලියයි එලහිතෙල් එක්ක කකාරා කැටි නැගෙන පදමට බා තබා කාශිය බර කඩදෙනු.

සර්වාංග වායුවට

10. දොඩං දළු නත්නාරං දළු තික දළු
මෙකී බේත් ශම බාග ගෙන වේලා කුඩුකර රෙද්දෙං පෙරා ගත ශුඩු එැනු, අබ මිරිස් මෙකී දේ පොඩි කොට සුං ශාලේ බත් එක්ක කනු. සර්වාංග වායු ගුණවේ.

11. හීරැස්ස වේලා පොඩි කොට
තිප්පිලි වැල්මී අරළු පෙරුංකායන්
පොඩිකර ඒ එක්ක මී පැනියෙන් කනු. සර්වාංග වායු ගුණවේ.

12. ශුඩු දුරු ගෙන්දගම් පෙරුංකායම් ශුඩු එැනු
අරළු තෙල්ලි බුළු
පෝඩි කර මී පැනියෙන් දෙනු. සර්වාංග වායු ගුණවේ.

13. තෙලට
වරා මුල් පොල් සමග කොටා තබා මිරිකා ලිප තබා කැකැරෙන පදමට
විලිකුන් වරා පත්‍ර වරා මුල් තුඹ කොල
තලා
කුඩු මිරිස් පොතු, කොසඹ පොතු මැල්ල පොතු

මෙකී දේ ඉණ්ම පත පතයි, පිල කොල, පස් පැහිරි, හරන්කශා, වල් ඉඟුරු, කැලතිය අල, අබ, කහ, කුරුඳු පොතු, මේ යුෂ පත පතයි කරඳ කොල යුෂ පතයි යොදා කකාරා තෙල් පාට ඌ විට තිකුළු අබ පෙරුන්කායන් උළුවා සන්තිනායන් ලසුනු මේ හැම දේ ශිනිඳුව අඹරා යොදා සම පාකයට බා පෙරා ඇඟ ඉශ ගානු. කාශියක් පදමට බොන්නට දෙනු. අසුවක් වායු, කොර, වාදන් නසයි.

වාතයට ඇඟ තෙල් ගැල්ලීම්, තැවීම්. නශ්‍ය කිරීම්, විරේක වීම්, සිනිඳු ආහාර දීමෙන් ලේ ඇරීමෙන් ගුන කරනු.

4. දැත්ත් බැබිල බෙලි කටුකරඬු
එඬරු තික ඉඟුරු
මෙකී මුල්
දේවදාර සුදුළුනු උළුන්දු කොල්ලු
මේ හැම කකාල කසායට සවින්දව ලා දෙනු. වායු ගුණවේ.

15. බෙලි මුල් තික බැබිල වරා
රත්නිටුල්
මේවා මුල් කතා, ඉඟුරු, සුදුළුනු, එක්කලං සමාර බැගින් ගෙන තලා දමා අට එකට කකාරා දෙනු. බඩේ සියළු වායු ගුණවේ.

16. සිද්ධිගුරු සුදුළුනු දේවදාර වං ඇපල මුල්
මෙකී දෙකලඳ කලඳ අට එකට කකාරා දෙනු වායු නසයි.

17. බෙලි බැබිල තික එඬරු
තිප්පිලි
මෙකී මුල් කකාරා කසාය දෙනු. සර්වාංග වායු නසයි.

18. සිද්ධිගුරු මිරිස් හිරුස්ස මුල් කුරුඳු පොතු
මෙකී දේ හැලියක දමා අට පත එකට ශිදුවා කකාරා දෙනු. වායු ගුනවේ.

19. අතපය වකුටුකල ගල්කුර අඹරා පොල් තෙල් ශිද තෙල්කඩ දමනු. ගුණවේ.

අදුවක් වායුවට

20. ගිතෙල් තල තෙල් එඬරු තෙල් මුසුව බත් දෙනු.

හන්දි වායුවට

21. කොහොඹ කොල, පොතු හරං කශා අල වේලට පොඩි කර හන්දි වල ගානු.

කන්ද වායුවට

22. වරා කොල ගඳ පාන කොල ඔළිඳ කොල වැරැල්ල කොල
වෙල්ලංගිරිය කොල
මෙකී බෙහෙත් ඉශ්ම ගෙන මිරිකා යම්තම් උනු කොට ඇඟේ ගානු. උනු දිය නානු. කන්ද වායු ගුණවේ.

23. බැබිල මුල ශැට ශතර පලම ගෙන කපා පොඩි කොට ශලක දිය දශ නැළියක් වක්කොට මදින් මද ශදවශක් ගිනිකොට කකාරා ශතර නැළියකට හුනු කොට බා පෙරාගෙන තල තෙල් නැළියක් එල කිරි නැළියක් වක්කොට බැබිල මුල් පලමක් අඹරා එහි ලා දෙ දවසක් කකාරා තුන් වෙනි දවශ බානාකල බොරලු ශේ දමන පදමට බා පෙරා ගෙන රුජාවට ඇඟ ගානු.

24. කටුකරඬු මුල් ශැට ශතර පලමක් ගෙන කපා පොඩිකොට ශැළියක ලා දිය මුලකී පමන ගෙන කකාරා මුල ප්‍රමාණයට සිඳ ඒ කශායෙහි තල තෙල් එල කිරි නැලිය නැලිය බැගින් වත්කර එම කරඬු මුල් පලමක් අඹරා මුල කී හැටියේ කකාරා බානාකල කල්ක ඉටිපදමට බා පෙරාගෙන එහි ශකුරු අට පලමක් බහා කඩ වශා මැටි බැඳ දහ්‍යා පාකයෙන් උයා සතියක් වලදනු. සියළු රුජා නශා.

ගල ග්‍රහයට

මී අරටුවක් අඹරා මී තෙල් ලා සිඳ කොල පල්මාතික්කන් එක්ක අඹරා තලතෙලේ සිඳ තෙලේ රෙදි සිසාරා ඊපිට එම තෙල් ගා උගුර ඇතුලේ තදකොට ඔබා ගානු. පොවනු කණ්මාලා හදරෝග ගුනවේ.

වවුලැටියා කොල අඹරා උගුර පිට ගානු.
තිත්ත කපුරු පල්මාතික්කන් අක්කරකා
මේ චූර්ණ කර පොට්ටනි බැඳ තනකිරෙන් ගලා කටේ තිබා කෙල ගිලිනු.
ගලග්‍රහ කපා වැගිරේ.

ගලක්කාරයට

ඒකාවේරිය මුල් දෙහි ඇඹුලෙන් උරච්චි කර පල්මාතික්කං පොඩි මදක් ලා තලතෙල් මදක් ලා පොවනු.

ගෙලෙහි ගඩුවලට

ගැටතෙටුල්, කුප්පමේතිය පත් යුසයෙන් එනු කුළුදුල්ලක් වගපුල් සුනු මදක් හා තලතෙල් මිශ්‍රකොට දෙනු. ගෙලේ ගඩු කපා වැගිරේ.

සක්සඳ මුල් ඇඹුල් දොඩම් ඇඹුලෙන් ගලගා පොවනු උගුර හැසුරුණ් හැරේ.

කටුකරෝහනී පුස්කර සිඩිගුරු
මේ චූර්ණය මීයෙන්දෙනු. ගෙලෙහි වූ කප රෝග ගුනවේ.

තිකුළු සුදුරූනු අසමෝදගං ශෙත්දළුනු
වතුසුද්ද මුලේ පොතු
මේවා ඇඹුල් දොඩං ඇඹුලෙන් අඹරා යොදා ආලේප පාන කරනු. ගලග්‍රහ ආදි සියළු ශෙලෙස්මා රෝග නසා.

අර්ශස්

අරිසස් ලෙඩ දුටු තැනම පමා නොව සම්හිඳුවන පිළියම් කරනු. එසේම නොකළොත් මල මාර්ගය අහුරාගෙන බද්ධ ගුදොදර නම් රෝගයක් කරන්නේය. ඊට

1. එළගොම රෙද්දක පොට්ටනියක් බැඳ කබලක ලා තබා උණු කොට අරිසස් ගඩු ඇති මල මාර්ගයේ තබනු.

2. එසේම විළඳ පොඩි කොට පොට්ටනියක් බැඳ දියෙන් තෙමා පොඩි පොට්ටනියක් බැඳ සතකුප්ප පොඩි පොට්ටනි බැඳ එ අරිසස් ගඩු පිට තබා කීකිරිදීය යුෂින් තෙමනු.

3. සුවස එනු දැත්ත අල තියගලා අල රත්නිටුල්
වගපුල් මගුල් මාර ඇට කොට්ටන් සවින්දවළුනු
මෙකී බෙහෙත් සමසේ ගෙන ගෝමුත්‍රයෙන් අඹරා කිරින් අනා අරිසස් ගඩුපිට ගානු. අරිසස් නැතිවේ.

4. කසා කුකුළු ගූ ඔලිඳ ඇට වගපුල්
සමසේ ගෙන ගෝමුත්‍රයෙන් අඹරා වියළුනු අරිසෙස් ගඩු පිට ගා අදිනු.

මේ යෝග තුන වෙන වෙන ගැම කුෂ්ට අරිසස් වායුවට බල පවතී. මල මාර්ගය මෙලොක් වේ

5. දැත්ත අල කනේරු මුල් කළු තුඹ වළහසාල්
එන්සාල් රත්නිටුල් සවින්දවළුනු
මෙකී බෙහෙත් සමසේ ගෙන සතර පලමක් අඹරා ගෙන වරාකිරි පතක්, තලතෙල් නැලියක්, දිය සතර නැලියක් වත්කොට තුන් දවසක් ගින්නේ කකාරාතෙල් කා ලනු වැටෙන පදමට බා පෙරා ගෙන අරිසස් ගඩුවේ ආලේප කරනු. අරිෂස් නැතීවේ.

6. අරළු සුනු කොට උක් සකුරෙන් අනා ලේහ කරනු.

7. අරළු සුනුකොට සමස ගොමුත්‍රයෙහි ලා තිබා උදෑසන ඇර ගෙන තුන් කලඳක් පමණ වළඳනු. අරිසස් නැතිවේ.

8. රත්නිටුල් මුල්, සත්කුප්ප සමසේ ගෙන පොඩි කොට තුන් කළඳක් වීතර ගෙන එල කිලතින් පොවනු. අරිසස් නැතිවේ.

9. සිඩිගුරු, පොතු ඇරි බෙලි මුල් සමයේ ගෙන පොඩි කොට එළ මොරින් උදෑසන බොනු. අරිශස් නැතිවේ.

10. රත්නිටුල් මුල් අඹරා කලය ඇතුලේ ගා වියලා මෝරු වත් දිය කිරිවක් කොට රෑ කඩ වසා බැද තබා උදෑසන ගෙන වළඳනු. අරිසස් නැතිවේ.

11. රසකිඳ වැලින්වත්, සිත් මැඩ හගු මුලින් වත්, දම් දෙවු සුදු වලින්වත්, මුව කිරි වැලින් වත් අඹරාගත් කල්ක එකක් කලයෙහි ගා වියලා ගන මෝරුවත් දිකිරිවත් වක්කොට රෑ තබා උදෑසන බොනු. අරිසස් නැතිවේ.

12. සිවිය වැලේ පොතු, රත් නිටුල් මුල්, සමසේ ගෙන සුනු කොට තුන් කළඳක් ඊයෙලා තබා උදෑසන වළඳනු.

13. රත්නිටුල්, සිඩිගුරු සමයේ ගෙන සුනුකොට මී පැණියෙන් අනා වළඳනු. අරිසස් නැතිවේ.

14. සවින්දව එනුර්ට දීවුනුව දැත්ත අල ගෙන බදුල්ල ඇට, තිපල් රත්නිටුල් මුල් කෝවෙක ලා රෙදි මැටිලා ගොම වැරටි දවාගත් අළුගෙන ඇල්දියෙන් වළඳනු. අරිසස් නැතිවේ.

15. සවින්දව එනුවට දී වුනුව දත්ත අල ගෙන බදුල්ල ඇට, තිපල්, රත්නිටුල් මුල් සතකුප්ප කෝවෙක ලා රෙදි මැටිලා ගොම වැරටි දවාගත් අළුගෙන ඇල්දියෙන් වළඳනු. අරිසස් නැතිවේ.

16. කළු තල දෙපලමක් ගෙන වළඳා ඇල්දිය බොනු. අරිසස් නසා දත්තර කෙරේ. ඇඟ සවි ඇතිවේ.

17. කැල අළු දවා කකාල දිය තුන් නැලියකට තිකුළු තුන් පලමක් අඹරා කල්ක කොට තලතෙල් නැලියක් එක්කොට සිඳ කල්ක ලනු වැටෙන පදමට බා පෙරා ගෙන එළහිතෙල් හා එක්ව වලඳනු. අරිසස් ගඩු ගලවා වැටි යේ.

රක්ත අරිසසට

1. කොසඹ පොතු, සැවැන්දව මුල් මෙකී බෙහෙත් සමසෙ ගෙන පලමක් දිය දෙනැලියක් වත්කොට මදගින්නෙ කකාරා පතෙක හෙලා පෙරා ගෙන මද උණුවේ පොවනු. රක්ත අරිසස් නැතිවේ

2. බින් කොසඹ සුදු සඳුන් සිඩිගුරු වැල් කසඹිලිය මුල සමසේ ගෙන දිය දෙනැලියක් වත්කොට කකාරා පතක් පමණ සිටි කල පෙරා ගෙන තිවා පොවනු. රක්ත අරිසස් නැතිවේ.

ලේ යන අරිසසටයි

3. තිදිකුම්බා අල මානෙල් අල දිවුල් ලාටු තල සුදු සඳුන් සමසේ තුන් පලමක් ගෙන අඹරා එළකිරි පතක් පමණ ගෙන පොවනු. ලේ යන අරිසස් නැතිවේ.

4. කෙලින්ද ඇට සුනු කොට තුන් කළඳක් විතර ගෙන මී පැණියෙන් අනා වළඳනු. එළු කිරින් බත් කැවා මෙන් ලේ යන අරිසස් නැතිවේ.

5. කරල් ශාබෝ මුල් තුන් කළඳක් විවර ගෙන අඹරා සාල් පාතු දියෙන් පොවනු. ලේ යන අරිසස් නැතිවේ.

6. නෙළුම් මල් රේණු කළඳක් විවර ගෙන අඹරා මී පැණි ගා වෙඩරු එක්කොට පොවනු.

7. නෙළුම් කෙසරු පොඩි කොට සීනි හා උදාසන වළඳනු. ලේ යන අරිසස් සිටි.

8. තලිස් පතුරු මිරිස් සිවිය වැලේ පොතු
නාමල් රේනු කොල්ලන් කොළ ශවැන්දර මුල්
මෙකී දෙය එකිනෙකින් තුන් කළඳ ගෙන සිඩිගුරු, තිපල් මේ සතරින් දොලොස් පළමක් ගෙන මෙකී දෙය පොඩි කොට ගුලිකොට තබා ගෙන තුන් තුන් කළඳ වළඳනු. බඩගිනි වඩා අරිසස් ගුල්ම උන ලෙහි රෝග නැතිවේ.

9. එළකිරි අළු කෙහෙල් වෙන වෙන හෝ කවනු. එක්කොට හෝ කවනු. අනා පොවනු.

10. වගපුල්, මිරිස් එක බරට ගෙන
සිඩිගුරු දිවුනක් ගෙන
රත් නිවුල් මුල් අට කළඳක් ගෙන
වල් කිඩාරත් අල දහස කළඳක් ගෙන
වියලි සුනු කොට උක් සකුරෙන් අනා තුන් තුන් කළඳ පමණ ගුලි කොට දවස් පතා උද උදාසන තුන් තුන් කළඳ වලදනු. අරිසස් නසා බඩගිනි බොහෝ ව කැවිලි දිරවා.

11 මීටම.
කළු කොල්ලු පොඩිකර තල තෙලින් අනා ගඩොලක් රත් කර වත්ගෙඩිය ඇතුලේ ලා ඇබරු බෙහෙත් එහි ලා කෝ පතක් බැඳ මූලයට දුන් දෙනු. මූල වැදි නසා.

12. මුරුහා මූල් කසාය කකාරා පස්කුළු බඩු චූර්නය ලා උදය උදය දෙනු. මූල රෝගයටයි.

13. පිටට තික්මුනු මූලයට
මුව අං පුළුස්සාපු කුඩු කට්ටකුමංජල් සමග අඹරා මූලම පිට කුඩු එලනු. මූලම එම විටම බඩට වේ.

14. මීටම
වැල්කරල් ශැබෝ දළු දානා හාල් අඹරා රොටියගිතෙලින් උයා පළමුකොට රොටිය බදිනු.

මීටම

15. රතුළූනු ගෙඩියක් ඇස්ස කපා දමා තල තෙල් වත්කර මුඩියවසා ගිනි අඟුරු පිට තබා පුළුස්සා මදක් තෙරපා දරන මූලම පිට තබනු. එම විටම බඩට වේ

16. මීටම
රතුළුනු, පිත්ත දළු යුස මූල වැදියේ ගා ඉස් මුදුනේ ගා මූලය බඩට වෙනතුරු ඉස් මුදුන පිරිමදිනු.

17. තිපලයට, එරබදු පත් යුසටය අඹින් මංචාඩියක් කලතා ඉස් මුදුනේ පෙකනියේ ගා බොහෝ වේලා අතින් පිරිමදිනු.

බඩවැල එළියට එනවාට

1. ඇස්තිබෙත මොනරපිල්   පිත්ත මල්   උත ලී කුඩු
ඉඹි කබල් පොඩි
එක විතරට ගෙන එක්කර තලා උකු අඟුරු පිට ලා මල මාර්ගයට දුන්පානු. නැවත, දිවිකදුරු කොළ පොතු මිටක් අමු කහ අත්තකුත්, එනු එක පුපුරකුත් සමව කොටා මලවා තබා අමුඩු ගස්වා එක දිනක් තබා හැර දමනු. බඩවැල එළියට එන රෝග නසා ගුනවේ.

සැවැන්දරා මුල්   නෙළුත් අල   සාතාවාරිය මුල්   කලාදුරු අල
මේ කසාය කකාරා උදය උදය කීප දිනක් පොවනු. පලමුවෙන් මේ කසාය දෙනවාය.

2. මිටම: බඩවැල මැත් උනාට
පිත්තපොතු   පිත්ත දළු   රත්කරල් ශැබෝකොල
රතුළූනු
මේවා සමව ගෙන කොටා යුස මීරිකා තබා මෙම රොඩු මලවා තබා අමුඩු ගස්වනු. වැල ඉහලට ඇදේ. එසේ නැදුන නම් මිරිකා තිබුන යුස බඩවැලට අල්ලනු. තුන් දිනක් මේ ලෙස කරනු. ඉහලට ඇදේ.

3. මීටම
රතුළූනු කොටා තලතෙලින් මලවා අමුඩ ගස්වනු. ඇදේ. පත්‍යක්ෂයි.

4. මීටම
ගෙඩි ඇපල කොල කොටා මුත්‍රපැතින් මලවා අමුඩ ගස්වනු. එම යුස මිරිකා ඉබි කබලේ කකාරා ඉසුමුදුනේ ගා ඉබි කබල රත්කොට ඉස්මුදුන තබනු. වහා ඇදේ. ඉසපැත් වත්කරනු.

5. දියමිත්ත, නාපිරිත්ත සහ මුලයෙන් හෝ මෙම දළු හෝ කොටා යුස මිරිකා සිනටි හාලෙන් කැද පිස එනු නොලා තුන් උදයක් දෙනු. බඩවැල ඉහලට ඇදේ.

මී දීකිරිකිලතෙන්ඉස පැත් වත්කරනු.

6. සිවුරුස්ස පළු වතුර සිඳුවා යුස මිරිකා, එලකිරි වත්කර පොවනු ඇදේ

7. මී, දිකිරි, කිලත් හෝ මෝරු හෝ කීප දිනක් පොවනු. බඩවැල ඉහලට ඇදේ.

සියළු වැදියට

1. එනු ඇඹුල්, හකුරු, පැනි, තෙල්, දී කිරි අත අරිනු

2. හිඟුරු පියලි කුඹුක් පොතු අරළු පොතු නෙල්ලික්කා පොතු
මාදම් පොතු
මෙකී පොතු කොටා ඉශ්ම ගෙන කකාරා තලප පදමට ගෙන මී පැතියෙන් දෙනු. එනු ඇඹුල් අරිනු.

3. දනෙං පහල කකුල ඉදිමී පැලේද දිව කට කෙල හිදේද, ඉශ කරකනවාද, ඇඟ දාඩියද කපාල සන්නියේ ගුනයි.

මීට බේත්
කිකිලි බිජු රතු මද තඹා තල තෙලුත්,ගොමුත්‍රත් එක්ක ගානු. ගුනවේ.

4. ඉශ බරලාද, ඇඟ මතද, කත් දෙකකුත් කනකුත් කකියාද යන්තං උනද ශෙලෙව්ටුම කාශා කියන ලෙඩේ ලකුනුයි.

මීට බේත්
තිප්පිලි වශාවාසි කරාබු කළුදුරු
සුදුදුරු සුදුළූනු කෙප්පු වෙලිපරිත්ති
මෙකී බේත් කලඳ කලඳ ගෙන දෙහි ඇඹුලෙං අඹරා කොටිකාවක් විවර ගුලියක් තනා වේලකට ගුලියක් ඉඟුරු ඉශ්මිං දෙනු. කුඹුරු වියෙ බත් කිකිලි බිජු කනු.

5. ඇස් දෙක රුදාවද, කත් දෙකම නැහේද, මූත්‍රා වැවේද, ටික ටික උනද, දත්කුරු කාද, මිනිස්සුගේ මූන නොබලාද මේ කියන ලෙඩ ආන්ත්‍රා පිත්ති කියන ලෙඩයි.

මෙයට බේත්
කොත්තමල්ලි
පුදුළූනු
වලහ සාල්
මනෝශීල
කුරුදු
තිප්පිලි
කයිප්පු
ඉඟුරු
නෙල්ලි
ගෙන්දගන්
වද කශා
අරළු
මෙකී බෙහෙත් කලං බාගේ බාගෙ ගෙන එරඩුතෙල් එක්ක දමා එකවල්ලක කකාරා බානු. යටි පතුලේ අඩෙකල පැත්ත ඉශමුධන මුදුං ඇට දිගේ ගානු. පාදංඩ ගැවොත් ඉරමුදුං වේලාවට උයාපු හාලේ බතුත්, මිරිශ් හොදිත් එක්ක බත් දෙනු. ශැත්දැවේ ගැවොත් රෑ බත් දෙනු.

මකොදර බික්කං කියන ලෙඩට

දිව තොල කළුවේද, මූන ඉදිමේද, ඉශ්මුදුන ඉදිමේද, කකියාද, අංශයක බඩ පිපේද, බඩ ගශායේද, මකොදර බික්කං කියන ගුනයි. නාහේ ඇහිරේද, දිව කොටවේද, ලැපැත්ත ශෙලෙශ්මාද ගල ග්‍රහ ගුනයි.

මීට බෙහෙත්
හිඟුරු පට ඉශ්ම, කළුදුරු, පෙනෙල ගෙඩි
තල තෙලිං අඹරා දෙහි ඇඹුලෙං දෙනු. ලැපැත්තෙත් ගානු.

උලකතිසුලං කියන ලෙඩ

අත පය රුදාවද, ශෙලෙශ්මා ආදිද බඩ උශ්මුරුත්තද, දෙතුන්දවශක්ම පශ්ශෙ කහලනේද ඒවා වේලි බෙටි වැටේද උලත්තිසුලං කියන ලෙඩේ ගුනයි.

ඇස් දෙක බරද, වායු ඉශ්මතුවේද, දිය තිපාශද, බඩ ගිනිද, පාත්දර තිදී බෝද ඇශ කට අරිනට නොදේද, මහෝදර කියන ලෙඩේ ගුනයි.

අත පය ඉදිමේද, මූන මශ් වෙවුලාද, හොදට මේ ගැන දැන ගනු.

කහල එක්ක හැරවයේනම් පනයනවා තියමයි. බඩත් කකුලත් එක හැටී ඉදිමේද ලැපැත්තෙන් නාර වැල් ඇදුංදේද ඇහ තිගශී. මද මේ ගැන ධුටුවොත් වෙදකං නොකරනු. නගිනවා තියතයි.

තෙල්කා ලැපැත්තේ ගානු. ලුණු ඇඹුල් හකුරු දෙනු.

මී පොතු   මගුල් කරඳ පොතු දෙමට පොතු

මෙදේ ඉශ්ම මීරිකා තල තෙල් මනාවයි කෙහොඹ තෙල් මිටයි, පලමු කී බේත් කැකැරි එත පදමට තෙල් දෙවගෙත්වත් එකෙකට තිකුළු, දෙවධුරු, අරළු, වැල්මී මේ හැම චූර්ණ කොට තෙලට දමා තලප පදමට බා තිබා දවශකට පුවකර ගෙඩියක් පමන වලදනු

කුඩුරුවල මැස්සන්ට

කවුඩු බෝ මුල් ශතයි තිල් කටරොළු මුල් ශතයි

මේ දෙවගේ කකාරා පැත්ගෙන කෙංකොල යුශ අප්පල්ලයක ලා කකාරා යුශ ගෙන වෙල් මැද උශ් මඩුවක තනා ඇති බෙරේක මේ බේත් දෙපිට හමේ ගා බෙර ඇශ තමඩුව මඩේ ශිට බෙර දෙපිටිංගසනු. අඩ ඇශෙනවාතේ කුඹුරුවල මැශෝ යෙත්.

අෂ්ට විධ මුල ව්‍යාධියට

දැම්තිරිය යුෂ පතයි කීකිරිදිය යුෂ පතයි

මුගුණුවැන්නයුෂ පතයි රතුළූනු යුෂ පතයි

එලගිතෙල් පතයි මෙකී දේ එකට යොදා දෙදවසක් පසු කර දෙවනු ලිප තබා ඉටිපදමට ගෙන වේලකට තුන් කලදක් වලදනු.

මුගුනුවැන්න කායම සැම මුල අරිසස්වලට යහපති.

බඩින් යනවාට හීන් තඹල දිය දෙනු.

බඩින් යනවාට දිය මතුරු දෙනු.

මන්ත්‍ර
කඩත්ත ගී කාරම් හුවයි ඕං යාවිත් පාපඑං
ධම්මු ධම්මු ච එක්තුතුයි කත්පී
කත්පීක් කොඩුක්කුරු මල්ලංවන් කුඩින්කවන්
එලිත්තින් තේ ස්වාහා
බඩින් යනවාට අටතුරාශියක් දිය මතුරා දෙනු.

ඉක්කාවට

සිද්ධිගුරු තල් හකුරු
මී පැනියෙන් අඹරා පොවනු.

ගලක්කාරයට

මොනර පිල් දවා අළු ගෙන තල තෙලෙන් ගාටා දිවුමුල ගානු. ශිටි

දොඩං ඇට එනු ලා ගැට තුඹ කොල ඉස්ම තල තෙල් එක්ව උරච්චි කර කටින් බොත්තට බැරි නම් නාශේට වක්කරනු. ගලක්කාරෙ ශිටි

ළමයින්ගේ උගුරෙ ගුරු ගුරු ගානවාට

අරළු වැල්මී අතිස්
කලන් තුන තුන බැගින් කිරා පත අට එකට සිඳුවා එම පතට පුකිරි තුන් කලඳයි ශිති තුන් කලඳයි දමා පැති ය ශාදා කටේ ගානු.

ශෙමට කට සෝදන්ට කසාය

සමන් පිච්ච කොල තුන් කලඳයි අමු ඉඟුරු තුන් කලඳයි
අරළු තුන් කලඳයි තෙල්ලි තුන් කලඳයි
අට පත එකට සිඳුවා මී පැණි දමා කට ශෝදනු.

අනෝදා කොල තම්බා මී පැති දාමා කට සෝදනු. රහ දිය කා තිබුනත් දත් වලින් එලියට වැටෙයි.

ඇන්ද්‍රා පිත්තාවට

අරුද කටුවැල්බටු කලාඳුරු අල ඉඟුරු
පත්පාඩගන් සවුකෙන්ද අල ශඩුං
මී මල් මෙකී බෙහෙත් කොහොඹ තෙලිං අඹරා ඉඹුල් ඇට පමන ගුලිකොට

කොහොඹ තෙලෙං අන්ජනං දෙනු. මතු හැම ලෙඩටම තෙලයි

කල්ලිවාදන් කියන ලෙඩට

ශාදික්කා වශිවාශි අශමෝදගං සුඩු එැනු
දේවදාර කලාඳුරු අල අරළු තෙල්ලි
බුළු
මෙකී බෙහෙත් පශ් පශ් කලං ගෙන රටල කොල ඉශ්මිං අඹරා රඹුක් ඉශ්මිං ශතියක් දෙනු. වරකට එක් ගුලියකි. එනු ඇඹුල් වලකිනු.

පිත්තභ්‍රමාතිකත්වයකට

කොශඹ පොතු අඹරා කකාල දිය පොවා වමනය කරවනු.

කොශඹ මුල් ඇශල මුල් පොතු
එක විවරට ගෙන අඹරා අවශ්‍ය පමන ඇඟ උලා ගල්වනු.

කට්ටු මුට්ටුවට

වෙඩි එනුත් කරල් ශැබෝ කොලත්, මළුත්
පුළුස්සා ඒ අළුත් වෙඩි එනුත් දිය කර පැදෙන්ඩ තබා දෙනු. කට්ටු මුට්ටු ඉගිලේ.

කද ගැට රුදාවට

කපු කොල යුශ මිරිකා කකාරා මී පැනිත් දෙවගේ එක මට්ටමට කලන්දු කොට දෙනු.

මිරිශ් උදය විරේකට දෙනු. දී කිරිත් උයා පු ශාලේ බතුත් දෙනු. ශීටි.
ඇල් දියට ශිටි.

ශඩුං දෙනු. සිටි.

ඉශ්මුදුනේ මදිච්චි කරවනු. බඩේ ගානු. හීන් උඳුපියලි ඉස්ම පොවනු. සිටි. තිදි කුම්බා ඉස්ම පොවනු. සිටි. ඉරමුසු ඉස්ම පොවනු. සිටි.

එක අතකුත් එක පයකුත් රුදාවද මුත මශ් නටාද ඉශ්මුධුන ඇවිලේද එක කනක් අගුළු වැටේද දෙවනුව ඇරේද ඇහැ කර කැවේද, මන්දරාගතිහේම මොකවත් දැනේද මුතීතා කිහරුජාද පුරත්ති කියන ලෙඩේ ගැනෙයි.

මීට තෙල්
හිං කිරි වැල් මුල්, ඇත් වනස්ස මුල්, කටුතුඹමුල් , තිප්පිලි
වශිවාශි ශාදික්කා අශමෝදගං ශත කුප්ප
වැල්මී සුධුළුනු සිද්ධිගුරු හිඟුරුපියලි
එත්ෂාල්
මෙකී බෙහෙත් තුං තුං කලඳ ගෙන කොහොඹ තෙල් මනාවක් ගෙන මෙකී බෙහෙත් අඹරා තෙලට දමා තෙල් පදමට බා පෙරා තිබා ලපැත්තේ ගා පනම් බාගෙක බර බඩට දෙනු.

වොප්පුසාවො කියන ලෙඩේට

ශීතක්කාරං හත් කලඳයි අබිං තුන් කලඳයි

ශවීන්ද එනු දෙකලදයි   වැල්මී දෙකලදයි
ශැඩු රැනු දෙකලදයි
මෙකී බේත් කුප්පමේනිය ඉශ්මිං අඹරා දෙවතුව රඹුක් මද ඉශිං අඹරා එල කිරි පත පත බැගිං අඹරාගෙන මේ බෙහෙත් දිය කර තුන් වේලක් දෙනු.
අල වතුකං , . මුරුංගා පලු , කිකිලි බිජු
එනු ඇඹුල් වලකිනු.

පඩතාමරට

සුඩුලක් පැති   දේවදාර
කුර කොල ඉස්මිං දෙනු.
කයිල මුල්   සාරන මුල්   අත්තික්කා මුල්   මුරුංගා මුල්
මෙකී දේ කොටා වේලා කුඩු කර කරවිල කිරෙන් අට දවශක් දෙනු. පඩතාමරා ගුනවේ.

සෙලෙස්මා වායු කිපීමට

ශිත් වකුටු කුඩුසේ ම බඩුළ ඔඩුපැවුන් ඇතිව කැශුං ඇත්නම් පත් මීතලත්ත නම්. ගුදභ්‍රශය යයි තදින් ලේ පිටවීම යයි ඊට තෙල් ගා තවනු. ඇතුල් කරනු.

වඩුරුවලට

මලමීයගේ ශමගශා බඩවැල් කුනුහැර කකාල දිය ගෙන එල කිරි, තල තෙල්, එක්කොට තෙල් ශිද පදමට පෙරාගෙන පොවනු. වඩුරු නැතිවේ.

වඩුරු

පෙනුනුකැනම උදැශන කොමාරිකා පල්ලෙ මද ඇර ශුඩු රැණු එක්කොට අනා දිය පාවර දැන පොවනු. වඩුරු නැතිවේ.

පුරවියමට

රශකිද වේලා කුඩු කර රෙද්දෙං පෙරා කොටිකා ගෙඩි තුනක් ලැටි ගා කොටා කුඩු කර ඔලිද කොල කොටා කුඩු කර මෙකී බේත් එක්කර කළුපාට වෙනතුරු බැද දෙවතුව පොඩිකර රෙද්දෙං පෙරා කලං බාගයක් අමු මී පැනියෙන් දෙනු.
එනු ඇඹුල් අත හරිනු.

කුර තම්පලා
මුරුංගා පළු, කොල, කනු. ඉතිරි දේ අත හරිනු.

රශදිය ශින්දූරං කලදයි සාදිලිංගම් කලදයි
ගෙන්දගං කලදයි යහුනුතුත් කලදයි
තඹ පොඩි තුත් කලදයි
කිකිලි බීජු සුදුමදෙත් අඹරා ගුලි කර යහුනුමල තවරා රෙද්දෙ ඔතා එල ගොම වැරටිවලින් හතර ජාමෙම පුළුශ්ශා අළු ගෙන
ශාදික්කා වශිවාශි කරාබු තිප්පිලි
කළුදුරු ඉඟුරු
මෙකී බේත් ශම බාග ගෙන කුඩු කර පඟුව කුඩුත් එක්ක කලබා ගිතිකොට ඇහිලි දෙකිං ඇල්ලු පමන දෙනු. හැම ලෙඩට ඖෂධවේ.

ඉදිමුමට

අරළු කොත්තමල්ලි තිරස්පවාළු
තුං තුං කලද ගෙන දියවර තුනක් ගෙන එකට කකාරා දෙනු. ඉදිමුං ගුනවේ.

වසූරියට

ලුනුවිල සහමුලින් ගෙන කොටා ඉස්ම පතකට සීනිපලමක් දමා උදේ උදේ දෙනු.

සවින්ද එනු ඉඟුරු අරළු
වේලි කශා මෙකී බෙහෙත් චූර්ණ කර බැමිතිරිය යූෂ පතකට දමා වලදනු. වසූරි හගන්තර එහි නුපදී. සීනි දමා දෙතොත් හොදයි.

වසූරියට උන ගත්තාම දෙන කශාය

ඉඟුරු ඉරිවේරිය සුවද හොට වම්මුතු
සඳුන් පත්පාඩගත්
කලත් දෙක දෙක බැගින් කිරා මතා අට එකට සිඳුවා පස් වරුවට දෙනු.

වැල්මී කොහොඹ පොතු ලුනුවිල
කශාය කර සීනි දමා දෙනු.

ඉඟුරු කොත්තමල්ලි කොහොඹ පොතු
වැල්මී කසාය කර දෙනු.

ඊට විරේක

ත්‍රස්ත වාළු කුඩු පමණට ගෙන හීනි සහිද එනු මෙම සතර පඟුව තැඹිලි ගෙඩියක ඇශ්ශ කපා සවශට එහි තුල දමා තිබා උදේට පියන ඇර දමා හොදට එම වතුරට කලවත් කර දෙනු.

වැල්මී දොළොස් කලඳක් කිරාගෙන පත අට එකට සිඳුවා එක පමනට ප්‍රස්ථවාර කලන් 2 සහිද එනු කලං එකයි සීනි කලං 2

රසදිය කසායට සිද්ධිගුරු සුනු මිශ්‍ර/ කොට වලදනු. කවිය, පිට පාදය පාදය සිහින් කකුල යන මෙකී තැන්හි රුජා නසා.

තෙල්ලි සදුන්
කැකිරි ඇට හෝ වම්මුතුයන මෙකී දෙසමසේ ගෙන චූර්ණ කොට මෙම චූර්නයෙන් තුන් කලඳක් කිරා කාඩියෙහි කලතා වසූරියට ආරම්භයෙහි පලමු කොට දෙනු. වසූරි නුපදී.

වසූරි තාල්ලන්ඩ කවඩියක් මැදින් විද රණ්දිය හාලටයකින් පඟුවක් පමන දමා පෙරුත්කායත් වලින් ඇසුරා රෙදි ඔතා අතේ බඳිනු. ශේරෝම එකට කලවන් කර දෙනු. විරේක උතායින් පසු වැල්මී විසි හතර කලඳක් කිරා මතා අට එකට සිදවා සිනි දමා සැරෙන් සැරෙන් දෙනු. මතු උතායින් පසු එක්කොට දැන ගත් හැටිය
එනු විල ඉස්ම සීනි කප්පුවල්ලි ඉස්ම එඬරු තෙල්
එක පමනට ගෙන කලවත් කර උදේ ශවශ දෙනු.

කොත්තමල්ලි කලං හයයි අරළු කලං හයයි
පත අට එකට සිඳුවා එඬරු තෙල් දමා දෙනු.
මතු වී දොස් සමන කර ගත්ට දෙන කශාය අරළු වැල්මී, එනු විල රතුඑනු.
තිශි විධියට කශාය කර දෙනු. ප්‍රත්‍යක්ෂයි.

පසුවට ගායට දෙන කශාය

1. තෙල්ලි දොලොස් කලඳක් කිරා මතා අට එකට ශිඳුවා තල තෙල් දමා දෙනු. වේලයි.

මසන් කොල තොව්වි කොල එනු විල විෂ්නු ක්‍රාන්ති
කළු දුරු රතුඑනු සුදුදුරු
ගම්මිරිස් පියලි කරපුවා කොත්තමල්ලි තිසි විධියට කශාය කර සුකිරි කුඩු දමා දෙනු.

'තිමට දෙන කශාය

සුදුරු කළු දුරු කොත්තමල්ලි පිලයි කරපුවා
තිප්පිලි සුදු සදුන් කොල්ළු පත්පාඩගත්
මශන් කොල තොව්වි කොල ශෙන්බු
තෙරෙංවි එනු විල ඉරමුසු පොල් පලා
විෂ්නු ක්‍රාන්ති අස්වැත්ත

නිශි වීධියට කිරා කසාය කර සුකිරි කුඩු දමා දෙනු. තද බල ඇති අයට දෙනු. මෙම බෙහෙතේ වලට කැමති දෙයක් කන්නට පුළුවනි.

ඊට ඉශ රදේට

සුදු හඳුන් එලගිතෙලෙන් උරච්චි කර ඉස් මුදුනේ දමා හොඳට මදිච්චි කර ඇහැ බැම්මට ලැය දෙපැත්තේ උගුරේ කතා නොකර කෙම විධියෙ කරනු.

වද කහ ඉඟුරු වෙදා විකා ලෙඩාගේ කන් දෙකට නාශෙට පිඹිනුං

ඊට තෙපුල්
අරළු ගෙඩියයි නෙල්ලි ගෙඩියයි හොඳට සුද්ද කර තලා පොට්ටනියෙ බැඳ කුරුම්බා ගෙඩියෙ ඇස්ස කපා දමා තිබා තෙපුල් දෙනු. ප්‍රත්‍යක්‍ෂයි.

ඊටම කතා නොකර කොත්තමල්ලි මිටක් අරන් දිය බත්හැලියේ දමා තිබා තෙපුල් දෙනු. මුරුංගා මල් තෙපුල් දෙනු. පිච්ච මල් තෙපුල් දෙනු.

ඊටම් තෙපුල
සුදු හඳුන් වැල්මී කරල් ශැබ කොල රශ කිඳ කොල
ශීත් ගෙද එක එක පමනට ගෙන කෝමාරිකා ඉස්ම තන කිරෙන් තෙපුල් දෙනු.

ඊටම උගුරේ ආවම කැපෙන්ට දෙන ලේහ
කළු දුරු මදුරු තලා කරල්
ඇඹුල් දොඩන් ඉස්මෙන් ශිතිදුව අඹරා කැපෙන්ට කටේ ගානු.

ඇහෙ වන උනාට ගාන්ඩ

1. කොහොඹ කොල අමු කහ
   ශිතිදුව අඹරා ගානු.

2. ඇහැට දමන්ඩ ප්‍රත්‍යක්‍ෂ තෙපුල එනම් අරළු ගෙඩියයි නෙල්ලි ගෙඩියයි හොඳට සුද්ධ කර වැල්මී කොත්තමල්ලි මෙම සතර පඟුව එක එක පදමට අරං තලා පොට්ටනි බැඳ කුරුඹා ගෙඩියක ඇස්ස කපා එහි තුල දමා පියන වසා උදේ අරං එම වතුරෙන් මෙම තෙපුල් දෙනු. අත්දුටුවයි.

තෙපුල වසූරියට

ඊටම වසූරි නවතන්ට කසාය
එනු විල කොහොඹ පොතු අරළු වැල්මී
කශාය කර ශීනි දමා දෙනු.

ඊවම

දැත් ගත හැවිය කප්ප්‍රුවල්ලිය රතුඑනු, ලුනුවිල මෙම තුන් පත්ගුවෙං එක එක වශෙං ඉශ්ම ගෙන සියයකිං එකක් පදම් ගෙන ඊට එඩරු තෙල් දමා තුං වරුවක් දෙනු. ඉතා හොඳයි.

කටේ ගාන්ඩ පැතිය

උක් පැති　　කප්ප්‍රු වල්ලිය ඉෂ්ම　　පැණි දොඩන් ඉස්ම
රතුඑනු ඉස්ම　　සුකිරි
මේ සේරම දමා පත් පැති පදමට තනා කටේ ගානු. කෑම කංඩ බැරුවාට ප්‍රත්‍යක්ෂයි.

වේලවිල්ල හා ශෙම ඇවිත් උගුරෙහි තිබෙනවාට

උක් පුරුක්.
විකා ඉස්ම බොත්තට සාදන
අමු ඉඟුරු ඉස්ම පදමට අරන් එපමන මී පැති ගෙන තිප්පිලි කරලක් පදමට කුඩුකර ඊට දමා ලෙලි ඇර උක් පුරුක් හීන් කර ඉරා දෙකක් පදම දමා උක් පුරුක් වලට අල්ලා ගන්නා පොක් කකාරා අරන් වසූරි රෝග කාරයාට විකා කෙල ගිලින්ඩ දෙනු.

මදාත්‍යට

එනු　　තිකුලු
මෙකී බෙහෙත් අඹරා එලගිතෙල් ඇල් දියෙං කලතා පානය කරනු. දිරා ගිය තල පොවනු. වාතයෙන් වූ මදාත්‍ය නසා.

ඩෙබර ඇඹුලෙන්　දෙළුම් ඇඹුලෙන්　අශමෝදගං　　ශවින්දව
විලද
මෙකී බෙහෙත් අඹරා එලිගිතෙලින් හෝ තල තෙලිං හෝ පොවනු. වාතයෙන් වූ මදාත්‍ය නසා.

පිත්තයෙන් වූ මදාත්‍යට

මී පැති　　ශිනි
එක් කොට ඊට අඩයක් දිය එක්කොට පොවනු. පිතිං උපන් මදාත්‍ය නසා.

ශෙලෙස්මා මදාත්‍යට

වමන බෙහෙත් එක්කොට පොවා වමන කරවනු. මඩය බලවත් වී නම් ලඟන විය යුතුය

වැල්මී ගොදිවු මුදිරප්පලම් නිදි කුඹ
කිරි අඟුළු නෙළුම් මල් රශකිඳ
මෙකී බෙහෙත් අඹරා රායෙන් පොවනු. හැම මදය නසා.

සිද්ධිගුරු වග පුල්
මිරිස් පොඩි කොට තිපල් කසායෙහි කලතා පොවනු.

සුළු බුරුද වැල්මී මේ දෙක අඹරා බැලිල හෙල ශිරිවැඩියා කකාල කසායෙහි ඇඹරූ බෙහෙත් එහි ලා එල කිරි එලගිතෙල් සමසේ ගෙන කකාරා තෙල් සිඳ අනුබව කල කලක්‍ෂයරෝග ආදි මේ දේ නසා. සියළු රෝග නසා.

ගලක්කාරයට

මොතර පිල් දවා අළු ගෙන තල තෙලෙන් ගාටා දිව මුල ගානු. සිටී.

මීටම දොඩන් ඇට එනු ලා ගැට තුඹ කොල ඉශ්ම, තල තෙල් එක්ව උරවිවී කර කටින් බොන්නට බැරිනම් නාශේට වක්කරනු. ගලක් කාරේ සිටී.

ශීපද චිකිත්සාවට

උපනාහ බැඳිමද තැවින්ද, ලේ හැර විමද, වමන නශ්‍ය විරේක, ඛඩව තෙල් විදීමද, කශාය විදීමද කරනු.

ශෝපයට කී පිලියං කරනු. ශෙලෙශ්මායෙං උපන් ගඩු තෙල්ලි පමනව තෙලෙඹි වෙයි. කල් වැඩිය ගඩුනම් බොහෝ කල් නො හැරේ.

ගඩ මාලයට

මහා අගුන ශුඹුළු ගෙන අඹරා දිය ශතර නැලියකට තල තෙල් නැළියක් එක්කොට ඇඹරූ බෙහෙත් පතක් එහි ලා කකාරා තෙල් සිඳ ගානු. [illegible]

කොශඹ කිහිරි මෙකී පොතු අඹරා කකාරා ශිදගත් තල තෙල හෝ නොහොත් තිකත් තෙල් නශ්න කරනු.

ගඩුව නොපශුන කපාහැර වන මූනත උලා පිලියං කරනු. පැශුන කාරං සිඹ වනය ශුඩකොට පිලියං කටයුතු කරනු.

බඩ වැල පාත් වෙනවාට

1. අඹ දළු මිටක්ගෙන තල තෙලෙන් මලවා බත් එක්ක කඩ දෙනු.

2. මීට මිරිස් මීටක්, එනු මීටක්, වනේලා කොටා පොට්ටනි බැඳ කට පිම්මෙන් උයා තල වඩී අරක්කුවෙන් තෙමා අල්ලා බඳිනු. එවෙලේම සිටී.

උදු ගොව්වාට

1. රත් නෙටුල් මුල් දෙහි ඇඹුලෙන් ගලගා දෙතුන් වලියක් ගානු.

පල්මාතික්කන් රිදී යසුනු අරළු
සමකොට දවසකට දෙතුන් විටක් දමනු.

යක්බේරිය කොල සතාවාරිය
උදුගොවුවාටයි

මකුළු වැන්න ඉරමුසු මෙකී යුස ගෙන තුං තුං ඇවර අඹරා හිරියල් තිකුළු සුනු පාත්කඩ අඹරා අං කරනු.

කැඩුම් බිඳුම් වලට

දොඩම් කීපයක් කකියවා ගුරුල්ල සීත් කොට පොට්ටනි බැඳ ඇඹුලෙං ගා තවනු.සොත මැද ඇඹුලෙං ගා තවනු. සොත නැතිවේ.

හෙලිකිරිබිජු, මී පැනි, පොල් කිරි, තුන අනා බිඳුනු තැන ගානු. සනිදිවේ.

තැල්මට බේත්

හික් පොතු කොරකහ පොතු තලා කහ එනු ලා එඩරු කොල අකුලා උන අළුවෙන් උයා තැල්මෙ බඳිනු.

පර පොතු කැලිය පොතු රදිලිය පොතු කොර කහ පොතු මෙකී දේ ඉණ්ම මිරිකා පා හැදිගානු.

අනෝදා කොල පොල් කුඩු එක්ව කොටා මලවා බඳිනු. තැල්ම ගුනවේ.

කැඩුම් බිදුම් තැවීම් වලට

රත් ගොරක කොලයි පොතුයි කොට දිඹුලා කොලයි පොතුයි පැනිගොරක කොලයි, පොතුයි අහු කොල පොතු කෙසෙල් කොල, ඇටි කෙහෙල් කොල හම පිරිල් ලකොල මෙකී කොල කොටා පොල් කුඩු එක්ව මලවා බඳිනු. යහපති.

මීටම පත්තුවට

වියත් දුඹුළු ගුරුගල් ලිප මැදි අළු මෙකී දෙ පරත ගොරක ඇඹුලෙන් අඹරා උණු කර ගානු. ඉතා යහපති.

සන්දි බිදීමට

කුඩු මිරිස්ස කොල, පොතු කැප්පිටියා කොල පොතු
කැසිපිත්තන් කොල පොතු
එනු පොල් කුඩු ලා කොටා මලවා බදිනු.

බේදුරු අල ගොවි කොල පෝටා පහුරු ලෙවා කොල කහ එනු ලා කොටා මලවා බදිනු.

කොටිකන් බැබිල දළු ගුරුල්ල දළු එක්ක පොල් තෙල් අතා ඇඟ ගානු. පදමට ගෙන යකඩ හැන්ද රත්කර පුළුස්සනු හොඳයි.

බගන්ත්‍රයට පිළියන් කියනු ලැබේ:

මලමාර්ගයට දෑඟුලකින් පිටත රුජා ඇතිව ඇතිවුනු බගන්ත්‍රය දත යුත්තේය.

ඒ පස් පිළිකා කෙනෙක් වෙති. වාතයෙන් වැවු දැඩිව විදිනා වැතිව අරුනුවන්වූ වනෙහි සත පොතක නමවේ.

පිතින් උපන් පිළිකා රතෙයි උෂ්ටග්‍රීව නමවේ. ශෙලෙශ්මාවෙන් උපන් පිළිකා කෘශයි. වණවේ. ශුධවේ. පූජශ්‍රවී නම් වේ. තුනෙදශින් උපන් පිළිකය මෙකී හැම ලකුණු වේ. ශධුකා වර්ත නම් වේ.

අහර වැලදීමෙන් ඇටකටු ආදියෙන් වාද බැලීමෙන් වන පිළිකය පාර්ශ්ව පිළිකය උන්මාර්ගී නමවේ. මෙකී හැම පිළිකා ශිල්වූයේ බගන්ත්‍ර නමවේ. තුන්දෙසින් වූ පිළිකය හා ඇටකටු වැදීමෙන් පැලීමෙන් වූ පිළිකය සහ මෙකී දෙදෙන අශාධ්‍යයයි. ඇරපිය යුත්තේය. අතිකුත්දෙනා වෙදකන් කොට සුවකට හැකිවන්නේය.

මෙකී පිළිකා පැශෙනට පලමුව විරේක කරවා බෙහෙත් ආලේප කිරීමෙන් සුවකරන්නේය.

බින්න පිළිකාවට පිළියන් කියනු ලැබේ.

ඒ ගති නමතාශාරාශය ගතිබැල්මෙහි ගඩුවට හැර එවනයට පිළියම ක්‍ෂාර තිබීම, ශැත බැඳීම මෙකී ආදී කිරියා කොට පශුව වනයට පිළියම් කරනු.

1. ඇශල පොතු, කශා, රංවන් කැල, මෙකී දේ වියලා පොඩි කොට මීයියෙන් ගා එලගිතෙලින් ගා අනා සූත්‍රවස්ති දෙකේ. රදු සුත්‍ර නම ලනුව වස්ති නම් පාංකඩය මෙකී දෙදනාගෙන් සුදුසු දෙයක් ඔඩුවෙහි ඇර කීප දවශකින් කළ කල වනය සුධවෙයි. ගතිනශා.

2. ත්‍රස්තවාළු, පින්න කොල, දෑත්ත අල, වැල්මදට, කශා, වෙනිවැල්, රශ අඩුන්කොල මෙකී දේ අඹරා ආලේප කරනු. තැලිවන හා බගන්ත්‍ර නශා.

3. තිකුළු ශකුරු ගෝමුත්‍රයෙන් කකාරා බොල්වූ පදමට ගෙන අත මා පට ඇහිල්ලක් ශා පෙතක් අඹරා කකාල කල එහිතවරා ගුදයෙහි ඇතුලට ශතර අගුලක් පමන කොට තබනු. මදක් කල් තබා ඇරපියනු. මලය වාතයවේ. මෙ වශ්ති තිබීම නම්වේ.

බගන්දරයට:

1. තික පොතු, රුක් අත්තන පොතු, අරළු, ශිඩිගුරු, මිරිස්, සියඹලා කොල ඉණ්මෙං අඹරා මදක් උනුගන්වා ගඩුවෙහි බදිනු. ගඩුපොල විකායෙයි.

මුහට

එනු එලගිතෙලින් අඹරා කට තියා ඉදිනු මුහටයි.

බගන්දරා ගඩුවට:

2. තිකදළු පොතු, අරළු, මිරිස්, සිඩිගුරු, සියඹලා කොල ඉසෙමං මලවා බඳිනු. බගන්දරා විකායෙයි.

3. පුපුලකොල, කුඩුමිරිස් කොල, කුඹුරු කොල, මොනරළස කොල, තික කොල, ගඳපාන කොල, අරළු, බුළු, නෙල්ලි, සිඩිගුරු, පස්කුළු බඩු, කරාබු, වසාවාසි, සාදික්කා, මෙකී දේ කොටා මලවා බඳිනු. බගන්දරා විකායෙයි.

4. මීමුල්, එනුවරා මුල්, කරඳමුල්, රත්නෙටුල් මුල්, මුරුංගා, කොටා මලවා බඳිනු.

හුබස් බන්දනෙට:

5. හිරැස්ස පළු, හින්තඹලකොල, සියඹලා කොලපොතු, ගොන්කැකිරි කොල, අවරි කොල, මෙකී බේත් කොටා එලකිරි එක්ක ඉස කුලිච්චි කරනු. දියවත් කරනු.

6. දෙමට මල්, රත්මල්, වෙලාකොල, දෙහි ඇඹුලෙං අඹරා ගානු. හැම විසාදි සොර වියල් මැකේ.

7. මීට තෙල් කියනු ලැබේ.

රනවරා, නෙටොල්, රුක්අත්තන, එරබදු, ගන්බිරිස්, මෙකී පොතු, කිරි, අත්තන මුල්, මදුරු මුල්, කෝමාරිකා, පතුක් කොල, ඔලිඳ කොල, කිරිඅඟුන කොල, මුගුනුවැන්න කොල මුල්, කීකිරිදිය මෙකී බේත් කොටා මිරිකා තලතෙල් වත්කොට කකාරා දුරු දෙවගේ, පල්මාතික්කං, ඉඟුරු, මිරිස්, අරළු, බුළු, නෙල්ලි, මෙහැම පොඩිකොට ලා තෙල් සිඳ ඉසනා නාසාභ්‍යංග කරනු. බගන්දර ගුණවේ.

බගන්දර ගඩුවට:

8. ඇහැල දළු ගිතෙලින් මලවා උදය වලඳනු. ඉසපැන් වත්කරනු.

9. මීටම කුරුඳුමුල්, හිරැස්ස මෙම සරියට ගෙන සැලකලා අට එකට කකාරා මීට සරක්කු සුදුදුරු, පල්මාතික්කන්, තිත්ත කපුරු දමා පදමට බානු.

බගනත්‍රාවලට පැශවා ශිල්වු කල:

10. තිපල් තුං පලමක් ගෙන දිය දෙලොස් නැලියක් වක්කොට ශතරට ශිටුවා කකාරා පෙරාගෙන වනය ශෝද්ද බලා ගෙරිඇට ගෙන දෙඩං ඇඹුලෙං හා පාංකඩිං වනය ඇතුලේ ඇර පිටතත් ගානු.

බඩ ඇතුලට කඩ බෙත්:

රසදිය දශ කලඳක් ගෙන ගඳක දශ කලඳක් ගෙන කෝමාරිකා ඉශමීන් අඹරා උඳුඇට පමන ගුලිකොට වියලා තැවූං අපලයක ලා තබා තිසිවලඳකින් තැටියක් තනා බෙහෙත් වශා මතුපිටින් වශා සත්වාරයක් රෙදී මැටි බැඳ ගොම රැටි අළුවෙන් වශා මැටි බැඳ පෙරයම මද ගිනියන් කොට මැදයම අරිටවඩා ගිනිකොට අලුයම අරිට වඩා ගිනි කොට ශතර යම ශොදට ගිනියං කොට ඉක්බිතෙං නිවුනු කල ගෙන අළුමැටි හැර තබා තැටිය ගෙන දෙහි ඇඹුල් වක්කර තුංජාමයක් අඹරා මැටි ශෙප්පුවක ලා කුක්කුට පුට දෙනු. ඉක්බිති සවරහටවයිනායාවූ කල ගෙන මී පැනියෙං එලගිතෙලිං එක්ක වලදනු. මෙ බෙත් කිරා කාසියක බර ශතලිස් දවසක් කෑ කල අශඩ බගනත්‍ර යන්නාවූ දෙ ශාන්තවේ.

මෙ බෙහෙත උදශන හිශ් බඩ කා ශවශ කල් ගහේ මුල් ශුධළුනු එක්කලං ශමාරක් බැගිං ගෙන කාඩිදියෙන් කලතා ශැඳෑවෙලේ පොවනු. මේ බෙහෙත් කනකල් දවල් නිදි, පැනිරස කැවිලි ස්ත්‍රී ශේවනය වලකනු. බගනත්‍ර චිකිත්ශා නිමි.

ඉක්බිති උදවර්ත චිකිත්සා කියනු ලැබේ:

පක්වාශයේහි කිපුනාවූ අපානවායුමල වියලා වටකෙරෙමිං බලවත්ව උඩුබලා මුලය පිරුනේ මුත්‍රවර්ගීය වැලකුයේ උදවර්ත නම් වෙයි. පක්වාශය නම් පෙකනියට වම්බාගයයි.

ලය බඩ ඇලය පුරා වේදනා ඇතිවේ. ලිඟුයෙහි ශොථ ඇතිවේ. බඩ පුරවා මලබඩය වේ. උන වමනේ ද වේ. කනබිහිරි වේ. පිපාශ වේ. යන මෙතෙක් රෝග කෙරේ.

මිට

ඇඟ තැවීම් ඇඟතෙල් ගැල්වීම, ගුදයෙහි වශ්ති තිබීම බඩට තෙල් විදීම විරේක කරවීම් ඇඟ තෙල් ගැල්වීම් මෙකී ප්‍රතිකාර කරනු.

කකුරුමුවං ගෙඩි ශියං දුඹුළු, බලල් එනු, සවිඳැ ලුනු, කුරුඳු චුර්ණ කර බිලාලයක් දෙනු.

අන්ඩ වායුවට

මිට;

1. හිරැස්ස, තුඹ, තිකකොල, පෙනෙරකොල, පොල්සුනු පලා, සුදුළුනු, සුදුදුරු, උළුවා, ඉඟුරු, මෙවා මිට මිට ගෙන පොඩි කොට කඩපිම්මෙං රැයක් උයා මිරිකා උදය දෙනු. අණ්ඩ වායුවට ප්‍රත්‍යක්‍ෂයි.

මිට;

2. පෙනෙර මුල් යුස එලමෝරුවෙං දෙනු. සවී රුජා අන්ඩවායු නසයි.

මීට

3. කුඹුරු කොල. කුඹුරු දළු. පෙරුංකායං. උළුවා. දුරු දෙවගේ. ඉඟුරු. එඬරු ඇට. සිවිය වැල්. මෙවා මුරුංගා පොතු යුසින් අඹරා ඔලිද ඇට සා ගුලිකර 4ක් දෙඩං බිතක ලා ගිලිනු. සර්මුති සුල නසයි.

මීට

4. එක් මුළුතක් කුඹුරු ඇට පෙරුංකායං මෙවා තල තෙලෙං අඹරා පමනට ගුලිකර එඬරු තෙලෙං දෙනු. මුඩි සුල රුජා නසයි.

මීට

5. කළුදුරු. කරදපොතු. ඉඟුරු. මෙවා කොටා ගෙඩි පිට තිබා බදිනු.

මීට

6. තොල බෝ. ගැටතුඹ. තෝර කොල. කොටා මලවා බදිනු. අන්ෂ මාරු කර පය මාපට ඇඟිලෙල තහර දෙකට මැද ගැසෙන තහර බලා එඬරු මුලින් පුළුස්සනු.

7. සුදුළුනු. තුඹකොල මලවා බදිනු. වන සුවවේ.

8. තික කොල යුස නැලියට දිය සිවු නැලියක් ලා මද උනුසුමෙං අප්පලයක් ගෙඩි යට තිබා තාවනු.

9. අරළු. අබ. කුඹුරු ඇට. රත්තෙටුල්. ඉඟුරු. තිප්පිලි කසා. එඬරු තෙලින් අඹරා දෙනු. රුජා නසයි.

10. එඬරු. කුඹුරු ඇට. සාරන. සිඩිගුරු. සුදුළුනු මෙවා දෙකලං හමාර කෂාය සිද සවිද පෙරුන්කායං දෙකින් කලදක් ගෙන දෙනු. හැම අණ්ඩ වායු නසයි.

11. රසදිය. පුග්කු. ගෙන්දගං. හිරියල්. තාමු බස්ම. ත්‍රිකටුක. ත්‍රිපාල. වචනාවී. කිකිරිදිය යුසින් අරා ඔලිද ඇට සෙ ගුලිකර ඉඟුරු යුසින් දෙනු. සුල වාත ගුනවේ.

12. ඇල්දියට පෙරුංකායන් දියකර දෙනු. සියළු රුජා සිටි.

13. මුරුහා පොතු සිරස්ස පළු කොටා යුෂ ගෙන දෙඩං ඇඹුල් පොල්කිරි සමග කුඹුරැට දෙකයි. සුදුළුනු ගෙඩියයි අඹරා එඬරු තෙලෙන් දෙනු. අන්ඩවාත නසයි.

14. ගුරුල. මුරුවා. සියඹලා. යාකවනස්ස. වැල්ලැහිරියා කොලපොතු. ලෝළු පොතු. කදුරු. රුකැතන පොතු. සිවිය වැල් කොල පොතු. සමග කොටා වෙදු හැලියට රත් කර කිරිවාන ගල් දමා පඹුරු ඇති වත්ගෙඩියක ලා වෙදු පානු. සැලක කඩ වැස්ම බැද මුරුහා කොල මිටක් ඊ පිට තිබා පෙතරකොල මිටක් ඊපිට තිබා සුදුළුනු කුඹුරැට මද දෙකලදක් ඊ පිට තිබා මුරුහා කොලිං වසා අමු පොල් තුවක පොල් ගා ඊ පිට තිබා මතුපිට පෙතර කොල වසා අපපලලයක් උඩිං වසා රැයක් ගිනි දල්වා උදය පොල් වෙං කර එනුත් කුඹුරැට සවිඳ හිඟු ගෙන මුල කී කොල යුසිං අඹරා තබා පොල් කිරෙං සතියක් දෙනු. එනු ඇඹුල් හැර අන්ඩ වාත අතර උදී නසයි.

15 සිරස්ස. තුඹකොල. තික. පෙතෙර කොල. ඉඟුරු. සුදුළුනු. උළුවා. සුදුදුරු. මෙවා පලමු ලෙස තඹා අඹරා දෙනු. අන්ඩ වාත නසයි.

16. පෙතර මුල් යුස එලමෝරෙං දෙනු.

17. එඬරු, කුඹුරු ඇට, උළුවා, පෙරුංකායං, ඉඟුරු, දූරු දෙවගේ, සුදුළුනු, කුඹුරු දළු, මෙවා මුරුලංගා පොතු යුසිං අඹරා ඔලිඳට සා ගුලිකර සතර බැගිං දෙඩං බික ලා ගිලිනු. එනු ඇඹුල් හරිනු. අන්ධවාත නසයි.

18. ඒ බුළුනක් පමනට කුඹුරු ඇට හිඟු ගෙන තල තෙලිං අඹරා දෙනු. අන්ධ වාත නසයි.

19. ඉඟුරු, කරද පොතු, කළුදුරු, ලා කොටා මලවා බඳිනු. අන්ෂ මාරුකර අංකුෂේට නහර දෙකට මැද එඬරු මුලිං පුළුස්සා ඉපිට එනු බික් තුඹ කොල දවටනු.

20. තික කොල යුස දෙකට දිය සතරක් ලා උනු කර අණ්ඩ වායු ගෙඩිය නාවනු. ගුනවේ.

අණ්ඩ වෘද්ධි

1. තෙලින් තැවීම
2. විරේක කරවීම
3. පුඩාවන් ලවා ලේ හැරවීම.

1. එලකිරි හා එඬරු එක්කොට පොවනු.

2. වෙනිවැල් කකාල කෂායෙහි ගොමුත්‍ර එක්කොට පොවන්න.

3. හෙල තලා, මල්තලා, සුවඳතලා, ඉරමුසු, සිහින් මැඩහඟු, මුඩුමහන, කිතිහිරිය කොල, අක්මැල්ල, යකිනාරං රේරු, වලහසාල්, කැම්මෙරිය, කොතුරුබැද්ද

මෙකී බෙහෙත් ලද දෙයක් ගෙන ආලේප කරනු.

4. තෙලින් තවන්නට කී විට - ගිතෙල් තල තෙල් එක්කොට කකාරා රෙදි පොට්ටනියේ තවනු.

5. බෙහෙත් අඹරා ආලේපයට කී විට = තිකුලු, සුදුළුනු ලද දෙයක් අඹරා ආලේප කරනු.

සිහිල් වූ දියෙන් පරිශේක කීවිට -

1. නුග දිවුල්, ඇසතු දඩ පොතු කකාරා තිවා ගන්න.
2. කෙහෙල් බඩ කොටා මිරිකා ගත් දිය.

1. මිරිස්, අරළු, ඉඟුරු, සුදුදුරු, වගපුල්, අසමෝදගම්, සමව චූර්ණ කර එඬරු තෙලින් අනා උදේට වලඳන්න.

අඩ වාතයට කශායට:

1. සුදුදුරු, එඬරු මුල්, වැල්තිබ්බොටු මුල්, පොල්කුඩු පලා මුල්, මිරිශ්, ඉඟුරු, වගපුල්

මේ ශම දෙලෙස කලඳක් කිරා ගෙන දිය අට පතක් එක පතට සිඳුවා ගත සවිඳ එනු. පෙරුත්කායන්, යවකාර එනු පොඩිකොට එඬරු තෙල් තුන් කලඳක් ගෙන එහි කලතා දෙනු. බඩේ වායු, හිරිවායු ලැපැත්තේ වායු, අඩවායු ගුණ වෙයි.

අඩවායුවටඃ

2. කුඹුරු ඇට මද තුන් කලඳයි, සුදුළුනු එක් කලන් සමාරයි, සිඩිගුරු එකකලන් සමාරයි, පෙරුත්කායන් මුක් කාලයි, සහිඳළුනු එක් කලන් සමාරයි, මුරුහා පොතු මුක්කාලයි.

මෙකී දෙය උනුදියෙන් අඹරා දිය කොට එඬරු තෙලෙන් කලතා දෙනු. මල සුඩව අඩ වායු ගුණවෙයි.

3. මදටිය කොල කත, එනු ලා කොටා මලවා බඳිනු. අඩවායු ඉසිරෙයි.

4. නා කොල පස් තෙලින් අනා පොට්ටනි බැඳ පස් තෙල් ගා තවනු. වායු සුල දුවු මෙන් පහවෙයි.

අඩවායුවටඃ

5. කොට දිඹුලා පටෙට ඉහලට ගශා ඉන බඳිනු. සිටි.

6. කුඹුල් ගේ තෙමා ඉශ්ම මිරිකා පොවනු. රෙඩ ඉන බඳිනු.

7. ශැවැත්ත මුල් ඉඹිනු. දියේ ලා පොවනු.

8. බිමවල ශාරා ඉඩුවා ඉතේ රෙඩ තෙමා පෙරවං දිය හතක් වක්කුරනු.

9. එලගොම ටිකක් බිමගා උතුකටු පත්තුකර තබා බිම රත්වුනාම ඉඩුවනු.

10. ශඩුං ගලගා කුරුංබා දියෙං පොවනු.

11. නාපිරිත්ත මුල ඉශ්ම මිරිකා පොවනු. ඉශ ගල්ලනු.

12. තල පුපුරවා කනු.

13. අමු කෙහෙල් ඉශ්ම පොවනු.

14. එරමිනියා කොල කොටා මිරිකා ඉශ්ම පොවනු.

15. අළු කෙහෙල් අල ඉශ්ම පොවනු.

අඩවායුවටඃ

16. කට ලොකු ශැලියක් ගෙන දිය පුරවා කඩ වැශ්ම බැඳ මුරුහා කොල, අල,

පෙනෙල කොල අල, ශුඩුළුනු මිටයි, කුඹුරු ඇට මිටයි, දෙවනුවත් මුරුංගා කොලිං වසා නැවත අපපලෙකින් වශා උයා බා ගෙන උදය උදය කොල දිය මැඩ ගෙන වෙන වෙනම තබා පොල් කුඩු මැඩ වෙනම තබා ඉතිබු අතික් බෙත් ගෙන අඹරන කල ශර්නැළුනු මිටක්, පෙරුංකායං විකක් එක් කර අඹරා මෙම යුශත් මෙම කිරීත් ගෙන එක්ක කලතා ශතියක් දෙනු. අඩවායු ගුනවේ.

විරේක නො ඉගිලි තම;
ශ්‍රිතයට, තිදිකුඹ, ධුම්මල, කිරිබද්ද අල, මහ තිදිකුඹමුල්, නශ්නාරංමුල්, වැල්මී, පැහිප්ජ බොර මෙකී බෙත් පලමක් ගෙන කොටා එලගිතෙල් නැලියයි, එලකිරි ශතර නැලියක් දිය දශ නැලියක් වත්කොට මඳ ගිනෙන් කකාරා තෙල්කා ලනු වැටෙන පදමට බා පෙරා තිබා උදය පොවනු. රත්පිත් උන බඩ රුජා මලබඩ, බඩ පිපුම, මෙකී ලෙඩ නශා.

අඩවායුවට:

17. තිප්පිලි, කලාඩුරු අල, කටුකරෝශන කළුඩුරු, කාඤං, දඩරාස්නා දෙවෙලට දෙනු. අඩවායු ගුනවේ.

අණ්ඩවායුව:

18. හාතාවාරිය මුල්, පොල්කුඩු සමහ මිරිකා පෙරා, පෙරුංකායං දිය කොට පොවනු.

මූලවායුව:

19. ඇහැල පොතු යුස ගෙන හීනටි හාලේ බත් පිස කවනු.

20. හිරැස්ස එලකිරෙන් අඹරා බොන්න. 7 දිනක්.

අර්ශස්

1. අරිසස් ලෙඩ දුටු තැනම පමා නොව සම්හිඳුවන පිළියම් කරනු. එසේම නොකළොත් මල මාර්ගය අහුරාගෙන බද්ධ ගුදෝදර නම රෝගයක් කරන්නේය. ඊට එළගොම රෙද්දක පොට්ටනියක් බැඳ කබලක ලා තබා උණුකොට අරිසස් ගඩු ඇති මල මාර්ගයේ තබනු. එසේම විළඳ පොඩි කොට පොට්ටනියක් බැඳ දියෙන් තෙමා සතකුප්ප පොඩි පොට්ටනි බැඳ එ අරිසස් ගඩු පිට තබා කීකිරිඳිය යුෂින් තෙමනු.

2. සූවස් එනු, රත්නිටුල්, කොට්ටන්, දැත්ත අල, වගපුල්, සවින්වළුනු, තියහලා අල, මගුල් මාර ඇට මෙකී බෙහෙත් සමයේ ගෙන ගෝමුත්‍රයෙන් අඹරා කිරින් අනා අරිසස් ගඩුපිට ගානු. අරිසස් නැතිවේ.

3. කසා, වගපුල්, කුකුළු ගෑ, ඔලිඳ ඇට සමයේ ගෙන ගෝ මුත්‍රයෙන් අඹරා වියළුනු අරිසෙස් ගඩු පිට ගා අදිනු. මෙ යෝග තුන වෙන ගැව කුෂ්ට අරිසස් වායුවල බල පවතී. මල මාර්ගය මෙලොක් වේ.

4. දන්ත අල, වළගසාල්, සවීන්දවළුනු, කනේරු මුල්, එන්සාල්, කළු තුඹ, රත්නිටුල් මෙකී බෙහෙත් සමයේ ගෙන සතර පලමක් අඹරා ගෙන වරාකිරි පතක්, තලතෙල් නැලියක්, දිය සතර නැලියක් එක්කොට තුන් දවසක් මද ගින්නේ කකාරා තෙල් කා ලනු වැටෙන පදමට බා පෙරා ගෙන අරිසස් ගඩුවේ ආලේප කරනු. අරිසස් නැතිවේ.

5. අරළු සුනු කොට උක් සකුරෙන් අනා ආලේප කරනු.

6. අරළු සුනුකොට සවස ගොමුත්‍රයෙහි ලා තිබා උදෑසන ඇර ගෙන තුන් කලදක් පමණ වළදනු. අරිසස් නැතිවේ.

7. රත්නිටුල් මුල්, සතකුප්ප සමයෙ ගෙන පොඩි කොට තුන් කළදක් විවර ගෙන එළ කීලතීන් පොවනු. අරිසස් නැතිවේ.

8. සවිඳුව, සිඩිගුරු, පොතු ඇරි බෙලි මුල් සමයෙ ගෙන පොඩි කොට එළ මොරින් උදෑසන බොනු. අරිශස් නැතිවේ.

9. රත්නිටුල් මුල් අඹරා කලය ඇතුලේ ගා වියලා මෝරු වත් දිය කිරිවත් කොට රෑ කඩ වසා බැඳ තබා උදෑසන ගෙන වළදනු. අරිසස් නැතිවේ.

10. රසකිඳ වැලින්වත්, සින් මැඩ හඟු මුලින් වත්, දම් දෙවු සුදු වලින්වත්, මුව කිරි වැලින් වත් අඹරාගත් කල්ක එකක් කලයෙහි ගා වියලා ගත මෝරුවත් දීකිරිවත් වත්කෙට රෑ තබා උදෑසන බොනු. අරිසස් නැතිවේ.

11. සිවිය වැලේ පොතු, රත් නිටුල් මුල්, සමයේ ගෙන සුනු කොට තුන් කළදක් රායෙ ලා උදෑසන වළදනු.

12. රත්නිටුල්, සිඩිගුරු සමයේ ගෙන සුනුකොට මී පැණියෙන් අනා වළදනු. අරිසස් නැතිවේ.

13. සවින්දව එනුවට දිවුනුව දන්ත අල ගෙන බදුල්ල ඇට, තිපල් රත්නිටුල් මුල් කො වෙක ලා රෙදි මැටිලා ගොම වැරටියෙන් දවාගත අළුගෙන ඇල්දියෙන් වළදනු. අරිසස් නැතිවේ.

14. කළු තල දෙපලමක් ගෙන වළඳ ඇල්දිය බොනු. අරිසස් නසා

කුල දළු දවා කකාල දිය තුන් නැලියකට තිකුළු තුන් පලමක් අඹරා කල්ක කොට තලතෙල් නැලියක් එක්කොට සිඳ කල්ක ලනු වැටෙන පදමට බා පෙරා ගෙන එළගිතෙල් හා එක්ව වළදනු. අරිසස් ගඩු ගලවා වැටියේ.

රක්ත අරිසටඃ

1. කොසඹ පොතු, සැවැන්දරා මුල්, කරල් සැබෝ මෙකී බෙහෙත් සමයෙ ගෙන පලමක් දිය දෙනැලියක් වත්කොට මදගින්නේ කකාරා පතෙක හෙලා පෙරා ගෙන රත් කරල් ගැබ්බ ඇට වුණිලා මද උණුවේ පොවනු. රක්ත අරිසස් නැතිවේ.

බින් කොසඹ, කෝමාරිකා, ඇල් කසාඹිලිය මුල්, සුදු සඳුන්, සිඩිගුරු සමයේ

ගෙන දිය දෙනැලියක් කකාරා පතක් පමණ සිටි කල පෙරා ගෙන තිවා පොවනු. රක්ත අරිසස් නැතිවේ.

ලේ යන අර්සසටයි.

නිදිකුමබ අල, තල, මානෙල් අල, සුදු සඳුන්. දිවුල් ලාටු සමයේ තුන් පලමක් ගෙන අඹරා එළකිරි පතක් පමණ ගෙන පොවනු. ලේ යන අරිසස් නැතිවේ.

කෙලින්ද ඇට සුනු කොට තුන් කළඳක් ගෙන මී පැණියෙන් අනා වළඳනු. එළු කිරින් බත් කැවා මෙන් ලේ යන අරිසස් නැතිවේ.

කරල් ශාබෝ මුල් තුනක් කළඳක් විවර ගෙන අඹරා සාල් පානු දියෙන් පොවනු. ලේ යන අරිසස් නැතිවේ.

නෙළුම් මල් රේණු කලඳක් විවර ගෙන අඹරා මී පැණි හා වෙඩරු එක්කොට පොවනු.

නෙළුම් කෙසරු පොඩි කොට සීනි හා උදුසන වළඳනු. ලේ යන අරිසස් සිටී.

තලිස් පතුරු, නාමල් රේණු, මිරිස්, කොල්ලන් කොළ, සිවිය වැලේ පොතු, ශවැන්දර මුල් මෙකී දෙය එකිනෙකින් තුන් තුන් කළඳ ගෙන සිඩිගුරු, තිපල් මේ සතරින් දෙලොස් පළමක් ගෙන මෙකී දෙය පොඩි කොට ගුලිකොට තබා ගෙන තුන් තුන් කළඳ වළඳනු. බඩගිනි වඩා අරිසස් ගුල්ම උන ලෙහි රෝග නැතිවේ.

එළකිරි, අළු කෙහෙල් වෙන වෙන හෝ කවනු. එක්කොට හෝ කවනු. අනා පොවනු.

වගපුල්; මිරිස් එක බරට ගෙන සිඩිගුරු දිවුනක් ගෙන රත් නිටුල් මුල් ඇට කළඳක් ගෙන වල් කිඩාරන් අල දහස කළඳක් ගෙන වියලා සුනු කොට උක් සකුරෙන් අනා තුන් තුන් කළඳ පමණ ගුලි කොට දවස් පතා උදේ උදුසන තුන් තුන් කළඳ වළඳනු. අරිසස් නසා බඩගිනි බොහෝ ව කැවිලි දිරවා.

මීටම;
කළු කොල්ලු පොඩිකර තල තෙලින් අනා ගැඩොලක් රත් කර වත්ගෙඩිය ඇතුලේ ලා ඇඹරූ බෙහෙත් එහි ලා කෝ පතක් බැඳ මුලයට දුන් දෙනු. මූල වැදි නසා.

මුරුහා මුල් කසාය කකාරා පස්කුළු බඩු චූනනීය ලා උදය උදය් දෙනු. මූල රෝගයටයි.

පිටට නික්මුනු මූලයට:

මුව අං පුළුස්සාපු කුඩු. කට්ටකුමවල් සමග අඹරා මූලම පිට කුඩු එලනු. මූලම එම විටම බඩට වේ.

මීටම;
වැල්කරල් ශැබෝ අළු දනා හාල් අඹරා රොටිය උයා ගිතෙලින් පළමුකොට රොටිය බඳිනු.

මිටම:
රතුළූනු ගෙඩියක් ඇස්ස කපා දමා තල තෙල් වත්කර මූඩිය වසා ගිනි අඟුරු පිට තබා පුළුස්සා මදක් නෙරපා දරනය මුලම පිට තබනු. එම විටම බඩට වේ.

මිටම:
රතුළූනු. පින්න දළු යුස මුල වැදියේ ගා ඉස් මුදුනේ ගා මුලය බඩට වෙනතුරු ඉස මුදුන පිරිමදිනු.

යෝ තිපලයට. එරබදු පත් යුසයට අබින් මවඩියක් කලතා ඉස් මුදුනේ පෙකනියේ ගා බොහෝ වේලා අතින් පිරිමදිනු.

ඇස්තිබෙත මොනරපිල්. ඉබි කබල් පොඩි. පින්න මල්. උන ලී කුඩු එක විවරට ගෙන එක්කර තලා උතු අඟුරු පිට ලා මල මාගීයට දුන්පානු. නැවත. දිවිකදුරු කොළ පොතු මිටක්. අමු කහ අත්තකුත්. එනු එක පුපුරකුත් සමව කොටා මලවා තබා අමුඩු ගස්වා. එක දිනක් තබා හැර දමනු. බඩවැල එළියට එන රෝග නසා ගුනවේ.

සැවැන්දරා මුල්. කලාදුරු අල. නෙළුම අල. සාතාවාරීය මුල් මෙ කසාය කකාරා උදය උදය කීප දිනක් පොවනු. පලමුවෙන් මෙ කසාය දෙනවාය.

මිටම: බඩවැල මෑත් උනාට:

පින්නපොතු. රතුළූනු. පින්න දළු. අත්කසා. රන්කරල් ගැබෝකොල මෙවා සමව ගෙන කොටා යුස මිරිකා තබා මෙම රොඩු මලවා තබා අමුඩු ගස්වනු. වැල ඉහලට ඇදේ. එසේ නැදුන නම් පලමු මිරිකා තිබුන යුස බඩවැලට අල්ලනු. තුන් දිනක් මෙ ලෙස කරණු. ඉහලට ඇදේ.

මිටම:
රතුළූනු කොටා තලතෙලින් මලවා අමුඩ ගස්වනු. ඇදේ. ප්‍රත්‍යක්ෂයි.

මිටම:
ගෙඩි ඇපල කොල කොටා මුත්‍රපැනින් මලවා අමුඩ ගස්වනු. එම යුස මිරිකා ඉබි කබලේ කකාරා ඉස්මුදුනේ ගා ඉබි කබල රත්කොට ඉස්මුදුන තබනු. වහා ඇදේ. ඉසපැන් වත්කරනු. දියමිත්ත. නාපිරිත්ත සහමුලයෙන් හෝ මෙම දළු හෝ කොටා යුස මිරිකා සීනටි හාලෙන් කැඳ පිස තුන් උදයක් දෙනු. බඩවැල ඉහලට ඇදේ.

මීදකිරි කිලන්න ඉස පැන් වත්කරනු.

සිවුරුස්ස පළු වතුර සිඳුවා යුස මිරිකා. එලකිරි වත්කර පොවනු ඇදේ.

මීකිරි හෝ මෝරු හෝ කීප දිනක් පොවනු. බඩවැල ඉහලට ඇදේ.

මීහර. මීතෙල. ගලගා ගොමුය ගලගා හෝ මුයලා උඩු තලේ ඇහිල්ලෙන් පිරිමදිනු. සෙලසමා කපා වැගිරෙමනාවේ.

රත්ත. වමමුතු. සුවසළුනු. මී පැනි. තිකුළු. වැල්මී සමභාග ගෙන අඹරා මුකයෙහි ලනු. සියළු ගලරෝග නසා.

සුස්කර, තිකුළු, රත්නෙටුල්, යවකර, වලහසාල්, තිපල්, සවිඳැවළුනු මෙවා චූනණී කර ගොමුවෙන් ලේහ පදමට පිසගත විතතීනය කරනු. ගලරෝග සියල්ල නසා ශසත්‍ර සාධ්‍ය වූ ගලරෝග ක්‍ෂනයෙන් නසා ශක නොකරනු.

විවිධ

අරමයාට

1. වෙල්ලප් පාෂානම් කළදයි, කයිප්පු තුන් කළදයි, මෙ දෙවගේ අමු ඉඟුරු යුෂ දෙලොස් කලඳකින් යුෂ ඉතුරු නොකර සොඳ ලෙසට අඹරා මුං ඇට පමන ගුලි සෙවන වියලා දුන් තෙලින් වේලකට එක එක බැගින් සතර දවසක් දෙනු. දූං තෙල් හා බත් කනු. බගන්ත්‍ර, අරමනට, දිව්‍ය ඖෂධයයි.

රසදියෙන් ඇඟ නරක් වී වන වල්ද නාක්කු නොවී තිබුණු වන වලද ආදී වූ සියළු දේට මාදම් පොතු කසාය සතියක් බී ඉන්පසු විරේක දෙමින් ඇඟ සුද්ධ වී ඉන්පසු ලෙඩේ පමණට රසදිය කලඳක් වත් දෙකලඳක් වත් ගෙන කුප්පමෙතිය යුෂින් විෂ මරා වෙලිප්පරිත්ති යුත් මුරුවට පුවක් කැබෙල්ලක් විවරක් මෙකී දේ සොඳ ලෙසට අඹරා රෙදී කැබෙල්ලක ගා පවන වියලා දහා හතරට කපා වේලකට කැබෙල්ලක් ගෙන දුන් කැඩූවෙන් දුන් බොන්නට පළමුවෙන් එළ කිරිත් බතුත් කා ඊ පිට දුන් බොනු. බේත් එක් වූ තුන් තුන් දවසක් ඇර ඇල්දිය වක්කරනු. එනු ඇඹුල් වලකිනු. මින් ගුණ පීනස බොවුවෙන් උඩ වන වල්ද කට ඇතුලේ වනවල්ද, යනාදි වූ දේට යහපති.

කට ගඳ වුනි නම්

වෙලිප්පිරිත්ති කසායෙන් කට සෝදනු

ජරා විලිල පිලි නැතිවේ

අරළු, වග පුල්, වලහ සාල්, යහුනු සමයේ ගෙන සකීකරා, ගිතෙල්, තල තෙල්, එසේම ත්‍රි මන්ඩලයක් ලේහ කොට වලදනු. ජරා විලි පිලි නැතිවේ.

වලහ සාල්, තිපල්, යහුනු, වග පුල්, ගිතෙල්, සකීකරා සමසේ ගෙන මීයෙන් ලේහ කොට වලදනු. නර නොනැගේ.

ආනන්ද වායු තෙලයට:

සක් සඳ, තිරස්තවාළු, සාතාවාරිය, අත්තන, කීකිරිදිය, මුරුංගා, එරබදු, යක් එරබදු, කතුරු මුරුංගා, තිත්ත වැටකොළු, තිත්ත ලබු, එනු අරන, පතුක්, පෙනෙල, කොසඹ, මාදන්, යකි නාරන්, මුදු කැන්ද, නව හන්දි, මුගුනුවැන්න, ඉලන්ද, කුප්පමෙතිය, තොටිල, තික, ගඳපානා, පුඩළු, හිරළස්ස, වග පුල්, දුනුකේ, අරළු, දෙහි ඇඹුල් නැලියයි, කොමාරිකා ඉස්ම නැලියයි, මතු කී කොල ඉස්ම පතයි, බෝදි ඇට, තුවර ඇට, කශා ඇට, කරඳ ඇට, නැදුන් ඇට, පීල ඇට, වැටකොළු ඇට, කළු තුඹ, සපු මල්, නා මල්, කොල්ලන් මල්, රුක්අත්තන මල්, සඳුන්,

සත් සත් කලං ඉරිවේරිය මුල් කලදයි, සැවැන්දරා කලදයි සිහුරු පියලි කලදයි, හොද කුරුඳු කලදයි, එළ බිජු, සියඹලා ඇට කලදයි, සාදික්කා, වසාවාසි, තිප්පිලි, කලද කලදයි තිප්පිලි මුල්, කොතඹුරු, අසමෝදගන්, මනෝසිල, වච්චනාවි, ගන්දක එක එක කලදයි, අගුන මුල් මෙකී දේ අඹරා මතු කී ඉස්මට දිය කර එළගිතෙල් එඬරු තෙල්, තල තෙල්, කෝන් තෙල්, කොසඹ තෙල් මනාව මනාව ගෙන කලත්දු කර රෑ දවල් තුන් දිනක් ජාමයන් කකාරා ලනු ගෙන පදමට බා පෙරා වායුවට ඉස ගල්වා ඉර මුදුන් වේලාවට මුත් ඇට බැබිල කොල, කොමාරිකා, ඉස ගා තෙල් උගුළුවනු. මෙසේ සත් දිනක් සන්නි දහ අටට ඉස් මුදුනේ ගා බින්දුවක් දෙනු. පිතෙන් ගන්නා ඔල්මාදයට දවසක් ඇර දවසක් ඉසේ ගානු. පසුව දිය වත්කරනු. තිමිර වායුවට ඇහ ගානු.

කුරුඳු, ඉඟුරු, කොටා පොට්ටනියෙන් තවනු. අංශෙක රදේට නලලේ ගා ඉ පිට සුදුළූනු වටා ගානු.

බරවයට:

සතියක් තෙල් ගා දළුක්, කටු කුරුඳු, සිරස්ස, නා, ශලක කකාරා වේදු පානු.

වස් දෙසට තුන් දවසක් තෙල් ගා පුවටා කොල කොටා කකාරා වේදු පානු. නාවනු.

කනේ කුරුම්තියාට කන වක්කරනු. එවේලේම වැටේ.

ගුල්ම දහ අටට:

පනමක බර බඩට දී බඩ පිට ගානු.

මාලේට:

මුරුංගා කොල තෙලෙන් මලවා කවනු.

අන්ධ වායුවට:

පෙනෙල කොල තෙලෙන් මලවා කන්ඩත් තෙල් ගාන්ඩත් යහපති.

අක්කාරමට දිවේ ගානු. දිව මුන රෝගයටත් යහපති.

ශොරි වලට තෙල් ගා උණු පැන් නානු.

සෝපයට:

තෙල් ගා තිත්ත වැටකොළු කොලෙන් තවනු.

කටවු මුට්ටුවට:

කුකුරුමාං පල යුෂින්ද, දරු වැටීමට බඩේ ගානු. වැටේ

ඉක්කාවට:

බුලතෙන් කනු.

ග්‍රහනියට, ගුල්මට:

මුරුංගා පොතු යුෂින්ද දෙනු.

හෘද රෝගයට:

සිද්ධිගුරු, සුවස එනු, පෙරුංකායන්, දෙළුං ඇඹුල් මෙතෙක් බෙහෙත් පොඩි කොට උනු පැනිං පොවනු.

පිත්තජ හෘද රෝගයට:

ශඩුං, ඉරිවේරිය, ශැවැන්ද ආදිවූ ශිහින් බෙහෙත් ගෙන අඹරා ඇහ ගල්වනු. එම දිය කොට ඇහ වක්කරනු. මී පැනි හා අරළු පොවා විරේක කරනු.

සුළු බුරුද, එඬරු, හාතාවාරිය අල, කිරි බදු මුල් අල, වලා වැන්න, එල බටු මෙකී ගෙන අඹරා ගිතෙලිං හෝ එල කිරෙං හෝ උක් පැනියෙන් හෝ මුද්දරප්පලම් රශයෙන් හෝ පොවනු. හෘද රෝග නශා.

ශුවස එනු, සියඹලා මඩ, කළු දුරු, මිරිශ්, බාගයෙන් බාගයට වඩ වඩා ගෙන නත්නාරන් ඇඹුලෙන් අඹරා අනා ගුලිකොට වලඳනු.

වාතයෙන් උපන් හෘද රෝගයට:

ශවින්දව එනු, ඇඹුල් එක්කොට තල තෙලින් පොවනු.

ගොමුත්‍ර එක්කොට ශිඳ ගත් තල තෙල් හෝ පොවනු. ගුල්ම ඇනුම නශා.

අරළු පහලොසක් අඹරා සුවශ එනු දෙපලමක් එළගිතෙල් නැළියක් දිය ශතර නැළියක් එක්කොට ශිද පොවනු.

සිද්ධිගුරු, ශුවස එනු, පෙරුත්කායන්, දෙළුම් ඇඹුල් මෙකී දේ ශුනු කොට උනු පැනින් පොවනු.

සඳුං. ඉරිවේරිය. ශමන්ධට ආදී වූ ශිශිල් බේත් අඹරා ඇඟ ගල්වනු. එම බේත් දිය කොට ඇඟ වත්කරනු. මී පැනී අඹරා පොවා විරේක කරනු.

සුළු බුරුද, ශාතාවාරිය අල, කිරිබදු අල, වලාවැන්න, එල බටු, මෙකී මුල් ගෙන අඹරා එළගිතෙල් හෝ එළ කිරෙං හෝ උක් පැනියෙන් හෝ මුද්දරප්පලම් රශයෙන් හෝ පොවනු. හෘද රෝග නසා.

පිධුරු පුළුස්සා අළු ගෙන දිය කොට පැධුනු කල මතු පිටින් පෙන පෙරා කරාබු පොඩි දමා තුන් විටක් පොවනු. අඹල වැදී නසා.

පිධුරු අළු අණ දඩ දමා අළු තික කොල අත්තන කොල, දෙබජා දිය නොවන්කර ශන්දිවල ගර්භාෂයේ ගානු. අඹල වැදී ගැට ගැ සුං නශා.

පෙනෙල කොල ඉෂ්ම පනෙක ශාදික්කා ගෙඩියක් අඹරා එහි කලනා පොවනු. අඹල වැදී නසා.

කඩුත්තුවට:

1. වද මල්, ගැඩුඹ දළු, එරබදු දළු, කරල් ශැබෝ, ශීන් මකුළුවැන්න, පෙනෙල කොල, මෙකී දේ සම භාග ගෙන මලවා අඹරා තල තෙලිං-එළගිතෙලිං දෙනු.

වමනයට.

කරාබු, වශිවාසි, ශාදික්කා, කුඹුළු මැටි මෙකී දේ අඹරා නැවුන් වලදක දිය කොට දෙනු. වමනේ සිටී.

ඡර්දි අරුචියට

සිවිය තිප්පිලි මුල් මිරිස් සිද්ධිගුරු
බෙලි
මෙයින් කකාල කශාය දෙනු. භක්ත දෙවිෂ ගුනවේ.

එත්සාල් කුරුඳු පොතු කොල්ලන් කොල දුරු
හීන් මේ හැම අඹරා කාඩි එක්කොට පාත ගන්ඩූෂ කරනු. අරුචි, කෙල ඉනීම්, කාෂ, ස්වාස, ගල රෝග ගුනවේ.

තිකුළු යවකර අශමෝදගම්
හීති මේ හැම අඹරා කාඩි දියෙහිලා කලතා දෙනු. සියළු අරුචි ගුනවේ.

නොහොත් ගෝ මුත්‍ර එක්කොට කකාරා හෝ දෙනු. ගුල්ම සුල බඩ පිපුම් ගුනවේ.

සිද්ධිගුරු සුවස ලුනු පෙරුන්කායම් වෙනිවැල්
ජටාමාන්ෂ ඇඹුල් වේ ගෙඩි
මේ හැම චූර්ණ කොට උනු ඩියෙන් දෙනු. ස්වාෂ දෝෂ ගුනවේ.

පිත්තයෙන් වූ හෘධෝගමයට ශෛත්‍ය වූ පරිශේක ආලේප හා මධූ ද්‍රවයයෙන් විරෙචන කරවනු.

කටුක ද්‍රව්‍ය කකාල කසාය හෝ වැල්මි කසාය තිති එක්කොට හෝ වාහ්‍රදොශයට දෙනු.

තිප්පිලි සිකුරු පියලි වද කහ අරත්ත
සිද්ධිගුරු අරළු තාමර අල
මේ හැම චූර්න කොට හෝ මෙයින් කකාල කශාය දෙනු.

සවින්දව එනු මිරිස් සිද්ධිගුරු තිප්පිලි
මී පැති නත්තාරම් රේනු
එක්කර කට තිබා ඉඳිනු. අරුචි හැරේ.

ත්‍රිකටුක සවින්දව සුදුදුරු
මේ චූර්ණය සියඹලා ඇඹුල් ලා අනා කනු. අරුචි හැරේ.

එත්සාල් කුරුඳු පොතු, දළු වේලා
සුනු කොට සිනි කාඩියෙන් බොනු. අරුචි හැරේ.

සිද්ධිගුරු තිප්පිලි මුල් බෙලි මුල්
යන මෙයින් කකාල කශාය සවින්දව එක්කොට දෙනු. මන්දාග්නි, ගුල්ම, අරුචි හැරේ.

කුරුඳු පොතු කොල්ලන් කොල තිප්පිලි එන්සාල්
වග පුල් සිද්ධිගුරු
මෙයින් කකාල කශාය මී පැති එක්කොට දෙනු. අරුචි,කාස, ස්වාස, පීනශ ගුනවේ.

එන්සාල් කුරුඳු පොතු නාමල් රේනු මිරිශ්
වග පුල් සිද්ධිගුරු
ක්‍රම වැඩි කොට ගෙන චූර්ණ කර සීනි සමකර කනු. කාෂ, අරුචි, ගෙලෙහි සියළු රෝග සමනය කෙරේ.

තිකුළු යවකර අසමෝදගන් සීනි
මේ හැම අඹරා කාඩියෙහි කලනා දෙනු. අරුචි ගුනවේ.

එන්සාල් කුරුඳු පොතු කොල්ලන් කොල සුදුදුරු
සීනි
මේ හැම අඹරා කාඩියෙහි ඩිය කොට ගන්ඩූස කරනු.
අරුචි, කෙල ඉනීම්, කාස, ස්වාෂ, ගල රෝග ගුණවේ.

නත්නාරම් ඇඹුල් දෙළුම් ඉෂ්ම සියඹරා බොර
ජීවළු මද ඉස්ම සීනි මී පැති මුද්දරප්පලම්
නෙළුම් රේනු සුදුදුරු කළු දුරු එන්සාල්
කුරුඳු පොතු කොල්ලන් කොල තිප්පිලි
පොරි සාඩික්කායොන් ඉදි මෙකී දේ බඩිනවා බැද වේලන දේ වේලා අඹරා ඉස්මත් වත්කොට ලේහ පදමට අඹරා ලේහ කරනු. අරුචි, වමන ගුනවේ.

සිරියල් චූර්ණ කොට පාත්කඩ අඹරා දුම් පානය කරනු. නාසයටත් දුන් පානු අරුචි හැරේ.

තිකුළු තිපල් සවින්ධව සුදුදුරු
ගල්මද ද සමබාග ගෙන සියඹලා ඇඹුලෙන් නත්නාරන් ඇඹුලෙන් අඹරා මී පැතියෙන් ලේහ පදමට හෝ ආලේප කරනු.

මගුල් කරඳ මුල්
කශාය කකාරා ඉන්කට කුමුන්දනු. අරුචි හැරේ.

උක් දඩු පොතු ගශා රත් කොට කපා දොඩම්
ඇඹුලෙන් තම්බා මිරිකා ගත් ඉස්මයි දොඩන් ඇඹුල් එක පදමට මැන සුනු සකුරු ඩියෙන් එපමන ගෙන එපමන එල කිරිත් ගෙන යමක වත්කර කකාරා උකු පදමට ගෙන ලේහ කරනු. අරුචි වමන ගුනවේ.

කළුඋක් දඩු, පොතු ගශා රත් රත් ශේ කපා දොඩම ඇඹුලේ දමා තම්බා ගෙනවිනා කෙල ගිල ඉඩිනු අරුචි ඇරේ.

අමු ඉඟුරු පෙති ගයා දෙසි ඇඹුලෙන් තඹා හපා තෙළ ගිලිනු අරුචියටයි.

පැහිච්ච දොඩම් දසයක් විවර කපා ඉණ්ම මිරිකා කකාරා මදක් කිතුල් පැනි මිටක් වත් කැර කළු දුරුත් අඹරා දමා උකු පදමට ගෙන ලේප කරනු.

ගුල්මයට

1. අබ   එත්සාල්   රත්නිටුල්   තිකටුක
සිව්ය මුල්   ශතකුප්ප   ශවින්දව ලුනු   වග පුල්
කලාදුරු
ශමසේ සතර පලමක් ගෙන දෙබර පොතු, තෙල්ලි, වත් මෙකී දෙයින් එකක් ශම ශතර පලමක් ගෙන දිය දශ නැලියක් වක්කොට කකාරා දී කිරි නැලියක් වක් කොට එලගි තෙල් නැලියක් එලකිරි නැලියක් ශතර නැලියක් සිටින කල ගෙන කල්ක කොට තෙල් සිද ගෙන තුං තුං කලද වලදනු.

2. වද කශා කලදයි   බලල් ලුනු   අරලු හතර කලදයි
සීන් ඉඟුරු කලදයි   පෙරුංකායං අට කලදයි
මෙකී දේ වියලා සුනු කොට මිශ්‍ර කොට තුං කලදක් වලනු.

3. සුවස ලුනු   යවකර ලුනු   වද කශා   කටුකරෝහිනි
අරලු   රත්නිටුල් මුල්   වලගසාල්   සීන් ඉඟුරු
මිරිශ්
මෙකී දෙය තුං තුං වගින් ගෙන අඹරා කල්ක කොට එලකිරි නැලියක් එලහි තෙල් නැලියක් කලතා කකාරා සිදගෙණ තුංතුං කලද වලදනු.

4. පෙරුංකායන්   තෙල්ලි   සීන් ඉඟුරු   වගපුල්
මිරිශ්, තලා මුල්   කොතබුරු   වද කශා   සුවස ලුනු
බලල් ඵනු   යවකාර එනු   ශවින්දවු   තෙළුත් අල
කලාදුරු   දෙලුම් මුල්   සිහුරු පියලි   රත් නිටුල් මුල්
සතකුප්ප
සමසේ සතර පලමක් ගෙන අඹරා කල්ක කොට එලහි තෙල් නැලියක් එලකිරි නැලියක් වත් කොට කලතා මද ගින්නේ තුන් දවසක් කකාරා පදමට පෙරා තිබා දෙනු.

5. ශවින්දව ලුනු   බලල් ලනු   දෙලුම් මුල්
මෙකී බෙහෙත් වියලා සුනු කොට පෙරුම්කායම් තත්තාරම් ඇඹුලෙන් අඹරා මුසු කොට පොවනු.

6. එලබටු මුල්ද   අරත්ත අල   වලගසාල්   සිනුක් කිරි
ශවින්දව ලුනු

මෙකී බෙහෙත් තුං තුං කලද ගෙන එළගි තෙල් පතක් දිය නැලියක් වත්කොට එකට සිද සතර කලදක් වලදනු

7. හිරස්ථවාලු මුල් ඇට ඇරි බුළු ඇට ඇරි නෙල්ලි අරළුත්
මෙකී දෙයින් පලම ගෙන අඹරා කල්ක කොට දිය නැලියක් එළගි තෙල් පතක් එළකිරි පතක් එක්කොට කකාරා පෙරා ගෙන තුන් කලදක් දවසකට වලදනු.

8. වග පුල් දොලොස් කලදක් ගෙන අඹරා කල්ක කොට එළගිතෙල් පතක් එළකිරි පතක් දිය නැලියක් වත්කර කකාරා සිද පදමට පෙරාගෙන මෙතෙල් විරේක කරනු.

9. පුශ්වැත්ත කුර මුල් රත්මල් මුල් හාතාවාරිය මුල්
ගොකටු මුල් එළබටු මුල් කටුවැල්බටු මුල්
සිරිවැඩිය මුල් කශඹිලියා මුල් රත් ශැවැන්දන මුල්
තොටිල්ල මුල් එනුවරන මුල් ඩෙබර මුල් යොත් ඉඳි
ඉඟිනි ඇට කොල්ලු
මෙකී දේ ශමසේ ගෙන ශැට ශතර පලමක් ගෙන දිය දහයක් වත් කර කකාරා ශතරක් පමන සිටින කල පෙරාගෙන මෙම බේත් කල්ක තුන් පලමක් අඹරා එළගිතෙල් නැලියක් එළකිරි නැලියක් එහිලා සැට පැයක් කකාරා පදම දැන සිද පෙරා ගෙන
කුකුරුමාං මුල් පොතු රත්මල් මුල් පොතු
තිපල් කොලින්ද පොතු ඇට්ටේරිය මුල් පොතු
රත් නිටුල් මුල් පොතු දළුක් මුල් පොතු කැල ගසේ පොතු
මෙකී දේ ශමසේ ගෙන ශූනු කොට තබා තුං කලදක් තුන් කලදක් තෙලෙහි කලතා පොවනු.

10. කොවක්කා මුල්, පලමක් ගෙන දිය දෙකක් වත්කොට පතක සිටි කල පෙරාගෙන සිටිකල උනු කොට බොනු.

11. එනුවරන මුල් ගෙන කකාල දිය පෙරාගෙන නිමි කල මී පැනි එක්කර පොවනු.

12. සීත් ඉඟුරු අරළු රංඑං කටුකරඬු මුල් පොතු
යවකාර ලුනු
මෙකී දෙය ශමසේ ත්‍රිංකලදක් කල්ක කොට අඹරා ගෙන
දිය බෙරලිය හාතාවරිය මුත් කිරිබදු අල
ඉරිවේරිය මුල් කෝමාරිකා මුල්
මෙකී දෙය ශමසේ පලමක් ගෙන දිය දෙනැලියක් වක්කර කකාරා පතක් සිටි කල සීනි ලා පොවනු.

රක්ත ගුල්මයට

1. නෙල්ලි යුෂ, උක්පැනි දෙවගෙන් දෙනැලියයි, අරළු කල්ක දෙපලමයි, පදමට සිද බා තබා දවස දෙවේලේ වලදනු

2. තැඹිලි ලෙලි යුෂ හීන් දෙහි ඇඹුල් සමව ගෙන මෙයින් සුනිවි ගලගා බටු ගෙඩි දෙකක් පමණ ගෙන උකු පදමට කලතා ලැපැත්තේ බඩේ ගානු.

3. කටුකරෝහිනි
කරාබු
තිප්පිලි
ගල්තහර
අරත්ත
අබින්
හිරියල්
වසාවාසි
මිරිස්
සුදුහඳුන්
වද කහ
සාදිලිංගම්
කොව්වම්
සිද්ධිගුරු
රත්හඳුන්
සුදුදුරු
සාදික්කා
දේවදාරු
කයිප්පු
ඉඹුල් මැලියම්
සුදුරූනු

මෙකී දේ සමභාග ගෙන අබින් වඩාගෙන එරබදු කොල කිකිරිඳියකොල යුෂ එක්ව තුන් දවසක් අඹරා උඳු ඇට පමණ ගුලිකොට සියළ ලෙඩට දෙනු.

ලේ හීදමට මා එරමිනිය පොතු යුෂය පොල් කිරෙන්ද, ගැට ඇඹලයට තික කොල යුෂයෙන්ද දෙනු.

වමනයට ඉඟුරු යුෂයෙන් හා මී පැනියෙන්ද දෙනු.

වාත ගුල්මයට කොසඹ කොලින් දෙනු.

පිත්ත ගුල්මයට මී පැනියෙන් දෙනු.

සෙලෙස්මා ගුල්මයට මුරුංගා පොතු යුෂයෙන් දෙනු.

දිය උදරයට එළ මුත්‍රයෙන් දෙනු.

වාතෝදරයට එඩරු තෙලින් දෙනු.
කුඹුරු කොල යුෂයෙන් හා කුරුඳු පොතු යුෂයෙන් දෙනු.

ලැව්රේකයට නිටුල් පොතු යුසයෙන් දෙනු.

දිය වැඩියාවට මී පැණියෙන්ද රනවරා කොල යුෂයෙන්ද දෙනු.

මුත්‍ර කට්ටුවට කුප්පමේනිය කොල යුෂයෙන්ද දෙනු.

කැසි ඉසට මී පැනියෙන් හා කොසඹ තෙලින්ද දෙනු.

උනට සීනියෙන් දෙනු.

මාලේට පොල් මල් යුසයෙන් දෙනු.

දාය උෂ්නයට මුද්‍රිත පල යුෂයෙන් දෙනු.

අරිසස්වලට

ශුෂ්ක අරිසස්වලට

1. ගොම පොට්ටනි හෝ විලඳ පොට්ටනියෙන් හෝ තැවිය යුතුය.

2 ගැරඬින්ගේ හෝ එළුවන්ගේ හෝ උරන්ගේ හෝ ඔටුවන්ගේ හෝ කැ
තහිළුවන්ගේ හෝ මෙකී සතුන්ගේ මාංශ තෙලින් දුං දිය යුත්තේය

3 කසා සුනු සහිත වූ දළුක් කිරෙන් ආලේප කරනු.

4. කසා සුනු වරා කිරි සහිත වූ දළුක් කිරෙන් ආලේප කරනු.

5. කසා සුනු, වගපුල්, ගොයින්නේ පිත් එක්ක අඹරා ආලේප කර යුතුය.

6. ගොමූත්‍ර පුවස එනු දැත්ත අල, ඇට, නියඟලා අල
රත් නෙටුල්
මෙකී බේත් හෝ වගපුල් මාරා ඇට, වරා කිරි, පුවසා, සෙන්ධව මෙකී දෙයින් හෝ කුකුළු වසුරු ඔලිද ඇට, ගොමූත්‍ර, වග පුල් මෙකී තුං වගේ වෙන වෙන අඹරා ආලේප කරනු. අරිසස් නසා.

7. දැත්ත අල කිතිහිරිය කළු තුඹ වලගසාල්
රත් නෙටුල් සෙන්දව එනු වරාකිරි
යන මෙතෙක් බෙහෙත් අඹරා තල තෙලෙන් භාගයක්ට දිය සතර භාගයක් එක්කොට ඇඹරූ බෙහෙත් එහි ලා කකාරා තෙල් සිඳ බා පෙරාගෙන එතෙල් ඇඟිලි දෙපුරුවක් තෙලෙහි ලා ඇතුලේ මදනය කරනු.

8. අරළු හා සීනි හෝ අරළු තලා ඇට, ඇර ගෝමුත්‍රයේ රඳා වියලා ගෙන හෝ එලඟි තෙලෙන් බැද ගත් වගපුල් හෝ මෙසේම බැදගත් අරළු හෝ තිරස්ථ වාළු, දැත්ත අල හා අරළු එක්ක හෝ මෙකී බෙහෙත් වෙන වෙන පොඩිකොට තබා ගෙන වැළඳුව අරිසස් නසා.

9. තිපල් බෙලි සිහින් මිදි තොට්ල
ඇද්දෙමට පලොල් එඬරු එලබටු
කටුවැල්බටු රත් නෙටුල් දැත්ත
මෙකී දෙපලම දෙපලම ගෙන දිය දසයක් වත්කොට කකාරා පෙරා දිය සතර නැලියක හෙලා සිඳුවා පෙරාගෙන ඒ දියෙහි සීනි හෝ සකුරු සියක් පලමක් ලා එලඟි තෙල් තිබූ කලයක සුරකිව තබා මසක් ගෙන අනුභව කරනු.

්ත අරිසස්වලට

1. කොසඹ වෙනිවැල් කුරුඳු පොතු
මෙකී බෙහෙත් දෙකලදයි ගෙන තලා දිය නැලියකලා කකාරා පතෙක සිටුවා බා පෙරා පොවනු.

2. සිද්ධිගුරු බිං කොසඹ වැල් කසඹිලියා
මෙකී දෙ අඹරා පලමු කී ලෙසටම කකාරා පොවනු.

3. මහතිදිකුම්භා මහතෙල් ඉඹුල්ලාවු තල
සඳුං
මෙකී දේ අඹරා එළු කිරෙන් පොවනු.

4. නෙළුන් රේනු අඹරා මී මුසුකොට එලවෙඬුරෙන් අනා ලෙහ කරනු.

5. සිවිය තලිස් පතුරු මිරිස්
මෙකී දේ පලම පලම හා සීනි තුං පලමක් හා නෙලුම් අල වගපුල් දෙපලම දෙපලම හා සමන්දට එත්සාල්, කොල්ලන් කොල, කුරුඳු පොතු, නාමල් රේනු, සිද්ධිගුරු
මෙකී බේත් තුං තුං පලම ගෙන අඹරා ගුලිකොට තබා වලදනු.

6. තිකුළු රත්තිටුල් කිරිබදු අල තෙමෙනල
සොලොස් බාගය ගෙන අඹරා සීනි එක්කොට අනා තුං තුං කලඳ පමන ගුලිකොට වැලඳුව කල අරිසස් නසයි.

7. ඉඟුල් පෙරුන්කායම් මිරිස් සෛන්ධව කළු දුරු
සිද්ධිගුරු කොට්ටන් අරළු හිරැස්ස
වද කසා
මෙකී බෙහෙත් ක්‍රමයෙන් වඩ වඩා ගෙන ගුලි අඹරා මිරිසට පමන ගුලිකොට දෙවරුවක් සකුරු එක්කොට උනු දියෙන් දෙනු.

8. අරළු මිරිස් දුරු තිප්පිලි එම මුල්
සිවිය රත් නෙටුල් සිද්ධිගුරු
යන මෙකී බේත් එක එක වඩා වඩා ගෙන යවකාර, සෙන් කොට්ටම් වල් කිඩාරම් අල පලම්, චූර්ණ හකුරෙන් දෙනු.

ගොකටු කිරිකවෙළු රත් නෙටුල් මුල්
එලගි තෙලින් කකාරා සිඳ ගානු.
වරා මුල් දැත්ත මුල් මාරා ඇට බදුල්ල ඇට
තිප්පිලි කසා වැනිවැල් පොතු කිරි බදු අල
රත් කැල ඇට
මෙ හැම සරියේ ගෙන දිය වත්කොට අඹරා ගානු. අරිසස් ගුණවේ.

දැත්ත මුල් තිප්පිලි අවරිය මුල් තියහලා අල
මෙ හැම චූණී කර තිප්පිලි, සවින්ධව එනු. මෙ හැම සමසේ ගෙන අඹරා ගෝ මුත්‍ර වත් කොට සටා පෙකිතිය සතරඟුලක පමන ගානු.

අත්තික්කා මුල් පොතු ඉරිවේරිය කෙලින්ද ඇට
එත්සාල් මානෙල් අල සැබො මුල් දිය මිත්ත මුල්
ශමෙල මුල්
මෙ සමභාගව දොලොස් කලඳක් ගෙන දිය අට එකට කකාරා දෙනු. අරළු, රත් නෙටුල්, සිද්ධිගුරු, යන මෙයින් කකාල කසායෙහි යවකර චූර්ණ ලා දෙනු.

රත් නෙටුල්. අරළු දැත්ත යන මෙයින් කකාල කසා යෙහි ශවින්ධ එනු, චූර්ණ ලා දෙනු.

රත් නෙටුල් අරළු දැත්ත
යන මෙයින් කකාල කසායෙහි ශවින්ධ එනු, චූර්ණ ලා දෙනු.

මඟුල් කරඳ සාරන රත් නෙටුල් අරළු
තිප්පිලි සිද්ධිගුරු සවින්ධව එණු
මෙයින් කකාරා කශාය දෙනු. අරිසස් බගන්ධර ගුල්ම මන්දාග්නි මේ හැම ගුනවේ

අරළු මිරිස් වලහසාල් අජමෝජ
සිද්ධිගුරු
යන මෙයින් කකාල කසායෙහි යවකර චූර්ණ ලා දෙනු.

සිවිය රත් නෙටුල්
මෙයින් කකාල කශායෙහි සවින්දව එනු පොඩි ලා දෙනු.
රත් නෙටුල් අජමෝද කන්ද ගල්
මේ හැම පොඩි කොට කලගෙඩියක ලා මෝරු හෝ ඩීකිරි හෝ එහි වත් කොට තබා ඌරු වූ කල බොනු. අරිසස් ගුනවේ.

තිප්පිලි සවිඳ මාරා ඇට
මේ හැම වරා කිරෙන් අඹරා ගුදාන්කුරයෙහි ආලේප කරනු.
තිප්පිලි සිද්ධිගුරු කොල්ළු කසිස්
සහිඳ එනු රත් නෙටුල් අරත්ත අල ලුනුවරන
කුරුඳු පොතු සිරිළ සාතා වාරිය නියහලා ඇට මද
මේ හැම සමසේ අඹරා තල තෙල් නැලියක් එක්කොට ඊට සතරක් ගෝ මූත්‍ර එක්කොට වරා කිරි පතක් ද දළුක් කිරි පතක්ද මෙහි එක්කොට කකාරා පදමට ගෙන තනා තිබා මදක් ගෙන අරිසස් වූ මුකයෙහි ගානු.

බෙලි මුල් තල
මේ දෙක අඹරා ගුලයට දුම් දෙනු. අරිසස් ගුනවේ.

සියං දුඹුළු එළු බෙටි පුසුකර සවිඳ එනු
මේ හැම කීකිරිඳිය කොල යුෂයෙන් අඹරා වැටි කොට තනා ගුදය ඇතුලට අරිනු.

කැල කොල පුළුස්සා අළු ගෙන ධිය කොට ඒ ධියෙහි තිකුළු චූර්ණ එක්කොට ඒ ගිතෙල් එක්ව කකාරා පදමට පෙරාගන පානය කරනු. අරිසස් ගුනවේ.

ගෝ මූත්‍ර නැලියෙන් දසයක් ගෙන අරළු දෙසියක් ගෙන මූත්‍රයෙහි ලා මූත්‍ර සිඳෙන තෙක් කකාරා ගෙන මින් දවසකට අරළු දෙක දෙක මී පැනියෙන් කනු.

අකුළු   බදුල්ල ඇට   රත් නෙටුල් මුල්   වලගසාල්
තිපල්
මේ හැමචූර්ණ කොට මීට සමව සීනි ගෙන අඹරා ගුලි කොට කනු. අරිසස් කුෂ්ට පාඩු රෝග ක්‍රිමි රෝග නසා.

මාරා ඇට තියහලා මේ දෙක අඹරා සතර ඇලක් පමන නාභියේ ආලේප කරනු.

රත් කරල් ශාබෝ කලදුරු අල යන මෙයින් කසාය දෙනු.

රක්ත අශීස්

හබරල අල   තිකුළු   අරළු   රත්නෙටුල් මුල්
කිඩාරම් අල
මේ හැම සමව ගෙන චූර්ණ කොට මෝරුවේ කලතා දෙනු. සියළු අරිසස් රෝග නසා.

අත්තික්කා   ඉරිවේරිය   කෙලින්ද   මානෙල් අල
කරල් සැබෝ මුල්   ධිය මිත්ත   මෙල මල
යන මෙයින් කකාල කසාය දෙනු.

කලාදුරු අල   නෙල්ලි   අරළු   තිප්පිලි
සාතාවාරිය   කෙලින්ද පොතු
මෙයින් කකාල කසාය දෙනු. රක්ත අරිසස් මල බද්ධය මෙයින් ගුණවේ.

රත් කරල් ගැබෝ මුල් හෝ හාතාවාරිය අල හෝ මෙකී දේ අඹරා මේ කල්ක එලවෙඩරුවෙන් හාල්පාතුවෙන් හෝ එල කිරෙන් හෝ දෙනු.

පියුම් රේනු අඹරා කල්කත් හීනිත් කල්ක එක්ක අඹරා හාල් පාතුවෙන් එල වෙඩරුවෙන් අනා කනු.

පියුම් රේනු   තිප්පිලි   කොල්ලු   සහිඳ එනු
මාරා ඇට   තියහලා
මේ හැම සමසේ ගෙන අඹරා කල්ක කොට නාබි මුලයේ ගානු.

දැත්ත අල   තිප්පිලි   තියහලා අල
මේ හැම සමසේ ගෙන සූක්ෂම චූර්ණ කොට අඹරා ප්‍රලේපයෙන් හෝ දුම් පැමෙන් හා අරිසස් ගුනවේ.

රසාංජන   කවුඩු කැකිරි   තෙල් කොඩු ඇට
මේ හැම සමව තියහලා අල මේ හැම අඹරා නාබි මුලයේ ආලේප කරනු.

ගිදු පසමියාගේ මළ අඹරා නාභි මූලයේ ගානු.

ලාකඩ අඹරා දුම් දෙනු. අරිසස් ගුනවේ.

කළු දැයන්ගේ ඇට පිත්තන් දෙවගේ සම භාග ගෙන චූර්ණ කොට දුම් දෙනු.

ගොත් කැකිරි මුල් ලබු මුල් මේ දෙක අඹරා ආලේප කරනු.

නියගලා අල, තිප්පිලි, කෙලින්ද, සහිඳ එනු මේ හැම සමසේ ගෙන ගෝමූත්‍රයෙන් අඹරා නාභියේ ආලේප කරනු. සියළු අරිසස් ගුනවේ.

කෙබෝවක්කා   රත්නිටුල්   නියගලා අල

මේ හැම ගොමූත්‍රයෙන් අඹරා වරා කිරෙන් අනා ආලෙප කරනු.

සැබර කන්ෂා කොල කබලක ලා බැඳ අමු මීයෙන් අනා අට දවසක බදිනු.

ලා කැකිරි අරගෙන ඇස්ස කපා සාරා පෙරුන්කායන් කලදක් ලා රෙදි මැටි බැඳ පුට දෙකක් දීතඹා ගෙන උන අළුවෙන් එක් පළුවක් අලුයම කනු.

රතු ළූනු පොතු හැර මදක් තලා මිටක් පමන ගෙන ඇතුලත පිටත තිබා අමුඩ ගසනු. තුන් දවසක් මේ සැටි කරනු.

දේවදර දර වලලා, පුළුස්සා අඟුරු ගෙන අඟුරට මී අං කුඩු දමා අපාධොරයට දුම් පානු පසු අසමෝදගත් බැඳ චූර්ණ ගිතෙලින් කනු. මුල ව්‍යාදි ගුණවේ.

ලේ වැහෙන අරිසසයට

ශැබෝ මුල් තුන් කලදක් අඹරා සාල් පානුවට දිය කැර මින් තුන් කළදක් අඹරා සාල් පානුවට දිය කරමින් තුන් කලදක් එක්කොට පොවනු.

සැබෝ පලා යෙන් බත් දෙනු.

සුළු කුර අඹරා පානුයෙන් දෙනු.

දස මුල් දැත්ත, රත්තෙටුල්, අරළු සමසේ ගෙන සොලෙසක ගුනයෙන් දිය වත් කොට කකාරා ලස්සෙක සිටුවා බෙහෙත් පෙරා හැර සිහිල් වූ කල්හි ගොලයක් සකුරු මැඩ තෙල් බඳුනක මසක් ධාන්‍ය පාබයේ තිබා පසුව ගෙන දෙසින් මෙන් මාත්‍රායෙන් වලඳනු.

නික මුල් සීරැස්ස, සුඹුළු යොත් තුඹ ශැබෝ මුල් මිරශ් මුල් හෙළ නෙටුල් මුල් මේ දේ දෙකලං ගෙන කකාරා ඇඹුල් මොර හා අඹරා පොවනු.

කිතුල්   සෙත් කොට්ටන්   වලහ සාල්   රත් නිටුල්

යහුනු මේ හැම බරට සීනි ගෙන අඹරා ගුලි කර ගුලිකා උනු පැන් බොනු. අරිසස් ගුනවේ.

කිඩාරම් අලත්, ළූනුත් ගැට තුඹ කොලත් කොටාගත උනු අඟුරු බණ්වා වන්ගෙඩිය ඇතුලේ ලා බෙහෙත් සුහක් දමා වංගෙඩිය උඩ ඉද දුම්පානු. අරිසස් ගඩු මැලවී හැකිලේ. තුන්දවසක් මේ සැටි දුම් පානු.

පරන ගොරක අඹරා

කළු දුරු   සුදුදුරු   සිද්ධිගුරු   පෙරුංකායන්

මිරිස්
උළුවා
අසමෝදගන්
සවින්ධව
තිප්පිලි
අබ

මෙකිවා මෝර කරවල වත් ටිකක් එක්කොට තික කොල ඉස්ම එක් කොට කැකුළු හාල් කසා ලා කායම් කකාරා කායම් උණු පැතින් බොනු.

වහතැල් කොල මුල් කලදයි
මුගුනුවැන්න මුල් කලදයි
කොමාරික මුල් කලදයි

සමව ගෙන වතලා කොටා බදනක ලා තබා නෙළුම් සපු කැකුළු කළු දුරු අගිල් සඳුන් කලද කලද මේ බෙහෙත් ගෙන චූර්ණ කර එලගි තෙල් තැලියක් ගෙන කකාරා තබා උදය තෙල් කුළුඳුල්ලක් කා උණු පැන් බොනු. අරිසස් මුල ගුනවේ.

අරිසස් කැපෙන්ට

කාරමට බේත් වේලා කොල දෙදැරුවයි මී මුරුවට තබා ගන ඉද්ධ කොල කොමාරික ඉස්ම වත් කොට අඹරා මල මාර්ගය ඇත ලත් වටකරක් ගාලා ඇඹරු බෙහෙත් ගඩුවට මාධං පත්තු කරනු පත්තු කරන රහ නම් තුං පැයක් විවර දී බෙහෙත් පොතුත් තවත්ඩ බැරි නම් අරගනු. මේ සැටි තුන් දිනක් කරනු. පසුව ගිතෙල් ගානු. කුනු ඇත්නම් තල තෙල් අතුලත ගානු.

තුත්තත්
පුසුකර කලං බාගයයි
ක්‍රීම් සස්ත්‍රු කලදයි
රත්නෙටලු
දද කිරි කලදයි
ගෝදත් අරළු කලදයි
තුරුසි දෙකලන් බාගයයි
හිරියල් කලයි
නවසාරන් කලදයි
එල තොටුල් දෙකලදයි
වියලි කසා කලදයි
බෙල්ලන් පුළුස්සාපු අළු කලදයි

මෙකී දේ චූර්ණ කර අඹරා තනා තිබා වෙලිප්පරිත්තයෙන් මිත් කාලක් ඩීය කර කුකුළු පියාටුවෙන් ගානු. සතියක් ගානු.

බිත්තල් මුල්, වේලාගත් පොඩි උලක්කුවයි මිරිස් පොඩි හතර කලදයි තිප්පිලි කලදයි මෙකී දේ චූර්ත කොට බිලාලපදයක් මීයෙන් අනා කනු.

දේවදාලි ඇට, පොඩි කොට සීනි හා වෙඬරුවෙන් කනු. මුල ව්‍යාදි කුඩුව පිටවේ.

එල මරින්දුයි, කුකුළු බිත්තර පොතුයි, මේකීවා අඹරා සුනු එක්ක අනා ඇතුළ ගානු.

මුල ව්‍යාධියට

වැල් කැප්පෙටියා කොල, කොටා කහා එනු ලා කොටා වෙත වෙතම අඹරාලා

මළවා අඹුව ගත්වනු. ඇත් දිනකින් නැටී ගැලවුනා සේ වැටේ. ඉස්ගිසි පරංගට ගින්නෙරිය ශාමූලියෙන් සතර පතත් ගෙන මංචාඩි දෙකයි, පල්මානික්කම් මංචාඩියයි අඹරා දමාතෙල් සිඳ යන්තම් කරනු. මූල වැදි ගුනවේ.

කළු එනු පොල් සකුරු අඹරා මී වෙඬරුවෙන් දෙනු. මූලවාදී නැසිවේ. මීටම මී මෝරු නැලියක් වළ තැල් කොල මිටක් පොඩි කොට බොනු. ඇත් දවසින් මූල වැදි වැටේ.

කහ, එනු පොතු , අශමොදගත් මෙකී දේ පොඩි කර දුම් පානු.

වරා මුල්
සිරස්ස
ශාබෝ මුල්
පොල්කුඩු පලා
දෙමට කොල
බළල් මයිල්
තෙසැව
මෙකී දේ කොටා තල තෙලින් අතා දුම් දෙනු.මුල වැදි කඩුත්තු නැතිවේ.

පැහිච්ච කරිවිල ගෙඩියක් ගෙන සියඹලා ඇටයක් විවර මීයෙන් අඹරා ඇහිල්ලේ ගා වමට දකුනට කරකවනු. මල මාර්ග සුඩවේ.

සුරක්කන්ති මුලිසෙන් කොට්ටම් උළුන්දු පොඩි පදමට බැද මේ හැම අඹරා දිය වත් කර ඉටිපදමට අඹරා පතම් පතම් සේ තනා එලඟි තෙලින් බැද ගෙන එලඟි තෙලින් ඒ රොටිත් කනු. සතියක් කනු.

කළු තල
සිද්ධිගුරු
අබ
මෙකී දේ සමව ගෙන චූර්ණ කර දෙවේලේ මඩලයක් කා උනු පැන් බොනු. මූල වැදිය මුලවිජිත්තවේ.

තිපල්
රත්නිටුල්
සාදික්කා
තිකුළු
වලගසාල්
කරාබු
අබ
කළු දුරු
වසාවාසි
සිවිය
අසමෝදගම්
පෙරුංකායන්
මෙයින් කලද කලදයි, මීට කසායට මී අරටුවක් කුඩා කුඩා කොටා කපා ශැලක දමා කකාරා දිය වත්කොට ඒ දියට රත් ගොරක මිටක් දමා නැලියක් විවර ගෙන ගොරක පෙරා දමා ඇඹරු බෙහෙත් දිය කර බෙහෙත් අඹරන කල මේ කසා යෙන් අඹරා පොල් සකුරු කැබැල්ලකුත් රබ්බඩ ගෙඩියක් විවර කන තෙල් ටිකක් දමා මද ගින්නෙන් පැණවා රත්කර සුරකිව තබාගෙන උදය වලදනු. මේ කන අතර තීකුළු කශා හරංකශා කුරුදු පොතු වල් ඉඟුරු අබ පෙරුංකායන් අමු ඉගුරු මණ්තකී මෙකී බෙහෙත් සමව ගෙන කොටා තිබා ගෙන කිරිවාන ගලක් රත්කොට වතලා මළු පිටක් බැද වශා බැද සිදු කොට බෙහෙත් වත දමා දුම්ගස්වනු.

අළුත් මී මුරුවට
පල්මානික්කම්
සුදුදුරු
කළු දුරු
සුදුළූනු
දක් සොද රහට අඹරා අමුඩ කවනු. අරිසස් ගෙවේ.

වල් කිඩාරම්   සොඳ කිඩාරම් අල   හබරල අල
රත්නෙටුල්   සීරැස්ස   සුදුළූණු   ඇඹුල් ඇඹිලිය
මේ හැම චූර්ණ කොට මීයෙන් කවනු.

රක්ත පාසාන කාලයි   වච්චනාවි කාලයි ගෝරෝචන සමාරයි
සුස්කර කාලයි   කෙහෙල් පතුරු පුළුස්සාපු අළු කාලයි
මේ දේ අඹරා පතුක්කොල තම්භාගත් ඉස්මෙනුත් එලගිතෙළුත් අනා ඇගිල්ලේ ගා අපාන දොර ඇර දකුන වම කරකවනු මේ ක්‍රමයෙන් මුලව්‍යාදි නැතිවේ.

ඇතුලට කන්ඩ බෙහෙත් තිත්ථ කපුරු ඇට කෙහෙල් පරඩලා දැවූ අළුත් එලහිතෙලින් අනාකනු. එනු ඇඹුල් අරිනු අරිසස් මුල වැදි ගුනවේ.

කළු කොල්ලු පොඩිකර තල තෙලින් අනා ගඩොලක් රත් කොට වන දමා ඇඹරූ බෙහෙත් දමා කට වසා දුම් පානු.

තුන්දවසක් කුඩැල්ලන් ඇර එඩරු කොල තෝර කොල, ආඩතෝඩ කොල වැල් කැප්පිටියා කොල, එනු කහ, ලා මලවා බදිනු දෙවෙනිදා කුඩැල්ලන් සතර දවසක් බදිනු තුන්වැනි දා කුඩැල්ලන් ඇර සතියක් බදිනු. මුරුංගා මුල් කසාය පස් කුළු බඩු ලා බොනු.

මූල විසාදියට

රත්තම්පලා දඩු · පුළුස්සාපු අළුයි   කපු තැරි පුළුස්සාපු අළුයි
වෙල්ලිප්පාසානං   අගුරු
උඩ තිබූ කල උනුවේ උනුවෙච්ච කල අරන් ඒ පාසානමුත් අඹරා එලහිතෙලින් පදමට ගෙන තබා මුල වැදියෙ ගානු.

මූල රෝග

මී තෙල් පතක් ගෙන ඔලිඳ කොල ඉස්ම මදක් වක්කර කකාරා බත් සමහ හත්වරුවක් කන්න. ගිතෙල් පතකට ඔලිඳ කොල ඉස්ම වක්කර කකාරා ඉස අල්ලනු.

මල් කිඩාරන්   ගස්කිඩාරම්   කොසවිල අල   හීරැස්සවාලු
එල මුත්‍ර   විනාකිරි   පොල් පැනි
කැප්පිටියා පොතු යුෂ
අරලු   ගත් ඌරුතෙල්   තිත්ත ලබු කොල බදුල්ල කොල යුෂ

පත බැගින් මේවා භාජනයක දමා දෙහි ගෙඩි 100ක් කපා හතරට ඉරුකර තිබා සිවිය බලල්, පෙරුංකායම් කලඳ බැගින් ලේවා ලුනු පතයි, චූර්ණ කර දෙහි ඇතුලේ ලා ශලකලා උඩිං වසා මැටි බැඳ බිම වලලා දින 7ක් තබා

සීනි ගිතෙල් පත පතලා සත් දිනක් සුඕපුටදී දෙසි දෙකට බෙදා පංගුවක්ට ත්‍රස්තවාලු තුන්පලමක් චූර්ණ කර දමා දෙන්න.

තැවිලි

ගොම පොට්ටනියෙන් හෝ විලඳ පොට්ටනියෙන් තවන්න.

දුම් දීම

ගරුඩි, බලල්, ඌරු, වටු, කැනහිල්
යන කිසියම් සතකුගේ මාංස තෙලින් දුම් දිය යුතුය.එම තෙලින් තැවිය යුතුයි.

කසා යුෂ සහිත දලුක් කිරි ආලේප කල යුතුයි.
කසා පත්‍ර සහිත වූ වගපුල් ගොයින්තෝ පිත් එක්ව ආලේප කළ යුතුය.
ගෝමුත්‍ර සුවස ලුණු දැත්ත අල තියහලා අල
රත්තෙටුල්
මෙකී බෙහෙත් හෝ වග පුල් මාරා ඇට වරාකිරි පුවටා, සවින්දව, මෙයින් හෝ කසා කුකුල් වයුරු ඔලිඳ ඇට, ගොමුත්‍ර වගපුල්, මෙකී තුන්වගය වෙතම අඹරා ආලේප කරනු.

දැත්ත අල කිතිහිරිය තිකුළු වලහසාල්
රත්තිවුල් සහිඳ ලුණු වරාකිරි
මේ බෙහෙත් අඹරා තල තෙල් බාගයකට දිය සතර බාගයක් එක්කොට එහි ඇඹරු බෙහෙත් එහිලා කකාරා තෙල් සිඳ කොහොඹ, වෙනිවැල්, කුරුඳු පොතු මෙතෙක් බෙහෙත් දෙකලඳ දෙකලඳ ගෙනතලා දිය නැලියක ලා කකාරා පතට සිඳුවා බා පෙරා බොන්න

සිද්ධිගුරු සඳුන් බිං කොහොඹ කහඹිලියා කෂාය
මහතිදි කුම්භා මහතිල් ඉඹුල්ලාටු තල
සඳුන්
මෙකී බෙහෙත් අඹරා එළුකිරෙන් පොවන්න.
නෙලුම් රේණු, අඹරා මී පැණි මුසුකොට එල වෙඩරුවෙන් අනා ලේහ කරන්න.
සිවිය හලිස් පතුරු මිරිස් සවින්දව
එන්සාල් කොල්ලම් කොල කුරුඳු සුඹුලු
තාමල් රේනු
මෙතෙක් බෙහෙත් හා සිද්ධිගුරු තුන් තුන් පලම ගෙන මෙකී බෙහෙත් එක්කොට අඹරා ගුලිකොට තබා වලඳනු.

වල් කිඩාරම් අලදහ පලමයි බඩුල්ල ඇට අට පලමයි
සිද්ධිගුරු හතර පලමයි මිරිශ් ධුරු තිප්පිලි එක්පලමයි,

විෂයානුක්‍රමණිකාව

රෝග නාමය පිටු අංකය

1. දත් රෝග (1 වන කාණ්ඩය හා සම්බන්ධ) 01
2. දත කළුවී දත කැක්කුම 01
3. දත් මුල් දිය වීම 01
4. මස් වැඩීමට හා අර්බුදවලට 01
5. දත් මුල සියළු රෝග වලට 02
6. දන්තශුල රුජා වැඩි වු කල්හි 02
7. මුඛ රෝග ලේපයක් හා තෙලක් 02
8. දත මුල ඉදිමුම් රුජාවට 03
9. මුඛයේ වන වලට 03
10. අක්කාරං යන ලෙඩට 04
11. යක්‍ෂ දිෂ්ටි කතා කරන්ට බැරිව යාම 04
12. උගුරේ රෝග 05
13. රසදිව දික්වීම 05
14. දිව පල්ලේ දිව හා දිවේ රෝග 05,07
15. උගුරේ රෝග, හනු ඉදිමුම්, හක්කේ ඇතුලත ගෙඩි 01,05
16. ශෙමට කට ශෝදන්ට කසායට 05
17. දන්ත පිළිකාවට 06
18. දන්ත පිළිකා කුණු කැපෙන්ඩ 06
19. දත් වැයාට 06,08
20. දත ඇතුලෙ ගඩු වලට 06
21. හකු පිළිකෙට 07
22. කුරුළුවලට 07
23. ඉසකෙයියා උගුරේ පැටලුනාට 07
24. දත් සවිවීමට 07,14
25. කටේවන සියළු රෝගයනට 08,09,11
26. දත් හිරි වැටුනාට 08
27. කටේ ලේ සැරවා ඇතිවිට 08
28. කටේ බිබිලි 08
29. දිව මුලද දතෙහිද රෝගයට 09
30. දිව මුල තොල පැලී මල නැග තිබේ නම 09
31. වීදුරු මසින් ලේ ගැලීම 10
32. ශෙලෙස්මාවෙන් උපන් මුඛ රෝගයට 10
33. උගුරේ වන 10
34. කට පැලීම 11
35. දත් මුලෙහි වන රෝගයට 11
36. දත් ශැලුමට 11
37. ක්‍රිමි දන්තයට 12
38. දිව මුල දත ශෙලෙවු රෝගයට 12
39. තොල් පැලීම, වන වීම 12
40. මුවෙහි රුජා ඇතිව පැලී වනව රිදේ නම 12
41. ශැලෙන දතට 12
42. ගලග්‍රහයට 13
43. දන්තර වන්නට 13
44. කට හඩ වැඩීමට බැරුන්ඩියට 13
45. දන්ත රෝගයට 13
46. මුඛ රෝගයට 14
47. ගල රෝග නිසා වු වමන 14
48. නාසා රෝග 15
49. පිනස පුතිනාශයට 18
50. නාශා පාකයට 24
51. පුයා රක්තයට 24
52. නාශා පරවියට 24
53. නාසා රක්තයට 20, 24
54. නාශා ශොෂයට 15,24
55. ප්‍රතිශ්‍යාවට 21,24
56. නාශා ගැශුනා 25
57. නාශා ශැරවයට 25
58. වර්ම ශිරෝ රෝග 26
59. ඉශ රුජාවට 27
60. පනුවන් විසින් වන ඉශ රුජාවට 27
61. ඉශ කුඩිච්චියට 28
62. කැසි මුස ශ්වාස 37
63. වායු සමග මුහට කැස්සට 34

64. කාස ස්වාසයට 28, 43
65. හික්කා ස්වාස 43,44
66. මුහ කැස්සට 46
67. කැස්සට පිලියං 44,49,53,
54,56,59
68. කුස්මාඩ රසායනය 53
69. කාසයට හා හික්කාවට 35,56
70. අරුචියට, සෙමට, ඉක්කාවට 57
71. සරස්වති තෙල 59
72. ක්ෂය කාසයට 62
73. කාස, ජ්වර, ගුල්ම 62
74. පිත්තකාස 63
75. ඇදුමට කැසි උනට 64
76. ඉංවි කුලම්බුවට 67
77. ළය බර බව 70
78. මුත්‍රා කිච්ඡවට 71
79. මල බද්දයට හා මුත්‍ර බද්දයට 72
80. මුත්‍රා දහයට 74
81. සකීර ප්‍රමේහ, ගල්වෙරෙප්පු, 76
මුත්‍රදහයට
82. සියළු ප්‍රමේහයට 77,83
83. දිය වැඩියාවට 81,94
84. ප්‍රමේහයට පත්‍ය 81
85. ප්‍රමේහයට හා ප්‍රොතික වාදමට 82,83
86. පිත් සෙලෙස්මාවට 84
87. මුහ ප්‍රමේහයට 85
88. ශ්ලේෂ්මා ප්‍රමේහයට 86
89. ශත කුප්ප 86
90. මුත්‍ර කඩිත්තුවට 86
91. ශෙලෙෂ්මා ගිනියමට 87
92. ජල මල අඩිස්සියට (මුත්‍ර කෘවපු) 88,89
93. ප්‍රමේහ විරේකයට 89
94. උෂ්ණ රෝගයට මුත්‍රදහයට 90
95. අන්ධවායි රුජාවට 90
96. විරේචන බේතට 90
97. ප්‍රමේහ දහයට 94
98. මුත්‍ර ගල් 96
99. මුත්‍ර විරේකයට 102
100. රත් පිත හා සමේ රෝග (කුෂ්ට) 103
101. රත් පිතෙන් ඇතිවන වමනයට 103
102. විරේකයට බේත් 103
103. රත්පිත් මාලෙට 104
104. යෝනි මාර්ගයෙන් ලේ යන රත්පිතට 105
පිතින් වු තියාවට කි බේත්
105. රත්පිතින් වැරුනාට 106
106. අධොගත රත්පිත 107
107. සෙමීං උපං වමනයට 108
108. තුං දෙස් වමනයට 108
109. ලේ වමනයට 108
110. මුඛයෙන් නාසයෙන් ලේ යනවාට 109
111. නාසයෙන් ලේ යනවාට 109
112. රත්පිතින්වූ නාසයෙන් ලේ යාමට 110
113. විලිඹුරාවට දුම 112
114. කබර තෙලට 112
115. ඇගේ රශ්නෙට ගිනියම් 113
116. කකුල් පැලුනාට 113
117. හිත් පිත් නිසාවෙන් වූ තිය බිරින්තාවට113
118. පුසුල් පත්මෙට 114
119. පුසුල් ශුතේට 115
120. පිතට 116
121. ඉදිමුන් රත් පිතට 116
122. මල් රතයට 116,
121, 124
123. කනේ අල්ලන රතයට 116,
121,
122, 125
124. බාලයන්ගේ අක්ෂි රෝගයට 117
125. බාලයන්ගේ මුඛ රෝගයට 117, 138
126. බාලයන්ගේ ග්‍රහ දෙසයට 117
127. බාලයන්ගේ ඉසරුජාවට 118

128. බාලයන්ගේ ග්‍රහණී අතීසාරයට 119
129. ග්‍රහනි මාන්දම් ගුලීයට 120
130. කෙලවලු බඩ මාලු බෙහෙත 120
131. මාන්දම් ගුලි i,ii,iii,iv,v,vi. 122
132. මාන්දම් තෙල්, අන්ධ මාන්දම, කිරි මාන්දම, සන්නි 124
133. හැම මාන්දමට 125
134. මාන්දම් කටින් බඩින් යනවාට 123
135. කිරි වමන මාන්දමට 123
136. අඩ මාන්දමට 123
137. මාන්දම් තෙල 124
138. කිරි මාන්දන් 124
139. පනු මාන්දමට 124
140. ශෙලෙස්මා මාන්දමට 124
141. බඩ පිපෙනවාට 126
142. පෝරු මාන්දමට 127
143. කෝල සන්නි මාන්දමට 129
144. උලුක්කු ශන්නි මාන්දමට 129
145. ශන්නි මාන්දමට 130
146. ශෝති මාන්දමට 130
147. වලී මාන්දං 130
148. ගල් රතේට 131
149. රතේට අල්ලන වමනයට 133
150. රත කසාය 133
151. දුවන පතින රතේට 135,141,208,209
152. රත විසාදී 135
153. දුවන රතේට 137
154. ළදරු නගනයට 137
155. ඇවිලිල්ලට 137
156. ආදෝ බාගයට යන රතට 138
157. වමනයට 138
158. නාසයෙන් වැගිරෙන රතයට 138
159. ඉසේ එන රත ගෙඩි 139
160. රත කැවිල්ලට 139
161. දහ 140
162. තෙල් අභ්‍යංග 140
163. රතේට 140
164. ලේ රතේට 142
165. තිපාණ්ඩු ගුලීය 143
166. තිප්පාඩු ගුලීය අනුපාන 143
167. බාලයන්ගේ වමනයට 143
168. බඩ ගසාගෙන යනවාට 143
169. සන්නියට 143
170. බාලයන්ගේ බඩ රුජාවට 143
171. බාලයන්ගේ පිට ගැස්මට ඇනුමට 144
172. බාලයන්ගේ කෝල සන්නියට 144
173. බාලයන්ගේ උනට 144
174. බිලිඳු රාජ ගුලීය 144
175. උගුරෙ ලෙඩට 144
176. රත් පිතෙන් එන හිස රදයට 146
177. ළදරු පිත් රෝග . 146
178. රත්පිත් 146
179. ඇස් රුජා 146
180. හිස රුජා 146
181. බාලයන්ගේ අත පය වලඟු නැතිවාට වේදුවක් 147
182. බාලයින්ගේ අධස්සියට 147
183. ළමයින්ට උපන්ද පටන් අල්ලන ශෙමට 147
184. ළමයින්ට ලැය තුල හිරවී තිබෙන ශෙමට 147
185. ළමයින්ට තුන්දෙසින් ආ උනට 147
186. ළදරුවන්ගේ සෙම නැගුම් 148
187. බාලයන්ට ආ උනට, කිරි නැගුමට 148
188. බිලිඳු කුමරුන්ට ආ හික්කාවට 148
189. බාලයන්ට වු පීනස, හික්කා, රුජාවට 148
190. වසූරියට 148
191. ළමයින්ගේ බඩ වේලෙනවාට 148
192. බාලයන්ට වු අතීසාරයට 149
193. සර්ව අතීසාරයට ජ්වරයට 149
194. බඩ ඈතුලේ අල්ලන රත 149
195. ළමයින්ගේ ඉදිමුමට කසාය 149
196. බඩ උන්තියට 152

197 පිත්තයට 153
198 මාලයින්ගේ කොටවින ඉඳිකුත් වලට 152
199 විරත මෙනෙත් නූකල
කොඩිපිලේ කම 152
200 ශිෂ්‍යානුබද්ධයන්ගේ වන රෝග නැසීමට 152
201 උගුරේ ලෙඩට 153
202 රස 153
203 කිරිඳු රජ ගුලිය 154
204 කිරිඳු රජ ගුලිය අනුපාන 154
205 උල්ලෙගමට 168
206 ඇඬුවිට උනට 178
207 ආතාය බිඳුනාට බෙහෙත් 178
208 සුතරාම කල්කය 179
209 ගර්භිණී රෝග හා සූතිකා රෝග 184
210 බඩ දරු ඇයට අඩස්සියට 184
211 අලුත වැදූ ඇයට 184
212 වැදුගෙයි ලෙඩට 184
213 වැදුගෙයි බඩින් යනවාට, කලුත්තුවට, 184
හාලේට
214 වැදුගෙයි කෝලෙට 185
215 වැදුගෙයි කෝල ඉලප්පුවට 185
216 වැදුගෙයි සන්නි උනට 185
217 වැදුගෙයි ඇයගේ සියලු සන්නියට 185
218 වැදුගෙයි ලෙඩට 185
219 කිරි හාලේට බෙහෙත් 187
220 රත්ත ගුල්මයට 187,255
249
221 කුස ගුලියට ගර්භයේ රුජාවට 187
222 ලේ සිඳුමට 188
223 වැදූ ඇයට ප්‍රමේහයට 188
224 ප්‍රදරයට 188
225 වැදූ ඇයගේ ලේ කුනු ශුද්ධ වීමට 189
226 බඩ මල දරුවෝ වැටෙන්ට 189
227 කැලුනාට 189
228 බඩ මල දරුවන් වැටීමට 189
229 වැදුගෙයි පිතලෙට 189
230 අත්සාරමට 190
231 වැදූඇයගේ සන්නි ගිරියමට 190
232 වැදූඇයගේ වෙව්ලන් සන්නියට 190
233 වැදි වලට 190
234 ගර්භිණීන්ගේ වාතයට 190
235 ගර්භිණීන්ගේ සර්ව වාතයට 190
236 වාලුකා කසාය 190
237 සියලු බඩරුජාවට 191
238 ගර්භිණීන්ගේ කලවේ උකුලේ රුජාවට 191
239 ගර්භිණීන්ගේ කාසයට 192
240 ගර්භිණීන්ගේ ප්‍රවාහිකාවට 192
241 ගර්භිණීන්ගේ ඡර්දියට 192
242 වමනෙට 192
243 වැද මහ වැටෙන්නට 193
244 සන්නිපාතයට 193
245 සූතිකා ජ්වරයට 193
246 සූතිකා රත්තය හොඳින් පිටවීමට 194
247 සූතිකාවන්ට 194
248 වැදුගෙයි අනුපුට්ටුව 194
249 බඩින් යනවාට 194
250 දත අට සන්නි 194
251 අනු පුට්ටුවට 195
252 පිට ගැස්මට 195
253 වැදූ ගෙයි පළමු තොට දෙන කසායට 195
254 වැදුගෙයි බඩේ කැක්කුමට 195
255 මා විෂ්ණු තෛලයට - සූතිකාවන්ට 196
256 ගුරුවිරාජ තෛලය 197
257 ඇට තනර වල රුජාවට 198
258 දරුවෝ සිටීමට 198
259 වැදුගෙට කොනොඹකායමට බෙත් 198
260 ගර්භනීන්ගේ ඉදිමුවට 199
261 වැදුගෙයි සන්නියට 199
263 පනුකැවිල්ලට 201
264 අත් කුඩුවුනාට, සුවෙන කුෂ්ටයට 276
265 කුෂ්ටයට සොරිකඩුවෙගත් 276
266 කඩිවේගමට 203
267 කිලිකාදියට 203
268 ඉගේ නැම නැතම සොරියට 203

269. තාම්‍ර කුෂ්ටය 204
270. අළු ගොමරට 205
271. මුල විදියට ශැට ඇත්තම 205
272. මුලං කිසෙල් යනවාට 205
273. ගැට අබල වැදියට 205
274. අභ්‍යංග 206
275. කුෂ්ට (ලාදුරු කුෂ්ටයට) 206
276. මහා සීත මුල් අරක්කුව 206
277. කඩුවේගත් 207
278. මූල විශාදියට 208
279. දයරග්ති ඇතිවනවලට 208
280. වන මස් වැඩීමට 209
281. වජ්‍රක ඝෘතය 209
282. මහා තික්ත ඝෘතය 209
283. රතයට 210
284. ගල්රත 210
285. මල් රතේට 211
286. කතේ අල්ලන රතේට 211
287. රත්පිතට බෙත් 213
288. ආදෝ බාගයෙන් යන රතට 213
289. විරේකයට 213
290. වමනයට 213,215
291. වැරයිටි ඇයට 213
292. නාසයෙන් වැහැරෙන රතයට 213
293. මල මාර්ගයෙන් වැහැරෙන රතයට 213
294. යෝනියෙන් වැහෙන රතයට 214
295. පිතින් උපන් වමනයට 215
296. වාත වමනයට 215
297. තුන්දෙස් වමනයට 215
398. රත තැවිල්ලට 216
399. රත්පිත් දහ ආලේපය 216
300. මුඛයෙන් නාසයෙන් ලේ යනවාට 217
301. කොර දද කුෂ්ට ගඩු ආදියට 217
302. ආග්‍රිකාදි කසායට 217
303. දුර්මාංශ කායසීම භස්මයට 218
304. කාන්දන් බස්මයට 219
305. රජපාන ගුලියයට බෙත් 219
306. තිය පිරීත්කාවට 220
307. කටු ඇදෙන්ට තහරුවැල් කැපුනාට 221
308. කැපුනාට 221
309. පය කටු ඇනුනාට 221
310. දදයට 221
311. කුෂ්ට 200,203,
222,225,
229,231
312. වන වලට අරමනයාට 222
313. දද කුෂ්ටයට 222
314. පනුවන් ඇති වනයට 222
315. අරමන වනයට 222
316. වමනය වන රත්පිතට විරේකයට
බෙත් 222
317. රත්පිත මාලේට 222
318. නාසයෙන් ලේ යනවාට 222
319. රත්පිත් විරේකයට 222
320. රත්මාලේට 223
321. ඉදිමුමට 223
322. සෝපරාජ කසාය 224
323. හැමපාඩු ඉදිමුමට 224
324. කසායට 224
325. ඉසේ කුෂ්ටයට 225
326. ඉසකසනවාට 225
327. උඳුගොව්වාට 225
328. කඩිවේගමට 226
329. සමකැපුනාට 226
330. පතුල විලිඹුවට 227
331. ශරීරයේ සෝගදට 227
332. අත් පනුවන් කනවාට 227
333. ගිනි විෂට 227
334. දුවන පතිත රතයට 228
235. රතයට 228
336. ගජ චර්මයට 229
337. තිලීකා 229
338. කබර වලට 230
339. දද අළු ගෝමර වලට 230

340. කුෂ්ටයෙන් හටගත් කුන්දෙය් ජ්වරයට 230
341. පතු කැවිලි 230
342. සොරි මලට සොරි වියලට 230
343. ඉකිලියේ අල්ලන තලපෝරුවට 231
344. සොරි 231
345. කඩු වේගමට හා ගජ වමියට 231
346. කල්ගිය සොරිවලට 231
347. නාසයෙන් මසු දළු වැඩී නාසය උඩ විකාරවේ නම් 232
348. දද කුෂ්ටයට 232
349. කඩී වේගමට 232
350. ශොථ 234
351. ඉදිමුමට 234
352. ශෝථයට 234
353. ඉදිමුමට මුත්‍රාවිරේකයට 234
354. ඉදිමුමට චූර්ණයට 234
355. පිත් ඉදිමුමට 237
356. ඉදිමුනාට 237
357. ශෝපයට 237
358. සෝපා කල්කයට 238
359. වායු පොට්ටනියට බෙත් 238
360. කැවුන විශ නසන්න, ඉන් වුන ඉදිමුන් 239
361. දතඅට සන්නියට හා කටින් බඩින් යනවාට 239
362. ගෙඩි වන තෙල් 240
363. මුර උණ 240
364. අතිසාරයට 240
365. උන්මාදයට 240
366. කෂායට 240
367. වාතොන්මාදයට 241
368. පිත්තොන්මාදයට 241
369. ශෙලෙශ්මා උන්මාදයට 241
370. උන්මාද අපස්මාර 241
371. ඔල්මාදයට තෙල් 242
372. කාමලයට 242
373. සොහමාලෙට 242
374. පිට ගැස්මට 243
375. පිට ගැස්මට අනු පුවටුවට 243
376. වාත රෝග 244
377. අසුවක් වායුවට තෛලය 244
378. වාතයට කසායට 245
379. ගුල්මයට 246,253, 311
380. නාසා රක්තයට 246
381. ගුල්මයට අරිසසට 246
382. ඇලීයාවට 247
383. කපජ ගුල්ම 249
384. ගැනු අයගේ බඩින් ලේ යනවාට සැරව යනවාටද ගුල්මයටද 249
385, ගුල්ම පතුවාට 250
386. හිරුස්සකායම 250
387. හිරුස්ස පළු කායමට බෙත් 250
388. පතුකැවිලි වලට 251
389. ස්ත්‍රීන්ගේ ගුල්ම රුජාවට. 251
390. නොයෙක් ගුල්ම වැදියට 251
391. වාතරුජා ගුල්මය්ට 251
392. කෝලවලිප්පු වැදියට 252
393. දිව යටින් දිවක් එනවාට 252
394. සියළුම ගුල්ම රුජාවට 253
395. පතු ගුල්මයට 253
396. ගුල්ම අරිශශට 253
397. පිත්ත ගුල්මයට 248,254, 256
398. ශෙලේශ්මා ගුල්මයට 254
399. ශේලේශ්මා ගුල්මයට 256
400. වාත රෝග 257,258, 265,276, 277
401. වාත කශාය කියනු ලැබේ 257
402. සන්දි ඉදිමුම වලට 258
403. අරිසස් 258,305, 383
404. ඇලීයාවට 260
405. ශෙලේශ්මා වාත දෙසිංවත විකාරෙට 263

406. භෘගවාදි චූර්ණය 263
407. දසාහ චූර්ණය 263
408. වාදමට 264
409. අතීසාරයට 265
410. මාලේට 266
412. ඇවිලිල්ලට 266
413. අර්ධිතයට 266
414. සර්වාංග ලෙඩට 268
415. විදුම් (අසුරවිදිය) 269
416. දහ තුනක් වාදන් වලට 270
417. සල්ල විධි 271
418. අරුචියට 273
419. බාලයාගේ බඩිං යනවාට 273
420. වාදමට 273
421. හික්කාවට 274,311
422. ඉදිමුම් උදර 276
423. පිත්ත පාඩුවට බෙත් 277
424. වාත රක්තයට 277
425. කුරුමෙත්තු රුදවට අසුවක් වායුවට 278
426. අසුවක් ප්‍රකාර වායුවට 279
427. වායු පස් වගේට තෙල් 279
428. සර්වාංග වායුවට 279
429. අසුවක් වායුවට 280
430. හන්දි වායුවට 280
431. කන්ද වායුවට 281
432. ගල ග්‍රහයට 281
433. ගලක්කාරයට 281
434. ගෙලහි ගඩුවලට 281
435. රක්ත අරිසසට 283,305
436. ලේ යන අර්සසට 284,307
437. බඩවැල එලියට එනවාට 285,307
438. සියළු වැදියට 286
439. මකොදර බික්කං කියන ලෙඩට 287
440. උලකතිසුලං කියන ලෙඩට 287
441. කුඩුරුවල මැස්සන්ට 288
442. අෂ්ට විධ මූල ව්‍යාධියට 288
443. ඉක්කාවට 288
444. ගලක්කාරයට 289
445. ළමයින්ගේ උගුරේ ගුරු ගුරු ගානවට 289
446. ශෙමට කට සෝදන්ට කසාය 289
447. ඇත්‍රා පිත්තාවට 289
448. කල්ලිවාදන් කියන ලෙඩට 289
449. පිත්තභ්‍රමාතිකත්වයකට 290
450. කට්ටු මුට්ටුවට 290
451. කද ගැට රුදවට 290
452. වොප්පුසාවො කියන ලෙඩේට 290
453. පඩතාමරට 291
454. සෙලෙස්මා වායු කිපීමට 291
455. වඩුරුවලට 291
456. වඩුරු 291
457. පුරවියමට 291
458. ඉදිමුමට 292
459. වසූරියට 292
460. වසූරියට උන ගත්තාම දෙන කශායට 292
461. පපුවට ගායට දෙන කශාය 293
462. අන්තිමට දෙන කශාය 293
463. ඊට ඉශ රදේට 294
464. ඇගෙ වන උනාට ගාන්ඩ 294
465. කෙවල වසූරියට 294
466. කටේ ගාන්ඩ පැතිය 295
467. වෙලවිල්ල හා ශෙම ඇවිත් උගුරෙහි තිබෙනවාට 295
468. මදත්‍යට 295
469. පිත්තයෙන් වු මදත්‍යට 295
470. ශෙලෙස්මා මදත්‍යට 295
471. ගලක්කාරයට 296
472. ශීපද චිකිත්සාවට 296
473. ගඩ මාලයට 296
474. බඩ වැල පාත් වෙනවාට 296
475. උදු ගොව්වාට 297
476. කැඩුම් බිදුම් වලට 297
477. නැල්මට බෙත් 297
478. කැඩුම් බිදුම් නැවිම වලට 297
479. සන්දි බිදීමට 298

480. බගන්ත්‍රයට පිලියම් 299,300

481. බිත්ත පිලිකාව 299

482. මුහට 299

483. බගඳුරා ගඩුවට 300

484. බඩ ඇතුලට කඩ බේත් 301

485. උදවතීයට 301

486. අඩ වායුවට 301,304,
305

487. අඩ වෘද්ධි 303

488. මුලවායුව 305

489. අරමයාට 309

490. කට ගදට 309

491. ආනහද වායු තෛලය 309

492. බරවයට 310

493. ගුල්ම 18ට 310

494. මාලේට 310

495. අඩ වායුවට 310

496. සෝපයට 310

497. කට්ටු මුට්ටුවට 311

498. ග්‍රහණියට 311

499. රක්ත රෝග 311

500. පිත්ත හෘදරෝග 311

501. වාත හෘද රෝග 311

502. කඩූන්තුවට 312

503. වමනයට 312

ගැටපද විවරණය

අක්‍රා	- අක්කරාපට්ට
අංශුක	- කොල්ලං
අක්	- බුළු
අග්නි	- රත් නිටුල්
අක	- වරා
අකුලේ	- රණවරා
අඹු	- ඉරිවේරිය
අඹුද	- කලාදුරු
අඩහැර	- අඩන හිරිය
අරිට	- කොහොඹ
ඉන්දිප්පු	- සහිඳ එනු
ඉඳු බිජු	- කෙලිඳ
ඉලවංගන්	- කුරුඳු පොතු
ඉසඟු	- වැල් දෙහි
උසනා	- ගම්මිරිස්
අගල් ආදර	- ආඩාතෝඩා
අගරි	- බාලයින්ට සෑදෙන මාන්දම රෝග විශේෂයක්
අගස්ති	- කතුරු මුරුංගා හෝ වෙලා
අජාගර	- කීකිරිදිය
අදිමදිරන්	- වැල්මී
අපලා	- පිටවක්කා
අර්ක- වරා	- රත්නිටුල්
අරණ	
ඇරසු	- ඇසතු, බෝ
අරාම	- දුම්මැල්ල
එරහැඳි	- ඇසල
ඔසු	- ඉඟුරු
කමනිය	- කුප්පමේනිය
කළුනිඹ	- කරපිංච
කිම්රුපු	- වලහසාල්
කිංජල	- කොට්ටන්
කිරිමිද	- වලහසාල්
කතක	- ඉඟිනි
කාර	- යව
කුළුරත	- කටුකරෝසන
කිලිල්	- උණ කිලිල්
ගන්ධක	- ගෙන්දගම
කරපට	- අක්‍රපට්ට
ගරිඳ	- දළු බුලත්
ගණ	- කලාදුරු
ජාතිඵල	- සාදික්කා
ජල	- ඉරිවේරිය
තන	- මවකිරි
තාමර	- නෙළුම
තාලක	- හිරියල්
තිකුළු	- එඟුරු, ගම්මිරිස්, තිප්පිලි
තින්වග	- කරාබුනැටි, වසාවාසි, සාදික්කා
තිංතිති	- සියඹලා
දන	- කොත්තමල්ලි
තෙද	- එත්සාල්, කොල්ලං කොල, නාමල් රේනු
දන්දෙව	- සිරිතේක්කු
දෙමෝද	- කොරාසානි, අසමෝදගම
පසඹුල්	- දෙහි, දෙඩම්, නාරං, ගොරක, අගඩා
එල	- තිපල්, කුකුරුමාන්

තිපල	- අරලු, බුළු, නෙල්ලි
පටු	- සහිඳ එනු
තාවී	- වච්චතාවී
පියයුරු රස	- තන කිරි
පොඩි දල්	- ගොටුකොල
පොකුරු	- නෙළුම
බිළිඳුන්	- කොල්ලු
මදන	- අත්තන
මදුක වැල්	- වැල්මී
පොත්තරි තාලම	- රත් හිරියල්
මයුර	- පල්මාතික්කන්
මීරිකුළු	- මුරුංගා
රුත	- කටුකරෝසන
රුහැතිය	- වල් ගම්මරිස්
රස	- රසදිය
රාසනා	- අරත්ත
රු	- අමුකහ
රොසන	- කටුකරෝසන
වරන	- ලුනුවරන
තෙරුවාල	- ජයපාල
විජයා	- අරළු
වල්තිය	- කුප්පමේතිය
වලග	- වලහසාල්
වාලක	- ඉරිවේරිය
වෙල්පල්	- කෙළිඳ
වෘස	- ආඩතෝඩා
සිසිල	- සුදු හඳුන්
සිඳු	- සහිඳ ලුනු
සිකි	- පල්මාතික්කං
සිකිපිල්	- මොනර පිල් අලු
සුවස	- එනු
සුවඳ හොට	- සැවැන්දරා
හිම	- සුදු හඳුන්

හිඟු	- පෙරුංකායන්
හිස්ස	- වදකහ
හිඟුල්	- සාදිලිංගන්
හේමවතී	- අරළු
හපුස	- මුඩ මහන

11812

011872
GWAIL